සැප්තැම්බර් රටට සුබයි ලග්න පලාඵල
පිටුව 27



# සිළුමිණ

சிழுமின The Silumina


■ ආරම්භය - 1930 මාර්තු 30 ■ ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී ■ 91 වැනි කාණ්ඩය 35 වැනි පත්‍රය ★
■ ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ සිංහ රවි 15 භාග බිනර පුර දොළොස්වක ඉරිදා ■ වර්ෂ 2020ක් වූ අගෝස්තු මස 30 වැනි ඉරිදා මිල රු 70.00




රජයේ ගැසට් පත්‍රය සැප්තැම්බර් 06 සිට සෑම ඉරිදාවකම සිළුමිණ සමග නොමිලේ




වැලිබල් රන් ණය
පොළිය අඩු කළා
රන් පවුමට
රු.81,000/-
7 480 480 | www.vallibelfinance.com
වැලිබල් ෆිනෑන්ස්

සෞදියේ වැලිකතර සිහිල් කළ මනුසත්කම
පිටුව 03



ඔටර්ස් සමාජ ශාලාව ඇවර වෙයිද?
පිටුව 04



කුඩු නිසා කුඩු වුණු ගැහැනු
පිටුව 07

# බස් අලුත්වැඩියාවෙන් කෝටි 100ක් රජයට

## මගී පහසුවට සැප බස් ගෙන්වයි

ජයසූරිය උඩුකුඹුර

ලංගම ඩිපෝවල ඇති අබලන් බස් රථ අලුත්වැඩියා කර මගී ප්‍රවාහනයට එක් කිරීම මඟින් රජයට රුපියල් කෝටි 100ක මුදලක් ඉතිරි කර ගැනීමට ප්‍රවාහන අමාත්‍යාංශය කටයුතු යොදා ඇත. ප්‍රවාහන අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතා සිළුමිණට පැවසුවේ ශ්‍රී ලංගම ඩිපෝවල බස් රථ 7410ක් ඇතත් එයින් ධාවනයට එක් කෙරෙන්නේ බස් රථ 5504ක් පමණක් බවයි. 2 වැනි පිටුවට

## උසස් පෙළ-5 ශිෂ්‍යත්වය ඔක්තෝම්බර් මාසයේ සාමාන්‍ය පෙළ-ජනවාරියේ

(සුභාෂිණී ජයරත්න) 2 වැනි පිටුවට

## ප්‍රථම පොපි මල ජනපතිට



ලෝක යුද්ධයන්හිදී මියගිය සෙබළුන් සිහි කරමින් 1944 සිට ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමය විසින් වාර්ෂිකව සංවිධානය කරන පොපිමල් දිනයේ පළමු පොපි මල ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් වෙත පැළඳවීම ඉකුත් 28 සිකුරාදා ජනාධිපති කාර්යාලයේදී සිදුකෙරිණි. පොපි මල් අලෙවියෙන් ලැබෙන ආදායම යුද්ධයෙන් මියගිය රණවිරුවන්ගේ පවුල්වල සහ ආබාධිත විරුවන්ගේ සුභසාධනය සඳහා වැය කෙරෙන අතර සේවා මුක්ත භට සංගමය මඟින් කොවිඩ් 19 අරමුදල සඳහා රුපියල් දස ලක්ෂයක මුදලක්ද එහිදී පිරිනමනු ලැබිණි. මෙම අවස්ථාවට ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමයේ සභාපති විශ්‍රාමික මේජර් ජෙනරාල් උපුල් පෙරේරා, මහලේකම් කර්නල් අජිත් සියඹලාපිටිය, භාණ්ඩාගාරික මේජර් ශාන්තිලාල් කංකානම්ගේ, පොපි සැමරුම් කමිටු සභාපති කණ්ඩායම් කපිතාන් කුමා කිරින්දේ යන මහත්වරු ඇතුළු සාමාජිකයන් පිරිසක් එක්ව සිටියහ.

## අඩු මිලට මාළු දෙන්න සැලැස්මක්

නිහාල් පී. අබේසිංහ

2 වැනි පිටුවට



## ආරක්ෂක - නීති අංශ එක්වී දූෂිත නිලධාරීන්ට වැට බඳී


(තාරක වික්‍රමසේකර)

සමස්ත දිවයිනම අපරාධ හා දූෂණවලින් වළක්වා ගැනීම සඳහා පොලිස් බුද්ධි ජාලයක් ක්‍රියාත්මක කිරීමටත් ආරක්ෂක අමාත්‍යාංශය හා නීතිපති දෙපාර්තමේන්තුව එක්ව නීතිමය වශයෙන් කටයුතු කිරීමේ නව සැලැස්මක් ක්‍රියාත්මක කිරීමටත් කටයුතු යොදා ඇත. 2 වැනි පිටුවට

## පස් නිවුන් දරු උපතක්

(හර්ෂා සුගතදාස) 2 වැනි පිටුවට

සිම්පල් මෑන්



## දේශීය කිරි ගොවීන් නඟා සිටුවීමට ෆොන්ටේරා සමාගමත් එක්වෙයි

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන්ගේ 'සෞභාග්‍යයේ දැක්ම' අරමුණුවලට සමගාමීව අගය එකතු කළ කිරි නිෂ්පාදන අපනයන ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කිරීමට ෆොන්ටේරා බ්‍රෑන්ඩ්ස් ශ්‍රී ලංකා සමාගම දැන් කටයුතු කරමින් සිටී. මෙය රජයේ ආර්ථික පුනර්ජීවනය සහ දරිද්‍රතාව තුරන් කිරීම පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බළකාය මඟින් හඳුනාගෙන ඇති ජාතික මට්ටමේ ප්‍රමුඛතාවන් සාක්ෂාත් කරගැනීමේ උත්සාහයට දායකවීමකි. එම ක්‍රියාවලිය යටතේ ෆොන්ටේරා සමාගමට කිරි සපයන කිරි ගොවීන්ගේ උත්සාහයන් අගයමින් ඔවුන් වෙත කෘෂි උපකරණ බෙදාදීමක් උක්ත කාර්යසාධක බළකායේ සභාපති බැසිල් රාජපක්ෂයන්ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් අගෝස්තු 28 දා කඩුවෙලදී සිදුවූ අතර එහිදී කිරි ගොවියකුට නවීනතම කෘෂි උපකරණ සංකේතාත්මක ලෙසින් ප්‍රදානය කළ අයුරු මෙහි දැක්වේ. රටේ ආර්ථික සමෘද්ධිය ළඟාකර ගැනීම සඳහා පෞද්ගලික අංශය දක්වන මෙවැනි දායකත්වයන් අගය කළ යුතු බව රජයේ ආර්ථික පුනර්ජීවනය සහ දරිද්‍රතාව තුරන් කිරීම පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බළකායේ සභාපති බැසිල් රාජපක්ෂයන් එහිදී අවධාරණය කළේය. ෆොන්ටේරා සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ තනතුරට පත්වූ ප්‍රථම ශ්‍රී ලාංකිකයා වන විද්‍යා සිවරාජා මහත්මියද ඡායාරූපයේ වේ.





UNLIMITED Entertainment
හිතේ හැටියට නරඹන්න
ඔබ කැමතිම films Ultra Full HD Quality එකෙන් හිතේ හැටියට Amazon Prime | Netflix | Apple TV+ | PEO TV Go | Fire TV | Hulu සහ Roku TV හරහා නරඹන්න
SLT වෙතින් Unlimited Data පැකේජය රු. 1990/- පමණයි.
ONLY FROM THE BEST INTERNET PROVIDER
ULTRA FULL HD
SUBSCRIBE VIA www.internetvas.slt.lk | Self Care | 1212
*කොන්දේසි සහිතයි TRC/SLT/PRO/20/02




DFCC Virtual Wallet
DFCC වර්චුවල් වොලට් එකෙන්
සල්ලි අල්ලන්නෙ නැතුව
බිල් ගෙවන්න
රීලෝඩ් දාන්න
ඕනෑම බැංකු ගිණුමකට සල්ලි යවන්න
DFCC සහ වෙනත් බැංකු Credit Card පියවීම්
ඕනෑම කෙනෙකුගේ phone එකට සල්ලි යවන්න
වැඩි විස්තර සඳහා 0112 350000 අමතන්න
Google Play App Store දැන්ම Download කරගන්න
*කොන්දේසි සහිතයි
24 පැය ඇමතුම් මධ්‍යස්ථානය: 0112 350000
www.dfcc.lk
DFCC බැංකුව ඔබේ වර්ධනයට




GLOBAL BANKING & FINANCE AWARDS
BEST LIFE INSURANCE COMPANY SRI LANKA 2019
AIA ඉන්ෂුවරන්ස් ශක්තිමත් පදනමක් - තිරසාර පැවැත්මක්.
- ශ්‍රී ලංකාවේ විශාලතම ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමේ ප්‍රතිශතය හිමි ජීවිත රක්ෂකයා.
- 30 වසරක් පුරාවට අඛණ්ඩව සේවාලාභීන්ට ලාභාංශ (2019 වසරට 9.99% ක ප්‍රකාශිත ලාභාංශ අගයක්).
- ඉහළ ගුණාත්මක බවින් යුත් ආයෝජන අරමුදලක්.
- ජීවිත රක්ෂණය පදනම් කොටගත් විශ්‍රාම සහ සෞඛ්‍ය රක්ෂණයේ ප්‍රමුඛයා.
- වසර 100කට වැඩි අත්දැකීම් සපිරි ලොව විශාලතම ජීවිත රක්ෂණ සමූහයේ සවිබලය.
*2020 මාර්තු මස 12 වන දින වෙළඳපොළ ප්‍රාග්ධනීකරණයට අනුව ලොව විශාලතම ජීවිත රක්ෂකයා
විශ්‍රාම, සෞඛ්‍ය හා ජීවිත රක්ෂණ
AIA ඉන්ෂුවරන්ස්
HEALTHIER, LONGER, BETTER LIVES
TBWASRI LANKA

BOVANS
ලොව ප්‍රකට ලේයර්ස්
ශ්‍රී ලංකාවේ සරු එල නෙලා ගත් කිකිළි පැටවුන්
* වැඩි බිත්තර නිෂ්පාදනයක්
* ඉතාම ශක්තිමත් බිත්තර කටුවක්
* වැඩි ජීවන ශක්තියක්
දික්කන්ද ෆාම්ස්
යක්කල පාර, වතුරුගම. බ: ප:
ටෙලි: 033 5626501 ෆැක්ස්: 033 2279674

1වැනි පිටුවෙන්...

## බස් අලුත්වැඩියාවෙන්...

දැනට ධාවනයෙන් ඉවත් කර ඇති බස් රථ 1906න් බස් රථ 900කට ආසන්න සංඛ්‍යාවක් කඩිනමින් අලුත්වැඩියා කර ධාවනයට එක් කිරීමෙන් මෙසේ කෝටි 100ක පමණ මුදලක් ඉතිරි කර ගැන්මට හැකි වනු ඇත.

බස් රථ 500කට අධික ප්‍රමාණයක් වසර 30ක් පමණ පැරැණි බස් රථ බැවින් එම බස් රථ වෙනුවෙන් මුදල් වැය කිරීම නිෂ්ඵල බවද ඇමැතිවරයා පවසයි.

අලුතින් බස් රථ ඉන්දියාවෙන් ආනයනය කරන්නේ නම් එක් බස් රථයක් වෙනුවෙන් රුපියල් ලක්ෂ 60ක පමණ මුදලක් වැය කළ යුතු අතර අලුත්වැඩියා කර ධාවනයට යොදවන බස් රථයක් වෙනුවෙන් වැය කළ යුතු වන්නේ රුපියල් ලක්ෂ දෙකක් හෝ ඊට අඩුමුදලක් නිසා අලුතින් බස් රථ 1000ක් ආනයනය කිරීමට වැය වන රුපියල් කෝටි 600ක් වැය වන අතර එම බස් රථයක් වසර 15ක කාලයක් ධාවනය කළ හැකි අතර ලංගම මගින් අලුත්වැඩියා කරන බස් රථයක් අවම වශයෙන් තවත් වසර 5ක කාලයක් ධාවනය කළ හැකිය.

## ආරක්ෂක - නීති අංශය...

ඒ අනුව රාජ්‍ය ආයතනවල දූෂිත නිලධාරීන්ටද දැනට පවතින නීති රීතිවලට වඩා දැඩි නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය.

ආරක්ෂක ලේකම් මේජර් ජනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න පවසන්නේ රාජ්‍ය ආයතනවල සිදුවන දූෂිත ක්‍රියාවන්ට එරෙහිව දැඩි ලෙසින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට මේ පියවර ගනු ලබන බවත් ඊට අමතරව මත්ද්‍රව්‍ය ජාවාරම, නීතිවිරෝධී ආයුධ සංසරණය, රජයේ ඉඩම් අත්පත් කර ගැනීම ඇතුළු අපරාධ වැළැක්වීමට මේ අනුව කටයුතු කරන බවයි. මෙහි එක් පියවරක් ලෙස මේ වන විට මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්, බෙදා හරින්නන් හා භාවිත කරන්නන් අත්අඩංගුවට ගැනීම ශීඝ්‍ර ලෙසින් ඉහළ ගොස් ඇති අතර අපරාධකල්ලි සාමාජිකයන්ද සැලකිය යුතු ලෙසින් අත්අඩංගුවට ගෙන ඇත. මීට අමතරව පොලිස් ස්ථාන හා පොලිස් කොට්ඨාසවලට එරෙහිව ලැබෙන මහජන පැමිණිලි විමර්ශනයට වෙනම ඒකකයක් ක්‍රියාත්මක කෙරෙන අතර මාසිකව එහි ප්‍රගතිය සම්බන්ධව සොයා බැලීමටද කටයුතු කෙරෙනු ඇත.

## හීය



● මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි

# ඒ.ආර් සහ එෆ්.ආර්

**සුද්දන් ශ්‍රී ලංකාව පාලනය කළ සමයේ මැද භාගයේදී පමණ ඔවුන් විසින් එක්තරා නිශ්චිත පාලන රටාවක් මෙරටට හඳුන්වා දී තිබුණේ ය. එම පාලන රටාව ඔවුන් විසින් හඳුන්වනු ලැබුවේ ඒ.ආර්. සහ එෆ්.ආර්. යනුවෙනි. එය තවදුරටත් පැහැදිලි කරනු ලැබුවහොත් සුද්දන්ගේ එම පාලන ක්‍රමවේදය ක්‍රියාත්මක කෙරුණේ නිශ්චිත පරිපාලන සහ මුදල් රෙගුලාසිවලට අනුවය.**

කෙසේ වෙතත් අප මේ සඳහන් කරන්නේ සුද්දන් රට ඇතුළු වූ මුල් කාලයේ මෙරට පාලනය කළ රොබට් බ්‍රවුන්රිග් සහ ටොරිංටන් සාමි වැනි මිනීමරු ආණ්ඩුකාරවරුන්ගේ අත්තනෝමතික පාලන රටාව ගැන නොවන බව ද විශේෂයෙන් ම සඳහන් කළ යුතු ය. එදා ඔවුන් විසින් ගෙනයනු ලැබුවේ ම්ලේච්ඡ පාලනයකි. 1818 දී සහ 1848 දී ඇතිවූ නිදහස් අරගල මැඩපැවැත්වීම සඳහා මාෂල් ලෝ නැමැති ම්ලේච්ඡ යුද්ධ නීතිය පනවා රට තුළ අති විශාල මනුෂ්‍ය සංහාරයක් ක්‍රියාත්මක කිරීම ඒ සඳහා කදිම උදාහරණයකි. මහාචාර්ය විමලානන්ද තෙන්නකෝන් සූරීන්ගේ උඩරට මහ කැරැල්ල නම් ග්‍රන්ථයේ එකී ම්ලේච්ඡ යුද්ධ නීතියේ තරම සවිස්තරව සඳහන් වේ.

ඉන් අනතුරුව මෙරටට පත්ව ආ තවත් බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරුන් කීපදෙනෙකු විසින් සිදුකර තිබුණේ මුඩුබිම් පනත වැනි නොයෙකුත් අණ පනත් මගින් සිංහලයන් සතු ඉඩම් රජයට පවරාගෙන ඒවා කුණු කොල්ලයට සුද්දන්ට විකුණා මුළු රටම ලිප්ටන්ගේ තේ වත්තක් බවට පත් කිරීමයි. නැතහොත් යටත් විජිතවාදය උපරිම මට්ටමින් රට තුළ තහවුරු කිරීමය.

එකල සුද්දන් විසින් ඒ.ආර්. සහ එෆ්.ආර්. රෙගුලාසි මෙරටට හඳුන්වා දෙනු ලැබුවේ තම පාලන කටයුතු පහසු කර ගැනීමේ පියවරක් වශයෙනි. එහිදී ඔවුන්ගේ අරමුණ වූයේ මුළු රටේම සම්පත් සමාන අයුරින් සූරා කෑමය. කෙසේ වෙතත් 1948 දී පමණ රට තුළ ඇති වෙමින් තිබූ නිදහස්වාදී හැඟීම් උත්සන්න වීමත් සමඟ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී සුද්දන්ට සිදුවූයේ මුළු රටම අතහැර දමා ආපසු එංගලන්තය වෙත යාමට ය. එදා ඔවුන් ආපසු ගොස් තිබුණේ තමන්ගේ සියලුම ඒ.ආර්. සහ එෆ්.ආර්. පමණක් නොව අධිරාජ්‍ය ගැති චින්තනයන් ද රට තුළ ඉතිරි කරමිනි.

සුද්දන් විසින් ඉතිරි කර ගිය ඒ.ආර්. සහ එෆ්.ආර්. ඇතුළු අධිරාජ්‍යවාදී නටබුන් මහ ඉහළින් පිළිගත් අපේ කළු සුද්දන් ද එම යල් පැන ගිය ක්‍රමවේදය තවදුරටත් ක්‍රියාත්මක කරගෙන ගියේ ඒවා කාලයට ඔබින පරිදි ගළපා ගැනීමකින් පවා තොරවය. 1948 න් පසු මෙරට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව 1972 දී සහ 1978 දී වශයෙන් දෙවරක් වෙනස්වී ඇතත් ඒ තුළ ඇති සුද්දන්ගේ කාලයේ ඒ.ආර්. සහ එෆ්.ආර්. වල අඳුරු සෙවණැලි තවමත් පවතින්නේ සක්‍රිය තත්ත්වයෙනි. එය ද උඩ - යට මාරුවෙමිනි. අනෙක් අතට එදා සුද්දන් ගේ ඒ.ආර්. සහ එෆ්.ආර්. ක්‍රමවේදය යටතේ රාජ්‍ය තන්ත්‍රයේ බලවතුන් වූයේ නිලධාරීන් ය. ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ මෙන් ම සෝල්බරි ව්‍යවස්ථාව යටතේත් දේශපාලනඥයන්ට සිදුවී තිබුණේ නිලධාරීන් විසින් ලියාදෙන පිටපතට අනුව කට සොලවමින් අංග චලනය කිරීමය. එහෙත් 1972 පළමු ජනරජ ව්‍යවස්ථාවෙන් සහ 1978 දෙවැනි ජනරජ ව්‍යවස්ථාවෙන් පසු තත්ත්වය සහමුලින් ම උඩු - යටිකුරු කෙරුණේ දේශපාලනඥයන්ට පාලන තන්ත්‍රයේ වැඩි බලතල ප්‍රමාණයක් අත්කර දෙමිනි.

අන්තිමේදී සිදුවූයේ රටේ මූලික නීතිය හෙවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හිතුන හිතුන විදිහට නැවීමට තකතීරු දේශපාලනඥයන්ට ඉඩ ලැබීමය. එවැනි ඇතැම් අවස්ථාවල දී රාජ්‍ය නායකයාගේ පෞද්ගලික අභිමතාර්ථයන් සපුරා ගැනෙන පරිදි රටේ මූලික නීතිය පවා වෙනස් කෙරුණේ ය. 1978 දී ඉදිරිපත් කළ 1 වැනි ව්‍යවස්ථා සංශෝධනය, 1982 දී ඉදිරිපත් කළ 3 වැනි ව්‍යවස්ථා සංශෝධනය සහ 4 වැනි ව්‍යවස්ථා සංශෝධනය, 1987 දී ඉදිරිපත් කළ 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය පමණක් නොව ඉකුත් යහපාලන ආණ්ඩුව මගින් ඉදිරිපත් කළ 19 වැනි සංශෝධනය ද ඒ සඳහා කදිම උදාහරණ ය.

ජේ.ආර්. ආණ්ඩුව මගින් 1978 නොවැම්බර් මාසයේදී 1 වැනි ව්‍යවස්ථා සංශෝධනය ගෙනැවුත් තිබුණේ විශේෂ ජනාධිපති කොමිසන් සභාවක් මගින් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි කිරීම සඳහා කරන ලද නිර්දේශයට නීතිමය ආවරණයක් ලබාදීමේ අදහසිනි. එය ජාතික අවශ්‍යතාවයක් නොවන බව අමුතුවෙන් කිවයුතු නොවේ. එසේම 3 වැනි ව්‍යවස්ථා සංශෝධනය සහ 4 වැනි ව්‍යවස්ථා සංශෝධනය ද ඊට සමාන අරමුණකින් ඉදිරිපත් කරන ලද සංශෝධන ය.

මහින්ද රාජපක්ෂයන්ගේ ආණ්ඩුව මගින් ඉදිරිපත් කළ 18 වැනි සංශෝධනයේ අරමුණවී තිබුණේ ද පෞද්ගලික අභිමතාර්ථයක් සපුරා ගැනීමය. එසේම ඉකුත් යහපාලන ආණ්ඩුව මගින් ඉදිරිපත් කළ 19 වැනි සංශෝධනය ද අවුල් ජාලයක් වී ඇති අතර එය සැකසූ ජයම්පති වික්‍රමරත්න වැනි නීති විශාරදයන් ද පසු කාලයකදී 19 වැනි සංශෝධනයේ නොගැළපීම් ගැන සඳහන් කර ඇත.

ඉහත සඳහන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන මගින් සිදුකර තිබුණේ රටේ පොදු නීතිය හැල්ලු කිරීමය. එය කුමන රටකට වුව ද හිතකර තත්ත්වයක් නොවේ. සුද්දන් විසින් මෙරටට හඳුන්වා දෙනු ලැබූ ඒ.ආර්. සහ එෆ්.ආර්. රටේ ඉදිරි ගමනට බාධාවක් වී ඇත්නම් ඒවා යාවත්කාලීන කළ යුතු බව සැබෑය. එහෙත් ඒවා කළ යුතුවන්නේ එක් එක් පුද්ගලයාගේ සිතු මනාපයට නොව අදාළ විෂයය පිළිබඳ විශේෂඥ දැනුමක් සහිත විද්වත් මණ්ඩලයක අධීක්ෂණයෙනි.

මෙරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 20 වැනි වරටත් සංශෝධනය කළ යුතු බවට මේ වනවිටත් යම් කතාබහක් පවතී. 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ බරපතළ හිඩැස් කීපයක් පවතින බැවින් එය කාලයට ගැළපෙන පරිදි සංශෝධනය කළ යුතු බව අපගේ ද අදහසයි. එහෙත් එය කළයුතු වන්නේ ඉතාමත් සීරුමාරුවටය. එසේ නොවුණහොත් සිදුවන්නේ යළිත් වරක් පඹගාලක පැටළීමය. එවැන්නකට ඉඩ තැබීම කිසිසේත්ම නොකළ යුත්තකි.

මේ අතර සමස්ත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවම අලුතින් සකස් කළ යුතු බවට ද ප්‍රබල මතයක් පවතී. එය ද ඉතා හොඳ අදහසකි. එහෙත් එය කළයුතු වන්නේ 1978 දී මෙන් එක් එක් පුද්ගලයාගේ පෞද්ගලික හෝ දේශපාලනික අභිමතාර්ථයන් මුදුන්පත් කර ගැනීමේ අරමුණින් නොවේ. රටේ ජාතික අවශ්‍යතාවන්ට මුල් තැන දෙමිනි.

වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන්ට රට ගැනත්, රටේ අනාගතය ගැනත් ඉතා හොඳ දැක්මක් තිබේ. ඉකුත් ජනාධිපතිවරණයේදී මෙන් ම ඉකුත් මහ මැතිවරණයේදීත් මෙරට බහුතර ජනතාව විසින් ඉහළින් ම අනුමැතිය පළවූයේ එම නිවැරැදි දැක්මට ය. එහෙයින් කවුරුන් මොන මුසාවක් ඇද බෑවද තමන්ගේ දර්ශනය තමන් බලාපොරොත්තු වූ අයුරින් ම ක්‍රියාත්මක කිරීම ජනාධිපතිතුමන් සතු වගකීමකි. මන්ද එය මෙරට ජනතාව අතරින් 2/3 කගේ අභිමතය වන බැවිනි. එසේම අභිනව ආණ්ඩුවේ ඉදිරි ගමන යල් පැනගිය ඒ. ආර්. සහ එෆ්.ආර්. වලින් සීමා කිරීමට ද ඉඩ නොතැබිය යුතු ය. වර්තමානයේ රටේ ජාතික අවශ්‍යතාව වී ඇත්තේ ජනහිතකාමී ශක්තිමත් ආණ්ඩුවකි.

එසේ නොවුණහොත් සිදුවන්නේ මෙරට කීර්තිමත් දේශපාලන අතීතයක් ඇති එ.ජා.ප. යට වර්තමානයේ සිදුවී ඇති කනගාටුදායක ඉරණමට සමාන තත්ත්වයකට මුහුණපෑමට අනෙක් පාලක පක්ෂවලට ද සිදුවීමය.

## පස් නිවුන්...

කොළඹ ද සොයිසා කාන්තා රෝහලෙන් පස් නිවුන් දරු උපතක් වාර්තා වෙයි. අගෝස්තු 28 වැනිදා පෙරවරුවේ උපත ලැබූ මෙම දරුවෝ පස්දෙනාම ගැහැනු දරුවෝ වෙති. දැරියන් පස්දෙනාම නිරෝගී සුවයෙන් පසු වෙති. එහෙත් දැඩි වෛද්‍ය අධීක්ෂණයක් දරුවන් වෙත යොමු කිරීමට අවශ්‍ය නිසා දැරියන් පස් දෙනා නොමේරු ළදරු ඒකකයට ඇතුළත් කර ඇත. මව ද මනා ශරීර සෞඛ්‍යයෙන් පසු වුවද දැඩි සත්කාර ඒකකයේ රඳවා ගෙන සිටින්නේ ඈ කෙරෙහි ද විශේෂ අවධානයෙන් පසු විය යුතු නිසා බව රෝහල් අධ්‍යක්ෂිකා වෛද්‍ය සාගරි කිරිවන්දෙණිය සඳහන් කරයි. ද සොයිසා කාන්තා රෝහලේ මහාචාර්ය ඒකකයේ නේවාසිකව සිටි පස් නිවුන් දරුවන්ගේ මවට සිසේරියන් සැත්කම සිදු කළේ ප්‍රබෝධන රණවීර සහ මොහොමඩ් රිෂාඩ් යන වෛද්‍යවරුන් දෙපළ විසිනි. ගම්පහ පැපිලියවල පදිංචි යුවළකට දාව උපන් මෙම දැරියන් පස්දෙනා, ඔවුන්ගේ ප්‍රථම දරු උපත වේ. මව රසාංජලි ජයවර්ධන 29 වැනි වියේ පසුවෙයි. පියා සුළු පරිමාණ ව්‍යාපාරිකයෙකි.

## උ.පෙළ - 5 ශිෂ්‍යත්වය...

දෙසැම්බර් මස පැවැත්වීමට නියමිත 2020 වර්ෂය සඳහා වූ අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය හා මේ වසරේ අවසන් පාසල් වාර පැවැත්වෙන දින හා වාර අවසන් නිවාඩු කාලය පිළිබඳ වෙනස් කම් රැසක් සිදු කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය මෙන්ම විභාග දෙපාර්තමේන්තුව තීරණය කර ඇත. ඒ අනුව දෙසැම්බර් මස පැවැත්වීමට නියමිත වූ අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය 2021.01.18 සිට 2021.01.27 දක්වා පැවැත්වීමට විභාග දෙපාර්තමේන්තුව තීරණය කර ඇත. විභාගය පැවැත්වෙන මෙම කාල පරිච්ඡේදය සියලු පාසල් සඳහා විශේෂ නිවාඩු කාලයක් ලබා දීමට අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කර ඇත. දෙසැම්බර් වාර අවසන් නිවාඩු හිමිවන්නේ දින කිහිපයක් පමණි.

අධ්‍යාපන අමාත්‍යාංශය පවසන පරිදි 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය 2020 ඔක්තෝබර් 11 වැනි ඉරිදා පැවැත්වීමටත්, උසස් පෙළ විභාගය ඔක්තෝබර් 12 වැනි දින සිට නොවැම්බර් 06 දක්වා පැවැත්වීමටත් තීරණය කර ඇති හෙයින් ඔක්තෝබර් 10 දින සිට නොවැම්බර් 08 වනදා දක්වා පාසල් දෙවන වාර නිවාඩුව සිසුන්ට හිමි වෙයි. ඒ අනුව තෙවැනි පාසල් වාරය 2020 නොවැම්බර් 09 වැනිදායින් ආරම්භ වන අතර, එය 2020 දෙසැම්බර් 23 දායින් අවසන් කෙරේ.

## අඩුවට මාළු දෙන්න...

මෙරට මුහුදු සීමාවේ මත්ස්‍ය අස්වැන්න වර්ධනය කරමින් දුම්රිය මැදිරි, බස්රථ හා ධීවර යාත්‍රා 172ක කෘත්‍රිම අභිජනන මධ්‍යස්ථාන ඇති කිරීමට හා මත්ස්‍ය පැටවු 90,000 ක් වැව්වලට මුදා හරිමින් මෙරට ධීවර ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීමට රජය සූදානම් වෙයි. ටින් මාළු නිෂ්පාදනයට අවශ්‍ය මත්ස්‍ය අවශ්‍යතාව දේශීයව සපුරා ගන්නා ලෙසද පසුගියදා ජනාධිපති කාර්යාලයේදී පැවැති සාකච්ඡාවකදී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා උපදෙස් දී ඇත. එමෙන්ම මාළු, කරවල, උම්බලකඩ, ටින්මාළු ආනයනයට වාර්ෂිකව වැය කරන ඩොලර් මිලියන 500කට ආසන්න මුදලින් යම් ප්‍රමාණයක් අඩු කර ගැනීමට ද ජනාධිපතිතුමා උපදෙස් දී ඇත. කරවල නිෂ්පාදනයේදී මෙරට සාගරයෙන් සපයාගත නොහැකි මත්ස්‍යයන් පමණක් ආනයනය කළ යුතු බවට මෙහිදී ජනාධිපතිවරයා උපදෙස් දුන්නේය.

## කොරෝනාවෙන් දරුවන් බිලියන 1.5කට පීඩා

**(භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්)**

කොවිඩ් - 19 වෛරසය ව්‍යාපෘතිය හේතුවෙන් පාසල් වසා දැමීමෙන් ලොව පුරා දරුවන් බිලියන එක හමාරක් පමණ දැඩි පීඩාවට පත්ව ඇති බව 'යුනිසෙෆ් සංවිධානය' පවසයි. පීඩාවට පත්ව ඇති දරුවන්ගෙන් වැඩිම ප්‍රමාණයක් අප්‍රිකා කලාපයේ දරුවන් බවටද යුනිසෙෆ් සංවිධානය වෙත තොරතුරු ලැබී තිබේ. දකුණු ආසියානු කලාපීය රටවල්වල පාසල් දරුවන් මිලියන 147 ක් පීඩාවට පත්ව සිටින බව ද එම සංවිධානය සඳහන් කරයි.

## 'සුරස' 31 සිට මාතරට

ෆාස්ට් පබ්ලිෂින් ආයතනයේ ප්‍රථම ප්‍රාදේශීය ශාඛාව 'සුරස පොත් මැදුර' සම්මානිත මහාචාර්ය සුනිල් ආරියරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් සහ සුවිශේෂ ආරාධිතයන් රැසකගේ සහභාගිත්වයෙන් අගොස්තු 31 වැනිදා පෙරවරු 10.15 ට, මාතර, අකුරැස්ස පාරේ, අංක 33 බී දරන ස්ථානයේදී විවෘත කෙරේ. මේ සමඟම දකුණු සිරිලක රසික රසිකාවියන්ට සාහිත්‍ය සේවනය සඳහා ඇති අවස්ථාවන් තව තවත් පුළුල් වනු ඇත.

## පිහිටවන්න

මිනුවන්ගොඩ මහගම හොරම්පැල්ල 320/ඒ පදිංචි ඩබ්ලිව්. පී.සී. කුමුදුනී වීරතුංග (56) දරුණු වකුගඩු රෝගයෙන් පෙළෙන හෙයින්, 'ඕ' රුධිර කාණ්ඩයේ වකුගඩුවක් අවශ්‍යව ඇත. පරිත්‍යාගශීලීන් සිටී නම් 0771332088 - 0779041516 අංකවලට අමතන්න.

## විද්‍යෝදය සාහිත්‍ය සම්මාන 02 දා

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයීය විද්‍යෝදය සාහිත්‍ය සම්මාන ප්‍රදානය 2020 සැප්තැම්බර් මස 02 වැනි බදාදා පස්වරු 3.30 ට විශ්ව විද්‍යාලයීය සුමංගල මන්දිරයේදී පැවැත්වේ. මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨාධිපති මහාචාර්ය ශිරාන්ත හීන්කෙන්ද උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ යන මහත්වරුන්ගේ සහභාගිත්වයෙන් හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග මහතාගේ ප්‍රධානත්වයෙන් එය පැවැත්වේ

## සාහිත්‍ය කලා වැඩමුළුවක් මාතලේදී

නවක ශිල්පීන්ට අත්දැකීම් වෙනුවෙන් 'පහන් ටැඹ සාමූහිකය' මෙහෙයවන එක් දින සාහිත්‍ය කලා වැඩමුළුවක් සැප්තැම්බර් 26 දා දවස පුරා මාතලේ මහත්මා ගාන්ධි ගුණසමරු ශාලාවේදී පැවැත්වේ. මෙහිදී කවිය, කෙටිකතාව, ගීත රචනය සහ චිත්‍ර කලාව වැනි අංශ කිහිපයක් පිළිබඳව ප්‍රවීණ කලාකරුවන් සමඟ අත්දැකීම් බෙදා හදා ගැනීමට අවස්ථාව සැලසේ. ප්‍රවීණ නිර්මාණ ශිල්පී රත්න ශ්‍රී විජේසිංහයන් මෙහෙයවන 'කාව්‍ය නිර්මාණය හා ගීත රචනය පිළිබඳව දේශනයක්ද එහිදී පැවැත්වේ. ට සවන් දීමටද අවස්ථාව ලැබෙනු ඇත. සහභාගි වීමට කැමැති ආධුනික නිර්මාණ ශිල්පීන් නම, ලිපිනය හා දුරකථන අංකය, පහන් ටැඹ සාමූහිකය වෙත දැන්විය යුතුය.'පහන් ටැඹ' ෆේස්බුක් කණ්ඩායම වෙත පණිවිඩයක් එවීමෙන් හෝ Pahantamba2020@gmail.com විද්‍යුත් තැපෑලෙන් හෝ 0779769800 අංකයට ඇමතුමක් හෝ කෙටි පණිවිඩයක් දීමෙන් හෝ සම්බන්ධ විය හැකිය.

## පහන් ටැඹ සාමූහිකයෙන් නිර්මාණ තරගාවලියක්

නවක තරුණ නිර්මාණවේදීන්ගේ ගමන ඔප නැංවීම සඳහා 'පහන් ටැඹ සාමූහිකය' කලා අංගයන් මූලික කොට දීපව්‍යාප්ත නිර්මාණ තරගාවලියක් පවත්වනු ලැබේ.

කාව්‍ය, කෙටිකතා, ගීත රචනා, ළමා කතා, චිත්‍ර, ඡායාරූප, කෙටි චිත්‍රපට (ජංගම දුරකතනයෙන් රූගත කළ) යන අංශවලින් නිර්මාණ කැඳවනු ලැබේ. නිර්මාණ භාර ගැනීමේ අවසාන දිනය 2020 ඔක්තෝබර් 15 දා වන අතර වැඩි විස්තර pahantamba2020@gmail.com විද්‍යුත් තැපැල් මගින් හෝ 'පහන් ටැඹ සාමූහිකය', 63, එදිරිවීර සරච්චන්ද්‍ර මාවත, පිටකෝට්ටේ යන ලිපිනයට තම ලිපිනය ලියූ මුද්දර කවරයක් එවීමෙන් ලබා ගත හැකි ය.

## ෂේක්ෂ්පියර් නාට්‍ය කණ්ඩායම ස්ථාපිත කෙරේ



**(නිශානි බන්නැහැක)**

ෂේක්ෂ්පියර් ජාත්‍යන්තර පදනමට අනුබද්ධිත ශ්‍රී ලංකා ෂේක්ෂ්පියර් නාට්‍ය කණ්ඩායම ස්ථාපිත කිරීම පසුගියදා අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්. පීරිස්ගේ ප්‍රධානත්වයෙන් සුදර්ශී ශාලා පරිශ්‍රයේදී පැවැත්වුණි.

නාට්‍ය කණ්ඩායමේ 55 ට උසස් සාමාජිකත්ව සහතික පිරිනැමීම සහ The tempest (හංස ගීතය) පරිවර්තන නාට්‍යයේ මුහුරත් උලෙළ ද මීට සමගාමීව පැවැත්වුණි.

ආරාධිතයන් පොල් තෙල් පහන දැල්වූ අවස්ථාවයි මේ.

මෙම අවස්ථාව සඳහා පූජ්‍ය ඇල්ලේ ගුණවංශ හිමියන්, ෂේක්ෂ්පියර් පදනමේ නිර්මාතෘ ඔබිනාමුණි ගාමිණී ද සිල්වා, හිටපු පළාත් සභා මන්ත්‍රී, හෙක්ටර් බෙත්මගේ, නීතිඥ යජිෂ් තෙන්නකෝන් ආචාර්ය නිලංකා ලියනගේ ඇතුළු විශාල පිරිසක් සහභාගි වූහ.

## ගැමියාගේ සනීපාරක්ෂාව නංවන්න උපකාර පතයි

**(ජයසූරිය උඩුකුඹුර)**

ග්‍රාමීය ජනතාවගේ සනීපාරක්ෂක කටයුතු වැඩි දියුණු කිරීමේ විශේෂ වැඩ පිළිවෙළක් දියත් කරන බව පැවිදි හඬ සංවිධානයේ හා එක්සත් රාජ්‍ය සේවා භෙද සංගමයේ සභාපති මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමියෝ සඳහන් කරති. දිවයිනේ බොහෝ ගම්මානවල ජනතාවට වැසිකිළි පහසුකම් හා පානීය ජලය හිඟ බව ආනන්ද නාහිමියෝ පෙන්වා දෙති. ගැමි ජනතාවගේ මූලික සෞඛ්‍යය පහසුකම් දියුණු කිරීම සඳහා රටේ දානපතියන් තම තමන්ට හැකි අයුරින් දායක වන ලෙසද නාහිමියෝ ඉල්ලා සිටිති. වැඩිවිස්තර සඳහා 011-2584084 යන දුරකථන අංකය අමතන ලෙස ඉල්ලීමක් කෙරේ.

## සායි දිනකර් සිසුවාට ජාත්‍යන්තර ජයග්‍රහණයක්



'කොරෝනාවට එරෙහිව එක්වෙමු ' නමින් ඉන්දියානු සංස්කෘතික කවුන්සිලය විසින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර චිත්‍ර තරගාවලියකින් සුවිශේෂී ජයග්‍රහණයක් ලබාගැනීමට දස හැවිරිදි පාසල් සිසුවෙකු වන සායි දිනකර් සමත්ව ඇත. දෙහිවල ජාත්‍යන්තර පාසලක අධ්‍යාපනය ලබන දිනකර් තමාට හිමි ත්‍යාගය හා සම්මාන සහතිකය ඉන්දීය මහකොමසාරිස් කාර්යාලයට අයත් සංස්කෘතික කේන්ද්‍රය වන ස්වාමි විවේකානාන්ද සංස්කෘතික කේන්ද්‍රයේ අධ්‍යක්ෂ අචාර්ය රෙවන්ට් වික්‍රම් සිං මහතා අතින් ලබාගත් අවස්ථාව.

## වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සාමාජිකත්වය අලුත් කිරීම අනිද්දා සිට

ශ්‍රී ලංකා වෘත්තිය ජනමාධ්‍යවේදීන්ගේ සංගමයට නව සාමාජිකයන් බඳවා ගැනීම සහ දැනට සිටින සාමාජිකයන්ගේ සාමාජිකත්වය අලුත් කිරීම 2020 සැප්තැම්බර් මස 01 සිට 30 දක්වා සිදුකෙරේ. වැඩිදුර තොරතුරු සඳහා පහත දුරකතන අංක වෙත අමතන්න. සභාපති දුමින්ද සම්පත් - 0773181731 ලේකම් ෆ්‍රෑන්ක් ද සොයිසා - 0715493815

## කාගම සිරිනන්ද හිමිගේ දම් දෙසුමක්

කාගම සිරිනන්ද හිමිගේ ධර්ම දේශනයක් 30 වැනිදා පස්වරු 5.30 ට නුගේගොඩ නාලන්දාරාමයේදී පැවැත්වේ. එහි දායකත්වය සංඝමිත්තා කුලඟන සමිතියයි.

## මාතර මංගල්‍යය තෙදිනක්

මාතර අප ස්වාමිදුවගේ ජාතික සිද්ධස්ථානයේ 113 වැනි වාර්ෂික මංගල්‍යය සැප්තැම්බර් 4,5,6 තෙදින සිදු කෙරේ.

අගෝස්තු 30 වැනිදා පස්වරු 4.00 ට කොඩි ගස එසවීමෙන් මේ උත්සවය ආරම්භ කෙරේ.

# සිළුමිණ ප්‍රවෘත්ති කර්තෘගෙනුත් පාස්කු කොමිසම සාක්කි ලබාගනී

**(භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්)**

මෙරට තුළ අන්තවාදීන් ක්‍රියාකාරී වන බව සිළුමිණ පුවත්පත මගින් 2015 වසරේ ජූලි මස 26 වැනිදා අනාවරණය කළේ සිළුමිණ ප්‍රධාන උප කර්තෘ ධුරය දැරූ වත්මන් සිළුමිණ ප්‍රවෘත්ති කර්තෘ තාරක වික්‍රමසේකරයන්ය. 'අයිඑස්අයිඑස්' අවසානයක්ම වේවා! යනුවෙන් ඔහු එදා පුවත්පතින් අනාවරණය කර තිබුණේ මධ්‍යම පළාතට අයත් ගලේවෙල පදිංචි නිලාම් නොහොත් අලි සක්කුල් සෙයිලානි නම් මුස්ලිම් ජාතික අයකු සිරියාවේ අයිඑස්අයිඑස් සංවිධානයට බැඳී ඇති බවත් ඔහු ඇමරිකානු ගුවන් ප්‍රහාර හමුවේ මිය ගිය බවත්ය. එමෙන්ම ඔහුගේ සියලු විස්තර හා ඔහු හා ඇසුරු කළ අය පිළිබඳවත් එහි විස්තර කර තිබුණි. නිලාම් ගලේවෙල හා කොටහේන ප්‍රදේශයේ පාසල් දෙකක උගන්වා ඇති බවත් ඔහු පාකිස්ථානයේදී අන්තවාදී ක්‍රියා පිළිබඳව අධ්‍යයනය කර ඇති බව එම ලිපියෙන් පෙන්වා දී තිබුණි. සය දරු පියකු වන නිලාම් මහනුවර වැරැල්ලගම අයකු බවත් ඔහු ඇසුරු කළ අය පිළිබඳව සොයා බැලීම කළ යුතුම බව ඔහු එම ලිපියෙන් අවධාරණය කර තිබුණි.

සිළුමිණ පුවත්පතට 2018.12.30 ලිපියක් පළ කරමින් ඔහු පෙන්වා දුන්නේ තිරුක්කෝවිල් යුද හමුදා කඳවුර ඉවත් කිරීමට නැඟෙනහිර මුස්ලිම් දේශපාලඥයන් කටයුතු කළද දෙමළ ජනතාව එම හමුදා කඳවුර ඉවත් කිරීමට විරෝධය පෑ බවයි. ඔවුන්ගේ ආරක්ෂාව පිණිස කඳවුර තිබිය යුතු බව පවසන එම ජනතාව පෙත්සමක් අත්සන් කරමින් මෙන්ම විරෝධතා ව්‍යාපාරයක් පැවැත්වූ අයුරු සේයාරූ සහිතව පෙන්වා දී තිබුණි.

මාවනැල්ල බුදු පිළිමවලට හානි කිරීමෙන් පසුව 'වනාතවිල්ලුව අවි ගබඩාව කාගේද?' යන සිරස්තලයෙන් යුක්ත ලිපියක් 2019 ජනවාරි 20 වැනිදා පළ කෙරෙන්නේ කොටි සෙවණැලි මේ අස්සේ තිබෙන්නට ඉඩ තිබුණද එවකට වවුනතිව් පොලිස් නිලධාරීන් දෙදෙනකු ඝාතනය කිරීම ගැන වැඩි අවධානය යොමු කරමිනි. එමෙන්ම පාස්කු ප්‍රහාරයෙන් පසුව යුද හමුදාපති ලුතිනන් ජනරාල් මහේෂ් සේනානායක හමු වී කළ සාකච්ඡාවකදී ඔහු අවධාරණයෙන් විමසා ඇත්තේ පාස්කු ප්‍රහාරයේ සැකකරුවන් නිදහස් කිරීමට දේශපාලන බලපෑම් යොමු වීම සම්බන්ධයෙනි. මන්නාරමේ ප්‍රබල දේශපාලඥයකු බලපෑම් එල්ල කළ බව හමුදාපතිවරයා පිළි ගත් බව ඔහු හෙළි කරන ලද්දේ 2019 මැයි මස 5 වැනිදා සිළුමිණෙනි.



සිළුමිණ ප්‍රවෘත්ති කර්තෘ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී තාරක වික්‍රමසේකර පාස්කු ප්‍රහාරය පිළිබඳ කොමිසමට ප්‍රකාශක් දීමට පැමිණි අවස්ථාව

පාස්කු ප්‍රහාරය පිළිබඳව විමර්ශනය කරනු ලබන ජනාධිපති කොමිසම විසින් කළ දැනුම් දීමක් අනුව තාරක වික්‍රමසේකරයන් එම කොමිසමේ විශේෂ පොලිස් ඒකකයට පෙරවරු 9.30ට පැමිණි පස්වරු 2.30 වන තෙක් පැය 5ක ප්‍රකාශ ලබා දෙන ලදි.

සේයාරුව - දුෂ්මන්ත මායාදුන්නෙ


පෞද්ගලික ජෙට් යානයෙන් ලංකාවට පැමිණි රෝගී ඇන්ඩෘ වෛද්‍ය කාර්ය මණ්ඩලය විසින් ඉන් පිටතට ගන්නා අයුරු


කටුනායක ගුවන්තොටුපළට ගෙන ආ රෝගී ඇන්ඩෘ රෝහලට ගෙනයාමට ගිලන් රථයට නැංවීමට පෙර


ඇන්ඩෘ රොහාන් (ඉදගෙන වමේ) සමාගමේ කාර්ය මණ්ඩලයේ පිරිසක් සමඟ


රජයේ ගැසට් පත්‍රය
සැප්තැම්බර් 06 වනදා සිට
සිළුමිණ
පුවත්පත සමඟ
නොමිලේ


# සෞදියේ වැලිකතර සිහිල් කළ මනුසත්කම

## සෞදි සමාගමක් රුපියල් ලක්ෂ 107ක් වැය කර විශේෂ ජෙට් යානයකින් ලංකාවට ගෙන ආ ලාංකේය රෝගියාගේ විශ්මිත කතාව

● රජිත බස්නායක

**ලෝකයේ පවතින මානව ධර්මීය ගුණයන් අතරින් ඉහළින්ම ඇති ගුණයක් වන්නේ පරෝපකාරයයි. එය හුදු සිතුවිල්ලකට පමණක් සීමා නොවී අප ජීවත් වන්නා වූ ලෝකය තුළ නිබඳව රැඳී පවතින්නකි. එක් රටකට කලාපයකට හෝ එක් කුලයකට සීමා නොවී කවරකු හෝ තවත් අයකුට උපකාර කරන්නේ නම් එය අප සැම බලාපොරොත්තු වන මානුෂිකත්වයේ සලකුණකි. කවරකු හෝ තම ජීවිත කාලය තුළ එක්රැස් කරනු ලබන මිල මුදල් යාන වාහනවලට වඩා වටිනාකමක් රැඳී පවතින්නේ ඔහු හෝ ඇය විසින් කරනු ලබන කුසල කර්මයන් මතය.**

පුද්ගලයකු විසින් කළ යහපත් ක්‍රියාවල ප්‍රතිඵල ලැබෙන්නේ ඒ පුද්ගලයා වෙතය. එහි ප්‍රතිඵල ලැබීමට නම් මෙලොව පරලොව කියා භේදයක් නැත. කරනු ලැබූ කටයුතුවල පුණ්‍ය බල මහිමය මෙලොව දීම අත්විඳින්නට ලැබේ නම් එය එක්තරා අන්දමකින් පුදුමාකාර වාසනා ගුණයකි. එකී පින්බර වාසනා ගුණයක් ලැබීමට මුල් වූ පුද්ගලයකු ලෙස 59 හැවිරිදි ඇන්ඩෘ රොහාන් හැඳින්විය හැකිය. ඔහු පිළිබඳ කතාව ඇරඹෙන්නේ ඔහු සෞදි සමාගමක සේවය කළ අවධියේදී ඇති වූ රෝගී තත්ත්වයක් නිසා පෞද්ගලික ජෙට් යානයක් මඟින් කටුනායක ගුවන් තොටුපළට රැගෙන ඒමත් යන පුවත සමඟිනි.

ශ්‍රී ලංකාවේ ශ්‍රමිකයන් ලක්ෂ 15ක පමණ පිරිසක් මේ වන විට විදෙස් රටවල සේවය කරනු ලබන අතර එයින් වැඩිම පිරිසක් එනම් ලක්ෂ 10ක් පමණ සේවය කරනු ලබන්නේ මැදපෙරදිග රටවලය. එපමණක් නොව විදෙස් ශ්‍රමිකයන්ගෙන් ලංකාවට වැඩිම ආදායමක් ගෙන එනු ලබන්නේද මැද පෙරදිග රටවල සේවය කරන ශ්‍රී ලාංකිකයන්ය. එසේ කාලයක් පුරා ශ්‍රී ලාංකිකයන් මැදපෙරදිග රටවල ශ්‍රමිකයන් ලෙස කටයුතු කළ ද එම රටවල පුරවැසියන් සහ හාම්පුතුන් තමා යටතේ සේවය කරන්නන්ට සැලකීම සම්බන්ධයෙන් පවතින්නේ යහපත් තත්ත්වයක් නොවේ. නිතර අපට අසන්නට දකින්නට ලැබුණේ ඔවුන් යටතේ සේවය කරන්නවුන්ට සිදු කරන හිරිහැර ගැන දුක්ඛිත කතාය. නමුත් මේ සියල්ල මොහොතකට හෝ අමතක කර දැමීමට හේතු වන ආකාරයේ එක් සිදුවීමක් පසුගිය දිනෙක අපට දැනගන්නට ලැබිණි. එනම් සෞදි සමාගමක් විසින් එහි සේවය කළ ශ්‍රී ලාංකිකයකු අසනීප වීම හේතුවෙන් ඔහු ලංකාවේ තම පවුලේ ඥාතීන් වෙත ගෙනවිත් බාර දීමට තරම් කාරුණික වීම ඒ අපූරු පුවතයි. ඒ සිදුවීම වූයේ අගෝස්තු 21 වනදා ය. මේ ආකාරයට ලංකාවට ගෙන එනු ලැබුවේ අප මුලින් කී කඳාන ප්‍රදේශයේ පදිංචිව සිටින ඇන්ඩෘ රොහාන්

මෙම කරුණත් සමඟ බොහෝ දෙනෙක් විමසිලිමත් වූයේ එම සිදුවීම වූයේ කවර හේතුවක් නිසා ද යන්න සොයා බැලීමටය. මේ සිදුවීමේ සුලමුල කුමක්ද යන්න දැනගැනීමට බොහෝ දෙනකු තුළ උනන්දුවක් ඇතිවූයේ සෞදි අරාබිය වැනි රටකින් ශ්‍රී ලාංකික ශ්‍රමිකයකු එවැනි සැලකිල්ලකට සහ ගරුත්වයකට ලක්වීමට තරම් විශේෂිත වූයේ ඇයිද යන කරුණ සම්බන්ධයෙනි. එපමණක් නොව ජාත්‍යන්තරයේ පවා බොහෝ දෙනෙක් මේ සම්බන්ධව කතා බහ කරන්නට වූහ.

එවැනි විශේෂ සැලකීමකට බඳුන් වූ ඇන්ඩෘ රොහාන් උප්පත්තිය ලැබුවේ 1960 වර්ෂයේ අගෝස්තු 29දා මඩකලපුවේදී ය. උපතින් කතෝලික භක්තිකයෙකු වූ ඇන්ඩෘ තම මූලික අධ්‍යාපනය හදාරන්නට පිවිසෙන්නේ මඩකලපුව ශාන්ත පීතර විද්‍යාලයටය. එයින් අනතුරුව ඔහුගේ උසස් අධ්‍යාපනය තවදුරටත් ඉහළ නංවාලීම පිණිස ඇන්ඩෘගේ දෙමාපියන් ඔහු ඇතුළත් කරනු ලබන්නේ මඩකලපුව ශාන්ත මයිකල් විද්‍යාලයට ය. කතෝලික භක්තිකයෙකු වූ ඇන්ඩෘ පදිංචිව සිටියේ කඩවත ප්‍රදේශයේ ය. ඔහුගේ ජීවන සහකාරිය බවට පත්වූයේ මාග්‍රට් ජෝන් ය. ඔවුන්ට දරුවන් තිදෙනකු සිටින අතර සිටින අතර එක් පුතෙකු වූ ශිරාන් දැනට ප්‍රංශයේ ජීවත් වන අතර අනෙක් පුත්‍රයා වන රොෂාන් සහ දියණිය කාමිණි ලංකාවේ පදිංචිව සිටී.

ඇන්ඩෘ රොහාන් අසනීප වන විට සේවය කරමින් සිටියේ ජෙඩා නුවර පිහිටි ගල්ෆ් වෙස්ට් සමාගමේය. තුන්සියයකට ආසන්න සේවක සංඛ්‍යාවක් සේවය කරනු ලබන එම ආයතනයේ සියල්ලන්ගේම හිත දිනාගත් අයකු ලෙස ඇන්ඩෘ කා අතරත් ජනප්‍රියව සිටියේය. ඕනෑම අයකුට උදවු කරන මනුෂ්‍යත්වයෙන් සහ පිරි නිතහමානී හදවතක් ඔහු සතු විය. සෞදි අරාබියේ සේවයට වසර තිස් එකකට ආසන්න වුවද ඔහු ගල්ෆ් වෙස්ට් සමාගමේ සේවය අරඹනු ලැබුවේ මීට වසර පහළොවකට පමණ ඉහතදීය. අසනීප වන විට ඔහු එම සමාගමේ විකුණුම් හා අලෙවි කරන කළමනාකරුවකු ලෙස තම සේවය සලසමින් සිටි අතර ඔහු යටතේ සේවකයන් 31 දෙනෙකු සේවය කරමින් සිටියහ.


රෝගි වූ ඇන්ඩෘ රොහාන්

ඔහු සහ එම සේවකයන් අතර සම්බන්ධතාව කෙතරම් මානුෂිය දැයි කිවහොත් ඇන්ඩෘ ඔහුට ලැබෙන බෝනස් මුදල පවා තම සේවකයන් සමඟ බෙදා ගන්නට තරම් නිර්ලෝභී අයකු විය. එපමණටම මෘදු, කාරුණික හදවතක් ඔහු සතුව තිබිණ. පරිත්‍යාගශීලී බව, කාරුණික බව, කළගුණ සැලකීම වැනි උතුම් ගතිගුණ ඇන්ඩෘගේ ජීවිතය තුළ ඕනෑවටත් වඩා ඉහළින් තිබූ බව ඔහු ඇසුරු කළ කවුරුත් හොඳින්ම දන්නා කරුණකි. එහෙත් ජීවිතයේ ඇතැම් දෑ සිදු වන්නේ අප කිසිවකු සිතන පතන අයුරින්ම නොවේ. ඇන්ඩෘ රොහාන්ගේ ජීවිතයටද ඒ සත්‍යය පිටු දකින්නට අපහසු විය.

පසුගිය ජුනි මස 24 වැනිදා ඔහු හදිසියේම අසනීප වූයේ සේවයේ නිරතව සිටියදීය. ඔහු පළමු වරට රෝගී වූයේ එදිනය. එම අසනීපය ආඝාත (Stroke) තත්ත්වයකි. ඒ සඳහා ඔහුට හදිසි වෛද්‍ය ප්‍රතිකාර සිදු කළ අතර වෛද්‍යවරුන් විසින් ඔහුගේ රෝගී තත්ත්වය හඳුනා ගැනීමටද සමත් වූහ. ඒ අනුව එරට වෛද්‍යවරුන්ගේ නිගමනය වූයේ ඇන්ඩෘගේ මොළය අභ්‍යන්තරයේ ජලය වහනය වීමෙන් ඔහු ඒ ආකාරයට රෝගී තත්ත්වයට පත්ව ඇති බවයි. පසුගිය ජූලි මස 24 වැනි දින එසේ හදිසියේ රෝගී තත්ත්වයට ලක්වන්නට පෙර ඇන්ඩෘ ගිය වසරේ නත්තලට මෙරටට පැමිණියේය. ඊට පසු ඔහු යළිත් ලංකාවට පැමිණියේ තම බිරිය අසනීප තත්ත්වයෙන් සිටි නිසා ඇයගේ සුව දුක් බැලීමට ය.

දින දහයක කාලයක් බිරියගේ සුවදුක් සොයා බලමින් මෙරට රැඳී සිටි සිටි ඇන්ඩෘ යළිත් සෞදි අරාබිය වෙත පැමිණියේය. ඒ වන විටද ඔහු තමාගේ අසනීප තත්ත්වය සම්බන්ධයෙන් කිසිවක් දැන සිටියේ නැත. කෙසේවෙතත් එතෙක් යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් සේවය කරමින් සිටි ඇන්ඩෘට සිදුවූයේ හදිසියේ ඇතිව තිබූ අසනීප තත්ත්වයට එරටදී වෛද්‍ය ප්‍රතිකාර ලබා ගන්නටය. මෙසේ ප්‍රතිකාර ලබමින් සිටියදී ඇතිවූ කෝමා තත්ත්වය හේතුවෙන් ඔහු රෝහල් ගතව සිටියේ සම්පූර්ණ සිහිසුන්වය. සිහිසුන්ව එරට රෝහල්ගතව සිටි අවධියේ දී වෛද්‍යවරුන් විසින් ඔහු පිළිබඳ නිරන්තර අවධානයකින් සිටි අතර ඔහුගේ පවුලේ ඥාතීන්ගේ ඉල්ලීම වූයේ කෙසේ හෝ ඇන්ඩෘ මෙරටට ගෙන්වා දෙන ලෙසයි. ඔවුන් මෙම ඉල්ලීම කරනු ලැබුවේ සෞදි ගල්ෆ් වෙස්ට් සමාගමේ පාලනාධිකාරිය වෙතයි. ඇන්ඩෘ රොහාන්ගේ පවුලේ ඥාතීන්ගේ ඉල්ලීමට අනුව ගල්ෆ් වෙස්ට් සමාගමේ ප්‍රධාන විධායක වශයෙන් කටයුතු කරනු ලබන එදිරිස් මුස්තාපා මේ කටයුත්ත සම්බන්ධව තවත් එක් පුද්ගලයකු සම්බන්ධ කරගනු ලැබීය. ඒ, ඇන්ඩෘ සමඟ එක්ව එකම ආයතනයේ සේවය කරනු ලැබූ ෆාසී මරික්කාල්ය. එමෙන් ම සත්‍ය ශ්‍රිවා සහ රනිල් රෝගී ඇන්ඩෘ වෙනුවෙන් ලබාදුන් දායකත්වය ඉමහත්ය.

රෝගියා ලංකාවට ගෙන ඒම සඳහා ඔවුන් සමඟ සෞදි වෛද්‍ය කණ්ඩායමක්ද සූදානම් කරනු ලැබූ අතර රෝගියා මෙරටට ගෙන ඒම සඳහා පෞද්ගලික ජෙට් යානයක් ලබාදීමට ද කටයුතු කෙරිණ. මේ සම්බන්ධයෙන් එම ආයතනය මුලින්ම ශ්‍රී ලංකා තානාපති කාර්යාලය දැනුම්වත් කිරීමට කටයුතු කළහ. එම දැනුම්වත් කිරීමෙන් පසු පවුලේ ඥාතීන්ටද දන්වා රෝගියා වෛද්‍යවරුන් සහ අතුරු වෛද්‍ය නිලධාරීන්ගෙන් සමන්විත විශේෂ යානයකින් කොළඹ කටුනායක ගුවන් තොටුපළට ගෙන ඒමට සමත් විය

මෙසේ කොළඹට ගෙන එනු ලැබූ ඇන්ඩෘ රොහාන් වෛද්‍ය ප්‍රතිකාර සඳහා කොළඹ පෞද්ගලික රෝහලක් වෙත ගෙනයනු ලැබුවේ මෙරට සෞඛ්‍ය අංශ විසින් නිර්දේශිත නිරෝධායන කටයුතු අනුකූලවය. ඒ අනුව ඇන්ඩෘ රෝහල් ගත කිරීමෙන් පසු වෛද්‍ය කටයුතු භාරව කටයුතු කරනු ලැබුවේ විශේෂඥ වෛද්‍ය සුනිල් පෙරේරා මහතාය. රෝගී තත්ත්වය අනුව ඇන්ඩෘ ට සැත්කම් කිහිපයක් සිදු කිරීමට සිදුව තිබූ අතර එහි ප්‍රථම සැත්කම සිදු කරනු ලැබුවේ පසුගිය 25 වනදා කොළඹ මහ රෝහල ආසන්නයේ පිහිටා ඇති එම පෞද්ගලික රෝහලේදී මෙම සැත්කම සිදු කිරීම සඳහා පැය 5ක පමණ කාලයක් ගත වූ අතර එය ඉතා සාර්ථක ලෙස නිම කිරීමට වෛද්‍ය කාර්ය මණ්ඩලය සමත් විය. විශේෂඥ වෛද්‍ය සුනිල් පෙරේරා සඳහන් කරන්නේ ඉතිරි සැත්කම්ද මේ ආකාරයෙන් සාර්ථකව නිම වනු ඇති බවය. මේ මොහොත වන විටත් රෝගීයා බැලීමට අවසර ඇත්තේ එක් අයකුට පමණි.

මේ ආකාරයට ගල්ෆ් වෙස්ට් සමාගම විසින් ඇන්ඩෘ රොහාන් ලංකාවට ගෙන ඒම පිණිස අති විශාල මුදලක් වැය කර ඇති අතර එම මුදල ඇමරිකානු ඩොලර් 58,000 වේ. එය ශ්‍රී ලංකාවේ මුදලින් ලක්ෂ 107කට ආසන්නය. ගල්ෆ් වෙස්ට් සමාගම ඇන්ඩෘ මෙරටට පිටත්කර හැරීමෙන් පමණක් සිය වගකීම අත්හලේ නැත. මෙරට රෝහල්ගත වී ප්‍රතිකාර ලබන ඇන්ඩෘ පිළිබඳ සෞදි අරාබියේ සිටින ගල්ෆ් වෙස්ට් සමාගමේ නියෝජිතයකු නිරන්තරයෙන් සොයා බැලීම් සිදු කරන්නේ එම සමාගම් කළමනාකාරීත්වයේ උපදෙස් අනුවය.

ශ්‍රී ලාංකික ශ්‍රමිකයකු වෙනුවෙන් ඉටුකරනු ලබන එම සේවය පිළිබඳ සෞදියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය එම සමාගමට ස්තුතිය පුදකර තිබේ. සිය ආදරණීයා වෙනුවෙන් එම සමාගම විසින් ඉටු කළ මහඟු කාර්යය පිළිබඳ ඇන්ඩෘ රොහාන්ගේ පවුලේ සියලු දෙනා සිය කෘතඥතාව පළ කිරීමට ද අමතක නොකළහ. ඇන්ඩෘ රොහාන් වෙත සිය හාම්පුතුන් ගෙන් එවැනි සුවිශේෂ අනුග්‍රහයක් හිමිවූයේ ඔහු තුළ පැවති උදාර මානුෂික ගුණාංග නිසා බව නොකියාම බැරිය. මෙවැනි සිදුවීම්වලින් පසක් වන්නේ උතුම් වූ මනුෂ්‍යත්වයට පෙරළා ප්‍රතිඋපකාර ලැබෙන බවය.







ඔටර්ස් සමාජයේ නිර්මාතෘවරුන් වන ජී. ආර්. රොස්කොව්ස්කි (වමේ) ක්වින්ටස් සොයිසා (දකුණේ) මෙහි වෙති. සෙසු අය වන්නේ ඉබ්‍රම්සා සහ නිකී ඇන්තනීය.




# ඔටර්ස් ක්‍රීඩා සමාජයේ නොනිමෙන ගින්න

ඔටර් ක්‍රීඩා සමාජයේ තිබෙන ජාත්‍යන්තර තලයේ පිහිනුම් තටාකය

**මිලියන 31ක් රජයට ණයයි**

**වසර 87ක් පැරැණියි**

● අමිල මලවිසූරිය

**යටත්විජිත සමයේ ආරම්භ වූ ක්‍රීඩා සමාජ කිහිපයක්ම තවමත් කොළඹ නගරයේ දක්නට ලැබේ.**

කොළඹ හත, බෞද්ධාලෝක මාවතේ, 380/1 ස්ථානයේ පිහිටි ඔටර් ඇක්වටික් ක්ලබ් හෙවත් ඔටර් ජල ක්‍රීඩා සමාජයද මෙරට තිබෙන යටත්විජිත සමයේ ආරම්භ වූ පැරැණිම ක්‍රීඩා සමාජයක් ලෙස සැලැකේ.

1933 වර්ෂයේ මුලින් ගල්කිස්සේදී ආරම්භ කර ඇති මෙකී ක්‍රීඩා සමාජය වර්තමානයේ තිබෙන කොළඹ හතට රැගෙනවිත් ඇත්තෙ 1956 වර්ෂයේයි. පිහිනුම් ක්‍රීඩාවට අපමණ දායකත්වයක් සපයන ඔටර් ක්‍රීඩා සමාජය සතුව ජාත්‍යන්තර මට්ටමේ පිහිනුම් තටාකයක්ද වේ. ඊට අමතරව මේ වන විට පිහිනුම් තටාක තුනකින්ද සමන්විත ඔටර් ක්‍රීඩා සමාජය තුළ ටෙනිස්, බැඩ්මින්ටන්, ස්කොෂ්, බිලියඩ් සහ ස්නූකර්, කායවර්ධන, බාස්කට් බෝල්, ටේබල් ටෙනිස් වැනි ක්‍රීඩා ඉසව් රැසකටම ඉඩපහසුකම් සහිතය. එලෙස ක්‍රීඩා රැසකටම පහසුකම් සහිත කොළඹ නගරයේ තිබෙන එකම ක්‍රීඩා සමාජය ලෙසද මෙය සැලැකේ.

අක්කර දෙකකට අධික භූමි භාගයක් පුරා පැතිර තිබෙන ඔටර් ඇක්වටික් ක්‍රීඩා සමාජය පිළිබඳව පසුගිය දිනවල කරළියට ආයේ ක්‍රීඩා සමාජය පවත්වාගෙන යන රජය සතු ඉඩමට අදාළ බදු නොගෙවීම නිසා ක්‍රීඩා සමාජයට එම ඉඩමෙන් ඉවත් කරගන්නා ලෙසට එකී භූමියෙහි නිසි බලධාරි ලෙස කටයුතු කරන තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් ප්‍රියන්තා දිසානායක මහත්මියගේ අත්සනින් යුතුව නිකුත් කළ 'අස්කිරීමේ දැන්වීම' නිසාවෙනි. එම දැන්වීමෙන් දන්වා තිබුණේ 2020 සැප්තැම්බර් 30 වැනි දින හෝ එදිනට පෙර ක්‍රීඩා සමාජය එකී භූමියෙන් ඉවත්කරගන්නා ලෙසටයි.

මේ පිළිබඳව කරුණු ගවේෂණය කළ අප තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් ප්‍රියන්තා දිසානායක මහත්මිය හමුවූ මොහොතේ මෙසේ පැවැසුවාය.


"ගිය වර්ෂයේ සැප්තැම්බර් 30 වැනිදා මෙහි තිස් අවුරුදු බදු ගිවිසුම අවසන් වුණා. රජයේ වෙනත් අවශ්‍යතාවක් සඳහා මේ භූමියට ඒ වන විට ඉල්ලුමක් නොතිබූ නිසාත්, හිඟ මුදලක් තිබූ නිසාත් අපි ක්‍රීඩා සමාජයේ බලධාරින්ට වර්ෂයක කාලයක් ලබා දුන්නා හිඟ බදු මුදල් ගෙවන්න. ඒ කියන්නෙ ලබන සැප්තැම්බර් 30 දක්වා. පාලනාධිකාරිය හිඟ මුදල්වලින් යම් ප්‍රමාණයක් ගෙවීම් කළා. ඒත් තවත් මිලියන 31කට අධික මුදලක් ගෙවිය යුතුව තිබෙනවා."

මේ අතරේ කොළඹ නගරය තුළ වත්මන් රජය සිදු කිරීමට නියමිත ශීඝ්‍ර සංවර්ධන සැලැස්මට අනුව නාගරික සංවර්ධන අධිකාරියේ නගර සැලැස්මට අනුව ඉඩම් අවශ්‍යතාද පැන නැඟී ඇති බවකි.

"මේ භූමිය සඳහාත් නාගරික සංවර්ධන අධිකාරිය සතුව සැලැස්මක් තිබුණා. ඒ අතරේ මෙහි හිඟ බදු වාරික විශාල මුදලක් එකතු වීම නිසාත් එම භූමිය නැවත පවරා ගැනීම සඳහා අපි කටයුතු කළා. අපි එහි පාලනාධිකාරිය කිහිප වරක්ම දැනුවත් කළා මේ ඇතිවී තිබෙන තත්ත්වය ගැන." ඒ ප්‍රියන්තා දිසානායකගේ අදහසයි.



නිසි බලධාරි ලෙස අස්කිරීමේ දැන්වීම නිකුත් කළ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් ප්‍රියන්තා දිසානායක



අස්කිරීමේ දැන්වීම

**සාමාජිකයන් 5000කට වැඩියි**

එහෙත් අවසන ක්‍රීඩා සමාජ බලධරයින් අසරණ වී ඇත්තෙ එක්රැස් වී තිබෙන අධික බදු වාරික මුදල ගෙවා ගැනීමට නොහැකි වීම නිසාවෙනි. මෙරට විසූ සම්මානිත පුරවැසියෙක් වූ ආචාර්ය ආතර් සී. ක්ලාක් ඇතුළු කෘතහස්ථ දේශපාලනඥයෙක් වූ පීටර් කේනමන් වැන්නන් ද සාමාජිකත්වය දැරූ ඔටර් ක්‍රීඩා සමාජයේ අතීතයේ සිට වර්තමානය දක්වා මෙරට ප්‍රභූ පැලැන්තියේ මෙන්ම සාමාන්‍ය පැලැන්තියේ බොහෝ දෙනෙක් සාමාජිකත්වය දරා තිබේ. මේ වන විටද සාමාජිකයන් සංඛ්‍යාව පන්දහසකට අධිකය. ඔටර් ක්‍රීඩා සමාජය ආරම්භ කිරීමේ ගෞරවය හිමි වන්නෙ ග්‍රේග් රොස්කොව්ස්කි, කුයින්ටස් සොයිසා, කේ. ඩබ්ලිව්. ඉබ්‍රම්සා සහ නිකි ඇන්තනි යන සිවු දෙනාටයි. 1933 ඔටර් ක්ලබ්හි මුල්ම සභාපතිවරයා ලෙස ඕ. බී. සිල්වා පත්වී ඇති අතර එතැන් සිට මේ දක්වා සභාපතිවරුන් 31 දෙනෙක් පත්ව තිබේ. වර්තමාන සභාපතිවරයා මහේන්ද්‍ර ද සිල්වායි.

ඔටර් ක්‍රීඩා සමාජයට මෙවැනි අභාග්‍ය තත්ත්වයක් උදාවීමට මූලික ලෙස බලපෑවේ කුමන හේතුවක්ද යන්න විමසූ කල ක්‍රීඩා සමාජයේ වත්මන් ලේකම් අනුෂ රොද්‍රිගු අපට කීවේ මෙවැනි කතාවකි.

"ඔටර් ක්‍රීඩා සමාජය වර්තමානයේ පවතින ස්ථානයට ගෙන ආවේ 1956 වර්ෂයේ. 1959 වර්ෂයේ බදු ගිවිසුම අත්සන් කරනවා. ඒ 1989 දක්වා. 1956 වර්ෂයේ සිට බලපැවැත්වෙන පරිදි. එම ගිවිසුමෙන් අපට වර්ෂයකට රුපියල් 222ක බදු මුදලක් ගෙවන්න තිබුණේ. 1989 දී මෙහි බදු ගිවිසුම නැවත අලුත් කළා 2019 සැප්තැම්බර් 30 දක්වා. වසර 30 කාලයකට. ඒ ගිවිසුමෙන් පසුවත් බද්ද ලෙස රු. 222ක මුදලක් තමයි ගෙව්වෙ. ඒත් 2005 දී බදු සංශෝධනයකින් මෙහි වාර්ෂික බද්ද ඉඩමේ වටිනාකමින් සියයට 4ක ප්‍රතිශතයක් දක්වා ඉහළ දැම්මා. වර්ෂයකට මුදලින් රුපියල් මිලියන හතක් ගෙවීමට. ඒත් එවකට සිටිය කමිටුව අධිකරණයට ගොස් එය සියයට දෙක දක්වා අඩුකරගෙන තිබුණා. මුදලින් ලක්ෂ 38ක් දක්වා. හැබැයි ඒ මුදල 2005 වර්ෂයේ සිට නොවේ, 1989 සිටම ගෙවිය යුතු බවටයි තීන්දු කර තිබුණේ."

එලෙස සිදුවූ බදු සංශෝධනය නිසාවෙන් ක්‍රීඩා සමාජයට ලැබුණු ආදායම අනුව එතරම් විශාල බදු මුදලක් ගෙවිය නොහැකි තත්ත්වය මත ක්‍රීඩා සමාජ අසරණ තත්ත්වයකට පත්වූ බව ලේකම්වරයා පැවැසීය. ඒ අනුව 1989 වසරේ සිට 2019 දක්වා වසර 30ක කාලයට වසරකට රුපියල් ලක්ෂ 38ක බදු මුදලේ එකතුව රුපියල් මිලියන 116ක් වී ඇත.

"අපි ඒ මිලියන 116න් මිලියන 86ක් සාමාජිකයන්ගේ මුදල්වලින් සහ ක්‍රීඩා සමාජයට ලැබුණ ආදායමෙන් පසුගිය කාලයේදී ගෙවා දැම්මා. ඉතිරි මුදල තමයි දැන් ගෙවන්න තියෙන්නෙ. ඉන් පස්සෙ අපි ඉතිරි මුදල් ප්‍රමාණය ගෙවන්න රජයේ බලධාරින්ගෙන් සහන කාලයක් ඉල්ලා ගත්තා. ඒත් අපිට සියලු මුදල් ගෙවාගන්න බැරිවුණා" යැයි කී ක්‍රීඩා සමාජ ලේකම්වරයා අනතුරුව හිඟ බදු මුදල ගෙවීම සඳහා ක්‍රීඩා සමාජයේ බලධාරින් විසින් සැලැස්මක් යෝජනා කළ බවද කීවේය.

ඒ අනුව ක්‍රීඩා සමාජ බලධාරින් විසින් යෝජනා කළ එකී මුදල් කන්දරාව ගෙවීම සඳහා ඔටර් ක්‍රීඩා සමාජ භූමියේ පවත්වාගෙන යන රථ ගාලෙහි රටේ සුපිරි වෙළෙඳසල් ජාලයක ශාඛාවක් ආරම්භ කිරීමේ ව්‍යාපෘතියකට බදු දී ලැබෙන මුදලින් හිඟ බදු මුදල පියවා ගැනීමට සූදානමක් තිබී ඇත. ඒ සඳහා රජයේ සියලු වගකිවයුතු ආයතනවලින් අනුමැතියද ලැබී තිබූ බව කී ලේකම්වරයා,

"එහෙම තියෙද්දි තමයි කොවිඩ් වසංගතයට ක්ලබ් එක වැහුවේ. පසුව ක්ලබ් එක විවෘත වූ පසු පසුගිය ජූලි 06 වැනිදා ප්‍රාදේශීය ලේකම්වරියගෙන් ලිපියක් ලැබුණා ගෙවීම් කර නැති නිසා සැප්තැම්බර් 30 වැනිදා වන විට ඉඩමෙන් ක්‍රීඩා සමාජය ඉවත් කරගන්නා ලෙසට දැනුම් දීලා."

ඔටර් ක්‍රීඩා සමාජයේ ලේකම්වරයා පවසන්නෙ අනතුරුව රජයේ වගකිවයුත්තන් සියල්ල හමු වී තම ක්‍රීඩා සමාජයට උද්ගතව ඇති තත්ත්වය පැහැදිලි කළ බවයි. ඒ අනුව දැනට වාර්තා වන අන්දමට නාගරික සංවර්ධන අධිකාරිය මෙකී භූමිය පවරා ගැනීමට සූදානමක් ඇති බවයි. කොළඹ නගරයේ පැරැණිතම ක්‍රීඩා සමාජයක් වන ඔටර් ඇක්වටික් ක්ලබ්හි ඉදිරි අනාගතය කෙබඳු වේද යන්න තීන්දු කෙරෙන්නෙ නාගරික සංවර්ධන අධිකාරිය ඉදිරියේදී ගන්නා තීන්දු තීරණ අනුවයි. කෙසේ හෝ කොළඹ නගරයේ ඉඩකඩම් වත්මන් රජය සිදු කිරීමට සැරැසෙන ශීඝ්‍ර සංවර්ධනයට යොදා ගැනීමට සූදානම් වෙද්දී මෙවැනි පැරැණි ක්‍රීඩා සමාජවල අනාගතයටද සුබදායි ලෙස තීන්දු තීරණ ගැනීම බලධරයන්ගේ වගකීමක් ලෙස අපි අවධාරණය කරමු.

**ඡායාරූප - සරත් පීරිස්**

---

# යටි මඩි ගැසූ මෝදර වරායේ මහා මගඩිය



මෝදර ධීවර වරායේ පිවිසුම

● තාරක වික්‍රමසේකර

**රට වටා ඇති මුහුදින් නිසි ප්‍රයෝජන ගන්නට තවමත් අප සමත්ව නැත්තේ ඒ සඳහා ක්‍රමවේද නැතිවා නොවේ. බොහෝ අවස්ථාවලදී ධීවර කටයුතු සම්බන්ධව වගකීම් බාර ගන්නා අය විසින්ම එහි සංවර්ධනය අඩාල කිරීම නිසාය.ශ්‍රී ලංකාව වටා ඇති මුහුදට අමතරව ප්‍රධාන ධීවර වරායන් 23ක්ම තිබේ. වර්ග සැතපුම් 25,332ක් වන මේ පුංචි රටට ප්‍රධාන ධීවර වරායන්වලට අමතරව කුඩා ධීවර වරායන් මෙන්ම බෝට්ටු නැංගුරම්පොළවල් රැසක්ද ධීවර කර්මාන්තය පිණිස ස්ථාපිතව තිබේ. මේ සියලු ධීවර වරායන් හරහා මෙරටට අවශ්‍ය සියලු මත්ස්‍ය අස්වැන්න ලබා දිය හැකිය.**

රට වටේට ඇති මුහුදින් විශාල මත්ස්‍ය අස්වැන්නක් ලබා ගත හැකිය. ඒ හරහා උපයාගත හැකි ආදායමද අතිවිශාලය.

එම ආදායම කෙසේ වුවත් පසුගිය 'යහපාලන' රජය බලයට පත් වී කෙටි කලකින් ලංකා ධීවර සංස්ථාවේ සේවකයන්ට ස්වේච්ඡා විශ්‍රාම ක්‍රමයක් හඳුන්වා දුන්නේය. මූලික වියදමක් හෝ නිෂ්පාදන වියදමක් හෝ නොමැති ලංකා ධීවර සංස්ථාව එතළුම් බංකොළොත් තත්ත්වයක පැවතුණි. ධීවර වරාය ඇතුළු ධීවර ක්ෂේත්‍රයට මෙතරම් කණකොකා හැඬීමට හේතු වූ සාධක මොනවාද යන්න විමසා බැලිය යුතුය.

ධීවර ක්ෂේත්‍රයේද ඇති පදමට යටි මඩි ගැහිලි වාර්තා වී තිබේ. 'හැංගි හැංගි බැන්ද වෙස්' මේ වන විට හෙළිව තිබේ.

මූලික වියදම් හෝ නිෂ්පාදන වියදම් නොමැති ආයතනයක් රජයට විශාල බරක් වූයේ කෙසේද යන්න විමසා බැලීමේදී හේතු සාධක රැසක් එළියට ඇදෙන නමුත් මේ අවස්ථාවේදී සමාජයේ වැඩි අවධානයක් යොමු වූ එක් සිදුවීමක් පමණක් ගෙන සලකා බැලීම සුදුසු යැයි අපි සිතමු.

ධීවර වරායන්ගේ කඩා වැටීමට හේතු සාධක වී ඇති කොළඹ නගරයේ ම ඇති ප්‍රධාන ධීවර වරාය බොහෝ දෙනාගේ ඇස් වසමින් කුණු කොල්ලයකට විදේශීය සමාගමකට බදු දීම නිසයි.

සාමාන්‍ය වංචාවකට වඩා බොහෝ ලෙසින් සලකා බැලිය යුතු වංචාවක් ලෙස මෙය හඳුන්වා දිය හැක්කේ ඇස් පනාපිටම කළ සොරකමක් නිසයි. වර්තමානයේ ජංගම දුරකතනයක් රුපියල් 3000සිට ඉහළ මිලකට ගත හැකියි. එහෙත් රුපියල් 30කට පමණ අලුත්ම දුරකතනයක් ලබා දෙන්නේ නම් ඒ ගැන කිව හැක්කේ කුමක්ද? මේ සිදුවීමද ඒ හා සමානය.

**බදු තක්සේරුව ලක්ෂ 17ක්. එක්ලක්ෂ විසිපන්දාහට බදු දීලා**

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව යටතේ ඇති මෝදර ධීවර වරාය (මුතුවාල් ධීවර වරාය) බදු දීමට ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් කටයුතු කර තිබෙන්නේ 2014 වසරේදීය. ඒ සඳහා කිසිදු ආකාරයක විධිමත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කර නැත. සමස්ත වරායම බදු දී ඇත්තේ රුපියල් 125000.00ක මාසික කුලියකට වීම අප පෙර කී ලෙසින් නවතම ජංගම දුරකතනයක් රුපියල් 30කට ලබා දීමක් හා සමානය. මෝදර, මට්ටක්කුලිය, කාකදූපත ප්‍රදේශවල ලෑලිවලින් ආවරණය කළ තහඩු සෙවිළි කළ කුඩා කඩ කාමරයක් කුලියට ගත්තද මසක කුලිය රුපියල් 100,000ක් පමණ වනු ඇත. එම නිසා මේ මහා පරිමාණ වංචාව නිසා රජයට සිදු ව ඇති පාඩුව අතිවිශාලය.

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් මෝදර ධීවර වරාය මාසිකව රුපියල් 125000.00කට බදු දී ඇත්තේ SEA GULF UK නම් විදේශීය සමාගමටය.

කොළඹ නාගරික බල ප්‍රදේශයට අයත් අක්කර 1ක් හා පර්චස් 30.56ක් මේ බදු දීමට අයත් වන අතර ඊට අමතරව හෙක්ටයාර් 1.4කින් යුක්ත වටිනා ජල බේසමක්ද මේ වරායට අයත්ය. බදු දී ඇත්තේ මේ සියල්ලම වීම පුදුම උපදවන සුළුය.

රජය සතු දේපළක් බදු දීම සඳහා පැහැදිලි නිර්ණායක සහිත ක්‍රමවේදයක් ඇත. පළමුව




වරාය රුපියල් 17,00,000කට මාසිකව බදු දිය හැකි බවට කළ තක්සේරු වාර්තාව




මෝදර ධීවර වරාය සම්බන්ධ විගණන විමසුම

ඒ සම්බන්ධව තක්සේරු වාර්තාවක් ලබා ගත යුතුය. අනිවාර්යෙන්ම තක්සේරුවට වඩා වැඩි වටිනාකමකට බදු දිය යුතුය. එම තක්සේරුවද රජය පිළිගත් ආයතනයකින් ලබා ගත යුතුය. එහෙත් මෙවන් අතිවිශාල දේපළක් බදු දීමේදී නම් අනිවාර්යෙන්ම තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුවක් ලබා ගැනීමද අනිවාර්යය වේ. එසේම බදු දීමට අදාළව පිළිගත් සමාගම්වලින් ටෙන්ඩර් කැඳවිය යුතුය.

එසේම අදාළ බදු ආදායම එහි නඩත්තුව, සේවක වැටුප්, හා සංසන්දය කළ යුතුය. එහෙත් මෝදර ධීවර වරාය බදු දීමේදී මේ කිසිදු නිර්ණායකයක් හෝ ක්‍රමවේදයක් අනුගමනය කර නොමැත.

2014 වසරේ ඔක්තෝබර් මස 30 වැනිදා සිට වසර 25 කාලයකට එවකට ධීවර ඇමැතිව සිටි වෛද්‍ය රාජිත සේනාරත්න විසින් මෙම ධීවර වරාය බදු දී ඇති අතර තවත් වසර 20ක් පමණ ගිය පසු එම මුදලේ වටිනාකම කෙතරම් අව ප්‍රමාණ වනු ඇතිද යන්න ගැන විමසිය යුතුය.

කිසිදු ආකාරයක ටෙන්ඩර් කැඳවීමක් මේ බදු දීමේදී අනුගමනය කර නොමැත. එසේම වසර 25ක කාලය තුළ වෙනත් තෙවන පාර්ශ්වයකට බදු දිය නොහැකි බවට සඳහන් කර නොමැත. එම නිසා මේ අපැහැදිලි වගන්ති අනුව තුන්වන පාර්ශ්වයකට එය බදු දීමට හැකිය. එසේම බදු දීමේදී විදේශීය සමාගමට එම වගන්ති වෙනස් කර ගත හැකි ආකාරයට ගිවිසුම සකස් කර ඇති බවද පෙනී යයි. රජයේ තක්සේරුව පසෙක තබා පෞද්ගලික තක්සේරුකරුවකු විසින් මේ වරාය තක්සේරු කර ඇත්තේ මිලියන 283කටය.

මේ මහා වංචාව ගැන දිගින් දිගටම පැමිණිලි ලැබීම නිසා විගණකාධිපතිවරයා ඒ සම්බන්ධයෙන් විගණන විමසුමක් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සභාපතිට යොමු කර ඇත. ඒ 2015 වසරේ ජූනි මස 18 දින LP/B/CFHC/2014/22 අංකය යටතේය.

විගණකාධිපතිගේ විගණන විමසුමේ මේ සියලු අකටයුතුකම් දූෂණ වංචාවන් ගැන පැහැදිලිව සඳහන් කර ඇත.

ඒ අනුව මේ බදුදීමට අදාළව ගැනුම්කරු තෝරාගත් ආකාරය ගැන කිසිදු පැහැදිලිතාවක් දැකගත නොහැකි බව විගණන විමසුමේ දක්වා ඇත. එසේම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක්ද ඒ සඳහා ලබා ගෙන නොමැති බවද විගණන විමසුමේ දක්වා ඇත.

එසේම රජයේ තක්සේරුකරුවකුගෙන් තක්සේරු වාර්තාවක් ලබා ගත යුතු නමුත් එවැන්නක් ලබා නොගෙන පෞද්ගලික තක්සේරුකරුවකුගෙන් ලබා ගත් ව්‍යාජ වාර්තාවක් මත මෙම බදු දීම සිදු කර ඇති බවත් විගණන විමසුමේදී අනාවරණය කර තිබේ. ඒ අනුව 2015 (2016 විය යුතුයි) ජනවාරි මස 08 වැනිදා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් මෝදර ධීවර වරාය බදු දීමට අදාළව තක්සේරු වාර්තාවක් ඉල්ලා ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සභාපතිවරයා ලිපියක් යොමු කර ඇත.

**ටෙන්ඩර් කැඳවා නැහැ. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් නැහැ.**

2016.02.25 දිනැති අංක CM/CMC/LM/1806 යටතේ තක්සේරු වාර්තාවක් යොමු කරන මහ කොළඹ (කා.හා) පළාත් තක්සේරුනරු ජී.එස්. විජේවර්ධනයන් වරාය රුපියල් එක් මිලියන හත්සිය දහසකට (17,00,000.00) එනම් රුපියල් ලක්ෂ 17කට මාසිකව බදු දිය හැකි ලෙසින් තක්සේරු වාර්තාවක් ඉදිරිපත් කර ඇත. එය වරාය බදු දී ඇති රුපියල් 125,000.00 මුදල මෙන් 14 ගුණයකට ආසන්නය.

පෞද්ගලික තක්සේරුකරුවකුගෙන් ලබා ගත් වරායේ වටිනාකම වන මිලියන 283 ව්‍යාජ බවත් එහි ආසන්න වටිනාකම මිලියන 445ක් බවත් හෙළි කර ඇත. එසේම වරාය බදු දීමේදී කළමනාකරු ඇතුළු එවකට සේවය කළ ප්‍රධාන සේවකයන් 8 දෙනාගේ වැටුප් සම්බන්ධව කිසිදු අවධානයක් යොමු කර නැති අතර ඔවුන්ගේ වාර්ෂික වැටුප් සඳහා පමණක් රුපියල් 45,26,194.00ක් වැය වන බවත් මෙහිදී හෙළි කර ගෙන ඇත. එහෙත් වරාය බදු දීමෙන් වාර්ෂිකව හිමි වන්නේ (මාසිකව 125000.00 X 12 ක්) රුපියල් 150,00,000.00ක් පමණකි. ඒ අනුව මේ මානව සම්පතට ගෙවිය යුතු වැටුප් හා දීමනා නිශ්ක්‍රීය ලෙසින් සලකා ඇති බවත් විගණන වාර්තාව මගින් හෙළි කර ඇත.

වරාය බදු ගත් විදේශීය සමාගම විසින් එහි කොන්දේසි එළි පිටම කඩා දැමුවත් ඒ ගැන කිසිම පියවරක් ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබීමද විශාල ගැටලු උපදවන්නකි. ගිවිසුමට අනුව කිසිදු ගොඩනැගිල්ලක් කඩා දැමීමට හැකියාවක් නැත. එහෙත් විශාල ප්‍රමාණයේ ගොඩනැගිලි දෙකක් මේ සමාගම විසින් කඩා ඉවත් කර දමා ඇත.

කෙසේ හෝ චෞරයෝ මේ වන විට බළලුන් මල්ලෙන් එළියට පැමිණ තිබේ. රාජ්‍ය දේපළ අවභාවිතය සෙල්ලමකට ගත නොහැකිය. දැන් නීතිය තදින් ක්‍රියාත්මක කළ යුතුය. මෙවන් මහා පරිමාණ වංචාවන් ඉදිරියේදී තවත් සිදු වීමට ඉඩ නොදිය යුතුය.

**ඡායාරූප - සමන්ත වීරසිරි**



# කුසගින්නට ගම් වැදී දිවියෙන් සමුගත් කොටි

● සුභාෂිණී ජයරත්න

**වනජීවි පරිසර රසවිඳින්නන්ට මෙන්ම වන දිවියට හිතැති දෙස් විදෙස් සංචාරකයින්ට නිදැල්ලේ හැසිරෙන වටිනාකමක් ඇති සතුන් නෙත ගැටීම අමරණීය අත්දැකීමකි. කොටියකු දක්නට ලැබීමද එවන් අත්දැක්මක් එක් කරන්නනෙකි. එහෙත් කුසගිනි නිවා ගැනීමට මිනිස් ජනාවාසයට ටිකෙන් ටික ආක්‍රමණය කළද අවසානයේ නොසිතූ පරිදි අකාලයේ මරු වසඟයට යන්නට තරම් ඔවුහු පවුකාර විය. මිනිසුන්ගේ නොපහත්කම් නිසාවෙන් ඇටවූ මරු උගුල් වලට අවසානයේ ඔවුහු දිවියට සමු දුන්හ. දෙස් විදෙස් පරිසර ලෝලීන්ගේ නෙත් සිත් ඇඳ බැඳ ගන්නා අපූරු වනජීවි පරිසරයක් අපට තිබුණද දැන් ඒ සියල්ල කෙමින් කෙමින් විනාශ වී යන්නට පටන් ගෙන ඇත්තේ මිනිස් ක්‍රියාකාරකම්හි පටු අරමුණු නිසාය.**

අද ලංකාවේ වඳ වී යන කොටියාට අත්ව ඇත්තේ මේ අකාරුණික ඉරණමය. මේ වසර තුළ මියගිය 8 වැනි කොටියා පසුගියදා වාර්තා වූයේ ගම්පොල දොළුව ප්‍රදේශයෙනි. එහෙත් වාර්තා නොවූ කොටි මරණ කෙතෙකුත් ඇත්දැයි කවුරුත් නොදනී.

## ඇඳිරි නීති කාලයේ බොහෝ දෙනෙක් සතුන් අල්ලා ගැනීමට මදු බැන්ඳා

සමස්ත ලංකා වනජීවි නියාමකවරුන්ගේ සංගමය ද පවසා සිටින්නේ විවිධ දඩයම් හේතුවෙන් ලංකා කොටින්ගේ මරණ වාර්තාගත අන්දමින් ඉහළ ගොස් ඇති බවකි. ඉතා කෙටි කාලයක් තුළ මෙසේ වැඩිම මරණ සංඛ්‍යාවක් වාර්තා වි ඇත්තේද මේ වසරේය.

මේ පිළිබඳව අදහස් දක්වන උඩවලව ඇත් අතුරු සෙවණ පශු වෛද්‍ය නිලධාරී මාලක අබේවර්ධන මහතා පවසා සිටින්නේද පසුගිය කොරෝනා වසංගත කාලයේ බොහෝ දෙනෙක් නිවෙස්වලටම වී සිටීම හේතුවෙන් මෙවන් ප්‍රවණතාවක් දැකිය හැකි වු බවකි.

"පසුගිය කාලයේ ගොඩාක් අය ගෙවල්වලට වී සිටි නිසා සමහර පළාත්වල සතුන් ගොඩාක් දෙනෙක්ගේ ආහාරයට එකතු වුණා. මේ නිසා සත්තු අල්ලා ගැනීමට ගම්වල මඳු බැන්දා. අපේ ලංකාවේ 'Pantehra pardus kotiya' කියන විශේෂය තමයි මේ මරණයට පත් වන්නේ. බොහෝ දෙනෙක් මේ සතාව දිවියා විදියට හැඳින්වුවත් දිවියා කියන්නේ පූසෙකු වගේ කුඩා ප්‍රමාණයේ සතෙක්. මේ සතුන් ලංකාවේ සෑම දේශගුණික කලාපයකම ඉන්නවා වගේම පොඩි පොඩි කඳුකර කැළෑවලත් ඉන්නවා. නමුත් දැන් ගම් වදින්නේ ආහාර හොයාගෙන. ගම්වලට ආවහම මේ සතුන්ට බල්ලෝ ඌරෝ ආදි සතුන් පහසුවෙන් අල්ලා ගත හැකි වෙනවා. මෙහෙම සත්තු දඩයමට ගම්වදින විට තමයි මෙවැනි කොටින් මද්දට හසුවෙලා මැරෙන්නේ. පසුගිය මාස 8 ට මෙවැනි වටිනා සතුන් 8 දෙනෙක් අකාලයේ මැරුණා. ඒ අතර වාර්තාගත වන විශේෂ කොටි මරණය තමයි කළු කොටියාගේ මරණය. ලංකාවේ කොටි හැමෝටම දකින්නට ලැබෙන්නේ නැහැ. සංචාරකයින් මෙවැනි සතුන් බලන්න හරිම ආසයි. මේ නිසා සංචාරක කර්මාන්තය පැත්තෙන් මේ සතුන් සිටීම ඉතා වැදගත්. තවත් පැත්තකින් ආහාර දාමයේ ඉහළින්ම සිටින්නේ මේ සතුන්. ඒ සතුන්ගේ ගහණයේ අඩු වීමක් වෙනවා කියන්නේ පරිසර සමතුලිතතාව අඩු වෙනවා කියන එකයි. වගාවට පමණක් නෙමෙයි කැළෑවේ සමතුලිතතාවයද නැති වෙනවා...." ඒ පශු වෛද්‍ය නිලධාරී මාලක අබේවර්ධන මහතාය. හැටන්, නොර්වුඩ් සහ ආගරපතන ආදී ප්‍රදේශයන්හි තේ වතු ආශ්‍රිතව සැරිසරන කොටි මෙසේ දඩයක්කරුවන්ගේ උගුල්වලට හසු වීමෙන් සහ වස මිශ්‍ර කළ මස් වර්ග ආහාරයට ගැනීමෙන් මරණයට පත් වූයේ වටිනා සම්පතක් රටට අහිමි කරමිනි. වනජීවි වාර්තාවන්ට අනුව මෙසේ මියගිය බහුතරයක් කොටින් වැඩුණු ගැහැනු සතුන් විම මෙහි බරපතළකම වඩාත් තීව්‍ර කරන්නෙකි. එය සත්ත්ව ගහණ ඝනත්වයට දැඩි බලපෑම් කරවන්නකි. ලංකාවේ සිටි දුර්ලභ කළු කොටියා මිය ගියේ මැයි මස 29 වැනිදාය. ලක්ෂපාන වාලමලෙයි ප්‍රදේශයේ එළවළු වගා ගොවිපලක සතුන් දඩයම් කිරිම සඳහා අටවා තිබූ මන්දකට හසු වී තුවාල ලැබූ මේ දුර්ලභ කළු කොටියා වැඩිදුරට ප්‍රතිකාර ලබාදිම සඳහා උඩවලව පශු වෛද්‍ය රෝහල වෙත රැගෙන ගොස් සිටියදි ජීවිතක්ෂයට පත්විය.

කළු කොටියා මිය යාම සම්බන්ධයෙන් හැටන් මහෙස්ත්‍රාත් අධිකරණය වෙත නල්ලතන්නිය වනජීවි කාර්යාල විසින් කරුණු වාර්තා කර තිබූ අතර වනජීවි දෙපාර්තමේන්තුව විසින් මිය ගිය කළු කොටියාගේ සිරුර සංරක්ෂණය කිරිමට අවශ්‍ය කටයුතු කොළඹ කෞතුකාගාරය හා එක්ව සිදු කර ගෙන යයි. මීට ප්‍රථම දෙණියාය මවුල්දෙණිය ප්‍රදේශයේ මන්දකට හසු වී මිය ගිය මෙවැනිම කළු කොටියෙකුගේ සිරුර ගිරිතලේ ජාතික වනජීවි පුහුණු කෙන්ද්‍රයේ සංරක්ෂණය කර ඇත.

ජූනි 23 වැනිදා හෙල්බඩ වතුයායකදි මියගියේ පැටියෙකු සහිතව සිටි කොටි දෙනෙකි. මොවුන් ලංකාවටම ආවේණික කොටි විශේෂවන අතර දුර්ලභ වඳ වි යන සත්ත්ව විශේෂයි. නමුත් තේ වගාවට නතු වුණු මධ්‍යම කඳුකරයේ උස් භූමි ආශ්‍රිතව සැරිසරන කොටින් වතු කම්කරුවන්ට මහත් භීතිය උපදවන සත්ත්ව කොට්ඨාසයකි. උන්හිටි ගමන් හොර රහසේම වතු ජනාවාසවලට කඩා වදින කොටින්, කුකුළන්, එළුවන්, ගවයන් සහ බල්ලන් ආදී ගෘහාශ්‍රිත සතුන්ට එල්ල කරන තර්ජනය ඉමහත්ය.

තර්ජනයෙන් මිදීම පිණිස කඳුකර වැසියන් දැන් කලක පටන් කොටියන්ට උගුල් ඇටවීමට අත්හදා බලමින් සිටිති. එනම්, ගෙදර දොර ඇති කරන බල්ලන් 'ඇමක්'සේ භාවිකර, කොටියන්ට පාඩම් උගන්වන්නට යාමයි.



## 2020 වසරේ කොටි මරණ 8

| දිනය | ස්ථානය |
| --- | --- |
| ජන. 3 | යටියන්තොටදී |
| අප්‍රේල් 2 | නාවලපිටියේදී |
| අප්‍රේල් 18 | මස්කෙලියේදී |
| මැයි 29 | නල්ලතන්නියේදී |
| ජූනි 2 | නෙළුවේදී |
| ජූනි 23 | හෙල්බොඩදී |
| ජූලි 20 | නාවලපිටිය මාපකන්දේදී |
| අගෝ. 23 | ගම්පළ දොළුවේදී |







කොළඹ ජාතික කෞතුකාගාරයේ දී සංරක්ෂණය කරන ලක්ෂපාන වාලමලෙයි මිය ගිය කළු කොටියා

## වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතට අනුව දැඩි දඬුවම්


පාඩම ඉගෙන ගන්නා කොටි, දැන් සෑහෙන කාලයක් තිස්සේ අතිශය කුරිරු ලෙස මිනිසුන් වෙතින් මියැදෙන්නෝය. බොහෝ දෙනා මෙම සතා කොටියා හා දිවියා වශයෙන් මාරු කර ගනිති. අපේ රට තුළ වාසය කරන කොටියාට වඩා සිරුරින් කුඩා බළල් පවුලට අයත් සාමාජිකයින් දෙදෙනෙක් වන්නේ කොළ දිවියා (Rusty Spotted Cat) සහ හඳුන් දිවියා (Fishing Cat)ය. මේ දෙදෙනාට අමතරව අපේ රට තුළ වාසය කරන බළල් පවුලේ අනෙක් පුංචි ඇත්තා වෙන්නේ වල් බළලායි (Jungle Cat). මේ සිවු දෙනාම වන ජීවී රක්ෂිතයන් ඇසුරේ දිවි ගෙවනා බළල් පවුලේ සාමාජිකයින්ය. තමන්ගේ බල පරාක්‍රමයට සරිලන ආකාරයට සෙසු සත්වයින් ගොදුරු කර ගනිමින් ජීවත් වන ආකාරයට මේ සතුන් හුරු වි ඇති නිසා ස්වභාව ධර්මයට පටහැනි අයුරින් මේ සතුන්ගේ ජීවන රටාව විනාශ කිරීමට කිසි වෙකුටත් නීතියෙන් අවසරයක් නැත. තියුණු නිය, තියුණු උල් දත්, වනගත දිවියටම ගැළපෙන සුනම්‍ය සිරුරත් ඌට ස්වභාව ධර්මයෙන් දී ඇත්තේ ඒ නිසාවෙනි. අපේ රටේ වාර්තා වෙන මේ වඳවීමේ තර්ජනයට ලක්ව ඇත්තේ බිළාල පවුලට අයත් රටට ඇවැසි සාමාජිකයෝය. වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂා කිරීමේ ආඥා පනතේ 30 වන වගන්තියේ, දෙවන උප වගන්තියට අනුව බිළාල පවුලේ සාමාජිකයින් දැඩි ලෙස ආරක්ෂිත ක්ෂීරපායින් ලෙස ලැයිස්තු ගත කර ඇත්තේ විවිධ මානව බලපෑම් හේතුවෙන් මේ අයගේ ජීවිතයට තර්ජනයන් එල්ල වීම වළක්වාලමින් ඔවුන්ගේ පැවැත්ම තහවුරු කරනු පිණිසයි. එබැවින් මෙවැනි ජීවී සතෙකු තබා අජීවී මියගිය සතෙකුගේ කොටසක් හෝ ළඟ තබා ගැනීම (සම්, දත්, නිය) දඬුවම් ලැබිය හැකි වරදක් බව සිහිපත් කළ යුතුමය.

## මියගිය කොටින් බහුතරයක් වැඩුණු ගැහැනු සතුන්

# සතියක් ඇතුළත 15කට දිවි අහිමි කළ මාරක රිය අනතුරු පහක්



අලව්වේ ටිපර්-මෝටර් රථ අනතුර



රාවණා දිය ඇල්ල අසලදී ප්‍රපාතයට පෙරළුණු වෑන් රථය



පයින්ඩිකුලම දුම්රිය හරස් මාර්ගයේදී දුම්රියේ ගැටුණු කැබ් රථය

● සුරේකා නිල්මිණී ඉලංගකෝන්

**ජීවිතයේ අවිනිශ්චිත භාවය පිළිබඳ නිදසුන් ඕනෑතරම් තිබුණද හිතවතකුට අවසන් ගෞරව දක්වන්නට ගිය ගමන තමන්ගේද අවසන් ගමන වෙතැයි එම ඉරණමට මුහුණ දුන් කිසිවකු සිහිනෙනුදු නොසිතන්නට ඇත. පසුගිය 22 වැනිදා එවැනි අවාසනාවන්ත ඉරණමක් සනිටුහන් කළ දිනයකි. එදින ප්‍රදේශ 3කදී සිදුවූ මාරක රිය අනතුරු 3කින් 8 දෙනකුට දිවි අහිමි වූ අතර 10 දෙනකු තුවාල ලැබීය. කුරුණෑගල- කොළඹ ප්‍රධාන මාර්ගයේ අලව්වේදී මෝටර් රියක් ටිපරයක ගැටීමෙන් 5 දෙනකු මරුමුවට පත්වූ අතර එදිනම ඇල්ල වැල්වාය මාර්ගයේ රාවණා දිය ඇල්ල අසලදී වෑන් රියක් ප්‍රපාතයට වැටීමෙන් තිදෙනකු මරුමුවට පත්වී තිදෙනකු තුවාල ලැබීය. එදිනම තලාව තඹුත්තේගම ප්‍රධාන මාර්ගයේ පයින්ඩිකුලමේදී කැබ් රියක් දුම්රියේ ගැටී 7 දෙනකු බරපතළ තුවාල ලැබීය.**

## අවමඟුලකට ගොස් එන ගමන් අවසන් ගමන් ගිය මිතුරෝ

ඒ අතරින් කුරුණෑගල කොළඹ මාර්ගයේ අලව්ව වළකුඹුර ප්‍රදේශයේදී අලුයම හතරට පමණ මෝටර් රථයක් සහ ටිපර් රථයක් එකිනෙකට ගැටීමෙන් සිදුවූ මාරක අනතුරින් දිවි අහිමි වූ පුද්ගලයන් 5 දෙනාම වයස අවුරුදු 30ට අඩු තරුණයන් වීම දැඩි ඛේදනීය තත්ත්වයකි. එම තරුණයන්ගෙන් තිදෙනකු පෞද්ගලික ඉදිකිරීම් සමාගමක මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ වදාකඩ කොටසේ සේවය කළ මිණුම් සහායකයවරුන් වන අතර එක් තරුණයකු එම සමාගමේම රියැදුරකු ලෙස සේවය කරමින් සිටි අයෙකි. අනෙක් තරුණයා ඇගළුම් කම්හලක සේවය කරමින් සිටි අයෙකි. ඔවුහු 21 වැනිදා රාත්‍රියේ මිතුරකුගේ පියකුගේ අවමඟුලට සහභාගී වීම සඳහා වරකාපොල ප්‍රදේශයට ගොස් නැවත පැමිණෙමින් සිටියදී එම අවාසනාවන්ත ඉරණමට මුහුණ දී තිබේ. එලෙස අවාසනාවන්ත ලෙස දිවි සැරිය නිමා කළේ පුත්තලම කොට්ටුකච්චිය මැල්ලන්කුලමේ පදිංචිව සිටි වර්ණකුලසූරියගේ තාරුක අදීෂ පෙරේරා(22), වැලිමඩ අඹගස්දෝව නිකඅත්තනගොඩ පදිංචිව සිටි මල්ලවආරච්චිගේ ශ්‍රීමාල් මනෝජ්(26), කෑගල්ල නෙළුන්දෙණිය උඩුකුඹුරේ පදිංචිව සිටි දිල්ෂාන් ජයසංක(23)යන මිනුම් සහායකයන් තිදෙනා, එම සමාගමේම රියදුරකු ලෙස සේවය කළ ඉබ්බාගමුව වඩුපොල සුනිල් පතිරණලාගේ මිහිර සචිත්‍ර පතිරණ(29) සහ ඇගළුම් කම්හලක සේවය කළ ඉබ්බාගමුවේ පන්නල වීරකෝන් මුදියන්සේලාගේ චරිත කෞශල්‍ය මධුෂාන් (24) යන අයය. චරිත මධුෂාන් මෙම ගමනට එක්වී ඇත්තේ ඔහුගේ මිතුරා වන මිහිර සචිත්‍රගේ ඉල්ලීමටය. අනතුරට ලක්වූ ඔවුන් ගමන් ගත් මරුටි වර්ගයේ මෝටර් රථය ද මිහිරට අයත් වූවක් වන අතර රිය පදවා ඇත්තේ ද ඔහු විසින් බව අනාවරණය වී තිබේ.

රියැදුරුට නින්ද යෑම හේතුවෙන් එම මාරක අනතුර සිදුවන්නට ඇති බව පොලිසිය සැක කරයි. වැලි පිරවූ ටිපර් රථය මාර්ගයේ නියමිත දෙසින් ධාවනය වී ඇති බවත් ඊට ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි මෝටර් රථය මාර්ගයේ දකුණු පසට ධාවනය වී ටිපර් රථය සමඟ මුහුණට මුහුණලා ගැටීමෙන් අනතුර සිදුවී තිබේ. ටිපර් රථයේ රියැදුරු යටියන්තොට ප්‍රදේශයේ පදිංචි නිහාල් පුෂ්පකුමාර ජයසේන පොලිසියට කර ඇති ප්‍රකාශය අනුව ඔහු මඩකලපුවේ සිට වැලි රැගෙන කොළඹ දෙසට රිය ධාවනය කරමින් සිටියදී අනතුරට පත්වූ මෝටර් රථය විදුලි පහන් අවලෝකනය නොකර වේගයෙන් ඉදිරියට පැමිණ තිබේ. එය දුටු වහාම ඔහු ටිපර් රථය නවතා ඇතත් මෝටර් රථය විශාල ශබ්දයක් නඟමින් ටිපර් රථයේ ගැටී ඇත.

තරුණ ජීවිත 5ක් අකාලයේ රටට අහිමි කළ ඒ මාරක අනතුර එසේ සිදුවද්දී එදිනම උදෑසන 6ට පමණ තවත් මාරක අනතුරක් ඇල්ල වැල්ලවාය ප්‍රදේශයේදී සිදු විය. ඒ, ඇල්ල වැල්ලවාය මාර්ගයේ රාවණා ඇල්ලට නුදුරින් පිහිටි වංගුවක් ආසන්නයේදී වෑන් රියක් මාර්ගයෙන් ඉවතට පැන අඩි 150ක පමණ දුරක් ප්‍රපාතයට පෙරළී යෑම නිසා එම වෑන් රථයේ ගමන් ගත් තිදෙනකු ජීවිතක්ෂයට පත්වී තවත් තිදෙනකු තුවාල ලැබීමෙනි. ලංකා විදුලි බල මණ්ඩලයේ බදුල්ල ශාඛාවේ තැණීම් අංශයේ සේවය කළ විදුලි අධිකාරිවරුන් දෙදෙනකු සහ ඔවුන් ගමන් ගත් කුලී පදනම යටතේ ලබාගෙන තිබූ වෑන් රථයේ රියදුරු එසේ ජීවිතක්ෂයට පත්විය. ඒ අනුව එම අනතුර නිසා දිවි අහිමි වූයේ පස්සර මාඔස්සාගොල්ලේ පදිංචිව සිටි ඩබ්. එම්. සුබසිංහ හා ගාල්ල ප්‍රදේශයේ පදිංචිව සිටි ටී.ජී. උදය කුමාර යන විදුලි අධිකාරිවරු දෙදෙනාට සහ වෑන් රථයේ රියදුරු බදුල්ලේ අළුගොල්ලේ පදිංචිව සිටි ඒ. එම්. විමලසේන යන අයටය. අනතුර හේතුවෙන් හිසට බරපතළ තැලීම් සිදුවූ විදුලි අධිකාරි ආර්.එම්. දිල්හාන් වැල්ලවාය රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබන අතර සුළු තුවාල ලැබූ ලලිත් ප්‍රසන්න සහ අජිත් පුෂ්පකුමාර යන විදුලි අධිකාරිවරුන් දෙදෙනා බදුල්ල මහරෝහලේ ප්‍රතිකාර ලබයි.

එම විදුලි අධිකාරිවරු පස්දෙනා පෙරදින රාත්‍රියේ ගාල්ල ප්‍රදේශයේ පිහිටි හිතවත් විදුලි අධිකාරිවරයකුගේ ඥාතියකුගේ අවමඟුල් අවස්ථාවකට සහභාගි වීමට ගොස් ඇති අතර 22 වැනිදා උදෑසන ආපසු එමින් සිටියදී වෑන් රථයේ රියැදුරුට නින්ද යෑම හේතුවෙන් උදෑසන 6.25ට පමණ එම අනතුර සිදුවී තිබෙන බව මූලික පොලිස් පරීක්ෂණවලදී අනාවරණය වී තිබේ. මාර්ගයෙන් ඉවතට පැන අඩි 150ක් පමණ බෑවුමකට වැටුණු රථය ගසක වැදීමෙන් නැවතී ඇති බවත් එසේ නොවන්නට තවත් අඩි 3000කට වඩා වැඩි බෑවුමකට රථය වැටීමට ඉඩ තිබූ බව ද පොලිසිය පවසයි.

22 වැනිදා අලුයම 3ට පමණ තලාව තඹුත්තේගම ප්‍රධාන මාර්ගයේ පයින්ඩිකුලම ප්‍රදේශයට පිවිසෙන දුම්රිය හරස් මාර්ගයේ ඔස්සේ ධාවනය වූ කැබ් රථයක් මන්නාරම සිට කොළඹ බලා ගමන් කරමින් තිබූ දුම්රියක ගැටීමෙන් තවත් අනතුරක් සිදු විය. ඒ හේතුවෙන් කැබ් රථයේ ගමන් ගත් හත් දෙනකු බරපතළ තුවාල ලබා අනුරාධපුර ශික්ෂණ රෝහලට ඇතුළත් කර තිබේ. තුවාල ලැබුවන් ගම්පහ ප්‍රදේශයේ පදිංචිකරුවන් වන අතර ඔවුන් පස්දෙනකු තලාව ප්‍රදේශයේ ඥාතියකුගේ නිවසේ පැවති සාදයකට සහභාගි වී එහි සිටි තවත් ඥාතීන් දෙදෙනකු ද සමඟ ආපසු යමින් සිටියදී මෙම අනතුර සිදුවී තිබේ. තුවාල ලැබුවන් අතර කාන්තාවන් දෙදෙනකු ද වේ.

22 වැනිදා සිදුවූ එම මාරක රිය අනතුරුවලට අමතරව 23 වැනිදා රාත්‍රී 8.30ට පමණ මහනුවර කුරුණෑගල ප්‍රධාන මාර්ගයේ ගලගෙදර මඩවල බෑවුමේදී මෝටර් රථ දෙකක් හා කන්ටේනර් රථයක් ගැටීමෙන් සිදුවූ අනතුරකින් දෙදෙනකු මරුමුවට පත්ව තවත් පස් දෙනකු තුවාල ලබා තිබේ. අනතුර සිදුව ඇත්තේ කටුගස්තොට ප්‍රදේශයේ සිට කුරුණෑගල දෙසට සාදික්කා තොගයක් රැගෙන ගමන් ගනිමින් තිබූ කන්ටේනර් රථයක් මඩවල බෑවුමේදී මෝටර් රථයක ගැටී ඉදිරියට ධාවනය වෙමින් තවත් මෝටර් රථයක ගැටී ඒ මතට පෙරළීමෙනි. කන්ටේනර් රථය මුලින්ම ගැටුණු මෝටර් රථය පැදවූ කාන්තාව සහ එහි සිටි ඇගේ දියණිය තුවාල ලබා තිබේ. අනෙක් මෝටර් රථයට අනතුරින් දැඩි හානි සිදුව තිබෙන අතර එහි එකම පවුලේ මව, පියා හා දරුවන් දෙදෙනකු පැමිණ තිබේ. රිය පැදවූ පියා සහ ඔහුගේ සිඟිති දියණිය මෙම අනතුරින් මරුමුවට පත්විය. පියා ගලහ ප්‍රදේශයේ පදිංචි හෝටල් කළමනාකරුවකු වන ගලහ නිල්අඹේ පදිංචි චතුර සුරේෂ් ගණේපොල (36)වන අතර ඔහුගේ දියණිය දුලානි සෙනාලි දෙහැවිරිදිය.


**2020.08.23 දින ඉරු දින සිළුමිණ පුවත්පතේ පළ වූ දැන්වීම පිළිබඳවයි**

**1) වෙනස් විය යුතු කොටස්**

"සංචාරක හා ගුවන් සේවා අමාත්‍යාංශය " යන්න "සංචාරක අමාත්‍යාංශය" ලෙස සහ " පිටපතක් සහිත මුද්‍ර, තබන ලද යෝජනා දින 30 ක් තුළ" යන්න පිටපත් සහිත මුද්‍ර, තබන ලද යෝජනා 2020 සැප්තැම්බර් මස 15 දින සවස 2.00 ට හෝ ඊට පෙර පහත ලිපිනයට එවීමට හෝ ගෙනැවිත් භාරදීම කළ හැකි අතර, එදිනම ඒවා විවෘත කරනු ලැබේ ලෙසට වෙනස් විය යුතුය.

**2) එකතු විය යුතු කොටස් :**

සංචාරක අමාත්‍යාංශය හෝ එම අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට සම්බන්ධ අයට හෝ ඥාති සබඳතාවක් ඇති අයට මේ සඳහා අයදුම් කිරීමට අවස්ථාව නොලැබේ.

වැඩි විස්තර කාර්යාල වේලාවේදී පහත අංක අමතා ලබාගත හැක.

සහකාර අධ්‍යක්ෂක /
නිකේතන කළමනාකරණ
0112-348887 හෝ 0112-426800- දිගුව 409



**අඩු මිලට බෙඩ් ෂීට්** ලස්සන ඩිසයින් වලින්
... Cotton ...
0771 964 341 / 0117 902 278

**කළමනා/නීති/පුස්තකාල/දුම්රිය තරග විභාග පෙරහුරු පොත් පෙළ**
- කළමනාකරණ සහකාර 1 - 490/-
- කළමනාකරණ සහකාර 2 - 590/-
- නීති විද්‍යාල පෙරහුරුව-1 - 490/-
- නීති විද්‍යාල පෙරහුරුව-2 - 590/-
- අභියෝගතාව 1 සහ 2 - 390/-
- සාමාන්‍ය දැනීම 1 සහ 2 - 390/-
- පුස්තකාලාධිපති - 490/-
- දුම්රිය ස්ථානාධිපති - 490/-
- භාෂා හැකියාව - 390/-
- Test Your IQ - 490/-
- Master Your IQ - 490/-
- General Knowledge 1 & 2 - 490/-

සැකසුම - W.O.T. ප්‍රනාන්දු
දැන් ඕනෑම ප්‍රසිද්ධ පොත්හලකින් හෝ ගිහාන් පොත්හලින්, 144සී, බිල් විද්‍යාපෝෂිත අසල, දෙහිවල.
දුරකථන: 011-2730152/011-2717205 ෆැක්ස්: 011-2717755

**5 ශිෂ්‍යත්වය 2020 ආධාර පොත්**
- MY TUTOR ශිෂ්‍යත්ව කට්ටලය - 390/-
- ශිෂ්‍යාධාර - 1 සහ 2 - 390/-
- ශිෂ්‍යත්වය - 1 සහ 2 (2000 සිට 2019) - 290/-
- සිංහල රචනා පුහුණුව - 290/-
- 5 ශිෂ්‍යත්ව සිංහල රචනාව හා අවබෝධය - 290/-
- 5 ශිෂ්‍යත්ව සාමාන්‍ය දැනීම - 290/-

සැකසුම - W.O.T. ප්‍රනාන්දු
දැන් ඕනෑම ප්‍රසිද්ධ පොත්හලකින් හෝ ගිහාන් පොත්හලින්, 144සී, දෙහිවල.
දුරකථන: 011-2730152/011-2717205 ෆැක්ස්: 011-2717755

**A/L 2020**
නිවසේ සිට හදාරා විශිෂ්ට ප්‍රතිඵල ලැබීමට උපකාර
2019 විෂයය නිර්දේශය අනුව සැකසූ MY TUTOR සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍ය පොත්
- 2019 හා ඉන්පසු විභාගවලට අනුකූල විභාග දෙපාර්තමේන්තුවෙන් මුද්‍රිත මුලාකෘති ප්‍රශ්න පත්‍රය
- 2019 අනුකූල ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ විවෘත පැහැදිලි සවිස්තරාත්මක පිළිතුරු
- 2019 නිර්දේශයට වඩාත් අනුකූල පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා පිළිතුරු

දැන් ඕනෑම ප්‍රසිද්ධ පොත්හලකින් හෝ ගිහාන් පොත්හලින්, 144සී, දෙහිවල.
දුරකථන: 011-2730152/011-2717205 ෆැක්ස්: 011-2717755

# දහම් පාසල් අධ්‍යාපනය වසර 125ක් සපුරයි

● ලලිත් චාමින්ද

**"ම ගේ සිතට වැදගත් අදහසක් පහළ විය. බෞද්ධ ළමයින් ඔවුන්ගේ ආගම දිවයිනේ තිබෙන හැම පන්සලකම විශේෂ දිනවල නියමිත පැය ගණනක් උගත යුතුය. ඔවුන්ගේ මවුපියන්ගේ ආගමෙහි මුලික කරුණු පවා ඔවුන්ට නොඉගැන්වුවහොත් ඔවුන් හොඳ බෞද්ධයන් වෙතැයි කෙසේ බලාපොරොත්තු විය හැකිද?"**

එය හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා විසින් ඔහුගේ දිනපොතේ සටහන් කරන ලද්දකි. ඕල්කට්තුමා විසින් බෞද්ධ පාසල් පිහිටුවා ඒවායේ නඩත්තු කටයුතු සඳහා බෞද්ධ අරමුදලට ආධාර සපයමින් ගමින් ගමට දේශනා පවත්වමින් ගියේය. එසේ යන අතරතුරේ බෞද්ධ හැඩගැස්මකින් තොර බාල පරපුර දුටු ඕල්කට්තුමා විසින් ඔහුගේ සිතට පහළ වූ අදහසක් මේ අයුරින් සිය දිනපොතේ සටහන් කළේය. ක්‍රිස්තියානුවරුන් ඔවුන්ගේ ළමයින්ට ආගම ඉගැන්වීම අතපසු නොකරද්දී බෞද්ධයෝ පමණක් ඔවුන්ගේ දරුවන්ට එය කුමක් නිසා අතපසු කරද්ද? ඕල්කට්තුමා එකල ගම් නියම්ගම් පුරා දේශන පවත්වමින් යන අතරේ මේ ගැන කල්පනා කළේය. ඔහු තම සිත තුළ පැළපැදියම් වෙමින් තිබූ අදහස ක්‍රියාවට නැංවීම සඳහා තෝරාගනු ලැබුවේ ඕල්කට්තුමා විසින් මෙරටට පැමිණ පළමුවරට පන්සිල් සමාදම් වූ විහාරස්ථානයයි. ඒ, ගාල්ල වැලිවත්ත විජයානන්ද විහාරස්ථානයයි.

එවකට ගාල්ලේ පරම විඥානාර්ථ සමාගමේ ලේකම් ධුරයට විජයානන්ද විහාරස්ථානයේ ප්‍රධාන දායකයකු වූ ධර්මසේන ජිනදාස සුබසිංහ පත්ව සිටියේය. ඕල්කට්තුමා විසින් තම අදහස ධර්මසේන ජිනදාස සුබසිංහට දන්වනු ලැබීය. ජිනදාස සුබසිංහ විසින් මේ පිළිබඳ විහාරාධිපති අක්මීමන ධම්මාරාම හා පරිවේණාධිපති පයාගල සිරිසුමන තිස්ස යන හිමිවරුන් සමඟ සාකච්ඡා කළහ.1889 වර්ෂයේ විජයානන්ද ඉරුදින දහම් පාසල මුල්වරට ආරම්භ කළේය. කෙසේවුවද පරිවේණාධිපති සිරිසුමන තිස්ස හිමියන්ගේ අසනීප වුහ. එපමණක් නොව දහම් පාසල ඉතා උනන්දුවෙන් පවත්වාගෙන ගිය සුබසිංහට දුම්රිය දෙපාර්තමේන්තුවේ ලිපිකාර තනතුරක් ලැබ කඩුගන්නාව ප්‍රදේශයට යෑමට සිදු විය. මේ නිසා දහම් පාසලේ ඉගැන්වීමේ කටයුතු නතර කිරීමට සිදු විය. මේ බව ගාල්ලේ ඥණෝභාෂ හිමියන් විසින් රචිත බොදු පුබුදුව ග්‍රන්ථයේ සඳහන්ව ඇත. සිරිසුමන හිමියන් අපවත් වී මාසයකුත් පහළොස් දිනක් ගෙවී යද්දී එවකට විජයානන්ද පිරිවෙනේ ඉගෙනුම ලබමින් සිටි ඇහැලේපොළ ජිනෝරස හිමියන් දහම් පාසල යළිත් පිහිටුවීම සඳහා ඩී. ජේ සුබසිංහ, ජී. සමරකොන්, ඊ.එච් තෙබෙරිස් ද සිල්වා යන අය සමඟ සාකච්ඡා කළහ. ජිනෝරස හිමියන් පිරිවෙනේ අවසන් වර්ෂයේ ඉගෙනුම ලබමින් සිටියදී විජයානන්ද දහම් පාසල මුලින් ආරම්භ කළ අවදියේදී එහි ප්‍රධානාචාර්යවරයා වශයෙන් කටයුතු කළහ. උන්වහන්සේ මෙකී දහම් පාසල නැවතත් ආරම්භ කිරීම සඳහා මුලිකත්වය ගනු ලැබීය. දහම් පාසලේ ස්ථිර පැවැත්ම සඳහා විජයානන්ද සභාව නමින් සමිතියක්ද පිහිටුවනු ලැබීය. ඉක්බිති ක්‍රිස්තු වර්ෂ 1895ක් වූ අගෝස්තු මස 03 වැනි ඉරුදින විජයානන්ද ඉරිදා බෞද්ධ පාඨශාලාව උත්සවාකාරයෙන් යළි ආරම්භ කරනු ලැබීය. පසුව විජයානන්ද දහම්පාසලේ මුල්කාල සීමාව අත්හැර දහම් පාසල ආරම්භ කරනු ලැබූ දිනය 1895 අගෝස්තු මස 03 වැනිදා වශයෙන් සලකනු ලැබීය.

ඒ අනුව ගතවූ වසර 125ක කාලය තුළ මෙකී දහම්පාසල් ඉතිහාසය තුළ සුවිශේෂී වූ සිද්ධීන් සංවත්සර වාර්තාවල සඳහන්ව ඇත.1897 වර්ෂයේ පැවති සංවත්සර වාර්තාවේ ජයමංගල ගාථා කියවීම පිළිබඳ මේ අයුරින් සඳහන්ව ඇත.


බෞද්ධයන්ගේ මංගල අවස්ථාවලදී ඉරිදා පාඨශාලාවේ ළමුන් ලවා ජයමංගල ගාථා කියවීම මුලින්ම ආරම්භ කරනු ලැබුවේ ජේම්ස් එදිරිවීර දොස්තරය. ජේම්ස් මහතා තමන්ගේ වියදමින් ළමුන් අට දෙනෙකුට ඒ අවස්ථාවට සුදුසු ඇඳුම් මස්සවා දුන්නා පමණක් නොව ළමුන්ට රුපියල් 04 බැගින් පරිත්‍යාග කළේය. මේ නිසා විජයානන්ද සභාවට මහත් ලාභයක්ද සිදු විය. එපමණක් නොව විජයානන්ද දහම් පාසල ආරම්භ කොට පස්වසරක් ගතවීමෙන් පසු දහම් පාසලේ කළමණාකරු ඩී.ජේ සුභසිංහ මහතා විසින් ගාල්ල නගරයේ තවත් දහම් පාසල් තුනක්ද මාතලේ නගරයේ දහම් පාසලක් ආරම්භ කළ බව ක්‍රි.වර්ෂ 1902 වර්ෂයේ මුද්‍රිත දහම් පාසල් වාර්තාවේ සඳහන් වේ. එම වාර්තාවට අනුව 1901 වසරේ මාගාල්ලේ සුදර්මාරාමය, මිනුවන්ගොඩ පරමානන්ද විහාරය, ගල්වඩුගොඩ පරම විචිත්‍රානන්ද විහාරය යන විහාරස්ථානවල විහාරාධිපති හිමිවරුන් සමඟ සාකච්ඡා කොට ඒ විහාරස්ථානවල දහම් පාසල් ආරම්භ කරනු ලැබීය. මාතලේ විද්‍යාවර්ධන සමිතිය සමඟ සාකච්ඡා කොට එහි විද්‍යානන්ද නමින් දහම් පාසලක් ආරම්භ කරනු ලැබීය.

විජයානන්ද දහම් පාසලේ දියුණුව සඳහා 1895 වර්ෂයේ අගෝස්තු මස 03 වැනි දින ආරම්භ කළ විජයානන්ද සභාවේ මුල්ම නිලධාරි මණ්ඩලය ගැනද සංවත්සර වාර්තාවල සඳහන්ව තිබේ. පැවිදි අනුශාසක ලෙස ඇහැලේපොල ජිනෝරස හිමියන්, ගිහි අනුශාසක ලෙස ඩී. ජේ සුබසිංහ, සභාපතිවරයා ලෙස එස්. ඒ. ඉසැඩ් සිරිවර්ධන, ලේකම් ලෙස ජී. සමරකෝන්, උප ලේකම් ලෙස ඊ.එච් තෙබෙරිස් සිල්වා සහ භාණ්ඩාගාරික ලෙස සී. පි ජයසුන්දර යන පත්ව තිබුණි.

වර්තමානයේ විජයානන්ද දහම් පාසලේ සිසු දරු දැරියන් 600 දෙනෙකු පමණ අධ්‍යාපනය ලබන අතර ගුරුවරු ගුරුවරියන් 30 දෙනෙකු ස්වෙච්ඡාවෙන් අධ්‍යාපනය ලබා දෙති. ගුරුවරු, විවිධ පර්යේෂකයන්, විශ්වවිද්‍යාල සිසු සිසුවියන් දහම් පාසල පිළිබඳ තොරතුරු ලබාගැනීමට මෙකී ස්ථානයට පැමිණෙති. දහම් පාසලේ ප්‍රධානාචාර්ය ධුරය දරනු ලබන්නේ ශාස්ත්‍රපති නාකියාදෙණියේ ඤාණුත්තර හිමියින් විසිනි.



දහම් පාසල් දරුවන්



ප්‍රධානාචාර්ය ශාස්ත්‍රපති නාකියාදෙණියේ ඤාණුත්තර හිමි



සංවර්ධන කමිටු සභාපති ලාල් රත්නායක



ආචාරිනී බී.එම් සුජීවා ප්‍රියදර්ශන දහනායක

අපි පසුගිය ඉරුදින එම දහම්පාසලට ගොඩවැදුණු අවස්ථාවේ විජයානන්ද දහම් පාසලේ ප්‍රධානාචාර්ය ශාස්ත්‍රපති නාකියාදෙණියේ ඤාණුත්තර හිමියෝ මෙසේ පැවසූහ.

“ මේ දහම් පාසලේ නමට ගැළපෙන විදියට ලොකු ගෞරවයක් ලබා දෙන්න අපි කටයුතු කරමින් යනවා. වසර 125ක් සමරන මේ අවස්ථාවේ ජාතික මට්ටමින් වැදගත් මෙවැනි ආයතනයක් පිළිබඳ බොහෝ දෙනෙකු වැඩි සැලකිල්ලක් දක්වලා නැති බව කනගාටුවෙන් කියන්න ඕන. මේ දහම් පාසල සියලු දහම් පාසල්වල මවු දහම් පාසල නිසා මෙයට රජයෙන් මෙන්ම පෞද්ගලික අංශයේ සහයෝගය ලැබිය යුතුයි. නමුත් අපි බලාපොරොත්තු වූ අයුරින් ඒ සහයෝගය ලැබුණු බව පෙන්නේ නැහැ. මේ නිසා අපි දහම් පාසල් සංවර්ධන සමිතියක් ගොඩනගාගෙන භෞතික පහසුකම් වැඩිදියුණු කිරීමට තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සැලසුම් කළා. ඒ ගොඩනැගිල්ලේ මහල් දෙකක මේ වනවිට ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබෙනවා. වහලය නිමකර ගන්න තියෙනවා. මේ ගොඩනැගිල්ල ඕල්කට් අනුස්මරණ ගොඩනැගිල්ල ලෙස නම් කර 125 වැනි සංවත්සරය අවස්ථාවේ විවෘත කිරීමට සැලසුම් කොට තිබුණා. රජයත් මුල් කාලයේ මේ සඳහා මැදිහත් වුණා. නමුත් කොරෝනා වසංගතය නිසා රජයට මෙන්ම අපි කාටත් එය ක්‍රියාත්මක කිරීමට බැරිවුණා. මෙකී ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමෙන් පසු එහි කොටසක කෞතුකාගාරයක් ආරම්භ කිරීමට සැලසුම් කොට තිබේ. දහම්පාසල් සංවර්ධන කමිටුවේ සභාපති ලාල් රත්නායක කීවේ මෙවැනි කථාවකි.

“දැනට දහම් පාසලේ ඉන්න දරුවන් සංඛ්‍යාව අනුව ඉඩකඩ මදි. ඒ නිසා තමයි තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සැලසුම් කළේ. එහි තුන්වැනි මහලයේ වහලය ගසා වැඩ අවසන් කිරීමට තියෙනවා. අපේ දහම් පාසලේ තියෙන කෞතුක භාණ්ඩ පොත්පත්, ලේඛන, බුද්ධ රූප සංරක්ෂණය කරගෙන කෞතුකාගාරයක් පිහිටුවීමට සැලසුම්කොට තියෙනවා. දරුවන් දහමින් පෝෂණය කිරීම තමයි අපේ අරමුණ”

දහම් පාසලේ ගුරුවරියක ලෙස සේවය කරන බී. එම් සුජීවා ප්‍රියදර්ශනී මෙසේ පැවසුවාය.

“දැනට වසර 32ක් තිස්සේ මම දරුවන්ට දහම් අධ්‍යාපනය ලබාදෙනවා. මමත් ඉගෙන ගත්තේ මෙම දහම් පාසලෙන්. අපේ දහම් පාසලට වසර 125ක් පිරීම අපිටත් විශාල සතුටක්. මේ දහම් පාසලෙන් ඉගෙන ගත් අය අද සමාජයේ උසස් තැන්වල ඉන්නවා. වෛද්‍යවරු, නීතිඥයන්, දේශපාලඥයන් ඒ අතර ඉන්නවා”.

1895 අගෝස්තු 03 දින දහම් පාසල් දිනය ලෙස රජය විසින් ප්‍රකාශයට පත්කොට තිබේ. එම දිනය නිමිති කරගෙන සෑම වර්ෂයකදීම දිවයිනේ එක් දිස්ත්‍රික්කයක් තෝරාගෙන දහම් පාසල් දින සැමරුම් ජාතික වැඩසටහන හා ජාතික මහෝත්සවය පවත්වනු ලබයි. මෙවර 125 වැනි දහම් පාසල් දින සැමරුම් උත්සවය පැවතියේ හම්බන්තොට කසාගල රජමහා විහාරස්ථානයේදීය. බොදු පිළිවෙත් සුරකින දැහැමි සමාජයක් උදෙසා 125 වන දහම් පාසල් දින සැමරුම් ජාතික මහෝත්සවය ශ්‍යාමොපාලී මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ රුහුණු මාගම්පත්තුව ඇතුළු ගිරුවාගම දොළොස් දහස් රට ප්‍රධාන අධිකරණ සංඝනායක කසාගල රජමහා විහාරාධිපති ශාස්ත්‍රපති පූජ්‍ය තලම්පෝරුවේ ඉන්දසිරිසුමන නායක ස්වාමීන් වහන්සේ ඇතුළු මහානායක ස්වාමීන් වහන්සේලාගේ ගෞරවනීය සහභාගීත්වයෙන් අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

මෙරට ලියපදිංචි මුළු දහම් පාසල් සංඛ්‍යාව 11034කි. දහම් පාසල් ශිෂ්‍ය සංඛ්‍යාව 2 258 382කි. මුළු දහම්පාසල් ගුරුභවතුන් සංඛ්‍යාව 131,948කි. කෙසේවුවද වත්මන් රජය මඟින් දහම් අධ්‍යාපනයට මෙන්ම දහම් පාසල් ගුරුවරුන්ටද නිසි තැනක් ලබා දී ඇත්තේ දහම් පාසල් විෂය අධ්‍යාපන රාජ්‍ය ඇමතිවරයකු යටතට පත්කිරීමෙනි.

## දහම් පාසල් අධ්‍යාපනයට ප්‍රථම වරට රාජ්‍ය ඇමැතිවරයෙක්

## දහම් පාසල් ශිෂ්‍ය සංඛ්‍යාව 2,258,382ක්

## මුළු දහම් පාසල් ගුරුභවතුන් සංඛ්‍යාව 131,948කි

## මෙරට ලියාපදිංචි මුළු දහම් පාසල් සංඛ්‍යාව 11034ක්

---

# කොවිඩ් දුරැකර පාසල් පණ ගැන්වීම යුනිසෙෆ් ඇගයුමට

● සුභාෂිණී ජයරත්න

**කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් ලොව සෑම රටකම ප්‍රාථමික හා ද්විතීයික පාසල් වැසීගිය බවත් එය බිලියන 1.5 කට වැඩි ඉගෙනුම ලබන දරු පිරිසකට සෘජුව බලපෑ බවත් යුනෙස්කෝ සංවිධානය පසුගියදා වාර්තා කළේය. එහෙත් අප රට මේ සියලු අභියෝගයන් පරදවමින් කොවිඩ් අභියෝගයට සාර්ථකව මුහුණ දුන්නා පමණක් නොව ලොව අන් සියලු රටවලට සාපේක්ෂව ලක්ෂ 45 ක් වූ දරු පිරිසකට යළිත් පාසල් දොරගුළු විවෘත කරන්නට සමත්වීම අද ලෝක වාර්තාවක් අතරටද එක් වන්නේය.**

යුනිසෙෆ් ආයතනය පසුගියදා ලෝකයාට පැවැසුවේ කොවිඩ් 19 පරදා ආරක්ෂිතව සිසුන් පාසල් යැවූ ප්‍රථම දකුණු ආසියාතික රට ලෙස ලංකාව හැඳින්විය හැකි බවයි. යුනිසෙෆ් ආයතනයේ අදහස මෙසේ ලොවට ප්‍රකාශ කළේ එහි නියෝජිත ටිම් සූටන් මහතාය.

“COVID-19 සඳහා ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීම පිළිබඳව ශ්‍රී ලංකාවට අපි සුබ පතන්නෙමු. එමඟින් පාසල් විවෘත කර ළමයින් සුරක්ෂිතව ගෙන ඒම සඳහා දකුණු ආසියාවේ ප්‍රථම රටවල් අතරට පැමිණීමට හැකි වී තිබේ” යනුවෙන් යුනිසෙෆ් ආයතනයේ නියෝජිත ටිම් සූටන් මහතා පැවැසුවේ ප්‍රශංසනාත්මකවය. යුනිසෙෆ් ආයතනය ශ්‍රී ලංකාව පැමිණි මේ ගමන්මඟ තවදුරටත් විග්‍රහ කරමින් ඔහු පැවැසූයේ “පාසල් වසා දැමීමේදී ලංකාවේ අධ්‍යාපනය අඛණ්ඩව පැවතුණා. දරුවන්ට වඩාත්ම අවදානමට ලක්විය හැකි ස්ථාන අවම කර ඉගෙනීමට හොඳම ස්ථානය පාසල බවට පත් කරන්නට ඔවුන්ට හැකිවුණා. දැන් ඔවුන්ගේ ගුරුවරුන් සහ මිතුරන් සමඟ ධනාත්මක, ආරක්ෂිත පාසල් පරිසරයක සිටින බව අපි දනිමු. කෙසේ වෙතත්, COVID-19 අවදානම තවමත් පවතී. අපගේ පණිවිඩය සරල වන්නේ එබැවිනි ”යනුවෙන් එහි හැඳින්විණි.

මාර්තු මස 12 වැනිදා කොවිඩ් අවදානමින් මිදෙන්නට වැසු පාසල් යළි මාස 5 කට පසු එනම් පසුගිය අගොස්තු 10 වැනිදා සියලු දරුවන්ට යළිත් පාසල් දොරටු විවෘත කරමින් ආරම්භ කළ ගමන මේ වන විට ලොවම ප්‍රශංසා කරති. ඒ ජනාධිපතිවරයා, අගමැතිවරයා, හිටපු අධ්‍යාපන ඇමැති ඩලස් අලහප්පෙරුම හා වත්මන් අධ්‍යාපන ඇමැති ජී.එල් පීරිස් ප්‍රමුඛ රජය හා සෞඛ්‍ය නිලධාරීන් ලබා දුන් සෘජු නායකත්වයටය. මේ වන විට ඒ තත්ත්වය තවත් ඉදිරියට යමින් එළඹෙන සැප්තැම්බර් මස 8 වැනිදා සිට යළිත් පෙර තිබූ පාසල් පරිසරය ඇති කරන්නට මේ වන විටත් රජය හා නව අධ්‍යාපන ඇමැති ජී. එල්. පීරිස් මහතා ප්‍රමුඛ අධ්‍යාපන හා සෞඛ්‍ය බලධාරීන් කටයුතු කරමින් සිටිති. මාස කිහිපයකට පාසල් දරුවන්ගේ අධ්‍යාපනය බිඳ වැටුණද පාසල් පද්ධතියේ සියලු අභියෝගවලට මුහුණ දෙමින් පන්ති කාමරයේ සිට පාසල් පරිබාහිර සමාජයම යළි ප්‍රතිනිර්මාණය කරමින් ගෙන ගිය මේ වැඩ පිළිවෙළ අද ලොවටම ආදර්ශයක් ගෙන දෙන්නේය. සංවර්ධනය වෙමින් පවතින රටක් යැයි හංවඩු ගැසූ ලේබලයෙන් මිදෙමින් දියුණු රටවලට පවා කරන්නට නොහැකි වූ විස්මිතයන් කොවිඩ් හමුවේ කරමින් මේ වන විටත් යුනිසෙෆ් ආයතනයේ ප්‍රශංසාව හිමිවී ඇත.

කොරෝනා වසංගතයය හේතුවෙන් මේ වන විටත් ලොව බොහෝ රටවලට පාසල් යළි විවෘත කරන්නට නොහැකි වී ඇත්තේ දරුවන්ගේ සුරක්ෂිතබව තහවුරු කිරීමට නොහැකි නිසාවෙනි. එක්සත් ජනපදය වැනි ඇතැම් දියුණු රටවල පවා මේ වන විටත් පාසල් ආරක්ෂිතව විවෘත කරන්නට හැකිවී නැත. ඒ පාසල් විවෘත කළද මේ වසංගතය පාලනය කළ නොහැකි නිසාවෙනි. ලොව බොහෝමයක් රටවල් මේ වන විට දරුවන්ගේ අධ්‍යාපනය හමුවේ අසරණ වී ඇත. ඊශ්‍රායලය පාසල් නැවත විවෘත කළද නිරෝධායන නීති අනුගමනය නොකිරීමෙන් බොහෝ පන්ති කාමර සිසුන්ගෙන් පිරෙන්නට විය. මේ තත්ත්වය පුපුරා ගොස් ගුරුවරුන් පවා කොරෝනා වෛරසයෙන් මිය යන්නට වූ අතර අවසානයේ දරුවන්ගේ ආරක්ෂාව පතා පාසල් යැවීම නතර කරන්නට දෙමවුපියන්ට සිදුවිය. බොහෝමයක් රටවල යළි පාසල් විවෘත කිරීම දරා ගත නොහැකි වූ මිල අධික ක්‍රියාවකි. එක්සත් ජනපදයේ ප්‍රාථමික සහ ද්විතීයික පාසල්වලට මේ වන විට ඩොලර් බිලියන 13.5 ක ෆෙඩරල් සහනයක් ලැබී ඇත. කෙසේ වෙතත් මෙම රටේ පාසල් නැවත විවෘත කිරීමට ඩොලර් මිලියන 328 ක් වැයවන බව ගණන් බලා ඇත. කොවිඩ් පුපුරා යාම හේතුවෙන් 2020 මාර්තු මාසයේ සිට ඉන්දියාවේ පාසල් සියල්ල වසා දමා ඇත. තවමත් ඉන්දියාවේ පාසල් නැවත විවෘත කිරීමේ දිනය අවිනිශ්චිතයි. සමහර මාධ්‍ය වාර්තාවලට අනුව, 2020 සැප්තැම්බර් 1 සිට නොවැම්බර් 14 දක්වා පියවරෙන් පියවර පාසල් නැවත විවෘත කිරීමට ඉන්දීය රජය සැලසුම් කරමින් සිටියි. බොහෝ යුරෝපීය හා නැගෙනහිර ආසියානු රටවල පාසල් ද යළි ආරම්භ කර ඇත්තේ මේ වසංගතයේ යම් පාලනයක් හෝ සිදුවන දිනයක් නොතකාය. සැප්තැම්බර් මාසයේදී පාසල් නැවත විවෘත කිරීමට එංගලන්තය ද සූදානම් වෙමින් සිටියද තවමත් ඒ සියල්ල අවිනිශ්චිතය..

පාසල් යළි විවෘත කිරීම ලොවට අභියෝගයක් වෙද්දී ලංකාව ඒ අභියෝගයන් ජය ගනිමින් කිසිදු සහනාධාර පවා නොලැබ ආ ගමන ප්‍රශංසනීය ය. ඉන්දියාවේ හින්දුස්ථාන් ටයිම්ස් පුවත්පත ලංකාවේ පාසල් විවෘත කිරීම ගැන අදහස් දැක්වූයේ මේ ආකාරයෙනි. “......ඔවුන් කොවිඩ් නිරෝධායන නීති අකුරට අනුගමනය කරන්න කටයුතු යෙදුවා. ගුරුවරුන් කාර්ය මණ්ඩලය කලින්ම පැමිණ පාසල් සකස් කිරීමේ කටයුතු කළා. ඔවුන් කොවිඩ් වසංගතයෙන් පසුව සාර්ථකව පාසල් විවෘත කළා පමණක් නොව අගොස්තු 5 වැනිදා මහ මැතිවරණයක්ද පැවැත්වුවා..“යනුවෙනි.

මේ විස්මිතයන් සියල්ල සිදුකළේ කොයි ආකාරයෙන්ද? හිටපු අධ්‍යාපන ඇමැතිවරයා හා නව අධ්‍යාපන ඇමැතිවරයා නියෝජනය කරමින් නව අධ්‍යාපන ලේකම් මහාචාර්ය කපිල පෙරේරා මෙසේ පැවසීය.

“අපි පාසල් යළි විවෘත කළේ ලෝක සෞඛ්‍ය සංවිධාන හා අපේ සෞඛ්‍ය බලධාරීන් දුන් නිර්දේශවලට අනුවයි. අපිට ලොකු අභියෝගයක් වුණේ සුරක්ෂිත පාසල් පරිසරයක් ඇති කරන්නේ කොහොමද කියන එකයි. කෙසේ වෙතත් අපි ඒ අභියෝගය ජය ගන්නට හැකිවුණා. මේ අතර දරුවන්ගේ අධ්‍යාපනය කඩා වැටෙන්නට ඉඩ දුන්නේ නැහැ. රටේ සෑම පාසලකටම කොවිඩ් වෙනුවෙන් යළි පාසල් ප්‍රතිනිර්මාණය කිරීමට රුපියල් මිලියන 600 ක ප්‍රතිපාදන ලබා දුන්නා. මේ සියල්ල කළේ පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ඒකායන අරමුණින්. එක් පැත්තකින් ලෝක සෞඛ්‍ය සංවිධානය පවසා සිටින දෙයක් වන්නේ මේ වසංගතයේ අවසානයක් දකින්න තව කාලයක් යන බව. මේ නිසා අපි කෙසේ හෝ මේ අභියෝගය ජය ගත යුතු වුණා. පාසල් විභාග පැවැත්විය යුතු වුණා. පාසල් ඇරීමේ අභියෝගය ජය ගනිමින් රජය කෙසේ හෝ සුරක්ෂිත පාසල් පරිසරයක් ඇති කළා. ඒ වගේම මේ වන විට එන ඕනෑම අභියෝගයකට සාර්ථකව මුහුණ දීමේ හැකියාව අප සතුයි. නමුත් අපි කිසි විටකත් කොවිඩ් අවදානමින් මිදීමේ හැකියාවක් නැහැ. අපි මේ සියල්ල කරන්නේ ඒ අවදානම අතදරා ගෙනයි...“ ඒ නව අධ්‍යාපන ලේකම්වරයාය.

අධ්‍යාපන අමාත්‍යාංශය ලොකු පොඩි පාසල් භේදයකින් තොරව සෑම පාසලකටම මේ අවදානමින් මිදීමේ අභියෝගය දරන්නට පාර කපා දුන්නේය. රජය ආ ඒ ගමන් මඟට දුෂ්කර පාසල් එක්වූයේ මේ ආකාරයෙනි.

“අපේ පාසල සිසුන් 355 ක් සිටින ගමේ දුෂ්කර පාසලක්. අපිට ඇත්තෙන්ම කොවිඩ් අවදානමක් තිබුණේ නැහැ. එහෙම කියලා අධ්‍යාපන අමාත්‍යාංශය අපිව අත් හළේ නැහැ. අනිකුත් පාසල් වගේම අපේ පාසලටත් අවශ්‍ය සියලු පහසුකම් ලබා දුන්නා. පාසල්වල අවශ්‍යතාවයන් අනුව හා යම් වර්ග කිරීම් වලට යටත්ව අවශ්‍ය සියලු ප්‍රතිපාදන ලබා දුන්නා. ලබා දුන් සෞඛ්‍ය උපදෙස් අපි වගකීමෙන් ක්‍රියාත්මක කළා. රජය කොරෝනා වසංගතයේදි ලබා දුන් නායකත්වය ඉතාව වටිනා දෙයක් වුණා. ඒ වගේම දරුවන් නිවසේ සිටින කාලයේ ඒ දරුවන්ගේ හැකියා වර්ධනය කරන්න හොඳ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළා. දරුවන්ට යම් යම් නිර්මාණාත්මක දේ සිදු කරන්න අවස්ථාව ලබා දුන්නා.....“ ඒ ලංකාවේ දුෂ්කර පාසලක් වන මහියංගනයේ රොටලවෙළ පාසලේ විදුහල්පති සරත් රූපසිංහය.

කොවිඩ් අවදානම දැනුණු නාගරික පාසල්ද සුරක්ෂිත පරිසරයක් ඇති කරන්නට හැකිවූයේ නිසි නායකත්වය නිසාවෙනි. මෙහිදි සෞඛ්‍ය බලධාරීන් ලබා දුන් නිසි සෞඛ්‍ය උපදෙස් පාසල් බලධාරීන් විසින් අනුගමනය කිරීම හේතුවෙන් සිසුන් වැඩි නාගරික පාසල් පරිසරද අද සුරක්ෂිත වී ඇත. ලබන මස සිට මේ පාසල්ද යළිත් සුපුරුදු පාසල් පරිසරයටම එක් වන්නේය.

“පාසල කියන්නේ පොදු සමාජයේ හරස් කඩක්. කොවිඩ් ආරම්භයත් සමඟ රජය ගත් දූරදර්ශී ක්‍රියාවක් තමයි පාසල් වසා දැමීම. දෙවැනුව විදුහල්පතිවරු නිසි වැඩ පිළිවෙළක් යටතේ දුරස්ත අධ්‍යාපනය ක්‍රියාත්මක කළා. මෙහිදි අධ්‍යාපන අමාත්‍යාංශය සාධනීය වැඩ පිළිවෙළ රැසක් ක්‍රියාත්මක කළා. පාසල් යළි විවෘත කිරීමේදි පියවරෙන් පියවර ලබා දුන් සෞඛ්‍ය නිර්දේශ හා උපදෙස් ගොඩාක් වැදගත් වුණා. අද සෑම පාසල් පරිසරයක්ම කොවිඩ් වසංගතයෙන් මිදිලා. දරුවන්ට සුරක්ෂිතයි. මෙය අපි ලද සුවිශාල ජයග්‍රහණයක්...“ ඒ හෝමාගම මහින්ද රාජපක්ෂ විදුහලේ විදුහල්පති එම්.ආර්.ඩී කසුන් ගුණරත්නය.

කොවිඩ් වසංගතය විසින් දකුණු ආසියාවේ ළමුන් මිලියන 430 කට වැඩි පිරිසකට ඉගෙනීම කඩාකප්පල් කර ඇති අවධියක ඒ සියලු අභියෝග හා වියදම් කරට ගනිමින් 10,175 ක් වූ පාසල් පද්ධතිය මෙන්ම ලක්ෂ 45 ක් වූ සිසු පරපුරට නැවතත් පාසල් විවෘත කරන්නට අපිට හැකිවීම ඇත්තෙන්ම ලෝක වාර්තා අතරට එක් වන්නේය.



අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්. පීරිස්



හිටපු අධ්‍යාපන ඇමැති ඩලස් අලහප්පෙරුම



අධ්‍යාපන ලේකම් මහාචාර්ය කපිල පෙරේරා



හෝමාගම මහින්ද රාජපක්ෂ විදුහලේ විදුහල්පති එම්.ආර්.ඩී කසුන් ගුණරත්න



මහියංගනයේ රොටලවෙළ පාසලේ විදුහල්පති සරත් රූපසිංහය

unicef

## ලංකාව අභියෝග ජය ගනිමින් සහනාධාර නොලැබ ආ ගමන ප්‍රශංසනීයයි

හින්දුස්ථාන් ටයිම්ස් පුවත්පත

## එක්සත් ජනපදයේ පාසල් විවෘත කිරීමට ඩොලර් මිලියන 328ක්

## ඉන්දියාවේ පාසල් නැවත විවෘත කරන දිනය අවිනිශ්චිතයි

## අභියෝග ජය ගත්තත් අවදානම අමතක කර නැහැ

අධ්‍යාපන ලේකම් කපිල පෙරේරා

## රජය ලබා දුන් නායකත්වය මීට ප්‍රබල හේතුවක්

විදුහල්පතිවරු



# අහස බෙදා ගන්න විනය කියා දෙන ඩ්‍රෝන තාක්ෂණය

**මීටර 100 කට වඩා ඉහළ උසකට ඩ්‍රෝනයක් ඔසවන්නට නීතියෙන් අවසර නෑ**

● ජානක ලියනආරච්චි

**ඩ්‍රෝන කැමරාවක් යොදගෙන කොළඹ අධි ආරක්ෂිත කලාපය වීඩියෝ කළ චීන ජාතිකයෙක් පසුගිය සෙනසුරාදා (22) කොල්ලුපිටිය පොලිසියෙන් අත්අඩංගුවට ගත්තේය. මේ චීන ජාතිකයා ඩ්‍රෝන කැමරාව පියාසර කරවමින් වීඩියෝ කිරීම් කර තිබුණේ අරලියගහ මන්දිරය ආසන්නයේ මහල් 35කින් යුතු හෝටලයක ඉහළ මාලයේ සිටය. අනතුරුව ගුවන් හමුදාවට ලද තොරතුරක් අනුව ගුවන් හමුදාව විසින් මේ තැනැත්තා අත්අඩංගුවට ගෙන කොල්ලුපිටිය පොලිසියට බාර දී තිබිණි.**

අධිකරණයට ඉදිරිපත් කළ සැකකරු රුපියල් පනස් දහසක ශරීර ඇපයක් මත නිදහස් කළේය. නඩුව විභාග වෙමින් පවතී.

පසුගිය ජූලි මස 20 දා යුක්‍රේන ජාතිකයෙක් නුවර බහිරවකන්ද පුද්ගලික තානායමක සිට මහනුවර රාත්‍රී දර්ශන අනවසරයෙන් වීඩියෝ කරමින් සිටිය දී ඩ්‍රෝන කැමරාව මහනුවර ජනාධිපති මන්දිරය භූමියට ඇද වැටුනේය. සංචාරක වීසා මගින් රට තුළ රැඳී සිටි මේ තැනැත්තා ජූලි මස 20 දා මහනුවරට පැමිණි දින සිට නුවර රාත්‍රී දර්ශන වීඩියෝගත කර තිබිණි. ජනාධිපති මන්දිරයට කැමරාව ඇද වැටුණු පසු මහනුවර සංචාරක පොලිසිය විසින් මේ තැනැත්තාව අත්අඩංගුවට ගත්තේය. ඔහුව උසාවියට ඉදිරිපත් කළේය. මේ වනවිටත් මේ යුක්‍රේන ජාතිකයා සිටින්නේ බන්ධනාගාරගතවය. මේ සිදුවීම් දෙකම ජාතික ආරක්ෂාව සම්බන්ධව ගැටලු ඇති කළේය. යුද්ධය අවසන් වූ පසුත් බිහිසුණු අන්තවාදී ත්‍රස්ත ප්‍රහාරයකට ලක්ව සිටින රටක් ලෙස ඒ සිදුවීම් සම්බන්ධව වෙනත් මානයකින් සිතන්නට රටට බල කර තිබිණි.

## අතීත සිදුවීම්

මෙවැනි සිදුවීම් විටින් විට වාර්තා වූයේය. ඩ්‍රෝන කැමරා භාවිතයෙන් වීඩියෝගත කිරීම සම්බන්ධ සිද්ධි කිහිපයක් මෑත වකවානුව තුළ රට තුළ ආන්දෝලනයක් ඇති කළේය. ඉන් මතකයට නැගෙන ප්‍රධානම සිදුවීම වූයේ වර්ෂ 2017 ජනවාරි මාසයේ දී රුවන්වැලි සෑයේ කප්රුක් පූජාවක් ඩ්‍රෝන තාක්ෂණයෙන් වීඩියෝගත කිරීමට ගිය තරුණයෙකුගේ ඩ්‍රෝන කැමරාවක් පාලනයෙන් මිදී සෑයේ කොත් කැරැල්ලෙහි ගැටීමය. අනතුරුව එය හතරැස් කොටුවේ වැදී ගර්භය මත පතිත වෙමින් සලපතල මලුවට ඇද වැටුණේ දෙනෝ දාහක් බැතිමතුන් බලා සිටිය දී ය. රටේ සංස්කෘතියේ මෙන්ම ඉතිහාසයේ ප්‍රධානම සංකේතයක් වූ රුවන්වැලි සෑ රදුන්ට යම් භෞතික හානියක් සිදුකළ මේ සිදුවීම සමාජය තුළ විශාල කතිකාවක් ඇති කළේය.

ඒ සතියේම දිනක හම්බන්තොට චීන ශ්‍රී ලංකා සහයෝගීතාවයෙන් ආරම්භ කරන්නට යෙදුණු කර්මාන්ත පුරයේ සමාරම්භක අවස්ථාව වාර්තා කරන්නට ගිය පෞද්ගලික රූපවාහිනී නාලිකාවක් විසින් අනවසරයෙන් යැවූ ඩ්‍රෝන කැමරාවක් අගමැති ආරක්ෂක නිලධාරීන් විසින් අත්අඩංගුවට ගත්තේය.

සන්ඩේ ලීඩර් කර්තෘ ලසන්ත වික්‍රමතුංග ගේ සිරුර බොරැල්ල කනත්තේ දී යළි ගොඩගත් අවස්ථාවේ දී එය වාර්තා නොකරන ලෙසට පවුලේ ඥාතීන් ඉල්ලා සිටියේය. එබැවින් පොලිසිය මාධ්‍යයට එම අවස්ථාව වාර්තා කිරීම වැළැක්වූයේය. නමුත් එක්තරා මාධ්‍ය ආයතනයක් විසින් මේ අවස්ථාව වීඩියෝ කිරීමට ඩ්‍රෝන කැමරාවක් ගුවන්ගත කළේය. ආරක්ෂකවලටත් කර කියාගත හැකි දෙයක් නැති විය. ඩ්‍රොන කැමරාව සොයා ගැනීමටවත් ඔවුන්ට හැකි වූයේ නැත. මේ සිදුවීම් දෙකම ඩ්‍රෝන කැමරා භාවිතයේ දී මාධ්‍ය අනුගමනය කළ යුතු සදාචාර සීමා පිළිබඳ රටේ අවධානය යොමු කළේය.

ඉන් අනතුරුව ඩ්‍රෝන කැමරා භාවිතය සම්බන්ධ නීති හා ආචාරධර්ම ගැන දැනුවත් කිරීමේ වැඩ මුළුවක් මාධ්‍යය වෙනුවෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් සැලසුම් කළේය. එහිදී ලංකාවේ ඩ්‍රෝන යානා භාවිතය සම්බන්ධව නෛතික රාමුව සම්බන්ධව ප්‍රමාණවත් දැනුවත් කිරීමක් සිදු විය.

## බලාත්මක වන නීති

දැනට ඩ්‍රෝනවලට අදාළව ශ්‍රී ලංකාවේ බලාත්මක වන්නේ ඉතාම සීමිත නීතිමය රාමුවකි. ඩ්‍රෝනයක් භාවිතා කරන අය එය අනිවාර්යයෙන් සිවිල් ගුවන්සේවා අධිකාරියේ ලියාපදිංචි කළ යුතුය. එම ලියාපදිංචි කිරීම ක්‍රියාවලිය ඉතා පහසු එකකි. ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ වෙබ් අඩවියට පිවිස ඒ පිළිබඳ තොරතුරු පහසුවෙන් ලබා ගත හැකිය. එහෙත් විනෝදාංශයක් වශයෙන් හෝ අධ්‍යාපනික අරමුණු සඳහා 200g කට අඩු බරකින් යුත් කැමරාවක් හෝ වෙනයම් රූගත කිරීමේ උපකරණයක් සවි කර නොමැති ඩ්‍රෝන යානයක්, තම ගෙවත්තේ අඩි 150 කට අඩු ගුවන් පරාසයක් තුළ ගුවන් ගත කිරීම සඳහා අවසරයක් හෝ ලියාපදිංචි කිරීමක් අවශ්‍ය නැත. දැනට ඇති නෛතික රාමුව තුළ ඩ්‍රෝනයක් යොදාගෙන පොදු ජනතාවට එසවිය හැකි උපරිම බර ප්‍රමාණය කැමරාවක බර පමණි.

ඩ්‍රෝනයක් භාවිත කළ යුත්තේ කෙසේද යන කාරණය සම්බන්ධයෙනුත් හඳුනාගත හැකි සීමා කිහිපයක් ඇත. උදාහරණයක් හැටියට මීටර 100 කට වඩා ඉහළ උසකට ඩ්‍රෝනයක් ඔසවන්නට නීතියෙන් අවසරයක් නැත. එසේම ධාවනය කරන පුද්ගලයාට පෙනෙන සීමාවෙන් ඔබ්බට ඩ්‍රෝනයක් ධාවනය කිරීමත් නීතියෙන් තහනම්ය.

## ඩ්‍රෝන යානාවල ඉතිහාසය

ස්වාධීනව පාලනය වන හෝ දුරස්ථ පාලක ආධාරයෙන් හැසිරවිය හැකි රොබෝ නිෂ්පාදනයක් වශයෙන් මේ වනවිට සුලභව ඇති ඩ්‍රෝන යනාවක සංකල්පීය අතීතය මිනිසාගේ චින්තන පරිණාමයේ ආරම්භක අතීතතට දිවෙන්නකි. ගුවනින් යන යාත්‍රා පිළිබඳ සංකල්පය ශිෂ්ඨාචාරවත් වූ මිනිසුන්ගේ පරිකල්පනා තුළ සහශ්‍ර ගණනකට කලින් ඇතිවන ආකාරය දේව කතා ආශ්‍රිත ආගමික සාහිත්‍යයේ ගැබ් වී තිබිණි. එහෙත් එම සංකල්ප ප්‍රායෝගික වන්නේ පසුගිය සියවස මුල් භාගයේ දී ය.

ගුවන් ආකෘතියක් පොළොවෙන් ඉහළට එසවූ මුල්ම නිර්මාපකයන් වන්නේ ලුවී බ්‍රෙග්‍යුට් සහ ජැක් බෙග්‍යුට් දෙසෝයුරන්ටය.ඔවුන් සිය පළමු ගුවන් ගමනේ දී සිය යානය අඩි දෙකක් ඉහළට එසවූහ. ගුවන්ගත යානයක් පිළිබඳ මුල්ම ප්‍රායෝගික ආරම්භය වූයේ එය ය. වර්ෂ 1917 දී රයිට් සහෝදරයන් විසින් ගුවන් යානා පියාසැරිය යථාර්ථයක් කර වසර 16කට පසුව නිකොලායි ටෙස්ලා විසින් හඳුන්වා දුන් ගුවන්විදුලි සන්නිවේදන තාක්ෂණය වැඩි දියුනු කරමින් නියමුවෙක් රහිත ගුවන් යානයක් නිර්මාණය වූයේය. එය නිර්මාණය වූයේ ඉලක්ක හඹායන පියාසර බෝම්බයක් ලෙසය. මෙම නිර්මාණය එවකට යුද්ධයකදී භාවිත වූයේ නැත. එහෙත් මෙය වර්තමාන මිලිටරි ඩ්‍රෝන තාක්ෂණයට ප්‍රායෝගික ප්‍රවේශයක් ලබා දුන්නේය. දෙවන ලෝක යුද්ධ වකවානුවේ , වර්ෂ 1943 දී ජර්මානු හමුදා විසින් මුල්ම දුරස්ථ පාලක අවිය දැවැන්ත නැව් ගිල්වීම සඳහා භාවිත කළේය. එය රාත්තල් 2300ක් බර බෝම්බ සහිත දුරස්ථ පාලක යානයකි. වර්තමාන මිලිටරි ඩ්‍රෝන යානා සහ මිසයිල සම්බන්ධ- දැවැන්තම ප්‍රායෝගික රූපණයේ ප්‍රථම අවස්ථාව මෙයය.

1960 දශකයේ ට්‍රාන්ස්සිටර් තාක්ෂණයේ දියුණුව ඩ්‍රෝන තාක්ෂණික සංකල්පය නව මගකට ගෙන ආවේය. මෙම තාක්ෂණය සන්නද්ධ ඩ්‍රෝන යානාවක් දක්වා වර්ධනය වී එය ප්‍රහාර සඳහා මුල්වරයට යොදවා ගන්නේ වර්ෂ 2001 -9 -11 ප්‍රහාරයත් සමගය. සී.අයි.ඒ සංවිධානය විසින්ඇෆ්ගනිස්ථානයට එරෙහිව ප්‍රහාර සඳහා සන්නද්ධ ඩ්‍රෝන යානා යොදා ගත්තේය. ඔසාමා බින් ලාඩන් යැයි සැක කරන පුද්ගලයෙක් ඉලක්ක කරගැනීම සඳහා මිනිසුන් රහිත ප්‍රෙඩියේටර් ඩ්‍රෝන යානයක් ඇමරිකාව විසින් භාවිත කළේය. යානාව සිය ඉලක්කය සොයා ගත්තේය. වර්ෂ 2002 පෙබරවාරි මස එල්ල වූ මෙම ඩ්‍රෝන ප්‍රහාරයෙන් ඉතිහාසයේ මුල්ම ඩ්‍රෝන යානා මිනී මැරීම සී.අයි.ඒ . සංවිධානය විසින් සිදුකළේය. කාලකණ්ණි ඇත්ත වූයේ සී.අයි.ඒ කාරයන් ලෝක ඉතිහාසයේ මුල්ම ඩ්‍රෝන ප්‍රහාරයෙන් මරා දැම්මේ ඔසාමා බින් ලාඩන් නොව සීරියම් ලෝහයඑකතු කරමින් සිටි දරාස් ඛාන් නම් අහිංසක මිනිසෙකු වීමය.

## ලංකාවේ ඩ්‍රෝන තාක්ෂණය භාවිතය

මේ වනවිට ලෝකය ඩ්‍රෝන යානාවල විපුලත්වය අත්දකිමින් හිඳින්නේය. එය අතිශයින්ම ප්‍රයෝජනවත් මෙවලමක් වී තිබෙන්නේය. අප නොදන්නවාට එම තාක්ෂණය ඵලදායී ලෙස යොදා ගත හැකි ආකාරය සම්බන්ධව මේ වනවිට රටේ නවෝත්පාදකයෝ පර්යේෂණ පවත්වමින් සිටිති. දැනට බහුලවම ඩ්‍රෝන තාක්ෂණය භාවිත වන්නේ ඡායාරූප හා වීඩියෝකරණය සඳහාය. පුද්ගලික හා රාජ්‍ය අංශද්වයෙහි භූමි සමීක්ෂණය හා තක්සේරුකරණය වැනි අවශ්‍යතා සඳහා වැදගත්වන තාක්ෂණිය ඡයාරූප හා දත්ත එක් රැස් කරගැනීමට ලංකාවේ දී ඩ්‍රෝන යානා යොදා ගත් අවස්ථා තිබේ. මෙම තාක්ෂණික ක්‍රමවේද වැඩි දියුණු කරගත හැකි ආකාරය ගැන පර්යේක්ෂකයෝ අවධානය යොමු කිරමින් සිටිති. එමෙන් ලෝක ආදර්ශ ගුරුකර ගනිමින් ලංකාවේ ප්‍රමුඛ සමාගම් කීපයක් වෙරළ තීරය දිගේ ඉතා කුඩා අයිතම බෙදා හැරීම පහසු කරන ජාලයක් සකස් කිරීම අරඹා ඇත. එමෙන්ම ලංකාවේ කෘෂි කර්මාන්තයට සම්බන්ධ ප්‍රමුඛ සමාගම් දෙකක් කිලෝ ග්‍රෑම් දහයක ධාරිතාවක් සහිත කෘෂිකාර්මික ඩ්‍රෝන මෙහෙයවීම හා නඩත්තු කිරීම සම්බන්ධව අවධානය යොමු කර තිබේ. ඩ්‍රෝන තාක්ෂණය සම්බන්ධව දැනට පවතින නෛතික රාමුව සම්බන්ධ සාධනීය සංශෝධන ප්‍රමාණයක් එක්වීමෙන් මේ තාක්ෂණික ප්‍රවේශයන් ප්‍රායෝගික වනු ඇත. දැනටමත් එම සමාගම් වෙත මහජනතාව වෙත පනවා ඇති සම්මිත බර ප්‍රමාණයට වඩා වැඩි බර ප්‍රමාණයක් ඩ්‍රෝන මගින් එසවීමට අවසර ලබා දී තිබේ.

එමෙන් ජාතික ආපදා තත්වයන්හි සිදු කර පිරික්සුම් කටයුතු වලදී ඩ්‍රෝන තාක්ෂණය අපේ ඇත්තෝ භාවිතා කර තබුණහ. හදිසි තත්වයක දී සිදුවී ඇති හානිය පිළිබඳ පූර්ව තක්සේරුව, නිවැරදි ප්‍රායෝගික එළඹුම් සම්බන්ධ අදහසක් ලබා ගැනීමට වර්ෂ 2018 ගං වතුර අවස්ථාවේ දී රතුකුරුස සංවිධානය විසින් ඩ්‍රෝන යානා කිහිපයක් යොදා ගත්තේය.

ලෝකයේ විශිෂ්ටතම තාක්ෂණික මෙවලම් භාවිතයේ විපුලත්වය සමාජයට ලැබෙන්නේ එම තාක්ෂණික මෙවලම් හසුරුවන්නන්ගේ අපේක්ෂා අරමුණු හා පරිකල්පනාවන් තුළය. මේ සම්බන්ධව සංවාදයක් ලොව පුරා ඇති වී තිබේ

"අහස යනු ඉතා විශාල අවකාශයකි. එකට ජීවත්වීම නියාමනය කිරීම සඳහා අහස පරිහරණය කිරීමේ උපාය මාර්ගයක් අවශ්‍යය. ඒ සඳහා ඩ්‍රෝන තාක්ෂණය වැදගත්. " ලෝ ප්‍රකට තාක්ෂණික සමාගමක ප්‍රධානියෙක් වූ බුස්ෆෙල්ඩ් වරෙක කියා තිබිණි.

ලෝ ප්‍රකට ස්විස්කොම් සඟරාවේ කතුවරයා කියා තිබුණේ ඩ්‍රෝන යනු සෙල්ලම් බඩු නොවන බවය. මේ ඉතා ප්‍රයෝජනවත් මෙවලම ප්‍රයෝජනවත් භාවිතයක් සඳහා ලෝකයට නීති අවශ්‍ය බවත් එය භාවිත කරන්නන් සතුව විනයක් බුද්ධියක් හා සමාජ ජීවිතයට ගෞරව කිරීමක් අවශ්‍ය බවත් ඔහු පෙන්වා දී තිබුණේය.

" වර්තමාන නෛතික තත්වයන් අනුව ඩ්‍රෝන භාවිතාවන් බොහෝවිට පුද්ගලිකත්වය උල්ලංඝණය කිරීමකි. මා සිතන ආකාරයට ඔබේ ගෙවත්තේ වෙඩි තැබීමක් ඔබට අවශ්‍ය නැත." ස්විස්කොම් කතුවරයා කියා තිබුණේය.

ඩ්‍රෝන තාක්ෂණය භාවිත කරන අපට එහි වගකීම සම්බන්ධව මීට වඩා යහපත් පූර්ව කථනයක් නොවේ.

ඔබේ ගෙවත්තේ මිනීමැරුමක් නොවන ආකාරයට මේ තාක්ෂණය පරිහරණය කරන්න....





# කුඩු නිසා කුඩේ කුඩු වුණු ගැහැනු

● අමිල මලවිසූරිය

**සිංහවත් විධානාත්මක අපරාධකරුවන් හෙවත් පාතාල සාමාජිකයන් ඇතුළු මත් ජාවාරම්කරුවන් සොයා පොලිසිය සහ පොලිස් විශේෂ කාර්ය බළකාය ක්‍රියාත්මක කරන මෙහෙයුම්වලදී දිනෙන් දින අත්අඩංගුවට පත්වන අපරාධකාරයන් සංඛ්‍යාව ශීඝ්‍ර ලෙස ඉහළ යමින් තිබේ. ඒ අතරේ මහා පරිමාණ මත් ජාවාරම්කාරයන්ට නොදෙවැනිව මහා පරිමාණ මත් ජාවාරම්කාරියන් බොහෝ දෙනෙක් පසුගිය දින කිහිපයේ අත්අඩංගුවට පත්වූහ.**

මෑත ඉතිහාසයේ පාතාලයේ නායිකාවක් ලෙස වැජඹෙමින් මත් ජාවාරම සිදු කළේ කොළඹ ජම්පටාවීදිය මුල්කොට අවට බලය පැතිරූ එඩ්වඩ් මේරි සෙල්වි හෙවත් කුඩු සෙල්වි නමැති කාන්තාවයි. කොරෝනා වසංගතයෙන් පසු බස්නාහිර පළාත් බාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ සෘජු අධීක්ෂණයෙන් සිදු කෙරෙන පාතාලය සහ මත් ජාවාරම් මෙරටින් අතුගා දැමීමේ ක්‍රියාන්විතයේදී මේ වන විට මහා පරිමාණ මත් ජාවාරම්කාරියන් සහ පාතාලය සමඟ සෘජුව සබඳතා පැවැත්වූ ප්‍රබල ගණයේ අපරාධකාරියන් දහයකට වැඩි සංඛ්‍යාවක් අත්අඩංගුවටගෙන ඇති බව වාර්තා වේ.

මෙකී ජාවාරම් සඳහා ළාබාල වයසේ පසුවන තරුණියන්ගේ සිට වයස අවුරුදු පනහ ඉක්මවූ කාන්තාවන්ද සම්බන්ධ වී ඇත. රටේ විවිධ පළාත්වලින් මෙකී කාන්තාවන් අත්අඩංගුවට පත්වන්නේ මත්ද්‍රව්‍ය සහ ලක්ෂ ගණනින් මුදල් සහ දේපළ ද සමඟිනි. ගෙවී ගිය සතියේ දකුණේ පාතාලයේ ප්‍රබලයෙක් වීමට වලි කන දැනට බූස්ස බන්ධනාගාරයේ සිටින ජනිත් මධුශංඛ ද සිල්වා හෙවත් පොඩි ලැසීගේ මව වන 52 හැවිරිදි දිල්ෂානි තනෝජා අත්අඩංගුවට පත් වූයේ මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගත් මුදල් පරිහරණය සම්බන්ධයෙනි.

පැලියගොඩ පිහිටි බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරින්ට ලැබුණු තොරතුරක් අනුව සිදුකළ වැටලීමකදී පොඩි ලැසීගේ මව අත්අඩංගුවට ගනු ලැබූවේ පන්නිපිටිය මාකුඹුර අධිවේගී පිවිසුමට ආසන්න මායා මාවතේ තුන්වන පටුමගේ තට්ටු තුනකින් යුත් සුවිසල් නිවෙසක සැඟවී සිටියදීය. රුපියල් 51,000ක්, ජංගම දුරකථන පහක්, බැංකු පොතක් සමඟ අත්අඩංගුවට පත් ඇය පොලිසියට කියා තිබුණේ, "පොඩි ලැසි කළුතර බන්ධනාගාරයේ රඳවා සිටි සමයේ පුවත්පතක පළවූ දැන්වීමක් මගින් මෙකී නිවෙස සොයාගෙන ඇති බවයි. වීඩියෝ දුරකථන ඔස්සේ සම්බන්ධ වෙමින් මීට මාස හතකට පමණ පෙරදී අදාළ සුවිසල් නිවෙස මිලදී ගැනීමට කටයුතු කළ බවයි. ඒ සඳහා ලැසී නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගත් මුදල්වලින් මිලදීගෙන තිබූ අවුඩි වර්ගයේ රථයක් සහ තවත් රථයක් විකුණා කෝටි එකහමාරක මුදලක්ද ලබාගෙන ඇති බවයි. අනාවරණය වන පරිදි පොඩි ලැසි නමැත්තා අපරාධකාරයෙකු වීමේ තිරය පිටුපස සිටි තැනැත්තියද මෙකී කාන්තාව බවයි. මේ අතරේ පසුගියදා තවත් මහා පරිමාණ මත් ජාවාරමක ප්‍රධාන හවුල්කාරියක වූ ඇඟලුම් සේවිකාවක ලෙස රැකියාව කළ මිනුවන්ගොඩ කාන්තාවක අත්අඩංගුවට ගැනීමට මීගමුව නොවිසඳුණු අපරාධ ඒකකයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක සම්පත් දිසානායක ප්‍රමුඛ පොලිස් කණ්ඩායමට හැකි විණි.

ඇය 37 හැවිරිදි වියේ පසුවන මිනුවන්ගොඩ, වෑගොවුවේ පදිංචිකාරියකි. නදීකා සමන්ති නමැති ඇය දැනට රටින් පැනගොස් සිටින පිළියන්දලදී පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශ පොලිස් පරීක්ෂක නියෝමාල් රංගජීවට වෙඩි ප්‍රහාරය එල්ල කිරීමට මාකඳුරේ මධුෂ්ගේ පාර්ශ්වයට සහාය දුන් මීගමුවේ නවාස් නමැත්තා මෙහෙයවූ එම මත්ද්‍රව්‍ය ජාවාරම තවත් සැකකරුවකුද සමඟ මෙරට සිට මෙහෙයවා ඇති තැනැත්තියයි. එම ජාවාරමට සම්බන්ධව ඇයගේ නමින් මීගමුවේ පෞද්ගලික බැංකුවක පවත්වාගෙන ගිය ගිණුමක මේ වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ රුපියල් දෙකෝටි තිස්එක් ලක්ෂයක මුදලක් සැරිසරා ඇති බව අනාවරණය වේ. මේ වන විට මත් ජාවාරම්වලට සම්බන්ධව මෑත දිනවලදී කාන්තාවන් වැඩිම දෙනෙක් අත්අඩංගුවට පත්වූයේ දෙහිවල, අත්තිඩියේ මහා පරිමාණ මත් ජාවාරම්කාරයෙක් ලෙස ප්‍රකටව සිටි දැනට බූස්ස බන්ධනාගාරයේ පසුවන මර්වින් ජානාගේ ඥාති හිතෛෂින්ය.

ගෙවී ගිය සතියේ මර්වින් ජානාගේ මත් ජාවාරමට සම්බන්ධ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ නියාමකවරියක් ලෙස කටයුතු කළ තිළිණි විජේරත්න නමැති කාන්තාව අත්අඩංගුවට ගනු ලැබූයේ දෙහිවල පොලිස් නිලධාරින් විසිනි. මර්වින් ජනාගේ මහප්පාගේ දියණියක වන සැකකාරිය බොරලැස්ගමුව, දේවාලමුල්ල, පළමු පටුමගේදී අත්අඩංගුවට පත්වූයේ වෑන් රථයක්ද සමඟිනි. ඇයගේ බැංකු ගිණුම් පරීක්ෂාවේදී වසර තුනක් වැනි කාලයකදී ගිණුම් පහකින් දාහතර කෝටියකට අධික මුදලක් සංසරණය වී ඇති බවයි.

බොරලැස්ගමුව, රත්මලාන, දෙහිවල ඇතුළු ප්‍රදේශ කිහිපයකටම මත්ද්‍රව්‍ය බෙදාහැරීම සිදුකර ඇති ඇය තිදරු මවකි.

මීට දින කීපයකට පෙර එනම් පසුගිය 14 වැනිදාද මර්වින් ජානාගේ වැඩිමහල් සහෝදරිය වන මනෝරි රන්දිමා හෙවත් අක්කා නමැති කාන්තාවද අත්අඩංගුවට පත්වූවාය. පසුගියදා හෙරොයින් කිලෝග්‍රෑමයක් සමඟ මොරගහහේන ප්‍රදේශයේදී අත්අඩංගුවට පත් යුවළකගෙන් හෙළිවූ තොරතුරු මෙකී ජාවාරම්කාරිය ඇතුළු මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාලයක සුලමුල අනාවරණය කරගැනීමට මුල් විය.

මෝටර් රථයක්ද සමඟ අත්අඩංගුවට පත් ඇයගේද බැංකු ගිණුම් පහක වසර තුනක් වැනි කාලයකදී රුපියල් මිලියන 306ක මුදලක් හුවමාරු වී ඇති බව දෙහිවල පොලිසිය සිදුකළ විමර්ශනවලදී අනාවරණය වේ.

මේ අතර පසුගිය 12 වැනිදා බොරැල්ල පොලිසිය සිදුකළ මත්ද්‍රව්‍ය ජාවාරමට සම්බන්ධ මෑත අතීතයේ සිටම මත් ජාවාරමට ප්‍රකට කොළඹ නගරයේ බොරැල්ල සින්න දූපතේ වැටලීමකින් තවත් කාන්තාවක අත්අඩංගුවට පත්වූවාය. මත් ජවාරමට අතීතයේ සිටම සබඳතා පැවැති පවුලකින් පැවැත එන ඇය 39 හැවිරිදි සුදර්ශනි ලසන්තා බොතේජු හෙවත් අමාලි නම් වූවාය. අමාලි රැඳවුම් නියෝග මත රඳවා බොරැල්ල පොලිසිය කළ ප්‍රශ්න කිරීම්වලදී බන්ධනාගාරගතව සිදු කෙරෙන හෙරොයින් ජාවාරමක සුලමුලද අනාවරණය වී තිබේ. එකී මත් ජාවාරමේ මුදල් කළමනාකරණය කරමින් සුඛෝපභෝගී දිවියක් ගතකර ඇති සැකකාරිය සතුව මැගසින් පාරේ නිවෙසක සඟවා තිබී මෝටර් රථයක් සහ යතුරුපැදියක්ද සොයා ගැනීමට පොලිසියට හැකි විණි.

මෙලෙස මත් ජාවාරම්හි නිරතව අත්අඩංගුවට පත් කාන්තාවන් අතර කොට්ටාව පොලිසිය කාන්තාවක අත්අඩංගුවට ගත්තේ වෑන් රථයක්ද සමඟිනි. 39 හැවිරිදි එක්දරු මවක් වන ඇය වසරකට පමණ පෙරදී බණ්ඩාරවෙල සිට කොට්ටාව ප්‍රදේශයට පැමිණ කුලී නිවෙසක වාසය කරමින් ඇඳුම් මසන රැකියාවක් කරන බවට ව්‍යාජ රඟපෑමක් සිදුකොට කුඩා දරුවාද වෑන් රථයේ නංවාගෙන යමින් මත් ජාවාරම ගජරාමෙට කරගෙන ගොස් තිබුණාය. පසුගියදා පිළියන්දල ප්‍රදේශයේදී තරුණ කාන්තාවන් දෙදෙනෙක්ම සිය ස්වාමියන් සමඟ මත් ජාවාරම්හි නිරතව සිටියදී අත්අඩංගුවට ගැනීමට මොරටුමුල්ල පොලිසියට සහ කොළඹ අපරාධ කොට්ඨාසය නිලධාරින්ට හැකි විණි. මොරටුමුල්ලෙ යුවළක් පිළියන්දල සුවාරපොළ නිවෙසක් කුලියට ගෙන මත්ද්‍රව්‍ය පැකට්කොට ජාවාරමේ නිරත වන බවට මොරටුමුල්ල පොලිසියට ලද තොරතුරක් මත එම යුවළ අත්අඩංගුවට ගෙන තිබිණි.

මෙලෙස කොළඹ අවට මහා පරිමාණයෙන් සිදුවන මත් ජාවාරම් සඳහා කාන්තාවන් සෘජුවම සබඳතා පවත්වා ඇති බව හෙළි වෙද්දී පසුගියදා හෝමාගමදී අත්අඩංගුවට පත් කොස්ගොඩ තාරකට අයත් බවට සැලවෙන ගිනිඅවි තොගයට සබඳතා පැවැත්වූ කාන්තාවක්ද අත්අඩංගුවට පත් වූවාය. හෝමාගම පොලිසිය විසින් අත්අඩංගුවට පත් නුවනි විවේකා නමැති 32 හැවිරිදි එම කාන්තාව ගිනිඅවි 12ක් සොයා ගැනුණු පස්මහල් ගොඩනැඟිල්ලේ හිමිකරුවා වන කෞශල්‍ය නමැත්තාගේ අනියම් බිරියක ලෙස සිටි කාන්තාවකි. ඇය කොස්ගොඩ තාරකට අයත් පුපුරණ ද්‍රව්‍ය තොගයක් පිටිපන සිල්වර්හස්ට් වත්තෙ නිවෙසක සඟවාගෙන සිටි බවට ලැබුණු තොරතුරක් මත අත්අඩංගුවට ගැනිණි.

එසේම අපරාධ මැඩලීමේ මෙහෙයුම ආරම්භයේදීම කොස්ගොඩ තාරකගේ මත්ද්‍රව්‍ය ජාවාරමේ මුදල් පරිපාලනය කළ ලක්මිණි ප්‍රියදර්ශනී නමැති කාන්තාවක්ද සපුගස්කන්ද ප්‍රදේශයේ ආරක්ෂිත නිවස්නයක සිටියදී අත්අඩංගුවට ගැනුණාය. ඇය හෙරොයින් ජාවාරමෙන් ලැබෙන අතිවිශාල මුදල් කන්දරාව දවල් කාලයේදී එකතුකොට රාත්‍රී කාලයේදී ගණන් බලා කොස්ගොඩ තාරක දෙන උපදෙස් මත අදාළ ස්ථානවලට හෝ නිවෙස්වලට රැගෙන ගොස් දෙන බව පොලිසිය අනාවරණය කර ගත්තේය. පිරිමි පුද්ගලයන් දෙදෙනෙක්ද සමඟ ඇයව අත්අඩංගුවට ගැනුණේ මත්කුඩු සමඟ වැගන්ආර් රථ තුනක් සමඟිනි.

මෙලෙස මත් ජාවාරම්හි නිරත පාතාල අපරාධකාරයන් සමඟ සබඳතා පවත්වන කාන්තාවන් කොතෙක්ද යන්න නිශ්චිතව කිව නොහැකිය. එහෙත් සක්සුදක් සේ පැහැදිලි වන්නෙ පොලිසිය සහ විශේෂ කාර්ය බළකාය මත්ද්‍රව්‍ය සහ පාතාලය මෙරටින් අතුගා දැමීමට සිදු කරන අඛණ්ඩ මෙහෙයුම් මගින් මෙකී කුමාරිහාමිලාට ලගින්නට සිදුවන්නෙ මහ උළු ගෙදර බවනම් මනා සේ පිළිබිඹු වේ.

සිළුමිණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස්, කොළඹ 10.
දුරකථන පොදු: 011-2429429, 011-2421181, 011-2331181
කර්තෘ: 011-2429261 ජ්‍යෙෂ්ඨ සම කර්තෘ: 011-2429263
කර්තෘ මණ්ඩලය: 011-2429262-3-4-5
ෆැක්ස්: 011-2429260 (සිළුමිණ)
ඊ-මේල්: edmediaunit@gmail.com
දැන්වීම් කළමනාකරු: 011-2429351
ලුහුඬු දැන්වීම් කළමනාකරු: 011-2429341-2

වෂී 2020ක් වූ අගෝස්තු මස 30 වැනිදා ඉරිදා

# රාජ්‍ය යාන්ත්‍රණයේ අභිමානය

'ලංකා සිවිල් සේවා පරිපාලනය' නම් කෘතියේ රාජ්‍ය නිලධාරියා යනු රාජ්‍ය මුදල් භාවිත කරන පුද්ගලයා ලෙස අර්ථ ගන්වා ඇත. රාජ්‍ය මුදල් භාවිත කිරීමේ අවසරය ඇති රාජ්‍ය නිලධාරීන් වෙන කිසියම්ම හෝ බන්ධනයකට, බලපෑමකට යටත් නොවිය යුතු බව මින් ගම්‍ය වේ. ඔවුන්ගේ ක්‍රියාපාටිපාටිය සැකසිය යුතු වන්නේ ව්‍යවස්ථාදායක අණ පනත් සහ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ පදනම් කරගෙන ය. ඒ අනුව රාජ්‍ය නිලධාරීන්, පාර්ලිමේන්තුවට, විධායකයට, අධිකරණයට හා ජනතාවට සෘජුව වගකිව යුතු වෙයි. සිය වගකීම් අතර ලැදිකම, බිය හෝ වෙනත් බලපෑම්වලට නතුව සිදු කෙරෙන රාජකාරි පිළිබඳ ව කිසිදු රාජ්‍ය නිලධාරියකුට නිදහස් හෝ නිදොස් විය නොහැකිය.

මේ කතාව යථාර්ථයක් වීමට අවශ්‍ය පසුබිම පසුගියදා නව අමාත්‍යාංශ ලේකම්වරු පත් වූ අවස්ථාවේ ජනාධිපතිවරයා අවධාරණය කර තිබිණි. ශක්තිමත් රාජ්‍ය සේවයකට අවැසි දෑ නිර්මාණය කිරීමෙහි ලා බාධා වන ඕනෑම දෙයක් ඒ අනුව නිශේධනය වීමේ හැකියාව පවතින බවට වන සහතිකය සියලු රාජ්‍ය නිලධාරීන්ට ලැබුණේය. එය ඓතිහාසික ප්‍රවේශයකි. පසුගිය කාලය පුරා රාජ්‍ය සේවය දේශපාලඥයන් විසින් හීලෑ කරගෙන තිබිණි. රාජ්‍ය නිලධාරීන්ට අනවශ්‍ය සුදුසුකම් මත තනතුරු ලබා දීම නිසා බොහෝදුරට මේ තත්ත්වය උද්ගත විය. සිද්ධි එකින් එක ගෙන ඒවා හුදෙකලා සිද්ධි සේ දඩමස් කිරීමෙන් ඵලක් නොවූවද ධනාත්මක ප්‍රවේශයක් සඳහා ඒ අවබෝධාත්මක කතිකාව ඇති විය යුතුය. මේ ඒ සඳහා ලැබුණු ස්වර්ණමය අවස්ථාවකි.

රාජ්‍ය සේවය ප්‍රසාරණය වී ඇති ප්‍රමාණයට සාපේක්ෂව එහි ඵලදායිතාවක් තිබේ ද යන්න විවාදිත කරුණකි. රාජ්‍ය නායකයා පවා කියන්නේ රාජ්‍ය සේවය දූෂිත බව ය. පොදු ජනතාව කියන්නේ රාජ්‍ය සේවය දේශපාලනීකරණය වී ඇති අතර ඒ නිසාම එය අකාර්යක්ෂම බව ය. මේ කියන කාරණාවල කිසියම් සත්‍යයක් ඇතත් රාජ්‍ය සේවයට සාධාරණ විනිශ්චයක් දිය හැක්කේ රාජ්‍ය සේවය අද පවතින තත්ත්වයට හේතු නිවැරදිව අවබෝධ කරගතහොත් පමණ ය.

එදා මෙදා තුර රාජ්‍ය සේවයේ තිබූ අභිමානය, කීර්තිය මෙන්ම ශක්තිය ද බිඳ දැමූ තීරණාත්මක අවස්ථාව වූයේ 1980 ජූලි වැඩ වර්ජනයයි. මෙහිදී ජේ. ආර්. ගේ ආණ්ඩුව අසූදහසක පමණ පිරිසක් එක රැයින් සේවයෙන් නෙරපා හැරියේය. මේ නිසා පළපුරුද්ද හා අත්දැකීම් ඇති පරිණත රාජ්‍ය සේවකයන් අති විශාල පිරිසක් රාජ්‍ය සේවයට අහිමි වූ අතර, සුදුසුකම් විමසීමකින් තොරව පුරප්පාඩු සඳහා බඳවා ගැනුණේ දේශපාලන අනුගාමිකයන් ය. ඉන්පසු බලයට පැමිණි බොහෝ ආණ්ඩු අඩු වැඩි වශයෙන් තමන්ගේ පැවැත්ම සඳහා මේ තත්ත්වය පවත්වා ගෙන ගිය අතර, එනිසාම රාජ්‍ය සේවය අකාර්යක්ෂම බවට පත් විණි. මේ තත්ත්වය සම්පූර්ණයෙන් ම වෙනස් කිරීමේ අඩිතාලම දමමින් අභිනව ආණ්ඩුව එකවර හැටදහසකට රාජ්‍ය සේවයේ දොරටු විවර කළේ ශක්තිමත් රාජ්‍යයක් ගොඩනංවා ගැනීමේ අරමුණිනි. එය ඓතිහාසික අවස්ථාවක් වන්නේ, රටක රාජ්‍ය සේවයේ ස්ථාවරත්වය මත ඒ රාජ්‍යයේ සමෘද්ධිය තීරණය වන බැවිනි.

මේ රට සංවර්ධනය කිරීමට යමකු අපේක්ෂා කරන්නේ නම්, ඒ සඳහා ශක්තිමත් රාජ්‍ය සේවයක් අත්‍යවශ්‍ය ය. රාජ්‍ය සේවකයන්ගෙන් ප්‍රශස්ත සේවයක් ලබා ගැනීමට බලපාන්නා වූ වැදගත් ම කාරණයක් තිබේ. එනම් රාජ්‍ය සේවය දේශපාලනයෙන් ස්වාධීන කිරීම ය. එසේම දේශපාලකයන්ගේ තීන්දු තීරණවලට රජයේ සේවකයන්ට වන්දි ගෙවීමට සිදුවීම වළක්වාලීම ය. මෑතකාලීන ව රජයේ සේවකයා අකර්මණ්‍ය කරන්නට බලපෑ ප්‍රධානතම හේතුවක් වූයේ දේශපාලකයාගේ තීන්දු සඳහා ලොකු කුඩා භේදයකින් තොරව රජයේ සේවකයාට වන්දි ගෙවීමට සිදුවීම ය.

සිංගප්පූරුවේ ආර්ථික සංවර්ධන නිර්මාතෘ, හිටපු අගමැතිවරයා වූ ලී ක්වාන් යු ලංකාවට පැමිණි පසු කොළඹ නගරයේ එවකට පැවති දියුණු තත්ත්වය පිළිබඳ විශ්මයට පත්ව සිංගප්පූරුව ද එවැනි රටක් බවට පත් කරන බවට කළ ප්‍රකාශය පසුගිය කාලයේ මෙන්ම වර්තමානයේ ද නිරන්තර කතාබහට ලක් වන්නෙකි. මැලේසියාවෙන් වෙන් වූ පසුව ස්වභාවික සම්පත් පවා නැතිව කෙටි කාලයක් ඇතුළත ගෝලීය වශයෙන් අනිකුත් රටවල් අබිබවා යමින් සංවර්ධනය වූ රටක් බවට පත්වීමේ දී අනුගමනය කළ රාජ්‍ය සේවය සම්බන්ධ උපාය මාර්ග බොහොමයක්, දැන් ලංකාවට ද වැදගත් වන බැව් අප අමතක කළ යුතු නැත.

සිංගප්පූරුවේ රාජ්‍ය සේවය ප්‍රශස්ථ මට්ටමකට ගෙන ඒම වෙනුවෙන් ක්‍රියාත්මක කළ PS 21 - Future- Oriented Reform කළමනාකරණ ප්‍රතිසංස්කරණ වැඩසටහන, මූල්‍ය සහ අයවැය ප්‍රතිසංස්කරණ වැඩසටහන, මෙන්ම ප්‍රශස්ථ මට්ටමේ රාජ්‍ය සේවයක් නිර්මාණය කිරීම වෙනුවෙන් මැලේසියාවේ හිටපු අගමැති මහතීර් මොහොමඩ්ගේ රාජ්‍ය පාලන කාලයේ දී ක්‍රියාත්මක කළ රාජ්‍ය ප්‍රතිනිර්මාණ වැඩසටහන මෙහිදී අධ්‍යයනයට වැදගත් ය. ලංකාව ආසන්නයේ පිහිටි රටක් වශයෙන් ඉන්දියාවේ ප්‍රාන්ත කිහිපයකම හඳුන්වාදී ඇති තොරතුරු තාක්ෂණය පදනම් කරගත් පුරවැසියාගේ දෘෂ්ටි කෝණය විශ්ලේෂණය කර ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති රැසක් ද තිබෙන නිසා එවැනි යහපත් අත්දැකීම් පූර්වාදර්ශයට ගනිමින් ජාතික සංවර්ධනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා කාර්යක්ෂම වූත් ප්‍රතිඵලදායක වූත් රාජ්‍ය සේවයක් බිහි කිරීමට හැකියාව අපට ඇත. මේ සඳහා වන දැක්ම හා නායකත්වය දැන් අප සතු බැවින් ඉදිරිය පැහැබර ය.

එහිදී රටේ දේශපාලනික ස්ථාවර බව ඉතාමත් වැදගත් සාධකයක් විය යුතු අතර, අනාගතය පුරෝකථනය කරමින් ජනතාවගේ සමාජ, ආර්ථික, සංස්කෘතික සුබසිද්ධිය වෙනුවෙන් සකස් කළ දිගුකාලීන වූ ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කිරීම ද අවශ්‍ය කරුණකි. මෙහිදී රජයක් වශයෙන් සකස් කරන්නා වූ එකී ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේලා රාජ්‍ය සේවයට පැවරෙන වගකීම්, කාර්යභාර්ය මැනවින් අර්ථකථනය කරගෙන පුරවැසියාගේ අපේක්ෂා ඉටුවන ආකාරයේ සේවා සම්පාදනය සැලැස්විය යුතුව තිබේ. ලෝකයේ තොරතුරු තාක්ෂණයේ ඇති වී ඇති නව ප්‍රවණතා ද ආදේශ කර රාජ්‍ය සේවා යාන්ත්‍රණය නව්‍යකරණය කිරීම පිළිබඳ අවධානය යොමු විය යුතුය.

රාජ්‍ය සේවය සඳහා බලපෑ මූලික ගැටලු කිහිපයක් තිබිණි. එක; ඔවුන්ගේ වැටුප් හා දීමනා ප්‍රමාණවත් නො වීම ය. දෙක; උසස් වීමේ ක්‍රියා පටිපාටිය නිසි ලෙස ක්‍රියාත්මක නොවීම ය. තුන; රාජ්‍ය සේවය සඳහා වූ දේශපාලන බලපෑම උත්සන්න වී තිබීම ය. වත්මන් ආණ්ඩුව ඉහත ගැටලු තුනට ම විසැඳුම් ලබාදී ඇති බව කිව යුතු ය. සමස්ත රාජ්‍ය සේවයේම වැටුප් තත්ත්වය සතුටුදායක ය. උසස්වීම් සඳහා වූ ක්‍රියා පටිපාටිය නිසි ලෙස ක්‍රියාත්මක වෙයි. දේශපාලන බලපෑම් සිදු කිරීමට කිසිවකු ඉදිරිපත් වන්නේ නැත. නූතන රාජ්‍ය සේවය නිදහස් හා ස්වාධීන එකක් සේ සැලැකිය හැකි ය.

අපේ රාජ්‍ය සේවකයා බුද්ධිමත් ය. ඔවුන්ට රටේ අනාගතය පිළිබඳ හැඟීමක් තිබේ. ඒ අනුව බුද්ධිමත් තීන්දු - තීරණ ඔස්සේ රටේ අනාගතයට හවුල්වීමට ඔවුන් තීරණය කරනු ඇත.

# රාජ්‍ය සේවයේ ප්‍රතිසංවිධානයට පෙරවදනක්

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහින්ද පතිරණ**

● සුභද්‍රා දේශප්‍රිය

**රාජ්‍ය යාන්ත්‍රණය ප්‍රතිසංවිධානය කිරීම සම්බන්ධ මාතෘකාව සමාජ කතිකාවක් බවට පත් කිරීම අතිශය කාලෝචිතය. මේ අවස්ථාව මඟනොහැර නියමාකාරයෙන් ඒ සම්බන්ධයෙන් කතිකාවක් ගොඩනඟා ගතහොත් අප අපේක්ෂිත ලංකාව නැවත ගොඩනඟා ගැනීමට සහ එතැනින් ඊළඟ පියවරට යෑමේ ක්‍රියාදාය ඒ හරහා ඉටුකරගත හැකි වනු ඇත. බව අපේ අපේක්ෂාවයි. නව රජය යටතේ රාජ්‍ය යාන්ත්‍රණය ප්‍රතිසංවිධානය කිරීම සම්බන්ධයෙන් ප්‍රවිෂ්ඨයක් ගෙන ඇත. ඇමැති මණ්ඩලය පත්කිරීමේදී නිශ්චිත කාර්ය භාරයක් සහිතව ඇමැතිවරුන් සහ රාජ්‍ය ඇමැතිවරුන් පත් කර ඇති ආකාරය අතිශයින්ම කාලෝචිතය. ආණ්ඩුව එයින් පෙන්නුම් කරනු ලබන ප්‍රධාන කාරණාව නම් අදාළ විෂය භාර ඇමැතිවරුන්ට සහ අදාළ නිලධාරීන්ට නිශ්චිත ඉලක්ක ගත සැලසුමකට යා යුතුයි යන අභිලාෂය එහි අන්තර්ගත වී ඇති බවයි.**

මේ අවස්ථාවේදී රටක් ලෙස සියලු දෙනා ග්‍රහණය කරගත යුතු කාරණාවද මෙයයි. සියලු ක්ෂේත්‍ර වෙන් වශයෙන් වෙන් කොට ලබාදීම හැල්ලුවට ලක් කළයුතු කාරණාවක් හෝ සමාජ ජාලා වෙබ් අඩවි හරහා අපහාසයට ලක්කරමින් කතා කළ යුතු කාරණාවක් නොවේ. ඇමැතිවරුන්ට නිශ්චිත කාර්යභාරයක් පැවරීම මීට දශක ගනනාවකට පෙර සිදු කර තිබුණේ නම් මේ රට අද ඊළඟ පියවරට ගොස් ඇති බව නියත කාරණාවකි. මෙම ඇමැතිධුර පැවරී ඇති තත්ත්වය අනුව කිසිවකුට තම කාර්යය මගහැර සිටීමට නොහැකිය. රාජ්‍ය යාන්ත්‍රණය ප්‍රතිසංවිධානය කිරීමට අපි පාවිච්චි කළ යුතු හොඳම මෙවලම මෙයයි.

ඇමැතිවරුන්ට නිශ්චිත ඉලක්ක ලබාදුන් සේම රාජ්‍ය නිලධාරීන්ටද පහළ තලයේ නිලධාරීන්ටද එම කාර්යයභාරයේ නිශ්චිත වැඩ ලැයිස්තුගත පිළිවෙළකට ලබා දිය යුතුය. අමාත්‍යංශ ලේකම්වරයාගේ සිට සියලු නිලධාරීන්ට ඉලක්ක සේම කාර්ය පටිපාටියක් ලබා දිය යුතුයි. නිශ්චිත කාර්යය සටහනක් කාර්ය පටිපාටියක් නැති වීම නිසා කාර්යභාරයන් මගහැරී යෑම සාමාන්‍ය තත්ත්වයකි. අදාළ නිලධාරීන් තමන්ගේ කාර්යභාරය ලැයිස්තුවක් ලිඛිත සටහනක් නොමැති නම් අමාත්‍යංශයකට පැවරී ඇති කාර්යභාරය පිළිබඳ ජනතාවගේද දැනුවත් වීමක් නැත. ඒ අනුව මේ කාර්යභාර ලැයිස්තුවක් ලබා දීම ඉතා වැදගත් වන අතර ඒ අනුව රාජ්‍ය සේවකයා දැනුවත් වීමක් සිදුවෙයි. එවැනි ලිඛිත ලැයිස්තුගත ලියවිල්ලක් තිබීම තුළ රාජකාරිය මගහැරීමට රාජ්‍ය සේවකයාට නොහැකි වෙයි. ඉලක්ක ගත සැලැසුම් ජය ගැනීමට අප ඉතිහාසයේ සිට ම හැකියාවක් තිබූ ජාතියකි. මෙහිදී ඉලක්කගත සැලසුම් අනුව ලේකම්වරයා අමාත්‍යාංශය මෙහෙය විය යුතුය. නිලධාරීන් වෙනත් තැන්වලට ස්ථානගත කිරීම ඵලක් නැත. නිලධාරීන්ගෙන් කාර්යක්ෂම සේවාවක් ලබාගැනීමට සංකල්ප නිර්මාණය කර ඒ ව්‍යාපෘති හඳුනාගෙන ඒවා බාරදිය යුතුයි. එමෙන්ම ඒ ව්‍යාපෘති සඳහා කාල රාමුවක් ලබා දිය යුතුයි.

## ඉලක්ක සපුරාගැනීමට නම් නිශ්චිත ඉලක්කය දැනගෙන සිටිය යුතුයි

ගමනාන්තයට නිවැරදිව යෑමට නම් යන මාර්ගය දැනගත යුතුයි. ඉලක්ක සපුරා ගැනීමට නම් නිශ්චිත ඉලක්ක දැනසිටිය යුතුයි. එසේ නොවන්නේ නම් රාජ්‍ය දේපළ අපතේ යෑමක් සිදුවේ. ඉලක්ක ලබා ගන්නවාද නැත්ද යන්න පසුවිපරම් කළ යුතුය. මෙය වර්තමාන අමාත්‍යාංශවල සිදු නොවන ක්‍රියාවකි. එලෙස ප්‍රගති සමාලෝචනය කළ යුතුයි. ප්‍රගති සමාලෝචනයේදී නිලධාරීන්ට සාර්ථකත්වය සහ අසාර්ථකත්වය පිළිබඳ ස්වයං තක්සේරුවක් කරගැනීමේ හැකියාවක් ඇත. ඒ අනුව ඒ අදාළ අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තුවේ සියලු දෙනාට එම පණිවුඩය සන්නිවේදනය වේ. ඒ හරහා නිලධාරියාට තම කාර්යය සාධකය නිවැරදි කරගැනීම හෝ ප්‍රගතිය නැවත ප්‍රතිනිර්මාණය කරගැනීමට හැකිය. එවිට තමා එම කාර්යයට සුදුසු බව පිළිගෙන ඔහුට ප්‍රගතියක් ඇති කර ගැනීමට හැකි ස්ථානයකට ස්ථානගත වීමට හැකියාව ලැබේ.

රාජ්‍ය යාන්ත්‍රණය පිළිබඳ ඇති වැරදි අවබෝධය දුරුකරගත යුතුය. තමන්ගේ පහළ නිලධාරීන් සම්බන්ධයෙන් සුහදව කටයුතු කිරීමට ඇති හැකියාව, සහයෝගය සහ සහජීවනය වත්මන් රාජ්‍ය සේවයේ දැක ගත නොහැකිය. විශේෂයෙන් මහජනතාව සමඟ ගනුදෙනු කිරීමේදී පෞද්ගලික අංශයේ ඇති සුහදශීලීත්වය රාජ්‍ය අංශයේ නොමැති බවට සමාජ කතිකාවක් ගොඩනැඟී ඇත. එයද රාජ්‍ය සේවයේ ප්‍රතිසංවිධානය විය යුතු සුවිශේෂී ක්‍රියා පිළිවෙතකි. ඒ දුරස්ථ භාවය ඉතා අහිතකර නිසා එය ඉතා කඩිනමින් වෙනස් විය යුතුය. නිලධාරීන් අතර සහ මහජනතාව අතර සුහදශීලී සේවාවක් පවත්වා ගත යුතුය. තමන් පිළිබඳ අධි තක්සේරුව බැහැර කර නිසි අවබෝධයෙන් යුතුව සේවා සපයන්නකු ලෙස මහජනතාව ඉදිරියේ පෙනී සිටින නිලධාරී පැලැන්තියක් අපි රාජ්‍ය සේවය තුළින් බිහි කරගත යුතුය. තනතුරු ඇත්තේ මහජනයාට සේවා සපයන්නට මිස ප්‍රභූ තන්ත්‍රය හෝ පෞද්ගලිකත්වය ප්‍රවර්ධනය කිරීමට නොවන බව නිලධාරීන්ට අවබෝධ කළ යුතුය. මේ සියලු කරුණු හරහා මනාව තම ඉලක්ක සපුරන නිලධාරීන් හඳුනා ගත හැකිය. එසේ හඳුනා ගන්නා නිලධාරීන් REWARDS කිරීම එනම් ඇගැයීමට ලක් කළ යුතුය.




> **"තනතුරු ඇත්තේ මහජනයාට සේවා සපයන්නට මිස ප්‍රභූ තන්ත්‍රය හෝ පෞද්ගලිකත්වය ප්‍රවර්ධනය කිරීමට නොවන බව නිලධාරීන්ට අවබෝධ කළ යුතුයි"**

> **"මෙරට රාජ්‍ය සේවාවට සාරධර්ම, ආචාර ධර්ම පද්ධතියක් නොතිබීම විශාල අඩුපාඩුවක්"**

එමගින් අනෙක් රාජ්‍ය නිලධාරීන් ප්‍රේරණයට මෙන්ම උද්යෝගයට පත්වනවා මෙන්ම සියලු සේවකයන්ට ආදර්ශ සැපයීමක්ද සිදුවේ. උදාහරණ ලෙස ඇතැම් පළාත් පාලන ආයතනවල ආයතන අතර තරග පවත්වනු ලබයි. එහිදී වඩා හොඳින් කටයුතු කරන පළාත් පාලන ආයතන දකින විට තමුන්ගේ ආයතනයත් එවැනි හොඳ ස්ථානයක ස්ථානගත කිරීමේ උනන්දුවක් සෙසු ආයතනවලට ඇතිවේ. ඒ ආකාරයට ආයතන හරහා සේවා ඇගයීම් තරගකාරීත්වයක් ඇති කළ යුතුය.

ඇතැම් රාජ්‍ය නිලධාරීන්ට තමා ස්ථානගත වී ඇති ස්ථානයෙන් ඉදිරියට යෑමේ, ජයග්‍රහණය කිරීමේ හෝ ඉලක්ක, අභියෝග ජයගත යුතුයි යන හැඟීමක් නැත. තමන් කෙසේ රැකියාවේ නියුතු වූවත් සියලු වරප්‍රසාද සහ විශ්‍රාම වැටුප් ලැබෙනැයි යන විශ්වාසය ඇතැම් නිලධාරීන් තුළ වීම ඊට හේතුවයි. පෞද්ගලික අංශයේ මෙන් නිශ්චිත ක්‍රියාපටිපාටියක්, සේවා ඉලක්කයක් නොමැති වීම එම මානසිකත්වය ඇති වීමට ප්‍රධාන හේතුවයි. පෞද්ගලික අංශයේ නිලධාරීන්ට උසස්වීම්, වැටුප් වර්ධන ලැබෙන්නේ ඉලක්ක සපුරන ප්‍රමාණය අනුවය. රාජ්‍ය සේවාවේද එවැනි කාර්ය පටිපාටියක් සකස් කළ යුතුය. උපාධිධාරීන් හැට දහසක් සහ අඩු ආදායම්ලාභී පවුල්වලින් ලක්ෂයක් තෝරා ගෙන ඔවුන්ට රැකියා පුහුණුවක් ලබාදී ආර්ථිකයට දායක කර ගන්නා අතරම රැකියා ලබාදීමේ වැඩපිළිවෙළක් රජය විසින් දැන් ආරම්භ කර තිබේ. එය ඉතා හොඳ වැඩපිළිවෙළකි. නමුත් බොහෝ පිරිස් රාජ්‍ය සේවයට පැමිණෙන්නේ පූර්ණ නිගමන අනුවය. එයට සරල උදාහරණයක් ලෙස ඇතැම් උපාධිධාරීන්ට හැත්තෑදහසකට අධික වැටුපක් ලබා ඊ.ටී.එෆ් සහ ඊ.පී. එෆ්. කපා ගැනීමක් සිදුවී ඇත. ඔවුන් හැට හැත්තෑ දහසක වැටුපක් අතහැර 20000 පුහුණු දීමනාවකට රාජ්‍ය සේවයට බැඳීමේ අරමුණ අප සෙවිය යුතුය. රාජ්‍ය සේවයට බැඳී සේවයක් කිරීමේ අරමුණද යන්න ගැන සැලකිලිමත් විය යුතුය. අවංකවම එසේ නොවන අයගේ ආකල්පයක් වන්නේ රාජ්‍ය සේවයට පැමිණියොත් වැඩ සීමාසහිතව කිරීමෙන් වැටුප් ගැනීමට හැකි වන බවයි. ඒ මානසිකත්වය අප වෙනස් කළ යුතුය.

## රාජ්‍ය යාන්ත්‍රණය පිළිබඳ ඇති වැරදි අවබෝධය දුරුකරගත යුතුය.


මේ සම්බන්ධයෙන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන්ගේ වැඩපිළිවෙළක් ඇති අතර එය ඉතා සාර්ථක සහ ප්‍රායෝගික වැඩපිළිවෙළකි. ඒ සඳහා කාර්ය සාධක බළකායක් ලබාදී ඇති අතර ඒ තුළින් නිසි පුහුණුවක් ලබාදී ඔවුන්ගේ පූර්ව නිගමන සහ මානසිකත්වය වෙනස් කිරීමකට ලක්වනු ඇත. පුහුණුව ලබාදී හැකියාවන් අනුව ඉලක්ක ලබාදීම ඔවුන් ස්ථානගත කළ යුතුය. මේ රටේ ඉදිරි සංවර්ධන මෙහෙයුමට අනිවාර්ය දායකත්වයක් ඔවුන්ගෙන් ලබාගත හැක්කේ එවිටය. එසේ නොවන්නට මේ බඳවා ගන්නා එක් ලක්ෂ හැට දහසක පිරිස රජයට බරක් වනු ඇත.

මෙරට රාජ්‍ය සේවාවට සාරධර්ම, ආචාර ධර්ම පද්ධතියක් නොතිබීම විශාල අඩුපාඩුවකි. ඒ ආචාර ධර්ම පද්ධතිය තුළ තමන්ගේ කාර්ය භාරය සිදු කළ යුතුයි. ඒ තුළ අපි සැලකිලිමත් විය යුතු කාරණාවක් ලෙස නවීන ලෝකයේ ඇතිවී ඇති ප්‍රවණතාවක් ලෙස ස්ත්‍රී පුරුෂ භාවය සම්බන්ධයෙන් ඇති කරුණු සම්බන්ධයෙන් කතා කිරීමේදී කාන්තාවක ඉහළ තනතුරකට පත්වූ අවස්ථාවලදී යම් මානසික හිංසනයන්ට ලක් වීම සිදු වන අවස්ථා වේ. ඔවුන්ට නිදහසේ කටයුතු කරගැනීමට නොහැකි වන අවස්ථා වේ. ඇතැම් අවස්ථාවල පුරුෂයන්ටද මෙවැනි ගැටලු මතු වේ. ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයන්ටම මෙවැනි හිංසන වන අවස්ථා ඇත. මේ පිළිබඳ විශේෂයෙන් සැලැකිලිමත් විය යුතුය. රාජ්‍ය සේවය නිසියාකාරයෙන් ස්ථානගත කරගැනීමට නම් රාජ්‍ය සේවය කාර්යක්ෂම කරගැනීමට නම් අදාළ නිලධාරීන්ට වැඩ කළ හැකි හොඳ පරිසරයක් රාජ්‍ය යාන්ත්‍රණය තුළ ඇති කළ යුතුය. කිසිවකුගේ බලපෑමට ලක් නොවී නිරෝගී මනසකින් වැඩ කළ හැක්කේ එවිටයි. ඒ සඳහා පැහැදිලි වටපිටාවක් රාජ්‍ය යාන්ත්‍රණය තුළ ඇති කළ යුතුය.

බටහිර රටවල කාන්තාවන්ට සිදු කරන ලිංගික හිංසනයන්ට දැඩි දඬුවම් පමුණුවයි. ඉතා සුළු වැරදිවලට වුවත් විශාල දඬුවම් පමුණුවයි. සුළු වරදක් ලෙස නොසලකයි. එවැනි හිංසනයන්ට ලක්වන නිලධාරිනියන්ගෙන් කාර්යක්ෂමතාව බිඳ වැටෙයි. විශේෂයෙන් මෙවැනි කාර්යාලීය හිංසනයකට ලක්නොවන්නට ආචාර ධර්ම පද්ධතියක් කාර්යාල තුළ ස්ථිර වශයෙන් ඇති කළ යුතුය. ඒවා නියාමනය කළහැකි රාජ්‍ය යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කළ යුතුය.

මෙම ප්‍රතිසංස්කරණ රාජ්‍ය සේවයට ස්ථාන ගත කරගැනීම් සිදුකරනු ලබන නව නිලධාරීන් සහ මේ වන විට සේවය කරන නිලධාරීන් ඇතුළු සමස්ත රාජ්‍ය සේවය තුළම ස්ථාපිත කළ යුතුය. මෙහි පළමු පියවර ලෙස නායකත්ව පුහුණු වැඩපිළිවෙළක් ආරම්භ කළ යුතුයි. නායකත්වය මෙහිදී ඉතා වැදගත් වන්නේ තමන් යටතේ සිටින පිරිස තමන්ගේ අරමුණ කරා ගෙන යෑමට කාර්යක්ෂම නායකත්වයක් නිර්මාණය කිරීමට නම් ආදර්ශවත් නිලධාරීන් අවශ්‍ය වෙයි. ඒ සඳහා තාක්ෂණයද අත්‍යවශ්‍ය සාධකයක් වෙයි. කෝවිඩ් 19 හරහා අපි එය හොඳින් අත්වින්දෙමු. තාක්ෂණය මගින් රාජ්‍ය සේවයේ සහ වෙනත් සේවා නිසි කාර්යක්ෂමතාවකින් ඉටු කළ ආකාරය අපි දුටුවෙමු. රට වසා දැමූ කාලවකවානුවේදී එය සාර්ථක විය. කෝවිඩ් 19 හරහා රටම අක්‍රිය මොහොතක මාර්ගගත (online) ක්‍රමවේද අනුගමනය කරමින් අවශ්‍යතා සපුරා ගතහැකි ක්‍රමවේදය අපි දුටුවෙමු. එය සාර්ථක විය.

විශේෂයෙන් පෙර පැවති ආණ්ඩුකාලවලදී රාජ්‍ය සේවයකයන් මානසික, කායික පීඩාවන්ට පත් කළ තව කරුණක් වෙයි. එනම් වෙනත් දේශපාලනික මතවාද දරන නිලධාරීන්ට නඩු පවරමින් ඔවුන්ව හිංසනයට ලක් කිරීම සිදුවිය. ඔවුන්ගේ අභිමානය නැති කර රාජ්‍ය සේවය ඉතාමත් පහතට ඇද දමා චරිත විනාශ කළ ආකාරය අපි දුටුවෙමු. එවැනි ආණ්ඩුවලට පැවැත්මක් නොතිබුණි. එසේම රටේ සංවර්ධනය අඩාළ වූයේ දේශපාලනික බල අධිකාරිය විසින් නිලධාරීන්ගෙන් එවැනි පලිගැනීම් සිදු කර ඔවුන් අකර්මණ්‍ය කිරීම නිසාවෙනි. ඒ අනුව ඉහළ නිලධාරීන් තමන්ගේ පහළ නිලධාරීන්ට වැඩ පැවැරීම් සම්බන්ධයෙන් තීරණ ගැනීමට බියවීම නිසා ඒ හරහා රාජ්‍ය සේවය අකර්මණ්‍ය විය. මේ නිසා රාජ්‍ය සේවකයා අඩපණ විය. වැඩ කිරීමේ මානසික තත්ත්වයෙන් බැහැර විය. මේ තත්ත්වය වෙනස් කර නැවත රාජ්‍ය සේවකයාට මානසික නිදහස දිය යුතුය. එහිදී ඉලක්ක කරා යෑමට ඉඩ දිය යුතුය. ඒ සඳහා මානසික වටපිටාව මෙන්ම සේවකයාට ගරුත්වය සහ නවීන තාක්ෂණික මෙවලම් භාවිතය ඉතා වැදගත් වෙයි. ආයතනවලට යටිතල පහසුකම් ලබාදිය යුතුය. එතැනින් අපි මේ අලුත් ගමන ආරම්භ කර මේ මූලික පියවර රාජ්‍ය සේවය වෙනුවෙන් ගනු ලැබූ විට රාජ්‍ය සේවය නිතැතින්ම කාර්යක්ෂම වේ.



# මහින්දලා දෙන්නා ගෙන් අලුත් අයට පන්තියක්

ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් බෞද්ධ උපදේශක සභාවේ පස්වන සභාවාරය ඉකුත් 21 දා පැවැත්විණ. ජනාධිපති කාර්යාලයේදී පැවැති මෙම රැස්වී-මට බෞද්ධ උපදේශක සභාවට පත්ව ඇති භික්ෂූන් වහන්සේ සියලු දෙනාම සහභාගි වී සිටියහ. "මම මේ උපදේශක සභාවේ උපදෙස් පාදක කරගෙන තමයි රාජ්‍ය අමාත්‍යාංශ සකස් කර තිබෙන්නේ. මේ සභාව දැනට සභාවාර හතරක් පවත්වා තිබෙනවා. ඒ සභාවාර වලදී අපි සාකච්ඡා කරල ක්‍රියාත්මක කර ඇති කට-යුතුවල ප්‍රගතිය ලබන සභාවාරයට ඉදිරිපත් කරනවා" ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ කීවේ සභාව ආරම්භයේදීමය.

අනතුරුව පැවැති සාකච්ඡාවෙන් අනතුරුව ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයත් බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්ව විද්‍යාලයත් අධ්‍යා-පන අමාත්‍යාංශය යටතට පවරා ගැනීමට තීරණය කෙරුණා. "මේ ආයතන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම යටතට පත් කරන්න පුළුවන්ද කියලත් මම හොයල බල-න්නම්" ජනාධිපති කීවේය.

ඉකුත් සතියේ පාර්ලිමේන්තුවට අලුතින් පත්වූ මන්ත්‍රීවරුන්ට කාර්ය සාධනය හා පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ දෙදින පුහුණු-වක් පැවැත්වුණේ පාර්ලිමේන්තු සංකීර්ණයේ-දීමය. නවක මන්ත්‍රීවරු අසූ දෙනෙකු පමණ සහභාගි වූ මෙම පුහුණු වැඩමුළුවට අගමැති මහින්ද රාජපක්ෂ, සභානායක දිනේෂ් ගුණව-ර්ධන, කථානායක මහින්ද යාපා අබේවර්ධන ද සහභාගි වී සිටියහ. මන්ත්‍රීවරුන් සඳහා පැවැති තේ විවේකයේදී අගමැති මහින්ද කථානායක මහින්ද හා සභානායක දිනේෂ් ද තේ පැන් සංග්‍රහයට සහභාගි විය.

"කථානායකව-රයෙක් මේ වැනි අවස්ථාවක තේ පැන් සංග්‍රහයට සහභාගි වූ මුල්ම අවස්ථාව මේක වෙන්න ඕනේ" දිනේෂ් කීවේ තේ මේසයේ අසුන් ගනිමින්ය.

"ඔව් මටත් මීට පෙර එහෙම අවස්ථාවක් මතක නෑ. ඔබතුමා නවක-යින් සමඟ මේ විදියට සමීපව කටයුතු කිරීම ඉතා වැදගත්" අගමැති මහින්ද කීවේ කථානායක මහින්ද දෙස කෘත-වේදිව සිනහවක් පාමින්ය.

"පාර්ලිමේන්තුවේ අපි හැමෝම එකට එක්ව රට හදන්න මහන්සි ගන්නවා කියල හැමෝම තේරුම් ගත්තොත් ගැටුම් අඩු කර ගන්න පුළුවනි" කථානායක මහින්ද කීවේය.

ජනාධිපතිවරයා ඉකුත් සතියේ රාජ්‍ය අමාත්‍යාංශ තුනක ඇමැතිවරු හා නිලධාරීන් කැඳවා සාකච්ඡා කළේ ග්‍රාමීය ජන ජීවිතය ගොඩනැඟීම සඳහා මෙම අමාත්‍යාංශ වෙත පැවරී ඇති වගකීම ගැනය. මුලින්ම සාක-ච්ඡාවට එක් වූයේ සමෘද්ධි, ගෘහ ආර්ථික ක්ෂුද්‍ර මූල්‍ය ස්වයං රැකියා ව්‍යාපෘති සංවර්ධන හා ඌන උපයෝජන රාජ්‍ය සම්පත් සංව-ර්ධන රාජ්‍ය අමාත්‍යාංශයයි. එම සාකච්ඡා-වෙන් පසු වී, ධාන්‍ය, කාබනික පොහොර, එළවළු පලතුරු, මිරිස්, ලූනු හා අර්තාපල් වගා ප්‍රවර්ධන බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය සමඟ ජනාධිපතිවරයා සාකච්ඡාව ආරම්භ කෙළේය. පොල් කිතුල් තල් හා රබර් වගා ප්‍රවර්ධන හා ආශ්‍රිත කර්මාන්ත භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගිකරණ රාජ්‍ය අමාත්‍යාංශය සමඟ ජනාධිපතිවරයා සාකච්ඡා කරනු ලැබුවේ ඉකුත් 25 දාය.

"ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් හදන්න පුළුවන් වන්නෙ ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීමෙන් පමණයි. ග්‍රාමීය ප්‍රදේශවල පොල්, අඹ, කොස් වැනි බෝග සංවර්ධනයට ප්‍රමුඛ-තාව දෙන්න. ගෙවතු මිලියන දෙකක් පොල් පැළ මිලියන 4ක් හිටුවන්න පියවර ගන්න. එහෙම කළොත් ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කරන්න පුළුවන්" ජනාධිපතිවරයා ඒ සාකච්ඡාවලදී අවධාරණය කෙළේය. ඉකුත් බදාදා ජනාධිපතිවරයා රාජ්‍ය අමාත්‍යාංශව-ලට ලේකම්වරුන් 35 දෙනෙකු සඳහා පත්වීම් ලිපි ප්‍රදානය කෙළේය. එහිදී පැය භාගයක පමණ කාලයක් තුළ ජනාධිපතිවරයා රාජ්‍ය ලේකම්වරුන්ට කීවේ ගැමි ජනතාව ආර්ථික සමාජයීය වශයෙන් ශක්තිමත් කිරීමේ ඇති වැදගත් කමය.

ශ්‍රී ලංකාවේ වැඩබලන බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් ලීසා වැන්ස්ටෝල් ඉකුත්දා අරලියගහ මන්දිරයට පැමිණ අගමැති මහින්ද රාජපක්ෂ හමුවූයේ මැතිවරණ ජයග්‍රහණය වෙනුවෙන් සුභ පතන්නටය. "මේ මැතිවර-ණයේදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට ඉතා ශක්තිමත් ජනවරමක් ලැබී තිබෙනවා" ඇය කීවාය.

"ඔව් අපි අපේ රටට ආදරය කරනවා. ඒ නිසා ජනතාවට අපි විශ්වාසයි" අගමැති මහින්ද රාජපක්ෂ ඇයට උත්තර දුන්නේය. දෙපාර්ශ්වය අතර විනාඩි 30ක පමණ පැවැති සාකච්ඡාවෙන් අනතුරුව "ශ්‍රී ලංකාවට ආයෝජන ආකර්ෂනය කර ගැනීම සඳහා වරාය නගරය උපාය මාර්ගික මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කළ හැකි බවද ඇය අගමැතිව-රයාට පෙන්වා දුන්නාය.

ලොක ශූර ඩිලන්ත මාලගමුව ඉකුත් බදාදා නාමල් රාජපක්ෂ, අගමැති මහින්ද හමුවූයේ ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ලැබ්බෝගිනි සුපර් ටෝෆියෝ යුරෝපා ශූරතා තරගාවලි-යට පිටත්ව යෑමට පෙරය. ඩිලන්තට මෝටර් රථ ධාවන තරගයක් සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබුණේ පළමුවරටය. මේ අනුග්‍රහය දක්වා තිබුණේ ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයයි. අමාත්‍ය ප්‍රසන්න රණතුංගගේ මැදිහත් වීමෙන් මෙම අනුග්‍රාහක දායකත්වය ලබාදී තිබුණි. ඩිලන්ත අගමැති හමුවී තමන්ට අනුග්‍රහය ලබා දුන්නේ ඇමැති ප්‍රසන්නගේ මැදිහත් වීමෙන් බව කීවේ කෘතගුණය ඇතිවය.

"ඔව් ඔව් ප්‍රසන්න ටත් කථා කළා. මමත් කීවා මේ වැඩේ කොහෙම හරි කරමු කියලා." අගමැති ඩිලන්තට කීවේය.

"ප්‍රසන්න ඇමැතිතුමා මේ උදව්ව කරන්න හුඟක් මහන්සි වුණා." ඩිලන්ත කියද්දී "ප්‍රසන්න අයියා වැඩක් බාර ගත්තොත් ඔහොම තමයි. වැඩේ කරන්න බාධා ආවොත් වැඩය කරන්න විදිහක් හොයල හරියටම වැඩේ කරනවා." ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් කීවේය.



## ඩිලන්ත මාලගමුවට අනුග්‍රහය දෙන්න නාමල් - ප්‍රසන්න එක්වෙති

නිමල් ලන්සා, පියල් නිශාන්ත හා ඇමැති ප්‍රසන්න ඉකුත් බ්‍රහස්පතින්දා පාර්ලිමේන්තු ලොබියේදි කථා බහ කර-මින් සිටියේය.

"ඔයාගේ යහළුවා හුඟ කාලෙකට පස්සෙ අන්න ආයේ කට ඇරලා" නිමල් කීවේ පියල්ටය. පියල් හා හිටපු ඇමැති රාජිත සේනාරත්න අතර ඇති නයි මුගටි වෛරය ගැන දැන සිටි නිමල් එසේ කීවේ රාජිත 19 සංශෝධනය ගැන කර තිබූ ප්‍රකාශයක් මතක් කර-මිනි.

"ඔව් ඔව් මාත් දැක්කා "පරාජිත" ආයෙත් කට ඇරලා තිබුණා" පියල් කීවේය.

"හැබැයි ඇමැතිතුමා රාජිතලා දැන් මොන විදි-යට කෙබර ගැහුවත් ඒවාට ජනතාව අහුවෙන්නෙ නෑ." ලන්සා කීවේය.

"බැසිල් ගේන්නලු අපි මේ සංශෝධන කරන්නේ. බැසිල් ඇමැති-තුමාට පාර්ලිමේන්තු එන්න ඕනේ නම් ඔය සංශෝධන ඕනේ නෑ. එයා මේ පක්ෂය හැදුවා. ආණ්ඩුව හැදුවා. ගෝඨාභය මහත්තය ජනා-ධිපති කළා. එහෙම කෙනෙක් පාර්ලිමේන්තු එයි කියල මුන් දැන් වෙව්ලනවා. ඒකයි ඔය බොරු පතුරුවන්නෙ අපිට ජනතාව බලේ දුන්නෙ 19 අහෝසි කරන්න. අපි ඒක කරන්න ඕනේ. නැත්නම් අපි ජනතා-වට බොරු කාරයෝ වෙනවා." ප්‍රසන්න කීවේය.

## ගලගොඩඅත්තේ හාමුදුරුවෝ අගමැති හමුවුණේ මොකටද?

නවක මන්ත්‍රීවරුන් සඳහා පාර්ලිමේන්තු සංකීර්ණයේදි පැවැති දෙදින පුහුණු වැඩමු-ළුවේදී නවකයින්ට පාර්ලිමේන්තුවේ ආසන පැනවෙන ආකාරයද සාකච්ඡා කෙරිණ. ජාතික නිදහස් පෙරමුණ නියෝජනය කරන ජාතික ලැයිස්තු මන්ත්‍රී මුසාම්මිල් මීට පෙර පාර්ලිමේන්තුවට පැමිණ තිබුණ ද ඔහුගේ නම ද නවක ලැයිස්තුවට ඇතුළත් වීම නිසා ආසන පැනවීමේදී පිටුපස අසුනක් හිමි විය.



"මේ ආසන පැනවිම ජ්‍යෙෂ්ඨත්වය අනුව කෙරෙනවා නම් මුසාම්මිල් මන්ත්‍රීවරයට අපට වඩා ඉදිරි අසුනක් දෙන්න" යදාමිණි ගුණවර්ධන කීවේය.

"ආ... හරි යදාමිණි මන්ත්‍රීවරයාට තමයි තේරුණේ මුසාම්මිල් මහතා මීට පෙරත් පාර්ලිමේන්තුවේ සිටි නිසා ජ්‍යෙෂ්ඨයෙක් වෙනවා." යැයි පාර්ලිමේන්තු නිලධාරියා කීවේය. මේ අතර රුපියල් 3000ක කෑම වේලක් රුපියල් 200 කට මන්ත්‍රීවරුන්ට ලබා-දෙන බව පාර්ලිමේන්තුවේ නිලධාරියෙකු මේ පුහුණු වැඩමුළුවේදී කීවේය. මෙයින් කල-බලයට පත් නවක මන්ත්‍රීන් "ඔය කියන්නේ කොයි කාලේ ගණන් හිලව්ද?" අසන්නට විය.

කොළඹට නුදුරු පුරාණ විහාරයක විශාල භූමිය එක එක පන්නයේ වාහනවලින් පිරී තිබුණේ ඉකුත් බ්‍රහස්පතින්දාය. කඩිසර නිර්භීත හිමිනමක් සමඟ විවිධ තරාතිරම්වල අය මහ සාකච්ඡාවකි. පන්සලේ අධිපති හිමිට හොඳටම කේන්ති ගොස් ඇති අයුරු දක්නට ලැබුණි.

"ආණ්ඩු හදනවා හොරකම් වංචාව පගාව නවත්වනවා කිව්වට ඒවා නතර වෙලා නෑ. ඒවාට පුරුදු වුණ එවුන් ඒවා දිගටම කරගෙන යනවා" නාහිමියෝ පැවසූහ.

## රාජකීය හැල්ල

ජයසූරිය උඩුකුඹුර කියයි... ejournalists@gmail.com

"මේවා මෙහෙම වෙන්න දෙන්න බෑ. ජනපතිට කියන්න ඕනේ" කිව් නාහිමියන් පන්සලේ ස්ථාවර දුරකථනයෙන් ජනපතිට කතා කළහ.

කරු ජයසූරියට පක්ෂ සාමාජිකත්වය නොමැති බවට වූ ප්‍රකාශය ගැන සමගි ජන බලවේගයේ නායකයින් කතා කරන්නටවූයේ තරමක කනගාටුවෙන් යුතුවය.

"එක්සත් ජාතික පක්ෂයේ නායකයින් කොතරම් කළ ගුණ නොදත් අයද කියලා පෙන්නන්න වෙන උදාහරණ ඕන නෑ. කරු ජයසූරියට අද වෙලා තියෙන දේ දැක්කම ඒ බව හොඳින්ම පේනවා"සමගි ජන බල-වේගයේ මහ ලේකම් රංජිත් මද්දුමබණ්ඩාර, සජිත් ප්‍රේමදාස සමග කීවේ තරමක කනගා-ටුවෙන් යුතුවය.

"කරු ජයසූරිය කියලා කියන්නේ රනිල් වික්‍රමසිංහ කියන දේවල් විශ්වාස කරන්න ගිහින් අමාරුවේ වැටුණ කෙනෙක්. රනිල් වික්‍රමසිංහ කියන කියන දේ කළා. නාය-කත්වය පිළිබඳ අරගල ඇතිවුණ වෙලාවේදි ඒකට බෙල්ල තිව්වෙත් කරු ජයසූරියම තමයි" කරු කළ කී දේ ගැන තිස්ස අත්ත-නායක මන්ත්‍රීවරයා සිහිපත් කළේය.

"මහ මැතිවරණය වෙලාවේදී කරු ජයසූරියට නාම යෝජනා ලැබුණේ නෑ. ඒ වෙලාවේ සමගි ජන බලවේගය එක්ක එකතුවෙන්න කියලා අපි ආරාධනාවකුත් කළා"සජිත් දේශපාලන රහසක් එළි කළේය.

"කරු කියන්නේ දින පනස් දෙකේ හොර ආණ්ඩුව පිහිටුවපු වෙලාවේදී කොන්ද කෙළින් තියාගෙන කටයුතු කරපු කථානාය-කවරයෙක්. එක්සත් ජාතික පක්ෂය ඒ කැප-කිරීම් අමතක කරපු හැටි නම් හරිම පුදුමයි. ඉතිං මේ වගේ අය එක්ක ජනතාව එකතු-වේවිද"රංජිත් මද්දුමබණ්ඩාර කීවේ කනගාටු-දායක මුහුණකින් යුතුවය.

"සමගි ජන බලවේගයේ සාමාජිකත්වය අරගෙන සමගි ජන බලවේගයත් එක්ක එකතු කරගෙන දේශපාලන වැඩවලට දායක කරගමු"සජිත් කොළ එළියක් දැල්වූවේය.

"මම කරු ජයසූරිය මැතිතුමා එක්ක මේ ගැන කතා කරන්නම්. අපිත් එක්ක එකතු-වෙන්න කියලා කරුට මම ආරාධනා කර-න්නම්"තිස්ස අත්තනායක කරුට ආරාධනා කිරීමේ වගකීම භාරගත්තේය.

විපක්ෂ නායකධුර-යට පත්වීමෙන් පසුව සජිත් ප්‍රේමදාස හමුවූ පළමු රාජ්‍ය තාන්ත්‍රි-කයා වූයේ ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේය.

ඉන්දීය මහ කොමසාරිස්ව-රයා සජිත් හමුවට එන විට, දෑත් එකට එකතු කළ සජිත් "නමස්තේ" යැයි කියමින් ඉන්දීය මහ කොමසාරිස්ව-රයා පිළිගත්තේ ඉන්දීය ආචාර සමාචාර විධි සිහිපත් කරමින්ය. ඉන්දීය මහ කොමසා-රිස්වරයා එයට ප්‍රතිචාර දැක්වූයේ අපූරු ආකාරයකටය. ඒ ඔහුද පෙරළා දෑත් එකතු කරමින් "ආයුබෝවන්" යැයි කියමිනි.

සමගි ජන බවේගයේ පාර්ලිමේන්තු කණ්ඩායම් රැස්වීම පසුගිය බදාදා සවස පැවැත්වුනේ පාර්ලිමේන්තු කමිටු ශාලා-වකදීය.

පාර්ලිමේන්තු කණ්ඩායම් රැස්වීම අතරවාරයේදී හරින් ප්‍රනාන්දු මන්ත්‍රීවරයා තරමක ආවේගයෙන් යුතුව කතා කළේය. ඒ විකෘත කරන ලද ඇතැම් තොරතුරු මාධ්‍යයේ පළවන නිසාය.

"අපි කණ්ඩායම් රැස්වීම්වල කතා කරන දේවල් කවුරුවත් විකෘති කරලා මාධ්‍ය-යට දෙන්න එපා"සජිත් කීවේ අභ්‍ය-න්තර සාකච්ඡාවල තොරතුරු මාධ්‍යයට ලබාදීම සම්බන්ධයෙන් පාලනයක් ඇති කරගැනීමේ වැදගත්කම ගැනද සිහිපත් කරමින්ය.

"කෝප් කමිටුවේ හා කෝපා කමිටුවේ සභාපතිත්වය සාමාන්‍යයෙන් විපක්ෂයට හිමිවන තනතුරු. මේවා අපි විපක්ෂයට ගන්න ඕන"අශෝක අබේසිංහ මන්ත්‍රීවරයා යෝජනාවක් කළේය. සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීවරයා නැගී සිටිමින් එම යෝජනාව ස්ථිර කළේය.

"පාර්ලිමේන්තු සම්ප්‍ර-දාය අනුව මේ තනතුරු විපක්ෂයට ලැබිය යුතු තනතුරු. ඒවා විපක්ෂයට ලබාගැ-නීමට අපි කටයුතු කළ යුතුයි"ඒ වෙනුවෙන් විපක්ෂ නාය-කවරයා ලෙස මැදිහත්වීමට සජිත් කටයුතු කළේය.

## කරු පක්ෂයට කළ මෙහෙය ගැන තිස්ස අත්තනායක ගෙන් ඇගයීමක්

පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩා-යම් රැස්වීම අවසන් කළේ ආණ්ඩුව ඉදිරිපත් කරන අතුරු සම්මත ගිණුම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේදී දැක්විය යුතු අදහස් ගැනද අවධානය යොමු කිරීමෙන් පසුවය.

ඉකුත් සතියේ පුවත්පත් මණ්ඩලයට රංජන් රාමනායක පැමිණියේ පුවත්පතක පළවූ ප්‍රවෘත්තියක් සම්බන්ධයෙන් සිදු කරන පරීක්ෂණයකට සහය වීමටය. එදින තවත් පුවත්පත් කීපයක මාධ්‍යවේදීන්ද පුවත්පත් මණ්ඩලයට පැමිණ සිටියහ.

"රංජන් මන්ත්‍රීතුමා ඔබට මෙහෙත් නඩුද?" මාධ්‍යවේදියකු ඇසීය.

"අනේ නෑ මල්ලි මම මේ කටඋ-ත්තරයක් දෙන්න ආවා" රංජන් කීවේ මාධ්‍යවේදීන් අතරේ රැඳෙමින්ය.

"අර අධිකරණයට අපහාස කළා කියන නඩුව මොකද වෙන්නෙ" ඒ තවත් මාධ්‍ය-වේදියකු ගෙන් රංජන්ට යොමුවූ ප්‍රශ්නයකි.

"මල්ලී මට දැන් ඒක වෙනුවෙන් මාස හයක් ඇතුළට යන්න වෙයි වගේ." රංජන් කීවේ ඇඟට නොදැනිය.

එජාපයේ ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයකු පත් කර ගැනීම ඉකුත් සතියේදි කල් ගියේය. සිරිකොතදී ඉකුත් සතියේ පැවැති කෘත්‍යාධි-කාරි රැස්වීමේදී වැඩිපුර කථාබහ ඇති වූයේ පක්ෂ නායකත්වය අර්බුදය ගැනය. රනිල් වික්‍රමසිංහ රැස්වීමට පැමිණ අසුන් ගනි-ද්දීම සභාවෙන් නැගුණ ප්‍රශ්නය "ඇත්තටම සැප්තැම්බර් 05 පක්ෂ නායකත්වයේ වෙන-සක් වෙනවාද" යන්නයි.

"බලමු මගේ තනි මතයට පක්ෂ නායකයා වෙනස් කරන්න බෑ" ඒ ගැන කෘත්‍යාධිකාරි මණ්ඩලය සාමූහික තීන්දුවක් ගත යුතුයි." රනිල් කීවේ සැහැල්ලුවෙනි.

"දෙකට කැඩුණු පිරිස නැවත එක්කර ගන්නවාද?" ඒ සභාවේ තවත් ප්‍රශ්නයකි. "එජාපය කියන්නෙ අලියා ලකුණ විත-රයි." රනිල් ඇඟට පතට නොදැනී උත්තර දුන්නේය.

එජාපයට හිතවත් භික්ෂූන් වහන්සේ හා විද්වතුන් පිරිසකගේ බලපෑම මත තමන් එජාප නායකත්වය බාර ගන්න කැමති බව කරු ජයසූරිය ලිඛිතව දැන්වූයේ ඉකුත් සතියේදීය. මේ ගැනද එජාප කෘත්‍යාධිකාරි මණ්ඩලයේදී සාකච්ඡා කෙරිණි.

"එයා වසර තුනක් රාජපක්ෂ ආණ්ඩුව ශක්තිමත් කරන්න ගියා. 2015 එයා පාර්ලිමේ-න්තුවට ආවේ ජාතික ලැයිස්තුවෙන්. ඒ පත්වීමට පක්ෂයේ සාමාජිකත්වය අදාළ නෑ. කරු ජයසූරිය එජාප යාවජීව සාමාජි-කයෙක් බව ඔප්පු කර ගන්න කිසිම ලිඛිත සාක්ෂි නෑ." එජාප නිලධාරිහු කෘත්‍යා-ධිකාරි මණ්ඩලය දැනුම්වත් කළහ.

ගලගොඩඅත්තේ ඥානසාරහිමියන් ඉකුත් බ්‍රහස්පතින්දා උදේ රැයින්ම අගමැති මහින්ද හමු වූයේ අග-මැති නිල නිවසේදීය. ඥාණසාර හිමි උදෙන්ම නාරාහේන්පිට අභයාරාම-යට වැඩම කර මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමියන්ද සිය වාහනයෙන්ම අගමැති නිල නිවසට කැඳවාගෙන ආවේ අගමැති නිල නිවසේ ගේට්ටු ආනන්ද හිමි-යන්ට නිතර විවෘතව පවතින නිසාය.

අගමැති මහින්ද හා ආනන්ද නාහිමි හා ඥානසාර හිමි අතර පැයකට ආසන්න කාලයක් පැවැති සාකච්ඡාවෙන් පසු එළියට පැමිණි ආනන්ද හිමි අගමැති ආරක්ෂක නිලධාරියකු සමඟ කීවේ අගමැතිවරයාට සංඝ ආරවුල් විසඳන්නටත් සිදුවෙලා කියලායි.

## මගේ තනි මතයට පක්ෂ නායකයා වෙනස් කරන්න බෑ



**පිළියන්දල කරදියාන වගුරු බිමේ හොරෙන් ගොඩකළ පස් ඉවත් කිරීමේ කතාව**





# අනවසර ගොඩකිරීම් කළොත් දැන් වැඩ වරදියි !

**'එක රටක් - එක නීතියක්' යන්න අද රට පුරාම ක්‍රියාත්මක කරවීමට රජය උත්සාහ දරයි. ඒ අනුව අද මොන ජගතා වුවත් වරදක් කළොත් ඒ අයටත් නීතිය එක සමානව ක්‍රියාත්මක කෙරෙයි.**

අප මේ අදහස ඉදිරිපත් කළේ පසුගිය දිනක අපි පිළියන්දල කරදියාන බට්ටියාවත්ත ප්‍රදේශයේ දුටු සුවිශේෂ සිදුවීමක් නිසාය. 2019 ජනාධිපතිවරණයට මාසයකට පෙර යහපාලන රජයේ ප්‍රාදේශීය දේශපාලනඥයන්ගේ උදව් ඇතිව ගොඩකළ පිළියන්දල කරදියාන බට්ටියාවත්තේ වගුරු බිමක පස් සම්පූර්ණයෙන් ඉවත් කිරීමේ සිද්ධිය ඒ සුවිශේෂී අවස්ථාවයි.

පිළියන්දල වේරැස් ගඟ ගංවතුර පාලන ව්‍යාපෘතිය සඳහා පවරාගෙන තිබූ අක්කරයකට වඩා විශාල අතහැර දමන ලද කුඹුරු ඉඩමක් අනවසරයෙන් ගොඩකර තිබූ අවස්ථාවක ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව මඟින් එහි තිබූ පස් ටිපර් රථ 15ක් මඟින් ඉවත්කර ගනු ලැබීම පසුගිය දිනවලදී සිදුවිය. මේ පස් ගොඩකිරීම නිසා ප්‍රදේශයේ විශාල ජල මාර්ගයේ ජල පරිවහනයට බාධා එල්ලවී තිබිණි.

වේරැස් ගඟ ගංවතුර පාලන ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබුවේ වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ආරක්ෂක ලේකම් ලෙස කටයුතු කරන කාලයේදීය.

ඒ පිළිබඳව කරුණු දැක්වූ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ප්‍රජා සංවර්ධන කළමනාකරු නිශාන්ත යල්කුඹුර මහතා මෙසේ පවසයි.

ඉස්සර අපි පවරාගත් ඉඩමක් වුවත් ගොඩ කළාට පසු ඉවත් කරන්න අපිට අපහසු වුණා. ඒ ඉහළ නිලධාරින් බලධාරින් කෙළින් කටයුතු කළේ නැති නිසා. නමුත් දැන් තත්ත්වය වෙනස්. ගෝඨාභය රාජපක්ෂ ජනපතිගේ වැඩපිළිවෙළ අනුව නීතිය සැමටම සමානව ක්‍රියාත්මකයි. දැන් අපේ අලුත් සභාපතිතුමාත් මේ පිළිබඳව හරියට සෘජුව කටයුතු කිරීම නිසා අපටත් රාජකාරි හරියට කරන්න පහසුයි.

2013 - 19 කාලයේ බෙල්ලන්විල පැපිලියාන ප්‍රදේශවලට ආරම්භ කරපු වේරැස් ගඟ ව්‍යාපෘතිය යටතේ අපි බෝකුන්දර ප්‍රදේශයේ මහඇළ සකස් කළා.

ඒ මඟින් මහරගම හා අවට ප්‍රදේශවල එකතුවන වැසි ජලය පවා මේ ඇළ මඟින් බොල්ගොඩ ගඟට යොමු කරනවා. වේරැස් ගඟ සම්පූර්ණ ව්‍යාපෘතියට ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව රුපියල් කෝටි 1400ක් වැය කරනවා.

මෙහි එක් අදියරක් ලෙස දැන් පිළියන්දල කරදියාන ප්‍රදේශයේ ජල මාර්ග හා ජලාශ අලුතින් සකස් කරනවා. ඒ සඳහා අපි ඉඩම් පවරාගෙන තිබුණේ. නමුත් ඒ සමහර ඉඩම් පසුගිය වසරේ අගභාගයේදි කුණු කසළ දමා උඩින් ගල් දමා ගොඩකර තිබුණා. ඉන් එක් ඉඩමක තමයි අපි පස් ඉවත් කරන්නේ.

ඒ අනුව අපේ සභාපති මේජර් ජනරාල් එම්.ආර්.ඩබ්. සොයිසා මහතාගේ උපදෙස් අනුව මේ ස්ථානයේ පස් සම්පූර්ණයෙන්ම ඉවත් කිරීමට කටයුතු සිදුකරන්න පටන් ගත්තා. නිශාන්ත යල්කුඹුර මහතා පවසයි.

ඒ අනුව පසුගිය 22 - 23 - 24 දිනවලදි පස් කියුබ් 700ක් විතර ඉවත් කර ඇත. ඒ සඳහා විශාල ප්‍රමාණයේ ටිපර් රථ 15ක් පාවිච්චි කර තිබේ.

මේ පිළිබඳව අපට කරුණු දැක්වූ ව්‍යාපෘති වැඩ පරීක්ෂක ගයාන් ප්‍රියදර්ශන මහතා පැවසුවේ මේ පස් ඉවත් කිරීමේ කටයුත්තට පිළියන්දල පොලිසියේ ද පූර්ණ සහාය ලැබුණු බවයි.

මේ පිළිබඳව අදහස් දැක්වූ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සභාපති මේජර් ජනරාල් එම්. ආර්.ඩබ්ලිව්. සොයිසා මහතා පැවසුවේ තම ආයතනයේ ව්‍යාපෘතියක් වන මේ වේරැස් ගඟ ව්‍යාපෘති ප්‍රදේශයේ සිදුකළ අනවසර ගොඩකිරම් දෙකක පස් ඉවත්කිරීමට දැනටමත් තම ආයතනයේ නිලධාරින් කටයුතු කළ බවයි.



කරදියාන වාලුකාරාම විහාරාධිකාරී මකුළුදූවේ සාරානන්ද හිමි



ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සභාපති එම්. ආර්. ඩබ්. සොයිසා



ප්‍රජා සංවර්ධන කළමනාකරු නිශාන්ත යල්කුඹුර



ගොඩකළ ඉඩමේ හිමිකරු ටී. එච්. සරත්



බට්ටියවත්ත පදිංචි ඩී.එම්. නදීකා



බට්ටියවත්ත පදිංචි නිරෝෂා ශ්‍යාමලි

## නීති තදයි වරදකරුවන්ට දැඩි දඬුවම් - සභාපති කියයි

## වගුරු ඉඩම් කුඹුරු ඉඩම් පෞද්ගලික ඉඩම් වුවත් අවසර නැතිව ගොඩකරන්න බැහැ

"අපි මේ ව්‍යාපෘතිය යටතේ කරන්නේ අවට ප්‍රදේශයේ ගංවතුර ඇතිවීම අවම කර ප්‍රදේශයේ පරිසරය සංරක්ෂණය හා ලස්සන කිරීමයි. අපි මේ ප්‍රදේශයේ ජලාශ ඉදිකර ඉහළ ප්‍රදේශයේ ජලය පහළ බොල්ගොඩ ගඟට යවන්න කටයුතු කරනවා. නමුත් ඊට බාධාකර ඒ ජල මාර්ගය සහ ඉඩම් ගොඩකළ විට අපේ කටයුතුවලට ඉමහත් බාධාවක් වෙනවා.

මේවායේ අනවසර වගුරු බිම් ගොඩකිරීමෙන් පාරිසරිකව ඇතිවන හානිය අති විශාලයි. ඒ හානිය අවම කරන්න මහජන මුදල් වැය කරමින් අපිට දැන් මේවාගේ අනවසර ගොඩකිරීම්වල පස් ඉවත් කරන්න සිදුවෙලා තිබෙනවා. ඒක ජාතික අපරාධයක්. ඒ පිළිබඳව මේ නීති විරෝධි ගොඩකිරීම් කරන අය කල්පනා කළ යුතුය.

මේ පිළියන්දල කරදියාන බට්ටියාවත්ත ප්‍රදේශයේ වගුරු බිම් ප්‍රදේශයට අපි අපේක්ෂා කළේ ප්‍රදේශයේ වැසි වතුර ගලායන ජලාශයක් විදියට සකස් කරන්න. නමුත් මේ අනවසර ගොඩකිරීම් නිසා එකතුවෙන වැසි ජලය පිටාර ගැලීම නිසා අවට ජනතාවගේ ජන ජීවිතයට හා අපේ වේරැස් ගඟ ව්‍යාපෘතියට බාධා එල්ල වුණා. ඒ නිසයි අපි මේ පස් ඉවත් කිරීමට කටයුතු කළේ." සභාපතිවරයා පවසයි.

"මේ වගුරුබිම් හා අත්හැර දැමූ කුඹුරු ඉඩම් ගොඩකිරීම වළක්වන්න හා ඒවා ගොඩකරන අයට දඬුවම් දීමට අලුත් පනතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරනවා.

ඒ පනත අනුව අනවසර ගොඩකිරීම් නවතාලීමේ බලතල හා ඒවා කරන අයට දඬුවම් දීමේ බලතල අපට ලැබෙනවා.

ඒ අයට සිර දඬුවම් දීමට හා අනවසර ගොඩකිරීම් කරන අයටම ඒවා ඉවත් කිරීමට අදාළ නීතිරීති මේ නව පනත මඟින් ක්‍රියාවට නංවන බවත් සභාපතිවරයා කීය.

දැනටම දෙල්කඳ ප්‍රදේශයේ අක්කර 4ක ඉඩමක් හා වේරැස් ගඟ ආශ්‍රිත කලාපයේ හඳුනාගත් විවිධ අනවසර ගොඩකිරීම් ස්ථානවල පස් ඉවත් කිරීමට පියවර ගෙන ඇති බවත් ඒවාට පොලිසියේ සහාය ලැබෙන බවත් සභාපතිවරයා අවධාරණය කළේය.

ඉඩම් අත්පත් කර ගැනීමේ පනත අනුව එහි 38 ආ වගන්තිය යටතේ 2019 වසරේ ගැසට් කර රජයට පවරාගත් මේ කරදියාන ඉඩම පසුගිය වසර අග භාගයේදි ගොඩකර තිබිණ.

යම් අයකුට යම් අත්‍යවශ්‍ය කරුණක් සම්බන්ධයෙන් හෝ මොනයම් අවශ්‍යතාවක් වෙනුවෙන් හෝ ඉඩම් ගොඩකිරීමට අයකු කටයුතු කරන්නේ නම් ඒ සඳහා නීති රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතුව ඇතැයි ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව පවසයි.

මේ පිළිබඳව අදහස් දැක්වූ මෙම ගොඩකරන ඉඩමේ අයිතිකරුවූ ටී.එච්. සරත් ප්‍රේමජයන්ත මහතා පැවසුවේ මේ ඉඩම අක්කරයක් විශාල බවයි. තමාට හොරෙන් තම ඉඩම කවුරු හරි ගොඩකර ඇති බවත් මේ පස් ඉවත් කිරීමට තමා පූර්ණ සහාය ලබාදෙන බවත් ඔහු කීය. තමාට වන්දියක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කරන බවත් ඔහු කීය.

පිළියන්දල කරදියාන බට්ටියවත්ත තවත් වගුරු ඉඩම් කීපයක් මෙසේ අනවසර ලෙස ගොඩකර ඇත. ඒ නිසා ඇතිවන ගංවතුර නිසා ජනතාව ඉමහත් පීඩා විඳිති.

මේ පිළිබඳව අදහස් දැක්වූ කරදියාන බට්ටියවත්ත පදිංචි ඩී.එම්. නදීකා මහත්මිය පැවසුවේ මේ ඉඩම් අනවසර ලෙස ඉදිකිරීම නිසා ප්‍රදේශයේ ගංවතුර වැඩිවූ බවයි.

"මේ අපේ ගේ ඉස්සරහ තිබෙන ඉඩම ගොඩකරන්න පටන් ගත්තේ 2019 ජනාධිපතිවරණයට සති 2 - 3 කට කලින්. පසුගිය දවස්වල ඒ ඉඩම ගොඩකරපු අය ඒක විකුණන්නත් දාලා තිබුණේ. ඒ ඉඩම මිලට ගන්නත් කට්ටිය ආවා. පර්චස් එක ලක්ෂ 4යි කිව්වා. මේ ඉඩම ගොඩකිරීම නිසා වහින කාලෙට අපේ ගෙවල් යටවෙනවා. බට්ටියාවත්ත පාරත් යටවෙනවා. දරුවන්ට පාසල් යන්නවත් බැහැ. ඒ පස් අයින් කරන එක ඉතා හොඳ වැඩක්." නදීකා මහත්මිය පවසන්නීය.

බට්ටියාවත්ත ප්‍රදේශයේ තිබෙන ප්‍රධාන විහාරස්ථානය වන කරදියාන වාලුකාරාමයේ විහාරාධිකාරි මකුළුදූවේ සාරානන්ද හිමිපාණන් පැවසුවේ මේ ප්‍රදේශයේ අනවසර ගොඩකිරීම් නිසා වැසි කාලයට තම විහාරස්ථානයට එන මාර්ගය පුරා ජලගැලීම් ඇතිවන බවයි.

"අපි කැමතියි මේ පස් ටික ඉවත් කරන එක පිළිබඳව. අපි ඒ වැඩසටහනට පූර්ණ සහාය දෙනවා. ඒ වගුරු බිම් තිබුණා නම් වැසි කාලයට වතුර උරා ගන්නවා. ඒවා නැති නිසා වැසි වතුර දෝරේ යනවා. අවට පරිසරය සුරැකීම සිදුවෙනවා නම් මේ පන්සලට එන බෞද්ධ ජනතාවටත් හොඳයි." උන්වහන්සේ පවසති.

ප්‍රදේශවාසි ජනතාව මෙන් ම පරිසර සංවිධාන ද පවසන්නේ පසුගිය කාලවල විවිධ දේශපාලන බලපුළුවන්කාරකම් අනුව සිදුකළ අනවසර ගොඩකිරීම් සඳහා විරුද්ධවීමක් පසුගිය කාලයේ සිදු නොවුණත් දැන් මේ පාරිසරික විනාශය පිළිබඳව රජය සෘජුව කටයුතු කිරීම ප්‍රශංසනීය බවයි.

"මීට පෙර අපේ රටේ මෙලෙස වගුරු ඉඩම් ගොඩකරන ලද පස් ඉවත් කිරීමක් සිදු වුණේ නැහැ. ඒවා නඩු දාලා ඇදි ඇදී තිබුණා" මිහිතල මිතුරෝ පරිසර පදනමේ ලේකම් කරුණාදාස මූණගම මහතා පවසයි. වත්මන් රජයේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නායකත්වය හා උපදෙස් අනුව මේ වැඩසටහන සෘජුව ක්‍රියාත්මක වීම පිළිබඳ හරිත මිතුරෝ පරිසර පදනමේ ලේකම් ප්‍රියදර්ශන සමන් කුමාර ඇතුළු පරිසර සංවිධාන ද සිය සතුට පළ කරති.

මේ පිළිබඳව අදහස් දැක්වූ පිළියන්දල කරදියාන බට්ටියාවත්ත පදිංචි නිරෝෂා ශ්‍යාමලි මහත්මිය පැවසුවේ පරිසරය විනාශ කරන මෙවැනි අනවසර ගොඩකිරීම් ඉවත් කිරීම පරිසර හිතකාමී කටයුත්තක් බවයි.

ඒ අනුව තම නිවාස අසල ගංවතුර ගැලීම වැළැක්වීමට ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව කටයුතු කිරීම අගය කරන්න ඕනෑ බවද ශ්‍යාමලි මහත්මියද පෙන්වා දුන්නාය.

සල්ලි හම්බු කරන්න පරිසරය විනාශ කරන අපේ රටේ අනවසර ගොඩකිරීම් හා අනවසර ඉදිකිරීම් නිසා අපේ රටේ ජල මාර්ගවල ගමනට බාධා එල්ලවී පාරිසරික ගැටලු රැසක් නිර්මාණය කරයි. ඒවා වැළැක්වීමට ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව මේ දිනවල කටයුතු කිරීම රටේ පරිසර සංරක්ෂණයට ඉමහත් මෙහෙයකි. ඊට පූර්ණ සහාය දීම පරිසරයට මෙන් ම රටට ආදරේ කරන සැමගේ යුතුකමකි.

**ඡායාරූප - සරත් පීරිස්**

---

# හතර වටේ GOසිIP

**● භක්ති මෙන්ඩිස් විසිනි**
bakthid@gmail.com

## අසුනක් වෙනුවෙන් උතුරේ සටනක්



**කොළ පාටියේ ඇත්තන්ට ඉකුත් සමයේ රජ ගෙදර රැකගන්න බොහොම ශක්තියක් වෙච්ච උතුරු පළාතේ පාටියේ නායකයන් මේ දිනවල ලොකු අවුලක කියලයි ආරංචිය.**

යහපාලනය අවුරුදු පහක් ම රැකගන්න උදවු කරපු මේ පාටියේ නායකයින්ට තමන්ගේ පාටිය රැකගන්න බැරිවෙලාලු. කොටි ත්‍රස්තවාදය මෙරටින් විනාශ කර දමා වසර දහයකට වැඩි කාලයක් ගතවී ඇතත් මේ පාටියේ බොහෝ දෙනෙකු තවමත් එම ත්‍රස්තවාදීන්ගේ මතය දරන බවයි පැවසෙන්නේ.

කොහොම කොහොම හරි මේ පාටියෙන් මෙවරත් දියවන්නාවට පැනගන්න කිහිප දෙනෙකුම හැකි වුණත් ජාතික ලැයිස්තුව සඳහා දියවන්නාවට තෝරන හාදයා ගැන ලොකු ගැටලුවක්ලු.

අවස්ථා කිහිපයකදීම මේ ඇත්තන් මේ වෙනුවෙන් ඇන කොටා ගත්තා කියලයි ආරංචිය.

කොළ පාටියේ ළඟම හිතවතුන් ලෙස පෙනී සිටි මේ පාටියේ නායකයින් දැන් දැන් පුතාණෝගේ ළඟට කිට්ටු වෙනවයි කියලයි කියන්නේ.

## ඇමැතිලාට නින්ද යන්නෙ නැතිලු


**ජනතාව වෙනුවෙන් ගොඩක්ම ගොඩක් මහන්සිවෙලා දියවන්නාවට පැනගත්ත පොහොට්ටු පාටියේ ඇත්තන් අතර හැත්තෑ දෙනකුටම මේ දිනවල නින්ද යන්නේ නෑ කියලයි කියන්නේ.**

ඒ වෙන කිසිම දෙයක් නිසා නොවෙයි. මේ හැත්තෑ දෙනාටම ඇමැතිකම් හිමිවුණු නිසා කියලයි ආරංචිය.

ඇමැතිකම් ලැබුණාට තමන්ට නිල මන්දිරයක් නොලැබෙනු ඇතැයි මේ අය බිය වෙලාලු. මෙන්න මේ නිසාත් ඇමැතිවරුන්ට නින්ද යන්නේ නෑ කියලයි කියන්නේ.

හැත්තෑ දෙනකු ඇමැතිවරුන් ලෙස තේරී පත් කළත් ඔවුන්ට නිල මන්දිර 35 පමණක් තියනවා කියලයි ආරංචිය. මහ රජුටයි, යුවරජුටයි මේ ගැන විටින් විට කරදර කරන්න මේ ඇමැතිවරු පටන් අරන් කියලයි කියන්නේ.

## පුතාණෝගේ සමගිය අසමගියක් වෙලා



**දියවන්නා තරගය නිම වීමත් සමඟ එම සටනේ සිටි කොළ, නිල්, ඇතුළු පාටි කිහිපයකම අර්බුද රැසක්ම ඇතිවෙලා කියලයි ආරංචිය.**

මේ අතර ලොකුම අර්බුදයට පත්ව ඇති පුතාණෝගේ පාටියේ බොහෝ දෙනකු පුතාණෝ සමඟ විරසක වෙලාලු.

පාටි කිහිපයක් ම එකතුවෙලා දියවන්නා සටනට ගිය පුතාණෝගේ සමගි කණ්ඩායම කෙටි කාලයක් තුළදී අසමගිවීම නිසා තමන් දියවන්නාවේදී තනිවම සිටින බව පුතාණෝ සමඟ එක්ව ඇති නායකයින් කිහිපදෙනකුම කියනව කියලයි ආරංචිය.

කොළ පාටියෙන් ඉවත්ව තනිවම සිට නැවත කොළ පාටියට එකතු වී කොළ පාටියෙන් පුතාණෝගේ පාටියට පැන්න නැගෙනහිර පළාතේ නායකයෙකු පුතාණෝ සමඟ නිතර නිතර සට්ටන ඇති කරගන්නවා කියලයි ආරංචිය.

මැති ඇමැතිකම් රැසක්ම හෙබවූ මොහු වසර විසි පහකට වැඩි කාලයක් දියවන්නාවේ සාමාජිකත්වය දරන අතර මෙවරත් දියවන්නාවට පැන ගන්නට සමත් වූයේ පුතාණෝගේ පිහිටෙන් කියලයි කියන්නේ.

ජාතික ලැයිස්තුවේ මන්ත්‍රීකමක් මොහුගේ පාටියට නොදුන් නිසා පුතාණෝට ගේමක් ගහන්න මේ හාදයා තැන තැන සාකච්ඡා පවත්වනවා කියලයි කියන්නේ.

## කොළ පාටියේ නායකයා බිය වෙලාලු

**කොළ පාටියේ කිසිවෙකුට දියවන්නාව මෙවර තරණය කරන්න නොහැකි වීමත් සමඟ කොළ පාටියේ අර්බුදය එන්න එන්නම අවුල් සහගත තත්ත්වයට පත් වෙලා කියලයි කියන්නේ.**

කොළ පාටිය දියවෙන්නම නොදී රැකගත යුතු බව එහි සිටි ජ්‍යෙෂ්ඨ නායකයින් රැසක් ම කොළ පාටියේ නිල දරයන්ට ප්‍රකාශ කර තිබේ.

කොළ පාටිය නියෝජනය කරමින් දියවන්නාවේ ප්‍රධාන ආසනයේ සිටි ගම්පහ දිස්ත්‍රික්කයේ නායකයෙකු කොළ පාටියේ නායකත්වය භාර ගන්න කැමැත්තක් දක්වනවා කියන්නේ.

කොළ පාටියේ නායකතුමන් මේ ප්‍රකාශයට ගොඩක් බය වෙලා.



කොළඹ පිහිටි ස්ථාන තුනකදීම කොළ පාටියේ නායකතුමන් රහස් සාකච්ඡා පවත්වලා තමන්ගේ බලය රැක ගන්න දැවැන්ත වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරලයි කියල ආරංචියි.

## කළුතර කටකාරයා කට හින්දා නාගනී

**අලි පාටියේ ලොකු රංගනයක යෙදුණු කළුතර දිස්ත්‍රික්කය කටකාරයා නැවතත් කට ඇරලයි කියල ආරංචියි.**

අලි පාටියෙන් පුතාණෝගේ පාටියට පැනලා මෙවරත් දියවන්නාව ජයගත්ත මොහු අලුත්ම සෙල්ලමක් ආරම්භ කරලලු.


මේ කටකාරයාගේ පුත්‍ර රත්නය තාත්තාට නොදෙවෙනි ලෙස බොරුබේගල් ඇද බානවා කියලත් ප්‍රසිද්ධයි. පුතාත් මෙවර දියවන්නා සටනට තරග කළාට ඔහුට දියවන්නාවට පනින්නට බැරි වුණාලු.

කටකාරයා තවත් කණ්ඩායමක් සමඟ එක්ව රජ ගෙදරට මඩ ගහන අලුත් ව්‍යාපාරයක් ආරම්භ කළා කියලත් කියනවා. රජගෙදරින් දියවන්නාවට ගෙන එන්න ලෑස්ති කරපු 20 ට විරෝධය පාමින් 19 දිගටම තියන්න කියලා මේ කණ්ඩායම ජනමාධ්‍යවලින් කියාගෙන යනවලු.

මේ අය එකතුවෙලා ජනතාවගේ මතය විමසූ බව සඳහන් කරපු ලිපියකුත් ලක ලෑස්ති කරා කියලයි කියන්නේ.

## රජකමක් ගන්න දුර ඇමතුම්

**දේශපාලනඥයන්ට කාලෙන් කාලෙට නොයෙක් ආකාරයේ නාමයන් ආරූඪ කරන බව මෙරට වැසියන් හොඳින් දන්නා කාරණයකි.**



කැලණිය පැත්තෙන් පොඩි දුටුගැමුණු කෙනෙකු එක වර මතුවෙලා මුළු රටේම ප්‍රසිද්ධ වුණා.

නිල් පාටියේ පාටිය මේ චරිතය දේශපාලන ඉතිහාසය තුළ වැඩිම කතාබහට ලක්වූ චරිතයකි. නිල් පාටියෙන් අලි පාටියට පැන ගත්ත මේ හාදයා මෙවර දියවන්නා සටනට පුතානෝගේ පාටියෙන් තරග කරාලු.

අප්පච්චි මළා කිව්වම අද මුළු රටම දන්නවානේ. ඒ තව චරිතයක්. මේ දිනවල මුහුණු පොත ඇතුළු සමාජ සමාජ මාධ්‍යවලින් දුටුගැමුණු රජතුමාට සමාන චරිතයක් පිළිබඳව දැඩි කතාබහක් ඇති වෙලා කියලයි ආරංචිය.

පුතාණෝගේ පාටියෙන් මෙවර දියවන්නාවට කුරුණෑගලින් තරග කරපු කටකාරයෙක් පුතාණෝව දුටගැමුණු ලෙස සලකන්න කියලා ඉල්ලීමක් කරලාලු.

මේ කතාබහ කන වැකුණු කිහිපදෙනෙක් මේ කටකාරයාට දුරකථන ඇමතුම ලබාදී තමන්ටත් රජකමක් ලබාදෙන්න කියලා ඉල්ලීම් කරනවා කියලයි ආරංචි.

● ඉනෝකා සමරවික්‍රම



# නාට්‍ය කලාවට අලුත් හුස්ම දෙන ප්‍රේක්ෂා නාට්‍ය උලෙළ

**දැන් හැමදේම සාමාන්‍යයි, අපිට හිතෙන්නෙත් එහෙමයි. ඒත් තවමත් කොරෝනා වයිරසය නිසා සාමාන්‍ය වෙන්න බැරි රටවල් ලෝකයේ ඇත. ඔවුන්ගේ දවස ගෙවෙන්නේ බොහෝ ආරක්ෂාකාරී ලෙසිනි. අත්‍යවශ්‍ය දෙයකට හැරෙන්නට ඔවුහු එළියට නොබසින යුගයක අපේ රටේ රාජ්‍ය නාට්‍ය උලෙළ සාර්ථක ලෙසින් පැවැත්වීම ම පැසසිය යුත්තකි. මේ කොරෝනා සමයේ ආර්ථික වශයෙන් කඩා වැටීමට ලක්ව සිටින නාට්‍යකරුවන් වෙනුවෙන් හා වේදිකා නාට්‍යයට ප්‍රිය කරන ප්‍රේක්ෂකයන් වෙනුවෙන් අගෝස්තු මාසයේ සිට සැප්තැම්බර් 15 දින දක්වා පැවැත්වෙන ප්‍රේක්ෂා නාට්‍ය උලෙළ සංවිධානය කරනු ලැබුවේ ටවර් හෝල් රඟහල පදනම විසිනි. අගෝස්තු 19 වැනිදා ආරම්භ වූ මෙම නාට්‍ය උලෙළ සැප්තැම්බර් මස 15 දා දක්වා ටවර් රඟහලේ සහ එල්ෆින්ස්ටන් රඟහලේ දී දිනපතා සවස 3.30 හා සවස 6.30 ලෙස දර්ශන වාර දෙකක් පැවැත්වේ.**

ප්‍රවීණ නාට්‍යකරුවන්ගේ නාට්‍ය මෙන්ම සම්මාන දිනූ ආධුනික නාට්‍ය ශිල්පීන්ගේ නාට්‍යද මෙහිදී ප්‍රදර්ශනය කෙරේ. ප්‍රේක්ෂා පළවෙනි නාට්‍ය උලෙළට ද සහභාගි වී සිටින ඇය දෙවන නාට්‍ය උලෙළේදීද සිය නාට්‍යයක් වේදිකා ගත කිරීම සඳහා මේ දිනවල සූදානමින් සිටි. ඇය ප්‍රවීණ කලාකාරිනි රම්‍යා වනිගසේකරය.

"ප්‍රේක්ෂා නාට්‍ය උලෙළ ගැන අපට හරිම සතුටුයි. පළවෙනි නාට්‍ය උලෙළේදි අපට කැලණි පාලම නාට්‍ය පෙන්වීමට අවස්ථාව ලැබුණා. දෙවැනි නාට්‍ය උලෙළටත් සම්බන්ධ වීමට අපට අවස්ථාව ලැබුණා. සැප්තම්බර් අට වෙනිදා වේදිකා ගතවන්නේ ආර්. ආර්. සමරකෝන් ගේ අහසින් වැටුණ මිනිස්සු නාට්‍ය. මේ නාට්‍ය ඒ යුගයෙත් බොහෝම ජනප්‍රිය වුණා. මම හිතනවා මේ යුගයෙත් ඒ නාට්‍යට ප්‍රේක්ෂක ප්‍රතිචාර ලැබෙයි කියලා. මේ නාට්‍යයට 1971 අවුරුද්දේ දී රාජ්‍ය නාට්‍ය උලෙලේ හොඳම නාට්‍ය ලෙස සම්මාන ලැබුණා. එහි ප්‍රධාන චරිතය රඟපෑ චන්ද්‍ර කළුආරච්චි තමයි හොඳම නිළිය වුණේ. හොඳම නළුවා ලෙසින් තේරුණේ රංජිත් යාඉන්න. මේ නාට්‍යයේ චරිත පහයි තියෙන්නේ. තිලක් කුමාර රත්නායක, ගීතා කාන්ති ජයකොඩි, වික්‍රම සෙනෙවිරත්න සහ මම තමයි මෙහි රඟපාන්නේ. කොහොම වුණත් පහුගිය කොරෝනා කාලයේ අපට අපේ නාට්‍ය පෙන්වා ගන්නට බැරිව ගියා. එවන් කාලයක ප්‍රේක්ෂා නාට්‍ය උලෙළ අපට ආශිර්වාදයක් වගෙයි. මෙය ඉතාම සාර්ථකයි. මින් ඉදිරියට හැම වසරකම මෙවැනි නාට්‍ය උලෙළ පැවැත් වෙනවා නම් ඉතා ම අගෙයි"රම්‍යා පවසන්නේ සතුටෙනි.

## ටවර් හෝල් රඟහල පදනමේ සාර්ථක ප්‍රයත්නයක්

මීට දශක කිහිපයකට පෙර වේදිකා නාට්‍යවලට මෙරට තිබුණේ ඉහළ ඉල්ලුමකි. නමුදු කාලයත් සමඟ වෙනත් කලාවන් ඉදිරියට ඒමත් විවිධාකාර හේතුන්ගේ බලපෑමත් සමඟ වේදිකා නාට්‍ය සඳහා තිබූ ජනප්‍රියත්වය ක්‍රමයෙන් අඩු වන්නට විය. ඒ සියල්ලටම වඩා පසුගිය කොරෝනා වයිරසයේ බලපෑමත් සමඟ සියල්ල උඩු යටිකුරු විය. බොහෝ කලාකරුවන්ට සිදු වූයේ දවස නිකම්ම ගෙවා දැමීමටය. ඇතැමුන්ට තිබූ ආදායම් මාර්ගයත් ඇහිරී ගියේය. සෘජුවම වේදිකා නාට්‍ය නළු නිළියන්ට, නිෂ්පාදකවරුන්ට පමණක් ඒ වටා සිටි බොහෝ දෙනෙකුගේ ආදායම් මාර්ග ඇහිරී ගියේය.

එවන් කාල වකවානුවක ප්‍රේක්ෂා නාට්‍ය උලෙළ පැවැත්වීම පිළිබඳ ප්‍රවීණ නාට්‍යවේදී ප්‍රියංකර රත්නායකයන් මෙසේ අදහස් දැක්වීය.

"මගේ නාට්‍ය "රතු වෙස් මුහුණ" වේදිකා ගතවුණේ පසුගිය බදාදා. මේ කොරෝනා කාලයේ ශාලාව පිරෙන්න ජනතාව පැමිණීම සතුටක්. ටවර්හෝල් වේදිකාවත්, එල්ෆින්ස්ටන් වේදිකාවත් නාට්‍යකරුවන්ට ලබා දුන්නේ නොමිලේ. එය විශේෂ අවස්ථාවක්. ප්‍රේක්ෂා පළමු නාට්‍ය උලෙළේදී තවත් සහන දී තිබුණා. අපි එය අගය කළ යුතුයි. මගේ නාට්‍ය වේදිකා ගත වූ දවසේම තමයි ටවර් හෝල් එකේ හෙන්රි ජයසේනයන්ගේ කුවේණි නාට්‍යය වේදිකා ගත වුණේ. මට දැන ගන්න ලැබුණා ඒ නාට්‍යයටත් ශාලාව පිරෙන්න සෙනඟ පැමිණිය බව. මේක හොඳ ප්‍රවණතාවක් ලෙසයි මම දකින්නේ. නාට්‍යකරුවන් විදිහට මෙය අපට විශාල සතුටක්. ටවර්හෝල් පදනමත් එහි අධ්‍යක්ෂ ඩග්ලස් සිරිවර්ධන මහත්මයාත් මේ ගැන දක්වන උනන්දුව සහ කැපවීම අගය කළ යුතුයි. මේ නාට්‍ය උලෙළේදී තරුණ නාට්‍යකරුවන්ටත් ඔවුන්ගේ නාට්‍ය පෙන්වීමට අවස්ථාව දී තිබෙනවා. නමුත් මට හිතෙනවා මේ තරුණ නාට්‍යකරුවන්ට ප්‍රවීණයන්ට මෙන් ප්‍රේක්ෂකයෝ ඉඳීවිද කියලා. එහෙම වුණොත් ඔවුන් මේ කලාව අතහරින්න පුළුවන්. නාට්‍යයක් වෙනුවෙන් දරන වියදම ඔවුන්ට දරාගන්න අපහසුයි. ඒ නිසා මම මෙහිදී ඉල්ලීමක් කරන්න කැමතියි තරුණ නාට්‍යකරුවන්ටත් පළමු ප්‍රේක්ෂා නාට්‍ය උලෙළේදී අනෙක් නාට්‍යකරුවන්ට දුන් සහනයන්ගෙන් ටිකක්වත් ලබා දෙන්න කියලා. පාසල්වල උසස් පෙළ විභාගය සඳහා නාට්‍ය හා රංග කලාව ඉගෙන ගන්න දරුවන් නාට්‍ය බැලීමට හුරු කළ යුතුයි. ඒ සඳහා ටවර්හොල් පදනම සමඟ අධ්‍යාපන අමාත්‍යාංශයත් එක් වුණොත් මේ වැඩපිළිවෙළ වඩාත් සාර්ථක කරන්නට පුළුවන්. ජනතාව නාට්‍ය ගැන උනන්දුයි. මේ උලෙළ වසරින් වසර පැවැත්වේවා කියන එක තමයි මගේ ප්‍රාර්ථනය."



ටවර්හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජෙනරාල්, ජ්‍යෙෂ්ඨ නීතිඥ ඩග්ලස් සිරිවර්ධන

## සැප්තැම්බර් 15 දක්වා දිනපතා සවස දර්ශන වාර දෙකක්

මාස ගණනාවකට පසු නාට්‍යයක් නැරඹීමට හැකිවීම ගැන ප්‍රේක්ෂකයන් තුළ ඇත්තේ සතුටකි. නාට්‍ය බලන්නට කොළඹට පැමිණි ප්‍රේක්ෂකයෝ කොළඹ හා ඒ අවට අය පමණක් නොවේ. ඇතැමුන් පැමිණ තිබුණේ ඇඹිලිපිටිය, අවිස්සාවේල්ල ආදී දුර බැහැර සිටය.

මෙම නාට්‍ය උලෙළ ගැන අදහස් දක්වමින් ටවර්හෝල් පදනමේ අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රවීණ නාට්‍යවේදී නීතිඥ ඩග්ලස් සිරිවර්ධනයන් කරුණු දක්වන්නේ සිය උත්සාහය සාර්ථක වීමේ සතුටිනි.

"නාට්‍ය උලෙළ අපි හිතුවාටත් වඩා සාර්ථකයි. මේ වැඩසටහන අරඹන්න යද්දි බොහෝ අය විවිධ අදහස් ප්‍රකාශ කළා. සමහරු කිව්වා මෙය සාර්ථක වෙන්නේ නැහැ කියලා. නමුත් මට විශ්වාසයක් තිබුණා මෙය සාර්ථකව අපට කරන්නට පුළුවන් කියලා. දුර බැහැර සිට නාට්‍ය බලන්නට අය පැමිණ සිටියා. ඒ වගේම නාට්‍යකරුවන්ගේ උනන්දුවත් තිබුණා. අගමැතිතුමාගේ උපදෙස් වගේම එතුමාගේ පූර්ණ අනුග්‍රහය ඇතිවයි අපට මේ කටයුත්ත මේ ආකාරයට කරන්නට පුළුවන් වුණේ. වර්තමානයේ ටවර්හෝල් පදනමේ සභාපතිධුරය දරන්නේ මහින්ද රාජපක්ෂ අගමැතිතුමා. ලෝකෙම මිනිස්සු එළියට බහින්න බයෙන් ඉන්න කාලෙක අපේ රටේ ජනතාව කොරෝනා බිය පසෙකලා නාට්‍ය බලන්නට පැමිණීම සතුටක්. ඉදිරි වසරේදී ප්‍රේක්ෂා නාට්‍ය උලෙළ මීටත් වඩා සාර්ථකව පැවැත් වීමයි අපේ අරමුණ. හැම වසරකම මේ නාට්‍ය උලෙළ පැවැත් වීමටයි අපේ ඊළඟ අරමුණ." යැයි ටවර්හෝල් පදනමේ අධ්‍යක්ෂ ජෙනරාල් පැවසීය.




නෙයිනගෙ සුදුව නාට්‍යයෙන්



පෙමතො ජායතී සෝකෝ නාට්‍යයෙන්



ප්‍රවීණ නාට්‍යවේදිනි රම්‍යා වනිගසේකර



ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ප්‍රියංකර රත්නායක

---



උම්බලකඩ සැකසීමට තම්බන ලද මාළු දුම්ගැසීම

# වෙළඳපොළක් නැතිව වේළෙන උම්බලකඩ කර්මාන්තකරුවෝ

● ජයසිරි පේදුරුආරච්චි
(ගන්දර සමූහ)

**දකුණු පළාතේ කෝට්ටගොඩ, නිල්වැල්ල, කුඩාවැල්ල සේම දෙවිනුවර ධීවර වරායන් ආශ්‍රිතව කලක සිට උම්බලකඩ කර්මාන්තය ක්‍රියාත්මක වන්නේ ධීවර කර්මාන්තයේ තවත් එක් අතුරු කර්මාන්තයක් ලෙසය. කලක් සාමාන්‍ය වශයෙන් ක්‍රියාත්මක වූ උම්බලකඩ කර්මාන්තය සුනාමියෙන් පසු මහා පරිමාණ අයුරින් ක්‍රියාත්මක වන ආකාරයක් දක්නට ඇත. එහෙත් විදේශයන්ගෙන් විශාල වශයෙන් උම්බලකඩ ගෙන්වීම නිසා මෙරට කර්මාන්තකරුවා අව්වේ වේළෙන තත්ත්වයට පත්ව ඇතැයි මැසිවිලි නැගේ.**

සරු මාළු අස්වනු ලැබෙන කාලයට වැඩි වශයෙන්ද මාළු අස්වනු අඩුවෙන් ලැබෙන කාලයට පාලනයක් සහිතවද සිදු කරන දකුණේ උම්බලකඩ කර්මාන්තය දිනෙන් දින දියුණුවක් ලබන බව දක්නට ලැබුණද කර්මාන්තකරුවාගේ වියදම හා මහන්සියට නියමිත වටිනාකමක් නොලැබීම මැසිවිලි නැඟීමට එක් හේතුවකි.



සුනිමල් ගම්හේවා



ඩබ්ලිව්. පී. සූරියපාල



එම්. පී. රංජනී



එම්.එම්. දිමුතු

"අපි අවුරුදු දාහතරක් තිස්සේ මේ කර්මාන්තය කරන්නේ. අපි කර්මාන්තය පටන් ගන්න කාලයේ රුපියල් හත්සියයට, අටසියයට තිබුණු උම්බලකඩ කිලෝව අද වන විට රුපියල් එක්දහස් දෙසීය දක්වා වැඩි වී තිබෙනවා. ඒ වාගේම මේ කර්මාන්තයට යන වියදමත් වැඩි වී තිබෙනවා. උම්බලකඩ කිලෝවක් හදන්න ලොකු බලයා වර්ගයේ මාළු කිලෝ පහක් වැය වෙනවා. කුඩා කුරි නම් කිලෝ හයක් වැයවෙනවා" උම්බලකඩ කර්මාන්තයේ සක්‍රියව නිරතව සිටින කෝට්ටගොඩ එම්. පී. රංජනී (53) තම අත්දැකීම එලෙස ප්‍රකාශ කළාය.

ඇය එලෙස පැවසුවද උම්බලකඩ කිලෝවක් සඳහා රුපියල් එක්දහස් දෙසීයක් වැනි ඉහළ මිලක් ලැබෙද්දීත් ඉන් සෑහීමකට පත්නොවීම පිළිබඳ කළ විමසුමේදී ඇය දැක්වූයේ මෙවන් අදහසකි.

"මම කලින් කී ආකාරයට එක උම්බලකඩ කිලෝවක් හදන්න මාළු කිලෝ පහක් යනවා වගේම ඒ සඳහා ලුණු, මාළු තැම්බීම සඳහා ලොකු හට්ටි, දර, පොල්ලෙලිවලට, මාළු කපන අයට වගේම උම්බලකඩ සැකසීම සඳහා යොදවා ගන්නා අත්උදවුකරුවන් ඇතුළු මේ හැමදේකටම මුදල් වැය වෙනවා. හැබැයි ගැණුම්කරුවන් ඇවිත් ඉල්ලන්නේ තුට්ටුවට දෙකට. පිටරටවලින් විශාල වශයෙන් උම්බලකඩ ගෙන්වනවා එම හේතුව නිසා තමයි වෙළෙන්දෝ අපේ නිෂ්පාදන ගන්නා විට හෙට්ටු කරන්නේ. අපි ගන්න මහන්සිය ඒ අයට පේන්නේ නෑ. මේකට යම් වැඩපිළිවෙළක් අවශ්‍යයි. ඒකයි අපි කියන්නේ"

## පිටරටින් උම්බලකඩ ගෙන්වීම නතර කරන්න



ධීවර රැකියාව සෑම දිනකම සිදු කිරීමට නොහැකි සේම උම්බලකඩ කර්මාන්තයද වාරකන් කාලයට සරුවට කළ නොහැකිය. ඒ මාළු අස්වැන්න අවශ්‍ය පරිදි නොලැබෙන නිසා හා සුළුවෙන් හෝ ලැබෙන මාළු ඉහළ මිලක් වන නිසාය. දකුණේ උම්බලකඩ කර්මාන්තයට වැඩිහිටියන් සේම තරුණ කොටස්ද එක්ව සිටින්නේ කැපවීමෙන් සිදුකළහොත් ඉන් වැඩි ලාභ ලබාගත හැකි නිසාය.

මේ රැකියාව හොඳ කැපවීමෙන් කළොත් මාසයකට රුපියල් පනස්දහසක්, හැටදහසක් උපයාගන්න පුළුවන්. හොඳ උම්බලකඩයක් හදන්න වැඩ කීපයක්ම කරන්න තියෙනවා. උම්බලකඩ හොඳ නම් ඉල්ලුම හොඳයි. එතකොට වැඩි ගණනකට විකුණා හොඳ ලාභයක් ගන්න පුළුවන්. අපි මේ මූලික වැඩ ටික කරන්නේ ගෙදර අයගේ කණකර බඩු උකස් තියලා. ලැබෙන ආදායමෙන් තමයි යළි ඒවා බේරාගන්නේ. අපි කොයිතරම් මහන්සියෙන් මේක කළත් පිටරටවල්වලින් ගේන උම්බලකඩ වෙළෙඳපොළට වැඩි වශයෙන් එන නිසා අපිට පහර වදිනවා. එම්. එම්. දිමුතු කියයි.

## උම්බලකඩ කිලෝවක් හදන්න ලොකු බලයා මාළු කිලෝ පහක් ඕනෑ

රසගුණ පිරි ලෙස සෞඛ්‍යාරක්ෂිතව උම්බලකඩ නිෂ්පාදනය පියවර කිහිපයක් ඔස්සේ සිදු වෙයි. ඒ, ධීවරයා මහ මුහුදෙන් අල්ලා ගෙන එනු ලබන බලයා වර්ගයේ මාළු තොග වශයෙන් ලබා ගැනීම, ඒවායේ හිස හා බඩවත කොටස් කපා ඉවත් කර සකස් කිරීම, ලුණු සහිත ලොකු භාජනවල දමා තම්බා ගැනීම, තම්බන ලද මාළු දුම් ගැසීම හා දුම් ගැසීමෙන් කටු ගලවා ඉවත් කර කොටස්වලට වෙන්කිරීම සහ අව්වේ දමා වේලා ගැනීම මෙන්ම වේළීම සිදු කරන අතර වැස්සෙන් හා සතුන්ගෙන් ආරක්ෂා කිරීමද සිදු කළ යුතුය. ඒ සඳහා ශ්‍රමය මෙන්ම සේවක ගාස්තු සඳහා අමතර පිරිවැයක්ද දැරිය යුතුය.


විදේශවලින් ගෙන්වන උම්බලකඩ ගැන හිතේ තියාගෙන බොහෝ අඩු මිල ගණන්වලට ඉල්ලනවා. ඒ නිසා අපේ මහන්සිය ගැන අපිටම දුකයි. අපි හැමදාම වගේම අදත් ඉල්ලන්නේ ව්‍යාපාරික සුනිමල් ගම්හේවා එසේ පැවසුවේය.

දකුණේ උම්බලකඩ කර්මාන්තකරුවා මුහුණදී ඇති තවත් ප්‍රධාන ප්‍රශ්නයක් වන්නේ සෘජු වෙළෙඳ පොළක් නොමැති වීමෙන් නිෂ්පාදකයා අතරමැදියන්ගේ ග්‍රහණයට හසුවීමයි. එම තත්ත්වය ඈත අතීතයේ සිට මෙම කර්මාන්තයේ නියැළෙන පිරිස මුහුණ දෙන ප්‍රධානතම ගැටලුවකි.

"වසරේ මාස දොළහෙන් මාස තුනක්ම මාළු හිඟයි. අලුත් අවුරුද්දෙන් පසු තමයි මෙම තත්ත්වය උදා වන්නේ. අපි ඒවා ගැනත් හිතලා තමයි නිෂ්පාදන කටයුතු සිදු කරන්නේ. එහෙම කැපකිරීම් රැසක් කරලා අව්වේ වේළිලා අමාරුවෙන් උම්බලකඩ ටික හදාගත්තට පස්සෙ අපි ඊළඟට හසුවෙන්නේ අතරමැදියන්ට. අපෙන් බඩු ගන්න සමහර අතරමැදියෝ මාස තුන හතර සල්ලි ප්‍රමාද කරනවා. සමහරවිට සල්ලි නොදීම ඉන්න අවස්ථාත් තිබෙනවා. මාළු තම්බන හට්ටියක් රුපියල් පහළොස් දහසක්, විසි දහසක් වෙනවා. එකක් මාස අටකට වඩා පාවිච්චි කරන්න බෑ. ලුණුවලට හිල්වෙනවා. අපිට හොඳ වෙළෙඳපොළක් වගේම මාළු තම්බන ලොකු හට්ටි, මාළු කපන ලොකු පිහි, දර එකලස් කරන සවල්, මාළු වහන්න වගේම වේළන්නත් භාවිත කරන ටකරන් අපිට අවශ්‍යයි" උම්බලකඩ කර්මාන්තයේ නිරත ව්‍යාපාරිකයකු වන ඩබ්ලිව්. පී. සූරියපාල හෙවත් චූටි මාමා පැවසුවේය.

උම්බලකඩ කර්මාන්තයෙන් ව්‍යාපාරිකයා සෘජු ආදායමක් ලබනවා සේම ඒ සඳහා අත්උදව් සපයන අය ද තම දරුපවුල් රැකගන්නේ එයිනි.

"මගේ මහත්තයා නෑ. මට දුවෙක් හා පුතෙක් ඉන්නවා. අපි කන්නෙ බොන්නේ, දරුවන්ට උගන්වන්නේ මේ කර්මාන්තයෙන් ලබාගන්නා දෙයින් තමයි. කරන වැඩ කොටස් සහ වැඩවල ප්‍රමාණය අනුව දවසට රුපියල් දෙදහසක්, දෙදහස් පන්සියයක් හොයාගන්න පුළුවන්. මේ කර්මාන්තය රැකුණොත් තමයි අපේ දරුපවුල් රැකෙන්නෙ. ඒ නිසා අතරමැදියන්ගෙන් හා පිටරටවලින් ගෙන්වන උම්බලකඩවලින් මේ කර්මාන්තය ආරක්ෂා කර දෙන ලෙස ඉල්ලා සිටිනවා" අත්උදව්කාරිනිය ලෙස කටයුතු කරන පී. එච්. ප්‍රියන්ති (37) එසේ කීවාය.







## අතිගරු ජනාධිපතිතුමාගේ පණිවුඩය



ශ්‍රී ලංකා මහ බැංකුව සිය 70 වැනි සංවත්සරය සමරන මේ මොහොතේ ඒ වෙනුවෙන් මාගේ ශුභාශිංසන එක් කරන්නේ ඉමහත් සතුටිනි. 1950 අගෝස්තු 28 වැනි දා ඇරැඹි ශ්‍රී ලංකා මහ බැංකුව රටේ මූල්‍ය අධිකාරිය වශයෙන් ආරම්භයේ සිටම ඇයේ දියුණුව වෙනුවෙන් අනලස් ව පෙනී සිටියේ ය.

"රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති මාලාවේ අඩංගු ඉලක්ක හා අනුගත වෙමින් ඒවායේ සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගැනීම උදෙසා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රටේ බැංකු අංශය කෙරෙහි දක්වන ලද නායකත්වය සහ මග පෙන්වීම පිළිබඳ ව මාගේ ප්‍රශංසාව පළ කරමි. කොවිඩ්-19 වංසගත තත්වය පිටුදැකීම සඳහා මුළු රට ම දැඩි සටනක යෙදී සිටි අවස්ථාවේ ප්‍රමාණවත් තරමේ මූල්‍ය පහසුකම් වෙළෙඳපොළ වෙත සැපයීමට මහ බැංකුව ගත් ක්‍රියාමාර්ග සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ මෙන් ම සාමාන්‍ය ජනතාවගේ ද සිත් තුළ විශ්වාසය ගොඩනැගීමට සමත් විය. අතිශය දුෂ්කර තත්වයන් යටතේ එම කාලය තුළ විනිමය අනුපාතික සාපේක්ෂ වශයෙන් දැඩි විචලනයකින් තොරව පවත්වා ගැනීමේ අභියෝගාත්මක කර්තව්‍යයට මහ බැංකුව මුහුණ දුන් ආකාරය ප්‍රශංසනීය වේ. රට ම නිරෝධායන මෙහෙවරක් සහිත අරගලයක යෙදී සිටි කාලය තුළ මූල්‍ය වෙළෙඳපොළේ පැවති ඉතා අසතුටුදායක තත්වය යටතේ වුව ද රටේ මූල්‍ය පද්ධතියේ සහ මූල්‍ය ආයතනවල දක්නට ලැබුණු ස්ථාවරත්වය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනු ලැබූ ඉක්මන් සහ ආරක්ෂාකාරී පියවර හේතු විය.

ශ්‍රී ලංකාවේ අභිවෘද්ධිය වෙනුවෙන් සංවර්ධිත ආර්ථිකයක් කරා යන ඉදිරි ගමනේ දී රටේ ණය බර කළමනාකරණය කර ගත හැකි මට්ටමකට පාලනය කර ගැනීම අවශ්‍ය ය. මේ සම්බන්ධයෙන් ගත් කළ ණය සේවාකරණ ගෙවීම් නිසි කලට සිදු කිරීම සම්බන්ධයෙන් නිකැළැල් වාර්තාවක් ශ්‍රී ලංකාව සතු ය. අතිශය අර්බුදකාරී තත්වයන් යටතේ වුව ද රටේ ණය සේවාකරණය කාර්යක්ෂම ලෙස ඉටු කිරීම මගින් මෙන් ම විදේශ සංචිත විචක්ෂණශීලී ලෙස කළමනාකරණය මගින් ද ශ්‍රී ලංකා මහ බැංකුව පෙන්වා දී ඇත්තේ එය සත්‍ය වශයෙන් ම මෙරට මූල්‍ය අංශයේ අග්‍රගණ්‍ය ආයතනය වන බව ය.

වර්තමානයේ පවත්නා අතිශය කැලඹිලි සහගත තත්වයන් යටතේ වුව ද රටේ සංවර්ධන අපේක්ෂා ඉටු කර ගැනීමට ශක්තියක් වෙමින් රට වඩාත් සුබවාදී ඉලක්කයක් කරා මෙහෙයවීමට ජාත්‍යන්තරයේ ද සහයෝගය ඇති ව ශ්‍රී ලංකා මහ බැංකුව රජයට සහයෝගය දක්වනු ඇතැයි මාගේ විශ්වාසයයි. වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් දැයට දායාද කිරීම සඳහා ඇවැසි ශක්තිය හා ධෛර්යය ශ්‍රී ලංකා මහ බැංකුවට ලැබේවා යි පතමි.

**ගෝඨාභය රාජපක්ෂ**

## ගරු අග්‍රාමාත්‍යතුමාගේ පණිවුඩය



දැඩි අභියෝග මධ්‍යයේ වුවද ඵලදායී ජයග්‍රහණයන් රැසක් ළඟා කරගනිමින් 70වැනි වසරට පා තබන ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාගේ ශුභාශිංසනය පළ කරමි. ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම ආයතනය වන ශ්‍රී ලංකා මහ බැංකුව සිය 70 වැනි සංවත්සරය සමරන මේ මොහොත ශ්‍රී ලංකාව ගෝලීය වසංගත තත්ත්වයක් වන කොවිඩ්-19 හමුවේ පැන නැගී ඇති අභියෝග හමුවේ වුව ද දේශපාලන ස්ථාවරත්වය අතින් නව යුගයකට එළඹෙමින්, නව බලාපොරොත්තු හා ආර්ථික අභිලාෂයන් පෙරදැරිව ඉදිරියට ගමන් කරන අවස්ථාවක් ලෙස හැඳින්විය හැක.

විවිධ දැඩි අභියෝගයන්ට මෙරට මුහුණ දුන් දශකයක පමණ කාලයක් පුරාවට මුදල් අමාත්‍යවරයා වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සමග මා සමීපව කටයුතු කළ බැවින්, රජයේ සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ශ්‍රී ලංකාව ඉසුරුමත් රාජ්‍ය ආයතනයක් බවට පරිවර්තනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව උත්ප්‍රේරකයක් වනු ඇතැයි මා තුළ දැඩි විශ්වාසයක් ඇත.

නිදහස ලැබීමෙන් පසු ආර්ථික සමෘද්ධිය ළඟාකර ගැනීමට ශ්‍රී ලංකාව ඉදිරියට ම ගමන් කළ ද, අප සැමගේ ධෛර්යය මැන බැලූ කාල වකවානුවලදී ආර්ථික හා මූල්‍ය සංවර්ධනය අතින් මෙරට යම් අඩාලවීම්වලට මුහුණ දී තිබේ. ශ්‍රී ලංකා මහ බැංකුව පසුගිය දශක හතක කාලය පුරාවට සිය සාම්ප්‍රදායික කාර්යය භාරය වන ආර්ථික හා මිල ස්ථායීතාව ළඟාකර ගැනීමටත්, රටේ ආර්ථික වර්ධනය හා සංවර්ධනයට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පවත්වා ගැනීමටත් සිය නායකත්වය ලබා දී ඇත.

තවද, ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමට අතිශයින් වැදගත් කාර්යයභාරයක් ඉටු කළ ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රාථමික මූල්‍ය පද්ධතියක සිට මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කළ හැකි ආකාරයේ, විවිධාංගීකරණයට ලක් වූ වෙළෙඳපොළ දිශානතියක් සහිත වූ මූල්‍ය පද්ධතියක් නිර්මාණය කිරීමට සමත් වී ඇත. කාලයෙන් කාලයට ආර්ථික සහ මූල්‍ය පරිසරයන්හි ඇතිවන වෙනස්වීම් වලට අනුගත වෙමින් ශ්‍රී ලංකා මහ බැංකුව සිය කාර්යයන් නවීකරණය කර ඇති අතර, ගෙවීම් හා පියවීම් පහසුකම් ක්‍රියාත්මක කිරීම, ව්‍යවහාර මුදල් කළමණාකරණය සහ විදේශ විනිමය හා විදේශ සංචිත කළමණාකරණය ආදිය මෙම කාර්යයන්ගෙන් සමහරකි. රජයේ බැංකුකරු හා මූල්‍ය උපදේශක ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කළ ආකාරය හේතුවෙන් ආර්ථික වර්ධනයට උත්තේජකයක් වන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී මුදල් ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය අතර සුසංයෝගයක් පවත්වාගැනීමට 1950 වසරේ මහ බැංකුව ආරම්භ වූ අවධියේ සිටම හැකියාවක් ලැබී ඇත. සිය ඉතිහාසය පුරාවට ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් අමාත්‍යාංශය ඇතුළු අනෙකුත් රාජ්‍ය ආයතන සමග සමීපව කටයුතු කරමින් ශ්‍රී ලංකාවේ ආර්ථික ගැටලු සාර්ථකව හැසිරවීමටත් ශ්‍රී ලාංකිකයන්ගේ යහපැවැත්ම වර්ධනය කිරීම උදෙසා කාලෝචිත විසඳුම් ලබාදීමටත් ක්‍රියාකර ඇත. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති නියෝජිත ලෙස සාර්ථකව රාජ්‍ය ණය කළමනාකරණය සිදුකර ඇති ශ්‍රී ලංකා මහ බැංකුව සිය විදේශීය ණය සේවාකරණ කාර්යයන් නියමිත වේලාවට නිකැළැල් අයුරින් සපුරාලීමට සමත් වී ඇති අතර මේ හේතුවෙන් ශ්‍රී ලංකාව කෙරෙහි ආයෝජකයන්ගේවිශ්වාසය ශක්තිමත් වී ඇත. ජාත්‍යන්තර ආයතන කිහිපයක් වෙනුවෙන් ප්‍රධාන සම්බන්ධීකාරක කටයුතු ඉටුකරන ආයතනය ශ්‍රී ලංකා මහ බැංකුව වන අතර ලෝකයේ අනෙකුත් රටවල් සමග ආර්ථික සහයෝගීතාව සහ සම්බන්ධතා වැඩිදියුණු කිරීමට මෙම කාර්යය අත්‍යාවශ්‍යයෙන් ම ඉවහල් වී ඇත.

මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හරහා මිල ස්ථායීතාව පවත්වා ගනිමින් රජයේ සංවර්ධන ක්‍රියාවලියට උර දී සාධාරණ වූත්,අන්තර්ග්‍රාහීව බලාපොරොත්තු සපිරි ආර්ථික වර්ධනයක් සඳහා පසුගිය වසර 70 පුරා ශ්‍රී ලංකා මහ බැංකුව ලබාදුන් දායකත්වය ප්‍රශංසනීය වේ. ශක්තිමත් හා සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් ගොඩනැගීමට විචක්ෂණශීලි සර්ව ආර්ථික ප්‍රතිපත්ති සකස් කරමින් සහ රජයට ක්‍රියාකාරී අදහස් ලබාදෙමින්, ඉදිරියේ දී ඇතිවිය හැකි විවිධ දේශීය හා ගෝලීය අභියෝගයන් මැදින් ආර්ථිකය හැසිරවීමට ශ්‍රී ලංකා මහ බැංකුව රජය වෙත සිය සහයෝගය තවදුරටත් ලබාදෙනු ඇතැයි මාගේ විශ්වාසයයි.

**මහින්ද රාජපක්ෂ**

## මහ බැංකු අධිපතිතුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකා මහ බැංකුව අද දින සිය 70 වන සංවත්සරය අභිමානවත් ව සමරයි. අලුතින් ස්ථාපිත කරන ලද ලංකා මහ බැංකුවේ ප්‍රථම අධිපතිවරයා බවට පත් වූ ජෝන් එක්ස්ටර් මහතා විසින් කෙටුම්පත් කරන ලද 1949 අංක 58 දරන මුදල් නීති පනත අනුව1950 වසරේ අගෝස්තු 28 වන දින ශ්‍රී ලංකා මහ බැංකුව සිය කටයුතු ආරම්භ කළේය.

1985 වසරේදී ලංකා මහ බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුව ලෙස නැවත නම් කරන ලදී. මුදල් නීති පනත අනුව ආරම්භයේ දී මහ බැංකුව වෙත අරමුණු හතරක් පැවරී තිබිණි

1) මුදලේ දේශීය අගය ස්ථාවර කිරීම,
2) ලංකා රුපියලේ බාහිර අගය ආරක්ෂා කිරීම හා ජංගම ගිණුම් ආශ්‍රිත ජාත්‍යන්තර ගනුදෙනු සඳහා රුපියල නිර්බාධීව භාවිත කිරීමට අවකාශ සැලසීම,
3)ලංකාවේ නිෂ්පාදනය, සේවා නියුක්තිය සහ මූර්ත ආදායම ඉහළ මට්ටමක් දක්වා ප්‍රවර්ධනයකොට පවත්වාගෙන යාම සහ
4) ලංකාවේ නිෂ්පාදන සම්පත්වල පූර්ණ සංවර්ධනය දිරිමත් කිරීම හා ප්‍රවර්ධනය කිරීම යනු, අරමුණු හතර යි.

මෙම කාලපරිච්ඡේදය තුළ ලොව බොහෝ මහ බැංකු "බ්‍රෙටන් වුඩ්ස් ක්‍රමය"නමින් හැඳින්වෙන පද්ධතියට අනුගතව කටයුතු කළේය. බ්‍රෙටන් වුඩ්ස් ක්‍රමය වනාහි දෙවන ලෝක සංග්‍රාමයට පසුකාලීනව තරගකාරී විනිමය අවප්‍රමාණ වළක්වාලමින්, ස්ථායී ආර්ථික වර්ධනය අරමුණු කොට,ගෝලීය ආර්ථිකය තුළ ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමයක් පවත්වාගෙන යාම සඳහා උත්සාහ දැරූ පද්ධතියකි. මෙම ක්‍රමය යටතේ, ප්‍රධාන වශයෙන් විනිමය අනුපාතික සාපේක්ෂව ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම අරමුණු කොට සිය මුදල් ප්‍රතිපත්ති මෙහෙයවීමටත්, වෙළෙඳ ගැටුම් වළක්වා ගැනීමටත් රටවල් එකඟතාවන්ට එළ ඹුණි.

කෙසේ වෙතත්, 1970 දශකයේ මුල් අවධියේ දී බ්‍රෙටන් වුඩ්ස් ක්‍රමය බිඳ වැටීමත් , සේවා වියුක්ති මට්ටම් ඉහළ යෑමත් මුල් කොට ගෙන බොහෝ රටවල් වැඩි වශයෙන් දේශීය ආර්ථික ස්ථායීතාව ඉලක්ක කරගනිමින් ප්‍රතිපත්ති හැඩ ගස්වාලීමට හුරු විය. ගෝලීයකරණ බලවේගවලට ද, සමාජ දේශපාලන පරිසරයේ වෙනස්කම්වලට ද විශේෂයෙන්ම, මූල්‍ය නවෝත්පාදනවලට හා තොරතුරු තාක්ෂණයේ ඉදිරි ගමනට ද ප්‍රතිචාර වශයෙන් පසුගිය කාලයෙහි ලොව පුරා මහ බැංකුවල ඉලක්ක විකාශනය වී ඇත. තිරසාර ලෙස උද්ධමනය අඩු මට්ටමක පවත්වා ගැනීම සහ ස්ථාවර මූර්ත ආර්ථිකයක් පවත්වා ගැනීම අද වන විට බොහෝ මහ බැංකුවල අරමුණු වෙයි. මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වාගෙන යාම ද මෙම අරමුණෙහි අන්තර්ගතය. ශ්‍රී ලංකා මහ



බැංකුව ද වෙනස්වන පරිසරය සමග විකාශනය වෙමින්, 2000 වසරේදී නවීකරණ වැඩසටහනක් සිදු කළේය. එහිදී, ශ්‍රී ලංකා මහ බැංකුවට මුලින් පැවරී තිබුණු ප්‍රධාන අරමුණු හතර, දෙයාකාර වූ මූලික ස්ථායීතා අරමුණකට සංශෝධනය කෙරුණි.

මේ අනුව,
1) ආර්ථික සහ මිල ස්ථායීතාව පවත්වා ගැනීම සහ
2) මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වාගැනීම ලෙස මෙම අරමුණු ද්විත්වය හැඳින්වේ.

ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සම්පත් සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේ හා දිරි ගැන්වීමේ අරමුණ මෙකී ප්‍රකාශිත අරමුණු තුළ සත්‍ය වශයෙන්ම අන්තර්ගත වෙයි. මෙම අරමුණු කරා යන ගමනේ දී මතු වූ අභියෝග සාර්ථකව ජය ගනිමින් එකී අභියෝග සමහරක් වැදගත් ආයතනික සංධිස්ථාන බවට පත් කර ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව සමත්ව ඇත.

වැදගත් සිහිවටන පිරුණු පසුගිය වසර 70ක ඉතිහාසය පුරා, පූර්වෝපායික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග යෝජනා කරමින්ද, සංවර්ධනය අරමුණු කරගත් සමාජ-ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පදනම වන ආර්ථික හා මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වා ගනිමින් ද, මහ බැංකුව ශ්‍රී ලංකාවේ ප්‍රගතියකට මහෝපකාර වී ඇත. 1970 දශකය දක්වා ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමයක් ද, 1980 දශකයේ සිට මුදල් සැපයුම් ඉලක්කකරණ ක්‍රමද වර්තමානයේ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් ද භාවිත කරමින් උද්ධමනය සතුටුදායක මට්ටම් හි පවත්වා ගැනීමට මහ බැංකුවට හැකි වී තිබේ.

2009 වසරේ සිට දශකයකට අධික කාලයක් පුරා උද්ධමනය අඛණ්ඩව තනි ඉලක්කම් අගයක පවත්වා ගැනීමට හැකි වීම මහ බැංකුව ස්වකීය ව්‍යවස්ථාපිත වගකීම ඉටු කරලීමෙහිලා ලද සුවිශේෂි ජයග්‍රහණයකි. වෙළඳපොළ බලවේගවලට අනුව වෙනස් වීමට යම් ඉඩක් ලබා දෙමින්, විනිමය අනුපාතිකය තීරණය වීමේ වඩා නම්‍යශීලී තත්ත්වයක් ආරක්ෂා කිරීමට හැකිව තිබේ. වෙළඳමේ දී රටේ තරගකාරිත්වය සහතික කරමින් මූර්ත විනිමය අනුපාතිකවල අවුල් සහගත වෙනස්වීම් අවම කර ගැනිණි. සාපේක්ෂ වශයෙන් මුදලේ බාහිර ස්ථායීතාව ආරක්ෂාකර ගැනුණු අතර, රටේ ගෙවුම් ශේෂ අවශ්‍යතාවලට අනුකූල වන පරිදි ප්‍රමාණවත් ආරක්ෂණ තත්ත්වයක් ඇති කරමින්, විදේශ සංචිත ප්‍රමාණවත් මට්ටමින් පවත්වාගෙන යාමට බැංකුව සමත්ව ඇත.

අප මෑතකදී අත් විඳි ගෝලීය මූල්‍ය අර්බුද කාලයෙහි වුවද, රටේ සංවර්ධනය සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සඳහා පහසුකම් සලසා දීමට මහ බැංකුවේ දායකත්වය ලබා දී තිබේ. ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතනික පද්ධතිය දැවැන්ත විකාශනයකට ලක්ව ඇත.

1950 වසරේ දී අප සතු වූයේ වාණිජ බැංකු 12කින් සහ ශාඛා 28කින් සමන්විත සරල මූල්‍ය ආයතනික පද්ධතියකි. වර්තමානයේ දී එය රට පුරා විසිරුණු බලපත්‍රලාභී වාණිජ බැංකු26කට අයත් ශාඛා 2,900කට අධික සංඛ්‍යාවක් ද විශේෂිත බැංකු 6ක් සහ බැංකු නොවන මූල්‍ය ආයතන රාශියක් ද සහිත පුළුල් හා අන්තර් සම්බන්ධිත ජාලයක් ලෙස විකාශනය වී ඇත.

මේ අතර, මහ බැංකුව රට තුළ ජාතික ගෙවීම් හා පියවීම් පද්ධතියක් ගොඩනගාලීමට පුරෝගාමීත්වය ගෙන ඇති අතර, වසර ගණනාවක් තුළ ගන්නා ලද ක්‍රියාමාර්ගවල ප්‍රතිඵල ලෙස, සුරක්ෂිත, ශක්තිමත්, කාර්යක්ෂම සහ වැඩි දෙනකුට ප්‍රවේශ විය හැකි ගෙවීම් සහ පියවීම් පද්ධතියක් ඇති කිරීමට අපි සමත්ව සිටිමු. ජන කේන්ද්‍රිය මහ බැංකුවක් ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුව, ස්වකීය නියාමනයට ලක්වන මූල්‍ය සේවා සපයන්නන් පිළ බඳව වන මහජන පැමිණිලි සහ චෝදනා ඇනුම් දීම හා විසඳ ගැනීම සඳහා උදව් වෙමින්, මහජනතාව සමග තවදුරටත් සම්බන්ධ වීමට කැප වූ විශේෂිත දෙපාර්තමේන්තුවක් මෑතකදී ස්ථාපිත කර ඇත.

ශ්‍රී ලංකා ආණ්ඩුවේ නියෝජිතයා වශයෙන් මහ බැංකුව නියෝජිත කාර්ය ගණනාවක් කාර්යක්ෂමව හා කාලානුරූපව සිදු කරමින් සිටී. රජයේ මූල්‍ය අවශ්‍යතා අවම පිරිවැයක් යටතේ සපුරා දී ඇති අතර, නියමිත කාලය තුළ රජයේ ණය ආපසු ගෙවා දැමීම පිළිබඳ නිකැළැල් වාර්තාවකට අපි හිමිකම් කියමු.

මහ බැංකුව විදේශ විනිමය ගනුදෙනු ලිහිල් කිරීමට රජයට සහාය වූ අතර, ශ්‍රී ලංකාව තුළ මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහිව සිය අධීක්ෂණ කටයුතු අඛණ්ඩව හා ශක්තිමත්ව ඉටු කර ඇත. රටේ විශාලතම විශ්‍රාම ප්‍රතිලාභ අරමුදල වන සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණයට අදාළ කටයුතු කාර්යක්ෂමව සිදු කරන මහ බැංකුව, විචක්ෂණශීලී ලෙස එකී අරමුදල් ආයෝජනය කිරීමෙන් එහි සාමාජිකයන්ට ඉහළ ප්‍රතිලාභ සහතික කිරීමට ද කටයුතු කරයි.

තවද, විවිධ ප්‍රාදේශීය සංවර්ධන කටයුතු හරහා ජනතාවගේ මූල්‍යට අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීමට මහ බැංකුව දායක වී ඇති අතර, එමගින් රට තුළ ව්‍යාප්ති සාධාරණය සහිත වර්ධනයක් ප්‍රවර්ධනය කොට ඇත.

මහ බැංකුවේ කාර්යභාරය ගතික වූවෙකි. පසුගිය වසර 70 තුළ දක්නට ලැබුණු පරිදි, එය අභියෝගාත්මක ආර්ථික තත්ත්වයන් හා අනුවර්තනය වී ඇත. 1970 දශකය අගභාගයේ සිට හඳුන්වා දෙන ලද ආර්ථික ලිහිල්කරණ හෝ නිර්බාධීකරණ ප්‍රතිපත්තිවල ප්‍රතිඵලයක් ලෙස වූ දැවැන්ත සමාජ-ආර්ථික වෙනස්වීම් මෙන්ම, 1970 දශකයේ මුල් භාගයේ සහ 1980 දශකයේ අග භාගයේ ඇති වූ සටන්කාමී තරුණ නැගිටීම් වැනි සමාජීය ගැටුම් පැවති කාල පරිච්ඡේදවල පවා මහ බැංකුව සිය අරමුණු සාර්ථකව ක්‍රියාත්මක කිරීමට සමත් වූයේය.

1996 දී සිදු වූ ත්‍රස්තවාදී ප්‍රහාරයත් සමග වසර 30ක් පුරා පැවති සිවිල් යුද්ධයේ මිලේච්ඡ ප්‍රතිවිපාක සෘජුව අත් විඳීමට මහ බැංකුවට සිදු විය. කෙසේ වෙතත්, විනාශ වූ මිනිස් ජීවිත හා භෞතික සම්පත් හමුවේ වුවද, ඉතාම කෙටි කාලයක් තුළ සිය කටයුතු නැවත ආරම්භ කිරීම ආයතනයක් ලෙස මහ බැංකුව සතුව තිබූ කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාවත් එහි කාර්ය මණ්ඩලයේ මානසික ශක්තියත් මොනවට නිරූපණය කරන කදිම සාක්ෂි වෙයි. 2004 සුනාමි ව්‍යසනයත් දැඩි කාලගුණික විපර්යාස හා සම්බන්ධ ස්වාභාවික විපත්තිත් නිසා රට පීඩා විඳි කාලවල දී මහ බැංකුව ආර්ථිකයට මග පෙන්වීම ලබා දිණි.

1997/98 ආසියානු අර්බුදය සහ 2007/08 ගෝලීය මූල්‍ය අර්බුදය වැනි කලාපීය හා ගෝලීය මූල්‍ය අර්බුද පැවති කාලවලදී රටේ මූල්‍ය පද්ධතියට සිදු වූ බාධා අවම කිරීම සඳහා මහ බැංකුවේ සුපරීක්ෂාකාරී අධීක්ෂණය ඉවහල් විය.

කෙසේ වෙතත්, මහ බැංකුවේ දශක හතක ඉතිහාසය තුළ 2020 වසර තරම් අභියෝගාත්මක වූ වෙනත් කාලයක් නොවූ තරම්ය.

13 පිටුවට



# ශ්‍රී ලංකා මහ බැංකුව පිළිබඳ තතු

**1949 අංක 59 දරන සංශෝධිත මුදල් නීති පනතේ ප්‍රතිපාදනවලට අනුව, ආර්ථික හා මිල ස්ථායිතාව සහ මූල්‍ය පද්ධති ස්ථායිතාව පවත්වා ගැනීමට නෛතික බලතල පැවරී ඇති ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම අධිකාරිය, ශ්‍රී ලංකා මහ බැංකුවයි. රටෙහි ඵලදායී සම්පත් සංවර්ධනය දිරිගැන්වීමත්, ප්‍රචලිත කිරීමත් අරබයා මෙම අරමුණු සාක්ෂාත් කරගැනීමේ කාර්යයෙහි ශ්‍රී ලංකා මහ බැංකුව නිරත වෙයි. මෙම ප්‍රධාන අරමුණුවලට අමතරව, නියෝජිත කාර්යයන් ඇතුළු තවත් ප්‍රධාන කාර්යයන් කිහිපයක්ම ශ්‍රී ලංකා මහ බැංකුව ඉටු කරයි. ශ්‍රී ලංකාවේ වලංගු මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල නිකුත් කිරීමේ හා කලමනාකරණය කිරීමේ ප්‍රධාන වගකීම පැවරී ඇත්තේ ද ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වන අතරම, රජයේ ආර්ථික උපදේශකවරයා මෙන් ම රජයේ බැංකුකරු ලෙස ද ක්‍රියාකරයි. ශ්‍රී ලංකාවේ විදේශ සංචිත කලමනාකරණය කිරීමේ අධිකාරී බලය ශ්‍රී ලංකා මහ බැංකුව සතුව පවතියි. තවද, රජයේ සුරැකුම්පත් නිකුත් කිරීම, ණය සේවාකරණය සහ රාජ්‍ය ණය කලමනාකරණය කිරීම ද ශ්‍රී ලංකා මහ බැංකුව සිදුකරයි.**

ශ්‍රී ලංකා මහ බැංකුව සිදු කරන රජයේ අනෙකුත් නියෝජිත කාර්යයන් නම් සේවක අර්ථසාධක අරමුදල කලමනාකරණය කිරීම, විදේශ විනිමය රෙගුලාසි නියම කිරීම සහ රජය හා විදේශීය අංශ ලබාදෙන ණය සහන යෝජනා ක්‍රම පරිපාලනය කිරීම ආදියයි. ශ්‍රී ලංකාවේ ගෙවීම් හා පියවීම් පද්ධතිය කලමනාකරණය කිරීම මහ බැංකුව සිදුකරන තවත් ප්‍රධාන කාර්යයක් වේ. මේ යටතේ ඩිජිටල්කරණය හමුවේ පැන නැගිය හැකි විවිධ අවදානම් අවම කරගනිමින් පාරිභෝගිකයන්ගේ හා ව්‍යාපාරවල විවිධ සංකීර්ණ අවශ්‍යතා සපුරාලීමට නම්‍යශීලී ප්‍රතිපත්ති හඳුන්වා දීම මහ බැංකුව විසින් සිදු කරයි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලනාධිකාරිය වශයෙන් කටයුතු කරන්නේ සාමාජිකයන් පස්දෙනෙකුගෙන් සමන්විත මුදල් මණ්ඩලයයි. සිය මෙහෙයුම් පරිචය ප්‍රසාරණය කරමින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවාවන් ලබාදීම මගින් ප්‍රාදේශීය සංවර්ධනයට දායක වීම සඳහා රට පුරා ප්‍රාදේශීය කාර්යාල 6ක් ද පිහිටුවා ඇත. ආර්ථික ප්‍රතිපත්ති උපදේශන පර්ෂදය, මූල්‍ය අංශ නියාමන හා අධීක්ෂණ පර්ෂදය, අවදානම් කළමනාකරණය හා අනුකූලතා පර්ෂදය සහ ශක්‍යතා ගොඩනැගීම් සහ සහයෝගීතා පර්ෂදය යන පර්ෂදය 4ට වර්ගීකරණය කර ඇති දෙපාර්තමේන්තු 29ක් මගින් ඉහත සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කෙරේ. ශ්‍රී ලංකා ආර්ථිකයේ තිරසාර වර්ධනය සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව කැපවී සිටින අතර වැඩි පරාසයක් පුරා විහිදුනු, ශක්තිමත් මූල්‍ය අංශයක් ගොඩනැංවීම මගින් ආර්ථිකය නිසි ලෙස පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතාවන් ප්‍රධාන වශයෙන් ඉවහල් වී ඇත.

## මහ බැංකුවේ තීරණ ගැනීමේ පදනම ලෙස ආයතනික යහපාලනයේ මෙහෙවර

ශ්‍රී ලංකා මහ බැංකුව සිය ව්‍යවස්ථාපිත බලතල ආයතනික ප්‍රතිපත්තීන්ට අනුකූලව, ස්වාධීන රාමුවක් තුළ ක්‍රියාත්මක කරන අතරම මුදල් හා මූල්‍ය අංශ ස්ථායිතාව ආරක්ෂා වන අයුරින් සිය අභ්‍යන්තර මෙහෙයුම් පද්ධතිය සහ පරිපාලන ව්‍යුහය සකස් කර ඇත. මුදල් ප්‍රතිපත්තිය සහ මූල්‍ය අංශ ස්ථායිතාව තහවුරු කිරීමේ සිය මූලික කාර්යභාරය පෙරදැරිව කටයුතු කරන මහ බැංකුව මේ සඳහා අවැසි විශේෂඥ දැනුම, හැකියාව සහ නිපුණත්වය සහතික කිරීමට ගුණාත්මකභාවයෙන් ඉහළ බඳවා ගැනීමේ සහ පුහුණු කිරීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරයි. ශ්‍රී ලංකා මහ බැංකුව සිය තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී විනිවිදභාවය, විශ්වසනීයත්වය සහ ඒකාග්‍රතාව ප්‍රධාන මූලධර්මයන් වශයෙන් යොදා ගනී. තම කාර්යභාරයන් ඉටු කිරීමේ දී සැමවිටම සිය ස්වාධීනත්වය අවධාරණය කරන මහ බැංකුව, සාර්ථක සාර්ව ආර්ථික ප්‍රතිපත්තිවලට එළැඹීම උදෙසා මුදල් ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය අතර කාර්යක්ෂම හා ඵලදායී සම්බන්ධීකරණයක් සිදු කරයි. සිය ආයතනය කෙරෙහි මහජන විශ්වාසය දිගටම පවත්වාගැනීමටත්, මහජන සම්බන්ධතා වර්ධනය කරගැනීමටත් ශ්‍රී ලංකා මහ බැංකුව තොරතුරු දැනගැනීමේ අයිතියට ප්‍රමුඛත්වයක් ලබාදී ඇත. රාජකාරී කටයුතුවල කාර්යක්ෂමතාව වර්ධනය කරගනිමින් කාර්යක්ෂම හා ඵලදායී ලෙස සිය සේවාවන් සියලු පාර්ශ්වකරුවන් වෙත ලබා දීම සඳහා වාර්ෂිකව සංවිධානය කෙරෙන උපායමාර්ගික ක්‍රියාකාරකම් තුළින් මූලික අවධානයක් යොමු කෙරේ.

## ශ්‍රී ලංකාවේ දියුණුව සහ සංවර්ධනය සමග බැඳී පවතින මහ බැංකු ඉතිහාසය

1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව ස්ථාපනය වූ අතර, එහි මෙහෙයුම් කටයුතු ආරම්භ වූයේ 1950 වර්ෂයේ දීය.

මහ බැංකුවට අදාළ සැලැස්ම එහි සමාරම්භක අධිපතිවරයා වන ජෝන් එක්ස්ටර් මහතා සකස් කළ අතර ඔහු එක්සත් ජනපද සංචිත බැංකුවේ සේවය කළකීර්තිමත් අර්ථශාස්ත්‍රඥයකු විය. එක්ස්ටර් මහතා 1949නොවැම්බර් මස මහ බැංකුවක් පිහිටුවීම සඳහා අවශ්‍ය තාර්කික හා නෛතික රාමුව පිළිබඳ වූ මෙම සැලැස්ම කෙටුම්පතක් ලෙස ලංකාණ්ඩුවට ඉදිරිපත් කළ අතර මෙය 1949 නොවැම්බර් 25වැනිදා 1949අංක 58දරන මුදල් නීති පනත වශයෙන් ලංකාණ්ඩුව විසින් සම්මත කර ඇත. මෙම පනත සම්මත වීම ශ්‍රී ලංකා මහ බැංකුවේ ආරම්භයත්, ව්‍යවහාර මුදල් මණ්ඩලයේ නිමාවත් සනිටුහන් කළේ ය. ශ්‍රී ලංකා මහ බැංකුව 1950 අගෝස්තු 28 වැනිදා සිය මෙහෙයුම් කටයුතු ආරම්භ කළේ ය.

**ශ්‍රී ලංකා මහ බැංකුවේ දැක්ම**

**"ශ්‍රී ලංකාවේ සෞභාග්‍යය සඳහා වන විශ්වසනීය සහ ගතික මහ බැංකුවක් "**

**ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙවර**

**"ප්‍රතිපත්තිමය ප්‍රෝත්සාහයන්, උපදෙස්, කැපවීම සහ විශිෂ්ටත්වය තුළින් තිරසාර වර්ධනයක් ලබා ගැනීම සඳහා පිටුබලයක් වීමට ආර්ථික සහ මිල ස්ථායිතාවත් මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවත් පවත්වා ගැනීම"**

ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී තිබූ බලතල පසුකාලීනව ඇතිවූ වේගවත් ආර්ථික හා මූල්‍ය අංශ වෙනස්වීම් සහ තාක්ෂණික දියුණුව හමුවේ පරිවර්තනයන් ට ලක් වී තිබේ. මේ අනුව, රටේ මුදල් සම්බන්ධ ප්‍රමුඛතම බලාධිකාරිය වශයෙන් නව ලොවක් හමුවේ සිය අරමුණු හා කාර්යභාරයන් වඩාත් හොඳින් හඳුනාගනිමින් වඩාත් සක්‍රිය ලෙස සිය කාර්යයන් සඳහා උපයෝගී කරගැනීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කර ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව වැනි බහුවිධ ජාත්‍යන්තර මූල්‍ය ආයතන දේශීය වශයෙන් සම්බන්ධීකරණය කරන ප්‍රධාන ආයතනය ලෙස කටයුතු කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව ජාත්‍යන්තර සබඳතා පවත්වා ගන්නා අතරම අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනය (සියැසන්) සහ දකුණු ආසියාතික සහයෝගිතා සංගමයේ (සාක්) මූල්‍ය ජාලය වැනි කලාපීය ආයතන සමග සක්‍රියව සම්බන්ධ වෙමින් නිතර වෙනස්වන සමාජ ආර්ථික තත්ත්වයන් ට මුහුණ දීම සඳහා අදහස් ලබාදෙමින් රටේ ආර්ථික ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට ඉමහත් දායකත්වයක් ලබාදීමට ආරම්භයේ සිටම ශ්‍රී ලංකා මහ බැංකුව සමත් වී ඇත. අලුතින් පැන නැගියහැකි දේශීය හා විදේශීය ප්‍රවණතාවන් ට මුහුණ දීම සඳහා නම්‍යශීලී ප්‍රතිපත්ති අනුගමනය කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව නිරතුරුව අවධාරණය කරන කටයුත්තකි. මහ බැංකුව සිය දශක හතක දිගු ගමන පුරා අධිපතිවරු 15 දෙනෙකු ගේ නායකත්වය යටතේ ක්‍රියාත්මක වූ ආයතනයකි. සිවිල් යුද තත්ත්වයන්, ස්වාභාවික විපත් සහ විවිධ දේශපාලන අස්ථාවර වීම්වලට ද මුහුණ දෙන අතරතුර ගෝලීය මූල්‍ය හා ආර්ථික අභියෝග මැදින් ආර්ථිකය හැසිරවූ මහ බැංකුව දශක හතක කාලයක් තුල විවිධ ජයග්‍රහණයන් රාශියක් අත්පත් කරගැනීමට සමත් වී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ සැවොම එක්වී ආ මේ ගමනේ දී, ඉදිරියට ඇතිවිය හැකි අර්බුදකාරී අවිනිශ්චිතතාවන් ට හොඳින් මුහුණ දිය හැකි අද්විතීය වූ, ශක්තිමත්, ස්ථාවර ආයතනයක් ගොඩ නැගීමට හැකි වී ඇත. මේ අනුව, ශ්‍රී ලංකාව සංවර්ධනය කරා මෙහෙයවන ගමනේ සමාජ ආර්ථික සංවර්ධන උපායමාර්ගික සහකරුවකු ලෙස කටයුතු කරමින්, අර්බුදකාරී තත්ත්වයන් ට සාර්ථකව මුහුණ දෙමින් ශ්‍රී ලංකාව සෞභාග්‍යය කරා යොමු කිරීමේ හැකියාව මහ බැංකුව සතුව පවතී.

## ශ්‍රී ලංකා මහ බැංකුවේ 70 වසරක මතකසටහන්

පසුගිය වසර 70ක කාලයක් මහ බැංකුව සාර්ථක ව සිය කාර්යභාර්ය ඉටු කරමින් වැදගත් සංධිස්ථාන රැසක් පසු කර ඇති අතර ඉන් සමහරක සාරාංශය පහත දැක්වේ:

### මිල හා ආර්ථික ස්ථායිතා පර්ෂදය

1950: මහ බැංකුව ස්ථාපනය කිරීමට පෙර පැවති ව්‍යවහාර මුදල් මණ්ඩලය වෙනුවට ස්ථාවර විදේශ විනිමය අනුපාත ක්‍රමය හඳුන්වා දීම

1965: ගෙවුම් ශේෂ තුළනයට උපකාරී වීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ප්‍රථම වතාවට එක් අවුරුදු නිත්‍ය ණය පහසුකමක් ලබාදීම

1966: ආසියානු පැසිෆික් කලාපයේ මහ බැංකු සඳහා පර්ය ෂණ හා ඉගෙනීම් කටයුතුවල කේන්ද්‍රස්ථානය වශයෙන් ක්‍රියාත්මක වන අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනයේ (සියැසන්) ආරම්භක සාමාජිකයකු ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව පත්වීම

1968: ද්විත්ව විදේශ විනිමය අනුපාත සහිත "විදේශ විනිමය හිමිකම් සහතිකය" නමින් බහුවිධ විදේශ විනිමය අනුපාතය ක්‍රමයක් හඳුන්වා දීම

1971: නව්‍ය පර්යේෂණ දිරිමත් කිරීම අරබයා සයමසකටවරක් නිකුත් කෙරෙන ශාස්ත්‍රීය ලිපි ඇතුළත් "මාණ්ඩලික පත්‍රිකා" ප්‍රකාශනය හඳුන්වා දීම

1977: පාවෙන පාලිතවිදේශ විනිමය අනුපාත ක්‍රමය හඳුන්වා දීම

1982: මුදල් ඉලක්කගත මුදල් ප්‍රතිපත්ති රාමුවක් සහිත මූල්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම ඇරඹීම

1998: ආරම්භක සාමාජිකයකු වශයෙන් දකුණු ආසියාතික සහයෝගීතා සංගමයේ (සාක්) මහ බැංකු අධිපතිවරුන්ගේ මූල්‍ය ජාලයට හා මූල්‍ය ලේකම්වරුන්ගේ ජාලයට ශ්‍රී ලංකා මහ බැංකුව එක්වීම

1998: මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී ප්‍රතිපත්ති පොලී අනුපාත කොරිඩෝවක් හඳුන්වා දීම

2001: පාවෙන නිදහස් විදේශ විනිමය අනුපාත ක්‍රමය හඳුන්වා දීම

2001: මුදල් ප්‍රතිපත්ති විශ්ලේෂණය ශක්තිමත් කිරීමට සහ තීරණ ගැනීමේ විනිවිදභාවය අරමුණු කරගනිමින් මුදල් ප්‍රතිපත්ති කමිටුවක් ස්ථාපනය කිරීම

2002: මහ බැංකුව ආරම්භයේදී පැවති බහුවිධ අරමුණු කේන්ද්‍රගත කිරීම සඳහා ආර්ථික හා මිල ස්ථායිතාවය සහ මූල්‍ය පද්ධති ස්ථායිතාවය යනුවෙන් අරමුණු ද්විත්වයක් හඳුන්වාදීම

2003: සක්‍රියව වෙළෙඳපොල ද්‍රවශීලතාවය කලමනාකරණය කිරීම තුළින් මුදල් ඉලක්ක ඵලදායීව ළඟාකරගැනීම සඳහා සක්‍රිය විවට වෙළෙඳපොළ කටයුතු හඳුන්වාදීම

2007: ශ්‍රී ලංකා මහ බැංකුවේ මධ්‍යකාලීන පුළුල් අරමුණු විදහා දැක්වෙන වාර්ෂික උපායමාර්ගික සැලැස්ම නිවේදනය කිරීමේ ආරම්භය

2007: මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා බාහිර ඇල්මැති පාර්ශ්වයන්ගේ අදහස් ලබාගැනීමට මුදල් ප්‍රතිපත්ති උපදේශක කමිටුව ස්ථාපනය කිරීම

2008: සමකාලීන සාර්ව ආර්ථික ප්‍රතිපත්තිමය ගැටලු අධ්‍යයනය කිරීමට න්‍යායාත්මක හා ආනුභවික පර්ය ෂණ දිරිමත් කිරීම උදෙසා වාර්ෂික ජාත්‍යන්තර පර්ය ෂණ සමුළුවක් ආරම්භ කිරීම

2015:මුදල් ඉලක්කගත හා උද්ධමන ඉලක්කගත මුදල් ප්‍රතිපත්ති ද්විත්වයෙහි ම ලක්ෂණ ඇතුළත් වැඩිදියුණු කළ මුදල් ප්‍රතිපත්ති රාමුවක් හරහා මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

2016: 1965 වර්ෂයේ ප්‍රථම වතාවට මෙම ණය පහසුකම ලබාදීමෙන් අනතුරුව දහසයවැනි වතාවට විස්තීර්ණ ණය පහසුකමක් වසර තුනක කාලයක් සඳහා ගෙවුම් ශේෂ තුළනයට උපකාරී වීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ලබාදීම

2019:උද්ධමන ඉලක්කගත මුදල් ප්‍රතිපත්ති රාමුවක් ඔස්සේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ඇරඹීම

### මූල්‍ය පද්ධති ස්ථායිතා පර්ෂදය

1964: ප්‍රමුඛතාවය ලැබිය යුතු අංශ වෙත මූල්‍ය සහන සැපයීම සඳහා මධ්‍ය හා දිගුකාලීන ණය අරමුදලක් ස්ථාපනය කිරීම

1974: ශ්‍රී ලංකා මහ බැංකුව තුල සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුව නමින් නව දෙපාර්තමේන්තුවක් ස්ථාපනය වීම

1978: සුළු පරිමාණ ව්‍යාපාරිකයන්ට උපකාරීවීම සඳහා ණය ඇප ආවරණ යෝජනා ක්‍රමවේදයක් ආරම්භ කිරීම

1979: 1979 අංක 27 දරන මූල්‍ය සමාගම් පාලන පනත

1979: නිදහස් වෙළෙඳ කලාප සංවර්ධනය කිරීමට සහ ශ්‍රී ලංකාව අක්වෙරළ මූල්‍ය මධ්‍යස්ථානයක් වශයෙන් සංවර්ධනය කිරීමට අක්වෙරළ බැංකු ඒකක ස්ථාපනය කිරීමේ අවසරය සියලු බැංකු වෙත ලබා දීම

1985: නොවැම්බරයේ ස්වයංකෘත නිෂ්කාශණාගාරය ස්ථාපනය කිරීම

1988: 1988 අංක 30 දරන බැංකු පනත

2008: බාසල් II නියාමන රාමුව යොදා ගැනීම හරහා බැංකුවල අවදානම් කළමනාකරණය කිරීමේ පද්ධතිය ශක්තිමත් කිරීම

2010: ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම

2010: මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට ශ්‍රී ලංකා රේගුව සමග ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම

2011: 2011 අංක 42 මුදල් ව්‍යාපාර පනත හඳුන්වා දීම


2014: මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ වැඩසටහනක් හඳුන්වා දීම

2019: මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් ශ්‍රී ලංකාව අළු ලේඛනයෙන් ඉවත් කිරීම

### වෙනත්

1957: සම්බුද්ධ පරිනිර්වාණය සිදුවී වසර 2500ක් ගතවීම සමරනු වස් ශ්‍රී ලංකාවේ ප්‍රථම සමරු කාසිය නිකුත් කිරීම

1974: ආසියානු නිෂ්කාශන සංගමයේ සාමාජිකත්වය ලබා ගැනීම




2000: නවීන, කාර්යක්ෂම මහ බැංකුවක් නිර්මාණය කිරීම සඳහා නව්‍යකරණ ව්‍යාපෘතියක් ඇරඹීම

2001: ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ප්‍රථම වරට නිකුත් කිරීම

2003: තත්කාලීන දළ පියවීම් පද්ධතිය ක්‍රියාත්මක කිරීම

2004: රජයේ සුරැකුම්පත් සඳහා නිර්ලේඛන සුරැකුම්පත් හා මධ්‍යම තැන්පතු ක්‍රමය ක්‍රියාත්මක කිරීම

2006: ජාතික ගෙවීම් කවුන්සිලයෙහි ආරම්භක වැඩපිළිවෙළ සැකසීම

2006: විදේශිකයන් වෙත රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ විවෘත කිරීම

2007: ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීමේ ආරම්භක වැඩපිළිවෙළ සැකසීම

2010:විදේශ විනිමය රෙගුලාසි ලිහිල් කිරීම

2013: පොදු ස්වයංකෘත ටෙලර් යන්ත්‍ර ස්විචය හඳුන්වා දීම

2020: දත්තවලට අදාළ කටයුතුවල දී වැඩිදියුණු වූ තාක්ෂණික ක්‍රම යොදා ගැනීම සහ"ඩිජිටල්කරණය සඳහා වූ වසරක්" යන සංකල්පය හඳුන්වා දීම

LAKE HOUSE

**දැන්වීම් අතිරේක අංශය**

සම්බන්ධීකරණය -

**ශාන්ති රණසිංහ, එරන්ද එදිරිමාන්න**

## මහ බැංකු අධිපතිතුමාගේ පණිවුඩය... 12 පිටුවෙන්

අප 70 වැනි සංවත්සරය සනිටුහන් කරන මෙම වසරේ ශ්‍රී ලංකා ආර්ථිකය, ලෝකයේ අනෙකුත් සියලුම රටවල් මෙන්ම, කොවිඩ්-19 වසංගතයේ අහිතකර බලපෑම් මගහරවා ගැනීමේ අභියෝගයට මුහුණ දී සිටී. මෙහි දී මහ බැංකුව තමන් වෙත පැවරී ඇති වගකීම ඇතුළත, ව්‍යාපාර හා කුටුම්භ කෙරෙහි ඇති වූ ආර්ථික හා මූල්‍ය බලපෑම් අවම කිරීම සඳහා පූර්වෝපායික ලෙස දායක වෙමින් සිටියි.මෙවැනි අභියෝගාත්මක අවස්ථාවන්හි ආර්ථිකය මෙහෙයවා ඇති ආකාරය, රටේ ප්‍රමුඛතම මූල්‍ය ආයතනය සහ මූල්‍ය නියාමකයා ලෙස, මහ බැංකුවේ ශක්තියත්, වෙනස්කම්වලට අනුගත වීමේ හැකියාව සහ ඔරොත්තු දීමේ හැකියාවත් අභියෝගයන්හි නොසැලෙන ලක්ෂණයත් පෙන්නුම් කරලයි.

අවසන් වශයෙන්, සියලු පාර්ශ්වකරුවන්ට කෘතවේදී වෙමින් සඳහන් කළ යුත්තේ, රාජ්‍ය ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ඉතා අභියෝගාත්මක සමාජ-ආර්ථික තත්ත්වයන් යටතේ මහජනතාව තුළ පැහැදීම හා විශ්වාසය පවත්වා ගැනීමට සමත් වී ඇති බවයි. මහ බැංකුව, ආරම්භයේ සිට ම මහජන සුභ සිද්ධිය ප්‍රවර්ධනය කිරීමට උත්සාහ දරා ඇත. ගෙවී ගිය වසර 70 තුළ විකාශනය වූ ක්‍රියාවලියක් හරහා ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රමයෙන් නවීන මහ බැංකුවක් බවට පත් ව ඇත. එය උද්ධමන අපේක්ෂා මනා ලෙස පාලනය කරගනිමින් ආර්ථික හා මිල ස්ථායීතාව සාර්ථක ලෙස පවත්වාගෙන ගොස් ඇත.

එල්ලවන අභියෝග හමුවේ ඒවාට ඔරොත්තු දීමේ හැකියාව මූල්‍ය පද්ධතියට ඇත. මෙම අංශ දෙකෙහි ස්ථායීතාව සහතික වීම හරහා සර්ව සහභාගිත්වයක් සහිත හා තිරසාර සංවර්ධනය යන අපේක්ෂිත ජාතික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විශ්වාසයෙන් යුතුව කටයුතු කිරීමට රටේ ආර්ථිකයට හැකියාව ලැබේ. අයවැය හිඟය සහ විදේශීය ජංගම ගිණුමේ හිඟය යන ද්විත්ව හිඟය වැනි ශ්‍රී ලාංකික ආර්ථිකයේ දිගු කාලීන ව්‍යුහමය ගැටලු නිවැරදි කර ගැනීම සඳහා සහාය දැක්වීමට මහ බැංකුව කැප වී සිටියි. ශීඝ්‍ර ප්‍රාග්ධන ආයෝජනය සහ තාක්ෂණික නවීකරණය තුළින් දේශීය නිෂ්පාදන ධාරිතාව සහ එහි ඵලදායීතාව ඉහළ නැංවිය යුතුව ඇත.

මෙකී ප්‍රතිසංස්කරණ අතිගරු ජනාධිපතිතුමාගේ "රට හදන සෞභාග්‍යයේ දැක්ම" යන ජාතික ප්‍රතිපත්ති රාමුවට ඇතුළුව තිබීම දිරිගන්වන සුළුය. කාලෝචිත හා පූර්වෝපායික ක්‍රියාමාර්ග හරහා, ඉදිරි කාලය තුළ දී අපේක්ෂිත ජාතික අරමුණු සාක්ෂාත් කර ගැනීමඅරමුණු කොට ඊළග ඉහළ තලයට පා තැබීමට ශ්‍රී ලංකාවට හැකි වනු ඇත.

එම ගමනේ දී, ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සම්පත් ප්‍රවර්ධනය කිරීම සහ සමස්ත සමාජ සුභ සිද්ධිය නංවාලීම අරමුණු කර ගනිමින්, රටේ ආර්ථික හා මිල ස්ථායීතාව සහතික කිරීමට මහ බැංකුව අඛණ්ඩව කැප වී සිටියි.

දේශමාන්‍ය, මහාචාර්ය
ඩබ්. ඩී ලක්ෂ්මන්




වර්ෂ 2020 ක්වූ අගෝස්තු මස 30 වැනිද ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.



# අපි එජාපය ආක්‍රමණය කරනවා

## සමගි ජන බලවේගයේ ජාතික සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී තිස්ස අත්තනායක

● ජයසූරිය උඩුකුඹුර

**මැතිවරණයෙන් අන්ත පරාජයක් ලැබූ එජාපය මේ වන විට අර්බුද රැසකට මුහුණ දී සිටිනවා. මේ තත්වය හිටපු මහ ලේකම් විදියට ඔබ දකින්නෙ කොහොමද?**

ඇත්තටම ඉතාම කනගාටුදායක තත්වයක්. මෙරටේ තිබුණු දැවැන්ත දේශපාලන විපක්ෂය අද පත්ව ඇති තත්වය ඉතාම කනගාටුදායකයි. රනිල් වික්‍රමසිංහ එජාප නායකත්වය අතහැරලා සජිත් ප්‍රේමදාස මහතාට පක්ෂය බාර දුන්නා නම් එහෙම වෙන්නෙ නෑ. ජනතාවත් මැතිවරණයේදී ලබා දී තිබෙන්නේ ඒ පණිවිඩයමයි. ඒක නොසලකා ආත්මාර්ථකාමීව කටයුතු කිරීමෙන් එජාප පාක්ෂිකයින් ගම්වල හුදෙකලා වී සිටිනවා. බහුතරයක් මේ වන විටත් සමගි ජන බලවේගයට එකතුව සිටියත් තවමත් සමහර පාක්ෂිකයෝ එජාපය නැවත ගොඩ එයි කියල බලාගෙන ඉන්නවා.

**දැන් සිදුවන දේවල් කොළේ වහලා සිදුවන දේවල් කියලයි කියන්නේ. ඔබලත් දැනුවත්ව රජයට එරෙහි දැවැන්ත බලවේගයක් හදන උපක්‍රමයක් ද මේ ක්‍රියාත්මක වෙන්නෙ?**

එජාපයට හා සමගිජන බලවේගයට එකට වැඩ කළ හැකි නම් ඔබ කියන ආකාරයට රජයට එරෙහි පුළුල් ජනබලයක් හදන්න පුළුවන්. මොකද රජයත් මේ වන විට ජනතා අප්‍රසාදයට ලක්වෙමින් තිබෙන්නෙ. අපිත් විමසිල්ලෙන් රජයේ කටයුතු දෙස බලාගෙනයි ඉන්නෙ. අපි සමගිජන බලවේගය ශක්තිය වැඩි කරගෙන විරුද්ධ පක්ෂයේ සියලු පක්ෂ සමඟ එක්ව රජය කරන ජනතා විරෝධි කටයුතුවලට එරෙහි පුළුල් ජනබලයක් ගොඩනඟමින් ඉන්න බව සැබෑවක්. සමගිජන බලවේගය හා එක්වීමට කිසිම බාධාවක් නෑ. එජාප නායකත්වය සජිත් ප්‍රේමදාසට බාර දීලා දෙපාර්ශ්වයට එක්ව එකට වැඩ කරන්න පුළුවන්.

**එජාපයත් සමගිජන බලවේගයත් රෝ සංවිධානයේ න්‍යාය පත්‍රයට අනුව රජය අර්බුදයකට යොමු කිරීමේ කුමන්ත්‍රණයකට හවුල් බවට චෝදනා එල්ල වෙනවා නේද?**

ඔය කියන කාරණය ගැන නම් මම කිසිම දෙයක් දන්නෙ නෑ. එජාපය කිසි කලෙක ඔවැනි සංවිධාන සමඟ සබඳතා පැවැත්වූවාද කියල මට නම් විශ්වාස කරන්න බෑ. මෙරටේ වෙනත් දේශපාලන පක්ෂ එවැනි සබඳතා පවත්වන බවට පසුගිය කාලේ කථාබහ පැතිර ගියා.

*** කරු ජයසූරිය එජාප නායකත්වය අපේක්ෂා කළත් එය ප්‍රතික්ෂේප වී තිබෙන පසුබිමක සජිත් කරුට සමගිජන බලවේගයට ආරාධනා කරන්නේ එජාපය ආක්‍රමණය කරන්නද?**

ඔව්. අපේ අරමුණ එජාපය ආක්‍රමණය කරලා එය සමගිජන බලවේගයට සම්බන්ධ කර ගැනීමයි. මොකද එජාපය කෘත්‍යාධිකාරි මණ්ඩලයේදී යෝජනා ස්ථිර කරගෙන බිහිවූ සමගිජන බලවේගය එජාපයෙන් නෙරපීම යුක්ති සහගත නෑ. ඒ නිසා අපි නිරතුරුවම උත්සහ කරන්නේ එජාපය එකතු කර ගැනීමටයි.

**මෙරටේ, ක්‍රියාත්මක වන පුද්ගල කේන්ද්‍රීය දේශපාලනය අතහැර ප්‍රතිපත්තිමය දේශපාලන ක්‍රියාදාමයක් සඳහා ඔබලා කැප නොවන්නේ ඇයි?**

ඔබ කියන කාරණය පැහැදිලියි. මෙරටේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකටම ජනතාව ඡන්දය දෙන්නෙ පුද්ගල කේන්ද්‍රීය දේශපාලනය නිසයි. පොහොට්ටුවට ඡන්දය දුන්නෙ මහින්ද රාජපක්ෂ චරිතය නිසයි. සමගිජන බලවේගයට ඡන්දය දුන්නෙ සජිත් ප්‍රේමදාස චරිතය නිසයි. මේක තමයි ඇත්ත. නමුත් ඔබ සඳහන් කරන ආකාරයට ප්‍රතිපත්ති කේන්ද්‍රීය දේශපාලනයක් සඳහා ජනතාව පෙළ ගැස්විය යුතුයි. නමුත් මේ පවතින ක්‍රමය අනුව ඒක කරන්න කොතරම් කාලයක් අවශ්‍ය වේදැයි අනුමාන කරන්නත් අමාරුයි.

**ඔබත් එජාප මහලේකම් තනතුර දරමින් පක්ෂය මාරු කළා. ඊට හේතුවත් පෞද්ගලික කාරණයක්. ඒ ආකාරයට ඔබ වැනි උගත් අත්දැකීම් සහිත දේශපාලනඥයන්ගේ හැසිරීම අංකුර දේශපාලනඥයන්ට ලබා දෙන ආදර්ශය කුමක්ද?**

ඇත්තම එදා ජනාධිපතිවරණයට එජාපයෙන් ජය ගත හැකි අයෙකු ඉදිරිපත් කරන්නට අපි ගත් ක්‍රියාමාර්ගය ගැන අදත් ජනතාව ප්‍රසාදයෙන් කතා කරනවා. පක්ෂය බෙද භින්න වෙලා තිබුණ විදියට එදා රනිල් සජිත් එකම වේදිකාවකට නංවා ගන්න නොහැකිව තිබියදී අපි කැපවෙලා ඒ අය සමගි කළා. එදා උල්ලංඝනය වුණේ පක්ෂයේ ප්‍රතිපත්තියක්. ඒකට එරෙහි වුණේ මම පක්ෂයේ මහලේකම්වරයා විදියටයි. ඒක ගැන අමනාප වූ අන්තවාදී කණ්ඩායම් මට එදා එරෙහි වුණා. ඒ අනුවයි මම දේශපාලන තීන්දුවක් ගත්තේ. 2015දි මම කිව්ව දේවල් අදටත් වලංගුයි.

**ඔබ වැනි උගතුනුත් පුද්ගල කේන්ද්‍රීය දේශපාලනය සඳහා පක්ෂ දේශපාලනයේ හිඟ වී සිටිනවා නම් ප්‍රතිපත්ති දේශපාලනය ක්‍රියාවට නංවන්න පුළුවන්ද?**

මම ඔබේ කතාවට සියයට සීයක්ම එකඟයි. ප්‍රතිපත්ති දේශපාලනය අපේ රටට අත්‍යවශ්‍යයයි. අසල්වැසි ඉන්දියාවත් ප්‍රතිපත්ති දේශපාලනය අනුව තමයි වැඩසටහන් සංවිධානය කරන්නෙ. ලෝකයේ හුගක් රටවල් ජාතික ප්‍රතිපත්ති හදලා ඒ අනුව තමයි කටයුතු කරන්නෙ. කවුරු බලයට පත් වුණත් ඒ ප්‍රතිපත්ති වෙනස් වෙන්නෙ නෑ, අපේ රටේ ඇමැතිවරු මාරු වුණාමත් ඒ අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති වැඩසටහන් වෙනස් වෙනවා. සමහරවිට ඇමැතිගේ කාමරයේ පුටුව මේසය පවා වෙනස් වෙනවා. මේක කනගාටුදායකයි. එහෙම නැතුව රට හදන්න බෑ. සෑම පක්ෂයකටම ප්‍රතිපත්ති මත පදනම් වූ වැඩපිළිවෙළක් අවශ්‍යයයි. ලංකාවේ එවැනි තත්වයක් නෑ. තුනෙන් දෙකේ බලයක් සහිත වත්මන් ආණ්ඩුවට ඒ ජනතාවාදී ප්‍රතිපත්ති වැඩපිළිවෙළක් හදන්න පුළුවන්. රට වෙනුවෙන් රටට ගැළපෙන ප්‍රතිපත්ති හදනවා නම් අපි සහය දෙනවා. පෞද්ගලික න්‍යාය පත්‍ර අනුව කටයුතු කරනවා නම් අපිට ඊට එරෙහි වෙන්න සිද්ධ වෙනවා.

**මේ දක්වා පාර්ලිමේන්තුවේදී සමගිජන බලවේගය ප්‍රධාන විරුද්ධ පක්ෂය විදියට කථානායක පත් කිරීමේදී හා රාජාසන කථාව අනුමත කිරීමේදී රජයට සහය දී තිබෙනවා. ඉදිරියටත් මේ ආකාරයෙන් කටයුතු කරනවාද?**

### 2015 දි මම කිව්ව ඒවා අදටත් වලංගුයි

### හැමදේකටම විරුද්ධයි කියන මතයේ අපි නැහැ

### විග්නේශ්වරම් ගේ ප්‍රකාශය පිළිබඳ රජය ලිහිල්ව කටයුතු කිරීම අපට පුදුමයි

අපි කිසිවිටකත් රටට හිතකර කිසිම දේකට එරෙහි වෙන්නෙ නෑ. ජනාධිපතිවරයා රාජාසන කථාවේ ඉදිරිපත් කළ වැඩපිළිවෙළ ප්‍රායෝගිකව දකින්න අපි බලාගෙන ඉන්නවා. කියන දේ නොකර නොකියපු දේවල් කරලා පෞද්ගලික අරමුණු ඉටුකර ගන්න අපට ඉඩ දී බලාගෙන ඉන්න බෑ. හරි දේ කළොත් අපි හැමදාම ඒවාට සහය දෙනවා. වැරදි දේ කළොත් ඒවාට විරුද්ධ වෙනවා.

**පාර්ලිමේන්තු පළමු සැසියේදීම විග්නේශ්වරම් මන්ත්‍රීවරයා ජාතිවාදය අවුළුවන්න උත්සහ කළා. ඒක සම්බන්ධයෙන් සමගිජන බලවේගයේ ස්ථාවරය කුමක්ද?**

අපි දැනටමත් අපේ ස්ථාවරය ප්‍රකාශ කරලා තියෙනවා. අපේ ස්ථාවරය තමයි නැවත මේ රට තුළ ජාතිවාදි ආගම්වාදි අදහස් ප්‍රකාශ කරලා රට අර්බුදවලට තල්ලු කරන්න ඉඩ දෙන්න බෑ. වසර තිහක යුද්ධයක අත්දැකීම් අපිට තියෙනවා. ඒ ඇතිවූ වේදනා සිත් රිදීම් තවම පහවෙලා නෑ. එවැනි පසුබිමක අපි කරන ප්‍රකාශ ගැන සැලකිලිමත්ව නැවත වර්ගවාදී ගැටුම්වලට උඩගෙඩි දෙන ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින්න ඕනේ. අපි අපේ ස්ථාවරය අපේ මන්ත්‍රීවරුන් හරහා ප්‍රකාශ කරලා තිබෙනවා.

ජාතික හා දේශප්‍රේමය ගැන වැඩිපුර කථා කරන ආණ්ඩුව විග්නේෂ්වරම් ගේ ප්‍රකාශය ගැන ලිහිල්ව කටයුතු කරන එක ගැන අපි අද පුදුම වෙනවා.

**පාර්ලිමේන්තු මාර්ගය උත්සව මාර්ගයක් වූ අවස්ථාවක මාර්ග නීති අදාළ වෙන්නෙ නෑ. සමගිජන බලවේගයේ මන්ත්‍රීවරුන්ට මේ සාමාන්‍ය දැනීම පවා නොමැතිව ජනතාව නොමඟ යවන්න උත්සහ කිරීම ගැන ඔබ මොනවද හිතන්නෙඝ**

ඇත්තටම අපි ප්‍රවේශම් විය යුතුයි. මම පුද්ගලයෙක් ගැන විවේචනය කරන්න හෝ අඩුපාඩු කථා කරන්න කැමති නෑ. අපි පාර්ලිමේන්තුවේදී ඉටු කළ යුතු කාරණා මොනවද කියල තේරුම් ගන්න ඕනේ. පාර්ලිමේන්තුවේදී අපිට පැවරෙන ප්‍රධාන කාරණා දෙකක් තියෙනවා. එකක් තමයි ජනතාව වෙනුවෙන් නීති සම්පාදනය කිරීම. අනෙක් කාරණය තමයි ජනතාවගෙන් එකතු කරන බදු මුදල හරියට භාවිතා කිරීම. මේ මූලික කරුණු ගැන අවධානය යොමු නොකර අවැදගත් කාරණා ගැන වාද විවාද කරමින් පාර්ලිමේන්තුව තුළ කලහකාරි ලෙස හැසිරීම ජනතාව අපෙන් අපේක්ෂා කරන්නෙ නෑ. අපි මේ අඩුපාඩු හදා ගන්න ඕනේ. පසුගිය කාලේ පාර්ලිමේන්තුව තුළ මන්ත්‍රීවරුන්ගේ හැසිරීම නිසා ජනතාව පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ප්‍රතික්ෂේප කරන තත්වයට පත්වුණා.

වරදක් වුණා කියල ඔවුන් සදාකාලිකව ඉවත් කරන්න හොඳ නෑ. වැරදි හදාගෙන ඉදිරියට ගන්න ඕනේ. හරින් ප්‍රනාන්දු අපේ මන්ත්‍රීවරයා අගරදගුරු සම්බන්ධ කරගෙන කරපු ප්‍රකාශය ආන්දෝලනයට ලක්වුණා. පක්ෂයේ නායකයා විදියට සජිත් ප්‍රේමදාස හරින් සමඟ අගරදගුරු හිමියන් හමුවේ සමාව ගත්තා. එහෙම වැරදි නිවැරැදි කරගෙන යන අයට ජනතා ප්‍රසාදය හිමි වෙනවා. වරදක් වුණාම ඒක "හෝද හෝදා මඩේ දාන්න" හොඳ නෑ.

**සාම්ප්‍රදායික විපක්ෂයේ කාර්යභාරය වෙනුවට අලුත් පක්ෂයක් විදියට පාර්ලිමේන්තුවේ විපක්ෂය නියෝජනය කරන සමගිජන බලවේගය අලුතින් යමක් කරන්න හිතනවාද?**

ජනතාව ආණ්ඩුවේ විපක්ෂයේ අපි හැමෝම පාර්ලිමේන්තුවට පත්කරල එවා තිබෙන්නෙ රට වෙනුවෙන් කටයුතු කරන්නයි. මේ අනුව සාම්ප්‍රදායික විපක්ෂයක් ලෙස අපි ආණ්ඩුවේ හැමදේටම විරුද්ධ වෙන්න සූදානම් නෑ. ජනතාවාදි කටයුතුවලදී අපි ආණ්ඩුව සමඟ කටයුතු කරනවා. නමුත් 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය සම්බන්ධයෙන් ආණ්ඩුව කටයුතු කරන ආකාරය සම්බන්ධයෙන් අපි අවදියෙන් සිටින්නෙ. 19 වන සංශෝධනය ඉතා හොඳ රටට රටේ ප්‍රජාතන්ත්‍රවාදයට හිතකර බොහෝ දේවල් තිබෙනවා. ඒ කරුණු අහෝසි කරන්න අපි ඉඩ දෙන්නෙ නෑ. නමුත් හැමදේටම විරුද්ධ විය යුතුයි කියන මතයේ ඉඳගෙන අපි කටයුතු කරන්නෙ නෑ.



# ළමා ලෝකය සුනුවිසුනු කරන අපයෝජනවලට වැට බැඳෙයි

● රජිත බස්නායක

**අප කොතෙකුත් කතා කළද වර්තමානය වන විට අප රට තුළ සිදුවන ළමා අපයෝජන සාමාන්‍ය සිදුවීම් තරමටම ලඝු වී තිබීමක් දක්නට ලැබේ. සිදුවීම් බරපතළ වුවද ඒවා නිතර ඇසෙන පුවත් නිසා කෙනෙකුට එය සාමාන්‍ය පුවතක් ලෙසින් දක්නට ඇති ඉඩකඩද වැඩිය. මේ සම්බන්ධයෙන් කොතෙකුත් නීති රීති පනවා තිබුණද කෙසේ හෝ තම අභිමතාර්ථ මුදුන් පමුණුවා ගැනීමට ළමා අපයෝජකයන් සමත්ව තිබේ.**

ලෝකය තුළ සිදුවන ළමා අපයෝජන සම්බන්ධයෙන් අවධානය යොමු කළහොත් පෙනෙන්නට තිබෙන කරුණ වන්නේ වැඩිම ළමා අපයෝජන සිදුවන රට ලෙස ඉන්දියාව පළමු ස්ථානයේ රැඳී තිබෙන බවයි. එහි සෑම විනාඩි 15 කට වරක් ම දරුවකු ලිංගික අපයෝජනයට ලක්වන බව වාර්තා වේ. 2016 වසර අවසාන වන විට දරුවන් 36,202ක් අපයෝජනයට ලක්ව ඇති බව වාර්තා වේ. ශ්‍රී ලංකාව තුළ 2020 වසර වනවිට දරුවන් පන්දාහකට වැඩි ප්‍රමාණයක් අපයෝජනයට ලක්ව ඇති අතර පළමු දින 15 තුළ ළමා අපයෝජන සිදුවීම් පහළොවක් ම වාර්තා වී තිබේ.

කෙසේ වෙතත් ඉන්දියාවේ ජනගහනය හා සසඳා බැලීමේදී ලංකාව තුළ සිදු වන ළමා අපයෝජනයන් ප්‍රමාණය සාපේක්ෂව වැඩි බව පෙන්නුම් කරයි.

### ළමා අපයෝජන නඩු ප්‍රමාණය 851 දක්වා අඩු කරයි

2019 මැයි මාසයේ සිට පසුගිය මාස 18 ක කාලය තුළ නීතිපති දෙපාර්තමේන්තුවේ ළමා ආරක්ෂක ඒකකයට ළමා අපයෝජන සිද්ධීන් 12,968 ආසන්න සංඛ්‍යාවක් ලැබී තිබේ. නීතිපති දප්පුල ද ලිවේරා මහතා පවසන්නේ 12,000කට අධික ළමා අපයෝජන නඩු ප්‍රමාණය 851 දක්වා අඩු කරන්නට සමත්ව තිබෙන බවයි. එය අගය කළ යුත්තකි. එහිදී සැකකරුවන් සම්බන්ධයෙන් අධි චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා 6,149ක නඩු ප්‍රමාණයක් යොමු කර තිබෙන අතර සැකකාර පුද්ගලයන් 4,372 ප්‍රමාණයක්ද මේ වන විට නිදහස් කර ඇත. එමෙන්ම පොලිසියට මහේස්ත්‍රාත් අධිකරණයේ අවශ්‍ය නඩු පැවරීම සඳහා 2,447 උපදෙස් ලබාදී තිබේ .

කෙසේ වෙතත් කරුණු මෙසේ සිදුවෙමින් පවතින අවස්ථාවක වුවද බාල වයස්කාර පිරිමි දරුවකු අපයෝජනය කිරීමේ සිදුවීමක් සම්බන්ධයෙන් බස්නාහිර පළාතේ නර්තන ගුරුවරයකු අත්අඩංගුවට ගැනීමට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සමත්ව තිබේ.

2019 වසරේ දී වෙස් මංගලයක් පුහුණුවීම් කරන අතරවාරයේදී ආහාර ගෙන ඒමට බව පවසා දරුවා ඔහුගේ කාරයට නංවාගෙන ගොස් ලිංගික අතවර කර ඇති බව පරීක්ෂණවලදී හෙළි වී ඇති අතර එම අවස්ථාවේදී මත් ද්‍රව්‍ය මිශ්‍ර කර සිසිල් බීම බෝතලයක් පානය කිරීමටද සලස්වා තිබේ.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සිදු කරන ලද පරීක්ෂණවලදී හෙළිවූ තවත් කරුණක් වූයේ මීට පෙර අවස්ථා කිහිපයකදීද මොහු පිරිමි දරුවන් අපයෝජනයට ලක් කර ඇති බවයි. මෙම සිදුවීමට ප්‍රථම මෙකී ගුරුවරයා විදේශ සංචාරයකට සම්බන්ධ ව සිටියදීද සංචාරයට සහභාගී වූ බාලවයස්කාර පිරිමි දරුවකු අපයෝජනයට ලක් කිරීමට සූදානම්ව තිබේ. මේ සම්බන්ධව පරීක්ෂණ ජාතික ළමාරක්ෂක අධිකාරියේ සභාපති වරයාගේ උපදෙස් මත එහි විමර්ශන ඒකකයේ නිලධාරීන් මේ මොහොතේ සිදු කරමින් පවතී.

### ළමා අපචාර සම්බන්ධව වෙනම අධිකරණයක්

ළමා අපචාර සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට අධිකරණ අමාත්‍යාංශයේ අවධානය යොමුව තිබීම ඉතා වැදගත් කරුණකි. අධිකරණ අමාත්‍ය අලි සබ්රි මහතා ප්‍රකාශ කර ඇත්තේ දරුවන්ට යම් සිදුවීමක් සිදු වුවහොත් එය ඔවුන්ගේ ජීවිත කාලයටම බලපානු ලබන බවයි.

මෙවැනි කටයුතු නිසා ළමා අපචාර සම්බන්ධව වෙනම අධිකරණයක් පිහිටුවීමට මේ වන විට අධිකරණ අමාත්‍යාංශය තීරණය කර තිබේ. එමෙන්ම බොහෝ තැන්හි දී කියැවෙන ආකාරයට මෙම අපයෝජන සිදු වන්නේ තමා සමීපයේ ම සිටින්නන්ගෙනි. තවද පසුගිය කාලය පුරා ම අසන්නට ලැබුණේ ඇතැම් ගුරුවරුන් වෙතින් ම ළමා අපයෝජන සිදු වන බවයි.

කුඩා දරුවන්ට සිදුවන අපයෝජන සිදුවීම් ඔවුන්ගේ අනාගතයටද බලපාන නිසා එම කටයුතු සම්පූර්ණයෙන්ම නවතාලීම පිණිස කටයුතු කළ යුතු බව ඇමතිවරයාගේ අදහසයි.

මෙවැනි කටයුතු ඉදිරියට කරගෙන යෑමේ දී මුහුණ දීමට සිදුවන බරපතළම ගැටලුව ලෙසින් ඇමැතිවරයා දක්වන්නේ නීතිමය කරුණුය. එබැවින් කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතිව මේ සම්බන්ධයෙන් වෙනම අධිකරණයක් පිහිටුවීම සම්බන්ධව රජය කටයුතු කරන බව ද ඇමතිවරයා පැවසීය. මෙය තනිව රජයකට කළ නොහැකි බවත් සාමූහික වශයෙන් එකතු වී ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දැක්විය යුතු බවද පවසන අමාත්‍යවරයා ආගමික සිද්ධස්ථාන, පොලීසිය, සෞඛ්‍ය පරීක්ෂකවරුන් සම්බන්ධ කරගෙන මේ පිළිබඳව ජනතාව මුල් වී කටයුතු කළ යුතු බවද පැවසීය.



අධිකරණ අමාත්‍ය
අලි සබ්රි



මහාචාර්ය
මුදිත විදානපතිරණ



මහාචාර්ය
අජන්තා හපුආරච්චි

ළමා ආරක්ෂක අධිකාරියේ සභාපති මහාචාර්ය මුදිත විදානපතිරණ පවසන්නේ ළමා අපයෝජන සමාජයේ ඉහළ අධ්‍යාපනයක් ලැබූ පිරිස අතර පමණක් නොව අධ්‍යාපනය අඩු සහ දුප්පත්, පොහොසත් බේදයක් නොමැතිව සියලු ක්ෂේත්‍ර අතර සිදුවන්නක් බවයි. ළමා අපයෝජන බහුල ලෙස සිදුවීම සම්බන්ධයෙන් මහාචාර්යවරයා පවසන්නේ මිනිසුන් තුළ පවතින සමාජමය, ආර්ථික හා මානසික ප්‍රශ්න නිසා මෙකී සිදුවීම් ඒ ආකාරයෙන්ම සිදු වීමට කරුණු කාරණා සැලසෙන බවයි.

පසුගිය සමයේ ළමා අපයෝජන සම්බන්ධයෙන් නීතියේ රැහැනට කොටුකර ගත් කොට්ටාවේ ඉංග්‍රීසි ගුරුවරයාද ගණිත ගුරුවරයා මෙන්ම මීට දින කිහිපයකට පෙර අත්අඩංගුවට ගත් නර්තන ගුරුවරයාටද ලැබිය යුතු දඬුවම් නීති මාර්ගයෙන් ඒ ආකාරයෙන්ම ලබා දීමට කටයුතු කරන බවද ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිවරයා වැඩිදුරටත් පැවසීය.

මාර්තු මස 16 වන දා සිට ජූනි මස 16 වන දා දක්වා කාලය තුළ ළමා අපයෝජනයන් සිදුවීම සම්බන්ධයෙන් පැමිණිලි 3500ක් ළමා ආරක්ෂක අධිකාරියට ලැබී ඇත. ඒ කාලය තුළ දරුවන් 927ක් කෲර වධ හිංසාවලට ලක්වී ඇත. මාර්තු මස 16 වන දිනට පෙර ලැබුණු සිදුවීම් හා සලකා බැලීමේදී එය සියයට 40ක වැඩි වීමකි.

### කොවිඩ් වසංගත සමයේ ලිංගික හිංසනය බහුලවෙයි

ළමා ආරක්ෂක අධිකාරිය පවසන පරිදි එම කාල සීමාව තුළ රට ලොක්ඩවුන් තත්ත්වයේ පැවතීම නිසා කිසිදු දරුවකුට වෙනත් ස්ථානවලට ගමන් කිරීමට සිදු වූ නොවූ අතර සමස්තයක් ලෙස ගතහොත් වධහිංසාවලට ලක් වීම සිදුව ඇත්තේ තම පවුල තුළදීය. එමෙන්ම පසුගිය කොවිඩ් වසංගත සමයේද ලිංගික හිංසනය බහුලව සිදුව ඇති බව දක්නට ලැබෙන කරුණකි.

මාර්තු මාසයේ පළමුවැනිදා සිට 30 වැනිදා අතර කාලයේදී ලිංගික හිංසන 12ක් සිදුව ඇති අතර ඉන් පසු මාසයේ එනම් අප්‍රේල් මාසයේදී පමණක් එය 65 දක්වාද මැයි මාසයේ එය 100 ඉක්මවාද වර්ධනය වී තිබේ.

මහාචාර්ය අජන්තා හපුආරච්චි පවසන්නේ ළමා අපයෝජන සිදු වීමට මත්කුඩු සහ මත්ද්‍රව්‍යවලින් ප්‍රබල බලපෑමක් සිදු වන බවයි. මාධ්‍ය හා අනෙකුත් සියල්ල මඟින් පාරිභෝජන ලෝකයක් ගොඩ නැඟුවද මානව ධර්මවලින් යුත් මිනිසකු ගොඩනැඟීමට නොහැකි වුණු බවත් විකෘති මිනිසකුගේ අසීමිත ආශාවන් දෙස බලා සිටීමට සිදුව ඇති බවත් ඇය පැවසුවාය.

එමෙන්ම මහාචාර්යවරිය වැඩිදුරටත් ප්‍රකාශ කරන්නේ මෙදෙස බැලිය යුත්තේ ලෝක මට්ටමින් බවත් නීත්‍යානුකූල නොවන තත්ත්වයක් යටතේ වුවද ගණිකා නිවාස, ස්පා යනාදී සියලු දෙයින් ඈත් වී ළමයකු අපයෝජනය කිරීමට තරම් මිනිසා පහතට වැටී ඇත්තේ පාරිභෝජන රටාවට හුරු මිනිසෙක් මිස යහපත් පුරවැසියකු බිහි නොවූ නිසා බවය. වත්මන් නීති රාමුව තුළ ළමා අපයෝජකයන්ට නීතිය ක්‍රියාත්මක කිරීම අගය කළ යුත්තක් බවත් ළමා අපයෝජන හා මත්ද්‍රව්‍ය ආදී මේ සියල්ල එක් ජාලයකට බැඳී ඇති බවත් ඇයගේ අදහසයි.



# ගාස්තු වැඩි නොකර ජනතා පහසුව සලසනවා

## ප්‍රවාහන අමාත්‍ය ගාමිණී ලොකුගේ

● ජයසූරිය උඩුකුඹුර

**■ අලුත් ආණ්ඩුවේ අලුතින් ලැබුණ ප්‍රවාහන අමාත්‍යාංශය ගැන ඔබ මොනවද කියන්නෙ?**

මේ මැතිවරණයේදී අප ජනතාවගෙන් තුනෙන් දෙකක වරමක් ඉල්ලුවා. ඒ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය ඉවත් කිරීමට සහ කොරෝනා වසංගතය සමග කඩා වැටුණ ආර්ථිකය හදන්න. මේ සමග අපනයනය වැඩි කරලා ආනයනය අඩු කරනවා කියල අපි කිව්වා. ජනතාව ඒකත් අනුමත කරලා තියෙනවා. දැන් අපි සෞභාග්‍ය දැක්මේ කරුණු ක්‍රියාත්මක කරන්න ඕනේ. ඒ සඳහා තමයි අපේ රටේ මෙතෙක් සිදු නොවූ ආකාරයට විද්‍යානුකූල අමාත්‍ය මණ්ඩලයක් පත් කරලා තිබෙන්නේ. මට ලබා දී තිබෙන ප්‍රවාහන අමාත්‍යාංශය ගැන මම සතුටු වෙනවා. ඒ වාගේ ම මට හොඳ තරුණ රාජ්‍ය අමාත්‍යවරයෙක් ලබාදී තිබෙනවා. ඒ අනුව අප දැන් වැඩ පටන් ගන්න සූදානම් වෙනවා.

**■ ප්‍රවාහන විෂය අභියෝගයක්. මේ අභියෝගය ජයගන්න ඔබට තිබෙන වැඩපිළිවෙළ මොකක්ද?**

ඒක තමයි කීවේ වැඩ පටන් ගන්න සූදානම් වෙනවා කියලා. මේ දිනවල අපි කරන්නේ ප්‍රවාහන අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන පිළිබඳ අධ්‍යයනය කරන එක. මොකද මේ රටේ ජනතාව ගෙන් 90% ක් විතරම අපේ පොදු ප්‍රවාහන සේවය භාවිතා කරලා තමයි ඔවුන්ගේ කටයුතු කරන්නෙ. ඒ නිසා ඔවුන්ට හොඳ සේවාවක් ලබාදෙන එක තිරසර වැඩපිළිවෙළක් වෙන්න ඕනේ. අපි දැන් අපේ අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ප්‍රධානීන් හා වගකිව යුතු නිලධාරීන් සමග සාකච්ඡා කරන්නේ අපිට තිබෙන සීමිත සම්පත්වලින් කොහොමද ජනතාවට උසස් සේවයක් ලබාදෙන්නේ කියලයි. ප්‍රවාහන සේවයේ ශ්‍රීලංගම වගේ ම දුම්රියත් ආරම්භයේ සිටම රාජ්‍ය ආයතන. මේ ගැන සුබ අසුබ දෙකෙන්ම මතවාද තිබෙනවා. ඒ මොනවා වුණත් අපි මහජනතාවට අපහසුතාවක් ඇති නොවන පරිද්දෙන් නියමිත කාල සටහන් අනුව මේ සේවාව පවත්වාගෙන යන්න ඕනේ. ඒ වගේ ම මේ ආයතන දියුණු කරන්න අපි කටයුතු කරන්න ඕනේ. ඒවා ගැන තමයි දැන් අපි කියවන්නේ. තව සතියක් දෙකක් යන කොට අපිට පුළුවන් වෙයි මේ ආයතනවල ඉදිරි ක්‍රියා සැලැස්ම එළියට දෙන්න.

**■ අමාත්‍ය මණ්ඩලය පත්වෙලා සති දෙකක් වෙනවා. තවමත් අමාත්‍යංශ කියවනවාලු සැලැස්ම හදන්න තව කාලයක් ගනී. මේ වසර අවසානයට පෙර වැඩක් සිද්ධ වෙන්නෙම නැතුවෙයි නේද?**

බලය තිබුණ පලියට අපිට වගකීම් පැවරූ පලියට මහජනතාව ගේ මුදල් නාස්ති කරලා සංදර්ශන කරන්න අපි සූදානම් නෑ. අපිට තියෙන සම්පත් යොදාගෙන ඒ ආයතන දියුණු කරන ගමන් මහජනතාවට තෘප්තිමත් සේවාවක් ලබා දෙන්න නම් මේ ආයතන ගැන එකින් එක නිවැරැදිව අධ්‍යයනය කරන්න ඕනේ. මේ අධ්‍යයනයන් කරන ගමන් අපි අත්හදා බැලීම් කරන්නත් සූදානම්. අපි කොළඹ දිස්ත්‍රික්කයේ සිසු සැරිය බස් ධාවනය ක්‍රමවත් කරන්න අත්හදා බැලීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන්න සූදානම් කරලා තිබෙනවා. කොළඹ පමණක් සිසු සැරිය බස් රථ 200 ක් පමණ තියෙනවා. ඒ බස් රථ සියල්ල හොඳ තත්ත්වයෙන් පිරිසිදුවට තබා ගෙන ධාවනයේ යොදවන්න ලබන 01 දායින් ආරම්භ කරලා 15 දා වන විට සම්පූර්ණ කරන්න අපේක්ෂා කරනවා. 15 දායින් පසුව සිසු සැරිය බස් 200 කොළඹ දිස්ත්‍රික්කයේ ධාවනය කරන ආකාරය බලලා එහි අඩු පාඩු හදාගෙන ඉතා හොඳ සිසු සැරිය බස් රථ සේවාවක් දිවයින පුරා ක්‍රියාත්මක කරන්න අපි කටයුතු කරනවා.

**■ ඔය වැඩෙත් කොළඹට කිරි ගමට කැකිරි වගේ වැඩක් වෙයිද?**

අපි ආණ්ඩුවක් විදියට මොනවා කළත් විපක්ෂයට ඒ ගැන නොයෙක් විවේචන තියෙන්න පුළුවන්. නමුත් එක තැනක අත්හදා බලලා තිබෙන අඩුපාඩු හදාගෙන නිවැරැදිම දේ රටපුරා ක්‍රියාත්මක කිරීමයි අපේ අරමුණ. දැනටත් බස් රථ ධාවනය වනවා. නමුත් ඒවායේ අඩුපාඩු ගැන

### වෘත්තිය සමිතිවල ඉල්ලීම් සාධාරණ නම් අරගල කරන්න පෙරම ඒවා ලබා දෙනවා

පැමිණිලි තියෙනවා. එවැනි පැමිණිලි නැවත නොඑන්න නම් අපි නිවැරැදි ලෙසට සිසු සැරිය බස් රථ ධාවනයේ යොදවන්න ඕනේ. ඒ වගේ ම කැලණිවැලි දුම්රිය මාර්ගයේ දැනට ධාවනය වන කාර්යාල දුම්රියවලට අමතරව තවත් කාර්යාල දුම්රියක් ධාවනය කරවන්න අපි දැන් සැලසුම් කරගෙන යනවා. මේ දුම්රිය දෙක ධාවනය ආරම්භ කරන වේලාවේ පරතරය විනාඩි 15 යි.

**■ ඔබ කියන දෙයින් පැහැදිලි වෙනවා බස් හා දුම්රිය පාඩු ලබන ආයතන බව. ඒ අනුව බස් හා දුම්රිය ගාස්තු වැඩිවීමක් අපේක්ෂා කරන්න පුළුවන්ද?**

නෑ. කිසිසේත්ම අපි මේ වේලාවේ බස් හෝ දුම්රිය ගාස්තු වැඩි කරන්නේ නෑ. එවැනි සාකච්ඡාවක් හෝ අපි පවත්වා නෑ. මේ ආයතනවල පාඩුව පියවා ගන්න අපි අලුත් ආදායම් මාර්ග හදනවා. දුම්රිය යොදාගෙන බඩු හා ඉන්ධන ප්‍රවාහනය කරන්න අපි දැන් අවධානය යොමු කරලා තියෙනවා. කෘෂිකාර්මික ප්‍රදේශවල ධාවනය කරන බස් රථවලත් පිටුපස ආසන කීපයක් ගලවා ඉවත් කර බඩු ප්‍රවාහනය කරන්න ඉඩ දෙන්න අවධානය යොමු කරලා තිබෙනවා. ඒ වාගේ ම මඩකලපුව වැනි ප්‍රදේශවල සිට දුම්රිය යොදාගෙන වැලි ප්‍රවාහනය කරන්නත් අපි අදහස් කරලා තිබෙනවා. ඒ වගේ ම අපි දැන් පෙට්‍රෝලියම් කෝපරේෂන් එකේ ගනුදෙනු කාරයෙක් විදියට තමයි ඉන්ධන ලබා ගන්නේ. අපි බලාපොරොත්තු වෙනවා මේක වෙනස් කරලා බස් හා දුම්රිය සඳහා ඉන්ධන ලබා ගැනීම ඉන්ධන අලෙවිකරුවෙකු සේ සලකා කටයුතු කරන්න කියල. එහෙම වුණොත් අපිට වාර්ෂිකව රුපියල් මිලියන 10 ක විතර ඉතිරියක් කරගන්න පුළුවන්.

**■ ඔබලා විපක්ෂයේ සිටියදී ටොප් 10 ටොප් 20 කියල යහපාලනයේ දූෂණ වංචා ගැන කථා කළා. ප්‍රවාහන අමාත්‍යාංශයටත් එදා ඔබලාම චෝදනා කළා. එදා ඔබලා හෙළි කළ වංචා දූෂණවලට සම්බන්ධ නිලධාරීන්ට නීතිය ක්‍රියාත්මක කරනවාද?**

ඔව්. අපි දැනටමත් ප්‍රවාහන අමාත්‍යාංශයේ සිදුව ඇති වංචා දූෂණ අකටයුතු ගැන සොයා බලා ගෙන ඒ පිළිබඳ තොරතුරු රැස් කර ගෙන යනවා. මේ තොරතුරු අපි FCID දෙන්නෙ නෑ. රටේ නියමිත පොලිසියට දීලා වැරදි කර තිබෙන අයට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලනවා.

**■ කොටුව ප්‍රධාන දුම්රියපොළ ආශ්‍රිතව කරන්න හදන වෙනස මොකක්ද?**

දුම්රිය මගීන් දුම්රිය එන තුරු දුම්රිය ස්ථානයේ රැඳී ඉන්නවා. දුම්රිය ආවාම ඒකෙන් ගිහිල්ල රෑ බෝවෙලා ගෙවල් ළඟ කඩෙන් බඩු ගන්න යනවා. මේ නිසා අපි කල්පනා කළා කොටුව දුම්රිය ස්ථානයේ සියලු රාජ්‍ය ආයතනවලින් ක්‍රියාත්මක කරන අලෙවි සැල් සංකීර්ණයක් හදන්න. එහෙම වුණාම රාජකාරි ඉවරවෙලා යන අයට ගෙදරට දරුවට අවශ්‍ය දේවලුත් අඩු මිලකට ලබාගෙන නිවසට යන්න පුළුවන්. ගුවන් තොටුපළේ 'ඩියුටි ෆ්‍රී' අලෙවි සල තිබෙනවා වගේ දුම්රිය ස්ථානයෙත් එවැනි වෙළෙඳ සැල් ස්ථාපිත කරන්නයි අපි සැලසුම් කරන්නේ. වෙළඳසැල් වගේ ම හොඳ ආපන ශාලා කීපයක් ද ආරම්භ කරනවා. හොඳ වැසිකිළි පද්ධතියකුත් ස්ථාපිත කරනවා.

**■ ඔබ සඳහන් කළා ජනතාව තුනෙන් දෙකේ බලයක් දීලා ව්‍යවස්ථා සංශෝධනයක් අපේක්ෂා කරනවා. නමුත් දැන් අළුයට ගින්දර මෙන් මේ තුනෙන් දෙකේ බලය කේවල් කරන උත්සාහයක් ගැන සඳහන් වෙනවා. ඔබ ඒ ගැන මොනවද කියන්නෙ?**

එහෙම දෙයක් මට නම් දැනිලා නෑ. මේ මැතිවරණය ජයග්‍රහණය කළේ විවිධ කණ්ඩායම්වල සහයෝගයෙන් කියන කාරණය අපි පිළිගන්නවා. නමුත් ඒ කණ්ඩායම් අපේක්ෂා කරන ආකාරයට ඔවුන්ව සතුටු කරන්න බෑ. මේ ආරම්භයේ යම් යම් කාරණා අඩුපාඩු වගේ දැක්කත් අපි වැඩ කරගෙන යන කොට ඒ අඩුපාඩු සකස් වෙලා අපිට එක කණ්ඩායමක් විදියට මේ වසර පහ රට වෙනුවෙන් කටයුතු කරන්න හැකියාව ලැබෙයි.

**■ ඔබ වෘත්තිය සමිති නායකයෙක් විදියට අමාත්‍ය තනතුර හා වෘත්තීය සමිති කටයුතු එකට ගළපා ගන්නේ කොහොමද?**

අපි ප්‍රතිපත්තියක් විදියට වෘත්තීය සමිති ඉල්ලීම් ගැන විශේෂ අවධානය යොමු කරනවා. ඉල්ලීම් සාධාරණ නම් අරගල කරන්න පෙර ඒ ඉල්ලීම් අපි ලබා දෙනවා. මේ නිසා මට අපේ අමාත්‍යාංශයේ වෘත්තිය සමිතිවල මෙන් ම ඉන් බාහිර වෘත්තීය සමිතිවල මෙන් ම ඉන් බාහිර වෘත්තීය සමිතිවලත් හොඳ සහයක් ශක්තියක් මේ අමාත්‍ය ධූරයේ කටයුතු කරන්න ලැබිල තියෙනවා.

**■ බස් හා දුම්රිය කාල සටහනකට ධාවනය නොවන බවට නිතර මැසිවිලි නැගෙනවා. ඊට ඔබට විසඳුමක් තිබෙනවාද?**

මම මුලදී කීවා සේ අපිට තිබෙන සීමිත සම්පත්වලින් තමයි අපිට වැඩ කරන්න සිදුව තිබෙන්නෙ. මේ නිසා තව ටික දිනක් යන තුරුත් පරණ තත්ත්වය තිබෙන්න පුළුවන්. කොහොම වුණත් අපි දැනටමත් දුම්රිය සාමාන්‍යාධිකාරිට හා ලංගම සභාපතිට දන්වල තිබෙනවා බස් හා දුම්රිය නියමිත කාල සටහනකට ඒ ඒ මාර්ගවල ධාවනය කරවන්න කියල. එහෙම කරන්න බැරි නම් ඒකට හේතු කියන්න කියලත් අපි දැනුම් දීල තියෙනවා. ඒ වගේ ම තාක්ෂණය යොදා ගෙන අපි දුම්රිය හා බස් ධාවන කාල සටහන ඇප් එකක් හරහා ජනතාවට දැනුම් දෙන්නත් පියවර ගනිමින් ඉන්නවා.

### දුම්රිය ස්ථානවලට 'ඩියුටි ෆ්‍රී' වෙළඳ සැල්

**■ ඔබ හා රාජ්‍ය අමාත්‍යවරයාත් නිලධාරීනුත් ජනාධිපතිවරයා සමග පැවැති සාකච්ඡාවේදී එතුමා සඳහන් කළේ බස් සෝදන තැනින් පටන් ගන්න කියලයි. එමඟින් ගම්‍ය වන්නෙ ප්‍රවාහන අමාත්‍යංශය පූර්ණ ලෙසම ප්‍රතිසංවිධානය විය යුතු බව නේද?**

ඔව්. අපි ජනාධිපති සඳහන් කළ දේ මතු පිටින් හා අභ්‍යන්තරවත් අවබෝධ කරගෙන කටයුතු කරනවා. විශේෂයෙන් බස් රථයක් ගමනාන්තයට පැමිණි පසු නැවත අලුත් ගමනක් පටන් ගන්න පෙර බස් රථය ඇතුළත හා පිටත පිරිසිදු කරන්න කියල අපි ශ්‍රීලංගමට දැනුම්දීලා තිබෙනවා. ගමනා ගමන කොමිසම හරහා පෞද්ගලික බස් ධාවකයන් ගෙනුත් අපි මේ ඉල්ලීම කරල තිබෙනවා. ඒ වගේ ම ජනතාව තෘප්තිමත් වන ආකාරයට ඉහළ සේවාවක් ඇති කිරීමට අවශ්‍ය ව්‍යුහාත්මක වෙනස්කමුත් අපි හඳුනා ගෙන ජනාධිපති සමගත් සාකච්ඡා කරල ඒවත් ක්‍රියාත්මක කරනවා.

**■ පළාත් සභා මැතිවරණයත් පැවැත්වීමට නියමිතයි. ඊට මුහුණ දෙන්න ඔබලාගේ සූදානම කොහොමද?**

පළාත් සභා මැතිවරණයට අපි මුහුණ දෙන්නම ඕනේ. මෙරටේ මැතිවරණ ප්‍රතිඵල උඩු යටිකුරු කරපු මේ මහ මැතිවරණය වගේ ම පළාත් සභා මැතිවරණයත් අපිට ජයගන්න පුළුවන්. ජනාධිපතිවරණයක් ඉවර වුණාම හුගක් අය හිතන්නේ ඊට පසුව පැවැත්වෙන මහ මැතිවරණ ප්‍රතිඵල අඩුයි කියලයි. නමුත් මෙවර ඒක වෙනස් වුණා. පළාත් සභා මේ ආදර්ශය ගනීවි. අපි මේ දිනවල කරන වැඩ නිවැරැදිව ජනතාවට සමීප කළොත් අපිට මැතිවරණ ගැන බය වෙන්න දෙයක් නෑ.

ඡායාරූපය - නිශ්ශංක ද සිල්වා



# බුහුමන් නොලබාම අවසන් ගමන් ගිය කොරෝනා රෝගියෝ

● හර්ෂා සුගතදාස

**ප්‍රසුගිය ඉරුදින ලංකාවේ 12 වැනි කොරෝනා මරණය වාර්තා විය. 12 වැනියා ලෙස කොරෝනා හේතුවෙන් මිය ගියේ කුරුණෑගල වෑඩ පදිංචි වී සිටි එෆ්. ආර්. රිසානා නම් 47 හැවිරිදි කාන්තාවයි. පිළිකා රෝගයට ගොදුරු වී සිටි ඈ ඉන්දියාවේ ගොස් තිබුණේ පිළිකා රෝගයට ප්‍රතිකාර ලබා ගැනීමටය. මීට අමතරව ඈ දියවැඩියා රෝගයෙන් ද පෙළුණු කාන්තාවකි. අගෝස්තු 20 වැනිදා ලංකාවට පැමිණි ඇයව ඉරණවිල නිරෝධායන මධ්‍යස්ථානයෙහි නිරෝධායනයට ලක් කර තිබුණි. එහිදී ඇයට කොවිඩ් 19 වයිරසය ආසාදනය වී ඇති බවට තහවුරු විය. ඉන් අනතුරුව ඇයව අංගොඩ අයි.ඩී.එච්. රෝහලට ඇතුළත් කරනු ලැබීය. 23 වැනි ඉරිදා පෙරවරුවේ ඈ මිය ගියාය. එදින ම පස්වරුවේ ඇගේ අවසන් කටයුතු අන්තර්ජාතික නිරෝධායන නීතිරීතිවලට අනුකූලව කොටිකාවත්ත සුසානභූමියේදී සිදු විය.**

ලංකාවේ 12 වැනි කොරෝනා මරණය වාර්තා වූයේ 11 වැනි කොරෝනා මරණය වාර්තා වී දින 83කට පසුව වීම විශේෂත්වයකි. 11 වැනි කොරොනා මරණය සිදු වූයේ ජූනි 01 වැනිදාය. ඔහු ද කුරුණෑගල රිදීගම කටුපිලගොල්ල ග්‍රාමයේ පදිංචිකරුවෙකි. ඔහු කුවේට් සිට මෙරටට පැමිණ තිබුණේ මැයි 16 වැනිදාය. මින්නේරිය යුද හමුදා නිරෝධායන මධ්‍යස්ථානයේ නිරෝධායනය වෙමින් සිටියදී ඔහුට කොරෝනා වයිරසය ආසාදනය වී ඇති බව තහවුරු වූයේ මැයි 26 වැනිදාය. එනම් ඔහු මෙරටට පැමිණ 10 වැනි දිනයේදීය. ඉන්පසුව ඔහුව හෝමාගම මූලික රෝහලට ඇතුළත් කෙරිණි. දියවැඩියාව රෝගයෙන් පෙළුණු ඔහු ඊට දින 2කට පසුව අසාධ්‍ය තත්ත්වයට පත් වූ බැවින් මැයි 28 වැනි දින ඔහුව දැඩි සත්කාර ඒකකයට ඇතුළත් කළ අතර ජූනි 01 වැනිදා අලුයම ඔහු මරණයට පත් විය. 45 හැවිරිදි වියේ පසු වූ ඔහු සූපවේදියකු ලෙස සේවය කර ඇත. ජාත්‍යන්තර නිරෝධායන නීතිරීතිවලට අනුකූලව හෝමාගම සුසානභූමියේදි ඔහුගේ අවසන් කටයුතු සිදු කෙරිණි.

10 වැනි කොරෝනා මරණය මෙරටින් වාර්තා වූයේ මැයි 25 වැනිදාය. එනම් 11 වැනි මරණයට දින 06කට පෙර ය. ලංකාවේ 10 වැනි කොරෝනා මරණය ලෙස වාර්තා වී තිබෙන්නේ

### 12වැනි රෝගියා මියගියේ ඉකුත් 23 දා

51 හැවිරිදි පයාගල ප්‍රදේශයේ පදිංචි කාන්තාවකි. ඇය ද කුවේට් සිට මෙරටට පැමිණ ත්‍රිකුණාමලය මන්කි බ්‍රිජ් නිරෝධායන මධ්‍යස්ථානයේ නිරෝධායනයට ලක්වෙමින් සිටි අයෙකි. ඇය හෘද රෝගයෙන් පෙළුණු කාන්තාවක බ ව අනාවරණය වී ඇත.

10 වැනි කොරෝනා මරණය සිදු වීමට දින 20කට පෙර, එනම් මැයි 05 වැනි දින ලංකාවේ 9 වැනි කොරෝනා මරණය වාර්තා විය. ඊට ගොදුරු වූයේ මෝදර ප්‍රදේශයේ පදිංචි කාන්තාවකි. 52 හැවිරිදි වියේ පසු වූ ඈ මාසයක පමණ කාලයක් අසනීප තත්ත්වයෙන් පසු වී තිබේ. මැයි 04 වැනි දින ශ්වසන රෝගී තත්ත්වය උත්සන්න වීමෙන් ඇයව කොළඹ ජාතික රෝහලට ඇතුළත් කෙරිණි. එහිදී ඈ කොරෝනා රෝගයට ගොදුරු වී ඇති බව තහවුරු විය. ඉන් අනතුරුව මැයි 05 දා අලුයම 1.00ට ඇයව අංගොඩ අයි.ඩී.එච්. රෝහලේ දැඩි සත්කාර ඒකකයට ඇතුළත් කරනු ලැබීය. එදින දවල් 12.50ට පමණ ඈ මිය ගියාය.

ඈ මරණයට පත්වීමට පෙර දින, එනම් මැයි 04 වැනි දින ද කොරෝනා හේතුවෙන් කාන්තාවක් මිය ගියාය. එම මරණය වාර්තා වන්නේ 8 වැනි මරණය ලෙසිනි. ඈ පොල්පිතිගම ප්‍රදේශයේ පදිංචි 72 හැවිරිදි කාන්තාවකි. කොරෝනා රෝගයට ගොදුරු වීමත් සමග හෝමාගම මූලික රෝහලට ඇයව ඇතුළත් කර තිබේ. වකුගඩු රෝගයෙන් පීඩා විඳිමින් සිටි ඇයට රෝගී තත්ත්වය සහ වෘද්ධභාවය නිසාම ජීවිතෙයන් සමු ගැනීමට සිදු වූයේ කොරෝනා සමග සටන් වැදීමට අසීරු වීමෙනි.

ලංකාවේ 7 වැනි කොරෝනා මරණය ලෙස සටහන් වී තිබෙන්නේ මෙරට වැඩි වශයෙන් කතාබහට ලක් වූ අයකුගේ මරණයයි. ඔහු ගල්කිස්ස ප්‍රදේශයේ

### ශ්‍රී ලංකාවේ මෙතෙක් හමුවූ කොරෝනා සංඛ්‍යාව 2,984 යි.

පදිංචි මැණික් ව්‍යාපාරිකයෙකි. ඔහු මිතුරන් සමග ව්‍යාපාරික අවශ්‍යතාවකට විදේශගත වී මෙරටට පැමිණීමෙන් පසු පුද්ගලික රෝහලක රසායනාගාරයකින් කොරෝනා වැළඳී ඇතිදැයි පරීක්ෂා කර ගෙන තිබිණි. එහිදි ඔහුට කොරෝනා ආසාදනය වී ඇති බවට තහවුරු විය.

එහෙත් ඔහු ඒ බව සඟවා ගෙන සිය පවුලේ සාමාජිකයන් හා මිතුරන් සමග සාමාන්‍ය ලෙස දිවි ගෙවීය. අවසානයේදී පොලිස් නිලධාරින් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ඔහු සොයා රැගෙනවිත් අංගොඩ අයි.ඩී.එච්. රෝහලට ඇතුළත් කරනු ලැබීය. 44 හැවිරිදි වියේ පසු වූ ඔහු රෝගය වැළඳුණු බව දැනගත් වහාම රෝහල්ගත වූයේ නම් සමහරවිට ඔහුගේ ජීවිතය බේරා ගැනීමට ඉඩ තිබිණි. ඔහුගේ බිරිඳටත් දරුවකුටත් මිතුරකුටත් ඔහුගෙන් කොරෝනා ආසාදනය වී තිබූ නිසා රෝහල්ගත කෙරුණු අතර ඔවුහු සුවය ලබා රෝහලෙන් පිටව ගියහ. මෙම පුද්ගලයාගේ මරණය, ලංකාවේ 7 වැනි කොරෝනා මරණය ලෙස වාර්තා වූයේ අප්‍රේල් 09 වැනිදාය.

ඊට දින 3කට පෙර, එනම් අප්‍රේල් 06 වැනිදා 6 වැනි කොරෝනා මරණය වාර්තා විය. මෙලෙස මිය ගියේ 80 හැවිරිදි දෙහිවල පදිංචිකරුවෙකි. ඔහුට කොරෝනා ආසාදනය වූ බව තහවුරු වූ පසුව අයි. ඩී. එච්. රෝහලට ඇතුළත් කරනු ලැබීය. එහිදී ඔහු මරණයට පත්විය.

ලංකාවේ 5 වැනි කොරෝනා මරණය ලෙස වාර්තා වූයේ වැලිකන්ද රෝහලේ ප්‍රතිකාර ලැබූ 44 හැවිරිදි පුද්ගලයෙකි. ඉතාලියේ සිට පැමිණි ඔහු නිව්මෝනියා තත්ත්වය උත්සන්න වීමෙන් මරණයට පත් විය. ඔහු හෝමාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. ඔහුගේ මරණය වැලිකන්ද රෝහලේ කොරෝනා නිසා මිය ගිය පළමු මරණය ලෙස සටහන් වී තිබේ. 5 වැනි කොරෝනා මරණය අප්‍රේල් 04 වැනිදා සිදු විය.

ඊට දින 2 කට පෙර, එනම් අප්‍රේල් 02 වැනි දින ලංකාවේ 4 වැනි කොරෝනා මරණය වාර්තා විය. මෙලෙස මරණයට පත් වූයේ 58 වැනි වියේ පසු වූ රත්මලාන ප්‍රදේශයේ පදිංචි හේමාල් සිල්වා නමැත්තාය. ඔහු බිරිඳ සමග ඉන්දියාවේ සිට මෙරටට පැමිණෙන අවස්ථාවේදී කටුනායක ගුවන් තොටුපොළ පරිශ්‍රයේදී ඉතාලියෙන් පැමිණ කලහකාරි ලෙස හැසිරුණු ශ්‍රී ලාංකිකයන් පිරිසකට මැදි වූ බව ඔහු පවසා තිබේ. ඒ අනුව ඔහුට කොරෝනා වෛරසය ආසාදනය වූ බවට අනුමාන කෙරිණි. හේමාල් සිල්වාත් ඔහුගේ බිරිඳත් කොරෝනා වෛරසය ආසාදනය වීමෙන් අංගොඩ අයි.ඩී.එච්. රෝහලට ඇතුළත් කරනු ලැබීය. හේමාල් සිල්වා මිය ගිය අතර ඔහුගේ බිරිඳ සුවය ලබා නිවසට ගියාය.

ශ්‍රී ලංකාවේ 3 වැනි කොරෝනා මරණය ලෙස සටහන් වී තිබෙන්නේ අප්‍රේල් 01 වැනිදා මරණයට පත් වූ මරදානේ පදිංචි මුස්ලිම් ජාතික පිරිමියකුගේ මරණයයි. 72 හැවිරිදි ඔහු ජයවර්ධනපුර රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටින විට කොරෝනා වැළඳී ඇති බව තහවුරු විය. ඉන්පසුව ඔහුව අංගොඩ අයි. ඩී. එච්. රෝහලට ඇතුළත් කිරීමට පියවර ගැනිණි. එහෙත් අප්‍රේල් 01 වැනිදා රාත්‍රියේ ඔහුව රෝහලට ඇතුළත් කිරීම සඳහා බාහිර රෝගී අංශයේ තබාගෙන සිටින අවස්ථාවේදී ඔහු මරණයට පත් විය. අධි රුධිර පීඩනය, දියවැඩියාව, වකුගඩු අකර්මන්‍ය වීම වැනි රෝග ගණනාවකින් පෙළුණු ඔහුගේ අවසන් කටයුතු මුල්ලේරියාව උඩුමුල්ල ආදාහනාගාරයේදී සිදු කෙරිණි.

ඊට දින 2කට පෙර, එනම් මාර්තු 30 වැනි දින ශ්‍රී ලංකාවේ 2 වැනි කොරෝනා මරණය වාර්තා විය. ඔහු මීගමුව පෝරුතොට පදිංචි වී සිටි මොහොමඩ් ජමල්ඩීන් නමැති මුස්ලිම් ජාතිකයෙකි. ශ්වසන ආබාධයකට ප්‍රතිකාර ගැනීම සඳහා මීගමුව පෞද්ගලික රෝහලකට ගිය ඔහුව පුද්ගලික රෝහලෙන් මීගමුව මූලික රෝහලට එවා තිබිණි. මීගමුව රෝහලේ 20 වැනි වාට්ටුවේ ප්‍රතිකාර ලැබූ ඔහුගේ රෝගී තත්ත්වය අසාධ්‍ය වූ බැවින් දැඩි සත්කාර ඒකකයට මාරු කරනු ලැබීය. ඔහු කොරෝනා ආසාදිතයකු බව තහවුරු වූයේ මාර්තු 30 වැනිදා පස්වරුවේය. ඔහුව අංගොඩ අයි. ඩී. එච්. රෝහලට මාරු කිරීමට පෙර මීගමුව රෝහලේදි මරණයට පත්

### මෙතෙක් සුවය ලැබූ සංඛ්‍යාව 2,830 යි.

විය. ඔහු මුස්ලිම් ජාතිකයකු වුවද මීගමුව මඤ්ඤොක්කාහේන සුසාන භූමියේදි ආදාහනය කෙරුණේ ජාත්‍යන්තර නිරෝධායන රෙගුලාසිවලට අනුවය. විදේශයක සිට මෙරටට පැමිණි කිසිවකු ඔහු සමීපව ඇසුරු කර නොතිබුණද මිය යෑමට දින 20කට පෙර යාපනයේ සංචාරය කර ඇති බවත් එහිදී කොරෝනා වයිරසය ශරීරගත වන්නට ඇති බවත් අනුමාන කෙරිණි.

ලංකාවේ ප්‍රථම කොරෝනා මරණය ලෙස වාර්තා වී තිබෙන්නේ මාරවිල හාල්දඬුවන ප්‍රදේශයේ පදිංචිකරුවකුගේ මරණයයි. ඉලංගපේඩිගේ ධර්මසිරි ජනානන්ද නම් ඔහු 60 හැවිරිදි වියේ පසුවන සංචාරක මඟ පෙන්වන්නකු ලෙස කටයුතු කළ අයෙකි. අවසාන වතාවට ජර්මන් ජාතික සංචාරකයන් පිරිසකට මඟ පෙන්වූ ඔහුට කොරෝනා වයිරසය ආසාදනය වූයේ එකී සංචාරකයන්ගෙන් යැයි අනුමාන කෙරිණි. ඔහු ලංකාවෙන් වාර්තා වූ 4 වැනි කොරෝනා රෝගියාය. අංගොඩ අයි. ඩී. එච්. රෝහලේ ප්‍රතිකාර ලැබූ ඔහුව දැඩි සත්කාර ඒකකයට ඇතුළත් කර තිබුණේ දියවැඩියා රෝගයෙන් පෙළුණු ඔහුට වකුගඩු බද්ධ කිරීමේ සැත්කමක් ද කර තිබූ නිසාය. එහෙත් මාර්තු 28 වැනි දින ඔහු මරණයට පත් වූයේ ලංකාවේ ප්‍රථම කොරෝනා මරණය ලෙස වාර්තාවක් තබමිනි. කොටිකාවත්ත සුසාන භූමියේ ආදාහනාගාරයේදි අන්තර්ජාතික නිරෝධායන රෙගුලාසිවලට අනුකූලව ඔහුගේ අවසන් කටයුතු සිදු කෙරිණි.


ලංකාවේ මෙතෙක් සිදු වූ කොරෝනා මරණ ගැන විමසා බැලීමේදී 9 වැනි මරණයෙන් පසුව සිදු වූ මරණ අතර යම් කාල පරතරයක් තිබෙන බව පැහැදිලිය. එහෙත් මුල් මරණ 7ම වාර්තා වී තිබෙන්නේ දිනයක්, දින දෙක තුනක් වැනි ඉතා කෙටි කාල පරතරයක් තබමිනි. මේ අනුව ශ්‍රී ලංකාව කොරෝනා රෝගය ඉතා සාර්ථකව පාලනය කළ බව පැහැදිලිව දැක ගත හැකිය.



"COVID-19 හමුවේ ජන ජීවිතය" ප්‍රථම ස්ථානය දිනාගත් සේයාරුව - නුවන් සමාධි



දෙවන ස්ථානය දිනාගත් සේයාරුව - ජයනාත් ඉලංගකෝන්



තෙවන ස්ථානය දිනාගත් සේයාරුව - සාලිය කුමාර ජයසේකර

# ලෝක ඡායාරූප දිනයට සමගාමීව පැවති සිව්වන ශ්‍රී ලංකා රාජ්‍ය ඡායාරූප උලෙළ 2020

## තෙවැනි ඇසින් ශ්‍රී ලංකාව

● රසික කොටුදුරගේ

**දෘශ්‍ය රූප සංකලනයේ රිද්මය සොයා යන තෙවන ඇසක් සතු වූවකු තුළ රසික හද සසල කරවන ජීවගුණයත්, හැඟීම් කුළුගන්වන නියමාවක් හා ඊට අදාළ අරමුණ සහ උපාංග අතර සමෝධානයෙන් නිමැවෙන රටාවක් නැති නම් රිද්මයක් සතු නම් හෙතෙම ප්‍රතිභා සම්පන්න නිර්මාණශීලී ඡායාරූප ශිල්පියකු බව අවිවාදයෙන් පිළිගත හැකිය.**

මෙකී ගුණයන්ගෙන් සුපුස්පිත ඡායාරූපාවලියක් පසුගිය දා අපේ ඇස ගැටිණ. ඒ ලෝක ඡායාරූප දිනයට සමගාමීව පැවැති සිව්වන රාජ්‍ය ඡායාරූප උළෙලේදීය. පසු ගිය 19 වැනිදා රාජ්‍ය අමාත්‍ය පියල් නිශාන්ත ද සිල්වාගේ ප්‍රධානත්වයෙන් ඉතා උත්කර්ෂවත් අයුරින් පැවැති මෙම ඡායාරූප උලෙළ පැවැත්විණි.

සමස්ත ලෝක වාසීන් මුහුණ දී සිටින COVID-19 ව්‍යසනය හේතුවෙන් මෙවර රාජ්‍ය ඡායාරූප තරගයේ ද ස්වභාවය තරමක් වෙනස් මුහුණුවරක් ගත්තේය. මෙවර එහි තේමාව වූයේ "COVID-19 හමුවේ ජන ජීවිතය" යන්නය.


මීට අමතරව විවෘත අංශය සඳහාද අවස්ථාව ලබා දී තිබුණි. ඒ අනුව දිවයිනේ නන්දෙස සිටින ඡායාරූප ශිල්පීන් ශිල්පිනියන් විශාල ප්‍රමාණයක් ඡායාරූප ඉදිරිපත් කර තිබුණි. ඒවා අත්දැකීම් බහුල ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් මගින් විනිශ්චයට ලක්කර තිබුණි.

ඒ අනුව "කොවිඩ් 19 සමඟ ජන ජීවිතය"යන තේමාව යටතේ පැවැති ඡායාරූප අංශයෙන් නුවන් සමාධි ඉදිරිපත් කළ 'විෂමතාවය (Disparity)' නම් ඡායාරූපයට ප්‍රථමස්ථානය හිමි විය. මෙහි දෙවනස්ථානය හිමි වූයේ 'කොරෝනාවලින් එහා ගිය විශ්වාසය (Belief Beyond Corona)'නම් ඡායාරූපය ඉදිරිපත් කළ ජයනාත් ඉලංගකෝන්ට ය. තෙවැනි ස්ථානය 'මනස නිදහසේ ලිහිල් කිරීම (Relaxation of The Free Mind)' නම් ඡායාරූපය ඉදිරිපත් කළ සාලිය කුමාර ජයසේකරට හිමිය.

විවෘත අංශයේ ප්‍රථම ස්ථානය හිමි වූයේ සුදානන්ත් කේතීෂ්වරනාදන් ඉදිරිපත් කළ 'THE HUT' නම් ඡායාරූපයටය. එම අංශයේ දෙවැනි ස්ථානය 'අපි නොදත් ලෝකය' ප්‍රියන්ත මීගොඩ දිනාගත් අතර, තෙවැනි ස්ථානය 'ආරක්ෂිතයි (SAFE HAVEN)'නම් ඡායාරූපය ඉදිරිපත් කළ එන්. සුභාෂණ කොස්තා දිනාගත්තේය. තෝරාගත් සෙසු තරගකරුවන් සඳහා කුසලතා සහතික පිරිනැමිණි.

මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් රාජ්‍ය ඡායාරූප උපදේශක සභාවේ සභාපති ප්‍රසන්න හෙන්නායක කියා සිටියේ "ශ්‍රී ලාංකේය සමාජය විසින් කැමරාකරුවකු ලෙස හඳුනාගෙන සිටින පුද්ගලයා තුළ ශ්‍රේෂ්ඨ කලාකරුවකු සැඟවී සිටින බව බොහෝ දෙනකු නොදන්නා බවය. එවැනි පුද්ගලයන් හඳුනාගෙන ඔවුන්ගේ ඡායාරූපවල ගැබ්ව ඇති ඡායාරූපමය වටිනාකම් සහ කලාත්මක ගුණය ඉහළට ඔසවා තැබීම තම සභාවේ කාර්යභාරය වන අතර ලොවපුරා ප්‍රබල කලා මාධ්‍යයක් ලෙස ගෞරවයට පාත්‍ර වූ ඡායාරූප ශිල්පයේ නිරත වන ශ්‍රී ලාංකිකයන්ට රාජ්‍ය ගෞරව පිරිනැමීමෙන් ඔවුන් දිරිමත් කිරීම උළලේ මුඛ්‍ය පරමාර්ථය වන බවය.

ඡායාරූපකරණය ශිල්පයක්, කලාවක් මෙන් ම ප්‍රබල ව්‍යාපාරයක් වන බව පැවසූ හෙතෙම එය කර්මාන්තයක් සහ ව්‍යාපාරයක් වශයෙන් දශක ගණනාවක් කිසිඳු රාජ්‍ය අනුග්‍රහයක් නොලබාම විශිෂ්ට සේවාවක් සපයන බවය. එබැවින් ඡායාරූප ශිල්පය හා බැඳුණු සියලුම අංශ පිළිබඳව සැලකිලිමත් වෙමින් ඔවුන්ගේ ගැටලු සහ ප්‍රශ්න විසඳීමට සක්‍රියව දායක වෙමින් ලබා දිය යුතු රාජ්‍ය අනුග්‍රහය ලබා ගැනීමට උපකාරී වීම රාජ්‍ය ඡායාරූප උපදේශක සභාවේ කාර්යභාරය වන බවත්, මෙවර රාජ්‍ය ඡායාරූප උළෙල covid-19 වසංගත තත්ත්වයන් හේතුවෙන් තත්‍යසම (virtual) තාක්ෂණයට අනුව සංවිධානය කළ බවයි. ඒ සඳහා උපදේශක සභාවේ සාමාජිකයින් කළ කැපවීම අගය කළ යුතු බවය.



විවෘත අංශයේ ප්‍රථම ස්ථානය දිනාගත් සේයාරුව - සුදානන්ත් කේතීශ්වරනාදන්



රාජ්‍ය ඡායාරූප උපදේශක සභාවේ සභාපති ප්‍රසන්න හෙන්නායක



ඡායාරූපාභිමානි ගෞරව සම්මානය හිමිකර ගත් ගුණදාස හෙට්ටිආරච්චි

ඡායාරූප කලාවේ නිරත ශ්‍රී ලාංකේය ඡායාරූප ශිල්පීන්ගේ නිර්මාණශීලීත්වය විනිවිද භාවයකින් යුක්තව දැකිය හැකි පරිණත විනිශ්චය මණ්ඩලයකින් එම නිර්මාණ අගයමින් නිසි වටිනාකම් ලබා දී තිබීම මෙහි විශේෂත්වයයි.

ජාතික මෙන්ම ජාත්‍යන්තර වශයෙන් සම්මානයට පාත්‍ර වූ ඡායාරූපකරණය පිළිබඳ ජ්‍යෙෂ්ඨයකු වන ගුණදාස හෙට්ටිආරච්චි ශූරීන් වෙත ඡායාරූපාභිමානි ගෞරව සම්මානය මෙහි දී පිරිනැමිණ.

නිසල රූප රාමුව කෙරෙහි අපරිමිත ගෞරවයක් දක්වමින් එහි කලාත්මක මෙන්ම තාක්ෂණික මෙහෙවරක යෙදෙන ගුණදාස හෙට්ටිආරච්චි මහතා 1938 මාතර දිස්ත්‍රික්කයේ කැකනදුර ග්‍රාමයේ ජන්මලාභය ලැබීය. මොටාගෙදර රජයේ විද්‍යාලය, කළුබෝවිල බුද්ධඝෝෂ විද්‍යාලය සහ වැල්ලවත්ත අර්තුසා යන විද්‍යාලවලින් අධ්‍යාපන ලැබූ හෙතෙම රජයේ ලලිත කලා ආයතනයට බැඳී ඡායාරූපකරණය පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමාවක් හැදෑරීය. එය ඔහුගේ ජීවිතයේ හැරවුම් ලක්ෂය බවට පත් විය. පසුව විල්සන් හැගොඩ සූරීන්ගේ චින්තනයෙන් පොහොසත් වූ 'කැමරා ළමා සමාජය'ට වර්ෂ 1964 දි සම්බන්ධ වීමට ඔහුට වාසනාව උදාවිය. ශාස්ත්‍රීය අධ්‍යාපනයෙන් ශික්ෂිත හෙතෙම ප්‍රායෝගිකව ඡායාරූපකරණයේ නියැළෙමින් ලාංකේය ඡායාරූප ක්ෂේත්‍රයට ඉටු කළ විශිෂ්ට මෙහෙවර ඇත්තෙන්ම අගය කළ යුතුය.

වැල්ලවත්ත ඇක්මී ඡායාරූපගාරය හා මරදාන ඩොනල්ඩ් සහ සමාගම ආදි කීර්තිමත් ආයතනයන්හි සේවය කිරීමෙන් සිය ශිල්පීය කුසලතාවය වඩවාගත් හෙතෙම පොටෝ ටෙක්නිකා (photo technica) ආයතනයේ අධිපති ෆෙඩ්.ආර් මල්වැන්න යටතේ සිනමා කැමරා තාක්ෂණය පිළිබඳව හැදෑරුවේය. පසුව ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ ඇඟිලි සලකුණු අංශයේ සම්පත් දායකයකු වශයෙන් වසර 35ක පමණ කාලයක් ජාතික මෙහෙවරක නිරත විය.

ජාතික මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ඡායාරූපකරණය පිළිබඳ කීර්තිය හිමිකරගත් හෙට්ටිආරච්චි මහතා සිය නිර්මාණාත්මක ඡායාරූප ලෝකයේ බොහෝ රටවල ප්‍රදර්ශනය කිරීමට සමත් විය.

ඉන් හසල අත්දැකීම් සම්භාරයක් කැටිකොටගත් හෙතෙම AFIAP හෙවත් ජාත්‍යන්තර ඡායාරූප කලා සංගමය විසින් පිරිනමන සම්මානයෙන් ද, HON FAG හෙවත් පාකිස්තාන ඡායාරූප ශිල්පීන්ගේ සංගමයේ ගෞරව සම්මානයෙන් ද පිදුම් ලැබීය. වර්ෂ 1987 දී බ්‍රිතාන්‍ය රාජකීය ඡායාරූප සංගමයේ සාමාජිකත්වය ලබාගත් හෙට්ටිආරච්චි මහතා කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයනාංශය ගෞරව සම්මානයෙන් ද ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ ANPS සහ FNPAS යන ගෞරව සම්මානයෙන් ද පිදුම් ලැබීය.

හෙට්ටිආරච්චි මහතා ෆොටෝ ෆොකස් (Foto Focus) නමින් 1968 දී කොළඹ කොටුවේ චිත්‍රාගාරයක් ආරම්භ කළ අතර, දේශීය ඡායාරූප කලාවට මෙන්ම වාණිජ අංශයට සේවාවන් ලබා දීමේ පුරෝගාමියකු විය. 2018 දී හෙට්ටිආරච්චි මහතා විසින් ඡායාරූප ක්ෂේත්‍රයට සිදු කරනු ලැබූ විසල් මෙහෙවර අගයමින් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව කලාභූෂණ රාජ්‍ය සම්මානයෙන් පිදුම් ලැබීය. මේවන විට 82 වියේ පසුවන ජී.හෙට්ටිආරච්චි මහතා රාජ්‍ය ඡායාරූප උපදේශන සභාවේ සක්‍රිය සාමාජිකයකු වශයෙන් වසර ගණනාවක සිට කටයුතු කරමින් සිටී.

ස්වකීය ජීවිතය ඡායාරූප කලාව, ශිල්පය හා කර්මාන්තය වෙනුවෙන් කැප කළ ජී.හෙට්ටිආරච්චි ශූරීන්ට ඡායාරූපාභිමානි ගෞරව සම්මානයෙන් පුදනු ලැබීම පිදිය යුත්තන් පුදනු ලැබීම මොනවට පසක් කරන්නකි.

මෙම උලළේදී රූපාවලෝකන ශාස්ත්‍රීය සංග්‍රහය එළිදැක්වීම ද සිදු විය. මේ අවස්ථාව සඳහා ඡායාරූප ශිල්පීන් මෙන්ම රාජ්‍ය ඡායාරූප උපදේශක සභාවේ සභාපති ප්‍රසන්න හෙන්නායක, ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ සභාපති මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ ඇතුළු සම්භාවනීය අමුත්තන් රාශියක් පැමිණ සිටියහ.



කුසලතා සම්මාන දිනාගත් සේයාරුවක් - සෝමසුන්දරම් සුරේෂ්




කුසලතා සම්මානය දිනාගත් සේයාරුවක් - උදාර ඔෂාන් නිශ්ශංක



කුසලතා සම්මානය දිනාගත් සේයාරුවක් - සින්නු රාමදාස්

## සැමරුම් කිත් රැස




මහාචාර්ය **ජයන්ත අමරසිංහ**

## ධර්ම ශාස්ත්‍ර උල්පත

ලංකාවේ මෑත අතීතයේ සිදු වූ ධර්ම ශාස්ත්‍ර පුනර්ජීවනය අප්‍රතිහත පුද්ගල පරිශ්‍රමයක ප්‍රතිඵලයකි. වැලිවිට සරණංකර සංඝරාජ හිමිපාණෝ එහි නියමුවාණෝය. ධර්ම ශාස්ත්‍ර අන්ත පරිහානියකට පත්ව තිබූ මහනුවර රාජධානි සමයෙහි උන්වහන්සේ විසින් අනේක ප්‍රකාර දුක් කම්කටොලු උසුලමින් දියත් කරන ලද ධර්ම ශාස්ත්‍ර පුනර්ජීවන ව්‍යාපාරය සිය වසක පමණ කාලයක් ඇතුළත දීප ව්‍යාප්තව ධර්ම ශාස්ත්‍රාලෝකය පැතිරවූ ප්‍රදීපස්ථම්භයක් බවට පත් විය.

ලංකාවේ ප්‍රදේශ නාම විවිධ කරුණු හේතු කොට ගෙන ප්‍රසිද්ධියට පත්ව තිබෙන අතර මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ ප්‍රදේශ නාමය ප්‍රසිද්ධියට පත්ව තිබෙන්නේ මෝඩකම්වලටය. එවන් සරදමකට බඳුන් වූ තුම්පනේ ප්‍රදේශයේ වැලිවිට නම් ග්‍රාමයේ කුලතුංග නම් මුදලි කෙනෙකුට දාව කුලතුංග බණ්ඩා කුමරු උපත ලද්දේ 1698 වර්ෂයේ ජුනි මස 19 වන දිනය. එරමුදු ලියද්දේ උපාසකරාලගෙන් සිංහල හෝඩිය සහ නම් පොත, මඟුල් ලකුණ ආදි මූලික පොත් පෙළ කියවා ගෙන මුරුද්දෙණියේ හේරත් ගෙදර ගුරුන්නාන්සේගෙන් වැඩි දුර ඉගෙනුම ලැබූ බව එක් ප්‍රවාදයකින් පැවසෙන අතර රාජ සේවයේ නිරතව සිටි සිය දෙටු සොහොයුරා සමඟ රජ මාලිගයෙහි විසූ බව තවත් ප්‍රවාදයකින් පැවසේ. ළමා වියේ සිටම ගිහි ගෙයි රැඳෙන රිසියක් නොපෙන්වූ කුලතුංග බණ්ඩා 1714 වර්ෂයේ සොළොස් හැවිරිදි වියේදී සූරියගොඩ කිත්සිරිමෙවන් රාජසුන්දර සාමීන් සමීපයෙහි සරණංකර නමින් සසුන් බිටම පිවිසිණ. එවක තම ශාස්ත්‍ර පිපාසය සන්සිඳවිය හැකි එකදු භික්ෂුවක නොවූයෙන් කිසියම් වරදකට මාකෙහෙල්වල සිරගත කරනු ලැබ සිටි ලෙව්කේ රාල වෙතින් රාජ උදහසට ලක් වීමේ තර්ජන තිබියදීත් බාලාවතාරයේ නාම කාණ්ඩය හදාළ බවත් ඒ සඳහා අපමණ වෙහෙසක් දැරූ බවත් සංඝරාජ සාධු චරියාවෙහි දැක්වේ. ඒ විස්තරයට අනුව සරණංකර සාමණේරයෝ 'ඒ මහකෙහෙල්වල ගමට සමීපව තිබෙන අලගල්ලේ කන්දේ අඹ ගස මුල ගල් ලෙණෙහි පැංචකු සමඟ අප්‍රසිද්ධ වෙසින් පොරොත්තුවැ සිටැ ගෙනැ, ඒ ප්‍රස්ථාවට පිණ්ඩපාත කිරීම නැතත් පාත්‍රයෙන්ම වළඳන නිසා තමන් වහන්සේට යැපෙන පමණට ඒ ගම්වැසි සැදැහැතියන් විසින් පාත්‍රයෙන් ගෙනවුත් දෙන භෝජනය ළඟින සිටින මඳින් මඳවත් දෙවේලටම දෙමින්, ඇතැම් විටෙක අවශිෂ්ටය දිය වත් කොට තළු තැටියෙන් කැඳ වශයෙන් වළඳා' ජීවත් වූහ. මෙසේ අපමණ දුක් ගැහැට විඳිමින් ලෙව්කේ රාල වෙතින් ලද ඉගෙනුම අවසන් වූ කල සරණංකර සාමණේරයෝ පල්කුඹුරේ අත්ථදස්සි සාමණේර ගුරුන් වෙත පැමිණියහ. පල්කුඹුරේ අත්ථදස්සි සාමණේර හිමි ලෙව්කේ රාලගේ ගුරු වූ වටබුලුවේ මහසාමිගේ ප්‍රධාන ශිෂ්‍යයාය. උන්වහන්සේ වෙතින් සරණංකර හිමියෝ බාලාවතාරයේ ඉතිරි කොටස හදාර නිම කළහ. ධර්ම ශාස්ත්‍ර අධ්‍යයන ආරම්භයේ පටන් සරණංකර හිමියන් ඇසුරේ තවත් සද්ධිවහාරික සාමණේරවරුන් දෙනමක් වූ අතර යථා කාලයේ තවත් සද්ධිවිහාරිකයකු එක් වීමත් සමඟ සිල්වත් සිවු නමකගේ සමාගමයක් නිර්මාණය විය. සිටිනාමළුවේ ධම්මජෝති, ඉලිපැන්ගමුවේ සහ කදිරාගොඩ යන සාමණේර හිමිවරු ඒ සමාගමයට අයත් වූහ. පිණ්ඩපාතයෙන් යැපෙමින් සතර කෝරලයේ සහ සත්කෝරලයේ පින්කම් සඳහා වැඩමකළ මේ සාමණේරවරුන් කෙරෙහි පැහැදුණු පිරිස් උන් වහන්සේලාගේ සමගමයට එකතු වූහ. එසේ එකතු වූ පිරිස් ධර්මශාස්ත්‍ර අධ්‍යයනයෙහි පූර්ණකාලීනව නිමග්න වීමට කටයුතු සැලසීම නිසා පැවති සීමිත ග්‍රන්ථ පිටපත් කිරීම මෙන්ම ඒවාට ව්‍යාඛ්‍යාන සම්පාදනය කිරීමද බහුල වශයෙන් සිදුවිය. සමහර ග්‍රන්ථ අලුතෙන්ම ලියවිණ. සද්ධර්ම සාරාර්ථ සංග්‍රහය, භේසජ්ජ මංජුසා සන්නය, අභිසම්බෝධි අලංකාරය, රූප මාලාව, මධුරාර්ථ ප්‍රකාශනි, මුනිගුණාලංකාරය, අභිසම්බෝධි අලංකාරය උන්වහන්සේ අතින් සම්පාදනය වූ ග්‍රන්ථයෝය.

සිල්වත් සමාගමයේ සාමාජික භික්ෂූන් වහන්සේ අනුක්‍රමයෙන් වැඩි වත්ම සරණංකර හිමියන් හඟුරන්කෙතට වැඩම කොට දමුණුවැව අසල කුටි පෙළක් තනවා ධර්ම ශාස්ත්‍ර ඉගැන්වීමේ කටයුතු තවත් ව්‍යාප්ත කිරීම නිසා උන්වහන්සේගේ උත්සාහය දිනෙන් දින සපල වනු දුටු මල්වතු අස්ගිරි විහාර වාසී ගණින්නාන්සේලා නරේන්ද්‍රසිංහ රජු වෙත සාවද්‍ය කරුණු පැමිණිලි ලෙස ඉදිරිපත් කළහ. එවක කන්ද උඩරටට සේන්දුව සිටි ජාකොමේ ගොන්සල්වේස් ප්‍රමුඛ කතෝලික පූජකවරුන්ද ස්වකීය ආගමික ප්‍රචාරක කටයුතුවලට සරණංකර හිමියන්ගේ ධර්ම ශාස්ත්‍ර පුනර්ජීවන ව්‍යාපාරය බාධාවක් බව පෙනී ගිය හෙයින් සරණංකර හිමියන් පිළිබඳ රජුට ගතු කී බව පැවසේ. මේ ව්‍යාජ තොරතුරු අවිචාරවත් ලෙස පිළිගත් නරේන්ද්‍රසිංහ රජ සරණංකර හිමියන් ලග්ගලට පිටුවාහල් කළේය.



පූජ්‍ය වැලිවිට සරණංකර සංඝරාජ හිමිපාණෝ

මෙසේ කාලය ගෙවී යන අතරේ ඉන්දියාවේ සිට පැමිණි බමුණකු කී සරල ශ්ලෝකයක අරුත පහදා දීමට සමත් කිසිවකු මහනුවර නොවූයෙන් ඊට එකම සුදුස්සා සරණංකර හිමියන් බව පළිපාන මොහොට්ටාලගෙන් දැන ගත් නරේන්ද්‍රසිංහ රජ සරණංකර හිමියන්ට පණිවුඩ යවා ගෙන්වා ගෙන්වා ගත්තේය.

ඒ අවස්ථාවේ ඉතා විචක්ෂණ ලෙස ශ්ලෝකයේ අරුත පහදා පාලි සිංහල සංස්කෘත භාෂාවලින් උන්වහන්සේ බණ කියා සියල්ලන් විස්මයට පත් කළ බව පැවසේ. සරණංකර හිමියන්ගේ පාණ්ඩිත්‍යය ගැන පැහැදුණු රජතුමා එතැන් පටන් සරණංකර හිමියන්ට ස්වකීය ධර්ම ශාස්ත්‍ර පුනර්ජීවන ව්‍යාපාර නොමසුරු සහයෝගය ලබා දුන්නේය.

සසුන්ගත වී දොළොස් වසරක් ගත වන විට සියලු සතුරු බලවේග පරාජය වී සරණංකර හිමියන්ගේ ධර්ම ශාස්ත්‍ර පුණර්ජීවන ව්‍යාපරයට පූර්ණ රාජ්‍ය අනුග්‍රහය හිමි විය. සරණංකර හිමියන්ට විරුද්ධවාදීකම් කළ උභය විහාරවාසී සාමණේරවරුන් ද සිල්වත් සමාගමට එක්වීමෙන් දිනෙන් දින සරණංකර හිමියන්ගේ ව්‍යාපාරය ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන්නට විය. නරේන්ද්‍රසිංහ රජුගේ අන්ග්‍රහය යටතේ අම්බැක්ක අසල නියමකන්ද නම් ස්ථානයේ පිරිවෙනක් තනවා ධර්ම ශාස්ත්‍ර අධ්‍යාපනය තවදුරටත් ව්‍යාප්ත කිරීමට සරණංකර හිමියෝ සමත් වූහ.

මේ සියලු කටයුතු මෙසේ සිදුවන අතරවාරයේ ලක්දිව භික්ෂු උපසම්පදාව ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා කිහිප විටක්ම අනේක ප්‍රකාර උත්සාහ දරූ සරණංකර හිමියෝ අවසානයේ තම උත්සාහය මස්තකප්‍රාප්ත කර ගැනීමට සමත් වූහ. පන්ස් පස්වන වියේදී උපසම්පදාව ලද සරණංකර හිමියෝ කීර්ති ශ්‍රී රාජසිහ රාජ්‍ය සමයේ දී සංඝරාජ පදවියට පත් වූහ.

මෙසේ කටයුතු කරගෙන යන අතරවාරයේ නැවත වරක් රාජ නිරපරදේ රාජ උදහසට ලක් වන සඟ රජ හිමියෝ පෙර පරිදිම තම ශාස්ත්‍ර ඥානයේ මහිමයෙන් නිර්දෝෂී බව ඔප්පු කිරීමට සමත් වූහ. සරණංකර හිමියන්ගේ ධර්ම ශාස්ත්‍ර පුනර්ජීවන ව්‍යාපාරය රුහුණ, සතර කෝරලය, සතර කෝරලය පුරා ව්‍යාප්ත විය. තම සද්ධිවිහාරික සිටිනාමළුවේ ධම්මජෝති හිමියන් ප්‍රමුඛ කොට ගෙන දකුණු ප්‍රදේශයේ ව්‍යාප්ත වූ ධර්ම ශාස්ත්‍ර ව්‍යාපාරය විසිවන සියවසේ මෙරට සිදු වූ මහත් ශාස්ත්‍ර පුනර්ජීවන ව්‍යාපාරයට ප්‍රතිෂ්ඨා විය. එනයින් සරණංකර සංඝරාජ හිමියෝ නූතන ශාස්ත්‍ර පුනර්ජීවන ව්‍යාපාරයේ ආදි කර්තෘ ලෙස සදා බුහුමණට ලක්විය යුත්තෝය.

**කථානායකවරයකුගේ ජීවිතය අහිමි කළ විවාදය**




19 පිටුව

**මහාචාර්ය රෝහණධීර වැඩියෙන්ම ආදරේ පොත්වලට**



20 පිටුව

**හර්තාලයට දැන් වසර 67යි**



21 පිටුව

# කොවිඩ් නැතත් කොවිඩ් නිසා බැට කන රටවල් දහයක්

**කොවිඩ් වංසගතය තවමත් ලෝව පුරා පැතිරෙමින් තිබේ. මේ වන විට සමස්ත ආසාදිතයන් සංඛ්‍යාව කෝටි දෙක ඉක්මවා ඇති අතර, මරණ සංඛ්‍යාව මිලියනයකට ආසන්න වෙමින් තිබේ.මෙලෙස ලොව පුරා රටවල් අතරින් අති බහුතරයක් කොවිඩ් හේතුවෙන් පීඩා විඳිමින් සිටින අතර එකද කොවිඩ් රෝගියකු හෝ වාර්තා නොවූ රටවල් දහයක් කොවිඩ් හේතුවෙන් බලවත් ලෙස පීඩා විඳිමින් සිටින බව පැවසුවහොත් බොහෝ දෙනා පුදුමයට පත්වනු ඇත.**

එකද රෝගියකු හෝ වාර්තා නොවූ රටක් කොවිඩ් හේතුවෙන් පීඩා විඳින්නේ කෙසේදැයි අසනු ඇත.

දැනට ලෝකයේ එකද කොවිඩ් ආසාදිතයකු හෝ වාර්තා නොවූ රටවල් දහයක් තිබේ. මේ රටවල් දහයම පැසිෆික් කලාපයේ පිහිටා ඇති කුඩා රටවල්ය. නම ඇසූ පමණින් බොහෝ දෙනා දන්නේද නැත. පැසිෆික් කලාපයේ ඉතා කුඩා රටවල් වන පලාවු, මයික්‍රොනීසියා, මාර්ෂල් දූපත්, නායුරු, කිරිබැටි, සොලමන් දූපත්, තුවාලු, සමෝආ, වනාටු සහ ටොංගා යන රටවල් එකද කොවිඩ් රෝගියකු හෝ වාර්තා කර නැත. එහෙත් මේ රටවල් මේ වන විට පසුවන්නේ ඉතා අසීරු ආර්ථික, සාමාජීය තත්ත්වයකය. ඊට හේතුව අන් කිසිවක් නොව කොවිඩ් වසංගතයයි.

මේ බොහෝ රටවල ප්‍රධාන ආදායම් මාර්ගය වන්නේ සංචාරක කර්මාන්තය වන අතර කොවිඩ් හේතුවෙන් මුළු ලෝකයේම අංක එකට පහර වැදී ඇති කර්මාන්තය වන්නේද සංචාරක කර්මාන්තයයි. කොවිඩ් ආසාදිතයන් වාර්තා නොවූවද ගුවන් ගමන් නිසි පරිදි ක්‍රියාත්මක නොවීම, බොහෝ රටවල සංචරණ සීමා ක්‍රියාත්මක වීම සහ සමාජ දුරස්තතාව යනාදී කරුණු හේතුවෙන් කොවිඩ් නොමැති මේ රටවල සංචාරය කිරීමටද කිසිවකු එක්වන්නේ නැත.

පලාවු රාජ්‍යයට 2019 වසරේදී පැමිණි සංචාරකයන් සංඛ්‍යාව 90,000 ඉක්මවා තිබේ. මේ සංඛ්‍යාව එරට ජනගහනය මෙන් පස් ගුණයකි. ඒ අනුව තද නිල් අහසක් සහ සුදු වැල්ලෙන් යුතු මුහුදු තීරයක් සහිත මේ කුඩා රට සංචාරක කර්මාන්තයෙන් ලබන ආදායම ගැන දළ අදහසක් ලබා ගත හැකි වනු ඇත. මේ වන විට පලාවු රාජ්‍ය තම දේශසීමා විවෘත කර බලා සිටියද එකද සංචාරකයෙක් හෝ එරටට පැමිණ නැත. එරටේ හෝටල් සේවකයන් සහ හිමියන් ඉතා අසීරු තත්ත්වයකට පත්ව ඇති අතර, පොදුවේ මුළු රටම ආර්ථික අස්ථායී තත්ත්වයකට පත්ව තිබේ. විශේෂම කරුණ වන්නේ මේ එකද කොවිඩ් රෝගියකු හෝ වාර්තා නොවූ තත්ත්වයක් තුළ බවයි.

ලෝකයේ දැනට කොවිඩ් ආසාදිතයන් අඩුවෙමන් වාර්තා වූ කලාපය ලෙස පැසිෆික් කලාපය දැක්විය හැකිය. එම කලාපයේ ඇති ප්‍රධාන රටවල් වන ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තයද පොදුවේ වාර්තා කර සිටියේ රෝගීන් අඩු ප්‍රමාණයකි. මේ කලාපයට වයිරසය ව්‍යාප්ත වූයේද සූදානම් වීමට කාලය ලබා දෙමිනි. එබැවින් ආසාදිතයන් වාර්තා නොවීම අතින් මේ රටවල් වාසනාවන්ත වුවද සමස්ත ලෝකය මුහුණ දෙන අර්බුදයෙන් ගැලවීමට කිසිදු රටකට නොහැකි වී තිබේ.

කොවිඩ් සාර්ථකව මර්දනය කළ බව ප්‍රකාශ කරමින් නවසීලන්තය ට්‍රැවල් බබල් සංකල්පය යටතේ ආරක්ෂිත රටවල සීමිත ගුවන් ගමන් ආරම්භ කරන බව කලින් ප්‍රකාශ කර සිටි බැවින් මේ කුඩා පැසිෆික් රාජ්‍යයන්ට සහනදායී සිතිවිලි පහළ වුවද ඕක්ලන්තයේ යළිත් පැතිරී යන වයිරසය ඒ සියලු සිහින බිඳ දමා තිබේ.

මේ බොහෝ රටවල් පවසන්නේ එකද කොවිඩ් රෝගියකු වාර්තා නොවූවද තමන්ගේ ආර්ථිකය මෙන්ම එදිනෙදා ජන ජීවිතය ද කොවිඩ් හේතුවෙන් විනාශ වී ගොස් ඇති බවය.



පාළුවට ගිය නායුරු මුහුදු වෙරළක්

# කමලා හැරිස් බයිඩන්ට උදව් කරයිද ලකුණු කපයිද?



සක්වළගල

● ටිරෝනි වෑවලගේ

**ඔබාමාගේ කීර්තිමත් පාලනයෙන් පසු අහිමි වී ගිය පාලන බලය යළි ලබා ගැනීමට ඩිමොක්‍රටික්වරු කළ හැකි සෑම දෙයක්ම කරමින් සිටිති. ඔවුන්ට සෑහීමකට පත්විය හැකි හොඳම අපේක්ෂකයා ලෙස ජෝ බයිඩ්න් තෝරා ගැනීමෙන් පසු මේ වන විට ඔවුන් උප ජනාධිපති අපේක්ෂිකාව ලෙස තවත් අයෙකුගේ නම යෝජනා කර තිබේ. ඒ මේ වන විට මුළු ලෝකයම වැඩි විස්තර සොයමින් සිටිනා කමලා හැරිස්ය.**

උප ජනාධිපති අපේක්ෂිකාව ලෙස කමලා හැරිස් නම් කිරීමත් සමගම යළිත් වතාවක් ජෝ බයිඩ්න් වෙත අමෙරිකාවේ පමණක් නොව මුළු ලෝකයේම අවධානය යොමු විය. මේ වනවිට තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීම ආරම්භ වීමට ඉතා ආසන්න මොහොතක ට්‍රම්ප් තමා වෙත අවධානය දිනා ගැනීමට යොදමින් සිටි බොහෝ උප්පරවැට්ටි යම් අන්දමින් සාර්ථකත්වයට ළඟා වෙමින් පැවති අවස්ථාවක බයිඩ්න් කමලා හැරිස් නම් වූ උප ජනාධිපති උපක්‍රමයෙන් යළිත් තමා වෙත අවධානය දිනා ගැනීමට සමත් වූයේය.

කමලා හැරිස් ලෝකයට ආගන්තුක වුවද අමෙරිකානු ජනතාවට නම් ආගන්තුක චරිතයක් නෙවේ. ඇය 2017 සිට සක්‍රිය දේශපාලනයේ නිරතව සිටින්නේ බොහෝ අධ්‍ය
වියැති කමලා උපත ලබන්නේ අමෙරිකාවේ කැලිෆෝර්නියාවේය. නමින් කමලා නම් වුවද ඇය පැහැදිලිවම අමෙරිකානු ජාතික කාන්තාවකි. ඇයට මේ ආසියාතික ආකර්ෂණීය නම හිමිවන්නේ ඇයගේ මවගෙනි. ඇයගේ මව ශ්‍යාමලා ගෝපාලන් හැරිස් ඉන්දියාවේ චෙන්නායිහි උපත ලැබූ කාන්තාවකි. ඇය අමෙරිකාවට සංක්‍රමණය වීමෙන් පසු වැඩි දුර අධ්‍යාපනය ලබා ජීව විද්‍යාඥවරියක් බවට පත්වන්නීය. අමෙරිකාවේදී ඩොනල්ඩ් ජෙස්පර් හැරිස් නම් වන ජැමෙයිකානු සම්භවයක් සහිත අමෙරිකානුවා සමඟ විවාහ වීමෙන් ඇය ලැබූ දියණිය වන්නේ කමලාය.

ඒ අනුව කමලා හැරිස්ට ලෝක මට්ටමේ නෑකම් බොහෝය. එය එක් අතකින් අප්‍රිකානු සම්භවයක් සහිත ඔබාමාට සමාන කළ හැකිය. ඔබාමාට තිබුණේ අප්‍රිකානු නෑකම් පමණි. දැන් කමලාට ඉන්දීය මෙන්ම ජැමෙයිකානු නෑකම්ද තිබේ.

නීතිවේදිනියක් ලෙස ක්‍රියාකළ කමලා දේශපාලනයට පිවිසෙන්නේ 2017 වසරේදීය. එහිදී කැලිෆෝර්නියාවේ කනිෂ්ඨ සෙනෙට්වරියක් ලෙස කටයුතු කරන ඇය එක්වරම ලෝක ප්‍රසිද්ධ වන්නේ බයිඩ්න්ගේ උප ජනාධිපති ලෙස නම් කිරීමත් සමඟිනි.

2015දී රිපබ්ලිකන් ට්‍රම්ප් ධවල මන්දිරයට පිවිසෙන්නේ තියුණු තරගයකින් පසු ඩිමොක්‍රටික් අපේක්ෂිකාව වූ හිලරි ක්ලින්ටන් පරාජය කරමිනි. සැබවින්ම එම ජයග්‍රහණය ඩිමොක්‍රටික්වරුන් විසින් සලකනු ලැබුවේ තමන් සතු වූ ජයග්‍රහණය උදුරා ගත්තා වැනි හැඟීමකින් යුතුවය. එතැන් සිට ඉතිහාසයේ පෙර නොවූ විරු ලෙස පත් වූ අමෙරිකානු ජනාධිපතිවරයාට බාධා කිරීමට ඩිමොක්‍රටික්වරු කටයුතු කළහ. ට්‍රම්ප් ජනාධිපතිවරයාට සීඑන්එන් සේවයෙන් කිසිදු ඉස්පාසුවක් නොලැබෙන තරමට ප්‍රහාර එල්ල විය. සෙනෙට් මණ්ඩලයේ ප්‍රධානී නැන්සි පෙලෝසි ට්‍රම්පට කොතරම් බාධා කළේද යත් ඔහුගේ කතාවේ පිටපත මුළු මහත් සභාව සහ මාධ්‍ය ඉදිරියේ ඉරා දමන තරම් සැහැසි ලෙස කටයුතු කළාය.

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සහය ට්‍රම්ප්ට බව හොඳින් දැන සිටියද ඔහුට විරුද්ධව දෝෂාභියෝගයක් පවා ගෙන ඒමට පෙලෝසි ප්‍රමුඛ ඩිමොක්‍රටික්වරු කටයුතු කළහ. මේ සියල්ල පෙන්නුම් කරන්නේ මෙවර කෙසේ හෝ ජනාධිපතිවරයා තමන්ගේ පිලෙන් පත් කර ගැනීමට ඩිමොක්‍රටික්වරු කළ හැකි සියල්ල කරමින් සිටින බවය. ඉතින් කමලා හැරිස්ද ඒ වැඩපිළිවෙළේ තවත් එක් පියවරක් බව පැහැදිලිය.



කමලා හැරිස් කුඩා කාලයේ මව සමඟ

කමලා හැරිස් තෝරා ගැනීම සම්බන්ධව මත පළ කරන විචාරකයන් පවසා සිටින්නේ ඇය ඉතා ප්‍රවේශම්කාරී සහ මැනවින් සිතා බලා කරන ලද තෝරා ගැනීමක් බවය. එමෙන්ම එය ඉතා ප්‍රායෝගික තෝරා ගැනීමක් බවද ඔවුහු පවසති.

මේ තෝරා ගැනීම මත කමලා හැරිස්ට අමෙරිකානු ජනාධිපති පුටුවට කෙටි මාර්ගයක් විවෘත වන බවද විචාරකයෝ පෙන්වා දෙති. ඇතැම් විට බයිඩ්න් මෙවර මැතිවරණයෙන් පරාජයට පත්වුවහොත් කමලාට යළිත් අවස්ථාවකදී ජනාධිපති ධූරය සඳහා තරග කිරීමේ දොරටු මෙමගින් විවර වී තිබේ. බයිඩ්න් මෙවර ජයග්‍රහණය කළහොත් ධූර කාල දෙකම හෙබවීමේ අවස්ථාව ඔහුට උදා වුවහොත් යළිත් ඉන්පසු අපේක්ෂකත්වය සඳහා කමලාට දොරටු විවර විය හැකිය.

මේ මත අනුව කමලා හැරිස් යනු අමෙරිකානු දේශපාලනයේ අනාගත කැපී පෙනෙන චරිතයක් බවට සැක නැත. කාන්තාවක් ආකර්ෂණීය චරිතක් බවට පත් කරමින් අපේක්ෂකයන් වෙත ඉදිරිපත් කිරීමට ඩිමොක්‍රටික්වරු උත්සාහ දැරුවේ 2008 තරම් ඈත සිටය. හිලරි ක්ලින්ටන් කෙතරම් සුදුසුකම් සහිත කාන්තාවක් වුවද ජයග්‍රහණය ඇගේ අතැඟිලිවල ගෑවී, ඇයගෙන් මිදී ගියේය. දැන් එම අඩුව පිරවීමට කමලා ඉදිරිපත්ව සිටින්නීය.



කමලා හැරිස් ගේ දෙමවුපියන්

> **කමලා හැරිස් යනු අමෙරිකානු දේශපාලනයේ අනාගත කැපී පෙනෙන චරිතයක් බවට සැක නැත. කාන්තාවක් ආකර්ෂණීය චරිතක් බවට පත් කරමින් අපේක්ෂකයන් වෙත ඉදිරිපත් කිරීමට ඩිමොක්‍රටික්වරු උත්සාහ දැරුවේ 2008 තරම් ඈත සිටය.**

අනික් අතට කමලා හැරිස් යනු අමෙරිකාවේ තරුණ ඡන්ද දායකයන්ට සහ වෙනත් ජාතීන්ට අයත් ඡන්ද දායකයන්ට ඩිමොක්‍රටික් පක්ෂය දැමූ ඇමයි. පසුගිය අවස්ථාවේදී සංක්‍රමණිකයන්ට වැට බඳිමින් ට්‍රම්ප් දැමූ අමෙරිකානු ජාතිකත්ව ඇම අමෙරිකානුවන් ඉතා සාර්ථකව ගිල දැමුවා පරිද්දෙන්ම මෙවර සුළු ජාතීන්ගේ සහ සංක්‍රමණිකයන්ගේ ඡන්ද කඩා ගැනීමට කමලා ඉතා සාර්ථක ඇමක් ලෙස ඩිමොක්‍රටික්වරුන් විසින් යොදවා තිබේ. කමලාට ඇත්තේ බහු ජාතිකත්ව අනන්‍යතාවකි. ඇය එක් අතකින් ආසියාතිකය. එක් අතෙකින් කැරිබියන්ය. හැම අතින්ම ඇමරිකන්ය. ඒ අනුව කමලා යනු ඉලක්ක කීපයක් එක් වර අල්ලමින් ගසා දමන ලද බූමරංගයක් වැනිය.

අනික් අතට කමලා යනු තරුණ ආකර්ෂණයකි. ජෝ බයිඩ්න් යනු 77 හැවිරිදි මහල්ලෙකි. ඔහු වියපත් සේ දකින ඡන්ද දායකයන්ට කමලා වෙනුවෙන් ඡන්දය භාවිත කිරීමේ හැකියාව දැන් ලැබෙනු ඇත. මේ අනුව පැහැදිලි වන්නේ කමලා යනු 2017 සිට ඉතා හොඳින් අනාගතය දකිමින් සූදානම් කරන ලද ඡන්ද ගුණ්ඩුවක් බවය.

ඩිමොක්‍රටික්වරු මේ අන්දමින් ඉතා හොඳින් සූදානම්ව සටනට පිවිසෙමින් සිටියද ට්‍රම්ප් ඇතුළු රිපබ්ලිකන්වරුන්ද සටන පහසුවෙන් අතහරින බවක් දක්නට නැත. කොවිඩ් හේතුවෙන් මිනිසුන් ලක්ෂ ගණනින් මිය යමින් සිටියද ට්‍රම්ප් ඒ සියල්ල ගසා දමමින් වරින් වර දේශපාලන යෝධයකු සේ නැගී සිටින බවද දැක ගත හැකිය. ඒ අනුව මෙවර නොවැම්බරයේදීද ලෝකයට හොඳ උණුසුම් මැතිවරණ සටනක් අමෙරිකාවෙන් දැක ගත හැකි වනු ඇත. කමලා නැමති ඡන්ද ගුණ්ඩුවේ ක්‍රියාකාරීත්වය ද පැහැදිලිව දැක ගත හැකි වනු ඇත්තේ එවිටය.

# උතුරු කොරියානු නායකයා දිවියෙන් සමුගන්නා ලකුණු

## දකුණු කොරියාව කියයි

**මිනිස් සමාජය සුන්දර වන්නේ දෙදෙනකු එක හා සමාන නොවන බැවිනි. එනම් සුන්දරත්වය ඇති වන්නේ විවිධත්වය තුළිනි. එසේම ලෝකයේ සෑම රටක්ම එක හා සමාන වන්නේ නම් කිසිවකු පුවත් මවන්නේ නැති වනු ඇති අතර ලෝකය බොහෝ ඒකාකාරීද වනු ඇත. මේ ලෝකයට විවිධත්වය සපයන රටවල් අතරින් උතුරු කොරියාවට හිමි වන්නේ ප්‍රධාන ස්ථානයකි. ඒ ලොව සෙසු බොහෝ රටවලට සාපේක්ෂව වෙනස් මගක ගමන් ගනිමින් වරින් වර පුවත් මවන ප්‍රධාන රටක් බවට උතුරු කොරියාව පත්ව ඇති බැවිනි.**

මීට මාස කිහිපයකට පෙර කොවිඩ් රෝගීන් සම්බන්ධ පුවත් මවමින් කතාබහට ලක් වූ උතුරු කොරියාව ඊට පෙර ලෝකයේ අවධානය දිනා ගත්තේ මිසයිල නිෂ්පාදනය සම්බන්ධයෙනි. උතුරු කොරියානු නායකයා තම ප්‍රධාන එදිරිවාදියා වූ අමෙරිකා ජනාධිපතිවරයා සමඟ සමගි සාකච්ඡා වට කිහිපයක් පවත්වමින් පසුගිය වසර කිහිපය පුරාවට ලෝකයේ අවධානය දිනා ගත්තේය.

දැන් මෙවර යළිත් වරක් උතුරු කොරියාවට ලෝකයේ අවධානය හිමිවෙමින් තිබෙන්නේ ද එහි අපූරු නායකයා මූලික කර ගනිමිනි.

පසුගියදා දකුණු කොරියානු රාජ්‍ය තාන්ත්‍රිකයකු ජනමාධ්‍ය වෙත පවසා සිටියේ උතුරු කොරියාවෙන් ලැබෙන තොරතුරු අනුව එරට රාජ්‍ය නායක කිම් ජොන්ග් අන් දියවැඩියා කෝමා තත්ත්වයේ පසුවන බවට තහවුරු කළ හැකි සාක්ෂි ලැබී තිබෙන බවය. ඒ අතර සඳහන් වූ අලුත්ම තොරතුර වූයේ ඔහු වෙනුවට ඔහුගේ සොහොයුරිය වන කිම් යෝ ජොන්ග් ධූරයේ වැඩ බලමින් සිටින බවට වූ පුවතයි.

ලෝකයට මේ පුවත ගෙන ආවේ චෙන්ග් සොන්ග්-මින් නම් වූ රාජ්‍ය තාන්ත්‍රික නිලධාරියෙකි. ඔහු දකුණු කොරියාවේ හිටපු ජනාධිපති කිම් ඩේ-ජුන්ග් යටතේ සේවය කළ පුද්ගලයෙකි.

චෙන්ග් වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ උතුරු කොරියානු රාජ්‍ය නායකයා කෝමා තත්ත්වයේ පසුවන නමුත් තවමත් ජීවතුන් අතර සිටින බවයි.

දකුණු කොරියාවෙන් ලැබුණු මේ පුවත ලොව පුරා තටු ලබා පැතිරී යෑමට ගත වූයේ සුළු වේලාවකි. එහිදී බොහෝ දෙනා මත පළ කර සිටියේ කිම් ජොන්ග් අන්ට වඩා ඔහුගේ සොහොයුරිය භයානක පුද්ගලයකු බවයි. බොහෝ දෙනා ඇය සම්බන්ධව පවසා සිටියේ ඇය 'ඉතා භයානක පුද්ගලයකු' බවයි. ඇයගේ සහෝදරයා බලයට පත්වූ පසු ඇයද උතුරු කොරියානු පාලනාධිකාරියේ ඉහළ මට්ටමේ කටයුතුවල නිරත වී සිටි අතර එම වකවානුවේ සිදුවූ දේශපාලන ඝාතන රැසකටම ඇය වගකිව යුතු වන බවට පුවත් බොහෝ මාධ්‍යවල දක්නට ලැබිණි.

උතුරු කොරියාවේ පාලන ක්‍රමවේදය අනුව එරට පාලකයන් බිහිවන්නේ එරට ආධ්‍යාත්මික නායකයා වූ කිම් ඉල්-සුන්ග් පවුල වන කිම් පවුලෙනි. කිම් ඉල්-සුන්ග් උතුරු කොරියාව එතෙක් පැවති මාවතෙන් ඉවතට ගෙන කම්කරු පක්ෂය බිහි කරමින් එරට තනි පක්ෂ ක්‍රමයේ වාමාංශික දේශපාලන මාවතට ගෙන ඒමේ පුරෝගාමියා ලෙස සැලකේ. ඔහු දීර්ඝ කාලයක් උතුරු කොරියාව පාලනය කළ අතර





කිම් යෝ ජොන්ග්

ඉන්පසු බලයට පැමිණියේ ඔහුගේ පුත්‍රයා වූ කිම් ජොන්ග්-ඉල් ය. කිම් ජොන්ග්- ඉල් ට දරුවන් තිදෙනෙකු වූ අතර දෙවැනි පුත්‍රයා වූයේ එරට වත්මන් පාලක කිම් ජොන්ග් අන් ය. ඔහු තම වැඩිමහල් පුත්‍රයාට රාජ්‍ය බලය පවරා නොදුන් අතර ඒ වෙනුවට තෝරා ගත් දෙවැනි පුත්‍රයා ඉතා හොඳින් තමාට පැවරුණු කාර්යය මේ දක්වා ඉටු කරමින් සිටියේය.

එහෙත් උතුරු කොරියාවෙන් ඉතා සූක්ෂ්ම ලෙස ලබා ගන්නා සත්‍ය තොරතුරු සමඟ මිශ්‍ර වූ ඕපාදූපද ලොවට පවසා සිටියේ කිම් ජොන්ග් අන් කිසිඳු සෞඛ්‍ය ප්‍රතිපත්ති අනුගමනය නොකළ අයෙකු බවයි. ඔහුගේ කිසිඳු ආහාර පාලනයක් නොපැවති අතර ව්‍යායාම සම්බන්ධයෙන්ද කිසිදු කැමැත්තක් ඔහු තුළ නොපැවති බවද එම තොරතුරුවල සඳහන් විය.

කිම් ජොන්ග් අන් උපත ලැබුවේ 1982 වසරේදීය. ඔහු තවමත් 38 හැවිරිදි නමුත් සෞඛ්‍ය තත්ත්වය අතින් ඉතා දුර්වල අඩියක පසුවන්නේ නිසි සෞඛ්‍ය ඇවතුම් පැවතුම් පවත්වා



කිම් යෝ ජොන්ග් ස්වකීය සොහොයුරා සමඟ

### නිසි සෞඛ්‍ය ඇවතුම් පැවතුම් පවත්වා නොගැනීම නිසා කිම් ජොන්ග් අන් දුර්වල සෞඛ්‍ය තත්ත්වයක

නොගැනීම නිසා බව පැවසේ.

මේ වන විට උතුරු කොරියාවේ පාලන කටයුතු මෙහෙයවමින් සිටින ඔහුගේ සොහොයුරිය උතුරු කොරියාවේ දෙවැනි අධ්‍යාත්මික නායකයා ලෙස සැලකෙන කිම් ජොන්ග් - ඉල් ගේ තෙවැනි දරුවාය.

උතුරු කොරියාව වාමාංශික ධාරාවේ පාලනයට පිවිසීමෙන් පසුව ලෝකයේ සෙසු රටවල් සමඟ ගනුදෙනු අවම කළ අතර දැඩි පුවත් වාරණයක්ද රට තුළ ක්‍රියාත්මක විය. ඒ අන්දමින් ජනතාව පාලන රටාවට අනුගත කළ එරට පාලකයෝ ලෝකයේ සෙසු රටවල පාලන ක්‍රමවේදයෙන් බැහැරව ස්වාධීන, ස්වයංපෝෂිත ආර්ථික රටාවක් සහිත රටක් බිහි කළහ. එහෙත් මේ ගමනේදී ඔවුන්ට මනුෂ්‍ය ඝාතන පවා කිරීමට සිදුවූ බවත්, මේ වන විට එරට රාජ්‍ය නායක ධූරයේ වැඩ බලන කිම් යෝ ජොන්ග්ද එවැනි ඝාතන සඳහා වගකිව යුතු චරිතයක් බවත් ඇතැම් වාර්තාවල සඳහන් වී තිබිණි.

අනෙක් වැදගත්ම කරුණ වන්නේ කිම් ජොන්ග් ඉල්ගේ දරුවන් තිදෙනාටම දරුවන් නොමැති වීමය. එබැවින් දැනට එරට බලය හොබවන මේ සහොදර සහෝදරියන්ගෙන් පසු කිම් පවුලේ නායකත්වය කාට හිමිවනු ඇතිද යන ප්‍රශ්නයද මතු වනු ඇත.

දකුණු කොරියානු තොරතුරු අනුව ලොව පුරා මාධ්‍ය උතුරු කොරියාව සම්බන්ධව කොතෙක් මත පළ කළද උතුරු කොරියාව මේ දක්වා මේ කිසිවක් සම්බන්ධව අදහස් දක්වා තිබුණේ නැත.

## සක්වළගල

● ටිරෝනි වැවලගේ

# ඔස්ට්‍රේලියා අගමැතිගේ ශ්‍රී ලාංකේය කෑම වට්ටෝරුව



අගමැති මොරිසන් තමා සෑදූ ශ්‍රී ලාංකීය කෑම වේල සමඟ

**සති අන්තය යනු ඕනෑම පුද්ගලයකුගේ විවේකී කාලයයි. මේ විවේකී කාලයේදී තමන්ගේ විනෝදාංශවල නියැළීමට, පවුලේ සාමාජිකයන් සමඟ සතුටෙන් ගත කිරීමට බොහෝ දෙනා දක්වන්නේ දැඩි කැමැත්තකි. මේ කැමැත්ත ඔස්ට්‍රේලියානු අගමැතිවරයාටද එසේමය. ඔහුගේ කැමැත්ත සති අන්තය ස්වකීය පවුලේ සාමාජිකයන් සමඟ ගත කරන අතර තුර තම විනෝදාංශයේ නියැළීමය. ඔහුගේ විනෝදාංශය නම් ආහාර පිසීමයි. රටරටවල ආහාර වට්ටෝරු අත්හදා බලමින් ස්වකීය පවුලේ සාමාජිකයන් සමඟ ඒවා රස බැලීම ඔස්ට්‍රේලියා අගමැති ස්කොට් මොරිසන්ගේ සති අන්ත නිවාඩුවේ කැමතිම අංගයයි. එහෙත් මේ සති අන්තයේ ඔහුගේ විනෝදාංශය ලොව පුරා ප්‍රසිද්ධ වීමට මෙන්ම ඔහුට බැණුම් ඇසීමටද සිදුවන අන්දමේ අත්දැකීමක් එක් කිරීමට සමත් වී තිබේ. ඒ ඔහු ශ්‍රී ලංකාවේ ආහාර වට්ටෝරුවක් පිළියෙල කිරීමත් සමඟිනි.**

අගමැති ස්කොට් මොරිසන් පසුගිය සෙනසුරාදා රාත්‍රියේ තමන් විවේකී සති අන්තය ගත කරමින් සිටි කැන්බරා නගරයේ නැවතුම්පොළේ කුස්සියට වැදී බොහෝ කාර්ය බහුල වූයේ ශ්‍රී ලංකාවේ ආහාර වට්ටෝරුවක් නිම කිරීම අරමුණු කර ගනිමිනි. ඒ වෙනුවෙන් පිළියෙළ කළ තුනපහ වර්ග, කැපූ ලූනු සහ තවත් කුළුබඩු වර්ග ඡායාරූප ගත කිරීමට ඔහු අමතක කළේ නැත. අවසන සාදා නිම කළ ආහාරය ඔහු නම් කළේ ශ්‍රී ලංකාවේ බැටලු මස් බැදුම සමඟ ගෝදම්බ රොටී යනුවෙනි.

තමන් පිසූ ආහාරයට තම දියණියන් දෙදෙනා සහ බිරිය ජෙන් බොහෝ ආසා කළ බවද එම ඡායාරූප සමඟ සටහන් කර සමාජ මාධ්‍ය වෙත යොමු කිරීමටද අගමැතිවරයා අමතක කර තිබුණේ නැත. ස්කොට් මොරිසන් අගමැතිවරයාට 12 සහ 10 වයසේ පසුවන දියණියන් දෙදෙනෙකු සිටින අතර ඔහුගේ බිරිය ජෙනිෆර්ද ඔහු පිසින ආහාරවල රස බැලීමට බොහෝ ප්‍රිය කරන බව සඳහන්ය. එබැවින් ඔහු සෑම අති අන්තයකම මෙලෙස නොයෙක් ආහාර පිසිමින් ස්වකීය පවුලේ සාමාජිකයන්ට පිළිගැන්වීමට කටයුතු කරන බවද වාර්තා වේ.

එහෙත් මෙවර ඔහු තමන් පිසූ ආහාර සමාජ මාධ්‍යවල පළ කිරීමත් සමඟ ඔහුට චෝදනා එල්ල වන්නට වූයේ ඔහුගේ ආණ්ඩුව මේ වන විටත් ශ්‍රී ලාංකීය පවුලක් පුරවැසිභාවය සම්බන්ධ චෝදනා යටතේ ක්‍රිස්මස් දූපත්වල රඳවා තබා සිටින බැවිනි. ඔහුගේ පළකිරීමට ප්‍රතිචාර ලෙස මොරිසන්ගේ ආණ්ඩුව මානුෂිකව කටයුතු කළේ නම් මේ වන විට එම ශ්‍රී ලාංකික පවුලද මෙවැනි ආහාර සදමින් සතුටෙන් සිටින බවට පළ වූ සටහන්ද නොඅඩුව දක්නට ලැබිණි.



# සවුදි කුමරා තම රථය කුරුල්ලන්ට වෙන් කරයි

**මැද පෙරදිග කලාපය යනු තවමත් රාජධානි සංකල්පය යටතේ පවතින රටවල් සහිත කලාපයකි. මේ රටවල් රජවරුන් විසින් පාලනය කරන අතර ඔටුන්න හිමි කුමාරවරුද වෙති. සවුදි අරාබිය මෙන්ම ඩුබායි දේශයද එවැනි රජවරු සහ ඔටුන්න හිමි කුමාරවරු සඳහා ප්‍රසිද්ධ රටවල් දෙකකි. සවුදි අරාබියේ ඔටුන්න හිමි කුමරා තම රට අනාගත ලෝකය කරා ගෙන යෑමේ සැලසුම් සකසමින් සිටින අතර ඔහු විවේචනය කළ මාධ්‍යවේදියකු කැබලිවලට කපා මරා දැමීම සම්බන්ධවද චෝදනා ලැබ සිටියි.**

මේ අතර සවුදියේ ඔටුන්න හිමි කුමරා ද පසුගියදා ප්‍රසිද්ධියට පත්විය. ඒ තම මෝටර් රථයේ කුරුලු කූඩුවක් සෑදූ කුරුල්ලන් දෙදෙනෙකු වෙනුවෙන් එම මෝටර් රථයම කැපකර දෙමිනි.

සවුදි ඔටුන්න හිමි කුමරා යනු එක් වාහනයක පමණක් හිමිකරුවකු නොවනු ඇති මුත්, පසුගියදා තම මෝටර් රථය වෙත ගිය ඔහු දුටුවේ එහි කුරුලු යුවළක් නිවසක් තනා බිත්තරද දමා ඇති බවයි. එය දුටු වහාම ප්‍රීතියෙන් පිනා ගිය කුමරා මේ කුරුලු යුවළට බාධා නොකිරීමට තීරණය කළේ ඔවුන් දරුවන් ලොකු මහත් කර ගන්නා තුරු වෙනත් වාහනයක් භාවිත කරන සිතිවිල්ලෙනි.

ඒ අතරම තම වාහනය මත දුටු අපූරු දසුන වීඩියෝ කිරීමටද ඔහු කටයුතු කළේ කුරුලු දෙමහල්ලන්ගේ කැපවීම ලොවට පෙන්වමිනි. පසුව ඒ වීඩියෝ දසුන් ඉන්ටර්ග්‍රෑම් වෙත යොමු කළේ තමා එම දසුන් දැකීමෙන් අත්විඳි ප්‍රීතිය තවත් මිනිසුන් වෙත ලබා දීමේ අපේක්ෂාවෙනි.

සැබවින්ම එය එසේ වූයේ බොහෝ දෙනා කුරුලු දෙමාපියන්ගේ කාර්යබහුලත්වය දැක ප්‍රිතිවන අතරම සවුදි කුමරාගේ මානුෂීය ගුණාංග ද අගේ කිරීමට වූ බැවිනි.

> තවත් අයකු වෙනුවෙන් තම කාලයෙන් මොහොතක් කැප කිරීමට අකමැති ධන කුවේරයන් මැද තම දරුවන් ලොකු මහත් කර ගැනීමට ඉඩ ලබා දෙමින් කුරුලු යුවළක් වෙනුවෙන් තම රථය භාවිතය අත්හළ සවුදි කුමරාද සුන්දර මිනිසකු බවට සැක නැත.



තවත් අයකු වෙනුවෙන් තම කාලයෙන් මොහොතක් කැප කිරීමට අකමැති ධන කුවේරයන් මැද තම දරුවන් ලොකු මහත් කර ගැනීමට ඉඩ ලබා දෙමින් කුරුලු යුවළක් වෙනුවෙන් තම රථය භාවිතය අත්හළ සවුදි කුමරාද සුන්දර මිනිසකු බවට සැක නැත.

● නන්දසේන සූරියආරච්චි

# කථානායක මොලමුරේගේ ජීවිතය උදුරා ගත්

# පාර්ලිමේන්තු විවාදය



ෆ්‍රැන්සිස් මොලමුරේ



සර් ජෝන් කොතලාවල



විල්මට් පෙරේරා



සෝමවීර චන්ද්‍රසිරි

**රාජ්‍ය මන්ත්‍රණ සභාවට පැමිණ සිටි මන්ත්‍රීවරුන් අතර වතුකරුවන් හමුදා ප්‍රධානීන් නැත්නම් පොලිස් සේවයේ ඉහළ බලතල දැරූ සල්ලි කාරයන් සිටියද සාමාන්‍ය මිනිසුන් සිටියේ කිහිප දෙනෙකු පමණි. විශේෂත්වය අනුව එදා සිදුවූ සිද්ධිවල විශේෂතා තිබිණ. මන්ත්‍රීවරුන් හැටියට පැමිණි පිරිස අතරද ඔවුන්ට විශේෂ වූ අමුතුම ගතිගුණ ද තිබිණ.**

ශ්‍රීමත් ජෝන් කොතලාවල මහතා මේ අතර සිටි විශේෂ පුද්ගලයෙකි. ඔහු මන්ත්‍රීවරයකු හා අගමැතිවරයකු ලෙස මන්ත්‍රණ සභාව නියෝජනය කළ පුද්ගලයෙකි. ඔහුගේ මන්ත්‍රණ සභා යුගයේ අප දුටු අමුතු විශේෂත්වයක් ඇත. කථානායකවරයා හෝ මූලාසනය ගෙන සිටි සභාපතිවරයාට ගෞරවයක් වශයෙන් හිස පහත් කොට ආචාර කිරීම කවුරුත් කවදත් කරන එක්තරා සම්ප්‍රදායානුකූල

## සර් ජෝන් කළ කලබල

පිළිවෙතකි. එහෙත් සර් ජෝන් කොතලාවල මහතා කිසිම දිනයක මූලාසනයට හිස පහත්කොට ආචාර කළේ නැත. ඔහු හමුදා ආචාරයක් ලෙස මූලාසනයට ගෞරවාන්විතව සැලියුට් කිරීම පුරුද්දක් කරගෙන සිටියේය. සභාවෙන් පිටතට යද්දීද එසේ කරන ඔහු එතනින් නික්ම යන්නේ ද හමුදා නිලධාරියකුගේ ආචාර විධි අනුව ය.

රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මහලේකම්ට වෙන්කර තිබූ කාමරය පාර්ලිමේන්තු අගමැති ලෙස පත්ව ආ ඩී.එස්. සේනානායකට වෙන්වීය. එදා ඇමතිවරුනට හෝ සභානායකට විරුද්ධ පක්ෂයට නායකයාට මෙදා මෙන් කාමර වෙන්කර නොවීය. විශේෂ කාමරයක් ලෙස තිබුණේ අගමැති තුමාගේ කාමරය පමණි.

මේ කාමරයේ කාර්යාල කාර්ය සභාව ලෙස සිටියේ තෝමස් නමැත්තෙකි. තෝමස් ඇතුළු එවැනි තත්වයේ අයටත් පාර්ලිමේන්තුව මගින් සලසා තිබූ පහසුවක් වූයේ යුනිෆෝම් හෙවත් නිල ඇඳුම් පිරිසිදු කිරීම සඳහා නොමිලයේ ලැබෙන වරප්‍රසාදයයි. සතියකට වරක් කාර්ය මණ්ඩලයේ හැම කෙනකුගේම ඇඳුම් ලොන්ඩරි කරුවා රැගෙන ගොස් ආපසු ගෙනවිත් දෙයි. එහෙත් තෝමස් තම ඇඳුම් පිරිසිදු කරගැනීමට තිබූ වරප්‍රසාදය ප්‍රයෝජනට නොගත්තේය. ඔහු හැමදාම කිලිටුවට ඇඳීම පුරුද්දක් කරගෙන තිබුණි. උදෑසනම පිටකොටුවේ රා කඩයට ගොඩ වැදී රා බී පැමිණෙන තෝමස් අගමැතිතුමාගේ කාමරයට වී ගොරව ගොරවා නිදා ගනී.





එක් දිනක් ඩී.එස්. සේනානායක අගමැතිතුමා හදිසියේ කාමරයට ඇතුළු විය. ඔහු මේ හදිසියේ කාමරයට පැමිණියේ වැසිකිළි යාමට අවශ්‍ය වූ හෙයිනි. කාමරයට දිව ආ ඩී.එස්. තම කෝට් එක ගලවා එය එල්ලන්නට සූදානම් විය. කෝට් එල්ලන්නට වෙන් වූ තැන කෝට් එකක් තබා, ලේන්සුවක් දමා යාමට වත් ඉඩක් නොවීය. තෝමස්ගේ කිළිටි ඇඳුම්වලින් එම ස්ථානය මුළුමනින්ම පිරී තිබිණ. ඩී.එස්. ට යකා නැග්ගේය. ඔහු වැසිකිළියාම පසක තබා තෝමස්ට කෑගැසුවේය. කෑ ගැසීම අසා සිටි තෝමස් "එනව සර්... මොකක්ද හදිස්සිය." රා බී පසක වැතිර සිටි තෝමස් වහා දිව ආවේය.

"කොහේද යකෝ මගේ කෝට් එක එල්ලන්නෙ."තෝමස් වට පිට බැලීය. මාස ගණනකින් පිරිසිදු නොකළ ඇඳුම් වලින් කාමරයේ ඇඳුම් එල්ලන කොකු සියල්ල පිරී තිබිණ.

"තෝමස් මම අහන්නෙ එකයි. මේ කාමර කාගෙද? උඹගේද මගේද?"

"සර් ගෙ නේ"

"එහෙනම් මේ බලපන් මොකද වෙලා තියෙන්නෙ කියල."

තෝමස්, තමාගේ ඇඳුම් සියල්ල පොදි ගසාගෙන පැමිණ ඒවා ලොන්ඩරියට උස්සාගෙන ගියේය.

ඩී.එස්. සේනානායක අගමැති තුමා ඒ සියල්ල බලා සිට සිනා වූවා මිස කිසිවක් කීවේ නැත. සුළු වැටුපකට ආ එක්තරා පුද්ගලයෙක්, ඩී.එස්. ට නිතර නිතර කරදරයක් විය. "අනේ සර්, මට කොහොම හරි වැඩි පඩියක් ගන්න මෙතන මොකක් හරි ලොකු තැනක් අරගෙන දෙන්න යයි කියමින් මේ පුද්ලයා නිතර නිතර ඩී. එස්ට කරදර කරයි. මෙයින් බේරෙන්නට බැරිම තැන මේ පුද්ගලයාට උපවේත්‍රධාරි තනතුරක් ඇතිකොට ඔහු එතැනට පත් කළේය.

## සර් ජෝන් හා සෝමවීර චන්ද්‍රසිරි ගැටුම දුර දිග ගිහින් වුණ දේ

අලුත් නිලයක් ලබා ගත්තත් මේ පුද්ගලයාගේ පුරුද්දක් වූයේ නැවත නැවතත් පඩි වැඩි කරගැනීමට තිබූ ආශාවයි. හැමදාම පඩි වැඩි කර දෙන ලෙස ඉල්ලීම ඔහුගේ පුරුද්දක් විය. මේ ගැන පමණක්ම කථා කිරීම නිසා මොහු ගැන, ඩී.එස්. ට කේන්තියක් මෙන්ම පිළිකුලක් ද ඇති විය.

අර පුද්ගලයා ඩී.එස්. ගෙන් තමාට අවශ්‍ය දේ නොලැබුණ නිසා වෙනත් කාර්යයක් කළේය. අයවැය කාරක සභා අවස්ථාව පැමිණෙද්දී එවකට මතුගම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා වූ විල්මට් පෙරේරා අල්වා ගත්තේය. ඔහු ලවා ඒ තනතුර සඳහා වැටුප් ක්‍රමය ඉහළ මට්ටමකට පත් කරන ලෙස ඉල්ලීමක් කරවීය. "මේක මේ මිනිහකරන කපටිකමක්. මම ඉඩ දෙන්නෙ නෑ යි" සිතූ ඩී.එස්. විල්මට් පෙරේරා යෝජනාව ඉදිරිපත් කරත්ම එයට විරුද්ධ විය.

"මේ තනතුර හැදුවෙ මම. ඒ තනතුරට පත් කළ පුද්ගලයාට මම කිව්ව දෙන පඩිය මේකයි කියල. ඒකට කැමති වෙලයි එයා මෙතන වැඩට ආවෙ. මම කොහොමටවත් එයට වඩා සතයක්වත් පඩි වැඩි කරන්නේ නෑ" යි ඩී. එස්. ස්ථිරවම ප්‍රකාශ කළේය. එයින් පසු පඩි වැඩිකිරීමේ යෝජනාවක් හෝ කතාබහක් අසන්නට නොලැබිණ.

පාර්ලිමේන්තුවේ විදුලි සෝපානයේ නැගී ඉහළ මාලයට යාමට මන්ත්‍රීවරුන්ට සිදුවී තිබිණ. මෙම විදුලිසෝපානයට නැගී යාමට හැකි උපරිම පිරිස පස් දෙනෙකි. දවසක් මෙහි ඩී.එස්. සහ තවත් දෙදෙනෙක් ගමන් ගත්හ. පස් දෙනෙකු නැගී යන මේ විදුලි සෝපානයට ඩී. එස්. තුන්දෙනෙකුටවත් වැඩි බරක් දුන් පුද්ගලයකු විය. මඳ දුරක් ඉහළට ගිය සෝපානය ඉහළ මාලයට යන්ට පෙර හදිසියේ නතර විය. අවසානයේ එහි ක්‍රියාකරුට හිඳගන්න පුටුව මත නැගී දැතින් ඉහළ-

## අගමැතිගේ කෝට් එක එල්ලන්න අගමැතිගේ කාමරයේ ඉඩක් නැහැ

මාලය අල්වා ගත් ඩී. එස්. අපහසුවෙන් ගමන කෙළවර කළේය. මෙයින් පසු අගමැතිතුමා යනවිට අනෙක් කිසිම මන්ත්‍රීවරයකු ඇතුළු කිරීමට විදුලිසෝපාන ක්‍රියාකරුවා ප්‍රවේසම් විය.

පාර්ලිමේන්තු රැස්වීම් වාරය හමාර වී පාර්ලිමේන්තුව විසුරුවා හරින දිනය තරම් මන්ත්‍රීවරුනට දුක් ඉපදවූ එක් දිනයක් ද නොවීය. හැම මන්ත්‍රීවරයකුම එදා ගත කළේ වේදනාවෙනි. සමහරු බැලූ අත බලා කල්පනා කරති. සමහරු වේදනාවෙන් උනු නුන් සමඟ කථාකරති. ඔවුන් හැම දෙනාම දුකෙන් සිටියේ ඉදිවාරයේ පාර්ලිමේන්තුවට ඒමට නොහැකි වූවොත් තමන්ට සිදුවන ලජ්ජාව ගැනය.

එක් දිනක් මෙසේ දුකෙන් සිටි මන්ත්‍රීවරයෙක් ළඟම සිටි කාර්ය මණ්ඩල සේවකයෙක් "මොකද සර් අද බර කල්පනාවක" යැයි ඇසීය. මන්ත්‍රීවරයා වට පිට බැලුවේ දෑසෙහි කඳුළු පුරවාගෙනය.

"මම මේ කල්පනා කළේ කෝච්චියට පැනල මැරෙන එකද, වස කාල මැරෙන එකද වැඩිය පහසු කියල. ලබන වාරයේ මම තේරුණේ නැතොත්, එක්කො වහ කාල මැරෙනව. නැත්නම් කෝච්චියට පැනල මැරෙනව. මගේ මළගමට තමුසෙත් එනවද?" කියා ඉකිබිඳිමින් මන්ත්‍රීවරයා හැඬුවේය.

එහෙත් ඒ මන්ත්‍රීවරයා ඊළඟ වතාවේද මැති සබයට පත්වීය.

එක දවසක් පාර්ලිමේන්තුව ඇතුලේදී සර් ජෝන් සමඟ පැටලෙන්න ආ සෝමවීර චන්ද්‍රසිරි මන්ත්‍රීතුමා අගක් මුලක් නොදන සර් ජෝන්ට බැණ වැදුණේය. සර් ජෝන් වෙනදා නම් තමාට විරුද්ධව කතාකරන අය සමඟ හරි හරියට බැණ ගන්නවා. හොඳටම කේන්ති ගියොත් කුණුහරුපෙන් හරි බණිනවා. එදා සෝමවීර සමඟ වාදයේදී සෝමවීර කියන සියල්ල සර් ජෝන් අසා සිටියේ පුදුම ඉවසිල්ලකින්. සෝමවීරගේ කථාව ඉවරවුණාම සර් ජෝන් එළියට ආවා. මන්ත්‍රීවරු සර් ජෝන් වට කරගත්තා. සෝමවීර බැණපු හැටි කොච්චර වැරදිද කියල කථාව දුර දිග යවන්නයි ඒ අය සූදානම් වුණේ. සර් ජෝන් අන්තිමේදී මෙහෙම කිව්වා.

"මම සෝමවීරගෙ හැටි දන්නවා. ඔය මිනිහා මට ඔහොම කියල නෑ. හැබැයි මට අද එකක් ඒත්තු ගියා. මට විශ්වාසයි ඌත් අපේ තාත්තගෙ කොල්ලෙක් කියල."

උල්පන්දම් දෙන්න ආ මන්ත්‍රීවරු හිනාවෙවී පැත්තකට ගියා.

එක දවසක් පාර්ලිමේන්තු මන්දිරය ඇතුළෙ ලොකු විවාදයක් පැවැත්වුණා. එය තරමක උණුසුම් එකක්. මන්ත්‍රීවරු හසුරුවා ගැනීමට මූලාසනේ කථානායක මොලමුරේට අපහසු වුණා. එක පැත්තකින් එක්කෙනෙකු කතා කරන විට තව පැත්තකින් දෙතුන් දෙනෙක් එක පාරටම නැගිටල විවාදයට හවුල් වෙනව. ඒ අතර තරමක වැරදි වචනත් මේ අයගෙන් කියැවෙනවා. මෙහෙම විවාද වෙන කොට මූලාසනයේ සිටි මොලමුරේ එක පාරටම ගල් ගැහිල වගේ මන්ත්‍රණ සභාව දිහා බලා සිටියා. මුළු සභාව කථානායකතුමා දෙස පුදුමයෙන් බලා සිටිනවා. මොලමුරේගේ බෙල්ල පැත්තකට ඇලවුණා. කිසි සද්දයක් නැතිව ගියා. බැලින්නම් මූලාසනයේ සිටිද්දිම සිහිය නැතිව ගිහින්. ගතවුණේ මෙහොතයි. මන්ත්‍රීවරු හැටියට සභාවෙ දොස්තර මහත්තුරු කීප දෙනෙක් මූලාසනය ළඟට පැමිණ ප්‍රථමාධාර දී, කාමරයට ඔසවා ගෙන ගියා. ඉස්පිරිතාලයට ටෙලිෆෝන් කළා. ඉක්මණින්ම ගිලන් රියකින් මොලමුරේ මහතා රෝහලට අරගෙන ගියා. ඒ යනවිට මොලමුරේට හොඳට සිහිය තිබුණා.

එයා පාර්ලිමේන්තු මන්දිරය දිහා බැලුවෙ දුකෙන් හා වේදනාවෙන්. ආයෙමත් මෙතනට ආ හැකිද කියා චකිතයක් එයාගෙ හිතේ තිබුණ වගෙ පෙනුණේ. ඉස්පිරිතාලෙන් බෙහෙත් කළත් මොලමුරේ ආයෙමත් මන්ත්‍රණ සභාවට ආවෙ නෑ. එයා මැරුණා. මේක පාර්ලිමේන්තු ඉතිහාසයෙ ඉතාම දුක්මුසු සිද්ධියක්.

# පිළිකා රෝගීන් රකින

# ඉටු දෙවියන් වැනි මිනිසුන්





අපේක්ෂා රෝහලේ විහාරස්ථානය

● නිශානි හේරත් බන්නැහැක

**ශ්‍රී ලංකාවේ පිළිකා රෝගීන් සඳහා නොමිලේ රජයේ ප්‍රතිකාර ලබාදෙන මහරගම පිළිකා රෝහල (අපේක්ෂා රෝහල) සඳහා දිවයිනේ නන් දෙසින් සුවිශාල ජන පිරිසක් දිනපතා එහි සායනවලට පැමිණෙති. මෙයින් බොහෝ පිරිසක් කොළඹ එන්නේ ඈත දුෂ්කර ප්‍රදේශවල සිටය. ඇතැම්විට දින දෙක තුනේ අඛණ්ඩ ප්‍රතිකාරවලට යොමු වනවිට නවාතැන් නැතිවීමෙන් ඔවුන් මහත් අසීරුතාවට ලක්වන අවස්ථා ඇත. මෙසේ අසරණ වන ජනතාව ගැන සිතා මේ වන විට මහරගම අපේක්ෂා රෝහල හා ඒ අවට ප්‍රතිකාර ලබන රෝගීන්ට තාවකාලිකව නතරවීම සඳහා සුවපහසු නවාතැන් තුනක් ඉදිකර තිබේ. මේ ඒ නවාතැන් ගැන පිළිබඳ කතාවයි.**

මේ තුන අතරින් පැරණිම නිවහන වන්නේ මහරගම අපේක්ෂා රෝහලට අනුබද්ධ විහාරස්ථානයයි. එය 1982 පූජ්‍ය වෑගන්තලේ රාහුල ලොකු හාමුදුරුවන් විසින් ස්ථාපිත කරන ලද්දකි. මේ සම්බන්ධයෙන් පූජ්‍ය වෑගන්තලේ සීවලී හිමියන් මෙසේ පැවසූ අතර දැනට මේ විහාරයේ කටයුතු බලා ගන්නේ උන්වහන්සේ විසිනි.

"ඒ කාලේ පිළිකා රෝගීන් සඳහා සහන සලසන්න කිසිඳු සිද්ධස්ථානයක් හෝ සංවිධානයක් තිබුණේ නැහැ. මුළු පිළිකා රෝහලේ පිළිකා රෝගීන් 250 පමණයි සිටියේ. ඒත් clinic වලට එන අයට හා දුර පළාත්වලින් රෝගීන් බලන්න එන්න තැනක් තිබුණෙ නැහැ. පූජ්‍ය වෑගන්තලේ රාහුල හාමුදුරුවෝ කියන්නේ මගේ බාප්පා. උන්වහන්සේ ඒ රෝගීන්ට නතර වෙන්න හෝල් එකක් හදලා දුන්නා. ඔවුන් බොහෝ ආර්ථික දුෂ්කරතා වලින් පෙළෙන බව දැනගත්තාම තුන්වේලම කන්න දුන්නා. ලොකු හාමුදුරුවෝ බොහොම දුක් වින්ඳා. පිණ්ඩපාත චාරිකාවෙ යෙදිලා තමයි කෑම හොයා ගත්තේ. මුලින්ම අපේ විහාරස්ථානයෙන් කළේ පිළිකා රෝහල් අසාධ්‍ය රෝගීන්ට පිරිත් හා ධර්ම දේශනා කිරීමයි. නායක හාමුදුරුවෝ ඉන් බැහැරව ගිහින් තමයි මේ සා කටයුත්තට අතගැසුවේ. මුල් යුගයේ රෝහලට අවශ්‍ය අබලි ට්‍රොලි ප්‍රතිසංස්කරණය, වෛද්‍ය උපකරන බෙහෙත් ලබාදීම ආදියත් කළා. ලොකු හාමුදුරුවෝ 2007 අපවත් වුණා. කාලයක් යද්දි රෝගීන් වැඩිවීමත් සමඟ පහසුකම් අඩුවුණා. ඒ නිසා මහල් 4 සුවමංසල හැදුවා. දැන් ඇඳන් 75ක් පමණ තියනවා. වෛද්‍ය පරීක්ෂණ සඳහා මෙහි පැමිණෙන අයට ආහාරපාන නවාතැන් සියල්ල ලැබෙනවා. හැබැයි අපි හොයා බලනවා කරුණුවල සත්‍ය අසත්‍ය බව. රෝහලෙන් රෝගීන් වෙනුවෙන් නිකුත් කරන රෝග විනිශ්චය කාඩ්පත බලනවා. පිළිකා රෝගියකුට වෙදකම වගේම හෙදකමත් අවශ්‍යයයි. විශ්‍රාම ශාලාවේ රෝගීන්ට වගේම ළඟ ඉන්න කෙනාටත් නවතින්න පුළුවන්.

රෝගීන්ට පොත්පත් කියවීම, ආගමික කටයුතුවල යෙදීම, රූපවාහිනිය නැරඹීම, භාවනා කිරීමටත් පුළුවන්. අපගේ ආයතනයට උපකාරයක් කිරීමට ඔබට අවශ්‍ය නම් දුරකථන අංක 0112851967 විමසිය හැකිය.

පිළිකා රෝගීන් වෙනුවෙන් නවාතැන් සපයන දෙවැන්න මහරගම තරුණ බෞද්ධ සංගමයේ බෞද්ධ මන්දිරයේ පිහිටි නිවහනයි. මේ සම්බන්ධව සිළුමිණට අදහස් දක්වමින් එහි ලේකම් ඊ.අයි.පී.පී. සමරසේකර මෙසේ පැවසුවේය.

'මුලින් අපි මේ කටයුතුවලට වෑගන්තලේ රාහුල හාමුදුරුවන්ට උදව් කරමින් සිටියා. එතන කුඩා ඉඩමක් තිබුණ නිසයි මෙතන ගොඩනැගිල්ලේ නවාතැන්පලක් හැදුවේ. රෝගීන්ට සුව පහසුව ජීවත්විය හැකි පරිදි. පිරිමි අයට, ගැහැනු අයට හා ළමුන්ට වෙන් වශයෙන් හැදුණු කාමර තුනක් තියනවා. ඊට අමතරව වෙනම මුළුතැන්ගෙයක්. විශාල ප්‍රමාණයේ කෑම කාමරයක්. රෝගීන්ට වන්දනා කිරීම සඳහා බුදු මැදුරක්. විදුලිය නැති අවස්ථාවලදී භාවිත කළ හැකි ජෙනරේටරයක් මෙහි ඇත.

පිළිකා රෝගීන් 42,000 වෙනුවෙන් මේ වන විට නේවාසික පහසුකම් සපයා ඇත. ආර්ථික අපහසුතා ඇති රෝගීන් වෙනුවෙන් නොමිලේ ඖෂධ වර්ග ලබාදීම සිදුකරයි.

'අපි සාමාන්‍යයෙන් නේවාසික රෝගියකු සඳහා රු. 3000 විතර වියදමක් දරනවා. අවශ්‍ය ලියකියවිලි ලෙස රෝගී කාඩ්පත, භාරකරු හැඳුනුම්පත අප පරීක්ෂා කරනවා. ඉස්සර නම් කොළඹ සීමාවේ අයට නවාතැන් දෙන්නෙ නැහැ. දැන් ඉඩකඩ තියන නිසා කොළඹ දිළිඳු අයටත් අපි නතරවෙන්න ඉඩ ලබා දෙනවා.





නෝමන් වීරසූරිය අනුස්මරණ නිවහන

## පිළිකා රෝගීන්ට සහන සලසන්න මහරගම සුවමංසල් තුනක්

මහරගම තරුණ බෞද්ධ සංගමය මුල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර ලබාදිය හැකි පින්වතුන් මහරගම තරුණ බෞද්ධ සංගමය, 25, විද්‍යාකර මාවත, මහරගම ලිපිනයට හෝ 0112839956, 0113151850 ඇමතීමෙන් ආධාර ලබාදිය හැකිය.

මහරගම පිළිකා රෝහලින් ප්‍රතිකාර ලබා රෝගීන් වෙනුවෙන් සුබ සාධනය සැලසීම සඳහා අලුතින්ම සැකසුණු ආයතනය, මහරගම නෝමර්න් වීරසූරිය අනුස්මරණ නිවහනයි. මහරගම අපේක්ෂා රෝහලට මුහුණලා පිහිටි මේ ආයතනය තරු හෝටලයක සිරි ගන්නා අතර කළමනාකරු ලයනල් රණතුංග මහතා අපට මෙසේ කීය."මේ ආයතනය ආරම්භ කළේ නුගේගොඩ International Construction Consotrum Pvt Ltd සේරම් මහත්මයයි. ඔහුගේ අක්කගේ මහත්තයා පිළිකා රෝගයකින් නැතිවෙලා. ඔහුට පින් පිණිසත් අසරණ රෝගීන්ගේ සුවසෙත වෙනුවෙනුත් මෙය හදලා 2019 සැප්තැම්බර් 26 රෝගීන් බඳවා ගැනීමට පටන්ගත්තා.

ලෙඩාට හා ඔහුගේ ළඟම ඥාතියාට නැවතිය හැකි කාමර 36 තියනවා. එම කාමර යාබද නාන කාමර සහිතව සුඛෝපභෝගීවත්, පිරිසුවත් හදලා තියනවා. උඩම තට්ටුවේ බුදු මැදුරක් හා භාවනා ප්‍රදේශයක් හදලා තියනවා. රෙදි

## ජාති ජාතිත් පින් පිරෙන දානයක් දෙන්න මෙහිදී ඔබටත් අවස්ථාවක්

සෝදලා දෙන්න වෙනමම ලොන්ඩ්‍රියක් තියනවා.

වෛද්‍ය නිර්දේශ අනුව තමයි අපි බඳවා ගන්නේ. බෙහෙත් තියන කාලෙට ලෙඩ්ඩු පිරිලා. බෙහෙත් අඩු කාලෙට ඩෙඩ්ඩුත් අඩුයි. කිමෝ තෙරපි වගේ ප්‍රතිකාර සඳහා නතරවන රෝගීන්ට ප්‍රතිකාර අවශ්‍ය දින ගණන තීරණය කරන්නේ රෝහලෙන් තමයි. පසුගිය දෙසැම්බරයේ බෙහෙත් තිබුණා. රෝගීන්ගෙන් කාමර පිරුණා.

දානපතියන්ටත් අවශ්‍ය නම් දානේ බාරගන්න හැකියි. උදේ දානේට රු. 4,500, දවල් දානෙට රු. 4,500, රෑ දානෙට රු. 5,000. සේරම 85 දෙනයි ඉන්නේ. මුදල් ගෙව්වාම මෙහෙ තමයි උයලා දෙන්නේ. මුදල් වෙනුවට බඩු ගෙනත් දෙන්නත් පුළුවන්. පිළිකා රෝගීන්ට දෙළුම් අනුමත කරනවා. අපි පිටින් දානේ ගේන අයට ඇතුළේ ජංගම දුරකථන භාවිත කරන්න ඉඩ දෙන්නෙ නැහැ. රෝගීන්ගේ ඡායාරූප ගන්න දෙන්නෙත් නැහැ. සමහර අයගේ එවැනි ඡායාරූප අරන් F.B. දාලා එම රෝගීන් අපහසුතාවයට පත්වූ අවස්ථා තියනවා. මෙයට ආධාර කරන්න කෙනෙකු කැමති නම් නෝර්මන් වීරසූරිය අනුස්මරණ නිවහන, 73, අපේක්ෂා රෝහල, මහරගම (දුරකථන අංක 0112745800) විමසිය හැකිය.

ජීවිතයේ අවිනිශ්චිතතාව හොඳින්ම පසක් කරගෙන ජීවත්වීමට තව මොහොතක් හෝ ජීවිතය අයදින අපේක්ෂා රෝගීන් වෙනුවෙන් නවාතැන්, ආහාරපාන සපයන කොයි කාටත් අත්වන්නේ පින් වැඩෙන පින්කමකි.



මහරගම තරුණ බෞද්ධ සංගමයේ නිවහන

සේයාරූ - ටී.ඩී. සිරිසේන
(මහරගම සමූහ)



වැව් දිය සිසිල අබිමුව බැසයන හිරුගේ දසුන



පුරන්වූ කුඹුරු යායක්



ජපන් ජබර වලින් වැසී ඇති වැවක්

## 6 වැව් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට නිර්ව්‍යාජ වැඩ පිළිවෙළක් අවශ්‍යයයි

● තඹුත්තේගම විශේෂ - ඩබ්ලිව්. ප්‍රදීප්

# පුරන් කුඹුරු අස්වද්දන්න වැව් පිළිසකර කර දෙන්න



### 6 පායන කාලේ "වැව්" හදන ඒකාබද්ධ වැඩපිළිවෙළකට යෑමේ අවශ්‍යතාවක්

**අප සතු ප්‍රධානතම මාහැඟි ස්වාභාවික සම්පත ලෙස අභ්‍යන්තර ජල මූලාශ්‍ර සැලකිය හැකිය. වැව්, අමුණු, මහා පරිමාණ ජලාශ ආදියෙන් සමන්විත මේ ජල සම්පත ලොව අන් කවර හෝ ජාතියක් සතු නොවන තරමේ ධන නිධානයකි. මේ බොහෝ වැව්, අමුණු පෙර රජ දවස පටන් පැවැත වර්තාමානයට දායාදව පවතී. එහෙත් අවාසනාව නම් මෙසේ මෙරට ග්‍රාමීය ප්‍රදේශවල පවතින වැව්, අමුණු රැකගැනීමට නිසි ඒකාබද්ධ වැඩපිළිවෙළක් නැති වීමය. වැව් සඳහා අයිතිවාසිකම් කීමට ආයතන ගණනාවක් පැවතුනද ඒ කිසිවකින් වර්තමානය වන විට සිදුවන අවංක මෙහෙවර අල්ප වී ඇති බව සැඟවිය නොහැකි සත්‍යයක්ව පවතී.**

මෙරට වැඩිම වැව් ප්‍රමාණයක් වියළි කලාපය කේන්ද්‍රීයව පවතී. ඒ වසර පුරාම මෙම කලාපයට වැසි නොවැටෙන හෙයිනි. වැසි වැටෙන කලට ඒකරාශී කොට තබා වසර පුරාම ජලය ප්‍රයෝජනයට ගැනීම එහි අරමුණ වී ඇත. මෙහෙයින්ම වියළි කලාපයේ හැම ගමකම පාහේ වැව් බැඳීමට අතීතයේ වෑයම් කොට ඇති අන්දම හඳුනාගත හැකි පොදු ලක්ෂණයකි. සමහර ගමක වැව් කිහිපයකි. කෘෂිකාර්මික කටයුතු, සත්ව පාලනය ආදිය සඳහා පමණක් නොව ස්නානය, පානීය ජලය සපයා ගැනීම ආදි කටයුතු සඳහා ද වැව් ජලය ප්‍රයෝජනවත් වී ඇත. රජරට කලාපයේ අනුරාධපුරය, පොළොන්නරුව, කුරුණෑගල ආදි ප්‍රදේශවල මෙරට වැව් පද්ධතියේ වැඩිම වපසරිය දැකගත හැකිය. උතුරු පළාතේ ද වව්නියාව, මුලතිව්,කිලිනොච්චිය ආදි ප්‍රදේශ වල විශාල වැව්, අමුණු ප්‍රමාණයක් අදටත් ශේෂව පවතී.

වර්තමානය වන විට මේ බොහොමයක් වැව්, අමුණු උපද්‍රව ගණනාවකට මැදිව ඇත. සැබෑ ජනතා අවශ්‍යතාවයට සරිලන සේ වැව් ප්‍රතිසංස්කරණය නොවීම මෙකල්හි පොදු ප්‍රවණතාවයක් බවට පත්ව තිබේ. බොහෝ විට සිදුවනුයේ වැව් ප්‍රතිසංස්කරණය සඳහා පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන්ට බාර දීමය. එය මෙම

ක්‍රියාවලිය අසාර්ථක වීම සඳහා පැහැදිලි පාර කැපීමකි. ඉකුත් දශක දෙකක පමණ කාලයක සිට කොන්ත්‍රාත්කරුවන් හරහා සිදුවන වැව් අලුත්වැඩියාවන් විවිධ මගඩි වලින් ගහනව පවතී. යැපෙන්නවුන්ගේ යහපතට හේතුවන පරිදි වැව ප්‍රතිසංස්කරණය කිරීම පසෙකලා වෙනත් පරිබාහිර පිරිස් සතුටු වන සේ එම කාර්යය සිදුවන වග පැහැදිලිව පෙනෙන්නට තිබේ.

මෙරට වැව් ප්‍රතිසංස්කරණ කාර්ය සඳහා ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ආසියානු සංවර්ධන බැංකුව ආදි මූල්‍ය ආයතන මූල්‍ය ප්‍රතිපාදන සැපයීමට වරින් වර ඉදිරිපත් වෙයි. එහෙත් බොහෝ විට මෙතෙක් සිදුව ඇත්තේ මෙම අරමුදල් නිසි ලෙස භාවිත නොවීමය. යම් යම් අවස්ථාවලදී යුද හමුදාවේ ශ්‍රම දායකත්වයෙන් සහ තාක්ෂණික මග පෙන්වීමෙන් වැව් අලුත්වැඩියා කෙරුණු අවස්ථාවන් කිහිපයක් ද මෑතකදී වාර්තා වී තිබේ. සාපේක්ෂව ගත් කල්හි එය ඉතා සාධනීය ප්‍රතිඵලදායක මැදිහත් වීමක් ලෙස දැකගත හැකි විය. පවිටු අපේක්ෂාවන්ගෙන් කිලිටු නොවුණු එවැනි මැදිහත්වීමක් මෙරට වැව් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට හොඳින්ම ගැළපෙන වග පෙනී ගොස් ඇත.

ඒ ඒ ආයතන අතර පවතින ප්‍රතිඵල විරහිත, ව්‍යාජ කඹ ඇදීම ද මෙරට වැව් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය අවුරා ඇති බලවත් බාධකයකි. මහවැලිය සතු වැව් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට මුල්වී අලුත්වැඩියා කළ නොහැකි වී තිබේ. එයට මහවැලි නිලධාරින්ම සිටිය යුතුය. සමහර තැනෙක ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ඇස්තමේන්තු සකස් කළ ද අලුත්වැඩියා අධීක්ෂණය කිරීමට මහවැලි හෝ වාරිමාර්ග නිලධාරීන් අවශ්‍ය වී තිබේ. මේ නිරර්ථක කල්මැරිල්ල හේතුවෙන් සමහර තැනක වැව් හැදිල්ල මුළුමනින්ම මඟහැරුණු අවස්ථාවන් ගැන ද අසන්නට ලැබේ. මේ නිලධාරිවාදයෙන් ගොවීන්ට අත්වන යහපතක් නැත. ඒකාබද්ධ ප්‍රවේශයක් මෙරට වැව් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට අවැසි වන්නේ මෙවැනි පසුබිමකය.

මෙරටේ සැකසෙන සෑම ඉදිකිරීම් ඇස්තමේන්තුවකින්ම අදාළ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුට සියයට පහළොවක, විස්සක හෝ විසිපහක ලාභයක් සහිතව සැකසීම පිළිගත් සම්මත ක්‍රමය වී තිබේ. ඇස්තමේන්තුගත මුදලෙන් වැඩි පිරිවැයක් ඉදිකිරීම් කටයුතු සඳහා යොදවා සාධාරණ ලාභයක් උපයා ගැනීමට කොන්ත්‍රාත්කරුට එමගින් අවකාශ සලසා දී තිබේ. එහෙත් වැව් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ දී මෙම පිළිවෙත බොහෝ විට කඩතොළු වීම බරපතළ ගැටලු සහගත තත්වයකි. වැසි කාලයක් ආසන්නයේ වැවක රොන්මඩ හැරීම වැනි රැවටීම් මගින් සිදුවනුයේ ඒ සඳහා නිදසුන් සැපයීමකි.

වැව් හැදීමේ මගඩි තුළ සමහර තැනෙක සිදුව ඇත්තේ ඉදිකිරීම් සඳහා අවම පිරිවැයක් දරණ විට ගෙඩි පිටින් මුදල් යටිමඩි ගැසීමය.

කොන්ත්‍රාත්කරු හැරුණු විට හදන වැවක පංගුකරුවන් ගණනාවකි. අධීක්ෂණ ආයතන ප්‍රධානියා, ඉංජිනේරුවරයා, ඉංජිනේරු සහකාර, තාක්ෂණ නිලධාරි, ක්ෂේත්‍ර නිලධාරි, කළමනාකරණ සහකාර ගේ සිට ලිපිගොනු එහේ මෙහේ ගෙනයන කාර්යාල කාර්ය සහායක ආදීන් ඒ අතර වේ.

ජපන් ජබර, සැල්වීනියා, පන් ආදි විවිධ අහිතකර ජලජ ශාක වැව් තුළ අප්‍රමාණව වර්ධනය වී තිබීම, වැවක අත්‍යවශ්‍ය අංග සේ පිළිගැනෙන වාන, සොරොව්ව, රළපනාව, වැව් බැම්ම ආදිය අබලන් වීම, තට්ටු ගණනාවක් රොන්මඩ ඒකරාශී වීම, වැව් රක්ෂිත අනවසරයෙන් අල්ලා ගැනීම ආදී පොදු ගැටලු ගණනාවකින් මෙරට වැව් පද්ධතිය පීඩාවට පත්ව ඇත. ගම්මැද්දක ඇති සමහර වැවකින් කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය ප්‍රයෝජනයට නොගත්ත ද පාරිසරික සමතුලිතතාවය සඳහා එමගින් සැලසෙන පිටිවහල අතිමහත් එකකි. අතීතයේ වන සතුන්ගේ ප්‍රයෝජනය සඳහා ද වැව් බැන්ද ජාතියක් ලෙස අප ප්‍රකටව ඇත. එහෙයින් කිසිදු වැවක් වල්වැදී, ගොඩවී විනාශවීමට ඉඩදීමට හැකියාවක් නැත. අනුරාධපුරයේ ප්‍රධානතම වාරි ජලාශය සේ සැලකෙන කලා වැව කේන්ද්‍රීයව මහවැලි ව්‍යාපාරය ආරම්භ කරන විට "එච් කලාපය" තුළ ග්‍රාමීයව පැවැති වැව්, අමුණු නොසලකා හැරීම නිරායාසයෙන්ම සිදු වූවකි.

එසේ නොසලකා හැරුණු වැව් 125 ක් පමණ මේ වන විට විවිධ උපද්‍රව වලට ලක්වී විනාශ වීමේ අවධානමට ලක්ව ඇත. ඒ වැව් නිරුපද්‍රිතව තිබුණේ නම් එච් කලාපයේ යල කන්නයේ වගාවන් මගහැරී, කුඹුරු වල් වදින්නේ නැත. වැවක් යනු සපුරාම පාරිසරික පද්ධතියකි.

වැවක් හැදීම හුදු ඉදිකිරීම් කාර්යක් පමණක් නොව පාරිසරික ක්‍රියාවලියක් යථාවත් කිරීම වග වටහා ගන්නෝ විරල වී තිබේ. සාම්ප්‍රදායික ගමේ වැව බාරව සිටි වෙල්විදානේ අද එහි නැත. සමහර ගොවි සංවිධාන නියෝජිතයන් ද නිලධාරින්ගේ, දේශපාලඥයන්ගේ අතවැසියන් වී සිටිති. එහෙයින්ම ග්‍රාමීයව හැදෙන වැව් සැබෑ හැඟීමෙන් රැක බලා ගැනීමට ඉදිරිපත් වන අය ගම්මැදි වල ද හිගවී තිබේ. එනිසාම වැව හදන අතරේ එය රැකීමට පිරිසක් ගමෙන්ම නිර්මාණය කිරීම දැඩි කාලීන අවශ්‍යතාවක් වී ඇත.

යුද හමුදාව, සිවිල් ආරක්ෂක බලකාය වැනි ආයතන සම්බන්ධ කොටගෙන වැව් හැදීමේ පිරිසිදු ක්‍රියාන්විතයක් දියත් කිරීමට දැන් කාලය පැමිණ ඇත.

ඇතැම් දේශපාලඥයන්ගේ, නිලධාරින්ගේ, කොන්ත්‍රාත්කරුවන්ගේ ඉල්ලමක් වී ඇති මෙරට වැව් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ඔවුනගෙන් මුදා ගැනීමේනිර්ව්‍යාජ මෙහෙයුමක් අද අවශ්‍ය වී තිබේ. එසේ නොවන තාක් වැව් හැදීමට යොදන අරමුදල් මගින් රටේ ණයබර වැඩිවීම විනා අත්වන යහපත අල්ප වීම වැළකිය නොහැකිව තිබේ.

---

**(අගෝස්තු 25 වැනි දිනට යෙදුණ විශිෂ්ට ඉතිහාසඥයකු, පුරාවිද්‍යාඥයකු හා සාහිත්‍යවේදියකු වූ මහාචාර්ය මැන්දිස් රෝහණදීරයන්ගේ 9 වැනි ගුණ සමරුව නිමිත්තෙනි)**



මහාචාර්ය මැන්දිස් රෝහණදීර

# තාත්තා අපිට වැඩිය ආදරය කළේ පොත්පත්වලට

## පුතු, ජ්‍යේෂ්ඨ නීතිඥ හරිගුප්ත රෝහණදීර කියයි

**මගේ තාත්තා කොයි වගේ කෙනෙක්ද යන්න මා නිතර සිතන දෙයකි. ඔහු රටම පිළිගත් අතිප්‍රමාණික උගතකු බවට හඳුන්වන බව ඇත්ත ය. ඉගැන්වීම, පර්යේෂණ, පොත්පත් ලිවීම, දේශන ආදිය හැර ඔහුට වෙනත් ජීවිතයක් නැතැයි මට සිතුණේ යමක් තේරෙන වයස වන විට ය. මා නිතර දකින්නේ මොනවා හෝ පොත් ගොන්නක් පෙරළමින්, බිත්තිවල ඇති කුරුටු අකුරු සටහන් ලේඛන (සෙල්ලිපි) කියවමින් එක්කෝ මොනවා හෝ ලියමින් සිටි මගේ තාත්තා ය. ගෙදර ඉන්නා විට කන්නට බොන්නට හය හත් සැරයක් තාත්තාට අඬ ගැසීමට අම්මාට නිතර සිදුවූ බව මට මතක ය. එක්කෝ ඔහු තමා හමුවීමට එන හාමුදුරුවරු, පත්තරවල අය හෝ තවත් අය හා කතාවේ ය. ඒ කතාබහ වල්පල් නොව ඉතිහාසය, සාහිත්‍යය ගැන කතා බහ ය. අපේ අම්මා තාත්තා හොඳින් තේරුම් ගත් නිසා තාත්තාගේ මුළු ශාස්ත්‍රීය සේවය කරදරයක් නැතිව සිදුවූ බව මට දැන් වැටහේ. එනිසාම අප හතරපස් දෙනාගේ වැඩ ගැන වැඩිපුරම වෙහෙසුණේ අම්මා ය.**

මගේ තාත්තා මා අදත් දකින්නේ හද්දා පිටිසර අව්‍යාජ හා නිහතමානි ගැමියකු ලෙස ය. ඔහු මිනිසුන්, සතාසීපාවා ඇතුළු හැම දෙනාටම, ගහ කොළවලට, රට ජාතියට හා තම ආගමට ආදරය කළ සුන්දර ගැමියෙකි. ආචාර්ය , මහාචාර්ය පදවි මෙන්ම සම්මාන පිට සම්මාන ලබමින් රට රාජ්‍යවල ගෞරවයට පවා ලක්වූවද එතුමා මියයන තෙක්ම ඒ අහිංසක ගැමිකම හා නිර්ව්‍යාජත්වය සහිත අයකු ලෙස ම දුටුවෙමි. ඒ තරම් නිර්ව්‍යාජ නිහතමානීකමක් ඔහුගේ දරුවන් වන අපට ළඟා කර ගන්නට තවමත් හැකිවී ඇත්දැයි මම බොහෝ විට මගෙන්ම විමසමි.

තාත්තා සතුන්ට ඉතා ආදරේ ය. ඔහුගේ වාහනයේ ඇතුළත හෝ ඩිකියේ බැළලියක් පැටවු දැමූ අවස්ථා මට මතක ය. අම්මා හෝ අපි උන් ඉවත් කරන්නට ගියත් තාත්තා ඊට ඉඩ නොදේ. අප කුඩා වියේ ගෙදර තිබුණේ එකම වාහනයකි. තාත්තා ඒ බළල් අම්මා හා පැටවුන් වාහනයේ ඩිකියේ කාඩ්බෝඩ් පෙට්ටියක තබාගෙන ඉගැන්වීමට සරසවියට යයි. පැටවු ලොකු වන තෙක් එසේම ය. ඒ අපේ තාත්තාගේ සත්ත්ව කරුණාව ය.

අතිප්‍රමාණ උගතකු, පර්යේෂකයකු වූ මගේ තාත්තාව මා දකින්නේ රැඩිකල් ශාස්ත්‍රීය පර්යේෂකයකු හා වියතකු ලෙස ය. කොයි ජගතා කීවත් සාධක සහිතව නැත්නම් තාත්තා ඒ මත පිළිගන්නේ නැත. පෘතුගීසීන් ලංකාවට පැමිණියේ 1505 දී යන්න සම්පූර්ණයෙන් වැරදි බව පෙන්වමින් එය 1517 බව සනාථ කරන්නට ඔහු සමත් වූයේ ඒ නිසා බව මට දැන් වැටහේ.වරක් තාත්තා පරණවිතානයන් පොළොන්නරු රජවරු ගැන කියා තිබූ මතයකට එරෙහි මතයක් ඉදිරිපත් කිරීමෙන් පත්තරවල විවේචන පිට විවේචන පළවූවා මට මතක ය. තාත්තා ඒවායින් සැලුණේ නැත. නිශ්ශංකමල්ල මහ කයිවාරුකාර රජෙකි යනුවෙන් බොහෝ අය උගතුන් පවා කරන උපහාසය සම්පූර්ණයෙන්ම වැරදි බව සනාථ කරමින් තාත්තා "කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල " නම් පොතක් ලිවුවේ ය.

තනතුරුවලින් ඉහළට යන්නට යන්නට, පොතපත හා නව මත ආදිය නිසා ජනප්‍රියත්වයට හා ගෞරවයට පාත්‍ර වන්නට වන්නට තාත්තා තව තවත් නිහතමානී වූ බව මට අදත් අමතක කළ නොහැකිය. එය හරියට ගෙඩි පිරි ගසක් පහතට නැමෙන්නාක් සේ ය. ඔහු අප ගැන නොබැලුවා නොවේ. " පුතේ ඉගෙනීම තමයි ලොකුම ධනය", "උගතමනා ශිල්පයමයි මතු රැකෙනා" ඔහු නිතර කියූ ඒවාය. තම පියා නැතිවූ පසු පවුලේ බඩ පිස්සා වූ තමාට ඉගැන්වීමට වැඩිමහලු සොහොයුරන් ඉගෙනීම නවතා කුලී වැඩට ගිය හැටි තාත්තා අපට අනන්තවත් කියා ඇත. ඒ වෙනුවෙන් සහෝදර සහෝදරියන්ගේ දරුවන් ගෙදරට ගෙනැවිත් කොළඹ පාසල්වලට යවා ඉහළට ඉගැන්වීමට කටයුතු කළා පමණක් නොව තාත්තා අහල පහල හා තම දුප්පත් නෑදැයන්ගේ දරුවන්ට පවා ඉගෙනීමට අත දුන්නේ ය. මා ආනන්ද විද්‍යාලයේ ඉගෙනගත් කාලයේ එහි බෝඩිමේ සිසුන්ට නිවාඩු කාලයේ ගෙදර යෑමට ඉඩ දෙන්නේ බෝඩිම් ගාස්තු ගෙවා නිම කළොත් පමණි. එසේ මුදල් නැතිකම නිසා ගෙදර යාමට නොහැකි සිසුන් කීප දෙනෙකුටම තාත්තා බෝඩින් ගාස්තු ගෙවා දැම්මේ වරක් දෙවරක් නොවේ.

මෙරට දේශපාලන ඉතිහාසයේ ඉතා වැදගත් සන්ධිස්ථානයක හා සිදුවීම්වල ප්‍රධාන චරිතයක් වූ තාත්තා, 1956 බණ්ඩාරනායක මහතා ඇති කළ දේශපාලන විප්ලවයේ ප්‍රධාන බලකරුවන් වූ සඟ, වෙද, ගුරු ගොවි කම්කරු පංච මහා බලවේගයේ ප්‍රධාන ක්‍රියාකාරිකයකු විය. ඔහු බණ්ඩාරනායක පවුලේ සමීප හිතවතකු විය. 1978 ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ව්‍යවස්ථාව නිර්මාණය කළේ ඔහු බව මා දැනගත්තේ පුවත්පතක ලිපියකිනි. සිරිමාවෝ බණ්ඩාරනායක යුගයේදී තාත්තා හඳුන්වා තිබුණේ " මැතිනියගේ පුරෝහිතයා "ලෙස ය. ඔහු මේ කතාව අම්මා සමඟ කියා මහ හඬින් සිනාසෙනු මට මතක ය.

පර්යේෂණ හා ශාස්ත්‍රීය මතවලදී කෙතරම් රැඩිකල් ප්‍රතිපත්තියක් දැරුවද දේශපාලන කටයුතුවලදී තාත්තා වැදගතකු හා රැඩිකල් බවින් තොර විය. මා දන්නා තරමට තිස්සමහාරාමය හා අවිස්සාවේල්ල ආසනවල ක්‍රියාකාරී සංවිධායක තනතුරු තාත්තා දරා තිබේ. 1989 මෙරට භීෂණ සමයේ කොළඹ දිස්ත්‍රික්කයට ශ්‍රී ල.නි.ප. පක්ෂයෙන් නාම යෝජනා ද ලැබුණද තාත්තා එය ප්‍රතික්ෂේප කළේය. ශ්‍රී ලංකාවේ දේශපාලනය ක්‍රමය ප්‍රචණ්ඩ වීම හා ප්‍රජාතන්ත්‍රවාදී බවෙන් ගිලිහීම තාත්තාට රුචි නොවූ බව මට මතකය. ඒ නිසා පසුකාලීන ශ්‍රී ල.නි.පක්ෂය හා බණ්ඩාරනායක පවුලත් අනතුරුව මහින්ද රාජපක්ෂ පවුලත් සමඟ සබඳතා දිගටම තබා ගත්තද තාත්තා දේශපාලන කටයුතුවලින් මුළුමනින්ම ඈත් වී ශාස්ත්‍රීය අංශයටම යොමු විය.

තාත්තාගේ අව්‍යාජ හා නිහතමානී බව ගැන අපූරු කථාවක් මට දැන් සිහිවේ. ඔහු ඉපදුණේ දරුවන් හත් දෙනෙකුගෙන් යුතු ඉතා දුප්පත් පවුලක බාලයා ලෙස දකුණේ බෙලිඅත්තේ පල්ලත්තර නම් ඈත දුෂ්කර ගම්මානයකය. මගේ තාත්තා හතර වසරේදී ඔහුගේ පියා මියගොස් ඇත්තේ උණසන්නිපාතය සෑදී නිවෙසේදීම ය. දවාලට පාසලෙන් ලැබෙන බත් හා පරිප්පු හැර පාසලට යන තාත්තාට හෝ අනෙක් සහෝදර සහෝදරියන්ට වතුර උගුරක්වත් නැත. මේ නිසා පාසලේ දී ක්ලාන්තය සෑදී වැටුණු වාර ගණන අපමණ ය. පියා මළ පසු සහෝදරයන් කළේ මල්ලීට උගැන්වීමට තමන් කුලී වැඩට යෑම ය. තාත්තා මේ කතාව පුවත්පතකට ද කියා තිබිණි. කෙතරම් ඉහළ කෙනෙකු වුවත් තාත්තා තම අතීතය අමතක කළේ නැත. අද යන්තම් යමක් හරිහම්බ කරගන්නා අය තමන් රත්තරන් හැඳි කටේ ගහගෙන උපන්නාක් සේ රඟපාන රටක හා සමාජයක තාත්තා කොතරම් නිර්ව්‍යාජ හා නිහතමානී චරිතයක්දැයි මම නිතරම සිහි කරමි. තාත්තා තමාගේ පමණක් නොව අම්මාගේ පවා කිසිදු දුප්පත් නැතිබැරි නෑයකු, සහෝදරයකු කිසිවිටක අමතක කළේ නැත. හැකි සෑම විටම මඟුලට, මරණයට හා දානයට පවා ගියේ අනෙක් වැඩ අතපසු කරගෙන ය.

තාත්තාගේ මතකය කටපාඩම හා ධාරණ ශක්තිය කෙතරම් උසස් ද යන්න වැටහුණු අවස්ථා අපමණ ය. ඔහු බොහෝ විට සාලයේ හෝ ගෙයි ඇතුළත තම කාමරයේ විවිධ අය සමඟ ශාස්ත්‍රීය සාකච්ඡා පවත්වයි. ඇතැම් විට ප්‍රශ්න කරනු ලැබූ විට සංදේශ සාහිත්‍යවල එන කවි එය අයත්වන වර්ණ කොටස ගැන කටපාඩමෙන් කියයි. සංස්කෘත, පාලි, ශ්ලෝක තේරුම් සමඟ කියයි. වරක් පුවත්පතක් හා සාකච්ඡා කරමින් සිටිය දී එම ලේඛකයා ඇසූ ප්‍රශ්නයක දී මගේ තාත්තා බරණ ගණිතයාගේ නීල කොබෝ සංදේශයේ හා ගිරා සංදේශයේ කවි දෙකක් ඉදිරිපත් කරමින් කෝට්ටේ එවකට තිබූ දේවාල ගැන සාධක ගෙන හැර දක්වමින් විස්තරයක් කළ අයුරු මට අද මෙන් මතක ය. අපේ ගෙදර සාකච්ඡා මණ්ඩපයක් බඳු විය. එය නිරන්තර උගතුන්ගෙන් තොර නොවීය. බස රැසදේ සිරි සීවලී, තොටගම වාචිස්සර, හේන්පිටගෙදර ඤාණසීහ වැනි එකල සිටි ප්‍රබල හා ඉහළ පෙළේ හිමිවරු මා මුල්වරට දැක්කේ අපේ ගෙදරදී ය. දේශපාලන සබඳතා නිසා 56 බලවේගයේ මේ අය නිතර තාත්තා හමුවීමට පැමිණිය හ. තාත්තා ගීත කවි තාලයට කියන්නට ඉතා ආශා කළ සැටි අපට මතක ය.

**හඹා ආපු ගිජු ලිහිණින් වැරදි ඩැහැගෙනගියා ද**
**කඩා පැන්න මිනි කිඹුලන් කැළකට ගොදුරක්උනා ද**
**ගසා ගහල ගිණි හෙනයක දැවටී අළු උණාවත් ද**
**හඬා දොඩා බලා සිටිමි පුතුනේ ඔබ මොලොව නැද් ද**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වසර 35 ක සේවා කාලයෙන් පසු විශ්වකෝෂයේ ප්‍රධාන කර්තෘ ලෙස ද, රජරට විශ්වවිද්‍යාලයේ උප කුලපති ලෙස ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ද ඔහු සේවය කරන ලදී. තාත්තාගේ ජීවිතය සහ ශාස්ත්‍රීය පර්යේෂණ ගහට පොත්තත්, පොත්තට ගහත් මෙන් විය. ඔහු මියගොස් වසර නවයක් පිරෙන මේ මොහොතේත් ඉතිහාසය, පුරාවිද්‍යාව හා සිංහල සාහිත්‍ය යන විෂයයන් ගැන කතා කරන හැම විටම මගේ තාත්තාගේ නම මහාචාර්ය මැන්දිස් රෝහණධීර යන්න සඳහන් වන්නේ මතක් වන්නේ ඒ නිසා බව මම විශ්වාස කරමි.

තාත්තා විශ්‍රාම ගිය පසුව වුවද කිසි විටෙක තම ශාස්ත්‍රීය පර්යේෂණ පොත පත ලිවීම නතර කළේ නැත. ඔහු වෙනදා මෙන්ම දිවා රෑ පුරාම වෙනදාටත් වඩා වේගයෙන් වැඩ කළ බව මම දනිමි. කෙසේ හෝ සෙල්ලිපියක්, පුරා වස්තුවක් හමුවූ පුවතක් ආරංචි වුවහොත් වහා එහි ගොස් එහි අනුරුවක් පිටපතක් ගෙන එයි. කැඩුණු බිඳුණු සෙල්ලිපිවල කොටස් කෑලි තාත්තාගේ කාමරයේ ඕනෑ තරම් විය. මට මතක විදිහට ඓතිහාසික රම්බාවේ විහාරය කැණීම් හා රුහුණේ ඓතිහාසික තිස්සමහාරාම සිලාපස්ස පිරිවෙන් සමූහ කැණීම් සඳහා මුලපිරීම සිදු කළේ ඔහු විශ්‍රාම ගිය පසුව ය. අද වන විට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මැදිහත් වී කරන එම කැණීම් පර්යේෂණ රුහුණේ ඉතිහාසය පිළිබඳ ඉතා වැදගත් පුරාවිද්‍යා තොරතුරු හෙළි කරයි.

මෙම නව සොයා ගැනීම් ගැන මෙන්ම මගේ පියා ඉන් සතුටට පත්වූ කරුණක් වූයේ "අස්ගිරි තල්පත " නම් අතිශය වැදගත් පෞරාණික කන්ද උඩරට තල්පත පිළිබඳ ස්වකීය පර්යේෂණයෙනි. ඔහු නිතර ඒ ගැන අප හා මෙන්ම උගතුන්, පුවත්පත් සමඟ කතා කළේය. "අස්ගිරි තල්පතේ ලංකා ඉතිහාසය හා ශ්‍රී ලංකාවේ මහා සංඝසාමි සංඝරාජ පරපුර" නමින් ඒ තල්පත ඉංග්‍රීසියෙන් ලියූ පර්යේෂණ ග්‍රන්ථ දෙක මෙතෙක් හෙළි නොවූ කන්ද උඩරට ඉතිහාසය, උඩරට බුදු දහමේ වගතුග හා ඉතිහාසය පිළිබඳ විශිෂ්ට සම්භාව්‍ය ග්‍රන්ථ දෙකක් සේ පිළිගැනුණු බව මට මතක ය. එකී විශිෂ්ට සේවාව අගය කරමින් අස්ගිරි මහා විහාරයේ නායක ස්වාමීන්වහන්සේ විසින් ශ්‍රී රෝහණ ජනරංජන ගෞරව සම්මානය පියා වෙත ප්‍රදානය කරන ලදී.

එක් පරිවර්තනයක්, ශාස්ත්‍රීය ග්‍රන්ථ නවයකුත්, චරිත කතා දෙකකුත් හා විචාර ග්‍රන්ථ දෙකක් ද කාව්‍ය විචාර ග්‍රන්ථ හා සංග්‍රහ දෙකක් ද මගේ පියා ලියා තිබෙන බව පසුව මම දැන ගතිමි. එතුමාගේ බස මෙන්ම කතාවේ වාග් චාතුර්යය ද අසන සෑම දෙනාගේ කියවන සෑම දෙනාගේ සිත් ඇද ගත් බව ඉතා ප්‍රකට ය. මගේ තාත්තාගේ ජීව ගුණය වූ නිහතමානී සන්සුන් බව ඒ හැම තැනම දිස්වෙතැයි මම සිතමි. ඔහු කිසි විටෙක කිසිවකුට පරිභව කර පහතට හෝ උපහාසයට ලක් කර වේදිකාවල දී තබා සාමාන්‍ය කථා බහේදී හෝ කටයුතු නොකළේ ය. කාගේවත් සිත් රිදවීම මගේ පියාගේ සිරිත නොවීය.

ඔහු පමණක් නොව මගේ මවගේ හා අප පවුලේ සැමගේ සිත් සදා වේදනාවට පත් කළ සිද්ධියකින් මේ ලිපිය නිමා කරන්නට කැමැත්තෙමි. ඒ මගේ ලොකු අයියා 1989 භීෂණ සමයේ ගෙය ඉදිරිපිට දී නාඳුනන අය විසින් පැහැරගෙන ගොස් අතුරුදන් කිරීමයි. පසු කාලයේ තාත්තා අත් වාරුව නැතිවූ අයියා ගැන කීප විටක්ම ශෝකයෙන් කතා කළ හැටි මට මතකය. ඔහු විසින් රචනා කරන ලද කවි පෙළ හඳුන්වා තිබුණේ අතුරුදන් වූ වරුණ තම අහිංසක පුතුට හා ඔහු සේම අකාලයේ මිලින කොට කපා හෙළු දහස් ගණන් තරුණ කුසුම්වලට නිවන් සුව අත්වේවා කියා ය.

# රන්සුනු

# අනුරාගයේ මුල්පොත...

**'මම තවදුරටත් පිරිසිදු ගැහැනියක නොවෙයි. මාව නිකම් ම නිකන් වේසියක් වන තැනට ඔහේ කටයුතු කළා. දියමන්ති කරාබු කුට්ටමකට මම මගේ සිරුර කුලියට දුන්නා. මීට පස්සෙ බලය සඳහා මට හොයාගන්න පුළුවන් බලවත් ම කුලී කාරයාට, මම ඒක කුලියට දෙන්නට සූදානම්.'**

මෙහෙම කියන්නේ මානසී මිත්‍ර ය. මානසි මිත්‍ර නමින් ගුගල් සෙව්වාට ඔබට ඒ චරිතය මුණ ගැසෙන්නේ නැත. ප්‍රබන්ධිත ලෝකයේ සමහර චරිත, ගුගල් සෙවුමේ හමු නොවුවාට ගුගල් වලටත් එහා ගිය මතයක් ඉතිරි කරන අවස්ථා එමට ය. මානසී එවැන්නියකි;

ඒ පෙර කී වදන් නපුරු යැයි ද නරුම යැයි ද කියන්නට පෙළ ගැසෙනා මිනිස් පෝලිමේ ඉදිරියෙන් ම ඔබත් සිටින්නට හැකිය. තරුණ රැඩිකල්වාදී භාරතීය තරුණ පිරිස අතර උන්මාදයක් වූ ඇය, අල්ලපු රටේ අපේ ද හදවත කොනිති ගසන්නට පටන් ගෙන ඇත්තේ ය. කමලා දාස් ගේ Alphabet of Lust නොකියවූ, කියැවීමෙන් ආතුර වූ පරම්පරාවේ සහෘදයකු නම් සොයා ගැනීමට නොහැකි වනු ඇතැයි සිතමි. 'අනුරාගයේ මුල්පොත' නමින් මේ අපූර්ව සමාජ වියමන සිංහලයට නඟන්නේ එතරම් ම උපහාසයෙන් හා විචක්ෂණයෙන් සමාජය දෙස බලන 'ආචාර්ය ඩබ්ලියු.ඒ. අබේසිංහයන්' ය. බරපතළ දේශපාලන කතිකාවක් හා එහි ව්‍යංගාර්ථයේ වන තියුණු උපහාසයක් එකට කලතන්නට කමලා දාස්ට හැකි වූයේ කිනම් ආශ්චර්යයකින් දැයි මගේ සිත නිරන්තරයෙන් විමැසුම් සහගත වීම; එය කියවා වසර 10කටත් වැඩි කාලයක් නික්ම ගිය අදටත් මට අරුමයකි. මැදිවියට එළැඹෙමින් සිටි ඇයගේ සිරුරේ කාන්තිය විසින් වෙනස් කරන දේශපාලන ගමන් මඟ හාස්‍යයකට වඩා දනවන්නේ අරමුණ පිළිබඳ ව වන වික්ෂෝප බවකි. ඒ වික්ෂෝපය යථාර්ථයක් ව ඇති මෙකල්හි පවා ප්‍රාර්ථනය එය නොවන නිසාදෝ සිතෙහි ගැටුමක් ඇති වීම වැළැක්විය නොහැකිය. මේ සියලු කරුණු ඔබ වෙත මෙසේ ලියන්නේ නිර්මාණකරණයේ රන්සුනු සොයනා යන අපට ලේඛකයා භාවිත කරන විධික්‍රමවල අපූර්වත්වය හා පාඨක අපේ මතය ග්‍රහණයට ඒවා කොතෙක් වැදගත් ද යන්න ඒත්තු ගැන්වීමට ය.

'අනුරාගයේ මුල්පොත' කියවා ගෙන යන ඇසිල්ලෙහි හමුවන සෑම දෙයක් ම ඔබ සමඟ බෙදා ගන්නට මට උවමනා ය. එහෙත් එය සාර්ථක කරගැනීම පහසු නැත. බෙදා ගැනීමට කෙතරම් අවශ්‍ය වුවත්, බෙදා ගත නොහැකි දේ අප ජීවිත ඇතුළත කෙතෙක් ඇත්දැයි ඔබ දනී. ඒ හැම දෙයක් ම හැම කෙනකු සමඟ ම බෙදා ගත නොහැකි බවත් ඔබ දනී. එනිසාම එක්වරම නවකතාවේ අවසානයට රැගෙන ගියා යැයි කියා අමනාප නොවී මේ කොටසට අවධානය යොමු කළ මැනවි. මේ වචන බොහෝ භාරතීය කාන්තාවන්ගේ සිහින කුමාරයකු වූ තරුණ ඇමැතිවරයා විජායි රාජේ ගේ ය; වෙනත් ලෙසකින් කියන්නේ නම් තරුණ මදයෙන් මත් වූ, බහුතරයක් ගැහැනු ඔහු කෙරෙහි ලිංගික පාශයෙහි දෙවරක් නොසිතා බැඳුණු, හැඟීමකින්, බැඳීමකින් තොරව ප්‍රේම කිරීමේ කලාවේ මහත් සේ නිපුණ වූ ඇමැතිවරයාගෙනි. ඒ තරුණ ඇමැතිවරයා මානසීට දමා ගසන වචනවල සමස්ත සදාචාරමය බිඳවැටීම සෘජු ව ප්‍රකාශිත වුවත්, ව්‍යංගයෙන් කියැවෙන්නේ සමස්ත පද්ධතියේ ම වන බිඳ වැටීම නොවේ දැයි ඔබට පසක් වනු ඇති බව නිසැක ය.

"අද ඉන්දියාවෙ මිනිස්සු, වැඩියෙන් ම බයේ ඉන්න ගෑනි, ඔයා නොවෙයිද? දැන් අගමැති වුණත්, ඔයා අතේ සෙල්ලම් බඩුවක්. ඉතින් ඔයා කියනවා, මම ඔයාව විනාශ කළා කියලා. මානසී, ඔයා ළඟ තිබුණෙත්, ඉහළට නගින ආශාව විතරයි."

ඒ වනවිට ඇය ඉන්දියාවේ මධ්‍යම ආණ්ඩුවේ බලවත් ම ඇමැති ධුරය වන ස්වදේශ කටයුතු ඇමතිවරිය වූවා ය. විජායි නම් තරුණ සල්ලාල දේශපාලකයා විසින් ඉහළට නැඟීමේ උපක්‍රමයක් ලෙස මහලු අගමැතිවරයාට, මානසී බන්දේසියක තබා පුදනු ලබන්නාක් මෙන් ප්‍රධානය කරන්නේ ය. ඉන්දියාවේ බලවත් ම ඇමතිධුරය වන ආරක්ෂක ඇමැතිධුරයට ද මානසී ව යෝජනා කරන්නේ නක්සලයිට් ව්‍යාපාරයට සම්බන්ධ සඟරාවක ඇය විසින් ලියන ලද ලිපි පිළිබඳ ව කියමින් විජායී ම ය.

මේ කරුණු ගොනු කරන්නට මා උත්සාහ කළේ පැති දෙකක් පිළිබඳ ව ඔබට කියන්නට ය. එකක් මේ අපූරුව ග්‍රන්ථය ලියන කමලාදාස් ගේ නිදහස් චින්තනයයි; අනෙක ගැහැනියගේ මානසික සට්ටනයයි.

ස්ත්‍රීවාදිනියක යැයි නම් කරනු ලැබුව ද එවැනි කිසිදු ව්‍යාපාරයක නිරත නොවූ ඇය ඒ වචනමාත්‍රික ස්ත්‍රීවාදිනියන්ට කිසිදා හමු නොවුණු කාන්තා මනසේ නිදහස්භාවය ගැන නිරන්තර විමසිලිමත් වූවා ය; ලියුවා ය. ස්වාධීන කාන්තාවකගේ පැවැත්ම තීරණය වන්නට මූලික ම සාධකය වන නිදහස් චින්තනය ගොඩනැංවීමේ ලා ඇය ප්‍රබල තීරණාත්මක මෙහෙයක් ඉටු කළා ය. කිවිඳියක වශයෙන් ඇය මේ කාරණා මීට වඩා බරපතළ ලෙස ප්‍රශ්න කළා ය. ඇය නිරන්තර කියන්නේ 'තමන් ගැහැනුන් බවට පත් කළ හැම දෙය ම පිරිමියාට පුදන ලෙස' ය. කාමරාගයේ හා ශෘංගාර ලෝලත්වයේ දවටා ස්පර්ශ කළ යුතු - නොකළ යුතු, කිලිටි හා නොකිලිටි යන ගැහැනිය සම්බන්ධ කරන සියලු ම දෑ ඇය සමඟ කාමසම්භෝගයේ යෙදෙන්නට කැමති පිරිමියාට අප්‍රිය නොවිය යුතු බව දක්වයි. මේ ඇය අප වෙත දවටා, ඔතා දෙන්නේ පිරිමින් සොයන ගැහැනියගේ පාරිශුද්ධත්වය පිළිබඳ උපහාසාත්මක දෘෂ්ටියයි. කමලාදාස් ඊනියා ස්ත්‍රීවාදිනියන්ට වඩා වටින්නේ ඒ නිසා ය.

අනෙක් අතට ඇය සනාතන ධර්මයක් මේ මඟින් පවසන්නී ය. මේ ලියැවිල්ල ආරම්භයේ ම සඳහන් කළ එය ගැහැනිය පිළිබඳ සමස්ථාර්ථයයි. ඕනෑ ම දෙයකට ඕනෑ ම අයකු බිය වන්නේ පළමු වතාවේ ය. දෙවැන්නේදී එය සාමාන්‍ය දෙයක් බවට පත් වන්නේ ය. මේ සියල්ල පොදු ධර්මතා වුව ද, ඒ සියුම් බවට ඔබ්බේ වන ඉසියුම් බව නිසා මේවා යම් යම් ආකාරවලට වෙනස් වන්නට පුළුවන. අන්න ඒ ඉසියුම් වෙනස ජීවිතවල ඇත්නම් අපේ සිතේ මේ වික්ෂෝපභාවය ඇති වන්නේ නැත. ලේඛකයා, නිර්මාණකරුවා හැමවිට ම ස්පර්ශ කළ යුතු වන්නේ ඒ වික්ෂෝප සිත බැව් ඔබට කියන්නට මට උවමනා වී තිබිණි. හැමෝගෙම හිතේ හක්කලං කරන මුත් එළිපිට කියන්නට බය මේ දේවල් කමලා දාස් කියන්නේ දෙවරක් නොසිතා ය. එනිසා ම ඇය පාඨක හදවතේ නොමැකෙන ලකුණක් ඉතිරි කරන්නී ය. රන්සුනු සොයා යන අපට ඒ ඉසියුම් චින්තනය අසු නොවුණහොත් පාඨක හදවතේ ආදරණීය ම ඉසව්වේ ළැගුම් ගන්නට නම් වාසනාව හිමි වන්නේ නැත.

sumudu.chathurani@lakehouse.lk



පොල්ගස් කපා පෙරළා දුම්රිය මාර්ග අවහිර කරන ලද අතර ඌරගහ සහ පුගොඩ පොලිස්ථාන වලටද හර්තාල් කරුවෝ පහර දුන්හ. ඊට ප්‍රතිප්‍රහාර වශයෙන් පොලිසිය තැබූ වෙඩි වලින් දෙදෙනෙක් මියගියහ. අන්තිමේදී හර්තාලය දියත් කළ අයටම එය පාලනය කර ගත නොහැකි තත්වයක් උදාවිය.

පොලිස් බලය නොතකා 1953 පෙරටම



හර්තාලයේ අවස්ථාවක්

## රහස් ලියවිල්ලෙන් කොමියුනිස්ට් පක්ෂය අපහසුවට පත්වෙයි

# හර්තාලය සමඟ මහනුවරින් මතු වූ 'බෝම්බය'

● ජානක පෙරේරා

**සත 25 ක් හාල් සේරුව සත 70 දක්වා මිල වැඩිකිරීම නිසා ලංකා සමසමාජ සහ කොමියුනිස්ට් පක්ෂ විසින් එවකට පැවති එක්සත් ජාතික පක්ෂ රජයට විරුද්ධව දියත්කළ හර්තාලයට පසුගිය අගෝස්තු 12 වැනිදාට හැට හත් වසරක් සපිරුනි. ඒ ගැන යන්තමින් හෝ මතකයක් ඇති අය අද ජීවතුන් අතර සිටී නම් ඒ සියලු දෙනාම වයස 70 ව ඉක්මවූවන්ය. මේ ලියම්කරු එවකට අට හැවිරිදි වියේ කුඩා පාසල් සිසුවෙකි. හර්තාලය නිසා පොදු ප්‍රවාහන සේවා ඇනහිටි අතර හර්තාල් කරුවන් ඕනෑම කොළපාට වාහනයකට ගල් ගසන බවටද කටකතා පැතිරුනි. ඒ එක්සත් ජාතික පක්ෂයේ නිල වර්ණය කොළපාට බැවිනි. සැබවින්ම හර්තාලය යනු යමකට විරෝධය ප්‍රකාශය කිරීම සඳහා කඩසාප්පු, කාර්යාල සහ වෙනත් ආයතන වසා දැමීමත් ඒ අරමුණින් වැඩ වර්ජනය කිරීමත්ය.**

එහෙත් මෙහිදී සිදුවූයේ අනෙකකි. රට පුරා කඩාකප්පල් ක්‍රියා රැසක් සිදු වූ අතර දුම්රිය පීලිවල ලී සිල්පර ගලවා දැමීම් සහ ඒවා ගිනි තැබීම්, විදුලි පණිවුඩ සහ දුරකථන සේවා සම්බන්ධ කරන රැහැන් කණු පෙරළා දැමීම සහ ගාමිණී සහ හයිලෙවල් රෝඩ් සමාගම් වල බස් වලට ගල් ගසා ඒවාට බරපතළ හානි සිදු කිරීමද ඒ අතර විය. කොළඹ - ගාල්ල අතර ගමන් කළ දුම්රියකට ගල් ගසන ලද අතර පුද්ගලික වාහන වලටද එළෙස පහර දෙන ලදී. පොල්ගස් කපා පෙරළා දුම්රිය මාර්ග අවහිර කරන ලද අතර ඌරගහ සහ පුගොඩ පොලිස්ථාන වලටද හර්තාල් කරුවෝ පහර දුන්හ. ඊට ප්‍රතිප්‍රහාර වශයෙන් පොලිසිය තැබූ වෙඩි වලින් දෙදෙනෙක් මියගියහ.

### කිසි දිනෙක දේශපාලන බලපෑම් වලට යට නොවීම

අන්තිමේදී හර්තාලය දියත් කළ අයටම එය පාලනය කර ගත නොහැකි තත්වයක් උදා විය.

මේ ලිපියේ අරමුණ ඒ ගැන වැඩි දෙනෙකු නොදත් සිදුවීමක් විශ්‍රාමික පොලිස් අධිකාරිවරයකු වූ ෆාර්සි ජාතික ෆ්‍රෙඩී ජිල්ලා ගේ අත්දැකීම් තුළින් හෙළි කිරීමය. ඔහු මේ හෙළිදරව්ව කරන්නේ සිය පොලිස් රාජකාරි දිවිය අළලා ලියූ WITHOUT FEAR OR FAVOUR ('බියෙන් හෝ පක්ෂපාතිත්වයෙන් තොරව') නම් පොතේය. කිසි දිනෙක දේශපාලන බලපෑම් වලට යට නොවී සිය අදහස් නොපැකිල පැවසූ ජිල්ලා ඉතා විශිෂ්ට පොලිස් නිලධාරියෙකු විය.

හර්තාලය සිදුවූ කාලයේ ඔහු සේවය කෙළේ මහනුවර පොලිස් බල ප්‍රදේශයේය. ජිල්ලාගේ වචන වලින් කියතොත් මුලින් සාමකාමී ලෙස හර්තාලයට සහාය දැක්වූ පේරාදෙණි සරසවි සිසු පිරිසක් "ලේ පිපාසිත යකුන්" බවට පරිවර්තනය වන අන්දම ඔහු දුටුවේ එදාය. පසුකලෙක මෙරට පොලිස්පති වූ ආනා සෙනෙවිරත්නද ඒ දිනවල සේවය කෙළ් ජිල්ලා සමඟය. හර්තාලය පටන් ගැනීමට පෙර දින මේ සිසුන් පිරිස එල්ල කළ දරුණු ගල් ප්‍රහාර වලින් පොලිස් නිලධාරියෙකුට බරපතල තුවාල සිදුවීම සහ ජිල්ලා ගේ ජීප් රිය ඇතුළු ගලහ පාරේ ගමන් කළ මෝටරිය දෙක තුනකටත් අලාභහානි වීම සිසුන්ගේ ක්‍රියාවල ප්‍රතිපල විය. ඒ හැරන්නට වෙනත් කිසිදු කලබලයක් ඊට පසුදින (හර්තාල් දින) මහනුවර සිදු වුයේ නැත.

කෙසේ වෙතත් සමසමාජ සහ කොමියුනිස්ට් පක්ෂ හර්තාලය පිටුපස සිටින බවට පොලිසියට වැටහී තිබූ බැවින් ජිල්ලා උප පොලිස් පරීක්ෂක වරුන් හතර දෙනෙකු සමඟ මහනුවර කාසල් වීදියේ පිහිටි කොමියුනිස්ට් පක්ෂ කාර්යාලය සෝදිසි කිරීමට තීරණය කෙළ්ය.

### බලයට කෑදර කමින් තොර නිහතමානී දේශපාලනඥයා


එම කාර්යාලය පිහිටියේ බිත්ති තුනකින් වටවූ කුඩා කාමරයක් තුළය. පොත් පත් සහ පත්‍රිකා පිරවූ තට්ටු ඒ සෑම බිත්තියකම සවිකර තිබිණ. කාමරය මැද කුඩා මේසයක් සහ පුටුවක් තිබූ අතර බිමද නොයෙකුත් කුඩා පොත්, පත්‍රිකා, ලිපි ගොනු යනාදිය විසිරී තිබිණ. ඒ සියල්ල භාරව සිටියේ නායර් නම් පුද්ගලයෙකි.



අලුත් අගමැති සර් ජෝන් කොතලාවල
ඩඩ්ලි සේනානායක ඉල්ලා අස්වෙයි



ඩඩ්ලි සේනානායක



පීටර් කේනමන්



ෆ්‍රෙඩී ජිල්ලා

## හර්තාලයට වසර 67යි

හර්තාලයට කොමියුනිස්ට් පක්ෂය සම්බන්ධ බවට නීතියානුකූලව ඔප්පු කළ හැකි ලියවිලි සොයාගැනීම සඳහා පොලිස් නිලධාරින් කාමරයේ සියලුම තට්ටු පිරික්සීමට පටන්ගත් අතර ජිල්ලා බිම විසිරී තිබූ පත්‍රිකා යනාදිය එකිනෙක පරීක්ෂා කළේය. ඔහු ඊළඟට මේස ලාච්චුව විවෘත කළ විට දුටුවේ චීන නායකයන් වූ මාඕ සේ තුං සහ චෞ එන් ලායි සහ ඊට පස් මසකට පෙර මියගිය සෝවියට් රුසියන් නායක ජෝසෆ් ස්ටාලින් ගේ විශාල පින්තූර රැසකි. ඔවුන් කවුදැයි තමන් නොදන්නා බව හැඟවූ ජිල්ලා 'මෝඩයකු' ලෙස මේ පින්තූර වල ඉන්නේ කවුදැයි නායර් ගෙන් විමසීය.

"ඒ අපේ නායකයෝ" යයි නායර් ඉතා සාඩම්බරයෙන් පැවසීය. ඔහුගේ මේ පිළිතුරෙන් ජිල්ලාට අසූහාරදාහට නැංගේය.

"මොනවා යකෝ? තෝ ලංකාවේ ජීවත්වෙවී පිටරැටියෝ තුන්දෙනෙකුට උඹේ නායකයෝ කියනවද?" යි ජිල්ලා ඔහුට කෑගැසීය. ඉන්පසු ජිල්ලා නායර් ගෙන් ප්‍රශ්නයක් ඇසීය? "උඹ දන්නවද උඹ රුසියානුවෙක් හැටියට රුසියාවේ නැත්නම් චීනෙක් ලෙස චීනයේ ජීවත් වෙවී වෙනත් රටක නායකයන්ගේ පින්තූර තියාගෙන ඒ තමන්ගේ නායකයොයි කියල ඒ රටවල පොලිසියට කිව්වා නම් වෙන දේ?"

### රට පුරා හදිසි තත්වයක් පනවන ලද පළමු අවස්ථාව

නායර් පිළිතුරු නොදී නිශ්ශබ්ද විය.

"එහෙනම් වෙන්නේ උන් උඹේ බෙල්ලෙන් අල්ලලා දේශ ද්‍රෝහියෙක් හැටියට උඹේ කාර්යාලෙම බිත්තියට හේත්තු කරලා වෙඩි තියන එකයි. එහෙම නීතියක් ලංකාවේ නැති එකයි මට කනගාටු" යි ජිල්ලා ඔහුට පැවසීය.

මේ අතරතුර ජිල්ලා සමඟ පැමිණි උප පොලිස් පරීක්ෂක වරයෙකු ඔවුන් බලාපොරොත්තු නොවූ ලෙස පිටු තුන හතරකින් යුත් රහසිගත ලියවිල්ලක කාබන් කොපියක් සොයාගත්තේය. පොතක පිටු අතරේ සඟවා තිබූ එම ලියවිල්ලේ ඉංග්‍රීසි සිරස්තලය වුයේ Plan to capture a country ('රටක් අල්ලා ගැනීමේ පිඹුරුපත') යන අරුත දෙන වැකියකි.

එම ලියවිල්ලට අනුව රටක බලය අල්ලා ගැනීමේ මෙහෙයුමකට අවශ්‍ය මූලික කරුණු වන්නේ ගිනි අවි සහ මුදල් එකතු කිරීමය.

සෑම පොලිස්ථානයකම රයිෆල් තුවක්කු යම් කිසි ගණනක් සහ ඊට අවශ්‍ය පතුරම් ඇති බව එම ලියවිල්ල පෙන්වා දුනි. ඈත පිටිසර බද පොලිස් ස්ථානවලට පහර දී ඒවායේ ඇති ගිනි අවි සහ පතුරම් පැහැරගත යුතුබවට එම ලියවිල්ලෙන් යෝජනා වී තිබිණ. එවකට මෙරට පොලිස් සහ යුද හමුදා නිලධාරීන් සහ ඒ වකවානුවේ මෙරට පදිංචි වී සිටි යුරෝපීයන් සතුවද ඔවුන්ගේ පුද්ගලික පාවිච්චිය සඳහා රිවෝල්වර් සහ ස්වංක්‍රීය පිස්තෝල වැනි කුඩා ගිනි අවි තිබූ අතර ඒවා බොහෝවිට පැවතියේ ඔවුන්ගේ නිවෙස් වල අල්මාරි තුළය. ඒවායේ අයිතිකරුවන් එම ගිනිඅවි ගැන එතරම් අවධානයකින් නොසිටියහ.

එබැවින් එම නිවෙස් වල මෙහෙකරුවන් ලවා එම අවි සහ පතුරම් සොරකම් කිරීමට මගපාදා ගත යුතු බවද රහස් ලියවිල්ලෙන් යෝජනා විය. (පසු කලෙක ජ.වි.පෙ.කැරලි කරුවන් අනුගමනය කළ උපක්‍රමද මීට සමාන විය) එකල ගම්බද පළාත්වල බැංකු නොතිබුණ අතර කොළඹින් පිට තිබුණේද බැංකු ඉතා සුළු ගණනකි. එනිසා වතු අධිකාරිවරු වතු කම්කරුවන්ට ගෙවීම සඳහා බැංකු වලින් මුදල් ගෙන එකම මගක් ඔස්සේ නැවත සිය වතුවලට ඒමට පුරුදුව සිටියහ. ඒ කටයුත්තට සෑම මසකම එක් දිනක් වෙන්කර තිබිණ. ඔවුන් එසේ මුදල් රැගෙන එනවිට පාළු ස්ථානයකදී මග හරස්කර වතු අධිකාරිවරයා මරා මුදල් පැහැරගත යුතු අන්දම ගැන ලියවිල්ලේ සටහනකින් දක්වා තිබිණ. (හර්තාලය පටන් ගැනීමට පස් වසරකට පෙර මංකොල්ලකරුවන් පිරිසක් එවකට රක්වානේ මාදම්පේ වතුයායේ යුරෝපීය අධිකාරි ජෝන් වයිට් හවුස් කොළඹ-රක්වාන පාරේදී ඝාතනය කර මුදල් පැහැර ගැනීමට අසාර්ථක ප්‍රයත්නයක යෙදුනේ මේ අයුරින්ය.) මංකොල්ලය සිදු වූ සැණින් පොලිසිය කොල්ලකරුවන් ඇල්ලීමට දැවැන්ත මෙහෙයුමක් දියත් කිරීම අනිවාර්ය බැවින් කොල්ලකාගත් මුදල් වහාම කැලෑබද පෙදෙසක සුරක්ෂිතව වළලා දැමිය යුතු බවටද ලියවිල්ලෙන් උපදෙස් දෙන ලදී.

මෙම කුමන්ත්‍රණකාරී රහස් ලියවිල්ල සොයාගැනීම පිළිබඳව ජිල්ලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ෆ්‍රිට්ස් ස්කානිවල් මහතාට දැන්වූ විට ඔහු පැවසුවේ මෙය 'බෝම්බයක්' බවත් වහාම එය දැඩි ආරක්ෂාවක් යටතේ කොළඹට යැවිය යුතු බවය. ජිල්ලා පවසන අන්දමට රටපුරා හදිසි තත්වයක් පැනවීමට ප්‍රධාන හේතුව වුයේ මෙම ලියවිල්ලය. ලංකාව බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස ලැබීමෙන් පසු රට පුරා හදිසි තත්වයක් පනවන ලද පළමු අවස්ථාව එය විය.

මේ නිසා සිය ආරක්ෂාව පිණිස කැබිනට් මණ්ඩලය රැස්වුයේ ඒ දිනවල කොළඹ වාරයේ නැංගුරම් ලා තිබූ බ්‍රිතාන්‍ය රාජකීය නාවික හමුදාවේ යුද නෞකාවකය. රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ සියලු කටයුතු ලකිසුරු ඔලිවර් ගුණතිලක යටතට පත්වූ අතර අගමැති ඩඩ්ලි සේනානායක අසනීප තත්වයක් බව පවසමින් රාජකාරි කටයුතුවලින් ඉවත්විය.

### ඩඩ්ලිගේ 'බඩේ රුදාවේ' ඇත්ත කතාව

මෙය "ඩඩ්ලිට බඩේ රුදාවක් ඇතිකළ හර්තාලය" ලෙසින් ඒ.ජා.ප.විරෝධීන්ගේ සමච්චලයට ලක් විය. යුද හමුදාවේ සහයෙන් හර්තාලය දෙදිනක් ඇතුළත මැඩලන ලදී. හර්තාලය මුවාවෙන් මතුවුණු ප්‍රචණ්ඩ ක්‍රියා මර්දනය කිරීමේදී මියගිය සමස්ත ගණන නව දෙනෙකි (මේ සිදුවීම් පසුකලෙක ජීවිත රැසක් බිලිගනිමින් ඇතිවූ ජනතා විමුක්ති පෙරමුණේ සන්නද්ධ කැරලිවල පෙර නිමිත්තක් බඳු විය)

රහස් ලියවිල්ල පිළිබඳව පාර්ලිමේන්තුවේදී හෙළිවූ විට කොමියුනිස්ට් පක්ෂ නායක පීට කෙනමන් ගත් කටටම පැවසුවේ එය පොලිසිය විසින් ගොතන ලද අමූලික බොරුවක් බවයි.

# තරංග

එහෙත් ලියවිල්ල සොයා ගන්නා ලද්දේ පොලිස් නිලධාරි ජිල්ලා විසින් බව කෙනමන් මහතා දැනගත් විට සිය චෝදනාව ඉවත් කරගත් ඔහු ඊළඟට පැවසුවේ එය මලයාවේ (වත්මන් මැලේසියාව) කොමියුනිස්ට් පක්ෂය විසින් ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයට එවනලද 'පරණ' ලියවිල්ලක් බවයි. එහෙත් ඔහුගේ මේ 'පැහැදිලි' කිරීම පොලිසියට ගැටලු සහගත විය .

එම ලියවිල්ල පරණ නම් එහි උපදෙස් දී තිබූ ආකාරයට ඌරගහ සහ පුගොඩ පොලිස්ථාන වලටද හර්තාල් කරුවන් පහර දුන්නේ ඇයි? ඔවුන් ගෙන් සමහරු මහනුවර නිවෙස් කිහිපයකින් ගිනි අවි අවි සොරකම් කෙළ් ඇයි? එපමණක් නොව යටකී රහස් ලියවිල්ලේ යෝජනා කර තිබූ අයුරින්ම මලයාවේ කොමියුනිස්ට් පක්ෂයෙන් මෙහෙයවනු ලැබූ 'මලයානු ජාතික විමුක්ති හමුදාව' ඒ අවස්ථාව වන විටත් එරට සන්නද්ධ කැරැල්ලක් දියත් කර තිබීමද ලංකා පොලිසියේ සැකයට තුඩු දුන්නේය.

### රහසිගත ලියවිල්ලක කාබන් කොපියක්

බ්‍රිතාන්‍ය සහ පොදුරාජ්‍ය මණ්ඩල හමුදා විසින් 1948 දී ඇරඹි එම කැරැල්ල ඉතා දරුණු ලෙස මඩිනු ලැබ 1960 දී අවසන් වුයේ ජීවිත රැසක් බිලිගනිමින්ය. ඒ වන විට බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස ලැබූ මලයාව, මැලේසියාව බවට පත්වී තුන්වරසක් ගතවී තිබිණ.

අරගලයට තුඩු දුන් සාධාරණ ආර්ථික හේතුන් තිබූ නමුත් එය 'කොමියුනිස්ට් විමුක්ති සටනක්' බවට පත්වීම එහි අන්ත පරාජයට මගපෑදීය. එරට ප්‍රධාන ජනකොටස වූ මැලේ ජාතිකයන් වැඩි දෙනා මාක්ස් වාදීන් නොවීම හෝ කොමියුනිස්ට් විරෝධීන් වීම ඒ පරාජයට තුඩු දුන් හේතුන්ගෙන් එකක් විය.

ඔවුන්ට වුවමනා වුයේ බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස් වීම විනා ඒ වෙනුවට සිය රට කොමියුනිස්ට් රාජ්‍යයක් බවට පත්කිරීම නොවේ. ලංකාවේ පැරණි වමට මෙන්ම පසුකලෙක ජ.වි.පෙ. කැරලි දෙකටම අත්වුයේද ඒ හා සමාන ඉරණමකි.

ජිල්ලා පවසන අන්දමට හර්තාලය නිසා අගමැති ඩඩ්ලි සේනානායක අගමැතිකමින් ඉවත් වීමට හේතු වූ 'බඩේ රුදාවේ' ඇත්ත කතාව මෙසේය.

හර්තාලය මැඩලීමෙන් ටික දිනකට පසු අගමැතිවරයා සිය තනතුරින් ඉල්ලා අස්වීමට සූදානම් වන බව දැනගත් එවක පොලිස්පති (මෙරට පළමු ලාංකික පොලිස්පති) රිචඩ් අලුවිහාරේ ඒ අස්වීමේ ප්‍රකාශය ප්‍රමාද කරන ලෙස සේනානායක මහතාගෙන් ඉල්ලීම සඳහා ඔහු හමුවීමට තීරණය කෙළ්ය. ඒ දිනවල අගමැති හඟුරන්කෙත පන්සලට ගොස් සිටි බැවින් තමා එහි එන බව අගමැතිවරයාට දන්වන ලෙස පොලිස්පති අලුවිහාරේ ජිල්ලාට උපදෙස් දුන්නේය.

සේනානායක මහතා සැමගේම සිත දිනාගත්, බලයට කෑදර කමින් තොර නිහතමානී දේශපාලනඥයකු විය.

එහෙත් අවදානම් අවස්ථාවක රජයට එල්ලවන බරපතළ අභියෝග වලට දක්ෂ රාජ්‍ය පාලකයකු ලෙස නොබියව මුහුණදීමට සහ ඒ සම්බන්ධයෙන් දැඩි තීරණ ගැනීමට ඔහුට ශක්තියක් නොවීය. ඊට හේතු වුයේ ඔහුගේ ඉතා සංවේදී මනසයි. ඔහු හමුවීමට පොලිස්පතිවරයා එන බව ජිල්ලා දැන්වූ විට සේනානායක මෙසේ පැවසීය.

"රිචඩ් එනකල් මම ඉන්නම්. හැබැයි එයා එන්නේ නිෂ්පල ගමනක්. මම අස්වෙන්න හිතාගෙන ඉවරයි. මගේ පොලිසිය මගේ මිනිස්සු මැරුවා. මම කොහොමද නැවත මගේ ජනතාවට මුහුණ දෙන්නේ?"

තරංග

මිතුරු පවුර



● කමල් පෙරේරා

# සංස්කෘතික මිනිස් පාලම

මිනිස්සු විවිධ අරමුණු උදෙසා විවිධ වෙනත් භාෂාවක් දැන සිටීම ප්‍රයෝජනවත් බව අමුතුවෙන් කිව යුතු නැත. විශේෂයෙන්ම භාෂා ගණනාවක් කතා කරන ජන වර්ග රාශියක් සිටින රටවල ජනයාට මේ හේතුවෙන් සමාජ සබඳතා පැවැත්වීම ඉතා පහසු වෙයි.

අපේ ලංකාව ගැන සලකා බලන විට ප්‍රධාන වශයෙන් ජනවර්ග තුනක් මෙහි ජීවත් වන බව අපි දනිමු. එසේ වුවද වාසනාවකට මෙන් සිංහල ජනයාට අමතරව මෙහි වෙසෙන දෙමළ හා මුස්ලිම් ජනයා ඔවුන්ගේ මවු බස ලෙස වහරන්නේ දෙමළය. ඒ නිසා සිංහලයන් දෙමළත් - දෙමළ හා මුස්ලිම් ජනයා සිංහලත් ඉගෙන ගැනීම ලාංකික සමාජයේ මානව සබඳතා මනාව පවත්වාගෙන යාමට රුකුලකි.

එසේ නමුත් මේ භාෂා දෙක ප්‍රමාණවත් තරමින් ඉගෙන ගෙන ජාතියක් හැටියට එකට අත්වැල් බැඳගෙන ඉදිරියට යාමේ හැකියාව අපි තවමත් උදා කරගෙන නැති බවද කනගාටුවෙන් වුවත් මෙහිදී සඳහන් කිරීමට සිදුව තිබේ. 48දී ලැබුණාය කියන නාමික නිදහසෙන් පසුව තබා 72 ජනරජ ව්‍යවස්ථාවක් සම්මත කරගනිමින් උදා කරගත් පූර්ණ සෛවරීභාවයෙන් පසුවවත් වගකිව යුත්තන් මේ පිළිබඳව ගැඹුරින් කල්පනා නොකිරීම නිසා ජාතියක් වශයෙන් අපි සෑහෙන පසුබෑමකට ලක් වූයෙමු. වසර තිහක වේදනාකාරී බෙදුම්වාදී යුද්ධයම වුවත් මෙහි රුදුරු පලවිපාක පිළිබඳ දුක්මුසු උදාහරණයක් නොවේද?

පොදුවේ සමස්ත සමාජයම අසල්වැසියාගේ භාෂාව ඉගෙනීමට උනන්දු වන්නේ නම් සමාජයකට නෙළා ගත් හැකි අස්වනු අපමණය. මගේ අසල්වැසියන් වන දෙමළ හා මුස්ලිම් ජනයා පරිහරණය කරන දෙමළ බස නොදැනීම නිසා මා දැඩි අපහසුවට සේම සිත් තැවුලටත් පත් වාර ගණන අනන්ත බව ලජ්ජාවෙන් වුවත් ඔබට පැවසිය යුතුය. ඉන් එක අවස්ථාවක් පමණක් මා ඔබට සිහිපත් කර සිටින්නේ අවම වශයෙන් හෙට දවසේ රට බාර ගැනීමට නියමිතව සිටින අපේ දරු පරපුර හෝ මේ අවාසනාවෙන් මුදා ගනු පිණිසය.

කොටි සංවිධානය හා රජය අතර සාම ගිවිසුමක් පැවති සමයේ මට යාපනයට යාමේ අවස්ථාවක් ලැබිණි. මා එවකට සේවය කරමින් සිටියේ මහජන බැංකුවේය. එහි මාණ්ඩලික ප්‍රකාශනය වූ බැංකුවයි ඔබයි සඟරාවට උතුරේ යුද ගැටුම් මැද මහජන බැංකුව ඉටු කරමින් සිටි මෙහෙවර පිළිබඳව ලිපියක් සැකසීම සඳහා තවත් බැංකු සගයන් කිහිප දෙනකු සමග මම එහි ගියෙමි. දෙමළ බස දැන සිටියේ අපේ එක් සගයකු පමණි. මට අවැසි ප්‍රශ්නය සිංහලෙන් පැවසූ විට ඔහු එය දෙමළ බසට නගා ඉදිරිපත් කළේය.

චාවකච්චේරියේදී අපට බැංකුවේ ජ්‍යෙෂ්ඨ ගනුදෙනුකරුවකු සමඟ කතා කිරීමට සිදු විය. මා සිංහලෙන් විමසූ පැනය මගේ සගයා දෙමළට නගන විට ජ්‍යෙෂ්ඨයා සිනහ වෙන්නට පටන් ගත්තේය.

"ඕක තමා මහත්තයා අපේ රටට මේ වගෙ කනගාටුදායක ඉරණමක් අත් වෙන්ඩ ප්‍රධාන හේතුව. ඔබතුමන්ලට දෙමළ බැහැ. අපේ මිනිස්සුන්ට සිංහල බැහැ. මහත්තයලගෙයි අපෙයි දේශපාලන නායකයො මුලදිම ඔය ප්‍රශ්නෙ විසඳලා තිබ්බනං අපේ රටේ මේ වගේ විනාසකාරි යුද්ධයක් වෙන්නෙ නැහැ නේද?"

රාජ්‍ය සේවකයකු වූ ඒ ජ්‍යෙෂ්ඨයා දිවයිනේ සිංහල ප්‍රජාව වෙසෙන ප්‍රදේශ කිහිපයකම සේවය කර තිබිණ. යුද්ධය ඇරඹී පසු ඔහු විශ්‍රාම ගෙන ගමට ආවේය. ඔහු චතුර ලෙස සිංහල කතා කරන විට අපි ලජ්ජාවට පත් විමු. අපි උතුරේ චාරිකාව නිමා කොට ගුවන් හමුදාවේ හෙලිකොප්ටරයකින් යළි ගම් රටවල් බලා එන අතරතුර හැකි ඉක්මනින් දෙමළ ඉගෙන ගැනීමට ගිවිස ගතිමු.

එහෙත් ඒ ගිවිසුම කාලයේ වැලි තලයේ යටපත්ව ගියේ අපටත් හොරෙනි. අපේ ප්‍රමුඛතා ලයිස්තුවේ ඊට වඩා බොහෝ වටිනා දේ පෙළ ගැසී තිබිණ.

මෑතකදී මම අන්තර්ජාලයේ සැරිසරමින් සිටින විට කේරළ ප්‍රාන්තයට වෙනත් පෙදෙසකින් කම්කරු රැකියාවක් පිණිස ආ මිනිසකු පවසා තිබූ මසුරං කියමනක් දක්නට ලැබිණ.

"මම මෙහාට එද්දි දැනගෙන හිටියෙ මගෙ මවු භාෂාව විතරයි..දැන් මම භාෂා දෙකක් දන්නවා.. කේරළයේ භාෂාවෙන් කතා කරනකොට මට ලොකු පිළිගැනීමක් තියෙනවා.. එක භාෂාවක් කියන්නෙ තනි මිනිහෙක්... භාෂා දෙකක් කියන්නෙ මිනිස්සු දෙන්නෙක්.. දැන් තමා මට ඒක හොඳට තේරෙන්නෙ.."

ඒ මසුරං කියමනට ලොකු ප්‍රසිද්ධියක් නොලැබුණේ එය අහිංසක කම්කරුවකුගෙ මුවින් පිටවූ වචන කිහිපයක් නිසා පමණක් විය හැකිය. දැන්වත් අපි අපේ දරුවන්ට කියා දිය යුත්තේ පඬිවරු පමණක් නොව වැඩබිම්වල දාදිය හෙළන සාමාන්‍ය මිනිසුන්ද වටිනා අදහස් පළ කරන බව නොවේද?



# ලංකාවට පටවන තෙක් නවසීලන්ත හිරේ ඉන්න ලාංකිකයා

● ජාලිය වීරක්කොඩි

**ශ්‍රේෂ්ට සම්පන්න ලෝකයක මිනිස්සු කාන්තාවන්ට ගෞරවනීය ලෙස සලකති. ඔවුන්ගේ අයිතීන් පිළිබඳව වග වෙති. එහෙත් මානව අයිතීන් ගරු කරන ශික්ෂිත සං යුරෝපීය රටක දී මේ කෙරුවාව විහිලුවක් නොවේ. ජීවිතයෙන්ම වන්දි ගෙවිය යුතු අපරාධයකි. එවන් අපරාධයකට නවසිලන්තයට සංක්‍රමණය වූ ශ්‍රී ලාංකිකයෙක් පසුගිය සතියේ සිකුරාදා (15) වනදි ගෙවූ ආකාරය අන්තර්ජාතික මාධ්‍යය වාර්තා කළේය.**

ඔහු වරදකරු වූයේ නවසීලන්තයේ ක්‍රිස්ට්චර්ච් හි දී නිදාගෙන සිටි තරුණ කාන්තාවකට ලිංගික අතවර කිරීමේ සිද්ධියකටය. ක්‍රිස්ට් චර්ච් දිසා අධිකරණයේ දී සිද්ධිය දිගහැරෙන්නේ මෙසේය. ඔහු ශ්‍රී ලාංකිකයෙකි. තිස් හැවිරිදිය. නමින් කේ. ද සිල්වා ය. ඔහුට අධිකරණය ඉදිරියේ එල්ල වූ චෝදනාව වූයේ නීති විරෝධී ලිංගික සම්බන්ධතා පැවැත්වීමය.

සිල්වා නවසීලන්තයට එන්නේ වර්ෂ 2014 දීය. එතැන් සිට සංක්‍රමණිකයෙක් ලෙස හේ ඒ රට තුළ ජීවත් වූයේය. මේ පුද්ගලයා චෝදනා ලබන සිද්ධිය වන්නේ මීට වසර එක හමාරකට පමණ කලිනි. හරියටම කියනවා නම් වර්ෂ 2018 නොවැම්බර් 10 වන දිනය. එදින සවස සිල්වා සිය මිතුරන් සමඟ මත්පැන් සාදයක් සඳහා පිටත්ව ගියේය.

කණ්ඩායම සාදය නිමා කර රාත්‍රී 11.30 ට පමණ පැමිණිහය. අනතුරුව ඔවුන්ගෙන් එක් අයෙක් පදිංච සිටින මහල් නිවාසයකට ගොස් සාදය දිගටම පවත්වාගෙන ගිහය. ඔහුගේ පෙම්වතිය මේ කණ්ඩායමේ වූවාය. සාදය පාන්දර දක්වා පැවතිණි. මේ අතර තරුණියගේ පෙම්වතා කණ්ඩායමෙන් ඉවත්ව ඔහුගේ සයනය වෙත ගියේය.

අගතියට පත් තරුණිය අධිකරණයේ දී කියා තිබුණේ ඇය සිය පෙම්වතා නිදි යහනට ගොස් ටික වෙලාවක් ගතවත්ම ඇයද ඔහුගේ යහන වෙත ගිය බවය. ඇය ඒ වන විට සිට ඇත්තේ හොඳටම වෙරි මතිනි. මඳ වෙලාවකින් ඇය අවදි වූවාය. ඒ යමෙකුගේ ස්පර්ෂයෙනි. ඒ සිය යටිකය ප්‍රදේශයෙන් නැගුණු චුම්බනයකි. ඒ සිය පෙම්වතා යැයි සිතූ ඇය ඔහුව වැලඳගෙන සිප ගන්නට වූවාය.

එහෙත් මඳ වෙලාවක් ගතවන විට ඇයට නුහුරු ස්වරූපයක් දැනී තිබිණි. මේ තම පෙම්වතා නොවන බව ඇති වූ සැකයෙන් කැලඹුණු ඇය වහාම තමන් සමඟ සිටින පුද්ගලයා වෙතින් ඉවතට




පැන ගත්තාය. එසැණින්ම ඇය කාමරයේ විදුලි පහන් දැල්වූවා ය. ඇය සමඟ ඇඳේ සිටියේ ඇයගේ පෙම්වතා හා ඇය සමඟ එකට මධු සාදයේ සිටි සිල්වා ය. සිද්ධිය අධිකරණය තෙක් ගමන් කරන්නේ ඒ සිදුවීමෙන් ඇයට ඇති වූ දරාගත නොහැකි කම්පනයත් සමඟිනි.

නඩුව දිගටම විභාග වුණේය. නඩු විභාගය අතරතුර සිල්වා කියා සිටියේ මෙම ලිංගික හැසිරීම සිදුවූයේ දෙදෙනා අතර වූ සම්මුතිකයින් බවය. එකිනෙකාගේ එගතාවයෙන් ඇති වූ මේ සම්බන්ධය පිළිබඳ සම්මුතිය ඇයට අමතක වන්නට ඇති ප්‍රධානම හේතුව ඇයගේ අධික බීමත්කම බවය.

එහෙත් සිල්වාගේ මේ ප්‍රකාශය ජූරි සභාවේ බහුතරයක් පිළිගත්තේ නැත. පැමිණිල්ලේ නීතිවේදීයා මෙම සිදුවීමෙන් වින්දිත කාන්තාවගේ ජීවිතයට එල්ල වී තිබුණු බලපෑම ගැන අධිකරණයට දීර්ඝ කරුණු දැක්වීමක් කළේය. ඔහු කීවේ මාස 21ක් ගතව සිටියදිත් ඇය මේ සිද්ධියේ කම්පනයෙන් පීඩා විඳින බවය. එය ඇයගේ රැකියාවට බලපෑමක් ඇති කළ ආකරයත්, නින්ද නැති වූ ආකාරයත්, පුද්ගලික ජීවිතයේ සම්බන්ධතා බිඳ වැටුණු ආකාරයත්, මානසික සෞඛ්‍යය අන්තයටම පිරිහුණු ආකාරයත් නීතිවේදියා අධිකරණය ඉදිරියේ ප්‍රකාශය කළේය.

විනිසුරුවරයා සිද්ධියට අදාළ තීන්දුව ප්‍රකාශ කරමින් කියා සිටියේ සිල්වා මෙම කාන්තාවට ලිංගික අතවර කරන විට ඇය ඉතා අවදානමට ලක්ව ඇති බවය. ඔහු ඇයගේ විශ්වාසය කඩ කළා පමණක් නොව, ඒ වන විට ඔහු සමඟ මිත්‍රව සිටි ඇගේ පෙම්වතාගේ විශ්වාසයද බිඳ දමා ඇතැයි විනිසුරුවරයා ප්‍රකාශ කළේය.

මේ සිද්ධියෙන් අනතුරුව ක්‍රිස්ට්චර්ච් පොලිසිය ඔහු සම්බන්ධව දීර්ඝ සොයා බැලීමක් කළේය. ඒ සමඟ ඔහු කළ වංචා හා දූෂණ රාශියක් පොලිසිය විසින් හෙළිදරව් කරගත්තේය. එම චෝදනා අධිකරණයට ඉදිරිපත් විය. පසුගිය වසරේ ඔක්තෝම්බර් මාසයේදී සිල්වා ව්‍යාජ ලියකියවිලි භාවිතා කළ බවට චෝදනා 17 ක් එල්ල වුණේය. එම වරදට සහ සොරකම් කිරීමේ එක් චෝදනාවකට ඔහු සිය වරද පිළිගත්තේය. මෙම වරද පසුගිය ජුනි සහ ජූලි මාසවලදී ක්‍රයිස්ට්චර්ච්, කයපොයි, රංගියෝරා සහ ඇෂ්බර්ටන් හි ද සිදු වූ අතර, ඔහු ව්‍යාජ මුදල් නෝට්ටුවලින් භාණ්ඩ මිලදී ගත් අවස්ථා කිහිපයක් ද ඊට ඇතුළත් විය.

මේ අපරාධ තමන් හුදකලවා නොකළ බවත් ඒවා කිරීමට තමන්ගේ කණ්ඩායමෙන් තමන්ට බලපෑම් කළ බවත් ඔහු අධිකරණයට කියා සිටියේය.

ලිංගික බලහත්කාරකම ඇතුළු මේ චෝදනාවලට වරදකරු වූ සිල්වා අවුරුදු දෙකකුත් මාස අටක සිර දඬුවමකට ලක්ව සිටින්නේය. සිර දඬුවම් කාලය නිම වූ වහාම ඔහුව රටින් පිටුවහල් කිරීමට අධිකරණය නියෝග කර ඇත්තේය.

ලෝකයේ දියුණුම රටවලට අපහසුවෙන් සංක්‍රමණය වී ඒ රටතුළ ඇති මානවීය නිදහස අපයෝජනය කරන මෙවැනි මිනිසුන්ට යළි ලංකාවට ඇවිත් කළ හැක්කේ කුමක් දැයි වෙනම සිතා බැලිය යුතුය

කියවන මුද්දර







# අත්කම් වෙනුවෙන් නිමැවුණු මුද්දර..

● නිරෝෂණ පීරිස්

**කියවන මුද්දර' මෙවර වෙන් වන්නේ 'සිරිලක බබළන අත්කම් විස්කම්' තේමා කරගත් නිර්මාණාත්මක මුද්දර ඉතිහාසය විමසීමටය.**

බ්‍රිතාන්‍ය කවුන්සිලය සිදු කරන ලද සමීක්ෂණයකට අනුව, ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන නිර්මාණාත්මක ආර්ථිකයේ ප්‍රධාන අංශ තුනක් හඳුනා ගෙන ඇත. ඒවා නම්, කලාව හා සංස්කෘතිය (ජයාරූපකරණය, දෘශ්‍ය කලා මාධ්‍ය, රංග කලාව, සාහිත්‍ය කලාව, උරුමය සහ අත්කම්), නිර්මාණකරණය (මෘදුකාංග නිමැවීම, ප්‍රචාරණය සහ වෙළඳ දැන්වීම්කරණය, නිර්මාණ ශිල්පය, ආලේඛ්‍ය සැලසුම්, කාර්මික නිර්මාණකරණය හා විලාසිතා නිර්මාණකරණය) හා මාධ්‍යය (ප්‍රකාශනය, ගුවන්විදුලි සහ රූපවාහිනී මාධ්‍ය, ඩිජිටල් මාධ්‍ය, චිත්‍රපට සහ වීඩියෝකරණය) යන අංශයන්ය.

මේ කොහොම වුණත් අපේ රටේ හස්ත කර්මාන්ත ඉතිහාසය ජාතියේ ඉතිහාසය තරමටම පැරණිය. ඒ අනුව, සාමාන්‍ය ජන ජීවිතයේ කොටසක් වූ කෘෂිකර්මාන්තය සමඟ විවිධ හස්ත කර්මාන්ත සමාන්තරව පැවති බව පැහැදිලිය. මෙම නිර්මාණ වෙළඳපොළ සඳහා




නොව අවශ්‍යතාවයට පමණක් සරිලන පරිදි වීය.

හස්ත කර්මාන්ත ශිල්පීය ක්ෂේත්‍ර අතර, මැටි, කෙඳි පත්‍ර හා තෘණ, දුම්බර රටා, වේවැල් සහ උණ බට, ලෝහ, ආභරණ, වෙස් මුහුණු සහ රූකඩ, කැටයම් මුහුණු, සංගීත භාණ්ඩ, රෙදිපිළි, බතික්, රේන්ද, ලක්ෂා, දැව කලා, සම්භාණ්ඩ, සාම්ප්‍රදායික චිත්‍ර හා මූර්ති, පොල් - කිතුල් - තල් ආශ්‍රිත නිර්මාණ, සේසත්, සිහිවටන ආදී ශිල්පීය ක්ෂේත්‍ර රැසක් දක්නට ලැබේ.

ස්වදේශිකත්ව ප්‍රවර්ධනය, පාරිසරික හිතකරභාවය, ග්‍රාමීය රැකියා ව්‍යුක්තිය අවම කිරීම වැනි අරමුණුද, දේශීය හස්ත කර්මාන්තකරුවනට දෙස් විදෙස් වෙළඳපොළ අවස්ථා ඇති කිරීමේ අරමුණද පෙරදැරිකරගෙන, වර්ෂ 1964දී 'ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය' ලෙස හැඳින්වෙන, "ලක්සල"ආරම්භ කරන ලද අතර, 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන පනත යටතේ 'ජාතික ශිල්ප සභාව' පිහිටුවා තිබේ.

හස්ත කර්මාන්ත පදනම් කරගෙනද මනරම් සමරු මුද්දර අතීතයේ නිර්මාණය වී ඇති මුද්දර අතරින් අපට හමුවේ.

මෙහිදී ලක්සල රජත ජයන්තිය (1964-1989) නිමිත්තෙන් 1990 අප්‍රේල් 2 වන දින අත්කම් නිර්මාණ සහිත නව සමරු මුද්දර හතරක් එළි දක්වන ලදී. සාම්ප්‍රදායික බෙර, රිදී භාණ්ඩ, ලක්ෂා භාණ්ඩ සහ දුම්බර පැදුරු එම මුද්දර මත සිතුවම් කර තිබුණි .

එමෙන්ම 1977අප්‍රේල් 07 වැනි දින 'ශ්‍රී ලංකවේ අත්කම්' නමින් අගනා මුද්දර 4ක් නිකුත් කරන ලදී. පිත්තල භාණ්ඩ, ස්වර්ණාභරණ, මැණික් ඔබ්බවූ ඇතෙක් සහ වෙස් මුහුණක් එම මුද්දර මගින් නිරූපිතය.

එක්දහස් නවසිය අනූ දෙකේ අගෝස්තු 19 වැනි දින 'ශ්‍රී ලංකාවේ වෙස් මුහුණු' නමින් අගනා මුද්දර 4ක් නිකුත් කර තිබේ. කෝලම් මුහුණක්, නිලමක්කාර මුහුණක්, බිසෝ මුහුණක් සහ රජ මුහුණක් එහි දක්නට විය.

නැවතත් 1996 මාර්තු 13 වැනි දින මේ තේමාවට අදාළවම සේසත්, මැටි බඳුන්, පැදුරු සහ රේන්ද මුද්දර 4ක් නිකුත් කර තිබේ.

මේ අතර 1998 අප්‍රේල් 24 වැනි දින තවත් අගනා නිර්මාණ සහිත සමරු මුද්දර 4ක් මුද්දර ලෝකයට එක් විය. ඒ 'ශ්‍රී ලංකාවේ පාරම්පරික ස්වර්ණාභරණ හා භාණ්ඩ' යන තේමාව පදනම් කරගෙන හුණු කිල්ලෝටය, අගස්ති මාලය, වළල්ල සහ කොන්ද කූර, සීගිරි කුණ්ඩලාභරණය යන මුද්දර එම නිකුතුවට අයත් විය.

මීට අමතරවද, දේශීය හස්ත කර්මාන්ත යන පොදු තේමාවට තවත් අවස්ථා ලබාදී ඇති බව මුද්දර ඉතිහාසය පිරික්සීමේදී දක්නට ලැබේ.

ලංකාවේ අපටත්, සෙසු ලෝකයාටත්, දේශීය අත්කම් පිළිබඳව කියා දිය හැකි හොඳම දෘශ්‍ය සන්නිවේදනය මුද්දරයයි. මුද්දර පර්යේෂිකා පොලිනා රෙන්ටෝ පවසන පරිදි, "සාමාන්‍ය පුරවැසියාගේ එදිනෙදා ජීවිතයේදී මෙසේ නිල දෘෂ්ටිය ක්‍රියාත්මක කරන මුද්දරයක් වැදගත් පණිවුඩකරුවෙකු බවට පත් කරන්නේ එහි දෘශ්‍ය ගුණාංගයි

# දැනුම වැඩුම

සැකසුම
● දිනූෂා පෙරේරා

### ජලය උණු කිරීමට යොදන භාජන වල ඇතුළු පැත්තේ ඝන සුදු පැහැති තට්ටුවක් බැදී පවතින්නේ ඇයි?

සමන්ත හීන්දෙණිය- කෑගල්ල

සමහර පළාත් වල ජලය උණු කිරීමට යොදන භාජන වල ඇතුල් පැත්තේ ඝන සුදු පැහැති තට්ටුවක් බැදී පවතී. එම පළාත් වල ජලයේ කැල්සියම් බයිකාබනේට් හා මැග්නීසියම් බයිකාබනේට් දියවී පවතී. රත් කිරීමේදී මෙම ලවණ කාබනේට බවට පත්වී භාජනය පතුලේ තැම්පත් වේ.

### මදුරුවන්ගෙන් ඒඩ්ස් බෝ විය හැකිද?

ජගත් අනුරුද්ද-දොම්පේ

මේ පිළිබඳ පර්යේෂණ කළ පර්යේෂකයන් මීට දෙන පිළිතුර වන්නේ නැත යන්නයි. වයිරස තත්පර කිහිපයක් දී මදුරුවා තුළ මිය යාම සිදුවේ. මැලේරියා පරපෝෂිතයා එසේ නොවේ. උගේ ජීවන චක්‍රයේ එක් කොටසක් මදුරුවා තුළ සිදුවේ. මැලේරියා පරපෝෂිතයා මදුරුවා තුළ ජීවත්ව සිටින නිසා මදුරුවා විදින තවත් අයකුට රෝගය බෝවන්නේ. ඒඩ්ස් වෛරසය මදුරුවා හෝ වෙනත් ලේ උරා බොන සත්ත්වයන් මගින් බෝ නොවන බව තහවුරු කර තිබේ.

### අධික ලෙස මත්පැන් පානය කළ අයට දෙහි යුෂ දෙන්නේ ඇයි?

සමනිතා වීරපන - බෙන්තොට

දෙහි යුෂ තුළ සිට්‍රික් අම්ලය අඩංගුය. මෙම සිට්‍රික් අම්ලයත් මත්පැන් වල ඇති ඊතයිල් මධ්‍යසාරයත් ක්‍රියාකොට ඊතයිල් සිට්‍රේට් නැමැති එස්ටරයත් ජලයත් සාදයි. මේ හේතුවෙන් මත්ගතියට හේතු වූ මධ්‍යසාරය කෙමෙන් කෙමෙන් ඉවත්වීම නිසා මත්පැන් පානය කළ පුද්ගලයාට සහනයක් දැනේ.

### රෙදි සූර්යාලෝකයට නිරාවරණය වූ විට පාට පිච්චෙන්නේ ඇයි?

සුසන්ත රත්නායක. - කඩවත



මෙම ක්‍රියාවලිය විරංජනය නමින් හඳුන්වයි. හිරු එළිය යනු මූලික වර්ණ හතක එකතුවකි. බොහෝ දේ වර්ණ ලෙස පෙනෙන්නේ හිරු එළියේ ඇති අනෙක් වර්ණ උරාගෙන, යම් නියත වර්ණයක් පමණක් පිට කිරීම නිසයි. රතු දෙයක් එලෙස පෙනෙන්නේ අනෙක් වර්ණ උරාගෙන රතු වර්ණය පමණක් පිට කිරීම නිසයි. හිරු එළියේ තිබෙන පාර ජම්බුල රශ්මි මෙම වර්ණ උරාගෙන එහි රසායන සංයුතිය වෙනස් කරයි. එය බොහෝ විට ඔක්සිකරණයවීම සිදුවේ. මෙලෙස සිදුවූ විට කලින් මෙන් වර්ණ පිටකිරීමක් සිදු නොවේ. වර්ණ පිච්චෙන බවට පවසන්නේ මෙම තත්ත්වයට පත්වීමය.

### පොල්ගෙඩිය ඇතුළේ වතුර ඇත්තේ ඇයි?

දීප්ති මංගලිකා- හොරණ

මෙය පොල්ගසට ආවේණික ලක්ෂණයකි. පොල්ගෙඩිය පැළවීමේ දී එයට අවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ සැපයිය යුත්තේ ජලය මාධ්‍යයක් තුළිනි. භ්‍රෑණ පෝෂණයට අවශ්‍ය පදාර්ථ පොල් මදය තුළ ඇත්තේ ඝන ද්‍රව්‍යයක් ලෙසිනි. එය දියර තත්වයට පත් කරවීමට අවශ්‍ය මාධ්‍යයක් ලෙස පොල් වතුර ක්‍රියා කරයි. සීනි, ලෝහ, ලවණ, සහ තවත් හෝමෝන එන්සයිම පොල් වතුරේ දිය වී තිබෙනවා. විශේෂයෙන්ම සෙලියුලේස් නම් එන්සයිමය පොල්මදයේ ඇති හෙමි සෙලියුලෝස් සීනි බවට පෙරළනවා. ද්‍රව්‍ය ප්‍රවාහන මාධ්‍යයක් ලෙස පොල්වතුර ක්‍රියාකර පොල් බීජය වැඩීමට අවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ සපයනවා.

### දහවල් කාලයට වඩා රාත්‍රියේ දී ගුවන්විදුලි හඬ පැහැදිලි ඇයි?

නීල් දසනායක- යක්කල

ගුවන් විදුලි වැඩසටහන් විකාශනය කිරීමට මධ්‍යම තරංග හා කෙටි තරංග යන ආකාර දෙකක ගුවන් විදුලි තරංග යොදා ගනියි. රාත්‍රී කාලයේ දී වඩා පැහැදිලිව ඇසෙන්නේ කෙටි තරංග විකාශනයන් සාමාන්‍ය යෙන් මධ්‍යම තරංග විකාශනවලට වඩා දුරක සිට කෙටි තරංග විකාශනවලට ඇහුම් කන් දෙන්න හැකි බැවිණි. කෙටි තරංග ඈතට ගමන් කරන්නේ වායුගෝලයේ ඉහළ මට්ටමේ පිහිටි විදුලි ආරෝපණ සහිත ස්ථරවල වැදී පරාවර්තනය වීමෙනි. මෙය ආරෝපණ අංශු සහිත ස්ථරය අයන තලය කියා හඳුන්වයි. අයන තලයේ වැදී කෙටි ගුවන් විදුලි තරංග පරාවර්තනය වන්නේ හරියට කැඩපතකින් ආලෝකය පරාවර්තනය වන ලෙසයි. දහවල් කාලයේ අයන තලයේ ඝනකම වැඩිවේ. රාත්‍රී කාලයට එහි ඝනකම දවල්ට වඩා අඩුය. දහවල් කාලයේ දී ඝනකම අයන තලය විසින් ගුවන් විදුලි තරංග වලින් වැඩි කොටසක් උරා ගනියි. ඒ නිසා අයන තලයේ වැදී පොළවට පරාවර්තනය වන්නේ දුර්වල තරංගයි. එනිසා පැහැදිලි බව අඩු වේ. රාත්‍රී කාලයේ දී අයන තලය තුනී වීම නිසා කෙටි ගුවන් විදුලි තරංග උරා ගැනීම අඩුවේ. මේනිසා පරාවර්තනය වන සංඥාව දුර්වල වන්නේ දහවලට වඩා අඩුවෙනි. එනිසා රාත්‍රියේදී කෙටි තරංග විකාශනවල ශබ්දය වඩා පැහැදිලි වේ.

### මිරිස් හෝ කොච්චි අතින්පොඩි කරන විට අත දන්නේ ඇයි?

සඳමාලි විතානගේ - අම්බලන්ගොඩ



මිරස්,කොච්චි වර්ගවල කැප්සසීන් නම් රසායනිකයක් තිබේ. එහි ප්‍රමාණය සීයට එකක් පමණ වේ.මාළු මිරිස්වලට වඩා වැඩියෙන් එය කොච්චිවලතිබේ. මිරිස්කරලක්පොඩි කරද්දී එම රසායනය යුෂ සමඟ එළියට විත් හම මතුපිට තැවරේ. හම යට ඇති ස්නායුවල එම රසායනය ගැටීමෙන් ඇති වන සංඥා මොළයේ මධ්‍යස්ථාන තුළ ඇති වන සංවේදීතාවය දැවීම ලෙස දැනේ. මෙය උද්දීපනය ලෙස හඳුන්වයි. ගම්මිරිස්වලඇති පිපරින් නම් රසායනිකයත් දැවිල්ල ඇති කරයි.

### හැකරැල්ලෙකුට ගැසූවිට සැණකින් වකුටු වන්නේ ඇයි?

ප්‍රසාද් රූපසිංහ- ගලේවෙල

මෙය ස්වයං ආරක්ෂක පියවරකි. 'ප්‍රතීක ක්‍රියා' ලෙස මෙය හඳුන්වනවා. හැකරැල්ලාගේ පිට පැත්ත ඝන අවරණයකින් සෑදී ඇති බැවින් තව දුරටත් තුවාල සිදුවීම වළකිනවා. කබල්ලෑවා,ඉල්බා වැනි සතුන් ද හදිසි අපදා අවස්ථාවලදී කටුව ඇතුළට රිංගීම හෝ හැකිළීම සිදු කරන්නේ ආරක්ෂක ප්‍රතීක ක්‍රියාවක් ලෙසයි.

තරංග

# ලොව විශාලතම දූපත් රාජ්‍යයේ 1978 කැරැල්ල



ජනාධිපති සුකර්නෝ



ජනාධිපති අබ්දුල් රහ්මාන් වහීඩ්



ජනාධිපති හබීබි



ජනාධිපතිනී මෙගාවතී සුකර්නොපුත්‍රි



ජනාධිපති සුහර්තෝ



වත්මන් ජනාධිපති ජෝකෝ විඩෝඩෝ



● අනුර බී. සෙනෙවිරත්න

**කිසියම් රටකට දූපත් 18,307 ට වඩා වැඩි ප්‍රමාණයක් අයත්ව ඇතැයි කිවහොත්, සමහරවිට ඔබ පුදුමයට පත්වනවා නොඅනුමාන ය. එහෙත්, ලොව එවැනි දූපත් විශාල ප්‍රමාණයක් අයත් රටවල් බොහෝ ගණනක් තිබේ. එසේ දූපත් 18,307 ට වඩා වැඩි ප්‍රමාණයක් අයත් ලොව විශාලතම දූපත් රාජ්‍යය වන්නේ ඉන්දුනීසියාව යි.**

වර්ග කි.මී. 1,904,569 ක භූමි ප්‍රමාණයකින් යුත් එරට මුළු ජනගහනය 255,461,700ක් පමණ වන අතර, එය චීනය, ඉන්දියාව සහ එක්සත් ජනපදයට පසු ලෝකයේ සිවුවන විශාලතම ජනගහනයක් සිටින රාජ්‍යය මෙන් ම, ලෝකයේ වැඩි ම ජනගහනයක් සිටින දූපත් රාජ්‍යය ද වෙයි.

නිල වශයෙන් 'ඉන්දුනීසියා ජනරජය' ලෙස ද හැඳින්වෙන ඉන්දුනීසියාව පිහිටා ඇත්තේ ගිනිකොණ දිග ආසියාව හා පැසිෆික් සාගරය අවට කලාපයේ ය. විශාලතම මුස්ලිම් ජනගහනයක් වෙසෙන්නේ ද ඉන්දුනීසියාවේ ය. ඡන්දයෙන් තෝරාපත් කරගනු ලබන ව්‍යවස්ථාදායකයක් සහ ජනාධිපතිවරයෙකු සිටින ඉන්දුනීසියාව සමුහාණ්ඩුවකි. එහි අගනුවර 'ජකර්තා' නුවර යි. මෙම රාජ්‍යය 'පැපුවා නිව් ගිනි', 'නැගෙනහිර තිමෝරය' හා 'මැලේසියාව' සමඟින් ස්වකීය දේශ සීමාවන් හවුලේ පරිහරණය කරයි. අවශේෂ අසල්වැසි රටවල් අතරට 'සිංගප්පූරුව', 'පිලිපීනය', 'ඕස්ට්‍රේලියාව', 'අන්දමන්' හා 'නිකෝබාර්' දූපත් හි ඉන්දියානු පාලන ප්‍රදේශ ද අයත් වේ.

දහ හත්වන සියවසේ සිට ම මෙම ඉන්දුනීසියානු දූපත් සමූහය වැදගත් වෙළඳ කලාපයක් බවට පත්ව තිබුණි. මුලින් බෞද්ධ අධිරාජයකු වූ 'ශ්‍රී විජය' ද, අනතුරුව 'මාජපහිත්‍රාඩඩ්' නම් අධිරාජයා ද චීනය සහ ඉන්දියාව සමඟ වෙළඳ සබඳතා පවත්වා තිබේ. ඒ අනුව, මුල් ශතවර්ෂයන් හි සිට ම එරට පාලකයන් සංස්කෘතික, ආගමික හා දේශපාලනික ක්ෂේත්‍ර සඳහා තෝරාගත්තේ ඉන්දියානු ආදර්ශයන් හා ආකෘතීන් ය.

ඉන්දුනීසියාවේ ස්වාභාවික සම්පත් වෙත ඇදී ආ විදේශ බලවතුන් නිසා ඉන්දුනීසියානු ඉතිහාසයට දැඩි බලපෑමක් එල්ල වී ය. මුස්ලිම් වෙළෙන්දන් පැමිණියේ ඉස්ලාම් ධර්මය ද රැගෙන ය. වෙළඳ ඒකාධිකාරය පවත්වාගෙන යාම සඳහා යුරෝපීය බලවත්තු එකිනෙකා සමඟ දබර කර ගත් හ. ඉන්දුනීසියාව ස්වකීය රටට නිදහස ලබා ගැනීමට සමත්වන්නේ සියවස් තුනහමාරක් පැවති ඕලන්ද යටත් විජිත පාලනයෙන් ඉක්බිතිව දෙවන ලෝක යුද්ධයෙන් පසුව ය.

නිදහස් ඉන්දුනීසියාවේ ප්‍රථම ජනාධිපතිවරයා බවට පත්වන්නේ 1945 සිට 1967 දක්වා වසර 22 කට ආසන්න කාලයක් බලයේ සිටි සුකර්නෝ ය. නිදහස ලැබූ ඉන්දුනීසියාව ස්වාභාවික ව්‍යසන, දූෂණ, බෙදුම්වාදය, ප්‍රජාතන්ත්‍රිකරණ ක්‍රියාවලීන් හා ඉක්මන් ආර්ථික ප්‍රතිසංස්කරණ යනාදිය හේතුකොට ගෙන අවුල් සහගත තත්ත්වයකට පත් වී ය. සුකර්නෝගෙන් පසුව 1968 සිට 1998 දක්වා වසර 30ක කාලයක් ඉන්දුනීසියාව පාලනය කරන ලද්දේ ජනාධිපති සුහර්තෝ විසිනි.

විවිධ ජනවර්ග, විවිධ භාෂාමය හා ආගමික කණ්ඩායම් ඉන්දුනීසියාවට අයත් දූපත්වල වෙසෙති. විශාල ම ජනවර්ගය වන ජාවානුවැසියෝ දේශපාලනමය වශයෙන් බලවත් ම ජන කණ්ඩායම වේ. ඉන්දුනීසියාවේ ජාතික ආදර්ශ පාඨය වන්නේ 'බිනේකා තුන්ගල් කා' (unity in Diversity - විවිධත්වයේ සමගිය ) යන්න ය. එරට විශාල ජනගහනයක් සිටිය ද, අසීමිත ජන සංඛ්‍යාවන් වාසය කරන

> එරට විශාල ජනගහනයක් සිටිය ද, අසීමිත ජන සංඛ්‍යාවන් වාසය කරන භූමි ප්‍රදේශ තිබුණ ද, ලොව දෙවන ඉහළ ම ජෛව විවිධත්වයට උරුමකම් කියන ඉන්දුනීසියාවේ ජනශූන්‍ය ප්‍රදේශ රාශියක් ද දක්නට තිබේ.

භූමි ප්‍රදේශ තිබුණ ද, ලොව දෙවන ඉහළ ම ජෛව විවිධත්වයට උරුමකම් කියන ඉන්දුනීසියාවේ ජනශූන්‍ය ප්‍රදේශ රාශියක් ද දක්නට තිබේ. එසේ ම, ඉන්දුනීසියාව ස්වාභාවික සම්පත්වලින් අනූන රාජ්‍යයක් වුව ද, අද පවා දරිද්‍රතාවය පුළුල් ලෙස එරට පැතිර යමින් පවතී. 2010 වර්ෂයේ සංඛ්‍යාලේඛනවලට අනුව ක්‍රය ශක්තියට සාපේක්ෂව එරට දළ දේශීය නිෂ්පාදිතය ඇ.ඩො. බිලියන 670.42කි. වාර්ෂික ඒක පුද්ගල ආදායම ඇ.ඩො. 2, 858කි.

හිටපු ජනාධිපති සුකර්නෝගේ දියණිය වන මෙගාවතී සුකර්නොපුත්‍රි 1993 දෙසැම්බරයේ දී 'ඉන්දුනීසියානු ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ' නායිකාව ලෙස තේරීපත් වූවා ය. 1997 පැවති ව්‍යවස්ථාදායක මැතිවරණය වනවිට මෙගාවතීට සහ 'ඉන්දුනීසියානු ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය'ට තිබුණු එරට මහජන සහයෝගය වර්ධනය වෙමින් පැවති අතර, එය පාලක 'ගොල්කාර් පක්ෂයේ' ආධිපත්‍යයට බලවත් තර්ජනයක් වී ය. එනිසා සුහර්තෝ රජය මෙගාවතීගේ පත්වීම අවලංගු බව ප්‍රකාශයට පත් කළ හෙයින්, 1996 ජුනි මාසයේ දී නව සම්මේලනයක් සංවිධානය කර නව පක්ෂ නායකයෙකු තෝරා ගන්නට 'ඉන්දුනීසියානු ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය'ට සිදු වී ය. එහෙත්, මෙගාවතීගේ ආධාරකරුවන් දැඩිව කියා සිටියේ ඔවුන් ක්‍රියා කරන්නේ නිවැරදි පක්ෂ නායකත්වයක් වෙනුවෙන් පමණක් බව ය.

මෙම සිදුවීම 'ජකර්තා' නුවර දින





දෙකක් පුරා පැවති කැරලි කෝලාහල දක්වා ව්‍යාප්ත වූ අතර, රජය මේ සම්බන්ධයෙන් 'මහජන ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය'ට දොස් පැවරී ය. 1997 මැයි 29 දින පැවති මැතිවරණය දක්වා මෙම ප්‍රචණ්ඩත්වයන් දිගට ම පැවති අතර, එහි ප්‍රතිඵලය වූයේ, 74% ක ඡන්ද ප්‍රතිශතයකින් 'ගොල්කාර් පක්ෂය' මැතිවරණය ජයගැනීම ය. බෙදී ගිය'මහජන ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය'ට ලැබුණේ 3% ක ඡන්ද ප්‍රතිශතයක් වන අතර, 'මුස්ලිම් එක්සත් සංවර්ධන පක්ෂය'ට 22% ක ඊට වඩා වැඩි ඡන්ද ප්‍රතිශතයක් ලැබිණි.

ඡන්ද අක්‍රමිකතා හේතුවෙන් එම මැතිවරණය අවලංගු වූ අතර, විශේෂයෙන් මහජන විරෝධය එල්ල වූයේ, රජයේ ආධාරකරුවන් වෙත ය. ජනතාව මැතිවරණ ප්‍රතිඵලය ප්‍රතික්ෂේප කළ අතර, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියක් අනුගමනය කරන ලෙස ඔවුහු රජයෙන් ඉල්ලා සිටියෝ ය. මේ වන විට එරට දළ දේශීය නිෂ්පාදිතය 8% ක අනුපාතයකින් වර්ධනය වී තිබීම නිසා ඉන්දුනීසියාව අත්විඳිමින් සිටියේ ආර්ථික උත්පාතයකි.

කෙසේ වෙතත්, මැතිවරණයෙන් මාස පහකට පසුව, එනම් ජූලි මාසයේ ආරම්භ වූ ආසියානු මූල්‍ය අර්බුදය නිසා සිවුවන කාර්තුවේ දී එරට ආර්ථික වර්ධනය 1.4% දක්වා මන්දගාමී වී ය. ආර්ථිකය ස්ථාවර කරගැනීමට නොහැකි වූ විට රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ආධාර ඉල්ලා සිටියේ ය. 1998 ජනවාරි වන විට එරට මුදල් ඒකකය ද එහි මුල් වටිනාකමෙන් හයෙන් එකක් දක්වා පහත වැටුණි.

ඉහළ යන විරැකියාවත්, උද්ධමනය වූ ආහාර මිල ගණනුත් සමඟ ආර්ථිකය හැසිරවීමට රජයට ඇති හැකියාව පිළිබඳ මහජනතාව තුළ පැවති විශ්වාසය බිඳ වැටුණි. ප්‍රචණ්ඩත්වය 'ජාවා' දූපත පුරා පැතිර ගිය අතර, පෙබරවාරි මාසයේ දී රජය සිය බලය ක්‍රියාත්මක කරමින් වීදි විරෝධතා සඳහා දින 25 ක තහනමක් පැනවී ය. තහනම උල්ලංඝනය කරමින් දේශපාලන කටයුතුවලට සම්බන්ධ වන ඕනෑ ම අයෙකු සිරගත කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට බලය ලබා දී තිබිණි.

එරට 'මහජන උපදේශක සභාව' විසින් මාර්තු මාසයේ දී අඛණ්ඩව හත්වන වරටත් සුහර්තෝ ජනාධිපති ධුරයට තෝරා පත්කර ගන්නා ලදි. ආර්ථික හා දේශපාලන ප්‍රතිසංස්කරණ සඳහා වන ඉල්ලීම් නොතකා ඔහු සිය මතභේදාත්මක හත්වන කැබිනට් මණ්ඩලයට ඔහුගේ පවුලේ සාමාජිකයන් සහ හිතවතුන් ඇතුළත් කරගත්තේ ය. මෙම සිදුවීම්වලින් පසුව සරසවිවල ශිෂ්‍ය උද්ඝෝෂණ තීව්‍ර වී ය.

1998 මැයි මස ඉන්දුනීසියාවේ ඇති වූ '1998 බේදවාචකය' ලෙස ද හැඳින්වෙන දරුණු

කැරැල්ල වාර්ගික ස්වභාවයක් ගත්ත ද, එමගින් මෙම විරෝධය පිළිබිඹු වී ය. ප්‍රධාන වශයෙන් මැයි 4 සිට 8 දක්වා උතුරු 'සුමාත්‍රා' පළාතේ 'මේදන්'වලත්, මැයි 12 සිට 15 දක්වා 'ජකර්තා' අගනුවර සහ මධ්‍යම පළාතේ 'සොලෝ'වලත්, මැයි 13 සිට 15 දක්වා 'ජාවා' නගරයේත් කෝලාහල ඇති වූයේ ආහාර හිඟයත්, විරැකියාව අධිකවීමත් නිසා ඇති වූ ආර්ථික ගැටලු හේතුවෙනි.

කැරලිවලින් දහසකට වැඩි පිරිසක් මියගිය බව ගණන් බලා තිබේ. අවම වශයෙන් ස්ත්‍රී දූෂණ 168 ක් වාර්තා වී ඇති අතර, සිදු වූ දේපල හානිය ඩොලර් ට්‍රිලියන 3.1 ට වඩා වැඩි ය. 'ජකර්තා'වල ඇති වූ කෝලාහලවලින් පසුව සතියකට වැඩි කාලයක් තිස්සේ ප්‍රදේශවාසීහු ඔවුන්ගේ ආරක්ෂාව ගැන බිය වී නිවෙස්වල ම රැඳී සිටිය හ. රට පුරා ප්‍රධාන නගරවල බොහෝ බැංකු, ව්‍යාපාර සහ පොදු ගොඩනැගිලි වසා දමා තිබුණි. මැයි 20 වන දින සමහර රජයේ කාර්යාල නැවත විවෘත කරන ලද්දේ 'ජාතික පිබිදීමේ දිනය' සැමරීම සඳහා ය.

> කොරෝනා වයිරසය හේතුවෙන් එරට ආර්ථිකයට එල්ල වී ඇති බලපෑම සුළුපටු නොවේ. 2020 දෙවන කාර්තුවේ දී එරට වාර්ෂික ආර්ථිකය 5.32%කින් සංකෝචනය වූ අතර, වෙළඳපොළ සම්මුතියට වඩා 4.61% කින් එය හැකිළීම වඩා නරක බව ආර්ථික විද්‍යාඥයෝ පෙන්වා දෙති.

කෝලාහල තවත් උග්‍ර වියහැකි බවට බියක් තිබුණ ද, කුඩා නගරවල සිදුවූයේ සුළු සිදුවීම් කිහිපයක් පමණි. ජකර්තා අගනුවර සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ සම්පාදනය කරන ලද දත්ත එකිනෙකට පරස්පර වී ය. එක් වාර්තාවකට අනුව, ගිනි තැබීම්වලින් 1,109 දෙනෙකු හා වෙඩි තැබීම්වලින් 27 දෙනෙකු මියගිය බවත්, 91 ක් දෙනෙකු තුවාල ලැබූ බවත්, තවත් 31 දෙනෙකු අතුරුදන් වූ බවත් වාර්තා වී ය.

පොලිස් වාර්තාවලට අනුව 463 දෙනෙකු මියගොස් 69 දෙනෙකු තුවාල ලබා ඇති අතර, නගර සභාව වාර්තා කර ඇත්තේ මරණ 288 ක් සහ තුවාල ලැබූවන් 101 ක් ගැන පමණි. දේපළ හානිය ඇ.ඩො. ට්‍රිලියන 2.5 ක් ලෙසත්, ගොඩනැගිලි 5,723 ක් සහ වාහන 1,948 ක් විනාශ කර ඇති බවත් නගර සභාව වාර්තා කර ඇති අතර, පොලිස් වාර්තාවල එම සංඛ්‍යා දක්වා ඇත්තේ, ගොඩනැගිලි 3,862 ක් සහ වාහන 2,693 ක් ලෙස ය.

කැරැල්ල අවසානයේ ජනාධිපති සුහර්තෝට ඉල්ලා අස්වන්නට සිදු වූ අතර, එම ආණ්ඩුවේ බිඳ වැටීමට ද එය

> ඉන්දුනීසියාවේ ස්වාභාවික සම්පත් වෙත ඇදී ආ විදේශ බලවතුන් නිසා ඉන්දුනීසියානු ඉතිහාසයට දැඩි බලපෑමක් එල්ල වී ය. මුස්ලිම් වෙළෙන්දන් පැමිණියේ ඉස්ලාම් ධර්මය ද රැගෙන ය. වෙළෙඳ ඒකාධිකාරය පවත්වාගෙන යාම සඳහා යුරෝපීය බලවත්තු එකිනෙකා සමඟ දබර කර ගත් හ.

හේතුවක් වී ය. සුහර්තෝගේ ආණ්ඩුවේ බිඳවැටීම 'ආචේ', 'පැපුවා' සහ 'නැගෙනහිර ටිමෝරයේ' බෙදුම්වාදී ව්‍යාපාර තීව්‍ර කිරීමට ද හේතු වී ය. නීතිය හා සාමය පිරිහීම නිසා 'මාලුකු' සහ 'මධ්‍යම සුලවේසි'හි ජනවාර්ගික හා ආගමික ගැටුම් ඇවිළ ගියේ ය.

1999 ජනවාරි මාසයේ දී දිනපතා පුවත්පතක් වන 'ජකර්තා පෝස්ට්' විසින් කරන ලද මත විමසුමක දී ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 77% ක් මහජන ආරක්ෂාව පිළිබඳ තත්ත්වය 'නරක' සහ 'ඉතා නරක' යැයි පවසා තිබිණි. සුහර්තෝගෙන් පසුව බලයට පත් හබීබිගේ ජනාධිපති ධූරයේ පළමු මාස කිහිපය තුළ ආර්ථික තත්වයන් උච්චාවචනය වූ අතර, 1998 දී අපරාධ 10% කින් වැඩි වූ බව ජාතික පොලීසිය වාර්තා කළේ ය.

'ජකර්තා' අගනුවර ප්‍රචණ්ඩත්වයට හේතුව සුහර්තෝගේ අනුප්‍රාප්තිකයා වීම සඳහා එරට හමුදා නිලධාරීන් තුළ වූ අභ්‍යන්තර අරගලයක ප්‍රතිඵලයක් බව විමර්ශනවලින් හෙළි වී ය. සමහර හානියට පත් ප්‍රදේශ හමුදා කඳවුරු අසල පැවතීමත්, කැරලි සංවිධායකයින්ට හමුදා සෙබළුන් ට සමාන ලක්ෂණ තිබුණු බවත් සාක්ෂි සහිතව සනාථ වී ය.

ඉන්දුනීසියාවේ පළමු කාන්තා ජනාධිපතිනිය බවට පත්වන්නේ සුකර්නෝගේ වැඩිමල් දියණිය වූ මෙගාවතී සුකර්නොපුත්‍රි ය. ඒ වනවිට 'අරගල සඳහා වන ඉන්දුනීසියානු ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ' නායිකාව වූ ඇය බලයට පත්වන්නේ හබීබ් ජනාධිපතිවරයාගෙන් පසුව බලයට පත් අබ්දුල් රහ්මාන් වහීඩ්ට එරෙහිව එල්ල වූ දෝෂාභියෝගයකින් පසුව ය. 2001 සිට 2004 දක්වා ඇය බලයේ සිටි කාල පරිච්ඡේදය එරට ආර්ථිකයේ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළ වකවානුවක් බව සඳහන් වුව ද, 2004 හා 2009 ජනාධිපතිවරණ දෙකෙන් ම ඇයට අත්වූයේ දරුණු පරාජයකි.

නිදහසින් පසුව ඉන්දුනීසියාවේ 1967 සිට 2014 දක්වා කාලය තුළ ජනාධිපතිවරුන් 07 දෙනෙකු එරට පාලනය කර ඇති අතර, එහි වත්මන් ජනපති වන්නේ එරට 07 වන ජනාධිපතිවරයා ලෙස 2014 ඔක්තෝබර් මස තේරීපත් වූ ජෝකෝ විඩෝඩෝ ය. ඔහු එරට ආර්ථිකය නැංවීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගනිමින් සිටින අතර, එහි ප්‍රතිඵලය ලෙස 2019 වනවිට එරට දළ දේශීය නිෂ්පාදිතය ඇමෙරිකානු ඩොලර් බිලියන 1119.19 ක් බවට පත්කර ගැනීමට හැකි වී ය. එය ලෝක ආර්ථිකයෙන් 0.93% ක් නියෝජනය කරයි. එරට විරැකියා අනුපාතය ද 2019 වසර තුළ 5.28% සිට 4.99% දක්වා අඩු වී තිබේ.

එහෙත්, කොරෝනා වයිරසය හේතුවෙන් එරට ආර්ථිකයට එල්ල වී ඇති බලපෑම සුළුපටු නොවේ. 2020 දෙවන කාර්තුවේ දී එරට වාර්ෂික ආර්ථිකය 5.32%කින් සංකෝචනය වූ අතර, වෙළඳපොළ සම්මුතියට වඩා 4.61% කින් එය හැකිළීම වඩා නරක බව ආර්ථික විද්‍යාඥයෝ පෙන්වා දෙති. කිරීටක වෛරස් අර්බුදය පාලනය කිරීම සඳහා වන මහජන සෞඛ්‍ය ක්‍රියාමාර්ග විශාල වශයෙන් ආර්ථිකයට බලපා ඇති හෙයින්, එය 1999 න් පසු එරට ආර්ථිකයේ සිදු වූ පළමු සංකෝචනය ලෙස ඔවුහු හඳුන්වති. එසේ ම, 2020 පළමු කාර්තුවට සාපේක්ෂව එරට කුටුම්භ පරිභෝජනය 5.51%කින් ද, ස්ථාවර ආයෝජන 8.61%කින් ද අඩුවී ඇත. තව ද, රජයේ වියදම් 6.90% කින් හැකිලී ඇති අතර, අපනයන හා ආනයන යන දෙක ම පහත වැටීම නිසා එය දළ දේශීය නිෂ්පාදිතයට අහිතකර ලෙස බලපා ඇත.

මෙම සියලු අභියෝගවලට මුහුණ දෙමින් සිටින එරට වත්මන් නායකත්වය 2019 මැයි මස 09 වැනි දින 'ඉන්දුනීසියාවේ ඉදිරි දැක්ම' ඉදිරිපත් කරමින් 2045 දී ඉන්දුනීසියාව ලොව සිවුවන හෝ පස්වන විශාලතම ආර්ථිකය බවට පත්වනු ඇතැයි විශ්වාසය පළකර තිබේ.

තරංග



# මඩ ගොහොරුවක් සෙනෙහෙ විලක් කළ කරාපිටිය රෝහල

● එස්. ලොකුකරව්ට
කරාපිටිය සමූහ

**ඔවුන්ට ජීවිත ගැන මහා ලොකු බලාපොරොත්තුවක් නැත. වැඩි අපේක්ෂාවක් නැත. සියලු දේ අතහැර දැමීමට ඔවුහු සූදානම්ව සිටිති. තමන්ට ඉතා කෙටි කලකින් ජීවිතය පවා අතහැර දැමීමට සිදුවන බව ඔවුහු දනිති. එහෙත් ඔවුහු හෙට දවස ගැන බලාපොරොත්තු සහගතව ජීවත් වෙති. ඒ මිනිසුන් වෙනුවෙන් ම ඉදිවූ සහන සත්කාර සේවා මධ්‍යස්ථානය ඔවුන්ට අපූරු නවාතැන් ස්ථානයක් බවට පත්ව ඇත.**

සහන සත්කාර සේවා මධ්‍යස්ථානය යනු ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහලේ 65 වැනි වාට්ටුවයි. නේවාසික රෝගීන් 30 දෙනකු සඳහා ඉඩ සහ සියලු පහසුකම්වලින් සමන්විත වන පරිදි මේ වාට්ටුව ඉදිකර ඇත.

ශ්‍රී ලංකාවේ කිසිදු රෝහලක මෙවැනි සහන සත්කාර සේවා මධ්‍යස්ථානයක් පිහිටා නැත. තව දුරටත් වෛද්‍ය ප්‍රතිකාර කිරීමෙන් මරණයෙන් බේරාගත නොහැකි වූ රෝගීන් රැකබලා ගනිමින් ඔවුන්ට කායික හා මානසික සුවය සැපයීමේ අරමුණෙන් මේ මධ්‍යස්ථානය බිහිකරන ලද්දේ පිළිකා රෝග පිළිබඳ ජ්‍යෙෂ්ඨ ශල්‍ය වෛද්‍ය විශේෂඥ ක්‍රිෂාන්ත පෙරේරා මහතාගේ සිතට නැගුණු සංකල්පයක් අනුවය.

පිළිකා රෝගීන්ට ප්‍රතිකාර කරන විශේෂඥ වෛද්‍ය පෙරේරා මහතා පිළිකා රෝගීන් සුව කළ නොහැකි තත්ත්වයට පත්වූ විට ඔවුන් විඳින වේදනාවන් හා මානසික පීඩනයන් තේරුම් ගෙන මෙවැනි මධ්‍යස්ථානයක් ඉදිකළ යුතු යැයි තීරණය කර තිබිණි. ඒ සඳහා රෝහලෙහි ඉඩක් තිබුණේ නැත. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ද තිබුණේ නැත. ඒ අවස්ථාවේ ඔහුගේ සහායට එක් වූයේ විශේෂඥ වෛද්‍ය ක්‍රිෂාන්ත පෙරේරා අනුශාසකත්වය දැරූ පිළිකා සංගමයයි. පිළිකා සංගමයේ ගාල්ල ශාඛාව සහන සත්කාරක අරමුදල නමින් අරමුදලක් පිහිටුවන ලද්දේ වෛද්‍යවරයාගේ සිතෙහි ඇති වූ මේ සිහිනය යථාර්ථයක් බවට පත්කිරීමේ අරමුණෙනි.

වැඩි කාලයක් ගත වූයේ නැත. මෙවැනි සේවාවක අවශ්‍යතාව හොඳින්ම තේරුම්ගෙන සිටි බොහෝ පිරිස් තම තමන්ට හැකි පමණින් ඒ සඳහා මුදල් පරිත්‍යාග කළහ. කරාපිටිය ශික්ෂණ රෝහලේ පිළිකා ඒකකයට පසෙකින් පිහිටි වගුරක් වැනි භූමියක් පමණක් මෙවැනි ඉදිකිරීමක් සඳහා ඉතිරිව තිබිණි. මේ බිමෙහි නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ දී අවශ්‍ය සැලසුම නිර්මාණය කර දෙන ලද්දේ ගාල්ලේ ප්‍රකට ගෘහ නිර්මාණ ශිල්පියකු වූ අනුර ද සිල්වා මහතා විසිනි. ඔහු මේ සියල්ල කළේ නොමිලේය ඒ අභිං-

## සහන සත්කාර මධ්‍යස්ථානය ඉදිකිරීමේ වියදම ලක්ෂ 650යි

සක රෝගීන් වෙුවෙන් උපන් කරුණාවෙනි.

මා මෙය ඉදිකළේ රෝහලක් කියන සංකල්පය නැතිව හෝටල් සංකල්පයෙන්. මෙහි හැඩය නෙළුම් කොළයක් ආකාරයෙන් සකස් කළා. ගොඩනැගිල්ල නෙළුම් විලක් පිහිටා තිබෙන ලෙසින් නිර්මාණය කළේ. එයට වියදම් වූ මුදල ගැන මගේ කිසිම ලෝභ කමක් නැහැ."

මුලින්ම මෙම සද්කාර්යය සඳහා මුලින්ම මුදල් පරිත්‍යාග කළේ අම්බලන්ගොඩ පදිංචි විශ්‍රාමික විදුහල්පතිවරයකු වූ එස්.එම්. සෝමදාස මහතාය. ඔහු විසින් රුපියල් ලක්ෂ 51ක මුදලක් පරිත්‍යාග කර තිබේ.

අරමුදලට මුදල් ලැබෙමින් තිබිය දී ම සහන සත්කාර මධ්‍යස්ථානයේ ඉදිකිරීම් සඳහා 2019 ජූලි 15 දින මුල්ගල් තැබිණි. ඒ වනවිට ප්‍රමාණවත් මුදලක් ලැබී නොතිබුණ ද සැමගේ විශ්වාසය වූයේ කඩිනමින් මෙහි වැඩකටයුතු සම්පූර්ණ කරගත හැකිවනු ඇතැයි යන්නයි.

ඉදිකිරීම් සඳහා අවශ්‍ය ශ්‍රම දායකත්වය නාවික හමුදාවෙන් ලැබිණි. නාවික හමුදාපති රියද් අද්මිරාල් පියල් ද සිල්වා මහතා ඊට සහය වූයේය. ඉදිකිරීම් කරන අතරතුර ගාල්ලේ ප්‍රකට ව්‍යාපාරිකයකු වන සේනක ද සිල්වා මහතා ජනාධිපති අරමුදල හා සම්බන්ධීකරණ කටයුතු කරමින් මේ සඳහා රුපියල් කෝටි දෙකක මුදලක් ලබා ගැනීමට කටයුතු කළේය.

කෙසේ වෙතත් වසරකට අඩු කාලයක් තුළ දී මෙහි ඉදිකිරීම් අවසන් කෙරිණි. ගොඩනැගිල්ල රෝගීන් සඳහා විවෘත කිරීම 2020 මාර්තු 20 වැනි දිනට යොදාගෙන තිබුණ ද කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් එය නිසි පරිදි සිදුවූයේ නැත. නමුත් එදා සිට රෝගීන් භාර ගැනීම සිදුකෙරිණි.


අද වන විට මෙම මධ්‍යස්ථානයේ නේවාසිකව ප්‍රතිකාර ලබාගත් රෝගීන් සංඛ්‍යාව 60 දෙනෙකි.



ගෘහ නිර්මාණ ශිල්පී අනුර ද සිල්වා



විශේෂඥ ශල්‍ය වෛද්‍ය ක්‍රිෂාන්ත පෙරේරා



විශ්‍රාමික විදුහල්පති එස්. එම්. සෝමදාස

මෙය රෝහලේ වාට්ටුවක් වුව ද සාමාන්‍ය වාට්ටුවකින් හාත්පසින් ම වෙනස් වූවකි. රෝගියෙකුට හා ඔවුන්ගේ ඥාතියකුට අන් අයගෙන් වෙන්ව සිටිය හැකි රෝගී කාමර 10 කින් හා සමූහ වශයෙන් රෝගීන් 10 දෙනකු බැගින් සිටිය හැකි ශාලා දෙකකින් සමන්විත මේ ඒකක බැලූ බැල්මට පුද්ගලික රෝහලක් මෙන් දිස්වේ.

රෝහල්වල ප්‍රතිකාර ලැබීමෙන් තවදුරටත් සුව කළ නොහැකි බවට වෛද්‍යවරුන් විසින් තීරණය කරන රෝගීන් සුව සහන සේවා මධ්‍යස්ථානයට යොමු කිරීම සිදුවේ. එවැනි රෝගීන්ට මානසික, කායික හා සමාජයීය සියලු සත්කාර සිදුකරන්නේ මේ ස්ථානයෙනි. එවැනි රෝගියකු නිවසට රැගෙන ගිය විට සිදුකරන සත්කාර පිළිබඳ, ඔවුන්ට පීඩාවක් ඇති නොවන පරිදි රැකබලා ගන්නා ආකාරය පිළිබඳ පවුලේ ඥාතීන්ට පුහුණුවක් ලබාදීම ද මෙම ස්ථානයේ දී සිදුවේ.

"මේ වාට්ටුවට යොමු කරන්නේ තවදුරටත් ප්‍රතිකාර වලින් සුව කරන්න බැරි රෝගීන්, ඔවුන්ට හුස්ම ගැනීමේ අපහසුතා, ආහාර ගැනීමේ අපහසුතා, සුව නොවන තුවාල, පපුවේ වේදනා, මානසික ගැටලු ආදිය තිබෙනවා. එවැනි අය අපි දින 14ක කාලයක් මේ ස්ථානයේ රඳවා ගන්නවා. රෝගියා රැකබලා ගන්නා ආකාරය පිළිබඳ නිවසේ අයට පුහුණුවක් ලබා දෙනවා. සියලු දෙනාටම අවශ්‍ය ඖෂධ, ආහාර ආදිය අපි මේ මධ්‍යස්ථානයෙන් ම සපයනවා. ඒවාට පරිත්‍යාගශීලීන් දිගටම උදව් කරනවා." යැයි වාට්ටුවේ හෙදියක් පැවැසීය.

මෙම ඒකකයට රෝගීන් ඇතුළත් කිරීමේ දී වයස් බේදයකින් තොරව කුඩා දරුවාගේ සිට වැඩිහිටියන් දක්වා ඇතුළත් කර ගනී. අවශ්‍ය වන්නේ මෙවැනි සත්කාරයක් අවශ්‍ය බවට රෝහලක වෛද්‍යවරයකු විසින් කරන නිර්දේශයක් පමණි. මෙවැනි සත්කාරක මධ්‍යස්ථානයක් ඉදිකිරීමේ සංකල්පය ඔහුගේය. නමුදු සංකල්පය ඉදිරිපත් කර පසෙකට වී නොසිටි පිළිකා රෝග ජ්‍යෙෂ්ඨ ශල්‍ය වෛද්‍ය ක්‍රිෂාන්ත පෙරේරා මේ සඳහා මුදල් සෙවීමට විශාල පරිශ්‍රමයක් දැරුවේය. තම හිතවතුන්, සහෝදර වෛද්‍යවරුන් ඇතුළු බොහෝ දෙනකු මීට සම්බන්ධ කරගනිමින් ඊට නායකත්වය දුන් හෙතෙම තම පුද්ගලික ධනයෙන් රුපියල් ලක්ෂ 40ක මුදලක් ඉදිකිරීම් කටයුතු සඳහා වැය කර තිබේ.

"මෙය අපේ රටේ රෝහලකට අලුත් දෙයක් වුණාට එය විදෙස් රටවලට අමුතු දෙයක් නොවෙයි. මේ සංකල්පය අනුව කටයුතු කිරීමේ දී ගොඩක් බාධක ආවා. මගේ හිත මිතුරන්, රෝගීන්, රෝගීන්ගේ ඥාතීන්, නාවික හමුදාව මේ සියලු කාර්යයන් සඳහා විශාල සහයෝගයක් දුන්නා. ඔවුන් සියලු දෙනාට ස්තුතියි. මට තව අවුරුදු පහක සේවා කාලයක් තියෙනවා. ඒ කාලයේ මේ ස්ථානය උපරිමයෙන් ආරක්ෂා කරමින් වැඩිදියුණු කරන්න බලාපොරොත්තු වෙනවා. මේ රෝගී සහන සත්කාර විෂය සඳහා වෙනත් රටවල විශේෂඥ වෛද්‍යවරු පවා ඉන්නවා. ඉදිරියේ දී එවැනි වෛද්‍යවරු කිහිප දෙනකු අපට අවශ්‍යයි. දැනට මේ වාට්ටුව ක්‍රියාත්මක වන්නේ පිළිකා ඒකකයේ පරිපාලනය යටතේ. ඒ නිසා එහි වෛද්‍යවරු මෙහි සිටින රෝගීන්ට පිළිබඳ සියලු දේ සොයා බලනවා. සාමාන්‍ය වාට්ටු පරීක්ෂා කිරීම් වගේ ම මේ ඒකකයේත් වෛද්‍යවරු පැමිණ පරීක්ෂා කිරීම් කරනවා. ඊට අමතරව හෙදියන් 20ක් සහ අනිකුත් කාර්ය මණ්ඩලයත් ඉන්නවා. නිතරම රෝගීන් පිළිබඳ සොයා බලනවා. විශේෂයෙන් ම මානසික වෛද්‍යවරු පවා රෝගීන්ගේ මානසික තත්ත්වය, ඥාතීන්ගේ මානසික තත්ත්වය පරීක්ෂා කර බලනවා. සහන සත්කාර මධ්‍යස්ථානයක් බිහිකරන්න ලැබීම මට සතුටක්."



## සංකල්පය ඉදිරිපත් කළ වෛද්‍යවරයා ලක්ෂ හතළිහක් පරිත්‍යාග කරයි

සහන සත්කාර සේවා මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා රුපියල් ලක්ෂ 650කට වඩා වැඩි මුදලක් මේ වනවිට වැය වී තිබේ. මඩ ගොහොරුවක් සේ දිස්වූ මේ ස්ථානය දැන් අපූරු සුන්දර පරිසරයකින් සමන්විතය. කරාපිටිය රෝහලේ එක් මායිමකින් ගලා ගිය ඇළ මාර්ගයක් සංවර්ධනය කරමින් විලක් සේ නිර්මාණය කර ඇත. එහි තාරාවුන් ආදී විවිධ සත්තු සිටිති. රෝගීන්ට පරිසරයේ සුන්දරත්වය අත්විඳිමින් ඒ අතර ඇවිද යා හැකිය. සියලු ආගමිකයන්ට තම තමන්ට අවශ්‍ය පරිදි ආගමික වතාවත් හා පුද පූජා පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් ද මේ භූමියේ ම සලසා දී තිබේ. එමෙන්ම රෝගීන්ට ආයුර්වේද ප්‍රතිකාර ලබාගැනීමට අවශ්‍යනම් සහන සත්කාර සේවා මධ්‍යස්ථානයේ නේවාසිකව සිටිය දි වුවත් ඒ සඳහා යොමුවීමට කිසිදු බාධාවක් නැත.



# කබලෙන් ලිපට ඇද වැටුණු ලොකු ලූනු ගොවියා

චන්ද්‍රසිරි

● දඹුල්ල - සරත් එරමිනිගම්මන

**අපේ රටේ දේශීය ලොකු ලූනු නිෂ්පාදන කර්මාන්තයට දශක තුනකට වැඩි කාලයක් ගතවෙමින් පවති. මුලින්ම මේ අත්හදා බැලීම සිදු කැරුණේ 1988 දීය. නමුදු මේ මොහොත වනවිට ලාංකීය ලොකු ලූනු කර්මාන්තය අත්ව ඇත්තේ අභාග්‍ය සම්පන්න ඉරණමකි.**

දේශීය ලොකු ලූනු කර්මාන්තයේ බිඳ වැටීම මනාව සනිටුහන් කළේ මීට මාස කීපයකට පෙර රටේ ජනතාවට පරිභෝජනය කිරීමට සිදු වූයේ ලොකු ලූනු කිලෝවක් රුපියල් 350 ක් රුපියල් 400ක් වැනි ඉහළ මිලකට ය. ඉන්දියාව ලොකු ලූනු අපනයනය සඳහා කොන්දේසි පැනවීම ලොකු ලූනු හිඟයට හේතුව විය.

වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා බලයට පැමිණීමෙන් පසු දේශීය ලොකු ලූනු ගොවියාට මහත් අස්වැසිල්ලක් විය. ලොකු ලූනු කර්මාන්තයෙන් ඉවත්ව සිටි දේශීය නිෂ්පාදකයාට දිරිදෙමින් දේශීය ලොකු ලූනු ගොවියා යළි ලූනු වගාවට අවතීර්ණ කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ද සැලසුම් සහගත දැඩි උත්සහයක් ගත්හ. මාතලේ ගොවියාගේ ලූනු වගාවේ ඉතිහාසය සිහි කරමින් මාතලේ දිස්ත්‍රික් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂක එම්. පි. කේ. දොඩම්වල මෙසේ පැවැසීය

"1988 වර්ෂයේ යල් කන්නයේදී මාතලේ දිස්ත්‍රික්කයෙන් පළමුවරට දේශීය ලොකු ලූනු වගාව ආරම්භ කළේ. ඒ සිගිරිය ගොවිජන බල ප්‍රදේශයේ පලුටාව ගම්මානයේ. එසේ ආනයනික බීජ මගින් ආරම්භ කළ දේශීය ලොකු ලූනු වගාව 2010 පමණ වනවිට දේශීය ලොකු ලූනු බීජ නිෂ්පාදනය කිරීම දක්වා පුළුල් කිරීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමෙන් ගොවීන්ට හැකියාව ලැබුණා මාතලේ, අනුරාධපුරය, මොනරාගල, අම්පාර, හම්බන්තොට හා වියළි කලාපිය දේශගුණයක් ඇති මහවැලි කලපයේ ද ලූනු වගාව ප්‍රචලිත කිරීමට හැකිවුණා. අපේ රටේ වැඩිම බිම් ප්‍රමාණයක දේශීය ලූනු වගාව සිදු කළේ 2013 වසරේදී.



දේශීය අස්වනු නෙලන සමයේ ආනයනික ලූනු වෙළඳ පොලේ සුලබ වීම, නිෂ්පාදන පිරිවැය ඉහළයාම, දේශගුණික තත්වයන් වෙනස්වීම, දේශීය බීජ නිෂ්පාදකයා අධෛර්යට පත්වීම, නිසි කලට වෙලාවට දේශීය බීජ අලෙවි කර ගැනීමේ කටයුතු අඩාලවීම, රසායනික පොහොර හිඟය, ලොකු ලූනු වගාවට විනකරන කලාදුරු මර්ධනය කරගැනීම අපහසුවීම, ලොකු ලූනු අස්වනු ලබන සමයේ සාධාරණ මිලක් නොලැබීම මෙන්ම අයහපත් කාලගුණික රටාව යනාදී හේතු මත බලපෑම නිසා ගොවියා ලූනු

ඒකනායක

එල්. එල්. ඩී. වීරසිංහ

වගාවෙන් ඉවත් වෙන්න හේතු වුණා.

ඒ අනුව මාතලේ දිස්ත්‍රික්කයේ ක්‍රම ක්‍රමයෙන් වගාකළ බිම ප්‍රමාණය අඩුවුණා. නමුත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ගොවින් උනන්දු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මේ වසරේ යල කන්නයේ හෙකටයර් 1150 ක ලොකු ලූනු වගාව යළි ආරම්භ කිරීමට හැකිව තිබෙනවා. නමුත් මේ දිනවල ලොකු ලූනු වගාවට උචිත නොවන අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් බරපතල හානි සිදු වී තියෙනවා. මාතලේ දිස්ත්‍රික්කයේ වියළි කලාපය ලෙස සැලකෙන දඹුල්ල, සිගිරිය, ලග්ගල, ගලේවෙල යන ප්‍රදේශවල දැනට පවතින කාලගුණය දේශීය ලොකු ළූණු වගාවට සුදුසුද යන්න ගැඹුරින් අධ්‍යනය කළයුතු කාලයයි මේ. ඒ වගේම බැක්ටීරියා ආසාදනයන් මතුව තිබෙනවා. ලොකු ලූනු බල්බය කුණුවීම, පත්‍ර දඟර රෝගය නිසා වගාවට දරුණු හානි ගෙනදී තිබෙනවා. ගොවි ජනතාව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත පලිබෝධ නාශක භාවිතා කළත් වගාව පාලනය කල නොහැකි දැඩි අනතුරකට ලක්ව තිබෙනවා. මෙම දිලීර හා බැක්ටීරියා ආසාදිත තත්වයන් මතුවී දින දෙක තුනක් ගත වෙන්නත් පෙරම වගාව සම්පූර්ණයෙන් විනාශවී යනවා."

ලොකු ලූනු ගොවියන් මේ ප්‍රශ්නය දකින්නේ තවත් පැත්තකිනි. මාතලේ දිස්ත්‍රික් ඒකාබද්ධ ගොවි පදනමේ සභාපති සුනිල් රණවීර පවසන්නේ මෙවැනි කතාවකි.

"අපේ ගොවියා දේශීය ලොකු ලූනු බීජ වගා කිරීම සඳහා වැඩි කැමැත්තක් දක්වනවා. දේශීය ලූනු බීජ ප්‍රමිතියෙන් හා ගුණාත්මක තත්වයෙන් ඉහළයි. දේශීය ලොකු ලූනු බීජ දඹුලු රෙඩ් හා ගලේවෙල වයිට් ලෙස වර්ග දෙකක් තිබෙනවා. දේශීය බීජ නිෂ්පාදන ක්‍රියාවලියේදී පැන නගින ගැටලුවක් වන්නේ වසන්තිකරණය සඳහා ශීත ගබඩා පහසුකම් නොමැතිකම. ඒ සඳහා නුවරඑළිය දිස්ත්‍රික්කයේ රහංගල, සීතා එළිය එසේ නොමැති නම්, කටුනායක ප්‍රදේශ පිහිටි ශීත ගබඩාවලට මවු බල්බ ප්‍රවාහනය කර දීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් හැම වගා කන්නයකම සිදු කරනවා. අද වන විටත් වගා ණය ගෙවා ගැනීමට බැරිව අසරණ වී සිටින ගොවියන් වෙනුවෙන් යම් සහනයක් ලැබේ නම් වටිනවා." යැයි සුනිල් රණවීර පවසන්නේය.

ලොකු ලූනු වගාව මාතලේ දිස්ත්‍රික්කයේ ජනප්‍රිය හා ප්‍රධාන අදායම් මාර්ගයක් වී ඇත. ඊට අමතරව අන්තර් කලාපීය ප්‍රදේශ ලෙස අනුරාධපුරය, පුත්තලම, පොළොන්නරුව, කුරුණෑගල, වව්නියාව, මුලතිව්, කිලිනොච්චි, බදුල්ල, උඩවලව හා මහවැලි කලාපයන්හි ගොවි ජනතාවද ලූනු වගාවට නැඹුරුවී සිටී.

අද වන විට ලොකු ලූනු කිලෝවක අවම ගැනුම් මිල රුපියල් 80 ක මිලක් නියම කිරීම ගොවියාට අස්වැසිල්ලකි. එසේම අස්වනු නෙළන සමය ආසන්න වන විට ලූනු ආනයනය තහනම් කිරීමට පියවර ගැනීම හෝ ආනයනික බදු ඉහළ දැමීම කළයුතු වෙනවා.

මෙවර යල කන්නයේ පැවතී ලොකු ලූනු බීජ හිඟය හේතුවෙන් ආනයනික බීජ කිලෝවක මිල රුපියල් 7000, 8000 කටද දේශීය බීජ කිලෝවක මිල රුපියල් 22000 , 25000 ත අතර මිලකට ගොවීන්ට මිලදී ගැනීමට සිදු විය. ලොකු ලූනු බීජ හිඟය හා මිල ඉහළයාම නිසාම ඇතැම් කුඨ වෙළඳුන් කල් ඉකුත් වූ බීජ අලෙවි කිරීමේ ජාවාරමක් ද කළේය. මේ නිසා වගාව ආරම්භයේදීම ගොවියාට විශාල පාඩුවක් දැරීමට සිදුවිය.

මොරගහකන්ද ඒකාබද්ධ ගොවි පදනමේ සභාපති ඩබ්ලිව්.එම්. චන්ද්‍රසිරි බණ්ඩාර.

මහවැලියේ හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මහත්තුරු මැදිහත් වෙලා ගොවීන්ට ලූනු බීජ දිලා ගොවීන් උනන්දු කරපු නිසා අපිත් ලොකු ලූනු වගාවට යොමු වුණා. අක්කරයක් වගා කරන්න රුපියල් ලක්ෂ දෙකකට වඩා වියදම් කරලා තියෙනවා. මේ දිනවල ලොකු ලූනු වලට වැලඳී ඇති රෝගය ගැන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා මහවැලි අධිකාරිය දැනුවත් කළා. ඔවුන් නියම කළ සියළු බෙහෙත් වර්ග යෙදුවා. ඒත් වැඩක් වුණේ නැහැ. මහඉලුප්පල්ලමේ කෘෂිකර්ම නිලධාරින් අපිට කියන්නෙ මේක ඇන්ත්‍රැක්ස්නොස් රෝගය කියල. " චන්ද්‍රසිරි බණ්ඩාර එසේ පවසන විට කේ. බී. එස්. රණවීර පවසන්නේ මෙවන් කතාවකි.

" මම දේශීය ලොකු ළූණු වගාවේ ආරම්භයේ සිට වගා කළා. එක්දහස් නවසිය අනූ දෙක අනූතුන වසරවල කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මහත්තුරුයි අපියි දැඩි පරිශ්‍රමයක් දරල දේශීය ලොකු ලූනු බීජ අපටම නිෂ්පාදනය කරන්න පුළුවන් කියා ඔප්පු කළා. එහෙම කරපු අපිට දෙදහස් දාහතරේදී ලූනු විකුණ ගන්න බැරිව දඹුල්ල නගරයේ දැවැන්ත උදසෝෂණයක් කිරීමටත් සිදුවුණා."

ගලේවෙල, බුදුගේහින්න, දෙමටගොල්ලාගම පදිංචි එල්. එල්. ධීරසිංහ ද දේශීය ලොකු ළූණු බීජ නිෂ්පාදකයෙකි.

ලොකු ළූණු බීජ නිෂ්පාදනයට 2012 වසරේදී යොමුවුණා. මගේ ළූණු වගාවෙන්ම තෝරාගත් මවු බල්බ වසන්තිකරණයට යවනවා. මවු බල්බ කිලෝ ග්‍රෑම් 6000ක් සෑම වර්ෂයකම යවනවා.

පසුගිය කාලේ බීජ අලෙවි කරගැනීමේ ගැටළු මතුවුණා. 2018 වසරේදී රජයේ මැදිහත්වීමෙන් බීජ කිලෝව රුපියල් 9000 බැගින් ලුණු ගොවීන්ට ලබාදීම සිදුකළා. රජය බීජ කිලෝවට සියයට 50 ක සහනාධාරයක් ලබා දුන්නත් ඇතැමුන්ට එය ලැබී නැහැ." ඔවුහු පවසන්නේ තමන්ට ඇති ගැටළුය.

දඹුල්ල ආර්ථික මධ්‍යස්ථාන වෙළඳ සංගමයේ හිටපු සභාපති යු. බි. ඒකනායක දේශීය ලොකු ළූණු වගාවේ ආරම්භක වගා කරුවෙකි. එහෙත් අද වන විට ඔහු වෙනත් ව්‍යාපාරයක නියැලී සිටී.

සිගිරිය, පලුටාව පදිංචි එච්. එම්. සේනාරත්න අප හා මෙසේ පැවැසීය.

"අපේ ගමේ තමයි මුලින්ම ලූනු වගාව ආරම්භ කළේ. ඒ කාලයේ ලූනු කිලෝවක් වික්කේ රුපියල් 6.00ට. දැන් අවුරුදු පහ හයක කාලයක් සිට අපිට ලූනු වගාවෙන් එන්න එන්නම පාඩු සිදුවෙමින් තියෙනවා. වගාවට බැංකුවෙන් ගත් ණය මුදලේ පොළිය විතරක් අවුරුදු පතා ගෙවා දමමින් ඉන්නවා. වගාවන් දැන් සරු නැහැ නොයෙක් ලෙඩ බෝවෙලා නිසා. දිලීර රෝගයක් නිසා වගාවෙන් හතරෙන් තුනක්ම හානි වෙලා. ගමේ ගොවි පවුල් වැඩිපුරම ජීවත් වුණේ ලොකු ලූනු වගාවෙන්. දැන් වැඩි දෙනෙක් ලූනු වගාව අත්හැරලා තක්කාලි, අඹ, කෙසෙල් වැනි බෝග වගාවන්ට යොමුවෙලයි ඉන්නේ.

සිළුමිණ වාණිජ මණ්ඩලී මෙම පිටු එකතුව ව්‍යාපාරික ඔබ වෙනුවෙන්ම සැකසෙන විශේෂ අතිරේකයකි.
ඔබේ දේශීය-විදේශීය ව්‍යාපාර පුවත්, ප්‍රවෘත්ති නිවේදන, ඡායාරූප සහ නවතම පුවත් අප වෙත යොමු කරන්න.
සුළු, මධ්‍ය සහ මහා පරිමාණ ව්‍යාපාරික තොරතුරු සමාජයට විවර කිරීමට ඔබ පවත්වන මාධ්‍ය සාකච්ඡා සහ ගවේෂණ චාරිකාද යොමු කරන්නේ නම් මැනවි.
සියලු ලිපි පහත ලිපිනයට පමණක් එවිය යුතු වේ.
සිළුමිණ වාණිජ මණ්ඩලී, ලේක්හවුස් - කොළඹ 10.

හෙට ලොවට මඟ කියන ව්‍යාපාරික අත්වැල

දුරකථන : කර්තෘ - 011 2429261
දැන්වීම් කළමණාකරු - 011 2429429 දිගුව 351
විද්‍යුත් ලිපිනය : edmediaunit@gmail.com

වාණිජ මණ්ඩලී


# විශිෂ්ට සේවාවක් සඳහා ප්‍රීමා රන් පියවර



**මෙරට ප්‍රමුඛතම තිරිඟු පිටි නිෂ්පාදන සමාගමක් වන ප්‍රීමා සිලෝන් (පුද්ගලික) සමාගම DFCC බැංකුව හා එක්ව තම සමාගම හා බැඳුණු විශිෂ්ට ගනුදෙනුකරුවන් සඳහාම වෙන්වූ ප්‍රීමා රන් පියවර නම් වූ සුවිශේෂී වැඩසටහනක් පසුගියදා දියත් කරමින් ඒ සඳහා වන අවබෝධතා ගිවිසුමට 2020 අගෝස්තු මස 10 වනදා ප්‍රීමා සිලෝන් (පුද්ගලික) සමාගමේ සාමාන්‍යාධිකාරී ඔන්ග් ජෝන් සියොන් මහතා සහ DFCC බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී ලක්ෂ්මන් සිල්වා යන මහත්වරුන් අත්සන් තබන ලදී.**

අඛණ්ඩව සිව්වන වරටත් ක්‍රියාත්මක කෙරෙන ප්‍රීමා රන් පියවර ලෝයල්ටි වැඩසටහන මෙවර නැවුම් ආරකින් ප්‍රීමා පාරිභෝගිකයන් ඇගයුමට ලක්කෙරෙන විශේෂාංග රැසකින් සමන්විතය. මෙරට බේකරි හා තිරිඟු පිටි ආශ්‍රිත කර්මාන්තවල ප්‍රමිතිය ඉහළ නංවමින් මෙම පාරිභෝගිකයන් දශක හතරකට අධික කාලයක පටන් ප්‍රීමා සමාගම සමඟ රැඳී සිටියහ.

DFCC බැංකුව සමඟ ඇතිකර ගත් මේ සබඳතාව හරහා, ප්‍රීමා විශ්වසනීය පාරිභෝගිකයින් හට DFCC සහ ප්‍රීමා සන්නාම යොදන ලද, ලෝයල්ටි ප්‍රතිලාභ ඇතුළත් ඩෙබිට් කාඩ්පතක් හිමිවන අතර, එය හරහා දිවයින පුරා පිහිටි හඳුනාගත් ප්‍රමුඛපෙළේ වෙළෙඳ හවුල්කරුවන්ගෙන් සේවය ලබා ගත හැකිය. පාරිභෝගිකයින්ගේ විවිධ ජීවන ශෛලීන්වලට ඔබින පරිදි විනෝද, සුවසේවා, රක්ෂණ, ස්වර්ණාභරණ, ගෘහ මෙවලම්, ඇඳුම්-පැළඳුම් සහ සුපිරි වෙළඳසැල් ආදී ක්ෂේත්‍ර රැසක් මෙම වැඩසටහනට ඇතුළත් කර ඇත.

DFCC බැංකුව සමඟ ප්‍රීමා සිලෝන් (පුද්ගලික) සමාගම ඇතිකර ගත් සබඳතාව හරහා හඳුනාගත් ප්‍රමුඛපෙළේ වෙළෙඳ ආයතනවලදී පහසුවෙන් භාවිත කළ හැකි ඩෙබිට් කාඩ්පතක් හිමිවන බැවින් පාරිභෝගිකයන් හට එය පුළුල් පරාසයක විහිදුනු භාණ්ඩ හා සේවා හිමිකර ගත හැකි මනා විකල්පයක් වේ. එම වීසා කාඩ්පත යොදාගනිමින් විශේෂිත වෙළෙඳ හවුල්කරුවන් පිරිනමන සුවිශේෂී ප්‍රතිලාභ හිමිකර ගැනීමට ද එම පාරිභෝගිකයන්ට හැකිවේ. තවද, මෙම හවුල්කාරිත්වය තවදුරටත් පුළුල් කරමින් DFCC බැංකුව විශේෂ ප්‍රවර්ධන, ප්‍රමුඛතා සේවා, ගාස්තු රහිත ක්‍රෙඩිට් කාඩ්පත් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) සඳහා ණය පහසුකම් ඇතුළු පහසුකම් රැසක් ද පිරිනමයි.

# "VIDEOCHECK" ඩිජිටල් සේවාව පළමු වරට ශ්‍රී ලංකාවට

**ශ්‍රී ලංකාවේ Peugeot හි නිල නියෝජිත Carmart පුද්ගලික සමාගම මෝටර් රථ නඩත්තු ක්ෂේත්‍රයේ විප්ලවීය වෙනසක් ඇති කරමින් Peugeot මව් සමාගමේ "VIDEOCHECK" සේවාව ශ්‍රී ලංකාවට හඳුන්වා දීමට සැරසෙයි. ඒ අනුව online තාක්ෂණය ඔස්සේ වාහනයේ වීඩියෝවක් පාරිභෝගිකයා වෙත යොමුකර, online ඇස්තමේන්තුවක් ලබා දීමටත් පාරිභෝගික අනුමැතියෙන් අනතුරුව පසු කාලීන සේවා සහාය ලබා දීමටත් මේ හරහා අවකාශය සැලසේ.**



ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට අලෙවියෙන් පසු VIDEOCHECK සේවාව සමාජ දුරස්ථභාවය ආරක්ෂා කර ගැනීමට ම මූලිකත්වය දෙන නව වාතාවරණය තුළ බොහෝ කාල වෙලාවක් ගතවීම වළක්වාලමින් VIDEOCHECK ක්‍රමවේදය එම බාධා ජය ගනිමින් ඉදිරියට ගොස් ඇත. යුරෝපය තුළ VIDEOCHECK ක්‍රමවේදය පුළුල්ව පරීක්ෂා කිරීම මගින් වැඩි දියුණු කර ඇති අතර මෙය Carmart හී ඩිජිටල්කරණය සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා වූ දිගුකාලීන උපායමාර්ගයන්ගේ මූලික අංගයකි.

ප්‍රංශය, ස්විට්සර්ලන්තය සහ ඔස්ට්‍රියාව යන රටවල පාරිභෝගික සේවා ක්‍රියාවලියට නව ඉහළ වටිනාකමක් එක් කරමින් VIDEOCHECK සේවාව ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵල ලෙස එම රටවල උසස් මට්ටමේ පාරිභෝගික තෘප්තියක් මෙම සඳහා පෙන්නුම් කර තිබේ. ඒ අනුව අද වන විට ප්‍රංසය, ස්පාඤ්ඤය, බෙල්ජියම, ඉතාලිය, සහ පෝලන්තය පුරා PSA ජාල ක්‍රියාත්මක කර ඇති අතර එහි වැඩි දුර පරීක්ෂණ ජර්මනියේ සිදු කෙරෙමින් පවතී. ඒහිදී ආසියා පැසිෆික් කලාපයේ VIDEOCHECK ක්‍රියාත්මක කළ පළමු රට ශ්‍රී ලංකාවයි.

මගීන්ගේ ආරක්ෂාව හෝ මාර්ග යෝග්‍යතාවයට මූලිකත්වය දෙමින් වැදගත් සහ හදිසි අවශ්‍යතාවන් විශේෂයෙන් සඳහන් කිරීමට නිෂ්පාදකයා විසින් වර්ගීකරණය කරන ලද පිරික්සුම් ලැයිස්තුවක් මෙහිදී භාවිත කරයි. ඊට අමතරව ටයර්වල තත්ත්වය, තිරිංගවල තත්ත්වය ද මෙම පරික්ෂාව අතරතුර සිදු කෙරේ.

වීඩියෝ පටය රූගත කිරීමෙන් අනතුරුව සිදු කළ යුතු කාර්යයන් පිළිබඳව විස්තර කිරීමක් සිදු කෙරේ. ඒ සඳහා ලයිස්තු ගත කර ඇති සේවාවන්ගෙන් පාරිභෝගිකයා ඉල්ලා සිටින සේවා ආදියත් යෝජිත අලුත්වැඩියා පිළිබඳව සහ වෙනත් කරුණුද ඇතුළත් වේ.




# සියැට් කැලණි ටයර් පෙරමුණේ

**සියැට් කැලණි හෝල්ඩින්ග්ස් සමාගම දැනටමත් වසරකට ටයර් මිලියන 2ක් නිපදවන අතර මෙරට ට්‍රක් සහ බස්රථ ටයර් අවශ්‍යතාව සියයට 100ක්ම සමාගමට සැපයිය හැකි බව පවසයි. ඒ සඳහා ඉදිරි සති කිහිපය තුළ රේඩියල් ටයර් නිෂ්පාදනය 45%කින් වර්ධනය කිරීමට යන්ත්‍ර සවිකරමින් පවතී**

විදේශ විනිමය ඉතිරි කර ගැනීමටත් දේශීය කර්මාන්ත නගා සිටුවීමටත් රජය දරන ප්‍රයත්නවලට ප්‍රතිචාරයක් ලෙස මෙරට ට්‍රක්රථ සහ බස්රථ ටයර් අවශ්‍යතාව සම්පූර්ණයෙන්ම නිපදවීම සඳහා සමාගමේ සියලුම නිෂ්පාදන කර්මාන්ත ශාලාවල ධාරිතාව උපරිමයෙන් භාවිත කරමින් ආනයන ආදේශනය තුළින් විදේශ විනිමය ඉතිරි කර දීමට සියැට් කැළණි හෝල්ඩින්ග්ස් සමාගම ඉදිරිපත් වී ඇත.

මෙරට ටයර් අවශ්‍යතාවෙන් දැනටමත් අඩකට ආසන්න ප්‍රමාණයක් නිෂ්පාදනය කරන සියැට් සමාගම රජය විසින් තාවකාලිකව පනවා ඇති ආනයන සීමා හමුවේ මෙරට මගී බස්රථ සහ භාණ්ඩ ප්‍රවාහන අංශවල ටයර් අවශ්‍යතාව සියයට 100ක්ම සමාගමට දේශීයව නිෂ්පාදනය කළ හැකි බව ප්‍රකාශ කරයි.

මේ ආකාරයෙන් පිටරටින් ගෙන්වන ටයර් මෙරට නිපදවීම මගින් වසරකට රුපියල් බිලියන 11ක විදේශ විනිමයක් ඉතිරි කරගත හැකිබව සමාගම සඳහන් කරයි.

ආනයන සීමාව නිසා දේශීය වෙළෙඳපොළේ ඇතිවී තිබෙන අමතර ඉල්ලුම සපුරාලීම සඳහා සමාගමට තිබෙන හැකියාව පිළිබඳව අදහස් දක්වමින් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ, රවී ඩඩ්ලානි අනාවරණය කළේ සියැට් කැලණි සමාගමට දැනටමත් වසරකට ටයර් මිලියන 2 ක් දේශීයව නිෂ්පාදනය කළ හැකි බවත් එළඹෙන සති කිහිපය තුළ කාර් සහ වෑන් රථ සඳහා වන රේඩියල් ටයර් තවත් 200, 000ක් නිෂ්පාදනය කිරීමට නව යන්ත්‍ර සවිකරමින් සිටින බවත්ය. මෙම නව යන්ත්‍ර නිෂ්පාදන ක්‍රියාවලියට යෙදවීම විදේශීය තාක්ෂණවේදීන් පැමිණි විගස සිදුවනු ඇතැයි ද ඔහු පැවසීය.

මීට අමතරව, පාරිභෝගිකයන්ට සහ ආර්ථිකයට සහයෝගය දැක්වීම සඳහා සියැට් කැලණි සමාගම විසින් 2019 දෙසැම්බර් මාසයේ සිට ටයර්වල මිල ගණන් වෙනස් නොකළ බව ද සමාගම පවසයි.

සමාගම විසින් පසුගිය ජූලි මාසයේ දී වැඩි බරක් ගෙන යමින් වැඩිදුරක් ධාවනය කළ හැකි 10.00 R-20 ප්‍රමාණයේ බයස්-ප්ලයි ටයරයක් වන 'CEAT LYFMAX' ටයරය වෙළෙඳපොළට හඳුන්වා දෙන ලදී. කිලෝ ග්‍රෑම් 52ක (රාත්තල් 115 ක්) බරකින් යුක්ත වන මෙම ටයරය ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළ තුළ තිබෙන මේ ආකාරයෙන් බර ඇදීම සඳහා නමක් දිනාගෙන තිබෙන තවත් ජාත්‍යන්තර ටයර් සන්නාම දෙකක් සමඟ සංසන්දනය කිරීම මගින් දිගුකල් පවත්නා බව සනාථ කර තිබේ.

# සෙලාන් බැංකුවෙන් වෙබිනාර් මාලාවක්

**සෙලාන් බැංකුව, රට වසා දමා තිබූ කාලය තුළ සහ ඉන් පසුව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වෙනුවෙන් අඛණ්ඩව සහයෝගය ලබා දීම ඉලක්ක කර ගනිමින් වෙබිනාර් සැසි දෙකක් පැවැත්වීමට කටයුතු කළේය. COVID-19 වසංගතයෙන් පසුව යළි නැගී සිටීම සඳහා අවශ්‍ය ව්‍යාපාරික උපදෙස් මෙන්ම ද්‍රවශීලතා කළමනාකරණය, සැපයුම්දාම කළමනාකරණය සහ වඩාත් යහපත් ව්‍යාපාරික ක්‍රියාවලි සඳහා නව තාක්ෂණය භාවිත කිරීම ආදී වැදගත් ක්ෂේත්‍ර රැසක් ද ව්‍යවසායකයන් වෙනුවෙන් පිරිනැමීම මෙම වෙබිනාර් පෙළෙහි අරමුණ විය.**

'ශ්‍රී ලාංකේය ආර්ථිකයට COVID-19 වසංගතයෙන් ඇති කළ බලපෑම' සහ 'නව අභියෝග හමුවේ ව්‍යාපාරික ක්‍රමෝපාය යළි අර්ථකථනය කිරීම' යන තේමා යටතේ වෙබිනාර් මාලාව පැවැත්විණි. බහුතර සිංහල සහ ද්‍රවිඩ ව්‍යාපාරික ප්‍රජාව ආවරණය කරමින් එම භාෂා දෙකෙන්ම වෙබිනාර් පැවැත්වීමට ද සෙලාන් බැංකුව කටයුතු කළේය. මෙවැනි වර්ගයේ ද්‍රවිඩ බසින් සුළු හා මධ්‍ය පරිමාණ අංශය වෙනුවෙන් දියත් කෙරුණු ප්‍රථම වෙබිනාර් සැසිය ද මෙය වීම විශේෂත්වයකි. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය නියෝජනය කරමින් එම ව්‍යවසාය නගාසිටුවීම සඳහා දියත් කෙරුණු වෙබිනාර් මාලාව සඳහා 300 දෙනෙකුගේ සහභාගිත්වයක් හිමි විය.

ජ්‍යෙෂ්ඨ ආර්ථිකවේදියකු මෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ සංවර්ධන උපදේශකවරයකු වන හසිත විජේසුන්දරගේ මූලිකත්වයෙන් පැවැත්වුණු ප්‍රථම වෙබිනාර් සැසිය සඳහා 125 දෙනෙකු සහභාගී විය. Sparkwin Research ආයතනයේ පර්යේෂණ සහ පාරිභෝගික දර්ශන ඒකකයේ අධ්‍යක්ෂ සුදාකරන් පේරම්බලම් මහතා විසින් මෙහෙයවන ලද දෙවන වෙබිනාර් සැසිය සඳහා 175 ක් දෙනෙක් සහභාගී විය.

# ටයර් ආනයනය සීමා කිරීමෙන් පාරිභෝගිකයින්ට දැඩි අසීරුතා

**"මුල් නිෂ්පාදන රේඩියල් ටයර්" භාවිතය ප්‍රකට ගෝලීය වාහන නිෂ්පාදකයන් විසින් වාහනයක දීර්ඝකාලීන ක්‍රියාශීලිත්වය, සුවපහසුව හා ආරක්ෂාව සඳහා "මුල් නිෂ්පාදන රේඩියල් ටයර්" භාවිතය පමණක් නිර්දේශ කරනු ලැබේ. එවැනි අති නවීන වාහන හිමිකරුවන් විසින් "මුල් නිෂ්පාදන රේඩියල් ටයර්" සන්නාම පමණක් තෝරා ගැනීමට රුචිකත්වයක් දැක්වීම ස්වභාවිකය.**

මේ සඳහා විවිධ සන්නාම නාමයන්ගෙන් හඳුන්වනු ලබන තත්ත්වයෙන් ඉහළ නොයෙක් වාහන මාදිලිවලට නිර්දේශ කළ ඒ ඒ "මුල් නිෂ්පාදන රේඩියල් ටයර්" මිලදී ගැනීමට හැකි අවකාශය වෙළෙඳ පොළෙහි ගම්‍ය විය යුතුය. එයට හේතුව විශේෂයෙන්ම "මුල් නිෂ්පාදන රේඩියල් ටයර්" භාවිත කිරීම සඳහා නිර්දේශිත ජාත්‍යන්තර උපදෙස් මාලාවට පටහැනිව ප්‍රමිතියෙන් තොර විකල්ප ටයර් භාවිත නොකිරීමට වාහන හිමිකරුවන් ඉතා පරික්ෂාකාරී වීමය. සැමවිටම වාහන හිමිකරුවන් රේඩියල් වර්ගයේ "මුල් නිෂ්පාදන ටයර්" භාවිත කිරීම සඳහා ප්‍රබල ප්‍රවණතාවක් නිරායාසයෙන් නිර්මාණය වේ. රේඩියල් ටයර් නිෂ්පාදනය සඳහා ප්‍රචලිත කාර්යක්ෂම ඉංජිනේරු තාක්ෂණය ලෙස සැලකෙන්නේ ලොව දැනට ශක්තිමත් ලෙස ප්‍රතිස්ථාපිත "සුපිරි රේඩියල් ටයර්" ශිල්පීය ක්‍රමවේදයයි. 2019 දත්තයන්ට අනුව ටයර් ආනයනය කිරීම තුළින් රුපියල් බිලියන 4.5 ක් පමණ වන රේගු බදු ආදායමක් රජය වෙත උත්පාදනය කරන ලදී.

කෙසේ වෙතත්, රජය විසින් දැනට තාවකලිකව ටයර් ආනයනය සීමා කර තිබීම හේතුවෙන් පාරිභෝගිකයාගේ දෘෂ්ටි කෝණයෙන් බලන කල කිසියම් අපහසුතාවක් පැන නැගී තිබෙන බව විද්‍යමාන වේ. අවශ්‍ය උසස් වර්ගයේ ටයර් ආනයන ක්‍රියාවලිය පෙර පරිදි සීමා නිර්ණයන්ගෙන් තොරව ආරම්භ කිරීම මේ නිසා කාලෝචිත වෙනු ඇතැයි සිතමු.

# Daraz.lk වෙතින් සුවිශේෂී වට්ටම්

**සුහද හදක් ඇති දේශීය බැංකුව ලෙස සෙලාන් බැංකුව ශ්‍රී ලංකාවේ විශාලතම අන්තර්ජාල සාප්පු සවාරි වෙබ් අඩවිය සමඟ අත්වැල් බැඳගනිමින් දියත් කරන 'සෙලාන් සිකුරාදා' (Seylan Fridays) ප්‍රවර්ධන වැඩසටහන හරහා සියලු සෙලාන් බැංකු ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන් වෙත අසමසම වට්ටම් පිරිනැමීමට කටයුතු යොදා ඇත.**

සිය සාප්පු සවාරි අවශ්‍යතා සපුරාගැනීම සඳහා පාරිභෝගිකයන් ඉ-වාණිජ ක්‍රමවේද වෙත වඩාත් නැඹුරු වීමේ ප්‍රවණතාවක් පවතින පසුබිම තුළ 2020 දෙසැම්බර් මාසය දක්වා සෑම සිකුරාදාවකම Daraz වෙබ් අඩවිය හරහා සුවිශේෂී වට්ටම් හිමිකර ගැනීමට සෙලාන් බැංකු ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන්ට අවස්ථාව උදාවී ඇත. ඒ අනුව, එම වෙබ්අඩවියේ සියලු භාණ්ඩ ආවරණය කරමින් පුළුල් පරාසයක නිෂ්පාදන සඳහා 10% ක වට්ටමක් හිමිකර දීමට සෙලාන් බැංකුව සහ Daraz වෙබ්අඩවිය කටයුතු යොදා ඇත. පාරිභෝගිකයා මිලදී ගන්නා භාණ්ඩ ඔවුන් සිටින ස්ථානයටම ගෙන්වා ගැනීමේ අවස්ථාව හිමිකර දෙමින් පාරිභෝගික පහසුව තවදුරටත් පුළුල් කිරීම මෙම ප්‍රවර්ධන වැඩසටහනේ අරමුණයි.

ෆිච් ශ්‍රේණිගත කිරීම් මගින් ඒ බැංකුවේ ජාතික දිගුකාලීන ශ්‍රේණිගත කිරීම A (lka) මගින් මූල්‍යමය වශයෙන් ස්ථාවර බැංකුවක් ලෙස තහවුරුකර ඇත. තවද, Transparency Global ආයතනය විසින් ආයතනික වාර්තාකරණයේ විනිවිදභාවය වෙනුවෙන් කොටස් වෙළෙඳපොළේ ලියාපදිංචි සමාගම් අතර දෙවන ස්ථානයේ ශ්‍රේණිගතකර ඇති සෙලාන් බැංකුව S & P Dow Jones SL 20 දර්ශකයට ද ඇතුළත්ව සිටී.

සෙලාන් ක්‍රෙඩිට් සහ ඩෙබිට් කාඩ්පත් ලබාගැනීම සඳහා 011 200 88 88 ක්ෂණික ඇමතුම් අංකය අමතන්න. වැඩිදුර තොරතුරු සඳහා www.seylan.lk වෙත පිවිසෙන්න.

# කොමර්ෂල් බැංකුවේ වත්කම් වර්ධනය වේ

**කොමර්ෂල් බැංකුව, එයට අනුබද්ධ සමාගම්ද ඇතුළත් වන කොමර්ෂල් බැංකු සමූහය විසින් 2020 පළමු මාස හයේ දී 11.19% ක ශක්තිමත් වත්කම් වර්ධනයක් ලබාගනිමින් රුපියල් ට්‍රිලියන 1.5 ක වත්කම් සීමාව පසුකිරීමට සමත්වී තිබෙන අතර සලකා බලන කාලයේ දී සමූහයේ දළ ආදායම 2.15%කින් වර්ධනය වී රුපියල් බිලියන 75.167 ක්වී තිබේ.**

බැංකුව සඳහන් කරන්නේ ජාත්‍යන්තර මූල්‍ය ආයතනය (IFC) විසින් ඉදිරියේ දී කොමර්ෂල් බැංකුවට සිදුකිරීමට නියමිත ඩොලර් මිලියන 50 ක කොටස් ආයෝජනය සමඟ බැංකුවේ පළමු පෙළ ප්‍රාග්ධන ප්‍රමාණත්ව අනුපාතය සහ කොටස්කරුවන්ගේ වටිනාකම් තවදුරටත් ඉහළ යනු ඇති බවයි.

මේ අතර, බැංකුවේ පොලී අන්තරය 2019 දෙසැම්බර් අවසානයේ තිබූ 3.51% ක මට්ටමේ සිට සලකා බලන මාස හයක කාල සීමාව තුළ දී 3.04% ක් දක්වා අඩුවී තිබේ. එසේම, 2019 අවසානයේ දී බැංකුවේ වත්කම්වල ප්‍රතිලාභ අනුපාතය (බදුවලට පෙර) සහ කොටස්වලට අදාළ ප්‍රතිලාභ අනුපාතය පිළිවෙලින් 1.66% ක් සහ 13.54% ක්වූ අතර එය 2020 ජුනි 30 වනදා වනවිට 1.43% ක් සහ 10.21%ක් වී ඇත.

බංග්ලාදේශය තුළ ශාඛා 19 ක් ද මියන්මාරයේ යැන්ගොන්හි, නියෝජිත කාර්යාලයක් සහ නේ පයිටව් හි, ක්ෂුද්‍ර මූල්‍යන සමාගමක් මෙන්ම මාලදිවයින තුළ බහුතර කොටස් හිමිකාරීත්වයෙන් යුතු පළමු පෙළ බැංකුවකින් සමන්විත විදේශීය මෙහෙයුමක් පවත්වාගෙන යන ශ්‍රී ලංකාවේ එකම පුද්ගලික වාණිජ බැංකුව කොමර්ෂල් බැංකුව වේ.

## උස්වත්ත කන්ෆැක්ෂනරී වර්ක්ස් සමාගම අනුග්‍රහයෙනි සිළුමිණ මොටාගෙදරගේ ගුරු ගෝල වෙනස 73 අගෝස්තු මස ජයග්‍රාහකයෝ




**රුපියල් 2500 බැගින් ත්‍යාග ලැබූ ජයග්‍රාහකයෝ**

1. ජී.එස්.එම්. ජයවර්ධන පස්සර පාර, හිඳගොඩ, බදුල්ල.
2. ඩබ්ලිව්.ඒ.එම්. රම්‍යලතා පොල්වත්ත, රත්තොට.
3. එච්.එම්. රත්නායක 5 වන පටුමග, සමගිඋයන, මාවතගම.
4. පී. ජෝන් ඉලංගරත්න හේවාපොල, පිලැස්ස.
5. එල්.පී. අමානි දිහාසා සිල්වරි ක්‍රෙස්ට්, යටියන පාර, කැකණදුර.
6. ඒ.එම්.එස්.බී. අමරකෝන් විජයබාහුකන්ද, හැටන් (හරහා)
7. විනීතා මංචනායක හතරැස් වෙල, යාපනය පාර, අනුරාධපුරය.
8. ජී.ජේ. අමරා ජයකොඩි සියඹලාගස්තැන්න, වැල්ලව.
9. ජී. දිනුෂිකා පියුමාලි බුරුතකන්ද, ගගේයාය, ඇඹිලිපිටිය.

**රුපියල් විසිපන්දහසක තෑගි**



# දැයට දිරිදුන් ලාෆ්ස් අභිමානය

## වසර 25ක ඉතිහාසය සපුරයි




ලාෆ්ස් සමාගමේ මූලස්ථානය


හම්බන්තොට පිහිටි ලාෆ්ස් (LPG) පර්යන්තය

● චන්දිමා එදිරිමාන්න

**එතෙක්, මෙතෙක් ඉතිහාසය තුළ ගෑස් වෙළෙඳාම හා බලශක්ති ක්ෂේත්‍රය වැනි ව්‍යාපාර ක්ෂේත්‍රය තුළ ප්‍රමුඛත්වය හිමි කර ගැනීමට සමත් වූයේ බහුජාතික වෙළෙඳ සමාගම්ය. මෙරට ජාතික ධනය සූරා ගනිමින් එම වෙළෙඳ කටයුතු හී ඒකාධිකාරය පැතිර වූ එකී බහුජාතික සමාගම් වෙත අභියෝග කරමින් වසර 25 ක් වැනි කෙටි කාලයක් තුළ තම ස්ථාවරත්වය ගොඩනගා ගැනීමටත්, ගෑස් වෙළෙඳාම, බලශක්තිය වැනි ක්ෂේත්‍රය තුළ මුදුනටම සිය නම ඔසවා තබන්නටත් ශ්‍රී ලාංකීය වෙළෙඳ සමාගමකට හැකි වුණි නම් එය එම සමාගම ලැබූ ජයග්‍රහණයක් පමණක් නොව සමස්ත ශ්‍රී ලාංකීය ජනතාවම ජාතියක් හැටියට පමණක් නොව රටක් හැටියටත් ලැබූ විජයග්‍රහණයක් ලෙස කිසිදු පැකිළීමකින් තොරවම හඳුන්වා දීමට හැකිය.**

ලාෆ්ස් ව්‍යාපාරික සන්නාමය 100% ක් දේශීය ව්‍යාපාර ජාලයකට හිමිකම් කියයි. එම ලාෆ්ස් සන්නාමය ප්‍රමුඛ ව්‍යාපාර ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ සාර්ථකව විවිධාංගීකරණය වූ ශ්‍රී ලංකාවේ විශාලතම සහ විශ්වාසනීයම ව්‍යාපාර සමූහයක් ලෙසද හඳුන්වා දීමට හැකිය. 1995 වර්ෂයේ දී ආරම්භ කළ ලාෆ්ස් ව්‍යාපාර සමූහය තුළ මේ වන විට වෘත්තීය නිපුනත්වයෙන් පිරිපුන් සේවක සේවිකාවන් 3500කට අධික පිරිසක් සේවය කරන අතර, වාර්ෂිකව ඇමරිකානු ඩොලර් මිලියන 300 ට අධික ආදායමක් උත්පාදනය කිරීමට ද එම ව්‍යාපාරික ජාලයට හැකියාව ලැබී ඇත.

එල්.පී ගෑස්, බලශක්ති, පාරිභෝගික භාණ්ඩ වෙළෙඳාම්, කර්මාන්ත, හෝටල් සහ සංචාරක සේවා, ප්‍රවාහන සහ සැපයුම් කටයුතු, යන විවිධ ව්‍යාපාර කර්මාන්ත අංශ 20කට අධික ප්‍රමාණයක ව්‍යාප්තව ඇති ලාෆ්ස් සමූහ ව්‍යාපාරය මිලියන ගණනක් පාරිභෝගිකයන්ගේ විශ්වසනීයත්වය ඉහළින්ම දිනූ සැබෑ ශ්‍රී ලාංකීය සමාගමකි. 2020 මාර්තු 31 අවසන් මූල්‍ය වර්ෂය සඳහා රුපියල් බිලියන 65 ක අලෙවි ආදායමක් වාර්තා කිරීමටද ලාෆ්ස් සමූහ ව්‍යාපාරයට හැකියාව ලැබුණු අතර 60,000 කට අධික දෛනික පාරිභෝගික පිරිසකගෙන් යුත් මෙරට විශාලතම ව්‍යාපාර සමාගම් අතරින් එකක් ලෙසද එම සමාගම් සමූහය පිළිගැනේ.

ලාෆ්ස් සමූහ ව්‍යාපාරය මේ වන විට සිය විසිපස් වසරක අභිමානවත් ගමන් මග සැමරීමට සමත් වී ඇති අතර, එම ව්‍යාපාරය ලැබූ මෙම සුවිශේෂ සාර්ථකත්වය පිටුපස සැඟවී ඇති ප්‍රධානතම සාධකය එහි වත්මන් සභාපති ඩබ්ලිව්. කේ. එච්.වැගපිටිය මහතා සතු නොපසුබස්නා උත්සාහය, අප්‍රතිහත ධෛර්ය හා අසීමිත කැපවීම හා දුරදක්නා නුවණින් යුතුව සිය ව්‍යාපාරික ජාලය මෙහෙයවීමට ඇති හැකියාව වැනි සාධක රැසක් ගෙන හැර දැක්වීමට පුළුවන. රත්නපුර දිස්ත්‍රික්කයේ බලන්ගොඩ නගරයට කිලෝමීටර් හතක් පමණ ඈතින් පිහිටි වැගපිටිය ගමේ, දරුවන් නව දෙනෙක් ගෙන් යුතු පවුලක බාලයා වී ඉපදී මොරහැළ බණ්ඩාරනායක විද්‍යාලයෙන් සිය මූලික අධ්‍යාපනය ලබා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට ඇතුළත්ව ව්‍යාපාර පරිපාලනය හා කළමනාකරණය පිළිබඳ උපාධිය ලබා ගැනීමට වාසනාවන්ත වුණු හෙතෙම විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් පසු නැව් සංස්ථාවේ පුහුණු වන සේවකයකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ අතර, අනතුරුව තමන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කර එය සාර්ථක කර ගැනීමේ අරමුණ ඇතිව එවකට ලංකාවේ කිසිදු ව්‍යාපාරිකයකු අත නොගැසූ


ලාෆ්ස් සමූහ ව්‍යාපාරයේ සභාපති ඩබ්ලිව්. කේ. එච් වැගපිටිය

බලශක්ති ව්‍යාපාරය ආශ්‍රිතව සිය ලාෆ්ස් සමාගම ආරම්භ කිරීමට තරම් ප්‍රඥාවන්ත විය.

තරුණ වැගපිටිය බලශක්ති ව්‍යාපාරය ආශ්‍රිතව ව්‍යාපාර කටයුතු වලට මුල් වූ මුල් කාලයේදී බහුජාතික ව්‍යාපාර ජාල හා කරට කර හැපෙමින් ඔහු වැනි දේශීය ව්‍යාපාරිකයන්ට මෙවැනි ව්‍යාපාර හසුරවන්නට නොහැකි වනු ඇති බවට ඇතැම් සමකාලීන ව්‍යාපාරිකයෝ කැට තියා ඔට්ටු ඇල්ලූහ. තවත් සමහරු උපහාසයට සිනාසුනහ. බොහෝ අය බලාපොරොත්තු වූයේ වැගපිටියගේ බලශක්ති සමාගම් සිහිනය, සිහිනයක්ම වනු ඇති බවටයි. එහෙත් තරගකරුවන්ගේ පමණක් නොව සමච්චල්කරුවන්ගේද දෑස් අබියසම ලාෆ්ස් ව්‍යාපාර සමූහය දිනෙන් දින අතු රිකිලි දා වැඩෙන අති දැවැන්ත දේශීය ව්‍යාපාර ජාලයක් ලෙස ගොඩ නැගී ඇති අතර මෙරට ජාතික ආර්ථිකයට පණ දෙන ප්‍රමුඛ කොටස්කරුවකු වීමටද ඔවුන්ට හැකියාව ලැබී තිබේ.

ලාෆ්ස් සමූහ ව්‍යාපාරයේ නිර්මාතෘවරයකු වන ඩබ්ලිව්. කේ. එච්. වැගපිටිය වර්තමානයේදීද එම සමාගම් ජාලයේ සමූහ සභාපතිවරයා ලෙස කටයුතු කරන අතර තිලක් ද සිල්වා එහි සමූහ නියෝජ්‍ය සභාපති ලෙස කටයුතු කරයි. මීට අමතරව ලාෆ්ස් සමූහ ව්‍යාපාරයේ සමූහ කළමනාකාර අධ්‍යක්ෂක, ප්‍රධාන විධායක නිලධාරී ලෙස පියදාස කුඩාබාලගේ කටයුතු කරන අතර එච්. ඒ. ආරියරත්න අධ්‍යක්ෂකවරයකු ලෙසත් ලාෆ්ස් දිනන ගමනට ශක්තියක් වී සිටියි.

ලාෆ්ස් ව්‍යාපාර සමූහය හා බැඳුණු ව්‍යාපාරික සමාගම් අතර ලාෆ්ස් ගෑස්, ලාෆ්ස් පෙට්‍රෝලියම්, ලාෆ්ස් ලුබ්‍රිකන්ට්ස්, ලාෆ්ස් පවර් ඇතුළු තවත් සමාගම් 17ක් ඇතුළත්ය.

### ◆ දේශීය ව්‍යාපාරිකයන් සඳහා සියලුම සහන නොඅඩුව ලබා දෙන්න.

**විසිපස් වසරක ජයග්‍රාහී ගමන්මග අභිමානයෙන් සැමරූ ලාෆ්ස් සමූහ ව්‍යාපාරයේ සභාපති ඩබ්ලිව්. කේ. එච් වැගපිටිය රජයෙන් ඉල්ලයි.**

මම ඉපදුණේ රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ ගමේ. විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා කොළඹට ආවේ එක්දාස් නවසිය අසූවේ දී. සාර්ථක ලෙස විශ්වවිද්‍යාල අධ්‍යාපනය සම්පූර්ණ කර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය හා කළමනාකරණය පිළිබඳ උපාධිය ලබාගත්තා. 1984දී විශ්වවිද්‍යාලයෙන් පිටවෙලා ජීවිතය ජය ගැනීමේ මාර්ග හෙව්වා. එහෙමත් ටික කාලයක් ගත වූ විට තමයි ව්‍යාපාර ක්ෂේත්‍රය වෙත මා යොමු වන්නේ. එලෙස මා ව්‍යාපාර කටයුතු සඳහා යොමු වන විට මා අත තිබුණේ රුපියල් 5000ක් වැනි ඉතා සුළු මුදලක්.

ව්‍යවසායකයකු ලෙස මගේ ගමන්මග මෙන්ම සාර්ථකත්වයද තහවුරු කළ ලාෆ්ස් ව්‍යාපාරය ආරම්භ කිරීමට කටයුතු යෙදුවේ මීට වසර විසි පහකට පෙර 1995 වසරේ අගෝස්තු 18 වෙනිදායි. ඒ අනුව ලංකාව පුරාම ඔටෝ ගෑස් මධ්‍යස්ථාන ආරම්භ කරමින් ලංකාවේ පළමු වරට රථවාහන සඳහා ඉන්ධනයක් විදිහට එල්.පී ගෑස් භාවිතා කරන්න අලුත් සංකල්පයක් හඳුන්වා දුන්නා. වසර පහක කාලයක් වන විට එය ඉතාම හොඳින් දියුණු වුණා.

එම සාර්ථකත්වය දිනා ගන්නා අතර තුර පාරිභෝගිකයන් සඳහා ගෘහස්ථ ගෑස් අලෙවිය සඳහා යොමු වීම සම්බන්ධව අප දිගින් දිගටම අවධානය යොමු කළා. එහි ප්‍රතිඵලයක් විධියට 2001 වසරේදී එලෙස ගෑස් වෙළෙඳාමට යොමු වුණු පළමු දේශීය ව්‍යාපාරික ආයතනය බවට පත් වෙමින් "ලාෆ්ස් ගෑස්" මෙරට වෙළෙඳපොළ වෙත ඉතාම සාඩම්බරයෙන් යුතුව හඳුන්වා දීමටද අපට හැකි වුණා. පැහැදිලිවම අප එම ජයග්‍රහණය තහවුරු කර ගනු ලැබුවේ එවකට මෙරට ගෑස් වෙළෙඳපොළ තුළ සිය ඒකාධිකාරය පතුරුවා ගෙන සිටි ප්‍රධානතම බහු ජාතික සමාගමක් වූ ෂෙල් ගෑස් සමාගමටද අභියෝගයක් එල්ල කරමින්.

මේ වන විට අපගේ ලාෆ්ස් ගෑස් සමාගම ප්‍රමුඛ කර ගනිමින් විෂය ක්ෂේත්‍ර රැසක් ආවරණය වූ සමාගම් රැසක් අපගේ ව්‍යාපාර සමූහය තුළ අනුබද්ධ සමාගම් ලෙස කටයුතු කරන බවත් සඳහන් කළ යුතුයි. ලංකාවේ දෙවැනි ගෑස් සමාගම ලෙස ජනතා ආදරය හා ගෞරවය හිමි කර ගත් අප ව්‍යාපාරය සතුව දකුණු ආසියාවේ ලොකුම ගෑස් ආනයන අපනයන පර්යන්තයත් හිමියි. ඒ වගේම ගෑස් ප්‍රවාහන නෞකා පවා මේ වනවිට අප සමාගම සතුයි.

බංගලාදේශයේ පිහිටි එරට හතරවැනියට විශාල කර්මාන්ත ශාලාවත් අපගේ ව්‍යාපාරික ජාලයේ ප්‍රමුඛ සාමාජිකයෙක්. ඊට අමතරව ලිහිසි තෙල්, සූර්ය බලශක්තිය යොදා ගනිමින් විදුලිය නිෂ්පාදනය,ජල විදුලි නිෂ්පාදනය, වාහන දුම් පරීක්ෂණ මධ්‍යස්ථාන,සුපිරි වෙළෙඳසැල්, හෝටල්, සංචාරක හෝටල් වැනි ව්‍යාපාර ක්ෂේත්‍ර ගණනාවක අපගේ අතුපතර පැතිර ගොස් තිබෙනවා.

ලාෆ්ස් ව්‍යාපාරික ජාලය සතු ව්‍යාපාරික සමාගම් මේ වන විට බංග්ලාදේශය, ඩුබායි යන රටවල ස්ථාපිත කර තිබීමද අප ලබා ගත් සුවිශේෂම ජයග්‍රහණයක්. ඉදිරියේදී බංග්ලාදේශය, මියන්මාරය වැනි රටවල තවත් ව්‍යාපාරික සමාගම් කීපයක් ව්‍යාප්ත කිරීමටද අප බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම ලාෆ්ස් ව්‍යාපාර සමූහයට අවුරුදු 25ක් සමරන මේ මොහොතේ දී අපගේ ජයග්‍රාහී ගමන් මගට පන්නරය දුන් පාර්ශ්ව කීපයක් පිළිබඳවම ස්තූතිපූර්වකව ඉතාම ගෞරවයෙන් සඳහන් කළ යුතුයි. ඒ අතර අපගේ ආදරණීය පාරිභෝගිකයන් හා සේවා දායකයන් ඉහළම තැනක සිටින අතර විවිධාකාරයෙන් ව්‍යාපාරයේ හවුල්කරුවන් වූ ව්‍යාපාරික සමාගම් මෙන්ම අපගේ නිබඳ ශක්තිය වන සේවක සේවිකාවන්ද මාගේ ඇගයුමට ලක් ව තිබෙනවා. එපමණක් නොව සියලුම රාජ්‍ය හා පුද්ගලික බැංකු, විද්‍යුත්, මුද්‍රිත මාධ්‍ය ආයතන අපගේ ගමන් මග වර්ණවත් කිරීමට විවිධාකාරයෙන් දායක වුණා. එසේම පසුගිය අවුරුදු 25 ක කාලය ඇතුළත රටේ පාලන තන්ත්‍රය හෙබවූ විවිධ රජයන්ද අපගේ ව්‍යාපාර අභිවෘද්ධිය පිණිස ඉහළම දායකත්වයක් හා සහයෝගයක් ලබා දුන් බවද සඳහන් කළ යුතුයි.

මේ වන මෙරට පාලන බලය හිමි අතිගරු ජනාධිපතිතුමාගෙන් වගේම වත්මන් රජයෙන්ද

### ලාෆ්ස් ව්‍යාපාරික ජාලයට තවත් ව්‍යාපාරික සමාගම් රැසක් සතුයි

**100%ක්ම දේශීය ව්‍යාපාරයක්**

**එල්.පී ගෑස්, බලශක්ති, සුපිරි වෙළෙඳසැල්, සිල්ලර වෙළෙඳාම්, කර්මාන්ත, හෝටල් සහ සංචාරක සේවා, ප්‍රවාහන සහ සැපයුම් කටයුතු, දේපොළ වෙළෙඳාම් යන විවිධ ව්‍යාපාර කර්මාන්ත අංශ 20කට අධික ප්‍රමාණයක ව්‍යාප්තයි.**

**60,000කට අධික දෛනික පාරිභෝගික පිරිසකගෙන් යුත් මෙරට විශාලතම ව්‍යාපාර සමාගම් අතරින් එකක්**

අභියෝග, බාධක, කම්කටොලු, අවහිරතා මැද ඉදිරියට හා දේශීය ව්‍යවසායකයකු ලෙස මා විශේෂ ඉල්ලීමක් සිදු කරනවා. යල්පැනගිය ප්‍රතිපත්ති හා ක්‍රමවේද යාවත්කාලීන කිරීමට කටයුතු යොදමින් දීර්ඝ කාලීනව පවතින කර්මාන්ත හා වෙළෙඳ ප්‍රතිපත්ති සකස් කිරීමට වහාම මැදිහත්ව කටයුතු කරන ලෙස ඉල්ලීම දේශීය ව්‍යවසායකයෙකු ලෙස අතිගරු ජනාධිපතිතුමාගෙන් මෙන්ම වත්මන් රජයෙන්ද මා කරන එම විශේෂ ඉල්ලීමයි. රටේ ඉදිරි ගමන ස්ථාවර ලෙස ගමන් කළ යුතු නිසාම විදේශීය ආයෝජන ගැන පමණක් නොව අභියෝග වලට මුහුණ දිය හැකි අප වැනි දේශීය ව්‍යාපාරිකයන් සඳහාත් ඉදිරි කාලය තුළ දිරි ගැන්වීම් මෙන්ම ලබා දිය හැකි සියලුම සහන අඩු නැතිව ලබා දීම සඳහා සියලු බලධාරීන් නොවලහා උනන්දු විය යුතුයි.

ඡායාරූපය - දුෂ්මන්ත මායාදුන්න

### වාණිජ මණ්ඩලී


උතුරු මැද පළාතේ ක්‍රියාත්මක වූ සමාජ සුබ සාධන ව්‍යාපෘතියක්


ලාෆ්ස් ඉකෝ ශ්‍රී සමාගමේ වාහන දුම් පරීක්ෂා කිරීමේ අවස්ථාවක්

## සිළුමිණ Daintee X-TRA ප්‍රහේලිකා අංක 115 රුපියල් පනස්දහසක තෑගි

### කොන්දේසි

(1) ප්‍රහේලිකාව සඳහා මසකට රුපියල් 50,000ක මුදලක් ජයග්‍රාහකයන් 10 දෙනකු අතර බෙදී යයි.

(2) පළමුවෙන්ම තෝරාගන්නා නිවැරැදි පිළිතුරු 10ට රුපියල් 5000 බැගින් මුදල් තෑගි පිරිනැමේ.

(3) සිළුමිණ පුවත්පතේ පළවන ප්‍රහේලිකාව විසඳා කූපනය පුරවා ලියුම් කවරයක බහා, එහි වම්පස ඉහළ කෙළවරේ ප්‍රහේලිකා අංක 115 යනුවෙන් සඳහන් කර ඩේන්ටී මයිලේඩි ටොෆී දවටන 10ක් සමඟ සිළුමිණ ප්‍රහේලිකාව, ලේක්හවුස්, කොළඹ 10. යන ලිපිනයට සැප්තැම්බර් 23 දිනට පෙර එවිය යුතුය. නිවැරදි ලිපිනය සහ දුරකතන අංකය ලියා එවන්න.

(4) ජයග්‍රාහකයන් තෝරා ගනු ලබන්නේ කුසපත් ඇදීමෙනි. ජයග්‍රාහකයන්ගේ නම් සහ ප්‍රහේලිකාවේ නිවැරැදි විසඳුම සැප්තැම්බර් 27දා සිළුමිණ පත්‍රයේ පළ වේ. ජයග්‍රාහකයන්ගේ ප්‍රතිඵල පුවත්පතේ පළ වී තෙමසක් ඇතුළත ත්‍යාග මුදල් පිරිනැමේ. ඔබේ ත්‍යාග මුදල නොලැබුණහොත් පමණක් සිළුමිණ කර්තෘ මණ්ඩලය අමතන්න. (දුරකතන අංකය - 011-2429265)

(5) ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සහ ඩේන්ටි ආයතනයේ, සේවකයන්ට හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට තරගය සඳහා ඉදිරිපත් විය නොහැකිය.


### උපකාරක පද

**හරහට**

1. ජල විදුලි බලාගාරයක් නිසා ම ප්‍රසිද්ධියට පත් දිය ඇල්ල
5. පාද නැති
7. නවරත්න
8. පතිව්‍රතා ධර්මය
9. 'ඇද' යන්න සමඟ වාක්ශ්ලිෂ්ටත්වය සඳහා යෙදෙන්නකි
10. රජ්ජුරුවෝ
11. ජගත් කීර්තියට පත් හිමිනමක් නිසා ප්‍රකට වූ මාතර දිසාවේ ගමකි
12. බඩුබාහිරාදිය ණයට ගැනීමේ දී ඉදිරිපත් කරන කාඩ්පත
14. ප්‍රකට වැදි ජනාවාස භූමියකි
17. තරුව
18. 'බැද්දෙගම' නවකතාවේ ප්‍රධාන චරිතය
20. මිනිත්තුවට මේවා හැටකි

**පහළට**

2. අහස-පොළොව ළං වී තිබෙන්නාක් මෙන් පෙනෙන ස්ථානය
3. 1818 කැරැල්ලෙන් පසු පලා ආ ජනයාගෙන් ජනාවාස වූ අම්පාර දිසාවේ වෙරළබඩ ගම්මානයකි
4. අලුත්
5. දුර්වර්ණ/ අඳුරුපාට
6. අලුයම / උදෑසන
8. මෙරට ප්‍රථම ලාංකේය පුරාවිද්‍යා කොමසාරිස්
13. ලෝකෙට ...... ගෙදර මරගාතේ
15. වේගපන්දුවත් අමුතු කොණ්ඩා විලාසිතාවත් නිසා ජනාදරයට පත් ක්‍රිකට් ක්‍රීඩකයා
16. අන්ධකාරය
19. උදුන






සිළුමිණ Daintee X-TRA ප්‍රහේලිකා අංක 115

නම: ......................................................

ලිපිනය: ......................................................

අත්සන: ......................................................

සම්බන්ධීකරණය - ගාමිණී රූපානන්ද අනුරූ මාධ්‍ය සේවා

# බිනර මස රටට, සැමට සුබ ඵල

## ඥාන කාරක බුධ කන්‍යා රාශියට

## ව්‍යවස්ථා කෙටුම්පත සම්පාදනයට නැණවත් ඇස

## විධිමත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රැසක්

## සියලු ලග්නවලට සුබ යෝග රැසක්

## ආගමික සංහිඳියාව පිළිබඳ සුබවාදී නැඹුරුවක්

අපල සපල



ප්‍රවීණ ජ්‍යොතිෂවේදී
සුබසෙත ජ්‍යෙෂ්ඨ කර්තෘ
අජිත් ධර්මසිරි

**ඥානකාරක බුධ ග්‍රහයා 2020 සැප්තැම්බර් මස 02 වැනි දින 12.01ට සිය උච්ච මූලත්‍රිකෝණ ස්වක්ෂේත්‍ර රාශිය වන කන්‍යාවට පැමිණේ. විශේෂයෙන් තීක්ෂණ නුවණට සත්‍යවාදී බවට කතා ලීලාවට ශාස්ත්‍රීය නිර්මාණ පොත්පත් ග්‍රන්ථකරණයට ඉගෙනීමට ඉගැන්වීමට චිත්‍ර කර්මාන්තය හා කලා කටයුතුවලට ප්‍රධානවන බුධ සිය වාස භවන හා සමාන කන්‍යා රාශියට පැමිණීම රටේ සිදුවන බොහෝ කටයුතු සඳහා බුද්ධිමතුන්ගේ ඒකරාශි වීම කැපවීම හා ආශිර්වාදය හිමි වෙනු ඇත.**

මේ අතරම 2020 අගෝස්තු මස 16 වන දින 19.11ට රවි ග්‍රහයාද සිය ස්වක්ෂේත්‍ර රාශිය වන සිංහ රාශියට පැමිණීම කෙළින්ම රජය නියෝජනය වන සුබවාද සිදුවීම් රැසක් මෙන්ම රජය ශක්තිමත් වන ප්‍රතිසංස්කරණ රැසක් සිදුවීමට එය හේතු සාධක වන්නකි. කුම්භ ලග්නය වන ලංකා කේන්ද්‍රයට අනුව රවි 7 ට පැමිණීම විවිධ ප්‍රබල ජන කොටස්වල ඒකරාශිව රජයේ තීන්දු ක්‍රියාවට නැංවීමට සහාය වීමද සිංහ ලග්නය වන ජනරජ කේන්ද්‍රයේ රවි ලග්නගත වීමද රජයේ ඍජු තීන්දු තීරණ කඩිනමින් ක්‍රියාවට නැංවීමද ඒ සඳහා සැමගේ සුබවාදී එකඟතාව රජයට නොඅඩුව ලැබීමද ඒ තුළින් රජය බුද්ධිමත් ලෙස ඉදිරියට ක්‍රියා කටයුතු සම්පාදනය කරවීමට ද සමත් වනු ඇත. ඥානයෙන් කෙරෙන කටයුතු අතර විදුලි, තැපැල්, දුම්රිය ගමනාගමනය, නව සොයා ගැනීම්, තාක්ෂණික ඥානය, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා රටේ විනෝදාස්වාදය වෙනුවෙන් කෙරෙන කටයුතු හා සුබසාධන කටයුතු කෙරේද වඩ වඩාත් කැපවීමට මේ රවි - බුධ යහපත් රාශි සම්ප්‍රාප්තිය ඉවහල් වනු ඇත. විශේෂයෙන් නීති සම්පාදනය, අධ්‍යාපන, රටේ ප්‍රවාහන, ප්‍රවාහන තදබදය අවම කෙරෙන සැලසුම් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීමද ඒ සඳහා ආගමික සංහිඳියාව - ජනතා ප්‍රසාදය ද රජයට හිමි වීමෙන් රජයේ ප්‍රධානින් බුද්ධිමත් ලෙස සිය කටයුතු ඉදිරියට ගෙන යනු ඇත. මේ අනුව ශ්‍රී ලංකාව ලෝකයේ ඉහළම තැන වැජඹෙන රටක් බවට පත් කිරීමට තරම් සුදුසු පියවරයන් රැසක් ඉදිරි සති දෙක තුන අතර ක්‍රියාවට නැංවෙනු ඇත.

මේ අනුව බුධ රවි සංක්‍රමණය ලග්න අනුව රටට ජනතාවට බලපාන්නේ කෙසේද යන්න සලකා බලමු.

### මේෂ ලග්නය
#### වාසනාවන්ත දරු ඵල

මේෂ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව බුධ 06 ට රවි 5 ට පැමිණීම විදේශ ආයෝජන ව්‍යාපාර හා විවිධ ආර්ථික ප්‍රතිලාභ හිමිවන බව පෙනෙන්නට තිබේ. විශේෂයෙන් දරුවන් බලාපොරොත්තු වන අය සඳහා වාසනාවන්ත පුත්‍ර ඵලද හිමිවෙයි. බුධ විශේෂයෙන් වා, පිත්, සෙම් රෝග වලට හේතු සාධක වන ග්‍රහයකු බැවින් එබඳු රෝග කෙරෙන් ප්‍රවේශම් වීමට වග බලා ගන්න. විශේෂයෙන් සෙම වඩන ආහාර ඇසිඩ් ගතිය සහිත ආහාර අවම කර ශරීර සෞඛ්‍ය පිළිබඳව උනන්දු වියයුතු කාලයක් බව පවසමි. චන්ද්‍රයා ද මේ සතිය පුරාවට 10 - 11 - 12 යන ස්ථානවල ගමන් කිරීම වැටීම් තැලීම් වලටද හේතුවිය හැකිය. රුචක යෝගය හර්ෂා යෝගය ඔබට උදා කරයි.

### වෘෂභ ලග්නය
#### රැකියාවේ සුබවාදී වෙනසක්

වෘෂභ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව බුධ ග්‍රහයා 05 වැන්නේ සිටින අතර රවි 04 වැන්නේ සිට ඔබගේ රැකියාවේ සුබවාදී වෙනසක් ඇති කිරීමට සමත් වේ. තමා බලාපොරොත්තු වන වාහන ඉඩම් නිවාස මිලදී ගැනීමක් ද හදිසි ධනයක් අන්සතු දේපළක් හිමි වීමක්ද පෙනෙන්නට තිබේ. උෂ්ණ අධික ආහාර වලින් වැළකී සිටිය යුතු කාලයකි. තෙල් ආහාර අවම කිරීම සුබයි. නැතහොත් පපුවේ නහරගත කිසියම් අසාත්මිකතා මතු කිරීමට හේතු වනු ඇත. ඉදිරි සතියේ චන්ද්‍රයාගේ ගමන් මඟද ඒ රෝග සඳහා අත වනන බව පෙනෙන්නට තිබේ. සරල හා විමලා යන බලවත් යෝග දෙක ඔබට උදා කරයි.

### මිථුන ලග්නය
#### අන් අයගේ අතහිත

මිථුන ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව බුධ ග්‍රහයා 04 වැන්නට හා රවි ග්‍රහයා 03 වැන්නට පැමිණ සිටීම ඉතා වාසනාවන්ත පිහිටීමකි. කාලයක් ගැටලුවක්ව පැවති නීති ප්‍රශ්නයක් නිරාකරණය වනු ඇත. එසේම තම ඥාති පාර්ශ්වයෙන් එල්ල වුණු විරෝධතා සමනය වී බොහෝ දෙනා ඔබගේ සාර්ථකත්වයට අතහිත දෙනු ඇත. කිසියම් සැලසුම් සහගත ආයෝජනයකට ඔබගේ මනස ක්‍රියාවට නැංවෙන අතර ඒ තුළින් බොහෝ සම්පත් උදාවීමට ද හේතුවේ. හංස යෝගය යන බලවත් යෝගය ඔබගේ ලග්නයට අනුව උදා කරයි.

## නව නීති සම්පාදනයට බුද්ධිමතුන්ගේ එකඟතාව

### කටක ලග්නය
#### ධන සම්පත් උදාවේ

කටක ලග්නයට අනුව ඔබගේ කේන්ද්‍රයේ බුධ 03 වැන්නට හා රවි ග්‍රහයා 02 වැන්නට පැමිණ විශේෂයෙන් ධන සම්පත් උදා කිරීමට හේතු වෙයි. අන් අය සතු ඉඩම් මිල මුදල් ඔබට අයිති වීමේ බලය හිමිවේ. විශේෂයෙන් ඔබට හිමි වන්නට තිබී වෙනත් අයකු විසින් භුක්ති විඳිමින් පැවති ඉඩමක අයිතිවාසිකම නීතියෙන්ම ඔබට පැවරෙනු ඇත. ඒ සඳහා බොහෝවිට වැඩිහිටි පාර්ශ්වයෙන් ඇප උපකාරද ලැබේ. ඔබගේ ලග්නයට අනුව රුචක යෝගය හා හර්ෂ යන බලවත් යෝග දෙක ඔබට උදා කරයි.

### සිංහ ලග්නය
#### රාජ තාන්ත්‍රික උපකාර

සිංහ ලග්නය හිමි ඔබගේ කේ වැන්නේ ද රවි ග්‍රහයා 01 වැන්නේ ද යෙදෙමින් සිතේ බලවත් සතුට ශක්තිය උදා කරමින් සැලසුම් සහගත ධනයකට හිමිකම් කීමට ඔබට හැකි වේ. රාජ තාන්ත්‍රික උපකාර හා තමාගේ ඥානකාරකත්වය උපක්‍රමශීලි ක්‍රියාමාර්ග නිසා බොහෝවිට එබඳු යහපත්කම් රැසකට සුදුසු මං සැලසේ. කෙසේ නමුදු හිසේ තදබල වේදනාවක් සෙම් කෝප වීමක් වීමට ඉඩ තිබෙන නිසා රාත්‍රී කාලයේ ස්නානය සෙම වඩන අතර සුදුසු නොවන බව පවසමි. ඔබගේ ලග්නයට අනුව හර්ෂ නම් බලවත් යෝගය ඔබට උදාවනු ඇත.

### කන්‍යා ලග්නය
#### බොහෝ දෙනාගේ ප්‍රසාදය

කන්‍යා ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව බුධ ග්‍රහයා ලග්න ගතවීමද රවි 12 වැන්නට පැමිණ සිටීමද නිසා බොහෝ විට එදිනෙදා කටයුතු කෙරෙන් සතුට අභිවෘද්ධිය ද ශාස්ත්‍රීය කලා අංශ කෙරෙන් සුබවාදී ජයග්‍රහණ ද හිමි වෙයි. බොහෝ දෙනාගේ ප්‍රසාදය හිමි වනු ඇත. ඔබ කරන කටයුතු අන් අයගේ ඇගයීමට ලක්වන අතර ඒ සඳහා සුදුසු මිලක් වටිනාකමක් ද හිමි වේ. විශේෂයෙන් පාදයේ වළලුකර ආශ්‍රිත උවදුරු එළඹිය හැකි නිසා ප්‍රවේශම් වන්න. ඔබගේ ලග්නයට අනුව හංස යෝගය, සරලා යෝගය හා විමලා යෝගය නම් බලවත් යෝග ත්‍රිත්වය ඔබට වාසනාව ගෙන එයි.

### තුලා ලග්නය
#### යහපත් ආර්ථික වාසියක්

තුලා ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව බුධ ග්‍රහයා 12 වැන්නට පැමිණීමත් රවි ග්‍රහයා 11 වැන්නට පැමිණ තිබීමත් නිසා යහපත් ආර්ථික වාසියක් ඔබට හිමිකර දෙයි. පිටරටක සිටින අයකු වෙතින් එම වාසිය ඔබට ලැබෙන අතර ලොතරැයි දිනුම් තරග විභාග වලින් ජයග්‍රහණ යනාදියට හේතු වෙයි. තමා කලක් සැලසුම් කරගෙන ආ ආයෝජන කටයුත්තකට අත ගැසීමට ඔබට ශක්තිය හා අන් අයගේ ඇප උපකාර ලැබෙනු ඇත. විශේෂයෙන් තුලා ලග්නය හිමි ඔබට සස යෝගය විමලා යෝගය යන යෝග යුගළ ඔබගේ ඉදිරි සාර්ථකත්වයට මනා පිටිවහලක් වනු ඇත.

### වෘශ්චික ලග්නය
#### ස්වඋත්සාහයෙන් ඉදිරියට

වෘශ්චික ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව බුධ ඔබගේ කේන්ද්‍රයේ 11 වැන්නට පැමිණීමත් රවි 1 වැන්නට පැමිණ සිටීමත් නිසා විශේෂයෙන් ධන කාරකත්වය මනාව ඔපුප් කරන පිහිටීමකි. විශේෂයෙන් රැකියාව, විවාහය හා ආර්ථික ප්‍රවර්ධනයට බාධා

## රජයේ ඍජු තීන්දු තීරණ පිළිබඳ ජනතාවගේ ප්‍රසාදය

පැමිණි යුගය අවසන් කරමින් බොහෝ මාර්ග රැසක් ඔබගේ දියුණුවට විවෘත කරදෙයි. තමා ස්ව උත්සාහයෙන් කරගෙන ආ ව්‍යාපාර කටයුතු නව මං ඔස්සේ ඔබට කරගෙන යාමට ශක්තිය උදා කෙරෙනු ඇත. වෘශ්චික ලග්නයට අනුව හර්ෂ යෝගය නම් බලවත් යෝගය ඔබට උදාකර දෙනු ඇත.

### ධනු ලග්නය
#### දේපළ අයිතියක්

ධනු ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව බුධ ග්‍රහයා 10 වැන්නට පැමිණෙන අතර රවි ග්‍රහයා 09 වැන්නට පැමිණ තිබීම නිසා ඉතා ප්‍රබල පුණ්‍ය මහිමයක් ඔබ වෙත ළඟා කර දෙනු ඇත. ඔබ විසින් මීට පෙර කර තිබූ ආයෝජනයක ප්‍රතිලාභ හෝ ඔබට අයිති වීමට තිබූ දේපළක උරුමය නොඅඩුව ඔබට ලැබෙනු ඇත. තවද තම පිය පාර්ශ්වයේ උරුමයක් මෙන්ම තමාට කලක් අවහිරයක්ව තිබූ නීති ගැටලුවක් ලිහිල්ව ගොස් අහිමි වී තිබූ ආර්ථික ප්‍රතිලාභයක් ඍජුවම ඔබට හිමි වනු ඇත. ධනු ලග්නයට අනුව හංස යෝගය හා හර්ෂ යෝගය නම් බලවත් යෝග දෙක ඔබට යහපත පිණිස උදා වෙයි.

### මකර ලග්නය
#### පෙර පින් මතු කෙරේ

මකර ලග්නයට අනුව ඔබගේ කේන්ද්‍රයේ බුධ 09 වැන්නට පැමිණීමද රවි 08 වැන්නට පැමිණ සිටීමද පෙර පින් මහිමය මතු කරන අපූර්වතම පිහිටීමකි. තමාගේ යහපත් කල්ක්‍රියාව බොහෝ දෙනාගේ ප්‍රසාදයට ඇගයීමට ලක්වන බව පෙනෙන්නට තිබේ. ඔබගේ චින්තනය දියුණු වී පෙර ආත්මයේ පටන් පැවත ආ කුසලතාවක් මේ වකවානුව තුළ විශේෂයෙන් කැපී පෙනෙන අන්දමින් උද්දීපනය වේ. චිත්‍ර, සංගීත හා වෙනත් නිර්මාණශීලී කටයුතු මෙසේ ප්‍රචලිත වීමට කරුණු යෙදෙනු ඇත. ඔබගේ ලග්නයට අනුව රුචක යෝගය, සස යෝගය, සරල යෝගය සහ විමලා යෝගය යන යෝග හතරම ඔබට යහපත පිණිස යෙදේ.

### කුම්භ ලග්නය
#### විවාහ කටයුතු සඳහා පසුබිම

කුම්භ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව බුධ 08 වැන්නට එතරම් සුබ නොවුවද දැනට රවි 07 වැන්නේ ප්‍රබලව යෙදී සිටින නිසා කල්ගිය විවාහ කටයුතු සඳහා සුදුසු කාලය එළඹීමකි. වෙන්වූ විවාහ සහකරු හෝ සහකාරිය නැවත ඔබ සොයා එනු ඇත. අවිවාහක අයට මංගල යෝජනා සම්මත වේ. බුධ විසින් ඔබට උගුරේ සෙම පපුවේ හතිය ගෙන එන නමුත් සෙම වඩන ආහාර අවම කිරීම අවේලාවේ ස්නානය අවම කිරීම තුළින් එම අපහසුතා මගහරවා ගැනීමට ඔබට හැකිවෙයි. සරලා යෝගය විමලා යෝගය යන යෝග දෙක ඔබට යහපත ගෙන ඒමට සමත් වෙයි.

### මීන ලග්නය
#### සිතේ සතුට

මීන ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව බුධ ග්‍රහයා 07 වැන්නට පැමිණ සිතේ සතුට උපදවන කරුණු රැසකට මඟ පාදයි. කලක් ඔබ වෙතින් ඈත්ව සිටි බොහෝ දෙනෙකු ඔබ සමඟ සබැඳියාවෙන් කටයුතු කිරීමට එක්වේ.

විභාගාදි කටයුතු වලින් ජය හිමිවේ. රැකියා සම්මුඛ පරීක්ෂණ ආදියේ ජයග්‍රහණ ඔබට හිමි කර දෙයි. විශේෂයෙන් ඔබ ප්‍රවේශම් විය යුත්තේ යටිබඩ ආශ්‍රිතව සිදුවිය හැකි අසාත්මිකතාවන්ගෙනි.

සැර උෂ්ණ ආහාර පානාදියෙන් වැළකී උපරිම වතුර පානය ඇඟ නිවෙන ආහාරපාන ගැනීම සුදුසු වෙයි.

ඔබගේ ලග්නයට අනුව භද්‍ර යෝගය, හංස යෝගය, හර්ෂ යෝගය ඔබට උදාකරමින් ඉදිරියට යහපත් කෙරේ.

## ‘මහත්මා@ගාන්ධි.කොම්’ අපේ කාලයේ වේදිකා නාට්‍යය




මහාත්මා ගාන්ධිතුමාගේ 150වන ජන්ම ශත සංවත්සරය වෙනුවෙන් සිංහල වේදිකාවට ගෙන එනු ලැබූ පර්යේෂණාත්මක අනුවර්තනයක් වන ‘මහත්මා@ගාන්ධි.කොම්’ නාට්‍යයේ තවත් මහජන දර්ශනයක් ටවර් රඟහල පදනම විසින් සංවිධානය කෙරෙන ‘ප්‍රේක්ෂා’ නාට්‍ය මහෝත්සවයට අදාළව අගෝස්තු මස 30 වැනි ඉරිදා දින මරදාන ටවර් රඟහලේදී සවස 3:30ට සහ 6:30ට පැවැත්වේ.

වසන්ත විට්ටච්චි මහත්මා ගාන්ධිගේ චරිතය නිරූපණය කරන අතර උදිත ගුණරත්න, මාලී ජයවීරගේ, උදේනි චන්ද්‍රසිරි, ප්‍රභා සඳසීලී, තරංග බණ්ඩාර, ඉන්දික ප්‍රභාත්, අනුත්තරා එදිරිවීර, උපුල් මහානාම, චන්න කුලරත්න, සම්පත් බණ්ඩිහෙට්ටි, රොෂාන් හඳුන්නෙත්ති, චරිත් මධුරංග, හසිත් වෙත්තසිංහ, ප්‍රසන්න රෝහිත, වත්සලා සමරකෝන් අනෙක් චරිත නිරූපණ සඳහා දායක වෙති.

නර්තන වින්‍යාසයෙන් සුවිනීතා පෙරේරා, රංගවස්ත්‍ර නිර්මාණයෙන් තිළිණ ලක්ෂාන් හෙට්ටිගමගේ, වේදිකා ආලෝකකරණය සහ ශබ්ද පරිපාලනයෙන් මිහිඳු මධුශංඛ, වේදිකා පසුතල නිර්මාණයෙන් රොහාන් සමරදිවාකර, අංගරචනයෙන් වසන්ත විට්ටච්චි සහ උපුල් මහානාම, රංගභූමි පාලනයෙන් චරිත් මධුරංග සහ රොෂාන් හඳුන්නෙත්ති, සහාය අධ්‍යක්ෂණයෙන් විමල් දේශප්‍රිය යන අය දායක වෙති.

මෙහි පරිවර්තනය, අනුවර්තනය, සංගීතය, නිෂ්පාදනය සහ අධ්‍යක්ෂණය කැලණිය විශ්වවිද්‍යාලයේ හින්දී අධ්‍යයනාංශයේ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උපුල් රංජිත් හේවාවිතානගමගේ විසින් සිදු කර ඇත.

## අනුදි නිසල්යාගේ දෙවැනි කවිපොත දොරට වැඩුම 30දා



යොවුන් කිවිඳියක වූ අනුදි නිසල්යා වීරසිංහගේ දෙවැනි කාව්‍ය සංග්‍රහය ‘ඉති මතම මල් කෙඳිති’ දොරට වැඩුම මේ මස 30දා (ඉරිදා) ප.ව. 3.30ට ජාතික පුස්තකාල සේවා ශ්‍රවණාගාරයේදී පැවැත්වේ.

සම්මානිත මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර ශූරීන් මුලසුන හොබවන මේ සාහිත්‍ය කතිකාවේ ප්‍රමුඛ දේශනය ප්‍රවීණ කිවිවර මහින්ද ප්‍රසාද් මස්ඉඹුලගෙනි. ප්‍රවීණ සිනමාවේදී සතිස්චන්ද්‍ර එදිරිසිංහ, කිවිවර තිඹිරියාගම බණ්ඩාර, ආචාර්ය හරිස්චන්ද්‍ර විජේතුංග මහත්වරු ඇතුළු පිරිසක් ද මේ අවස්ථාවට ඇරියුම් ලැබ සිටිති.

‘ඉති මතම මල් කෙඳිති’ කඩවත කඩුල්ල ප්‍රකාශනයකි.

## සමන් ආතාවුදගේ යූ ටියුබ් නාළිකාව ඇරඹේ




නිර්මාණවේදී සමන් අතාවුදහෙට්ටිගේ යූ ටියුබ් නාළිකාව saman4you සැප්තැම්බර් 1 දා ආරම්භ වේ. සයිබර් අවකාශයේ රස, නැණ, ගුණ වඩවමින් ප්‍රේක්ෂකයාට උසස් රසවින්දනාත්මක අත්දැකීමක් ශේෂ කරලීම saman4you හි අරමුණයි. විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන විද්වතුන් හා වෘත්තිකයන්ගේ සහභාගීත්වයෙන් නව ආකෘති ඔස්සේ සම්පාදනය කෙරෙන මේ වැඩසටහන් මගින් මෙතෙක් නොවිඳි යූ ටියුබ් රසයක් ඔබට දායාද කෙරෙනු ඇත.




සැකසුම: හර්ෂා සුගතදාස

**පිළිතුරු සැපයීම :-**
**කායික රෝග විශේෂඥ වෛද්‍ය**
**වරුණ ගුණතිලක**

## ● යකඩ පෙති පාවිච්චිය සුදුසුද?



**ප්‍රශ්නය :-** මම අවුරුදු 40ක විවාහක කාන්තාවකි. මට දැනෙන අධික තෙහෙට්ටුව සමඟ වෛද්‍යවරයාගෙන් රුධිර පරීක්ෂාවක් කර ගන්නා ලෙස උපදෙස් ලැබිණි. එම රුධිර පරීක්ෂණ වාර්තා අනුව මගේ හිමොග්ලොබින් මට්ටම 8.1 කි. ඉන්පසුව Blood picture, culture වැනි පරීක්ෂණ කීපයක් සිදු කළ අතර හිමොග්ලොබින් අඩු වීමට හේතුව මන්දපෝෂණය නොවන බව ඒවායින් කියැවිණි. නැවතත් හිමොග්ලොබින් අඩු වීමට හේතුව සොයා ගැනීම සඳහා විවිධ පරීක්ෂණ සිදු කළත් ඒවායින් විශේෂ දෙයක් සොයා ගැනීමට නොහැකි විය. සාමාන්‍ය මට්ටමේ පැවතිණි.

අවසානයේදී තැලසීමියා පරීක්ෂණයක් ද සිදු කරන ලදී. එහෙත් එවැනි රෝගයක් හඳුනා ගත හැකි වූයේ ද නැත. දැන් සියලු පරීක්ෂණ නවතා දමා හිමොග්ලොබින් වර්ධනයට යකඩ පෙති පාවිච්චි කරමි. ඔබගෙන් උපදෙසක් බලාපොරොත්තු වෙමි.

**මෝදර - රසිකා නිමාලි සල්ගාදු**

**පිළිතුර :-** යකඩ පෙති ගැනීම තාවකාලික පිළියමක් පමණි. ඔබේ හිමොග්ලොබින් අඩු වීමට හේතුව නියත වශයෙන් සොයා ගත යුතුය. ඔබට සිදු කළ විවිධ පරීක්ෂණවලින් රෝගයක් හඳුනා ගෙන නැති වුවත් තවදුරටත් පරීක්ෂණ සිදු කිරීම අවශ්‍ය වන්නේ හිමොග්ලොබින් අඩු වීමට හේතුව නිශ්චිත වශයෙන් හඳුනා ගත යුතු නිසාය. සමහරවිට ඇට මිදුළුවල රතු රුධිරාණු නිපදවීම අඩුවීම, යකඩ අවශෝෂණය අඩු වීම, අධික රුධිර වහනය වැනි හේතු නිසාද හිමොග්ලොබින් අඩු විය හැකිය. එබැවින් කායික රෝග විශේෂඥ වෛද්‍යවරයකු හමු වී අනිවාර්යයෙන්ම හිමොග්ලොබින් ප්‍රමාණය අඩු වීමට බලපාන හේතුව සොයා ගැනීම ඉතා වැදගත් වේ.

## ● නිතරම කුද්දැටි එනවා

**ප්‍රශ්නය :-** මම 43 හැවිරිදි විවාහක පිරිමියෙකි. මගේ කිහිලිවල සහ ඉකිලිවල නිතරම කුද්දැටි හට ගනී. තුවාල කිසිවක් නැතත් කුද්දැටි ඇති වේ. බෙහෙත් ගත් විට සුව වේ. නිතර නිතර කුද්දැටි හට ගන්නේ ඇයි?

**රදාවාන - ජගත් රෝහණ ජයරත්න**



**පිළිතුර :-** නිතර නිතර කුද්දැටි හට ගැනීම සාමාන්‍යයෙන් බැහැර කළ යුතු කාරණයක් නොවේ. තුවාලයක් නැතිවත් කුද්දැටි ඇති වන්නේ නම් කුද්දැටි ආශ්‍රිත රෝගී තත්ත්වයක් විය හැකිය. සමහරවිට ශරීර අභ්‍යන්තරයේ කුද්දැටි ඉදිමීමක් තිබේදැයි කියා පරීක්ෂා කර බැලිය යුතුය. ඇතැම් විට වසා ග්‍රන්ථීන් ආශ්‍රිත රෝගී තත්ත්වයක් විය හැකි වුවත් ඔබ එවා ඇති විස්තර අනුව එය ද නිශ්චිතව පැවසිය නොහැකිය. එබැවින් හැකි ඉක්මණින් කායික රෝග විශේෂඥ වෛද්‍යවරයකු හමුවන්න. මෙය කුමන හෝ රෝගයක ලක්ෂණයක් විය හැකි නිසා සැලකිලිමත් වීම ඉතා වැදගත් වේ.

## ● අස්ථි දිරා යන නිසා බෝනික්කකු මෙන් සිටිය යුතුද?

**ප්‍රශ්නය :-** මම 62 හැවිරිදි විවාහක කාන්තාවක්මි. මට ඉතා දරුණු ආකාරයට ඇදුම හා හතිය ඇත. වසර 10කට වැඩි කාලයක් මම ඇදුම රෝගයෙන් පීඩා විඳිමි. මම ඒ සඳහා රෝහලේ සායනික ප්‍රතිකාර ලබා ගනිමි. මෙම ප්‍රතිකාරවලදී මට ප්‍රෙඩ්නිසොලෝන් ඖෂධය ලබා දී තිබුණි. කෙසේ හෝ දැන් මගේ අස්ථි දිරා ඇත. අස්ථි දිරාපත් වීම නිසා වේදනාවක් ද ඇත. අස්ථි සම්බන්ධ විශේෂඥ වෛද්‍යවරයකු හමු වූ අතර ඔහු පැවසුවේ මට ඉතා ප්‍රවේශමෙන් කාලය ගත කළ යුතු බවයි. මගේ ශරීර කූඩුව ලාම්පුවේ මැන්ටලයක් වැනි යැයි පැවසූ එම වෛද්‍යවරයා, ගමන් බිමන් යෑමේදී වාහනයේ ආසනයට කොට්ට දමාගෙන යා යුතු බව උපදෙස් දුන්නේය. මගේ අස්ථි දිරායෑමට හේතුව දීර්ඝ කාලයක් මුළුල්ලේ ප්‍රෙඩ්නිසොලෝන් ඖෂධය ගැනීම බව වෛද්‍යවරයා පැවසීය. මම දැන් බෝනික්කකු සේ නිවසට වී කාලය ගත කරමි. ඇදුම රෝගය සහ අස්ථි දිරා යෑමෙන් පීඩා විඳින මම වෛද්‍ය උපදෙසක් බලාපොරොත්තු වෙමි.

**දැලතුර - ශ්‍රියානි ජයමාන්න**

**පිළිතුර :-** ඔබට දී ඇති ප්‍රෙඩ්නිසොලෝන් ස්ටීරොයිඩ් කාණ්ඩයේ ඖෂධයකි. මෙම ඖෂධය දිගුකාලීනව භාවිත කිරීමේදී ඔස්ටියෝපොරෝසිස් ඇති විය හැකිය. ඒ සමඟම අස්ථි වේදනාව නිසා ඔස්ටියෝ ආතරයිටිස් ඇති විය හැකිය. ප්‍රෙඩ්නිසොලෝන් ඇදුම හා හතියට ලබා දෙන ඖෂධයකි. එම ඖෂධය ඔබට ලබා දී තිබෙන්නේ එබැවිනි.

ඔබේ වයස අනුව ස්වාභාවිකව අස්ථි දිරායෑමේ තත්ත්වයක් ඇති වීම ද වැළැක්විය නොහැකිය. සාමාන්‍යයෙන් කාන්තාවන්ගේ ඔසප් වීම නැවතීමත් සමඟ අස්ථි දිරායෑම ඇරඹෙයි. ඔබට අස්ථි දිරායෑම ඇති වී තිබෙන්නේ ප්‍රෙඩ්නිසොලෝන් ඖෂධය නිසා පමණක් නොව ඔබේ වියපත්භාවය නිසා ද විය හැකිය. දැන් ඔබ කළ යුතු වන්නේ කායික රෝග විශේෂඥ වෛද්‍යවරයකු හමු වී ඔස්ටියෝ ආතරයිටිස් නිසා ඇති වන ගැටලුවලට ප්‍රතිකාර ගැනීමයි. ඔබ නිවසේ පුටුවක වාඩි වී බෝනික්කකු සේ නොසිටින්න. එය අස්ථි දිරායෑම තව තවත් වේගවත් කරයි. වෛද්‍ය උපදෙස් අනුව තම සීමාවන් තුළ සිටිමින් චලන ක්‍රියාවන් හී යෙදෙන්න. චලන ඉරියව් නොමැති වීමෙන් ඔබේ රෝගී තත්ත්වය තවතවත් උත්සන්න විය හැකිය.





කඳුරුගොඩ ස්තූපය

# උතුරේ බෞද්ධ උරුමයක් වූ කඳුරුගොඩ වෙහෙර



**● රුක්ෂිලා වෙත්තමුණි**

**කදුරුගොඩ විහාරය පිහිටි කන්තරෝඩයට ළඟාවීමට යාපනය-කන්කසන්තුරේ මාර්ගයේ චුන්නාකම් හන්දිය (හුණුගම) දක්වා ගමන් කළ යුතුය. එමෙන්ම පලාලි සිට කන්කසන්තුරය මාර්ගයේ පැමිණ මාවඩ්ඩිපුරම් කෝවිල අසලින් හැරී ගම්මාන මැදින් සැතපුම් කිහිපයක් ගමන් කළ පසු මෙම කදුරුගොඩ විහාරයට පිවිසිය හැකිය.**

**පාචීනාරාමය ලෙස සඳහන් වන්නේ කදුරුගොඩ විහාරය බව ඇතැමුන්ගේ අදහසයි**

**ආචාර්ය පෝල්. ඊ. පීරිස් විසින් 1917 දී කන්තරෝඩය සම්බන්ධව ප්‍රථම කරුණු දැක්වීම හා කැණීම සිදු කරයි**

**ආචාර්ය ශිරාන් දැරණියගල කදුරුගොඩ සම්බන්ධව අදහස් දැක්වීමේදී ප්‍රකාශ කරනුයේ මෙය ලංකාවේ හතරවැනි මානව ජනාවාස පෙදෙස නියෝජනය කරන බවයි**

කන්දරෝඩෙයි (කන්තරෝඩය) පිළිබඳව විවිධ මතවාද පවතින අතර මහාවංශයට අනුව සංඝමිත්තා තෙරණියගේ ලංකා ගමන හා සම්බන්ධ වේ. එනම් ලක්දිවට වැඩි මහරහතන් වහන්සේලා 60 නමක් මෙම පෙදෙසේ වැඩවාසය කළ හෙයින් උන්වහන්සේලා අපවත් වීමෙන් අනතුරුව එම ශාරීරික ධාතු නිදන්කොට මෙහි ස්තූප 60 ක් ඉදි කළ බව සඳහන්ය.

අක්කර 72 ක් පමණ වූ භූමි ප්‍රමාණයක් රක්ෂිත කලාපයක් ලෙස බ්‍රිතාන්‍යයන් විසින් එකල වෙන්කරනු ලැබීය. කදුරුගොඩ යන වචනයේ කදුරු (කඳුරු) යනු පාලි කන්දර නාමයට සමාන වූවකි. දියලු බිමක්, දිය ඇළක් යන අර්ථයක් ඉන් කියැවේ. දිය ඇළක් අසල ගොඩැල්ලක පිහිටි විහාරයක් යන්න මින් අදහස් වේ යැයි පැවසේ. ඒ අනුව කන්තරෝඩ වූයේ මෙම වචනයයි යන්න එල්ලාවල මේධානන්ද හිමි දක්වා ඇත. කන්දර කුඩ්ඩෙ යනුවෙන් පෘතුගීසි ලේඛනවල මේ ස්ථානය හඳුන්වයි. එය කදුරුගොඩ යන සිංහල වචනයේ පෘතුගීසි උච්චාරණය ලෙස සැලකේ. ඇතැමුන්ගේ අදහස වන්නේ මහනුවර යුගයේ රචිත විහාර හා පුදබිම් නාමාවලිය වන "නම් පොත" හෙවත් "විහාර අස්න" හි විස්තරය අනුව පාචීනාරාමය, ලෙස සඳහන් වන්නේ කදුරුගොඩ විහාරය බවය.

එවකට යාපනයේ දිස්ත්‍රික් විනිසුරු වූ ආචාර්ය පෝල්. ඊ. පීරිස් විසින් 1917 දී කන්තරෝඩය සම්බන්ධව ප්‍රථම කරුණු දැක්වීම සිදු කරනු ලැබූ අතර ඔහු මෙම භූමිය 1940 දී කැණීම් කරනු ලැබීය. විටින් විට විවිධ කාලවලදී මෙම ස්ථානයේ කැණීම් කටයුතු සිදුකර ඇති අතර එහිදී මතුකරගත් පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් නටබුන් අතර දුර්ලභ කවන්ධ බුදු පිළිමයක කොටස් ද හමුවිය. 1970 දශකයේ දී ඇමෙරිකාවේ පෙන්සිල්වේනියා විශ්වවිද්‍යාලයේ ආචාර්ය විමලා බෙග්ලි එක්ව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද කැණීමේ දී කානේලියන් පාෂාණයෙන් නිම වූ මුද්‍රාවක් හමු වූ අතර එහි මුද්‍රාවෙන් අශ්වාරෝහකයෙක් නිරූපණය කොට ඇත. ඊට අමතරව අක්ෂර සහිත මැටි බඳුන් කැබැල්ලක් සොයාගන්නට හැකිවිය. මෙම වළං කැබැල්ල හමු වූ ස්ථානය ඔවුන් නම් කරනු ලැබූයේ KTDA 14 ලෙසින්ය. මෙය සහයෝගිතා කැණීම් පර්යේෂණයක් විය.

විමලා බෙග්ලිගේ කැණීම් වාර්තාවේ කන්තරෝඩය, බෞද්ධගාමික නටබුන් සහිත භූමියක් ලෙස සඳහන් කොට ඇති අතර පොළෝ මට්ටමින් අඩි 12 ක් පමණ ගැඹුරින් ප්‍රාග් ඓතිහාසික අවශේෂ ලැබුණු බව ද සටහන් කර ඇත. මෙමගින් මුල් අවදියේ යකඩ යුගයේ සාධක ද දෙවන අවදියේ දී පූර්ව ඓතිහාසික සංස්කෘතික මෙවලම් ද තෙවැනි අවදියේ දී රූලේටඩ් මැටි බඳුන්, ලක්ෂ්මි කාසි, කොරල් කැබලි ද හමු වූ අතර සිව්වන අවදියේ දී බෞද්ධ නටබුන්හි සාධක ද ලැබුණු බව සඳහන්ය.

මෙහි දී සොයා ගත් අක්ෂර සහිත මැටි බඳුන් කැබැල්ල (වළං) බ්‍රාහ්මී අක්ෂර වලින් යුක්ත වූවකි. රූලේටඩ් වර්ගයේ වළං කැබැල්ලක් වූ මෙය එවකට යාපනය දිස්ත්‍රික්කයෙන් සොයාගත් පැරණිම අක්ෂර සහිත සලකුණ විය. මෙවැනි බ්‍රාහ්මී අක්ෂර සහිත වළං කැබැල්ලක් අනුරාධපුර ඇතුළු නගරයේ කළ කැණීමේ දී ද සොයා ගනු ලැබීය. එය ක්‍රි.පූ. 8 ට අයත් යැයි ආචාර්ය ශිරාන් දැරණියගලගේ අදහසයි.

කන්තරෝඩයෙන් හමු වූ මෙම වළං කැබැල්ලෙහි බ්‍රාහ්මී අක්ෂර 6 ක් සලකුණු කොට ඇත. මෙහි ප්‍රථම අක්ෂරය "මා" ලෙස හඳුනාගෙන ඇති අතර ආචාර්ය සද්ධාමංගල කරුණාරත්නගේ අදහස වූයේ එය සංකේතයක් යන්නය. මෙම සලකුණු අනුරාධපුරයෙන් හමු වූ අක්ෂර සලකුණුවලට සමානත්වයක් දරන බව විද්වතුන්ගේ මතයයි. තෝනිගල, පරමාකන්ද, පෙරියපුලියන්කුලම හා නැට්ටුකන්ද ආදි ස්ථාන වල පිහිටි ශිලා ලිපි අතර ද මේ හා සමාන සංකේත දක්නට ඇති බව සඳහන්ය. 1973 දී යාපනය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය කේ. ඉන්ද්‍රපාල විසින් කන්තරෝඩයෙන් හමු වූ වළං කැබැල්ලේ ඇති අක්ෂර වලින් "දතහපත" ලෙස අර්ථ ගැන්වෙන බව ප්‍රකාශ කරයි.එනම් දාඨාගේ (දතහපත) පාත්‍රය යන්න අදහසයි. මෙහි පාත්‍රයේ අයිතිකරු දත්තය. ඔහු ගිහියෙක් ද පැවිද්දෙක් ද යන්න නිශ්චිත නැත. දත්ත විසින් පුදන ලද පාත්‍රයක් විය හැකිය යන්න අදහසයි. මෙම කාල වකවානුවේ දී සෙල්ලිපි වල දක්නට ලැබෙන දතහ ලෙණෙ, ශමුදහ ලෙණෙ වැනි වචන වලින් ඒ බැව් ගම්‍ය වන බව කියැවේ.

පුරාවිද්‍යා කොමසාරිස් වූ ආචාර්ය චාල්ස් ගොඩකුඹුරේගේ ප්‍රධානත්වයෙන් 1965 - 1968 අතර කාලයේ දී සිදුකළ කැණීම් මගින් ඉතා වැදගත් සාධක මතුකර ගැනීමට හැකි විය. එහි දී ස්තූප 21 ක් නිරාවරණය කරගත් අතර ස්තූප 36 ක පාදම් මතුකර ගනු ලැබීය. මෙහි හමු වූ ස්තූප අතරින් විශාලම ස්තූපය වට අඩි විසිතුනහමාරක් වූ අතර කුඩාම ස්තූපය වට අඩි හයක් විය. මෙහි දී විද්‍යාමාන වන සියලු ස්තූප එකම ආකෘතියක ලක්ෂණ දැරීය. එමෙන්ම මෙහි හර්මිකා කිහිපයක් ද සොයා ගනු ලැබීය. ගරාදි වැට ඉන්දියාවේ සාංචි ස්තූපයේ සේ මනා ලෙස නිර්මාණය කර ඇත. වළලු නමයක ඡත්‍රාවලියක් හමු වූ බවත් ඡත්‍රය සවිකර තිබූ බවට එහි ඇති සිදුර සාක්ෂි සපයයි. මෙවැනි ස්තූප සමූහයක් එකම ස්ථානයකින් හමු වූ ප්‍රථම අවස්ථාව ලෙසට එල්ලාවල මේධානන්ද හිමි කඳුරුගොඩ විහාරය නම් කරනු ලබයි. කැණීමෙන් අනතුරුව ස්තූප කිහිපයක් පෙර පැවති තත්ත්වය උපකල්පනය කොට තහවුරු කර ඇත. එම තහවුරු කළ වර්ෂ ස්තූප පාදමේ 1975 සහ 1976 ලෙස සටහන් කොට තිබේ. මේ ස්තූප නිර්මාණ කාලය අනුව අනුරාධපුර යුගයේ මුල් කාලයට අයත් යැයි සැලකේ. පූජා භූමියෙන් හමු වූ කැටයම් රහිත සඳකඩ පහණ, පාද ලාංඡන ශිලා ඵලක හා ගඩොළු පැරණිම යුගය නියෝජනය කරයි.

මෙම කැණීම් අවස්ථාව වන විට පැරණි ගොඩනැගිල්ලක කණු පාදම්ගල් රැසක් දක්නට ලැබුණු බව සඳහන්ය. කැණීමේ දී හමු වූ පුරාවස්තු අතර හුණුගලෙන් කළ කොත් පියන් රහිත ගල් කරඩු, බුදුපිළිම හතරක කොටස්, ලා කොළ පැහැති වීදුරු කොතක්, කුඩා වාමන රූපයක්, ගල් ගරාදි වැටක කොටසක්, පූර්ණ සට සහිත මුරගල්, පාද ලාංඡන ශිලාඵලක, බෝධිසත්ව හිසක්, වර්ණ ගැන් වූ දාර සහිත උළු, විවිධ පබළු වර්ග 26 000 පමණ , වළං හා පාත්‍රා කැබලි, සෙල්ලිපියක කොටසක්, උළු කැබලි විශාල ප්‍රමාණයක් ද, පළමු පැරකුම්බා, සහස්සමල්ල, ලීලාවති ආදි රාජ්‍ය කාලයන්ට අයත් හා විවිධ කාසි වර්ග ද දැක්විය හැකිය. පූර්ව අනුරාධපුර සමයේ සිට ක්‍රි.ව. 910 අතර කාල වකවානුවට අයත් පුරාවස්තු මෙම කැණීම තුළින් මතුකර ගැනීමට හැකිවිය. එසේම 1615 දී නිකුත් කළ පළමු වන ජෝර්ජ් රජුගේ තුට්ටු භාගයේ කාසියක් ද මෙම ස්ථානයෙන් හමුව ඇත.

එල්ලාවල මේධානන්ද හිමි විසින් රචනා කරන ලද "නැගෙනහිර පළාත හා උතුරු පළාතේ සිංහල බෞද්ධ උරුමය" නම් වූ ග්‍රන්ථයේ කදුරුගොඩින් හමු වූ ශිලා ලේඛනය පිළිබඳව කරුණු අන්තර්ගත කොට තිබේ. මෙම සෙල්ලිපිය අත්තාණි කණුවක කොටසක් ලෙස සටහන් කරන අතර එය ක්‍රි.ව. 10 වන සියවසට අයත් සිංහල අක්ෂරයෙන් ලියන ලද්දකි. කණුවේ පැති තුනක අක්ෂර කොටා ඇත. අඩි දෙකයි අඟල් හතක් පමණ උසකින් යුත් මෙම ටැම් ලිපියේ මුදුනේ නෙළුම් මල් කැකුළු රූරා වැටෙන අයුරින් නිරූපණය කර ඇත. එමෙන්ම එක් පසෙක ධර්ම චක්‍රය සලකුණු කර තිබේ. ලිපියේ අන්තර්ගතය අනුව බෞද්ධ සිද්ධස්ථානයකට ලබාදුන් වරප්‍රසාද සහිත රාජාඥාවක් බව අවබෝධ වේ. ඔකාවස් රජ පරම්පරාවෙන් පැවත එන රුහුණු හා මායා යන දෙරටෙහි අධිපති ලෙස මෙහි සඳහන් රජුව හඳුන්වා ඇත. ලිපියේ සඳහන් භාෂාව අනුව 4 වන කාශ්‍යප (ක්‍රි.ව. 898-914) රජුගේ ආඥාවක් යැයි නිගමනය කෙරේ. වර්තමානයේ දී මෙම කදුරුගොඩ ටැම් ලිපිය යාපනය කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇත.


මේ ලිපියේ අක්ෂර අතර කුඩා අක්ෂර වලින් ලියා ඇතැයි සැලකෙන ලිපියක් මහාචාර්ය සෙනරත් පරණවිතාන විසින් කියවා ඇති අතර එය 15 වන සියවසට අයත් යැයි කියැවේ. එය සුමංගල නම් තෙර නමක් ලියවා ඇති බවත් සෙනරත් පරණවිතානගේ අදහසයි. එමෙන්ම ඔහු සඳහන් කරනුයේ ලිපියේ උත්තර පස්සයේ වල්පිට දිසාවේ කදුරුගොඩ නාමය දැක්වෙතත් සුමාත්‍රාවේ පිටපතේ නාවෙහෙර බද යනුවෙන් දක්වා ඇති බවය. ඒ අනුව මේධානන්ද හිමි දක්වන්නේ කන්තරෝඩේ නටබුන් කදුරුගොඩ විහාරය විය යුතු බවත් එය නාගවිහාරය නම් පුදබිමකට සම්බන්ධ බවත්ය.

කදුරුගොඩ විහාරයේ පැවැත්ම 16 වන සියවස දක්වා මනාලෙස පවතින්නට ඇතැයි යන්න විහාර භූමියෙන් හමු වූ පුරාවස්තු අනුව නිගමනය කළ හැකිය. ඊට හේතු සාධක ලෙස පළමුවන පරාක්‍රමබාහු, නිශ්ශංකමල්ල, ලීලාවතී හා බුවනෙකබාහු යනාදීන්ගේ රාජ්‍යත්ව සමයේ දී මෙම විහාරයට ලැබුණු අනුග්‍රහය ඉවහල් වන්නට ඇත. යාපනයේ පාලකයෙක් ලෙස කටයුතු කළ සංකිලි, වෙහෙර විහාර සමූල වශයෙන් විනාශ කළ බව සඳහන් වන බැවින් කදුරුගොඩ වෙහෙර ද එසේ විනාශ වන්නය ඇතැයි සැලකේ.

ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ යාපනය විශ්වවිද්‍යාලයේ දායකත්වය මත 2011 දී කැණීම් කටයුතු සිදුකරනු ලැබීය. එම කැණීම සඳහා ආචාර්ය සිරාන් දැරණියගල, ආචාර්ය නිමල් පෙරේරා, මහාචාර්ය ටී. පුෂ්පරත්නම් හා මහාචාර්ය රාසයියා ක්‍රිෂ්ණරාජ් යන විද්වතුන්ගේ සහභාගීත්වය සිදුවිය.

ආචාර්ය ශිරාන් දැරණියගලයන් කදුරුගොඩ සම්බන්ධව අදහස් දැක්වීමේ දී ප්‍රකාශ කරනුයේ මෙය ලංකාවේ හතරවැනි මානව ජනාවාස පෙදෙස නියෝජනය කරන බවයි. අනුරාධපුරය පළමු යුගය ලෙසත්, තිස්සමහාරාමය දෙවැන්නත්, මන්නාරමේ මාතොට හෙවත් මහාතිත්ථ වරාය ආශ්‍රිත පෙදෙස තෙවැන්න ලෙසත් කන්දරෝඩෙ (කදුරුගොඩ විහාරය) ආශ්‍රිත මානව ජනාවාස පෙදෙස සිව්වැන්නත් ලෙස දැරණියගලයන් පෙන්වා දෙයි.


*ඡායාරූප අන්තර්ජාලයෙනි*



වැසි සමයේ ස්තූප



ස්තූප



ආරක්ෂා වී ඇති ස්තූප

# එක් ලක්ෂ හැට දහසකට රජයේ රැකියා ලබාදීමේ වැඩසටහන




**සුභද්‍රා දේශප්‍රිය**

සෞභාග්‍යයේ දැක්ම වැඩපිළිවෙළ ක්‍රියාවට නංවමින් රැකියා විරහිත උපාධිධාරීන් පනස් දහසකට රජයේ රැකියා අවස්ථා ලබාදීමට රජය සියලු කටයුතු සූදානම් කර ඇත. එම පත්වීම් ලබාදීමේදී යම් අසාධාරණයට ලක්වී ඇතැයි කියන සියලුම උපාධිධාරීන්ට සහ තවත් උපාධිධාරීන් දසදහසකට රැකියා ලබාදීමට කැබිනට් අනුමැතිය ලැබී ඇත. ඒ අනුව උපාධිධාරීන් හැට දහසකට රැකියා අවස්ථා ලබා දෙන බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් පවසයි.

රජයේ රැකියා අයදුම් කර පෞද්ගලික අංශයේ රැකියා සේවයේ නියුතු උපාධිධාරීන්ට රැකියා අවස්ථා ලබාදීමට ද කටයුතු කරන බව ජනාධිපතිවරයා සඳහන් කරයි. මේ අනුව උපාධිධාරීන් හැට එක් දහසකට රැකියා හිමිවන අතරම අඩු ආදායම්ලාභී පවුල් වෙනුවෙන් රැකියා ලක්ෂයක් ලබාදීමටද රජය තීරණය කර ඇත.

මේ සම්බන්ධයෙන් අදහස් දක්වන නොයෙක් දේශපාලන පක්ෂ රජයේ මෙම වැඩ පිළිවෙළ සාර්ථකව ක්‍රියාත්මක කළහොත් එයට ආශිර්වාද කරන බව පවසයි. තවත් පිරිසක් සඳහන් කරන්නේ රජයේ සේවකයන්ට වැටුප් පවා ගෙවාගත නොහැකි තත්ත්වයක් යටතේ රැකියා ලබාදීමෙන් රජය විශාල අර්බුදයකට පත්වන බවයි. මේ පිළිබඳ අදහස් දක්වන ආණ්ඩු පක්ෂය නියෝජනය කරන පිරිස් සඳහන් කරන්නේ අමාත්‍යංශයට අයත් ඇමැතිවරයාගේ ඡන්ද බල ප්‍රදේශයෙන් පමණක් රැකියා සඳහා තෝරාපත් කරගැනීමට කටයුතු නොකර සියලුම පළාත් නියෝජනය වන පරිදි රැකියා විරහිත පිරිස් සඳහා රැකියා අවස්ථා ලබා දෙන බවයි.

එමෙන්ම පාට, පක්ෂ භේදයකින් තොරව සුදුසුකම් සපුරා ඇති සියලුම උපාධිධාරින් ඇතුළු අඩු ආදායම්ලාභී පවුල්වලට එම රැකියා අවස්ථා කඩිනමින් ලබාදීමට පියවරගන්නා බවයි.

## ආගම්, පක්ෂ පාට භේදයකින් තොරව රැකියා ලබාදීමට කටයුතු කරනවා

**ජනාධිපතිවරයා විසින් රජයක් ලෙස දුන් පොරොන්දු ඉටුවෙමින් තිබීම ගැන අපි සතුටු වෙනවා. මේ කාරණාව ඉටුවෙන්න තිබුණේ මාස ගණනාවකට පෙරයි. මැතිවරණය නිසා උපාධිධාරීන්ට රැකියා ලබා දීම, අඩු ආදායම් ලාභීන්ට රැකියා ලබාදීම නවත්වන්නට කටයුතු කළ පක්ෂවලට අද මොකද වෙලා තියෙන්නේ කියලා ඉතා පැහැදිලියි. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රී සංඛ්‍යාව හය තුනට බැස්සා. සමගි ජන බලවේගය අන්ත පරාජයක් සමඟ මන්ත්‍රීවරුන් 54යි ඉන්නේ. එජාප ගැන කතා කරන්න දෙයක් නැහැ. තමන් තරග කළ අසුන අහිමි වෙන තරමට ම නායකතුමා පවා අන්ත පරාජයට පත් වුණා. දෙමළ ජාතික සන්ධානය කඩා වැටුණා.**

දේශපාලනික පදනම මත අපි සතුටු වෙනවා මේ රටේ ජනතාව ඇත්ත තේරුම් ගැනීම සම්බන්ධයෙන්. අපේ ජනාධිපතිවරයා අගමැතිවරයා සම්බන්ධයෙන් විශ්වාසය තබා ජනතාව කටයුතු කර ඇති බව අපිට පේනවා. උපාධිධාරීන් පනස් දහසකට රැකියා ලබා දී තිබෙනවා. එහි යම් ප්‍රායෝගික ගැටලු මතුවෙලා තියෙනවා. සාවද්‍ය තොරතුරු මතු වෙලා තියෙනවා. ඒ නිසා මේ දේවල් අහිමි වී තියෙනවා. මෙතැන කිසිදු කුමන්ත්‍රණයක් නැහැ. මුල් ලැයිස්තුවල නම් තිබිලා රැකියා අහිමි වුණා නම් සාධාරණ හේතූන් මත නැවත ගැටලුකාරී තත්ත්වයක් ඇති නොවී මැදිහත් වීමක් කරන්නට ජනාධිපතිවරයා බලාපොරොත්තු වෙනවා. රැකියා ලක්ෂය සම්බන්ධයෙන් අදහසක් තියෙනවා, සමහර අයගේ අඩු ආදායම්ලාභී පවුල් කිව්වාම සමෘද්ධිලාභී නොවන අය ඉන්න පුළුවන්. සම්පූර්ණ දේශපාලනය පදනම් වූ සමෘද්ධි ලබාදීම අපි කිසිසේත් සිදු කරන්නේ නැහැ. සමෘද්ධිලාභීන් නොවන අයත් මෙයට එකතු වෙයි. රැකියා ලක්ෂය ලබාදීම විනිවිද භාවයෙන් සිදුකරනු ලබනවා. අඩු අදායම් ජනතාවට අපි මෙය ලබා දෙනවා කිසිදු පක්ෂ භේදයකින් තොරව. කිසිදු දේශපාලන මැදිහත්වීමක් නැතිව රැකියා එක්ලක්ෂ හැට එක්දහස් එකසිය තිස්පහක් කොයි රටේද දීලා තියෙන්නේ? අපේ ආණ්ඩුව මෙය සද්භාවයෙන් කරන විට එය කඩාකප්පල් කරනවා නම්, සාමාන්‍ය මිනිසුන්ට ඒ වරප්‍රසාදය නොලැබෙන්නත් කටයුතු කරනවා නම් අපි ඊට මැදිහත් වී සාධාරණයක් ඉටු කරනවා. සමෘද්ධිලාභී පවුල් ආර්ථික වශයෙන් ශක්තිමත් කරන්න කියලා තමයි ජනාධිපතිවරයා මට උපදෙස් දීලා තියෙන්නේ. අද වන විට රුපියල් තුන්දහසක පමණ දීමනාවක් එක් කාඩ්පතකින් ලැබෙන්නේ.



සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌන උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන

**රාජ්‍ය අමාත්‍ය ශෙහාන් සේමසිංහ**

මේ සමෘද්ධිලාභීන් ස්වයං රැකියා වැනි විකල්ප ආදායම් මාර්ගවලට යොමු කරලා වෙළෙඳපොළක් ඇති කරලා ආදයම් වැඩිකරන්න, ඒ අයගේ දක්ෂතා හඳුනාගෙන රැකියා බිහිකරන්න පුළුවන් තැනක් හදලා දීම අපේ අරමුණයි. සමුපාකාර සතොස රාජ්‍ය යාන්ත්‍රණය ඒකාබද්ධ කරගනිමින් වෙළෙඳපොළක් හදලා අලෙවිකරන්න පුළුවන් ජාලයක් හදලා දෙන්න කටයුතු කරනවා.

ආර්ථික වශයෙන් ශක්තිමත් කරන්නයි අපි උත්සාහ කරන්නේ. මොනතරම් ආදායමක් ලබා ගැනීමට හැකි අවස්ථාවක්ද මෙතරම් කාලයක් මගහැරී තිබුණේ කියන කාරණාව ඒ අයට මතුවේවි. විරුද්ධ පක්ෂය දිගටම කියනවා ආනයනය සීමා කිරීම සම්බන්ධයෙන්. ජුනි මාසයේ සිට ආනයන වියදම අඩුවෙලා තියෙනවා. ඒ නිසා දේශීය කර්මාන්තකරුවන්ට අලුත් අවකාශයක් ඇතිවෙලා තිබෙන බව දැන් පේන්න තියෙනවා. යමක් ආරම්භ කිරීමේදී මූලික පියවර අසීරුයි.

සීනි නිෂ්පාදනය ඇති කරලා පිටරටවලින් ආනයනික සීනිවලට අපි බද්දක් අය කරනවා. යම් ප්‍රමාණයකින් සීනි මිල අඩු වුණා වගේම ලංකාවේ නිපදවීම ජනතාව අනුමත කළා. ඒ නිසා ජනතාවට හොඳ පණිවුඩයක් දීලා තියෙනවා. සෑම දෙයක්ම රුපියල් සතවලින් මනින්න නෙමෙයි ජනතාව හුරුවෙලා තියෙන්නේ.

දේශීය නිෂ්පාදනය වැඩිකළ යුතුයි කියන කාරණාව ජනතාව තුළින් ම හටගෙන තියෙනවා. අපේ රටේ මොනවද ආනයනය නොකර ඉන්නේ? මේ දේවල්වලට ජාවාරම් කරුවන් හඬ නැගුවට මහපොළොවේ ජීවත් වන මිනිසුන් හඬ නැගුවේ නැහැ. මේ දේවල් කරන්න ටික කාලයක් යනවා. එවිට රැකියා එක්ලක්ෂ පනස් දාහට වඩා විශාල රැකියා අවස්ථා නිර්මාණය වනවා පමණක් නොවෙයි, සමෘද්ධිලාභීන් ඇතුළු අඩුආදයම් පවුල්වල ජනතාවට විශාල වශයෙන් රැකියා අවස්ථා නිර්මාණය වෙයි. යම් නිෂ්පාදනයක් කරනවා නම් ඒ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය තියෙනවා නම් ඒවා පිටරටවලින් අනිවාර්යෙන් ගෙන්විය යුතු නම් ඒ සඳහා අවසර ලබාදීමට අප කටයුතු කරනවා. ඒවාට කිසිදු බාධාවක්, සීමාවක් අපි කරන්නෙ නැහැ. ජනතා අපේක්ෂා ඉටුකරන්නයි අපි මේ ජනවරම ගත්තේ. ජනතා අපේක්ෂාවන් වෙනුවෙනුයි අපි මේ කටයුතු කරන්නේ. ඒ අනුව හොඳ අනාගතයක් නිර්මාණය වේවි. අඩු අදායම්ලාභීන් සඳහා රැකියා ලබාදීම සම්බන්ධයෙන් පහළ අධ්‍යාපන මට්ටමක් තිබෙන රැකියා බෙදීමේදී සමානව බෙදී ගියේ නැහැ.

අපි දැක්කේ ඇමැතිවරු බිහිවන දිස්ත්‍රික්ක බලලා තමන්ගේ මැතිවරණ දිස්ත්‍රික්කයෙන් පමණක් සියලුම පුරප්පාඩු පුරවන්න පටන් ගත්තා. එදා පසුපෙළ මන්ත්‍රීන් විදිහට, ග්‍රාමීය ජනතා නියෝජිතයන් විදිහට අපි දැක්කා ජනතාව තුළ එය දැඩි පීඩාකාරී දෙයක් බවට පත්වුණා. ජනතාව අතර අප්‍රසාදයක් නිර්මාණය වුණා. ඒ අනුව එක් එක් ඇමැතිවරුන්ගේ ආසනවලින් තමයි ලංකාව පුරාම පුරප්පාඩු පිරවුණේ.

ඒ තත්ත්වයක් උඩ අනෙක් ප්‍රදේශවල අම්මා තාත්තාගේ දරුවට අයිතියක් නැතිද ලංකාවේ කොහේ හෝ රැකියාවක් කරන්න. මේ දුර්වලතාවය තමයි අපි වෙනස් කරන්නේ. ආගම්, පක්ෂ පාට භේදයකින් තොරව මේ රැකියා ලබාදීමට අපි කටයුතු කරනවා. මේ රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීමේදී මේ ආකාරයේ සමතුලිත භාවයක් ඇති කරන්න අපි කටයුතු කරනවා.

## සමාජයේ පහළම ස්තරවල අයටත් සහන දීම හොඳයි



ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂ ප්‍රධාන ලේකම්

**ඩිව් ගුණසේකර**

**ආණ්ඩුවක් විසින් දුන් පොරොන්දුව ඉටු කර තියෙනවා. මේ රජය ඉදිරියේ ඇති අභියෝග හමුවේ රැකියා ලබා දීම කියන්නේ ඉතා සරල ප්‍රශ්නයක් ලෙසයි මා දකින්නේ. ආණ්ඩුව ඉදිරියේ අභියෝග රැසක් තියෙනවා. ඒ අභියෝග ජයගන්න දැවැන්ත ජනවරමක් ලබා දී තියෙනවා.**

මේ වරම ප්‍රබල වරමක්. එය ලැබුණේ මේ බලගතු අභියෝග ජයගැනීමටයි. විශේෂයෙන් ගෝලීය අභියෝග, කලාපීය අභියෝග, භූ දේශපාලනික අභියෝග පවතිනවා. නිදහසින් පසුව අපේ රටට මේ තරම් අභියෝගවලට මුහුණ දීමට සිදුවෙලා නැහැ. ලංකාවේ ජනතාව ජනාධිපතිවරයා සම්බන්ධව සහ මේ නව රජය පිළිබඳව අසීමිත ලෙස විශ්වාසයෙන් මේ අතිවිශාල ජනවරම ලබා දුන්නා. 1978 ආරම්භ කරන ලද ආර්ථික ක්‍රමය තවදුරටත් යන්න බැහැ; එහි විශාල අර්බුදයක් පවතිනවා. මේ සම්බන්ධයෙන් විකල්පයක් සෙවිය යුතුයි. 2015 සිට යහපාලන අසාර්ථකත්වය නිසා මේ ආර්ථික අර්බුදය උත්සන්න වුණා. මහ බැංකු කොල්ලය පාස්කු සිදුවීම මේ සියලු ම ජාතික ආරක්ෂාව සහ ආර්ථික කියන සියලු අභියෝග හමුවේ මේ නව රජයට ඒ සියලුම ගැටලුවලට මුහුණ දීමට සිදු වෙනවා. දුප්පත්කම, ආදායම් අසමානතාවය සහ විරැකියාව යන තුනම ආර්ථික ප්‍රතිපත්තිවල අසාර්ථකත්වය නිසා මතු වූ දේවල්. මේ සඳහා ක්ෂණික විසඳුමක් ලෙසයි; උපාධිධාරින්ට සහ අවිධිමත් අධ්‍යාපනයක් ලැබූ අඩු ආදායම් සහිත පවුල්වලට මේ රැකියා අවස්ථාව ලබාදීම. යම් සහනයක් ලැබෙනවා සමාජයේ පහළම ස්ථරවල ජනතාවට. රටේ ආර්ථිකය පණ ගන්වන්නට අවශ්‍යයි. ඉන් අනතුරුව යථා තත්ත්වයට පත් කළ යුතුයි. වහාම දේශීය ආර්ථිකය පණ ගන්වන්නට අවශ්‍යයි. වේගවත් ආර්ථික සංවර්ධනයක් ඇති කරන්නට අවශ්‍යයි. එක් එක් අමාත්‍යංශවලට කාර්යභාරයක් දීලා ඉලක්ක දීලා මුදල් ප්‍රතිපාදන දීලා මේ රට නැවත ගොඩනගන්න ජනාධිපතිවරයා ඇතුළු රජය උත්සහයක යෙදෙනවා. ඒ උත්සාහයේ ක්ෂණික පියවරක් ලෙසයි; මේ රැකියා අවස්ථා ලබාදීම සිදු කරන්නේ. ඊට වඩා බරපතළ ගැටලු ඉදිරියේ තියෙනවා. මේ ක්ෂණික උත්සහයක් පමණයි. මීට පසු හොරකම් කරමින්, බොරු කරමින් සිටීමට නොහැකියි. සියලු දෙනාම වැඩකළ යුතු කාලයක් ඉදිරියේ එනවා. මම එයට ඉතාමත් සතුටු වෙනවා.

## ආණ්ඩුවක් පටන් ගත්ත වෙලාවේ වැරදි කියන්න අවශ්‍ය නැහැ

**මේ තරම් විශාල රැකියා ප්‍රමාණයක් දෙන්න පුළුවන් නම් හොඳයි. දැනට රජයේ සේවකයන්ට ආණ්ඩුවේ පඩිගෙවා ගන්න බැරි තත්ත්වයකයි සිටින්නේ. තවත් රැකියා ලබාදීලා පෞද්ගලික ආයතනවල වැඩ කරන අයටයි ඒවා ගෙවන්නත් වෙන්නේ. රජයේ වියදම අඩු කරලා ආර්ථිකය ගොඩනැඟීම රජයයි විපක්ෂයයි එකතු වෙලා කළ යුතු වැඩක්. මිනිස්සුන්ට හොඳ නිසානේ මේ ආණ්ඩු පත් කළේ.**



එජාප හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

**දයා ගමගේ**

පටන් ගත්ත වෙලාවේ ඉඳලා වැරදි කියන්න අවශ්‍ය නැහැ. යම් කිසි කාලයක් දිය යුතුයි. මේ ජනාධිපතිවරයාට වැඩක් කරන්න බැරිවුණේ තුනෙන් දෙකක් නැති නිසා කිව්වා. දැන් ජනාධිපතිවරයාට සුදුසු ලෙස වැඩ ටික කරගෙන යන්න පුළුවන්. අපි විරුද්ධවාදීන් විදිහට ඒ දෙස බලනවාට වඩා ඒ අයට ඉදිරි කටයුතු කරන්න කාලයක් දෙන්න අවශ්‍යයි. ජනතාව ම පත්කරගත් ආණ්ඩුවට කාර්මික දෝෂයක් ආවත් ජනතාව බණිනවා. ඒ දේවල් වැරදියි. වත්මන් ලෝකයේ තත්ත්වය අනුව මේ වනවිට ලක්ෂ ගණනකට රැකියා අහිමිවෙමින් පවතිනවා. රැකියා උත්පාදනය කළ හැකි කුඩා ව්‍යාපාරිකයන්ට, ව්‍යවසායකයන්ට ඒ පහසුකම් ලබා දිය යුතුයි. විශේෂයෙන් මූලික පිරිවැය ප්‍රාග්ධනය ලබා දිය යුතුයි. රජය විසින් අන්තර්ජාතික සම්බන්ධතා ඇති කරගනිමින් අපනයන වෙළෙඳපොළ පිළිබඳව මීට වඩා උනන්දුවක් දැක්විය යුතුයි.

## ජනතාවට සෙතක් වෙන දෙයක් වෙනවා නම් අපිත් කැමැතියි

**රැකියා පමණක් නොවෙයි පොරොන්දු සියල්ල ඉටුකරනවා නම් අපි කැමතියි. ජනතාව වෙනුවෙන් යමක් කරනවා නම් ජනතාවාදී පක්ෂයක් විදිහට අපි ඒ ගැන සතුටු වෙනවා. මෙච්චර කල් කිය කියා හිටියේ ජනවරම නැහැ කියලා.**

දැන් ජනතාව තුනෙන් දෙකටත් වඩා වැඩි ජනවරමක් දීලා තියෙනවා.

දැන් ඉතින් සෞභාග්‍යයේ දැක්ම දිගට හරහට ක්‍රියාත්මක කරන්නයි තියෙන්නේ. හොඳ දේවල්වලට අපිත් කැමැතියි. විපක්ෂය කියලා හැමදේටම විරුද්ධ වෙන්නේ නැහැ.

ජනතාවට සෙතක් වෙන දෙයක් වෙනවා නම් අපිත් කැමැතියි. පඩිය දෙදහස් පන්සියයක් වැඩි කරනවා කියලා කිව්වට තවම ඒක කරලා නැහැ. කියපු ගොඩක් දේවල් කරලා නැහැ. වැඩ කරනවා නම් හොඳයි. දෙන දේවල් හිමිවිය යුතු හැමෝටම දෙනවා නම් හොඳයි.

දුන්නාට පසුව ඒ ගැන කතා කරමු. ජනවරම තියනවා දැන් ලැබිලා තියෙන නිසා වැඩ කරන්නයි තියෙන්නේ. අපි දේශපාලනික කුහකයෝ නොවෙයි. ජනතාවට හොඳක් වෙන්නයි අපිට ඕනේ.

හොඳ දේට හොඳයි කියන්න වගේම නරක දේට නරකයි කියන්නේ ජනතාවට යහපතක් වෙනවාට අපි කැමති නිසයි.

මේ දේවල් අපෙන් අහන්න කල් මදි. ඒ නිසා අපි කළාට පස්සේ ඒ ගැන බලමු. කළාට පස්සේ බොහොම හොඳයි කියන්න පැකිලෙන්නෙ නැහැ. අපිට අවශ්‍ය ජනතාවට යහපතක් වෙන්නයි.



සමගි ජන බලවේගය, ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී

**ගයන්ත කරුණාතිලක**

## ජනාධිපතිවරණයට පෙර ආණ්ඩුව කිව්වා රජයේ උපාධිධාරීන්ට රැකියා අවස්ථා ලබා දෙන බව



හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

**බිමල් රත්නායක**

**උපාධිධාරීන්ට රැකියා ලබාදීම සහ අඩු ආදායම් සහිත පවුල්වල අයට රැකියා ලබා දීම හොඳ දෙයක්. එකම ගැටලුව උපාධිධාරීන්ට රැකියා ලබාදෙන බවට පත්වීම් ලිපි යැව්වා පෙබරවාරි මාසයේ. නමුත් නැවත අගෝස්තු මාසයේ යැවූ ලිපිවල පෙබරවාරි මාසයේ ලබාදුන් 13000න් දහසකට රැකියා නැහැ. එය උපාධිධාරීන් දහතුන් දහසක් වැනි විශාල ප්‍රමාණයක් රැවටීමක් කියලා මම හිතන්නේ.**

උපාධිධාරීන් ඇතුළු එක්ලක්ෂ හැට එක්දහසකට රැකියා ලබාදීම පොදුවේ හොඳ ක්‍රියාවක්. නමුත් මෙතැන විශාල ගැටලුවක් වී තිබෙන්නේ උපාධිධාරියෙක් වුණාට පස්සේ කවුරුත් ගෙදරට වෙලා ඉන්නේ නැහැ. ගාමන්ට් එකකට හෝ කඩයක හරි වැඩට යනවා. ඒ වගේ කුමක් හෝ රස්සාවක් කරනවා. ඒ වගේ රැකියාවක් කරන තැනක එහෙම කෙනෙකුට ඊටීඑෆ් ලැබෙන්නත් පුළුවන් නොලැබෙන්නත් පුළුවන්.

ඒ තැනැත්තා රජයේ රැකියාවක් කරනවා නම් එයින් ඉවත් වෙන්න එපා කියන කාරණාව වෙනම කාරණාවක්. පෞද්ගලික අංශයේ රැකියාවක් කරනවා නම් ඒ අයට සුදුසුකම් තියනවා රජයේ රැකියාවක් තෝර ගන්න. නමුත් ජනාධිපතිවරණයට පෙර ආණ්ඩුව කිව්වා රජයේ උපාධිධාරීන්ට රැකියා අවස්ථා ලබා දෙනවා කියලා. නමුත් පාර්ලිමේන්තු මැතිවරණය අවසන් වෙන මොහොතේ පත්වීම් ලිපි ලැබී තියෙන්නේ.

එයින් යම් කිසි පිරිසකට ලැබී තිබුණේ නැහැ. එතනත් රැවටීමක් තිබෙනවා. මැතිවරණයට පෙරත් කිව්වා රැකියා ලබා දෙනවා කියලා. උපාධිධාරීන් මේ ආණ්ඩුව පත් කරන්න විශාල දායකත්වයක් ලබා දී තියෙනවා.

දේශපාලන රැවටීමට ඒ අයත් දායක වුණා සේම අනෙක් අයවත් දායක කළා. අඩු ආදායම්ලාභී පවුල්වල අයට රැකියා ලක්ෂයක් ලබාදීම සම්බන්ධයෙන් ඇති යෝජනාව අලුත් යෝජනාවක්.

හැම ආණ්ඩුවක්ම තමන්ගේ ජයග්‍රහණය සඳහා දායක වුණ අයට රැකියා ලබාදීම කරනවා. තමන්ගේ අමාත්‍යංශයට ආසනයේ කට්ටිය පුරවන එක මේ රටේ දේශපාලනයේ හැටි. කවුරුත් ගණන් හදන්නේ නැහැ රැකියා ලක්ෂයක්ද කියලා; නමුත් රැකියා ලැබෙයි.

## කලින් පත්වීම් ලිපි ලැබූ සියල්ලන්ටම රැකියා ලබාදිය යුතුයි

**රැකියා දෙනවා කියලා එක පැත්තකින් මේ ආණ්ඩුව උපාධිධාරීන් රවටා තියෙනවා. අසූ දහසකට වඩා අයදුම් පත් කැඳවලා උපක්‍රමශීලීව විශාල ප්‍රමාණයක් ඉවත් කර තිබෙනවා. ඊපීඑෆ් ගැටලුව නිසා 9944ක් ප්‍රතිශේප කර තිබෙනවා. සමස්ත ප්‍රතික්ෂේපිත ප්‍රමාණය හතලිස් දහසකට අධිකයි. අපි මුලින් කිව්වා මේ පුවත්පත් නිවේදනය නිවැරදි කරන්න කියලා. ඩිප්ලෝමාධාරීන් නිර්වචනය කරන්න කියලා.**

එහෙම කරන්නේ නැතුව රජය මේ අයව ප්‍රතික්ෂේප කර තිබෙනවා. මේ විශාල ප්‍රමාණයක් රැකියා ලැබුණ අය. මම කියන්නේ උපාධිධාරීන් කියවා ගත යුතු කාරණාවක්. ආණ්ඩු මැතිවරණ ඉලක්ක කරගනිමින් අපේ ප්‍රශ්න ඉදිරියට ගෙන එමින් ඉන්පසුව උපාධිධාරීන් රවටන ආකාරය අපිට ඉතා පැහැදිලියි. 50 දහසකට රැකියා ලබාදීම කියන කතාව ඇත්තක් වුණත් ඒ අයගේ සමහර අයට පත්වීම් ලිපිය අතට දීලා නැවත උදුරා ගැනීමක් කර තියෙනවා. මේ විදිහට හතලිස් දහස් අනු දෙකක් ප්‍රතික්ෂේප කිරීම වෙනුවෙන් අපි පසුගිය දිනක උද්ඝෝෂණයක නිරත වුණා. පත්වීම් ලිපි ලබාදී නැවත උදුරාගැනීම නිසා තක්කඩි විදිහට උපාධිධාරීන් රැවටීමක් කර තිබෙනවා. ගෙදර තියලා හරි වැටුප් ගෙවනවා කිව්වාට ගෙව්වේ නැහැ. රැකියා ලබා දීම සහ නැවත අවලංගු කිරීම ඉතාම නිර්ලැජ්ජිතයි. පත්වීම් හතළිස් පන්දහස් පන්සිය අසූපහක් මුලින් දුන්නා. දැනට ලේඛනයෙන් ඉවත් කර තිබෙන අයගේ ලිපි යැවීම සඳහා රුපියල් 65 පමණ මුදලක් වැය වෙලා තියෙනවා. ලක්ෂ විසිහයක් ඒ සඳහා සමස්ත වියදම ගිහින් තියෙනවා ඒ සඳහා අහිංසක උපාධිධාරීන්ගෙන්.

පත්වීම අතට ඇවිල්ලා උත්සවාකාරයෙන් එය ලබා ගත්, කරමින් සිටිය රැකියාවත් අහිමි වෙලා දිවිනසා ගන්න තරමට අභිමානය හැල්ලුවට ලක්වුණ උපාධිධාරීන් පිරිසක් ඉන්නවා. ඒ නිසා ඒ අය වෙනුවෙන් අපි පෙනී සිටිනවා. ඒ වගේම අපි රැකියා ලැබූ සියලු දෙනාට සුබ පතනවා. සුදුසු රැකියාවක් ලැබෙන තුරු උපාධිධාරීන් කුමක් හෝ රැකියාවක් කළ යුතුයි. අවුරුදු හතක් රැකියාවක් කරපු පලියට රජයේ රැකියාවක් දෙනකල් නිකන් හිටපන් කියලානේ කියන්නේ. එය ප්‍රායෝගිකද? ඒ ප්‍රශ්නය නිසා උපාධිධාරීන් නවදහස් ගණනක් මෙවර ප්‍රතික්ෂේප වෙලා තියෙනවා. සමාජයක් හැටියට අපි නැවත මේ ප්‍රශ්නය කියවාගත යුතුයි. තරුණ ප්‍රශ්න පාවිච්චි කරමින් තරුණ ජීවිත පාවිච්චි කරමින් තරුණ ජීවිත තඹ දොයිත්තකට මායිම් නොකරමින් මේ කරන දේ අපි එළිදරව්කරනවා. ඊපිඑෆ්, ඊටීඑෆ් ගැටලුව නිසා ප්‍රතික්ෂේප කළ උපාධිධාරීන්ට නැවත සාධාරණයක් ඉටු කරන්න. ඒ වගේම මේ උපාධිධාරීන් පුහුණු වැඩපිළිවෙළට අනුයුක්ත කරගන්න කියලා අපි ඉල්ලා සිටිනවා.



ඒකාබද්ධ රැකියා විරහිත උපාධිධාරීන්ගේ සංගමයේ කැඳවුම්කරු

**තැන්නේ ඥානානන්ද හිමි**

තරුණ ගැටලු කුණු කූඩවලට දාපු ආණ්ඩුවලට ඉතිහාසයේ පුරා මැතිවරණවලදි උරුම වුණේ කුණුකූඩයම තමයි. අනිවාර්යෙන් මේ අයත් ඒ දේම කරනවා නම් ඊළඟ මැතිවරණයේදී ජනතාව තීන්දුවක් ගනියි.

# ක්‍රීඩා

බන්දුල ජයමාන්න
kreeda@lakehouse.lk











# කිසි ප්‍රශ්නයක් නෑ

## තරංග ක්‍රිකට් කරළියෙන් බැස යමින් පවසයි

**ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ හිටපු වමත් ආරම්භක පිතිකරුවකු වන තරංග පරණවිතාන ක්‍රිකට් පිටියට සමුදීමට තීරණය කර තිබේ. 38 වන වියේ පසුවන තරංග ක්‍රිකට් පිටියෙන් සමු ගැනීමට තීරණය කරන විට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ටෙස්ට් තරග 32කට ක්‍රීඩා කර තිබුණි.**

කිසි ප්‍රශ්නයක් නෑ, වයස සමග සසඳනවිට මෙය හදිසි තීරණයක් නොවන බව පවසන තරංග මෙරට පළමු පෙළ ක්‍රිකට් තරගාවලියද අවසන් වීමෙන් පසු මේ තීරණයට එළැඹි බව පවසයි. කෑගල්ල ශාන්ත මරියා විද්‍යාලයෙන් සිප් සතර හැදෑරූ තරංග විද්‍යාලයේ වයස අවුරුදු 12 - 14න් පහළ පාපන්දු කණ්ඩායම්වලද නායකත්වය දරා ඇති අතර, මලල ක්‍රීඩාවට ද සම්බන්ධ වී තිබේ. නමුත් තරංග ඉදිරියට පැමිණියේ ක්‍රිකට් ක්‍රීඩාවෙන්ය.

පාකිස්ථාන් ක්‍රිකට් ඉතිහාසයට අඳුරු කල දසාවක් එක් කළ 2009 දී එකී සංචාරයට එක්වෙමින් පෙබරවාරි 21දා කරච්චිහිදි 111 වැනි ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩකයා ලෙස ටෙස්ට් වරම් දිනා ගත්තේය. නමුත් එකී පළමු ටෙස්ට් තරගය තරංගට සුබදායක නොවූයේ තමා මුහුණ දුන් පළමු පන්දුවෙන්ම උමාර් ගුල් ඉදිරියේ ලකුණු නොලබා දැවී යෑම නිසයි. දෙවැනි ඉනිමේදී ද අවාසනාවන්ත ලෙස දුවද්දි දැවී යාමකට හසුවිය. නමුත් දෙවැනි ටෙස්ට් තරගය පැවැති ලාහෝර්හිදි (2009 මාර්තු 03දා) ත්‍රස්ත ප්‍රහාරයට ලක්ව තුවාල ලැබූ ක්‍රීඩකයන් කිහිප දෙනා අතරට ද තරංග ඇතුළත් විය. නමුත් එම වසරේම පාකිස්ථාන් කණ්ඩායම ශ්‍රී ලංකාවේ සංචාරය කළ අතර, එහිදී ගාල්ලේදි සිය ප්‍රථම ටෙස්ට් අර්ධ ශතකය රැස් කර ගැනීමට සමත් විය.

තරංග සිය ටෙස්ට් දිවිය තුළ ශතක දෙකක් රැස් කර ඇති අතර එකී ශතක දෙක ඉන්දියාවට එරෙහිව පිට පිට රැස් කර ගැනීමද විශේෂත්වයකි. සිය ප්‍රථම ටෙස්ට් ශතකය සිය දහනම වැනි ඉනිමේ ඉන්දියාවට එරෙහිව ගාල්ලේදි රැස් කළේ (ලකුණු 111) 2010 දීය. දෙවැනි ශතකය (ලකුණු 100) රැස් කළේ සිංහල පිටියේදීය. සිය ටෙස්ට් තරග දිවිය තුළ ශතක දෙකක් සමඟ අර්ධ ශතක 11ක් රැස් කර ගැනීමට ද තරංග සමත්ව තිබේ.

2002 දි ශ්‍රී ලංකාවේ පැවැති නැඟී එන කණ්ඩායම් ශූරතාවලියේදි යොවුන් ක්‍රිකට් පිටියේ ස්ථාවරත්වයක් ගොඩ නඟාගත් තරංග 2007 - 08 දී පන්දු 392 කදී ලකුණු 236ක් ද සමගින් සමස්ත ලකුණු 893ක් රැස් කරමින් සිංහල ක්‍රීඩා සමාජයට අන්තර් සමාජ ප්‍රිමියර්ලීග් ක්‍රිකට් ශූරතාව දිනා දීමත් සමඟම ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ ද දොරටුව තරංගට විවර විය. එකී තරගාවලියේදි ශතක තුනක් සමඟ ලකුණු 893ක් තරංග රැස් කළේ සාමාන්‍ය 74.41ක් පවත්වාගෙන යමින්ය. එකී දස්කම සමඟ ශ්‍රී ලංකා ඒ කණ්ඩායමේ දකුණු අප්‍රිකානු සංචාරයට එක්වූ තරංග එහිදී පිත්තෙන් දස්කම් දක්වමින් ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩාවේ අනාගත බලාපොරොත්තුවක් ලෙස ඉදිරියට පැමිණීමට සමත් විය.

2012 දී නවසීලන්තයට එරෙහිව බෙත්තාරාම ක්‍රීඩාංගණයේ පැවැති තරගයට එක්වූ තරංගට අනතුරුව ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ටෙස්ට් පිටියට පැමිණීමට වරම් හිමි නොවීය. එකී තරගයේ පළමු ඉනිමේදි ලකුණු 40ක් රැස් කළ තරංග දෙවැනි ඉනිමේදි පළමු පන්දුවෙන්ම ලකුණු නොලබා දැවී ගියේය. ඒ අනුව සිය ටෙස්ට් තරග දිවියේ පළමු ඉනිම සහ සිය අවසන් ඉනිම එක පන්දුවකින් නිම කර ගත් ක්‍රීඩකයකු ලෙස ද තරංග වාර්තා පොත් අතරට එක්විය.

සිය ටෙස්ට් තරග දිවිය තරග 32කට සීමා වුවද සිය පළමු පෙළ තරග දිවිය 2001 සිට මේ දක්වා දශක දෙකකට ආසන්න කාලය තුළ තරග 222කදී ලකුණු 14940ක් රැස් කිරීමට සමත්ව තිබේ. ඊට ශතක 40ක් සහ අඩශතක 69ක් ඇතුළත්ය. රැකගෙන ඇති උඩ පන්දු සංඛ්‍යාව 219කි.

> සිය ටෙස්ට් තරග දිවියේ පළමු ඉනිම සහ සිය අවසන් ඉනිම **එක පන්දුවකින් නිම කර ගත් ක්‍රීඩකයකු ලෙස ද තරංග වාර්තා පොත් අතරට එක්විය.**

# පාපන්දු සභාපති කුසලාන

# කිරුළ ප්‍රථම වරට කාට ද?

● ප්‍රශාන්ත ඇල්පිටිය

**ඕනෑම ක්‍රීඩාවක සුන්දරත්වය පවතින්නේ එහි අවිනිශ්චිතභාවය මතය. ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය විසින් සංවිධානය කරනු ලැබූ වැන්ටේජ් සභාපති කුසලාන ලීග් තරගාවලියේදීත් මේ බව මනාව සනාථ විය.**

ඒ ප්‍රබල එමෙන්ම ජනප්‍රිය කණ්ඩායම් රැසක්ම අනපේක්ෂිත ආකාරයෙන් පසුබැසීමයි. එමෙන්ම ප්‍රාදේශීය සහ නවක කණ්ඩායම් කිහිපයක්ම ඉදිරියට පැමිණීමත් එහිදී දක්නට ලැබුණි. එය මෙරටේ අනාගත පාපන්දු ක්‍රීඩාවේ දියුණුවට සුබ ලකුණකි.

වැන්ටේජ් සභාපති කුසලාන ලීග් පාපන්දු තරගාවලියේ අවසන් පූර්ව තරග ඉකුත් 27 වැනිදා පැවැත්වීය. මෙම වැන්ටේජ් සභාපති කුසලාන ලීග් පාපන්දු තරගාවලියේ අවසන් මහා තරගය 02 දා කොළඹ සුගතදාස ක්‍රීඩාංගණයේදී පැවැත්වීමට නියමිතය. එහිදී ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගි වීමට නියමිතව තිබෙන්නේ තරුණ කටයුතු හා ක්‍රීඩා ඇමති නාමල් රාජපක්ෂය .

මෙම තරගාවලියේ අවසන් පූර්ව තරගවලට සුදුසුකම් ලබා ගැනීමට සමත් වූයේ ජාවාලේන්, බ්ලූ ඊගල්ස් (ගුවන්), කොළඹ සහ රෙඩ් ස්ටාර් යන කණ්ඩායම්ය. එහිදී ජාවාලේන් - බ්ලූ ඊගල්ස් සහ කොළඹ - රෙඩ් ස්ටාර් අතර තරග පැවැත්විණි.මේ අතර අර්ධ අවසන් තරගයකදී නිව් ස්ටාර් කණ්ඩායම විසින් බ්ලූ ඊගල්ස් කණ්ඩායම පරාජය කරනු ලැබීය. එහෙත් එම තරගයේදී නිව් ස්ටාර් කණ්ඩායමට නීති විරෝධී ආකාරයට ක්‍රීඩකයකු ක්‍රීඩා කිරීම හේතුවෙන් ඔවුන්ගේ ජයග්‍රහණය අවලංගු කරනු ලැබීය. මේ නිසා බ්ලූ ඊගල්ස් කණ්ඩායමට අවසන් පූර්ව වරම හිමි විය. අර්ධ අවසන් තරගවලදී කොළඹ පාපන්දු සමාජය විසින් ගෝල 03 - 00 කින් ශ්‍රී ලංකා පොලිස් ක්‍රීඩා සමාජය පරාජය කළේය. එමෙන්ම රෙඩ් ස්ටාර් පාපන්දු සමාජය ගෝල 05 - 03කින් ජය ගත්තේ මාවනැල්ල සෙරෙන්ඩිබ් ක්‍රීඩා සමාජය තියුණු තරගයකින් අනතුරුව පරාජය කරමිනි. එමෙන්ම ජාවාලේන් ගෝල 03 - 01 ක ජයක් ලැබුවේ ඩිෆෙන්ඩර්ස් (යුද) කණ්ඩායම හමුවේය.

මෙවර තරගාවලියේ මූලික වටයේ දී ලීග් ක්‍රමයට තරග පැවැත්වීය. ඊට සහභාගි වූ මුල් කණ්ඩායම් ගණන 20කි. එම කණ්ඩායම් කාණ්ඩ 05ක් යටතේ තරග කළේය. මූලික වටයේදී සෑම කණ්ඩායමක්ම තරග 03 බැගින් තරග කළේය.




මූලික වටයේදී තරගයක වැඩිම ගෝල ගණනකින් ජය ගත්තේ සොන්ඩර්ස් ක්‍රීඩා සමාජයයි. ඒ ගෝල 9 - 5 කින් බේරුවල සුපර් සන් පරාජය කරමිනි. එසේ වුවත් අර්ධ අවසන් වටයට සුදුසුකම් ලැබීමට සෝන්ඩර්ස් කණ්ඩායමට හැකි වූයේ නැත. ඊට බලපෑවේ මූලික වටයේ ඔවුන් සිටිය සී කාණ්ඩයේ දී තෙවැනි ස්ථානයට පත්වීමයි.

මූලික ලීග් වටයේදී අපරාජිත එකම කණ්ඩායම වූයේ බ්ලූ ඊගල්ස් (ගුවන්)ය. ඩී කාණ්ඩයේදී සෙරෙන්ඩිබ් සහ සී හෝව්ක්ස් (නාවික හමුදාව) සම ලකුණු ලබා සිටියහ. නමුත් දෙවැනි ස්ථානයට පත් වූයේ සෙරෙන්ඩිබ් කණ්ඩායමයි. ඒ ප්‍රතිවාදින්ට එරෙහිව වැඩිම ගෝල් ගණනක් ඔවුන් රැස් කරන ලද නිසාවෙනි. සෙරෙන්ඩිබ් ඒ අනුව ගෝල 10ක් රැස් කර තිබුණි. සී හෝව්ක්ස් පිලට ගෝල් 05කි.

# පිටියේ රවුමක්

## ඩිල්රුවන් පළමුපෙළ කඩුලු 800 සමාජයට

අන්තර් සමාජ පළමු පෙළ ලීග් ක්‍රිකට් තරගාවලිය යටතේ කඩුලු 800 සීමාව ඉක්මවා යෑමට කොළඹ කෝල්ට්ස් කණ්ඩායමේ දඟ පන්දු යවන ඩිල්රුවන් පෙරේරා සමත් විය. සුපර් 8 තරග වටයේ අවසන් තරගය හෙවත් එන්. සී. සී. කණ්ඩායමට එරෙහිව පැවැති තරගයේදී චතුරංග ද සිල්වාගේ කඩුල්ල දවා ගත් ඩිල්රුවන් කඩුලු 800 සීමාව අභිබවා යෑමට සමත් වූවේය.

වසර 80 කට ඇත අතීතයකට හිමිකම් කියන දේශීය පළමු පෙළ ක්‍රිකට් තරගාවලිය යටතේ කඩුලු 800 සීමාව ඉක්මවා ගිය පස්වැනි ශ්‍රී ලංකා පන්දු යවන්නා බවට ඩිල්රුවන් පත්විය. ඩිල්රුවන්ට පෙර එම සීමාව ඉක්මවා ගොස් ඇත්තේ ලොව වැඩිම ටෙස්ට් සහ එක්දින කඩුලු ලාභී මුත්තයියා මුරලිදරන් (1374), රංගන හේරත් (1001), දිනුක් හෙට්ටිආරච්චි (929) සහ සජීව වීරකෝන් (802) පමණි.

කොළඹ ක්‍රීඩා සමාජ පිටියේ පැවැති තරගයේදී පළමු දිනයේදී ලකුණු 119 කට ප්‍රතිවාදී පිලේ කඩුලු 4 ක් දවා ගත් ඩිල්රුවන් මෙතෙක් වැඩිම කඩුලු ලාභීන් අතර සිව්වැනි ස්ථානයේ සිටි සජීව වීරකෝන්ව (802) පස්වැනි තැනට ඇද දමමින් සිව්වැනි ස්ථානය දක්වා තේරී පත්විය. ඩිල්රුවන් මේ වන විට පළමු පෙළ තරග 222 කට සහභාගිවෙමින් කඩුලු 803 ක් දවාගැනීමට සමත්ව සිටින අතර ඔහුගේ ඉනිමක හොඳම පන්දු යැවීම ලකුණු 71 කට කඩුලු 7 ක් වේ.

## ඩිලන්තට ඉතිහාසයේ පළමුවරට රජයෙන් අත

ලැම්බෝර්ගිනි සුපර් ට්‍රෝෆියෝ යුරෝපා ශූරතාව සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් තරග වදින ලෝක ශූර ඩිලන්ත මාලගමුව දිවයිනෙන් පිටත්ව යාමට පෙර අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ හමු විය.

මෙරට රාජ්‍ය අනුග්‍රහය ඇතිව මෝටර් රථ ධාවන තරගාවලියක් සඳහා ඩිලන්ත මාලගමුව එක්වන්නේ ඉතිහාසයේ ප්‍රථම වතාවටය. වසර 36ක් පුරා මෙරටට විශාල කීර්තියක් අත්කර දුන් ඩිලන්ත මාලගමුව ට මෙවර ද ශූරතාව ශ්‍රී ලංකාවට රැගෙන ඒමට හැකි වේවායි අගමැතිවරයා සුබපතා තිබේ. මෙම තරගාවලිය සැප්තැම්බර් 5 සිට නොවැම්බර් මස 15 වැනිදා දක්වා ජර්මනිය, ස්පාඤ්ඤය, බෙල්ජියම, සහ ප්‍රංසය යන රටවල් හිදී පැවැත්වේ.

ප්‍රථම වතාවට රාජ්‍ය අනුග්‍රහය ලැබීම පිළිබඳ විශේෂ සටහනක් තැබූ ඩිලන්ත මාලගමුව අග්‍රාමාත්‍යවරයා ඇතුළු රජයටත්, එම කටයුතු සම්පාදනය කළ සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග ට, ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍ය නාමල් රාජපක්ෂ ට සහ ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයටත් ස්තූතිය පළ කළේය.

## පාසල් ක්‍රීඩාවට සෞඛ්‍ය හා ක්‍රීඩා අමාත්‍යාංශ අවධානය

කොවිඩ්19 ගෝලීය වසංගතයත් සමඟ නතර වූ ඇතැම් පාසල් ක්‍රීඩා ආරම්භ කිරීමට සෞඛ්‍ය හා ක්‍රීඩා යන අමාත්‍යාංශ එකඟතාවට පැමිණ ඇතැයි වාර්තා වෙයි. තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ , සෞඛ්‍ය අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි හා සෞඛ්‍ය බලධාරීන් සමඟ සෞඛ්‍ය අමාත්‍යංශයේ පැවති සාකච්ඡාවකදී මෙසේ එකඟතාවට පැමිණ තිබේ. මෙම සාකච්ඡාවට ක්‍රීඩා හා සෞඛ්‍ය යන අමාත්‍යංශයන් හි ඉහළ නිලධාරින් සහභාගි වූ අතර, දැඩි සෞඛ්‍ය මාර්ගෝපදේශ හා සෞඛ්‍ය අංශ අධීක්ෂණය යටතේ ඇතැම් පාසල් ක්‍රීඩා පැවැත්වීමට අමාත්‍යංශ දෙකම එකඟ වූ බව එම සාකච්ඡාවෙන් පසු තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ පැවැසීය. පවතින වාතාවරණය මත පැවැත්විය හැකි ක්‍රීඩා ගණනාවක් හඳුනාගෙන ඇති නමුත් ඒ පිළිබඳ අවසන් තීරණය සෞඛ්‍ය බලධාරීන්ගේ උපදෙස් මත ගන්නා බව අමාත්‍යවරයා වැඩි දුරටත් ප්‍රකාශ කළේය. කෙසේවෙතත් හැකි ඉක්මනින් පාසල් ක්‍රීඩා ආරම්භ කිරීමට හැකි වෙතැයි නව ක්‍රීඩා අමාත්‍යවරයා විශ්වාසය පළ කරයි.

## චන්දිමාල් - කිත්රුවන් අබිබවා යයි

ලාංකේය පළමුපෙළ ක්‍රිකට් තරග ඉතිහාසයේ පිතිකරුවකු රැස් කළ ඉහළම ලකුණු සංඛ්‍යාවට හිමිකම් කියමින් අන්තර් සමාජ ප්‍රිමියර් ලීග් ක්‍රිකට් තරගාවලියේ සැරසන්ස් පිලට එරෙහිව ත්‍රිත්ව ශතකයක් රැස් කිරීමට ශ්‍රී ලංකා පිලේ සුපිරි පිතිකරු දිනේෂ් චන්දිමාල් සමත් විය.

සැරසන්ස් පිල සමඟ කටුනායක චිලව් මේරියන්ස් පිටියේ පැවැත්වෙන සුපිරි අට වටයේ තරගයේදී යුද හමුදා පිල නියෝජනය කරමින් චන්දිමාල් කිත්රුවන් ඉනිම අබිබවා යාමට සමත් විය. පළමුව පන්දුවට පහරදුන් යුද හමුදා පිල කඩුලු 8ක් දැවී ලකුණු 642ක් ලබා ඉනිම අත්හිටුවද්දී චන්දිමාල් නොදැවී ලකුණු 354ක් ලබා සිටියේය. පන්දු 391කට මුහුණ දුන් චන්දිමාල් හතරේ පහර 33කින් සහ හයේ පහර 9කින් සිය ඉනිම වර්ණවත් කළේය.

චන්දිමාල් බිඳ දමනු ලැබුවේ 2015 වසරේ අන්තර් සමාජ තරගයකදී ද්‍රවිඩ සංගම් පිලට ක්‍රීඩා කළ කිත්රුවන් විතානගේ ගුවන් හමුදා පිලට එරෙහිව කටුනායක පිටියේදීම රැස් කළ ලකුණු 351 වාර්තාවය.

පළමු පෙළ තරගයකදී ශ්‍රී ලාංකික පිතිකරුවකු ත්‍රිත්ව ශතකයක් රැස් කළ 10 වැනි අවස්ථාව ද මෙය වේ. එමෙන්ම ශ්‍රී ලංකා පිතිකරුවකු ලකුණු 350 සීමාව පසු කළ තුන්වැනි අවස්ථාව ලෙසත් එය වාර්තා පොතට එක් විය. ඊට පෙර මහේල ජයවර්ධන දකුණු අප්‍රිකාවට එරෙහිව 2006 එස්.එස්.සී පිටියේ පැවැති ටෙස්ට් තරගයකදී ලකුණු 374ක් රැස් කරමින් එම සීමාව පසු කළ පළමු පිතිකරුවා විය. ඒ සමඟම මෙවර ප්‍රිමියර් ලීග් තරගාවලියේ දී ලකුණු දහසේ සීමාව පසු කළ දෙවැනි පිතිකරුවා බවට පත්වීමට ද චන්දිමාල් සමත් විය. ඊට පෙර එන්.සී.සී .පිලේ ළහිරු උදාර ලකුණු දහසේ සීමාව ඉක්මවා ගියේය.ළහිරු ඉනිම් 14කදී ලකුණු 1039කි.සාමාන්‍ය 86.58කි.චන්දිමාල් ඉනිම් 13කදී ලකුණු 1027කි.සාමාන්‍ය 93.36කි.


ත්‍රිත්ව ශතක ලැබූ ශ්‍රී ලංකා පිතිකරු ලැයිස්තුවට මහේල ජයවර්ධන (374), දිනේෂ් චන්දිමාල් (නොදැවී 354), කිත්රුවන් විතානගේ (351), මිනෝද් භානුක (342), තිළිණ කණ්ඩම්බි (නොදැවී 340), සනත් ජයසූරිය (340), කුසල් පෙරේරා (336), කුමාර සංගක්කාර (319), උදාර ජයසුන්දර (318) සහ රමේෂ් මෙන්ඩිස් (300) ඇතුළත් වෙති.

# සතියේ කවි පොත

**කෘතියේ නම - හදවතක් ඇති වලාවක්**
**කර්තෘ - චම්පා කුමාරි දිසානායක**

හදවතක් ඇති වලාවක් චම්පා කුමාරි දිසානායකගේ පළමු කාව්‍ය සංග්‍රහයයි. මේ විශ්වයේ ප්‍රේමයෙන්, ආදරයෙන් තොර පැවැත්මක් නැත. ජීවිතය හා බැඳී පවතින ප්‍රේමය නිර්මාණකරුවන්ගේ නිර්මාණ සමඟද බද්ධ වී ඇත්තේ එනිසාය. කවියත්, ගීතයත්, ඡායාරූපයත්, සිනමා පටයත්, නාට්‍යයත්, නවකතාවත්, කෙටිකතාවත් ආදිවූ කී නොකී සියලු කලාවන් පවතින්නේ මේ ප්‍රේමය මුල්කොටගෙනය. එනිසා ම අපට බොහෝ කවිපොත්වල ආදරය, විරහව, සෙනෙහස ආදිවූ බැඳීම්වල විවිධ පැතිවලින් ලියැවුණ නිර්මාණ හමුවේ. 'හදවතක් ඇති වලාවක්' කාව්‍ය සංග්‍රහයේ දිද අපට එවැනි නිර්මාණ හමුවේ.

එදා මෙදාතුර ආදරයෙන් බැඳුන හැම කෙනෙකුට ඒ ආදරය තමන්ගේ කර ගන්නට ලැබුණේ නැත. අත්හැර දමන්නට, අමතකකර දමන්ට වූ අවස්ථා බොහෝය. එහෙත් හිත වදවන්නේ ම, හිත රිදවන්නේ ම එවැනි අත්හැරුණු ප්‍රේමය ළඟය. මේ එවන් සිද්ධියකි. මාතෘකාව "හිත තාම ආදරෙයි රිදුම් දුන් ඔය පෙමට" කවිය කියවාගෙන යන විට මෙසේ සිතේ. ඒ අත්හැරුණ ප්‍රේමය වෙනුවෙන් කථකයා කොතරම් නම් විඳවන්නට වදවෙන්නට ඇතිදැයි කියාය.



"මහා කළු ගලක් වුව
කිරි ගැහෙනා තරමට
මං දුන්න ආදරේ පාට මදි වුණි නුඹට
මැවු ලෝකය ම දෙදරවා වැටෙද්දි දෙපා මුල
පණ කෙන්ද ඉතිරි වුණෙ පූරුවෙ පිං වලට...
එකම එක වතාවක් තුරුළු වී පපුතුරට
වෙන්වෙන්න විතරමයි ඉල්ලුවේ මං නුඹට
ඒ පපුව මත තබා ඇගෙ කොපුල් හුරතලට
එතකොටත් නුඹ ගිහින් නොකියාම ඇගෙ ලොවට..
සිහින බිඳලා ගිහින් දිය වෙලා එහි පාට
දරා ඉන්නේ කොහොම සඟවාන මුළු ලොවට
ඉඳහිටක මුණ ගැහී හිනැහුණත් ඔච්චමට
හිතතාම ආදරෙයි රිදුම් දුන් ඔය පෙමට"

යුද්ධය ගැන අලුත් පරම්පරාවට දැනුමක් නැත. ඇතැම්විට මේ කියන අය ඉපදිලාවත් සිටින්නට නැතිවා වන්නට පුළුවන. ඡායාරූපයක සිටින සිය 'රණවිරු පියා' දරුවාට නාම මාත්‍රයක් පමණි. පුතු සිටින්නේ සෙල්ෆි ගසන යුගයකය. එහෙත් යුද්ධයක් දැක නැති දරුවා යුද්ධයෙන් සිය පියා අහිමි වීමේ, පියෙකු නැති තනිකමේ වේදනාවෙන් පෙළෙන්නෙකි. අත්තම්මා යුද්ධය ගැනත් සිය පුතු යුද්ධයෙන් මිය ගිය බවත් දරුවාට කියන කතා ඔස්සේ තම පියාද විරුවෙක් බව සිතන දරුවා සිතන්නේ පියා කවදා හෝ ගෙදර ඒවි යැයි කියාය. එවන් අත්දැකීමක් චම්පා සිය කවියකට ගැළපූ අයුරුය මේ. මාතෘකාව 'එනවාද ගහන්න සෙල්ෆියක්'



චම්පා කුමාරි දිසානායක

සුදු මල් මාලේ එල්ලගෙන
හැමදාම බිත්තියේම යි
කිසිදාක ඔබ හමුවී නැතත්
ඔය හිනාවට හිත පිරෙයි...

ඒ කාලේ අන්තිම ටිකලු
යුද්ධයේ උඩපැත්තෙ
අත්තම්මා කීව විදියට
ආවේ පෙට්ටිය සීල් කරලලු...

මහා ගල් කණු අතරෙ
දවසකුත් හමාරක් ඇවිදලා
අන්තිමේ හවසකදි හමු වුණා
ස්මාරකයෙ ඔය නම ලියවිලා...

ඉඳහිටක දකිනවා මහ රෑට
අම්මා ඉකි බිඳ හඬනවා
වැරැද්දක් නොකළ මගෙ හිත
ඔබට හීනෙන් බණිනවා...

අත්තම්මා කී කතාවල නම්
වීරයා මැරැන්නෑ කවදාකවත්
ඔබ වීරයෙක් මං දන්නවා එය
ඒත් ඇයි මේ තරම් කාලයක්...

තාත්තේ;
ඔයා වීරයෙක් හින්දා ඇත්තම
හෙට අනිද්දාට ගෙදර ආව ම
විසිකර ඔය වතු සුදු මාලේ මිදුලට
එනවාද ගහන්න සෙල්ෆියක් මා එක්ක...

සීල්කළ පෙට්ටියක ගෙදරට ගෙනා නිසා මිනිය ඔහුගේම දැයි මේ කවියේ දරුවාට විශ්වාසයක් නැත. ඒ විශ්වාසය ගොඩ නගා ඇත්තේ අත්තම්මා හා අම්මා විසින් විය හැක. කාලයක් ගියද තාත්තා යළි පැමිණේවි යැයි බලාපොරොත්තුවෙන් සිටින දරුවකුගේ සිතුවිලි කඳිමට මතුකර දක්වන්නට කිවිඳිය උත්සාහ දරා ඇත. 'හදවතක් ඇති වලාවක්' කාව්‍ය සංග්‍රහයේදි අපට චම්පාගේ තවත් කවි හමුවේ. දිග කවි අතර කෙටි කවි ද හමුවේ. මේ කෙටි කවි වලට මාතෘකා නැත. එහෙත් මහා අරුතක් කීමට, පාඨකයාට බොහෝ දේ කියන්නට ඒ කෙටි කවි වලින් ඇය උත්සාහ දරා ඇත.

සිරිපාදේ යෑම ලේසි පහසු ගමනක් නොවේ. නමුදු බොහෝ දෙනා සියලු බාධක, අමාරුකම් පසෙක ලා මඟදි වෙන දුක් තැවුල් පීඩා විඳ ගනිමින් කඳුසිරස දක්වා දුෂ්කර ගමනක යෙදේ. අවසානයේ සිරිපතුල මත නළල බිම තබා වැඳ නමස්කාර කරති. මේ අතර යෞවනයෝ ද යෞවනියෝ ද වේ. එහෙත් සිරිපතුල වඳින ඔවුන්ගෙන් කෙනෙකු ඇතැම්විට තම මව පියාගේ පා නොවඳින්ට ඇත. චම්පා 'සමනලුන්' යැයි හඟවමින් කියන්නට උත්සාහ දරන්නේ ඒ කතාව යැයි අනුමාන කරමි.

'තරණය කර වැන්දාට
සිරිපතුල් ගල හැමදාම
සමනලුන් වැඳ නැහැ
මවු දෙපතුල් කිසි දාක'

'හදවතක් ඇති වලාවක්' කාව්‍ය සංග්‍රහය අහස මීඩියාවර්ක්ස් ප්‍රකාශනයකි.

## වියපත් කඳුළ

වැල් ඇඳ රැඳුණු ගේ දොරකඩ පියස යට
දැල්වෙන ලාම්පුව මදි එළිය අඳුරට
වල් බිහිවුණු මිදුල කසළය ගෙය අවට
මල් පැල බුදු පහන දෙන සහනෙකි සිතට

නික්මී ගිහින් සිරිදුව යළි නොඑන' යුරු
එක් යුගයක් නිමාවී රසබර සොඳුරු
දුක්බර ලොවට පාළුව රජයන අඳුරු
සක්විති සුව කුමට සිතකට කඳුළු පිරු

සුවඳැල් සහල් බත මුළුතැන් ගෙයි ඉදුනී
මුවරැඳි සිනා විසිරී මුළු ගෙය පිරුනී
අවසන් සුසුම් පොද නෙත් කඳුළින් ඇඳුනී
සුවබර අතීතය දුක් අඳුරින් වෙළුනී

වියා පැදුරු මලු රෑ පානේ නොනිඳ
දයාබර මවකි දරු සෙනෙහස නොමඳ
සොයා බැලූ සුව දුක මවුගුණ සුවඳ
ගියා නොඑන ගමනක මතකය නොසිඳ

එක පහනක් නිවී දුන් එළිය ගෙයකට
රැකවල් කරයි පාළුව හැමතැනක සිට
විකසිත මලකි සුවඳකි පෙර දිනයකට
දුක හුරු මතක සවියකි වියපත් සිතට

**ශාරිකා කරුණාතිලක**

## එඩිතර හිටිවන කිවි නද

සම නොළ මුදුන් නැඟ සිරිලක් කවි අඹර
අම තක නොවන ලෙස විහිදුව පද ගැඹර
නම ගිය දසත හිටිවන කිවි තත බඹර
කිම ගිලිහුණේ අකලට සිඳ මුව තඹර

සූවිසි පැයේ හිටිවන කවි කරළි තනා
පැරුසි හපන්කම් 'කඩුවෙල යුගය' ගෙනා
දී නිසි ගමන් මඟ නව පරපුරට මනා
කී රිසි පද පෙළෙකි නොමියෙන මතක දිනා

රටක් වටින සිත එඩිතර ජය කන්ද
පාටක් පැහැද රුපු මත - බල - ඔද බින්ද
අයුක් තියට නො නැමුව හිස - පිට කොන්ද
විමුක් තියෙකි නිලඹර කිවි දද බැන්ද

පොත පත පබැඳ පද වහරෙක ළබැඳි රස
ජනගත කෙරුණු හෙළ ලිව්සැරි අමර බස
ජනහිත දිනුම ඇද බැඳගත් සුහද ලෙස
පරිණත අබිමනෙකි 'ජාතික ඇඳුම' හිස

අකුරට ඇප-කැපව කව්ලැකි සුරැ කීමේ
ඉහපිට කර තබා ජාතික වග කීමේ
කවියට පණ දෙමින් - පණ කවියට දීමේ
මිහිපිට රනකුරෙකි 'ජී.ඇම්' කිවි නාමේ

**නන්දසේන පලිහක්කාර**

## ගඟක අගයක්

නිදහසේ ගලන්න හැකිවූවා නම් මට
නුඹලා කියාවි ද මගේ අගයක්
බාධක ගල් පර මම එන මඟට
වැටෙනවිට පසු බැස්සේ නෑ මම..

මිනිසුන් කරන මගේ වර්ණනාව
බාධක මැදින් ගලන හැටිබලා
ඒ අගය තව තවත් වැඩිවේලා
රළු ගල්පර මත
සුන්දරව ගලනවා තව මම

**ගයාන් ලසන්ත ජයසේකර**

## කණුව යට

පහණ පහර වැද
අඳුර පැතිරුණු කණුව යට
පිණි කඳුළු වැතිරේ
කටු මුල් ඇනෙන
පටු පාර රළු ය..
රිදුම් දේ පය ද සිත ද
හුරු පුරුදු අඳුර වුව
වරදවයි ද මට මඟ..
කොහි ද ඔබ
මේ කිසිත් නො පෙනෙන
කළුවර තුළ

**සුනිල් ලීවානගේ**

# දීපානි

## දීපිකා

නිසල හිමි සඳ
වැලඳ සෙනෙහෙන්
කඳුළු වැගිරූ
කිඳුරඟන ඔබ..

දරා පිරිපත
නොබා නොපැකිල
සටන් බිම හිඳි
දිරිය ළඳ ඔබ..

ගියද සමුගෙන
නොසිතූ මොහොතක
සදා හද රැඳි
මතක පොත ඔබ..!

**තිස්ස නිහාල් වික්‍රමසිංහ**

## නිමා වී නැත

කුණාටුව තවම
මඳක් සැර හැර
අඩු කළා පමණක් ය
සීතලේ ගුලිවෙමින්

හිම කබායට තුරුලු වී
තැබෑරුම වෙත
වීදියේ ඇවිද යමි
පිරූ විත අතින් ගෙන

තනිවෙමින් නුඹ සමඟ
මධු විතට බැඳී යමි
කොතෙක් මීවිත මත් කලත් මා
නුඹ තරම් මා මත් කරන්නට

පුරා ගත් මීවිතක්
සොයාගන්නට
නො හැකි විය
තවම මට

**ඉරේෂා දුලාංජලී කල්දේරා**



# කවි සිඳිතින්

සංස්කාරක - ඉනෝකා සමරවික්‍රම

## පපෙන මල

ගසට ආඩම්බරයක්
පරිසරයට සුන්දරත්වයක්
අත්තට මහ ගෞරවයක්
පිපෙන මල
මුදු මෙළෙක නව්‍ය බව
ලොව සුවඳ බව
අත්තට මහ ගෞරවයක්
පිපෙන මල
ගොස් කාරිය වනුයේ
මල රැක ගැනිමයි නිතැතිව
මුනිඳු පුදන තෙක් රැක ගත යුතුය
පිපෙන මල

**එල්. කේ. ටී. දිල්රංගි**

## සඳවත

දයාබර සඳවත
ඔබ නොදැක ඉන්න
බෑ මට
ඔබ අදම එන්න
අහසට
මට එළිය දෙන්න
සැමවිට

**ඉසුරි අසන්ති**

## අපි සිනහ වී ඉමු

ළසෝ තනුවක එති ඉන්නම්
මිහිරි පද පෙළ ගීතයේ
අපි සිනහ වී ඉමු...

හිත හදන්නට
පොඩි පැටවුගේ
සිත් බිඳී ගැටෙතෙයි
දළ රළක් සේ
මෘදු හැඟුම් පෙන්වමු..

හසරැල් මුවේ
හිත් ළාමකයි
පොඩි පැටවුන්ගේ
මේ හැඟුම් රුදුරුයි
සැඩ සුළං සේ
ආදරේ යයි කියමු
තොල් අග මුවේ
අවිහිංසකයි
පොඩි පැටවුනේ

**චන්දන වෛද්‍යසේකර**

## ජීවිතය මා සොයන......

අඳුරු සළුපට ඉරා දෙපළුවට
හිරු නැගී එද්දි රෑ මැදියමට
රතු නෙළුම් පිපී හිනැහෙන රුවට
බමර ගී නද ඇදෙයි සිතිජයට....

විවර කර මුහුදු තෙර සීරුවට
ගඟක් කරදිය ගලයි ගොඩ බිමට
පාට දේදුනු ඇඳී එක පෙළට
රටා විසිතුරු මවයි නෙතු අගට....

කිඩාරම් මලක සුවඳින් පිපුණ
පිනා යන වාතලය සරසමින
කෑරලෙක් ගයන ගීයක් සැණින
මියුරු සත්සර පුරාලයි සවන...

මතකයත් එකම මිටියට රැගෙන
මුල්ලකින් බැඳ තබා යළි නොගෙන
උදා වූ දිනෙක පලගෙන සිහින
ජීවිතය මට ලැබෙයි මා සොයන..

**මාලා විජේකෝන්....**

## මතක ගඳ-සුවඳ

අතීතයෙ මතක ගඳ සුවඳ
ඔබටත් මතකද සබඳ
ඉදහිට ගමට යන සඳ
මිහිරක් සිතට දැනෙනවද...

මතක සුළඟෙහි වෙළෙන
සුවඳ විලවුන් ගෙනෙන
සුවඳ පරයා දැනෙන
අතීතය ගඳ සුවඳ විහිදෙන...

සිසු සමයෙ උදෑසන
පාසල් බසය එනතුරු
තේ කඩේ ළඟ රැදෙන
සුවඳ කුරක් ගැසූ
කෙසෙල් කැනකින් හැමූ
සුවඳ මතකෙට නගමි...

පාසල් බසයෙ ලංගම
බැටරි පෙට්ටිය ළඟම
අසුනට දැනුණු මජං ගඳ, දුම
අමතක වන්නෙද කොහොම..

පාසලට යන මගෙහි
'කුණු ඇළ'ය නම් දැරූ
කුණු ඇළේ කළු වතුර
හැමූ පල් ගඳ අදද
ඔබටත් දැනෙනවද...

දිවිය පසුපස ඇදෙන
සුවඳ පරයා දැනෙන
දුගඳ වද දෙන තරම්
අරුමය කිමද නොදනිමි..

**සු.ප්‍රි. සමරසිංහ**

## නියඟලා

ගෝමරී එන්න !
නියගලා මල් පිපී ඇති දැයි බලන්න
නියගයෙන් දැවීගිය
මේ හේන් යායේ
කැඩුණු මේ දඬුවැට උඩින් පැන
ගෝමරී එන්න !
නියගලා මල් පිපී ඇති දැයි බලන්න...

වැහිපොදක් නොමවැටී හරියට
ගිනි අරන් මේ හේන් මණ්ඩිය
බිතක්කනයේ පැටව් ගැහුවම
කෙතේ ගොවි ණය
අපේ පැලටත් ඕං හාමත උදාවෙයි !
අපේ පැලටත් ඕං එතකොට ඕන වෙයි !
ගෝමරී එන්න !
නියගලා මල් පිපී ඇති දැයි බලන්න...

වහින පායන අකල් වැහි මැද
වැටී දියවුණු අකුරු ඇහිඳින
පතොක් මල්වන් නොදරුවන්ගේ
මාළිගා බිඳ වැටුණු දවසට
හීන විසිරුණු පොඩි එවුන්ටත් ඕන වෙයි
අපේ පැලටත් ඕං එතකොට ඕන වෙයි !
ගෝමරී එන්න !
නියගලා මල් පිපී ඇති දැයි බලන්න..

රන් කරඬුවක් සේ පිපිලා රුවට රුවින්
සරුවට වැඩී ඇත බව බෝගයක් ලෙසින්
'නගා මැරූ අල' සැඟවැත ලොවට හොරෙන්
තවකෙක් නසනු පෙර උගුලා දමමු ! සැණින්

**අනුර බී. සෙනෙවිරත්න**

**ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට එවන්න. සිළුමිණ, කවි පිටුව, ලේක්හවුස්, කොළඹ 10.**
**edmediaunit@gmail.com**

# මුහුණු පොතෙන් කවියක්

## අමරෙ

මචං අමරෙ
පෙඟිච්ච කොටු කොටු කමිසය
හඬු ඩෙනිමට සෙරෙප්පු දෙක
ට්‍රොස්කි උඹට දීපූ රැවුල
ලෙනින් උඹට දීපූ ඔළුව
චේ ගවේර දීපූ පපුව
ඒ ඔක්කොම අමරසේන
වැඩ වර්ජක...

පාලයියගෙ බාර් එකේ
පරෙයියනුත් බලා ඉන්නෙ උඹ එනකං
නළලෙ ඉදන් බෙල්ල දිගේ
ඉල ඇට උඩිනුත් ගලන්නෙ වොල්ගා ගඟ...
නාඳුනන සොල්දාදුවගෙ සොහොනෙ
පහන් සිල පත්තුවුණෙ උඹේ දෑසේ
මචං අමරෙ.....

පඩි දවසට
පොඩි අඩියට අපි ආවම
උඹේ පුටුව තාමත් හිස්......!

ඒ හිස් බව එක්ක තමයි
සංසාරේ තොටුපළකට අපිත් එක්ක
උඹ ඒ බව දන්නවානේ
නේද අමරෙ.....?

**කුමාර හෙට්ටිආරච්චි**

## කවිය නුඹ!

කුඩා අවදියේ මා
වට කර පහර දුන්නා
ඉගෙනුමේ වර පට සිදින්නත්
මඟට වී නුඹ
බලන් උන්නා
යුගෙන් යුගයට
මගේ සැප දුක
සොයා බැලුවෙන්
කවිය නුඹ මයි..

මගේ අත මිට
උදුර ගත්තත්
මට ම හිතවත්
කවිය ඔබමයි..
මරණ මඤ්චකයේදී
ඔබ හෙට මගෙන්
සමුගෙන යන්න යනවද?
එසේ නැත්නම්
නැවත භවයක
මට ම යළිත්
පහර දෙනවද..

**සූරිය මැදගෙදර**

# විදෙස් කවිය

### නිදි වර්ජිත රැය අවසන

සිටින්නිය බස්නැවතුමට වින් හෙදිය
නිමා කළ ඉක්බිතිව සිය රෑ වැඩමුරය
කිරි පැටවූ රියක් සහ රික්ෂෝවක් යයි
හඳුන්කුරු සුවඳ පොදක් මඟ අතැර
හදිසියකට නිදිඇඳුමෙන්ම ආ වෙදැදුරු
හඬවයි රිය නළාව පිට වන දොරටුව ළඟ
දුවා දස අත වෙහෙස පත් අය
භූගත සිහින අතරින් ඇදෙති අලසව
ගල්පිළිම ලෙස අඩිපාර මත...

දන් ගෙනෙන දන පිළිගනියි මල් වෙළෙඳුන්
පාපැදිවලින් එන සීනු නද හඬ නගයි දසතින්
ප්ලාස්ටික් නෙ`එම් මල් විල් අමතනා විලසින්
දිගැති කොහු මිටක් අතැති වාට්ටුවේ කොල්ලෙක්
දොඩමක්ය සිතා අහුලා ගනියි දොඩම් ලෙල්ලක්
ගෙවුණු රැයේ මදුරුදැළක් දිග හළ කවුරු හෝ අයෙකුට
අමතකව ඇත ගලවා දමන්නට හැරුණු ඇණ අහසට....

තුරුලතා සසල වෙයි
අන්ධකාරය දුරලමින්..
රෝහලේ සියලු දොරවල් මොහොතකින් විවර වේවා
උණ ගැනුණු නෙත් සහිත දරුවන් මගේ තුරුළට
ඇදේවා
හිරු කිරණක පහසින්ම පමණක් සියලු වණ දද මැකේවා
කඳුළුවලින් අප තන මඬලේ කිරි කැටි නොගැසේවා...

(කන්නඩ කවියකු වන ජයන්ත් කයිකිනි විසින් රචිත කාව්‍ය නිර්මාණයක් ඇසුරිනි)

**ජයන්ත් කයිකිනි**

කන්නඩ සාහිත්‍ය ක්ෂේත්‍රයේ නව පරපුර නියෝජනය කරන මුල් පෙළේ කවියකු, කෙටිකතා රචකයකු සහ ගීත රචකයකු මෙන්ම තිරපිටපත් රචකයකු ලෙසද සැලකෙන ඔහු 1955 ජනවාරි 24 වැනිදා ගෝකර්ණ ප්‍රදේශයේදී උපත ලැබීය. කර්ණාටක විශ්වවිද්‍යාලයෙන් ජීවරසායන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් හිමිකර ගැනීමෙන් පසුව මුම්බායි නුවරට සංක්‍රමණය වූ ඔහු වසර කිහිපයක් රසායන විද්‍යාඥයකු ලෙසද සේවය කළේය. සිය ප්‍රථම කාව්‍ය සංග්‍රහය සඳහා වර්ෂ 1974 දී කර්ණාටක සාහිත්‍ය ඇකඩමි සම්මානය හිමිකර ගත් ඔහු 1982, 1989 සහ 1996 වසරවලදී කෙටිකතා සංග්‍රහයන් සඳහාද එම සම්මානය හිමිකර ගත්තේය. ඔහුගේ කාව්‍ය නිර්මාණ සඳහා දිනකර දේශයි නමැති සම්මානයද, ප්‍රබන්ධ නිර්මාණ සඳහා බී. එච්. ශ්‍රීධර් සහ කතා ජාතික සම්මානය ඇතුළු තවත් සම්මාන රැසක්ද හිමිව ඇත. දකුණු ආසියානු සාහිත්‍යය උදෙසා පිරිනැමෙන ත්‍යාගයද ඔහුට හිමි විය.

**අජිත් නිශාන්ත**

දීපානි

# ශෝකයත් රසයක් ද?

## -මහාචාර්ය සුචරිත ගම්ලත්

**දහ අටවන සියවස වනවිට යටත් විජිතවාදය ඔස්සේ ලංකාව මුළුමනින්ම වාගේ බටහිරකරණයට ලක් වෙමින් තිබුණේය යන්න කවුරුත් දන්නා සත්‍යයක් වේ. වඩාත් සැලකිල්ලෙන් බැලුවහොත් අද සමාජ දේශපාලන වාතාවරණයට සාපේක්ෂව එකී කාලය සංක්‍රාන්ති සමයක් වශයෙන් හැඳින්විය හැකි තත්වයක් ද ඇතැයි සිතමි. ඒ අනුව ලංකා සමාජය තුළ පැවැති සාම්ප්‍රදායික කලා උරුමය, සමාජ වටිනාකම්, හි සිට ඇවතුම් පැවතුම් සිරිත් විරිත් පවා බටහිරකරණයත් සමඟ ඉදිරියට යාම නොවැළැක්විය හැකි තත්වයක් වුයේ ය.**

ඉහත තත්වය මෙරට අධ්‍යාපනයට අදාළව ගත් කල්හි වඩාත් වෙසෙස් තත්වයක් වූ බව ද කිව යුතු ය. මක් නිසාද යත් අධ්‍යාපනය වනාහි සමකාලීනව මෙන්ම ඉදිරි පරම්පරාවන් විෂයයිකව අනුලංඝනීය බලපෑමක් කරන්නා වූ ජීවමය සමාජ දේශපාලන ක්‍රියාන්විතයක්ම වන හෙයිනි.

සර් අයිවර් ජෙනිංග්ස් මුල් කොටගෙන එකල බලධාරීන් පේරාදෙනිය විශ්ව විද්‍යාලය සෑදීමට කටයුතු කළේ මෙරට විශ්ව විද්‍යාල පද්ධතියට තවත් මණ්ඩපයක් එකතු කිරීමක් වශයෙන් වුව ද ජෙනිංග්ස් එය නිර්මාණය කළ ආකාරය සහ විශේෂයෙන්ම 60 දශකයේ දී ඉන් බිහි වූ සාහිත්‍ය සමාජ සංවාදය යට කියවුණ බටහිරකරණය යන්න මැනවින් පෙන්වා දෙන කදිම රූපකාර්ථයක් වැන්න.

ඒ අනුව ජෙනිංග්ස් මෙරට සාම්ප්‍රදායික කලා හා වාස්තු නිර්මාණ ප්‍රයෝජනයට ගනිමින් අපූරු ගොඩනැගිලි සමූහයක් විශ්ව විද්‍යාලය වෙනුවෙන් නිර්මාණය කරන්නට කටයුතු කළ අතර බැලු බැල්මට ම එය දේශජ නිර්මාණ කලාවේ ඒ නිසාම මෙරට ජාතික උරුමයේ කේන්ද්‍රස්ථානයක් මෙන් පෙනී ගියේ ය. එහෙත් එසේ නිර්මාණය වුණ එම අධ්‍යාපන නිවස්නය මෙරට පොදු සමාජයට ඉදිරිපත් කළේ ජී. සී. මැන්දිස්ලාගේ මෙරට ඉතිහාසය සම්බන්ධ බටහිරවාදී විශ්ලේෂණයන් ය. ලුඩොවයික්ලාගේ කොයි ආකාරයෙන්වත් මෙරට ජාතික සංස්කෘතියට ආමන්ත්‍රණය නොකරන අනුකරණවාදී බටහිර නාටකයන් ය. විශේෂයෙන්ම පැවති පිරිවෙන් මුල් කොටගත් චිරන්තන සම්භාව්‍ය සාහිත්‍යය පාදක වූ ශාස්ත්‍රීය විෂය හැදෑරීම් නූතන අධ්‍යාපන විෂය මූලිකව ගැනීමේ දී ඉනුත් බටහිරවාදී අනුකරණය හමුවේ සිය ජාතික චින්තනය මතු කරගැනීමට ගත් උත්සාහයන් ලොව බොහෝ දේශයන්හි සිදු වී තිබේ. (අනුකරණවාදියෙකු වීම පහසුය. එහෙත් සිය අතීත ජාතිකත්වයේ මුල් උරුමයන් විමසීමෙන් කටයුතු කිරීම අතිශයින්ම අපහසු කටයුත්තකි.) විප්ලවීය දේශයන්හි පවා ඒ දේ එසේ සිදු වී තිබේ.

පේරාදෙනිය හරහා මතු වූ සමාජ සාහිත්‍යයික සංවාදය අසාර්ථක ව්‍යාපෘතියක් වන්නේ ද එම පසුබිම තුළ ය. තවද එය හේතු කොටගෙන ය. ඔවුහු මෙරට ගැමි නාටකය හැදෑරූහ. ඒ ඔස්සේ ජාතික මට්ටමේ නාට්‍ය සම්ප්‍රදායක් වෙනුවෙන් නිර්මාණ බිහි කළහ. නමුත් ඒ මතුපිටවාදී දේශීය නිර්මාණ සේවය කළේ උගත් මධ්‍යම පන්තිකයන්ගේ විසිත්ත කාමර ආස්වාදය වෙනුවෙන්ම මිස මෙරට පොදු ජාතික ආමන්ත්‍රණයේ සැබෑ නියෝජනය වෙනුවෙන් නොවන බව පැහැදිලිය. එකී නිර්මාණයන්හි අභ්‍යන්තරයේ වූයේ ජාතිකත්වයේ මුල් සිඳුණ විජාතිකත්වයම ය.

එවැනි පසුබිමක ඔවුන් විසින් ගෙන එන ලද මතුපිටින් තවරාගත් ඒ දේශීය කලාව මුල් කොටත් ජාතික සංවාදය ඔවුන්ගෙන්ම බිහි වූ දැවැන්ත උගතුන් දෙදෙනෙකුගේ ප්‍රශ්න කිරීමට ලක් විය. ඉන් පළමුවැන්නා ආචාර්ය ගුණදාස අමරසේකර ය. දෙවැන්නා මහාචාර්ය සුචරිත ගම්ලත් ය. ආචාර්ය අමරසේකර මෙතන දී ජාතික විඥානය මුල් කොටගත් ජාතික චින්තනය පිළිබඳ ගැඹුරු හැදෑරීමක යෙදෙමින් ඇති කළ ගැඹුරු සංවාදය මෙම සාකච්ඡාවට අදාළ නොවන්නේ අප කතා කරන්නේ ඔහු මුල් කොටගත් ඒ සංවාදය ගැන නොවන නිසා ය. කෙසේ වෙතත් ඒ හා සමාන නොවන ආකාරයේ විරෝධතාවක් මහාචාර්ය ගම්ලත්ගෙන් ද මතු වුයේ ය. ඔහු ඒ වෙනුවෙන් යොදා ගත්තේ මාක්ස්වාදී සාහිත්‍ය විචාරයයි. මාක්ස්වාදයේත් ට්‍රොට්ස්කිවාදී හැදෑරීම් ය.

මහැදුරු ගම්ලත්ගේ උක්ත කාර්භාරය ආකාර දෙකකට සමාජගත වූයේ යැයි සිතේ. ඒ අනුව එක් අතකින් විප්ලවවාදී කොමියුනිස්ට් පක්ෂය හා සම්බන්ධ වෙමින්, අතිශය න්‍යායික පදනමක පිහිටමින් ඔහු ලියූ දේශපාලන හා සාහිත්‍යයික ලියවිලි එකී මත අනුව යන්නා වූ සීමිත ක්‍රියාකාරිකයන් අතර ඇති කළා වූ සංවාද වලින් එහාට නොගියේ ය.

කෙසේ වෙතත් මහාචාර්ය ගම්ලත්ගේ ප්‍රාමාණික උගත්කමට විශේෂයෙන් විද්වත් සමාජය තුළ විවාදිතව වුව පිළිගැනීමක් තිබුණි. ඒ නිසාම පොදු ජන මාධ්‍යය තුළ පවා ඔහු මතු කළ සංවාදය ඉදිරියට ගෙන යාම නොසිදු වූ කටයුත්තක් නොවී ය. ඒ සම්බන්ධයෙන් වාරණ පැනවීමක් යනු නොකළ හැක්කක් විය.

විප්ලවාදී කොමියුනිස්ට් පක්ෂය වැනි සීමිත ක්‍රියාකාරීත්වයක් නියෝජනය කළ කම්කරු මාවත වැනි පොදුවේ සමාජගත නොවූ පුවත්පත් වල ලියුව ද ඒ අතරම පොදුවේ සාහිත්‍ය කලා විෂයයිකව ඔහුගේ ප්‍රාමාණික උගත්කම පොදු සමාජයට සංසරණය නොවූයේ යැයි අපට කීමට පුළුවන්කමක් නැත. එහි තේරුම ඔහුගේ ඒ නව ප්‍රවේශය (එහි සීමාන්තික අසීමාන්තික බව කුමක් වුණත්) පැවැති කාලයට සාපේක්ෂව ඇති කළ බලපෑම සංවාදයකට නොගෙන සිටිනවාට වඩා ගැනීමෙන් ප්‍රතිඵලයක් ලැබිය හැකි යැයි සිතමි.

සුචරිත ගම්ලත් යැයි කියන්නේ මෙරට විශ්ව විද්‍යාල පද්ධතිය තුළ ද කැපී පෙනෙන චරිතයක්ය යන්න ද අමතක නොකළ හැක්කකි.

අප මුලින් කතා කළ අන්දමට ඔහු පැමිණෙන්නේ පිරිවෙන් මුල කොටගත් මෙරට සම්භාව්‍ය ප්‍රාචීන උගැන්මෙන් පරප්‍රාප්තියට පත් යැයි කීමට තරම් හැදෑරීමක් ඇතිවය යන්න ඔහු සිය ගැඹුරු පාණ්ඩිත්‍යයෙන් මොනවට පෙන්වා දුන්නේය.

අප එසේ පවසන්නේ කිසිදු අතිශයෝක්තියකින් තොරව ය. විශේෂයෙන්ම සිංහල මුල් කොටගත් ප්‍රාචීන භාෂා හැකියාව, ඉංග්‍රීසි භාෂා දැනීම ද ඊට අදාළ වේ. විශේෂයෙන්ම චිරන්තන සම්භාව්‍ය සාහිත්‍යයේ එන කාලයට ද අදාළ නොවන පමණ ඉක්මවා ගිය වර්ණනා විෂයක්‍රාන්තිමය විෂය කරුණු නූතන විචාර සැතින් මෙන්ම සිය පැරණි හා නූතන උගැන්ම මත පිහිටමින් වීමංසනයට ලක් කළ ආකාරය, ඔහුගේ ඒ ශෛලිය ආපසු හැරී බැලීමට තරම් වටිනා එකක් වේ. "ශෝකයත් රසයක් ද?" මැයෙන් ඔහු ලියූ අපූරු නිබන්ධනයන්හි කදිම උත්ප්‍රාසයකින් මෙන්ම පැසුණු වීමංසනයකින් ඔහු විභාග කරන්නේ යට කියවුණ තත්වයයි.



මහැදුරු ගම්ලතුන් යනු එවැනි පරිපාකයක් තිබූ විද්වතෙකි. විමර්ශකයෙකි. ඒ සම්බන්ධයෙන් විවාදයකින් තොරවම ඔහු සම්බන්ධයෙන් අපට එකඟතාවක් ඇත. එසේ වුව මහාචාර්ය ගම්ලත් යටත් විජිත පැවැත්මත් සමඟ ආ මෙරට ජාතික අධ්‍යාපනයේ විකෘතිය (සර් අයිවර් ජෙනිංග්ස්ලාගේ බටහිරවාදී පය බරවාය) සම්බන්ධයෙන් ඔහු එල්ල කළ බුද්ධිමය ප්‍රහාරය පොදු බලවේගයක් බවට පත් නොවී න්‍යායික වුත්, ඇතැම් විට මූලධර්මවාදී වූත් ආස්ථානයක හුදෙකලා වීම සම්බන්ධයෙන් පොදු උගතුන් තුළින් මතු නොව විශ්ව විද්‍යාල මට්ටමින් වුව විමර්ශනයක් ඇති වීම අපලයක් ලෙසින් නොව සපලයක් ලෙසින්ම ගත යුත්තේ ය.

---

ඇසුර

මොහාන් ශ්‍රියන්ත ආරියවංශ
mohansriyantha@gmail.com

# සමාජ හා සංස්කෘතික අහිමිවීම් මහා වේදනාවකි

## -ෆෙදරිගෝ අන්දහාසි

**පශ්චාත් නූතනවාදය අපට සාහිත්‍යයික විලාසයක් වුණාට එය බිහි කළ අපරදිග ලෝකය එය සැලකුවේ ජීවන විලාසයක් වශයෙන් යැයි අප හා පැවැති හමුවක දී ගාමිනි වියන්ගොඩ පැවසුවේ ය. කෙසේ වෙතත් එවැනි ජීවන විලාසයක් ඒ රටවල එසේ බිහි වීමට පසුබිම් වූ සමාජ දේශපාලන සාධක තිබුණි. නමුත් පසුගිය කාලය පුරා මෙරට ඇතැම් සාහිත්‍යකරුවන් මෙන්ම විචාරකයන් ඒ විලාසය තමන්ට පවරා ගත්තාක් මෙන් කටයුතු කළේ ඊට අදාළ කිසිදු ඓතිහාසික පසුබිමක් නොදැන යැයි සිතේ. එය හරියට අපගේ පරාධීන ඉතිහාසය තුළ දී පෘතුගීසින්, ලන්දේසීන් මෙන්ම ඉංග්‍රීසීන්ගේ විලාසිතාවන් අනුකරණය කළා හා සමාන තත්වයකි. හිස් මිනිසුන් සිය ජීවිතය පුරාම සිදු කරන්නා වූ එකම දේ අනුකරණයයි.**

මේ වන විට ව්‍යවච්ඡේදකයා මැයෙන් සිංහල බසට ද නැගී ඇති කෘතියේ කතුවරයා වන ෆෙදරිගෝ අන්දහාසි ගැන කතා කෙරෙන්නේ ද පශ්චාත් නූතනවාදය නම් පසුබිම තුළ සිටම ය. වරක් ඔහු හා සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීමේ අරමුණින් ඔහු කරා එළඹුන පුවත්පතක විශේෂාංග ලේඛකයෙකු ඒ හමුව ගැන මෙසේ ලියා තිබුණි.

"එක් ප්‍රසන්න සිකුරාදා හැන්දෑවක මට ෆෙදරිගෝ අන්දහාසි මුණ ගැසුනේ බුවනෝර්ස් අයර්ස් හි පිහිටි ඔහුගේ අලංකාර නිවසේ දී ය. පසෙකින් වූ පොත් රාක්කයේ තදබද වූ පොත් අතර ලෝකයේ පළ වී ඇති සෑම නවකතාවක් ම ඇතුවා විය යුතු ය. ඒ අතර සම්භාව්‍ය දර්ශනවාද ගැන ලියවුණ කෘතීන් ද තිබුණි. අපි කෝපි පානය කෙළෙමු."

ඒ අවස්ථාවේ අන්දහාසි සිටියේ සිය බිරියත් සමඟ නගරයෙන් ඈතට සංචාරයක් සඳහා සූදානම් වෙමිනි. සූදානම් වෙන්නේ කොහේ යන්න දැයි පුවත්පත් කලාවේදියා අන්දහාසිගේ ඇසුවේ ය.

"අපි මිෂියෝනාවේ දිය ඇලි තියෙන ඒ ප්‍රදේශයේ ඉඳලා ආවා විතරයි. දැන් මේ පිටත්වෙන්න හදන්නේ මුහුදුබඩ (කොසටා ඩිලිස්ටෙ) කලාපයට. එහෙ අපේ නිවසක් තියෙනවා. වන වැස්මකින් වැහුණ සුන්දර තැනක්. අවසන් කරගත යුතු වැඩ කොටසක් තියෙන නිසා එහි යනවා. ......එහි ගෘහ නිර්මාණ ශිල්පියා ෆර්නැන්දෝ රොබල්ස් වුණත් ඒ නිවසේ බොහොමයක් නිර්මාණ සැලසුම් සිදු වුණේ මාත්, මගේ බිරිඳත් අතිනුයි."

තමන් අලුත් නවකතාවක වැඩ කටයුතු කරමින් සිටින බවත් එය තමන්ගේම චරිතය පාදක කරගත්තක් වීමට ඉඩ ඇතැයි යනුවෙනුත් ඔහු පැවසුවේ ය.


> **ඔහු පෙන්වා දෙන්නේ පුස්තකාලයකට වැදී ඉතිහාසය පිළිබඳව ගවේෂණය කරන්නෙකුගේ කාර්යට වඩා සිය පවුලේ ඉතිහාසය සොයා යන තමන්ගේ මේ වෑයම වෙනස් බව ය. දුෂ්කර බව ය. කෙසේ වෙතත් බුඩාපේස්ට් යන තම සීයා සමාජ ඇසුරක් පවත්වා ඇති බවත්, ඒ තුළම දේශපාලන පක්ෂයක් ද පිහිටුවාගෙන පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට කටයුතු කොට ඇති බවත්, ඔහු පෙන්වා දෙයි.**

"එහෙම ලියන මගේ පළමු නවකතාව මෙයයි. මගේ පවුලේ ඉතිහාසයත් එහිලා ප්‍රකාශ වෙනවා. කාර්යයක් හැටියට නම් එය පහසු නෑ. කතාවේ ආරම්භය තියෙන්නේ මගේ සීයා විසූ බුඩාපේස්ට් නගරයේ. හංගේරියාවෙන් ආරම්භ වුණ ඔහුගේ ජීවන ගමනේ අවසාන නැවතීම තමයි බුඩාපේස්ට්."

පශ්චාත් නූතනවාදී අත්දැකීම උත්පාදනය වන පසුබිම අන්දහාසිගේ ඉහත ප්‍රකාශය තුළ ගැබ්ව නැත්තේ දැයි සිතා බලනු වටී. විශේෂයෙන්ම ලෝක යුද්ධ දෙකකින් පසු අක් මුල් සිඳී මූලික සමාජ සම්බන්ධතා පවා අහිමි ව අවතැන් වූ ඒ කාල වකවානුව වර්තමානයට අදාළව නිසි ප්‍රතිෂ්ඨාවක් මත ප්‍රතිසංස්කරණය කර ගැනීමේ වුවමනාව වෙනුවෙන් පශ්චාත් නූතනවාදය නව මානයක් ලෙසින් ඔවුන් තෝරා ගත්තේ නූතනවාදය හමුවේ ද සිය පැවැත්මේ අර්බුදය නොවිසඳුන පසුබිමක ය.

ෆෙදරිගෝ අන්දහාසි පුවත්පත් කලාවේදියා හමුවේ මෙසේ ද පැවසීය.

"පැවැත්මක් හැටියට සීයා ආකර්ෂණීය ජීවිතයක් ගත කළ අයෙක්. අද වන විට මා මුළුමනින්ම යොමු වී සිටින්නේ ඒ ජීවිතය නැවතත්, මුළුමනින්මත් ගොඩ නගා ගැනීමේ වෑයමකයි. එත් සමඟම කිව යුතුයි, ඔහු සංක්‍රමණිකයෙක්. ඉතාම යහපත්, කරුණාවන්ත මිනිසෙක්. තමන්ගේ ජීවිතයේ දුෂ්කර කාල වකවානු ගැන ඔහු කවදාත් කතා කරල නැහැ පළවැනි හා දෙවැනි ලෝක යුද්ධ දෙකටම ඔහු මැදි වෙනවා. ඔය අතරේ සෝවියට දේශය හංගේරියාව ආක්‍රමණය කරනවා. සීයාගේ ජීවිතයේ මේ කාල වකවානු විවිධත්වය, අද මා සොයා යමින් සිටිනවා."



ඒත් සමඟම තමන්ගේ පියා කවියෙකු බව ද ඔහු පවසයි. ඔහු සිය තරුණ වයසේ දී පියාගේ කාව්‍ය සංග්‍රහයක් පෙරළා බලමින් සිටි අවස්ථාවක පත්තරයක කපාගත් කොටසක් දකියි. ඊට අනුව DAIA (Delegacion De Asociaciones Isrselil as Argentina) නම් සංවිධානයෙන් සීයාට ගෞරව සහතිකයක් ලබා දී තිබෙනවා. ඒත් සමඟම කිව යුතුයි ෂින්ඩ්ලර්ගේ වැන්දඹුව ( නාසීන්ගේ යුදෙව් සංහාරය හමුවේ උපක්‍රමශීලි ලෙස යුදෙව්වන් සිය කර්මාන්ත ශාලාවල සේවයට යොදවා ගනිමින් ඔවුන්ගේ ජීවිත ගලවාගත් ඔස්කාර් ෂින්ඩ්ලර්ගේ බිරිඳ ) ආර්ජන්ටිනාවට කැඳවාගෙන එන්නේත් මගේ සීයාය කියන කාරණය. ඒ බව මා දැනගන්නේ අර පුවත්පත් ලියවිල්ලෙන්. ඒ විතරක් නෙවෙයි හංගේරියාවේ ඔහුගේ නිවස තුළ යුදෙව්වන් විශාල සංඛ්‍යාවකට ඔහු රැකවරණය ලබා දී තිබෙනවා. ඔහු තමන්ගේ පළමු භාර්යාව තෝරා ගත්තෙත් මේ යුදෙව් මිනිසුන් අතරිනුයි. අද මම මේ ඉතිහාසය නැවත ලියමින් සිටිනවා."

කාර්යයක් හැටියට එහි පවත්නා දුෂ්කරත්වය ගැන පැහැදිලි කරමින් ඔහු පෙන්වා දෙන්නේ පුස්තකාලයකට වැදී ඉතිහාසය පිළිබඳව ගවේෂණය කරන්නෙකුගේ කාර්යට වඩා සිය පවුලේ ඉතිහාසය සොයා යන තමන්ගේ මේ වෑයම වෙනස් බව ය. දුෂ්කර බව ය. කෙසේ වෙතත් බුඩාපේස්ට් යන තම සීයා සමාජ ඇසුරක් පවත්වා ඇති බවත්, ඒ තුළම දේශපාලන පක්ෂයක් ද පිහිටුවාගෙන පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට කටයුතු කොට ඇති බවත්, ඔහු පෙන්වා දෙයි. පසුව තානාපතිවරයෙකු හැටියට ද රටවල් ගණනාවකම කටයුතු කොට ඇති බවත්, තමාගේ පොතක් ඔහුට පිරිනමනු වස් හංගේරියාවට ගිය අවස්ථාවේ දී ඔහු කොතරම් බලසම්පන්නව සිටියේද යන්න තමන් දුටු බවත් අන්දහාසි පුවත්පත් කලාවේදියා හමුවේ පවසා ඇත. බෙලා අන්දහාසි නම් ඔහුගේ සීයාගේ උසස් මට්ටමේ ඡායාරූප කිහිපයක්ම තම කෑම කාමරයේ එල්ලා ඇතැයි ද පැවසූ ෆෙදරිගෝ අනදහාසි ඒවා නරඹන්න යැයි පුවත්පත් කලාවේදියාට ආරාධනයක් ද කෙළේය.

පශ්චාත් නූතනවාදය මැයෙන් බොහෝ දෑ පවසන අනුකාරකයන් මෙම සංස්කෘතික ඛේදවාචකය හඳුනනවා දැයි පැහැදිලි නැත. සමාජීය මෙන්ම සංස්කෘතික වශයෙන් තමන්ට වූ අහිමි වීම් සොයා යෑමට පශ්චාත් නූතනවාදීන් ගත් උත්සාහයට අන්දහාසි සිය සීයා පිළිබඳව සිදු කළා වූ යථෝක්ත ප්‍රකාශය මනා නිදර්ශනයක්ම ය. තමාගේ සෑම නවකතාවකම වගේ අතීත සම්බන්ධකම් ඇති බවත්, ඒ අතීතය බොහෝ ඈත කාලයක් විය හැකි බවත් ඔහු පවසන්නේ අර තත්වය තවදුරටත් සනාථ කරමින් යැයි සිතමි. වර්තමාන සංසිද්ධි අනාවරණය කරගත හැකි බොහෝ ආලෝචත් තත්ව ඉතිහාසය තුළ ඇතැයි ඒ තුළම ඔහු තවදුරටත් පෙන්වා දෙයි. විශේෂයෙන්ම පහළට ඇද නොවැටී, මඩෙහි නොඑරී වර්තමානය ගැන කතා කරන්නට අතීතයෙන් මහත් අනුබලයක් ලැබෙන්නේ යැයි ඔහු පවසන්නේ ඔවුන් මුහුණ පෑ ඒ සමාජ සංස්කෘතික ව්‍යසනය තුළ අහිමි වීම්හි වේදනාව දනවමින් නොවේදැයි සිතා බැලීම වටී.

---

# ඒ රාගාධික විචිත්‍රත්වය.... කියග මගිය ඔබ කවුද?

ග්‍රන්ථය- හුදෙකලා තැපැල්කරුවෙකුගේ අරුම දිවි පුවත
පරිවර්තනය- චූලානන්ද සමරනායක
සුභාවි ප්‍රකාශනයකි
මිල රු. 400 (පිටු 151)





"සැබැවින්ම බිලෝඩො යනු කුතුහලයෙන් පිරි තැපැල්කරුවෙකි. ඔහුට කිසි දිනෙක හෝ පුද්ගලික ලිපි ලැබුණේ නැති. එසේ ලැබුණෙ නම් ඔහු සතුටු වන්නට ඉඩ තිබුණු නමුදු ලිපියක් එවන්න තරම් සමීප කිසිවෙකුත් ඔහුට සිටියේ නැත. ඔහු තමන්ටම ලිපි ලියා තැපැල් කරගැනීමට පුරුදු වී සිටියේ වුවද ඒ හැම අපේක්ෂා භංග කරවන තාලේ අත්දැකීමක් පමණි.



චූලානන්ද සමරනායක

එවැනි පසුබිමක ඔහුගේ හැසිරීම කෙබඳු වීද? පරිවර්තක චූලානන්ද සමරනායක මෙසේ පවසයි.

"බෙදා හැරීම පිණිස තමන් අත පත්වන ලිපි රහසින් විවෘත කර කියවන තැපැල්කරුවෙක්. සිය දිවියෙහි ඒකාකාරි බවින් මිදීම සඳහා එවන් විනය විරෝධි සහ සදාචාර විරෝධි ක්‍රියාවකට යොමුවන ඔහුගේ මුළු පැවැත්මම එසේ එක් දිනක විවෘත කරන ලිපියක් හේතුවෙන් වෙනස් වෙයි. -හයිකු- කිසි දිනෙක අසා නොතිබූ මේ වදන පසුපස හඹා යන ඔහුගේ දිවිසැරියෙහි අපූර්ව පුවත අපට ජීවිතය පිළිබඳ වෙනස් මානයක් ඉදිරිපත් කරයි."

ඔහුගේ දිවි සැරිය නම් ඒ හඳුනාගැනීම පුද්ගලවාචී පැවැත්මක් සම්බන්ධයෙන් නිවැරැදි වුවත් "හුදෙකලා තැපැල්කරුවෙකුගේ අරුම දිවි පුවත" නම් මෙම කෘතිය තුළ අර තැපැල්කරුවා අසීමිත සංසාරික විචිත්‍රත්වය නම් ආහ්ලාදය හඹා යන තවත් එකෙක් පමණි. ඒ අනුව ඔහු සිතා සිටින්නා වූ ඔහුගේ පුද්ගලවාචී පැවැත්ම සම්බන්ධයෙන් ඔහුට කිසිදු හිමිකමක් නැතැයි පැහැදිලි වේ. ඔහුට ඉදිරියෙන් ඒ හඹා යෑම තුළ තවෙකෙක් සිටී. ඒ ග්‍රෑන්ඩ්ප්‍රේ ය. තවකෙක් පසුපස තවෙකෙක් වශයෙන් පසුපසින් පැමිණෙන්නෝ ද සිටිති. එහෙත් ඔවුන් අඥාත ය. ඔවුන් හමුවේ ඇති ඒ අසීමිත මායාවි විචිත්‍රත්වය කෘතියේ විස්තර වන්නේ මෙසේ ය.

"මේ ග්වාඩලූපියානු කතගෙන් ලද ලිපි කවර තුළ අන් කිසිවක් තිබුණේ නැත. එහි වූයේ එකම එක කවියක් සටහන් කරන ලද කරදාසි බිටුවක් පමණි.....මේ කවිපද විසින් මුළු නවකතාවක් පරිද්දෙන් කියවන්නා පෝෂණය" කළේ යැයි පැවසේ. ඒ අසීමිත සංසාරික විචිත්‍රත්වය අනිකෙකු නොවේ. ඇය ම වේ. ඒ නිසාම ඇය තවදුරටත් මෙසේ වර්ණනාවට බඳුන්ව ඇත.

"ඉන් පසු එක්වනම දිස්වනුයේ විමතිය දනවන නිසංසලයෙන් යුත් කුඩා මුහුදු බොක්ක, දුඹුරුවන් වෙරළ සහ සිය දෙනයන පරිදිම අහස් නිලෙන් ගැවසී සමුදුරු රළ අතරින් පිහිනා යන සිගොලෙන් ය. රළ තුළින් නැගී, නග්න දෙපියවුරු මත ඇලී ගත් පබළු වන් දිය බින්දු සහ රන්වන් කුස මතින් රූරා බසින සිහින් දිය දහරින් සුවිනීතව මනහාරී ගමනින් ආපසු වෙරළ කරා ඇදෙන්නා වූ සැණින් මේ දෙවන වීනස් දෙවඟන පරයා යෑමට ලහි ලහියේ ඇදෙනා රිවි මඬල..."

මෙවන් විචිත්‍රත්වයක් ඔබ හමුවේ පවත්නා කල්හි (මම එයට සංසාරික ආකර්ෂණය යැයි කියමි.) ඔබේ අවසානය අවිනිශ්චිත යැයි පවසන්නට යමෙකු ඉදිරිපත් වීම පැහැදිලි නැති විකාරයක් වීමට ඉඩ ඇත.

එහෙත් මිනිස් පැවැත්මේ මේ මායාවි විචිත්‍රත්වය අසීමිත වන්නේ කොතරම් පරාසයක් තුළ ද ඒ තුළම පවත්නා ඔබ නොදත් නික්ම යෑම නිර්මාණය කරන්නේ කවරෙක් ද? එය තමාගේම නිර්මාණයක් නොවන්නේ යැයි කෙනෙකුට තර්ක කළ හැකි ය. නැත එය වෙනත් අනපේක්ෂිත ඉරණමකි යන තර්කය ද අර තරමටම (මේ කෘතියට අදාළව) බලවත්ය. ග්‍රෑන්ඩ්ප්‍රේ ඒ හදිසි අවසාන සියැසින් දකින මේ හුදෙකලා තැපැල්කරුවා වන බිලෝඩෝ පත්වන කම්පනය ඉහත කී කරුණ කදිමට නිරූපණය නොකරන්නේද? අනිත් අතට ග්‍රෑන්ඩ්ප්‍රේගේ ඒ හදිසි නැවතීම ඔහුව කොතරම් දුරට කම්පනය කළේද? එහෙත් එසේ වුණාය කියා බිලෝඩෝ ඒ හඹා යෑම අත්හැරියේ ද? නැත ඔහු ද ඒ මඟම ගියේ ය. මෙය වේදිකාවක් මත රඟ දැක්වෙන නාට්‍යයක් ගැන ලියවුණක් නොවේ. එහෙත් ජීවන පැවැත්ම සම්බන්ධයෙන් ප්‍රකට ශේක්ස්පිරියානු හැඟිම් මෙහි ද්වනිත නොවේ යැයි කිව හැක්කේ කාට ද?

කැනඩාවේ ක්විබෙක් ප්‍රාන්තයේ උපන් ඩෙනිස් තෙඑරියෝල් සිය දෙවන නවකතාව වන මෙය ලියන්නේ ප්‍රංශ බසිනි. පසුව එය ඉංග්‍රීසියට නැගෙන අතර සිංහල බසට නැගෙන්නේ ඉන් පසුව ය. මනෝවිද්‍යා උපාධිධරයෙකු වන ඔහුගේ මෙම කෘතිය ආසියානු සමාජ විඥානයට කොතරම් සමීප වන්නේ දැයි සිතෙන විට විමතියක් ද ඇති වේ.

අනුව යමින් මම මෙසේ පවසමි. කෘතියක් වශයෙන් ගත් කල මෙය පවතින්නේ මේ වන විට ඔබ ඒ ගැන සිතා සිටින්නා වූ ආස්ථානයක් වේ නම් එහි නොවේ. එහි නෙවේ ද නොවේ. මෙහි පවත්නා කුතුහලය එය අසීමිත රසාලිප්තයක්ම වන්නේ ය. ඒ සම්බන්ධයෙන් කිසිදු පරිසමාප්තියක් නොලබන තැනකට ඔබව පත් කිරීමට තරම් සාහසිකත්වයක් කතුවරයාට නොතිබෙන්නට ඇත. එහෙත් සිදුව ඇත්තේ එයම ය.

මට වැටහෙන අන්දමට මේ කෘතිය එකම ආකාරෙය් හයිකු කවියකි. ඔබේ කියවීම තුළ ඇත්තේ ඔබ කිසිසේත්ම අපේක්ෂා නොකරන අන්දමේ ගැඹුරු ඇතුළාන්තයකි. එය පැහැදිලි කරගත යුත්තේ ද ඔබම ය.

වෂී 2020ක් වූ අගෝස්තු මස 30 වැනි ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

Tel: 2429351
Mobile: 071 7829018
Email:
Silumina.advt@lakehouse.lk

සිළුමිණ

# අධ්‍යාපන
Education

# ලාංකේය සිසුන් ලොවට ගෙන යන MSU



MSI අධ්‍යක්ෂ ඩී.එස්. පීරිස්

ලොව තරුණ විශ්වවිද්‍යාල 150 අතරේ, 51 වැනි ස්ථානයේ හිඳින Management and Science University හෙවත් MSU, ජාත්‍යන්තර විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීමක් වන,QS World Rank හි 551 වැනි ස්ථානය හිමි කර ගත් විශ්වවිද්‍යාලය ලෙස ද පිළිගැනේ.

එමෙන්ම, ලොව වටා රටවල් 15කදී මධ්‍යස්ථාන 15ක් තුළ ක්‍රියාත්මක, මැලේසියාව මවු රට කර ගත් MSU, ජාත්‍යන්තර විශ්වවිද්‍යාලය ඩිප්ලෝමා පාඨමාලාවල සිට Ph.D උපාධි දක්වා, පාඨමාලා 126ක් පවත්වනු ලබයි.

MSU ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයේ ශ්‍රී ලාංකේය ශාඛාව, MSI හෙවත්, Management and Science Institute නමින්, කොල්ලුපිටිය ගාලු පාරේ අංක 300 දරන ස්ථානයේ පිහිටා තිබේ.

උසස් අධ්‍යාපනයට ලැදි ශ්‍රී ලාංකේය සිසුන් වෙත, MSU වෙතින් ලබා ගත හැකි ප්‍රතිලාභ පිළිබඳ, එහි අධ්‍යක්ෂ ඩී.එස්. පීරිස් මහතා සමග කළ කතාබහක් මේ.

**● රටේ පවතින වාතාවරණය අනුව, සිසුන් උසස් අධ්‍යාපනය වෙත නැඹුරුවීමේ ප්‍රවණතාව කෙබඳුද..**

ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාවලට අනුව, කොරෝනා වසංගතය හේතුවෙන් අධ්‍යාපන ක්ෂෙත්‍රයේ ඇති වූ පසුබෑම, 2-3% ක් තරම් අල්ප ප්‍රමාණයක්. ගූගල් පන්ති කාමර... මයික්‍රොසොෆ්ට් ටීම්... වැනි ඩිජිටල් තාක්ෂණික මෙවලම් නිසා, ගෙවී ගියේ අතිශය දුෂ්කර කාල පරිච්ඡේදයක් වුවත්, අධ්‍යාපනයේ බොහෝ ඉදිරියට ගමන් කරන්නට අපට හැකි වුණා.

ඒ වගේම,සෞඛ්‍යාරක්ෂිතව අධ්‍යාපන ක්‍රමවේද සකස් කරමින් ඉදිරියට එන්නට අපිට අදාළ ආයතනයන්ගෙන් විශාල සහායක් ලැබුණා. ඒ අනුව, සිසුන් සහ බොහෝ දෙමවුපියන් අප වෙත පැමිණෙමින් සිටිනවා. උසස් අධ්‍යාපනයට විදේශගත වන්නට බලාපොරොත්තු වූ බොහෝ සිසුන් මේ වන විට ලංකාවේ ඉඳන්ම ඒ දේ කරන්නත්, වැඩි ප්‍රවණතාවක් ඇති වී තිබෙනවා. අපිත් ඔවුන් ධෛර්යමත් කරන්නේ මේ තත්ත්වය පහ වන තුරු ශ්‍රී ලංකාවේ හිඳ ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු කරගෙන, ඉන්පසු විදේශ ගතවන ලෙසයි. අනික, මේ කාලය තමයි අධ්‍යාපනය වෙනුවෙන් යොදවන්නට හොඳම කාලය.

**● මොනවද මෙහි පැවැත්වෙන අධ්‍යාපන වෘත්තිකයන් සම්බන්ධ ඉහළම පාඨමාලා...**

ශ්‍රී ලංකා මෙඩිකල් කවුන්සිලයේ අනුමත,MBBS පාඨමාලාවට MSU Malaysia වෙත සිසුන් යොමු කරනවා. පෞද්ගලික අංශය මෙන්ම රජයේ ආයතන සහ විශ්වවිද්‍යාලවල අයවලුන් Ph.D උපාධිය අධ්‍යාපනය සිදුකරනවා.

* PhD (MSU- Malaysia Campus)
* MBBS (MSU- Malaysia Campus)
* Masters by Research

Master in Business Administration (MBA).... යන උපාධි පාඨමාලා පිරිනැමෙනවා. මේ වන විට, MSU හරහා බිහි වී සිටින ආචාර්යවරු ප්‍රමාණය 100ට අධිකයි. මහාචාර්යවරු ගණන හතරක්. එය අපට මහත් අභිමානයක්.

**● පිරිනමන උපාධි පාඨමාලා ගැනත් කියන්න...**

***Bachelor (Hons) degree in Hospitalit and Tourism Management**
***Bachelor (Hons) degree in Bio Medical Science**
***Bachelor (Hons) degree in International Business**
***Bachelor (Hons) degree in Event Management**
***Bachelor (Hons) degree in International Business**
***Bachelor (Hons) degree in Human capital Management**
***Bachelor (Hons) degree in Retail Management**

**● එතකොට, ඩිප්ලෝමා පාඨමාලා...**

*** Hospitality and Tourism Management.**
*** Event Management.**
*** Bio Medical Science**
*** Business Management.**
*** Human Capital Management.**
*** Industrial Management.**
*** Accounting.**
*** Retail Management.**

කියන්න තිබෙන වැදගත්ම දේ තමයි, මේ පාඨමාලා සෑම එකක්ම මධ්‍යම පාන්තික පවුල්වල දරුවන්ට ප්‍රවේශ විය හැකි සහ ඉක්මනින් රැකියාවක් කරන්නට බලාපොරොත්තු වන තරුණ තරුණියන් උදෙසා ම සකස් කළ අතිශය ප්‍රායෝගික පාඨමාලා වන බව.




**● මධ්‍යම පාන්තික දරුවන්ට උසස් අධ්‍යාපනයට ප්‍රවේශ වීම සඳහා සකසා තිබෙන පහසුකම් මොනවාද...**

ශ්‍රී ලංකාව තුළ අධ්‍යාපනය සම්පූර්ණයෙන් නිම කරන සිසුන්ට 55-65% ක් දක්වා ශිෂ්‍යත්ව ක්‍රම ක්‍රියාත්මක වනවා. ඒ වගේම, මාසික ගෙවීමේ සැලසුම්... බැංකු ණය පහසුකම් සහ ජාත්‍යන්තර ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමටද අවස්ථාවන් උදාකර දෙනවා. විශේෂයෙන් කිව යුතු දෙයක් තමයි, අප තවමත් මේ පාඨමාලා සඳහා අය කරන්නේ 2012 වසරේ නියමිත ගාස්තු ක්‍රමවේදයයි. ලාභය පදනම් කරගත් ක්‍රමවේදයකට වඩා අපේ අරමුණ වන්නේ, වැඩි පිරිසකට උසස් අධ්‍යාපනය ලබා දීමයි.ඒ සඳහා ප්‍රවේශ විය හැකි සෑම මාවතක් ම විවර කර දීමටයි.

**● මේ සියලු පාඨමාලා, රැකියා වෙළෙඳපොළ සඳහා මොන තරම් ප්‍රායෝගික ද...**

අපේ රටේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වගේ, මැලේසියාවේත් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය අධීක්ෂණය කරන රාජ්‍ය ආයතනයක් තිබෙනවා. එය තමයි, Malaysian Qualification Agency.මැලේසියානු MSU විශ්වවිද්‍යාලයත් , ඒ සියලු නියාමනයන්ට යටත්. ශ්‍රී ලංකාව ඇතුළු ලොව වටා තිබෙන MSU මධ්‍යස්ථාන 15ත්, එම නියාමනයන්ම අනුගමනය කළ යුතුයි. ඔවුන්ගේ ඒ උපදෙස්වලට අනුව සෑම රටක් ම සෑම විටම ක්‍රියාත්මක කළ යුත්තේ, ව්‍යවසායකත්වය පදනම් කර ගත් පාඨමාලා . ඒ අනුව,පාඨමාලා හදාරන අයට කොයි තරම් ඉක්මනින් රැකියාවක් ලැබෙනවාද කියන කාරණය හෙවත්, Employability level පිළිබඳ ඔවුන් වඩාත් සැලකිලිමත්. අනෙක් අතට, Employability level යනු, උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සාර්ථකත්වය මනින ප්‍රධාන නිර්ණායකයක්. එම නිර්ණායකයට අනුව,MSU වෙතින් උසස් අධ්‍යාපනය හැදෑරූ සිසුන්ගේ රැකියා ලැබීමේ ප්‍රවණතාව 98%ක්.

එයට බලපාන ප්‍රධාන හේතුව තමයි,මෙහි ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ උපාධි පාඨමාලාවක් හදාරන කිසිවකු මේ විෂය ක්ෂේත්‍රයට පමණක් කොටු වන්නේ නැහැ. ඔවුන් සෑම කෙනෙක්ම Marketing... Human Resources...InformationTechnology... Economics...සහHospitality...යන අමතර විෂයයන්ගෙන් පෝෂණය වනවා. තෝරා ගන්නා ඩිප්ලෝමා හෝ උපාධි විෂය කුමක් වුවත්, මේ සෑම අංශයක් පිළිබඳවම MSU සිසුන් දැනුවත්. ඉතින්, රැකියාවක් සඳහා ඉල්ලුම් කිරීමේදී, ඔවුන් ලබා ගෙන තිබෙන මේ අමතර දැනුම සහ සුදුසුකම් බොහෝවිට සාධනීයව බලපානවා.

ඒ වගේම, සෑම පාඨමාලාවක්ම සම්පූර්ණයෙන්ම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වීම තුළ, අඩු දැනුමක් සහිතව එන සිසුවකු වුණත් පාඨමාලාව සම්පූර්ණ වන විට ඉංග්‍රීසි දැනුමෙන් පොහොසත් සිසුවකු බවට පත්වනවා. සිසුවාට අවශ්‍යම ඒ පසුබිම, පාඨමාලාව පැවැත්වෙන මුළු කාලය පුරාම අප සකසා තිබෙනවා.

**● ව්‍යවසායකත්ව පාඨමාලා නිර්මාණයේ දී, ශ්‍රී ලාංකේය රැකියා වෙළෙඳපොළ තුළ සලකා බැලෙන කාරණා කෙබඳුද...**

අප සෑම විටම කර්මාන්ත ක්ෂේත්‍රය සමග දැඩි සබඳතාවක් පවත්වනවා. ඉදිරි වසර පහ තුළ වැඩිම ඉල්ලුමක් ඇති වන්නේ, කුමන ආකාරයේ රැකියා සඳහා ද..., යන කාරණය පිළිබඳ, ඔවුන් හා සමත් සමග එක්ව අධ්‍යයනය කරනවා. ඒ අනුව, වසර දෙකකට සැරයක් විෂය නිර්දේශ යාවත්කාලීන කරනවා. එය ශ්‍රී ලාංකේය හා ජාත්‍යන්තර කර්මාන්තකරණයට අදාළ සම්මිශ්‍රණයක්. විශේෂයෙන්, Hospitality කියන විෂය හදාරණ සිසුන්ට, මේ වන විට මැදපෙරදිගින් විශාල ඉල්ලුමක් ගොඩනැගෙමින් පවතිනවා. සංචාරක සේවය වගේම, ආගන්තුක සත්කාරක සේවාවන් එයට ඇතුළත්.එය ඉතාමත් පුළුල් විෂයක්.

ඒ වගේම, සම්පූර්ණ පාඨමාලා කාලයෙන් අඩක් හෝ මෙහෙ ඉගෙනගෙන වැඩිදුර උසස් අධ්‍යාපන කටයුතු සඳහා විදෙස්ගත වන සිසුන්ට, ඒ රටවලදී part time jobs සොයා ගැනීමේදී, තමන්ගේ හැකියාවට ගැළපෙන ආකාරයේ රැකියා සොයා ගැනීම පහසුයි. එසේ නැත්නම්, මුළු කාලයම එහි ගත කළ විට, නවපඛ time රැකියා වෙනුවෙන් ඔවුන්ට සිද්ධ වෙනවා, ලැබෙන ඕනෑම දෙයක් කරන්නට. එය සමහරවිට ආකැමැත්තෙන් කරන දෙයක් වෙන්නත් පුළුවන්. නමුත් අපගේ ඩිප්ලෝමා හෝ උපාධි අර්ධ වශයෙන් හදාරූ සිසුන්ටද එම රැකියා වෙළඳපොළ තුළත් හොඳ ඉල්ලුමක් ගොඩනැගෙනවා.

**● MSU ශ්‍රී ලංකා මධ්‍යස්ථානයේ විදේශ සිසුන් ඉගෙන ගන්නවාද...**

ඔව්, ලංකාවේ ඉගෙන ගන්න, මාලදිවයින් සිසුන් විශාල උනන්දුවක් සහ නැඹුරුතාවක් දක්වනවා. විශේෂයෙන් Hospitality හා BioMedical කියන උපාධි පාඨමාලා සඳහා සිසුන් විශාල ප්‍රමාණයක් සහභාගී වී තිබෙනවා.

**● එතකොට උපාධි පිරිනැමෙන්නේ කුමන රටේදී ද...**

මෙහි විෂය නිර්දේශය නිර්මාණය කරන්නේ මැලේසියාවෙන්. අදාළ විභාග සකස් කරන්නේ මැලේසියාවෙන්. අවසානයේ උපාධි පිරිනැමෙන්නේ ද මැලේසියාවෙන්. ඔවුන්ගේ නායකත්වය යටතේ,



MSU /MSI සභාපති,මහාචාර්ය ශුක්‍රි

ලොව පුරා සිසුන් 24000ක්, ඉගෙනුම ලබනවා. මේ සියලු දෙනා උපාධි ප්‍රදානෝත්සවය සඳහා, සිය දෙමවුපියන් ද සමග මැලේසියාවට ගෙන්වනවා.හේතුව, එතුලින් සිසුන්ට අන්තර්ජාතික නිරාවරණයක් (international Exposure) මෙන්ම තමන්ගේ ප්‍රධාන විශ්වවිද්‍යාල සිසුන්, කථිකාචාර්යවරුන්, අධ්‍යක්ෂක මණ්ඩලය හා සම්බන්ධ වීම සහ අවසානයේ අභිමානවත් උපාධි පිරිනැම්මේ උත්සවයකට සහාගිවීමේ අවස්ථාව උදාකිරිමයි.

**● සිසුන් සමග එක්ව සිදු කරන සමාජ සද්කාරක සේවා ව්‍යපෘති පිළිබඳවත් ඔබ කීවා...**

ඔව්. අපිට අවශ්‍ය, විෂය දැනුමෙන් පමණක් පිරිපුන් කෙනෙක් නෙවෙයි.රට ගැන හිතන... හැඟීම් දැනීම් ඇති... පරිත්‍යාගශීලී සෑම අතින් පිරිපුන් මනුෂ්‍යයෙක්. එවැනි පුද්ගලයකු ලෙස ඔවුන් සමාජගත වනවා දැකීමයි, අපගේ අරමුණ. ඒ සඳහා, සෑම වසරකම අප විශාල සමාජ සත්කාරක සේවා ව්‍යාපෘති ප්‍රමාණයක් ක්‍රියාත්මක කරනවා. ඩෙංගු මර්දන වැඩසටහන්.. වෙරළ පිරිසුදු කිරීම්...දුෂ්කර පාසල් වෙත පොත් පත් ප්‍රදානය කිරීම්... සහ පැළ සිටුවීමේ ව්‍යාපෘති සඳහා අපගේ සිසුන් නිබඳ දායක වනවා. මේ සියලු ක්‍රියාකාරකම් සදහා, ඒ අයම සංකල්පයක් ගොඩනගලා, එයින් යම් ආදායමක් උපයාගෙන, ඒ මුදල්වලින් තමයි, සමාජ සත්කාරක සේවා ව්‍යායාපෘතිය ක්‍රියාවට නංවන්නේ.



මේ කාරණාව තුළ, ඔවුන්ගේ සමගිය සහ ආකල්පමය වෙනස ඔවුන් විසින් ම වර්ධනය කරගන්නවා. තමන්ගෙන් සමාජයට සිදු කළ හැකි දායකත්වය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නවා. තමන්ගේ කටයුතු කරගන්නා අතරතුර , තමා වටා සිටින අඩුපහසුකම් ඇති අය පිළිබඳ සිතන්න පුරුදු වෙනවා. එයයි,අපට අවශ්‍යත.

ඒ වගේම, ඔවුන්ගේ කුසලතා එළි දක්වන, ඔවුන්ගේ විභාග ලකුණු ඇගැයීමට ලක් කරන, කුසලතා ඇගැයුම් උත්සවයක් ද අප පවත්වනවා. එය මැලේසියානු අධ්‍යක්ෂ මණ්ඩලයත් සහභාගී වන, ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ප්‍රාසාංගයක. සිසුන්ගේ සිතිවිලි උද්දීපනය කරන සහ ආකල්පමය වෙනසක් ඇති කරන මෙවැනි ක්‍රියාකාරකම් තුළින් අප බලාපොරොත්තු වන්නේ, දැනුම සහ ආකල්පවලින් පරිපූර්ණ පුරවැසියකු ලොවට දායාද කිරීමයි.

ඉනෝකා පෙරේරා බණ්ඩාර




## විද්‍යාවේදී (වැවිලි කළමනාකරණය) බාහිර උපාධි පාඨමාලාව
## 16 වන කණ්ඩායම ( 2021 -2023)
## කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය
## ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය පවත්වනු ලබන විද්‍යාවේදී වැවිලි කළමනාකරණය පිළිබඳ බාහිර උපාධි පාඨමාලාවේ දහසය වන (16) කණ්ඩායම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**ඇතුළත්වීමේ සුදුසුකම්**

පහත සඳහන් සුදුසුකම් වලින් එකක් සහිත වැවිලි කළමනාකරණ ක්ෂේත්‍රයට හෝ කෘෂිකර්ම ක්ෂේත්‍රයට සම්බන්ධ විධායක නිළධාරීන් හෝ වැවිලි කරුවන් හෝ වැවිලි කළමනාකරණ ක්ෂේත්‍රයට හෝ කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ ආයතනවල නිළධාරීන් හට අයදුම් කළ හැකි ය.

අ) උසස් ජාතික වැවිලි කළමනාකරණ ඩිප්ලෝමාව (HNDPM) සමග වැවිලි කළමනාකරණ ක්ෂේත්‍රයේ හෝ අදාළ ක්ෂේත්‍රයක වසරක (01) පළපුරුද්ද සහිත වීම.

හෝ

ආ) ජාතික වැවිලි කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (NDPM) හෝ ජාතික වැවිලි ව්‍යාප්ති කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (NDPEM) සමග වැවිලි කළමනාකරණ ක්ෂේත්‍රයේ හෝ අදාළ ක්ෂේත්‍රයක වසර දෙකක (02) සේවා පළපුරුද්ද සහිත වීම.

හෝ

ඇ) වයඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් අනුමත කරනු ලබන අනෙකුත් කෘෂිකාර්මික අධ්‍යාපන ආයතනයකින් පිරිනමන මාස දොළහකට (12) වඩා වැඩි වෙනත් කෘෂිකර්ම ඩිප්ලෝමාවක් සමග වැවිලි කළමනාකරණ ක්ෂේත්‍රයේ හෝ අදාළ ක්ෂේත්‍රයක වසර තුනක (03) සේවා පළපුරුද්ද සහිත වීම.

හෝ

ඈ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විද්‍යා, ගණිත, වාණිජ යන විෂය ධාරා වලින් හෝ කේම්බ්‍රිජ් හෝ එඩෙක්සෙල් උසස් පෙළ විභාගයේ දී එක්වර විෂයයන් තුනක් (03) ක් සමත් වීම සමග වැවිලි කළමනාකරණ ක්ෂේත්‍රයේ හෝ අදාළ ක්ෂේත්‍රයක වසර හතරක (04) සේවා පළපුරුද්ද සහිත වීම.

**අයදුම්කරුවන් අයදුම් පත්‍ර බාර ගන්නා අවසන් වන දිනට අවුරුදු 24 සම්පූර්ණ කර තිබිය යුතු ය.**

**බඳවා ගැනීමේ පටිපාටිය** : ඇතුළුවීමේ සුදුසුකම් සපුරාලන ඉල්ලුම්කරුවන් මූලික කෘෂිකර්මය හා ඉංග්‍රීසි භාෂාව ඇතුළත් ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයට ඉදිරිපත්විය යුතුයි. විෂයයන් දෙක සඳහාම අවම වශයෙන් 40% ලකුණු ලබාගන්නා අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ඉහත ඇගැයීම් වලින් සාර්ථක අපේක්ෂයින් පාඨමාලාව සඳහා බඳවාගනු ලැබේ.

**පාඨමාලා අධ්‍යයන කාලය** : අධ්‍යයන වර්ෂ 03 කි (2021 – 2023)

**පාඨමාලා මාධ්‍යය** : පාඨමාලාවේ අධ්‍යයන කටයුතු ඉංග්‍රීසි මාධ්‍යයෙන් දුරස්ථ අධ්‍යාපන ක්‍රමය යටතේ පවත්වනු ලැබේ. මුද්‍රිත පාඨමාලා පෙළ පොත් සපයනු ලැබේ.

**පාඨමාලාවේ ගාස්තු** : රු. 200,000/- කි. (ලියාපදිංචි වීමේදී රු. 50,000/- හා ඉතිරිය වාරික 5 කින් ගෙවිය යුතු ය).

**පාඨමාලා ආරම්භය** : 2021 ජනවාරි

අයදුම්පත්‍ර ලබාගැනීම සඳහා පැමිණ හෝ ලිපිනය ලියන ලද රු. 45/- ක් වටිනා මුද්දර ඇලවූ (9"X4") ලිපි කවරයක්, **සහකාර ලේඛකාධිකාරී, කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, මාකඳුර, ගෝනවිල (NWP)** යන ලිපිනයට එවීමෙන් හෝ වයඹ විශ්වවිද්‍යාලයෙහි නිල වෙබ් අඩවිය වන **www.wyb.ac.lk** (News & Events) වෙත පිවිසීමෙන් ලබා ගත හැකි ය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් සියලු සහතිකවල පිටපත් සහිතව මහජන බැංකුවේ මාකඳුර ශාඛාවේ **137 – 1 - 001 - 2 - 0000171** දරණ ගිණුම් අංකයට **රුපියල් 1,000/-** බැර කරන ලද රිසිට්පත සමග ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ පාඨමාලාවේ නම සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් 02.10.2020 වන දිනට ප්‍රථමයෙන් **සහකාර ලේඛකාධිකාරී, කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, මාකඳුර, ගෝනවිල (NWP)** යන ලිපිනයට එවිය යුතු ය. අසම්පූර්ණ සහ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේඛකාධිකාරී,
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, කුලියාපිටිය.

Tel: 2429351
Mobile: 071 7829018
Email:
Silumina.advt@lakehouse.lk
සිළුමිණ

# අධ්‍යාපන
Education

## ඇට්ලස්, සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳ පාසල් සිසුන් දැනුම්වත් කරයි



COVID-19 වසංගත තත්ත්වයෙන් අනතුරුව පාසල් යළි විවෘත කෙරෙන පසුබිමක් තුළ අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ අත්වැල් බැඳගනිමින් ඇට්ලස් සමාගම සෞඛ්‍යය සහ ආරක්ෂාව පිළිබඳ දරුවන් දැනුම්වත්කිරීමට ඉදිරිපත්ව සිටී. ඒ අනුව, පාසල් දරුවන් COVID-19 වසංගතයෙන් ආරක්ෂා කිරීමට අවශ්‍ය සනීපාරක්ෂක සහ ආරක්ෂක ක්‍රමවේද පිළිබඳ ඔවුන් දැනුම්වත් කිරීමට මෙන්ම යහපත් සෞඛ්‍ය පුරුදු ඔවුන් තුළ ඇතිකිරීමට ද ඇට්ලස් සමාගම අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව විවිධ වැඩසටහන් රැසක් ක්‍රියාත්මකකර ඇත.

COVID-19 වසංගතයෙන් ආරක්ෂා වීම පිළිබඳ පොත් පිංච සහ සෞඛ්‍යය සහ ආරක්ෂාව මෙන්ම යහපත් සනීපාරක්ෂක ක්‍රමවේද සිය ජීවන ශෛලියේ කොටසක් බවට පත්කර ගැනීම පිළිබඳ දරුවන්ට කියාදෙන 'ඇට්ලස් සුරු විරු' අන්තර්ජාල හා ජංගම දුරකථන යෙදවුම (Mobile App) ද එම වැඩසටහන් අතර වෙයි.

මෙම වැඩසටහන් මාලාව පිළිබඳ අදහස් පළ කරමින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් එන්. එච්.එම්. චිත්‍රානන්ද මහතා සඳහන් කළේ, දරුවන්ගේ අනාගතය සාක්ෂාත් කිරීම සඳහා ඔවුන්ට ශක්තිමත් අධ්‍යාපනික අඩිතාලමක් යෙදීම අත්‍යවශ්‍ය බවය. කෙසේවෙතත්, වර්තමානයේ දරුවන්ට අධ්‍යාපනය ලැබීමට සිදුවී තිබෙන්නේ නව අභියෝගවලින් යුතු පරිසරයක බැවින් දරුවන් හැකි ඉක්මනින් එම පරිසරයට හුරු කිරීමට සිදුවී තිබෙන බව ද ඒ මහතා සඳහන් කළේය.

## SLIM නව සභාපති සමඟ 50 වැනි වසරට නව විධායක කමිටුවක්



ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ (SLIM) 50 වැනි වාර්ෂික මහ සභා රැස්වීම, රජයේ සෞඛ්‍යාරක්ෂණ නීති අනුව 2020 ජූනි මස 26 වැනිදා කොළඹ මරීනෝ හෝටලයේදී පැවැත්විණ. එහිදී SLIM 50 වසරක අභිමානවත් ගමන් මග තුළ පත්වූ 42 වැනි සභාපතිවරයා ලෙස රොෂාන් ප්‍රනාන්දු මහතා තේරී පත්වූ අතර 2020/2021 වසර වෙනුවෙන් නව කළමනාකාරිත්ව මණ්ඩලයක් හා විධායක කමිටුවක්ද එහිදී තෝරා පත් කරගන්නා ලදී.

SLIM නව සභාපතිවරයා ලෙස පත් වූ රොෂාන් ප්‍රනාන්දු මහතා දෙරණ මාධ්‍ය ජාලයේ අලෙවි සාමාන්‍යාධිකාරීවරයා ලෙස කටයුතු කරනු ලබයි. ඔහු ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළ මාධ්‍ය ආයතන රැසක සාර්ථකත්වය උදෙසා කැපී පෙනෙන දායකත්වයක් දැක්වූ කළමනාකාරිත්ව වෘත්තිකයෙකි. රොෂාන් මහතාගේ අලෙවිකරණ වෘත්තියවේදී කුසලතාව Certified Professional Marketer (Asia) (Asia Marketing Federation) සහ Practising Marketer (SLIM) යන දෙස් විදෙස් අලෙවිකරණ වෘත්තීය සුදුසුකම් දරන අතර, ඔහු ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ මෙන්ම මහා බ්‍රිතාන්‍යයේ වරලත් අලෙවිකරුවන්ගේ ආයතනයේ (CIM) ගෞරවනීය සාමාජිකත්වයද ලබා ඇත.

මයික්‍රෝසොෆ්ට් ශ්‍රී ලංකා හි දකුණු ආසියාතු නව වෙළෙඳපොළ අලෙවි හා සන්නිවේදන කළමනාකාර තිලංකා අබේවර්ධන මහත්මිය ව්‍යාපෘති පිළිබඳ උප සභාපතිනිය ලෙසත් Arinma Holdings (Pvt) Ltdහි ව්‍යාපාර සබඳතා හා සන්නිවේදන අංශ ප්‍රධානී නුවන් ගමගේ මහතා අධ්‍යාපන කටයුතු පිළිබඳ උප සභාපතිවරයා ලෙසත් තේරී පත්විය. Hemas Pharmaceuticals (Pvt) Ltd සහ Hemas Surgical & Diagnostics (Pvt) Ltdහි අධ්‍යක්ෂ විකුණුම් චින්තක පෙරේරා මහතා නව ලේඛකාධිකාරී ලෙසත් සිංගර් ශ්‍රී ලංකා සමාගමේ ජ්‍යෙෂ්ඨ සන්නාම කළමනාකාර ගයාන් පෙරේරා මහතා සහකාර ලේඛකාධිකාරී ලෙසත් එහිදී තේරී පත්විය.2020/2021වසර සඳහා භාණ්ඩාගාරිකවරයා ලෙස HMD Global Inc ක්ෂේත්‍ර සේවා අංශ ප්‍රධානී ආචාර්ය ජයන්ත දේවසිරි මහතා තේරී පත්විය.

SLIM විධායක කමිටුව සඳහා ද පළපුරුදු අලෙවිකරණ වෘත්තිකයන් 10 දෙනෙකු එහිදී තෝරා පත් කරගන්නා ලදී. එනම්, මංතික රණසිංහ (ජාත්‍යන්තර ගනුදෙනු පිළිබඳ ව්‍යාපාර සංවර්ධන අංශ ප්‍රධානී – Kapruka.com), සතිකා වික්‍රමසිංහ (දත්ත විශ්ලේෂණ හා ප්‍රවේග අංශ කළමනාකාර – Fonterra Brands Lanka), ආචාර්ය දිල්හාන් එස්. ජයතිලක (ව්‍යාපාර සංවර්ධන හා අලෙවි සංවර්ධන අංශ ප්‍රධානී – ආරෝග්‍යා ලයිෆ් සිස්ටම්ස් ලංකා පුද්ගලික සමාගම, ව්‍යාපාර සංවර්ධන අලෙවි හා වෙළෙඳපොළ උපායමාර්ග පිළිබඳ සාමාන්‍යාධිකාරී – Softlidz Solutions Private Limited), චරක පෙරේරා (විධායක අධ්‍යක්ෂ – Fuchsia Retail S.A. (Private) Limited)" නුවන් තිලකරත්න (අලෙවි කළමනාකාර – යූනියන් බැංකුව), අසංක පෙරේරා (ප්‍රධාන විධායක නිලධාරී– Arugambay Beachwear (Pvt) Ltd)" නියාස් මොහොමඩ් ශිරාස් (අලෙවි හා විකුණුම් පිළිබඳ සහකාර සාමාන්‍යාධිකාරී– Fentons Limited &" අසේල සී. ගුණසේකර (සන්නාම සංවර්ධන කළමනාකාර -Metecno Lanka (Pvt) Ltd')" චන්න ජයසිංහ (සන්නාම සංවර්ධනය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කළමනාකාර – Kelani Cables Plc) සහ මොරටුව විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යන පීඨයේ ව්‍යාපාර පර්යේෂණ අංශයේ අධ්‍යක්ෂ – ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය තෙසාරා ජයවර්ධන මහත්ම මහත්මීන්ය.

## සුවිසල් වෙරළ මූර්ති සහ පවුරු සැලසුම් තරගාවලියකට සිසුන්ට අවස්ථාව

**කොළඹ වරායට නගරය (Port City Colombo) සිය ඉදිරි ගමනේ තවත් සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් "අනාගතයක දැක්ම" නමින් වෙරළ මූර්ති නිරමාණ තරගයක් ආරම්භ කිරීමට පසුගියදා කටයුතු කළේය. මෙරට නවක නිර්මාණ ශිල්පීන් ඉලක්ක කරගෙන දියත් කර ඇති මෙම වැඩසටහන මගින් සුවිශේෂී වෙරළ මූර්ති (beach Sculpture) සහ සන්නිවේදන පවුරක් (Interactive Wall) නිර්මාණය කිරීමට එම ශිල්පීන්ට අවස්ථාව හිමිවනු ඇත.**

මෙම තරගය කොළඹ වරාය නගරයේ සමාරම්භක වැඩසටහන් මාලාවේ එක් අංගයක් වන අතර, මෙම ව්‍යාපෘතියේ සුවිශේෂී අංග ලෙස ලොව පුරා ජනතාවගේ ආකර්ෂණය දිනා ගන්නා, ශ්‍රී ලාංකික අනන්‍යතාව කැටි කරගත් මාරක එකතුවක් නිර්මාණය කිරීම මෙහි මූලික අරමුණ වී තිබේ. මේ වන විට කොළඹ වරාය නගරය තුළ මූලික අදියර කිහිපයක් යටතේ පොදු වෙරළ තීරයන් හා උද්‍යාන වැනි අංග ඉදිකෙරෙමින් පවතින අතර, ඊළඟ අදියර ලෙස මෙම මූර්ති එකතුව සහ සන්නිවේදන පවුර ඉදිවනු ඇත. COVID-19 වසංගත තත්ත්වය හමුවේ පැනවීමට සිදු වී ඇති සීමාවන්ට අනුගත වෙමින්, මෙම තරගාවලිය මුළුමනින්ම www.envisionthefuture.lk වෙබ් අඩවිය ඔස්සේ පැවැත්වීමට කටයුතු යොදා තිබේ.

නිර්මාණ සැලසුම් සම්බන්ධයෙන් මගපෙන්වීම සඳහා Academy of Design සමග එක්වෙමින් සහ කලා ක්ෂේත්‍රයේ නිල සහකරු ලෙස ARTRA සඟරාව සමග අත්වැල් බැඳගනිමින් ක්‍රියාත්මක කරනු ලබන මෙම තරගයට එක්වී තම හැකියාවන් උරගා බලන මෙන් කොළඹ වරාය නගර ව්‍යාපෘතිය මෙරට නවක නිර්මාණ ශිල්පීන්ට හා ශිල්පිනියන්ට ආරාධනා කර සිටී. මෙරට හෝ විදේශ විශ්වවිද්‍යාලයක ලියාපදිංචි වී කලා, ගෘහ නිර්මාණ, නිර්මාණ සැලසුම්, ඉංජිනේරු සහ/හෝ වෙනත් නිර්මාණාත්මක විෂය ක්ෂේත්‍රයක් යටතේ ප්‍රථම හෝ පශ්චාත් උපාධිය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මෙම තරග සඳහා සහභාගී විය හැක. 2019/2020 අධ්‍යයන වර්ෂය තුළ තම උපාධි පාඨමාලා සම්පූර්ණ කළ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ද මේ සඳහා අයදුම් කළ හැකි වේ.තරගකරුවන්ට තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් විය හැකි අතර ඉදිරිපත් කළ හැකි උපරිම සැලසුම් සංඛ්‍යාව 2 කි, කණ්ඩායමක් වශයෙන් ඉදිරිපත් වන්නේ නම් සාමාජිකයන් සංඛ්‍යාව 3 කට සීමා විය යුතු ය. ජයග්‍රාහී සැලසුම් සඳහා රු. 700,000 කට වැඩි වටිනාකමකින් යුත් මුදල් ත්‍යාගයන් හිමිවනු ඇති අතර, එම සැලසුම් කොළඹ වරාය නගර පරිශ්‍රයේ වෙරළ තීරයේ ඉදි කෙරෙනු ඇත. එමෙන්ම අදාළ කාණ්ඩ වල ජයග්‍රහණය ලබාගන්නා පුද්ගලයන්ට හෝ කණ්ඩායම්වලට, අදාළ නිර්මාණය ඉදිකිරීම සඳහා සී. එච්. ඊ. සී. පෝට් සිටි කලම්බු (පුද්.) සමාගම [CHEC Port City Colombo (Pvt) Limited] විසින් තෝරාගනු ලබන ජාත්‍යන්තර ඉදිකිරීම් සමාගම සමඟ එක්ව කටයුතු කිරීමට අවස්ථාව හිමි වේ.

**තරගකරුවන්ට තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් විය හැකි අතර ඉදිරිපත් කළ හැකි උපරිම සැලසුම් සංඛ්‍යාව 2 කි, කණ්ඩායමක් වශයෙන් ඉදිරිපත් වන්නේ නම් සාමාජිකයන් සංඛ්‍යාව 3 කට සීමා විය යුතු ය. ජයග්‍රාහී සැලසුම් සඳහා රු. 700,000 කට වැඩි වටිනාකමකින් යුත් මුදල් ත්‍යාගයන් හිමිවනු ඇති අතර, එම සැලසුම් කොළඹ වරාය නගර පරිශ්‍රයේ වෙරළ තීරයේ ඉදි කෙරෙනු ඇත.**

මූල්‍ය කලාපය, මධ්‍යම උද්‍යාන වාසය, ජාත්‍යන්තර දිවයින, යාත්‍රාංගණය හා දූපත් වාසය ලෙස අනු කලාප 5 කින් නිර්මිත කොළඹ වරාය නගර ව්‍යාපෘතිය, දකුණු ආසියානු කලාපයේ ඉදිවෙමින් පවතින ජාත්‍යන්තර තලයේ නගරයකි. සාගරය ගොඩ කර ඉදිකරන ලද හෙක්ටයාර 269 ක භූමියක ඉදිවන කොළඹ වරාය නගරය, පසුගිය වසර තුළදී ශ්‍රී ලංකාවට අයත් භූමික් ලෙස ප්‍රකාශයට පත් කෙරිණි. එමෙන්ම කොළඹ වරාය නගර පරිශ්‍රයේ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා ව්‍යාපෘති සමාගම මගින් ඉදිරිපත් කරන ලද ඇමරිකානු ඩොලර් බිලියන 1 ක ආයෝජන සැලසුමක් සඳහා පසුගිය මාසයේදී ශ්‍රී ලංකා රජයේ අනුමැතිය හිමි විය.

අනාගත පරපුරේ අභිවෘද්ධිය ඉලක්ක කරගත් කොළඹ වරාය නගර ව්‍යාපෘතිය, ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති අතරින් වඩාත් නවීනතම අංග ලක්ෂණ සහිත ව්‍යාපෘතිය ලෙස සැලකේ.

අමතන්න
ඔබගේ අධ්‍යාපනික ලිපි හා දැන්වීම් සඳහා
011-2429351
සිළුමිණ දැන්වීම් අංශය

## අධ්‍යාපනික ණය ලබාදීමට කොමර්ෂල් බැංකුව සහ HCL ටෙක්නොලොජීස් එක් වේ



මෙරට පුහුණු වන සහ රැකියා කරන සිසුන්ට අඩු පොලී අධ්‍යාපනික ණය ලබාදීම සඳහා HCL ටෙක්නොලොජීස් ශ්‍රී ලංකා සමාගම සමග ඒකාබද්ධ වූ බව කොමර්ෂල් බැංකුව නිවේදනය කර ඇත.

මේ අනුව, HCL ටෙක්නොලොජීස් විසින් ඉදිරිපත් කරන මුල් කාලීන වෘත්තීය පුහුණු වැඩසටහනේ (ECTP) බැඳුම්කර ගාස්තුව මෙන්ම, පාර්ශ්වකාර විශ්වවිද්‍යාල විසින් ලබාදෙන උසස් අධ්‍යාපනික වැඩසටහන්වල පාඨමාලා ගාස්තු බැංකුවේ මෙම විශේෂ ණය වැඩසටහන මගින් මූල්‍යනය කරයි.

මෙම වැඩසටහන යටතේ මුල් කාලීන වෘත්තීය පුහුණු වැඩසටහනේ අපේක්ෂකයින්ට සහ උසස් අධ්‍යාපනය ලබන අපේක්ෂකයින්ට රුපියල් මිලියන 02 ක් දක්වා ණය පහසුකම් ලබා දේ.

'මෙරට තොරතුරු තාක්ෂණික අධ්‍යාපනය නැංවීමට සහාය ලබාදීම සහ ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණික සාක්ෂරතාව ඉහළට රැගෙන ඒම රට වෙනුවෙන් කොමර්ෂල් බැංකුවේ තිබෙන දැක්මේ ඉතාමත් වැදගත් කොටසක් වෙනවා,' යනුවෙන් මේ පිළිබඳව අදහස් දක්වමින් කොමර්ෂල් බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අලෙවිකරණ හස්රත් මුණසිංහ මහතා පැවසීය. 'ගෝලීය දැවැන්තයෙකු වන HCL ටෙක්නොලොජීස් සමාගමේ ශාඛාවක් මෙරට අරඹන විට එයට අපි ඉතාමත් සතුටෙන් සහයෝගය ලබාදුන්නා. එයට හේතුව වන්නේ මෙරට තොරතුරු තාක්ෂණික වෘත්තිකයින්ට බොහෝ අවස්ථාවන් මෙම සමාගමට ලබාදිය හැකි නිසයි." මෙම ඒකාබද්ධතාවය සඳහා ආයතන දෙක අතර, අත්සන් කළ අවබෝධතා ගිවිසුමට අනුව HCL ටෙක්නොලොජීස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ පුහුණු වන හෝ රැකියා කරන උසස් පෙළ සමතුන්ට, උපාධි අපේක්ෂකයින්ට, උපාධිධාරීන්ට සහ මෘදුකාංග ඉංජිනේරුවන්ට විශේෂ ණය ලබාගැනීමේ අවස්ථාව ලබාදී ඇත.

මෙම ගිවිසුමට අනුව HCL ටෙක්නොලොජීස් විසින් ඉදිරිපත් කරන මුල් කාලීන වෘත්තීය පුහුණු වැඩසටහන හැදෑරීම සඳහා කොමර්ෂල් බැංකුවෙන් ණය මුදලක් ලබාගත් සිසුන්ට අදාළ පුහුණුව අවසන් කළ පසුව HCL ටෙක්නොලොජීස් සමාගම රැකියා ලබාදෙන අතර, රැකියාවක් ලැබුණු පසුව මෙම ණය මුදල ගෙවීම සඳහා සහන ණය ගෙවීමේ සැලසුමකට එළැඹීමටද මේ යටතේ සිසුන්ට අවස්ථාව හිමි වේ.

## යූනියන් ඇෂුවරන්ස් වෙතින් 'සිසුමග+' අධ්‍යාපනික සුරක්ෂා සැලසුම




ප්‍රමුඛ පෙළේ ජීවිත රක්ෂණය පිළිබඳ විසඳුම් ලබා දෙන විශේෂඥ සමාගමක් වන යූනියන් ඇෂුවරන්ස් කුඩා අවධියේ සිට විශ්වවිද්‍යාල දක්වා අඛණ්ඩව අධ්‍යාපනය හැදෑරීම සහතික කිරීම සඳහා "සිසුමග+" නමින් විශේෂයෙන් නිර්මාණය කළ අද්විතීය අධ්‍යාපනික සුරක්ෂා සැලසුමක් හඳුන්වා දී ඇත.

"සිසුමග+" යනු තම දරුවාගේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය හෝ ඕනෑම තෘතීයික අධ්‍යාපන කටයුතුවලට යන වියදම් කළමනාකරණය කිරීමට කැමති දෙමවුපියන්ට අත්වැලක් සපයන සැලසුමක් වන අතර, මෙමගින් දෙමවුපියන්ගේ අකල් මරණයකදී පවා දරුවන්ගේ උසස් අධ්‍යාපන පිරිවැය සපුරාලීම ද සහතික කරයි.

යූනියන් ඇෂුවරන්ස් සිය නවතම සිසුමග ප්ලස් අධ්‍යාපනික සුරක්ෂා සැලසුම අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්, මහාචාර්ය කපිල පෙරේරා, ජෝන් කීල්ස් සමූහයේ සභාපති, ක්‍රිෂාන් බාලේන්ද්‍ර, ලංකා ඉම්පැක්ට් ඉන්වෙස්ට් නෙට්වර්ක් ආයතනයේ නිර්මාතෘ සහ සභාපති, චන්දුල අබේවික්‍රම සහ සුප්‍රසිද්ධ ගායකයකු වන භාතිය ජයකොඩි ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසකගේ සහභාගීත්වයෙන් පසුගියදා හඳුන්වා දුන්නේය.

යූනියන් ඇෂුවරන්ස් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි ජුඩ් ෆෝම්ස් මහතා නව "සිසුමග+" සැලසුම හඳුන්වා දෙමින් පැවසුවේ "ශ්‍රී ලංකාව ගත් කළ අධ්‍යාපන සුරක්ෂාව යනු නව සංකල්පයක් බවත්, දෙමවුපියන්ට තම දරුවන්ගේ උසස් අධ්‍යාපනික සිහින සැබෑ කිරීමට "සිසුමග+" ආරම්භ කිරීමේ පුරෝගාමියකු වීම පිළිබඳව යූනියන් ඇෂුවරන්ස් සතුටු වන බවයි. ඉතිරිකිරීම් හා අයෝජනයන් හි සුසංයෝගයෙන් නිර්මාණය කළ මෙම සැලසුම මගින් දරුවන්ට ඔවුන්ගේ උසස් අධ්‍යාපනය අභිලාෂයන් හඹා යාමට අවශ්‍ය සහය ලබා දෙන අතරම ඊට අවශ්‍ය මූල්‍ය පිරිවැය ද අඛණ්ඩව සපයනු ඇති අතර, ඔබේ දරුවන්ට අවශ්‍යම මොහොතේදී මුදල් ඔවුන්ට ලැබෙන බවට ද අපට සහතික විය හැකියි," යනුවෙන් ඔහු වැඩිදුරටත් පැවසුවේය.

## කාන්තා කළමනාකරණ ආයතනය හා ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව එක්ව විද්වත් සහ වෘත්තීය කාන්තා සම්මාන උළෙල 2020, සංවිධානය කරයි




ශ්‍රී ලංකාවේ කාන්තා නායකත්වය ඇගයීමේ දසවන වසර සමරමින් කාන්තා කළමනාකරණ ආයතනය Women in Management (WIM), ලෝක බැංකු සාමාජික ආයතනයක් වන ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (IFC) මෙන්ම ඒ හරහා ක්‍රියාත්මක Women in Work වැඩසටහනේ එකමුතුවෙන් සහ ඔස්ට්‍රේලියානු රජයේ ආධාර ඇතිව 'Top 50'විද්වත් සහ වෘත්තීය කාන්තා සම්මාන උළෙල 2020 දියත් කරයි.

තමන්ගේ වෘත්තීයේ, ව්‍යාපාරයේ සහ එදිනෙදා ජීවිතයේ විශිෂ්ටත්වයට පත්වෙමින් අනෙක් අයට පූර්වාදර්ශයක් වූ ශ්‍රී ලාංකික කාන්තාවන් ඇගයීම සහ සැමරීම උදෙසා පැවැත්වෙන මේ සම්මාන උළෙල සාර්ථක කරගැනීමට කාන්තා කළමනාකරණ ආයතනය (WIM) සමඟ නොකඩවා සය වැනි වරටත් ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (IFC) අත්වැල් බැඳගැනීම මෙහිදී කැපී පෙනෙයි.

"තමන් තෝරාගත් වෘත්තීය ක්ෂේත්‍රය තුළ සාර්ථකත්වයට පැමිණි කාන්තාවන් අගය කිරීම අනෙක් අයටත් ආදර්ශයක්වනු ඇතැයි අප විශ්වාස කරනවා" යැයි IFC හී Women in Work, වැඩසටහන් කළමනාකාර සාරා ට්විග් (Sarah Twigg) මහත්මිය පැවසීය. එසේම "මෙම සම්මාන හරහා ව්‍යාපාරික නායකයන් ලෙස කාන්තා භූමිකාවේ සාම්ප්‍රදායික දැක්ම අභියෝගයට ලක් වෙන අතර ව්‍යාපාර ආයතනික ක්ෂේත්‍රයේ දී ඉහළ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයක් සහිත වෘත්තීය පරිසරයක් පිළිබඳ මතවාදයක් ගොඩනැගෙයි."

ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (IFC) සිය වසර 50ක සේවා කාලය තුළ කාන්තා කළමනාකරණ ආයතනය (WIM) සමඟ ඉතා දිගු කාලයක් සහයෝගයෙන් කටයුතු කර තිබේ. IFC සහ WIM එකමුතුවෙන් ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර සහ කුඩා කර්මාන්ත ක්ෂේත්‍රයේ සේවය කරන කාන්තාවන්ට වගේම ඒවාට නායකත්වය ලබාදෙන ව්‍යවසායක කාන්තාවන්, මැදි කළමනාකරණ ක්ෂේත්‍රයේ නියුතු කාන්තාවන්, ඉහළ කළමනාකරණ සේවයේ නියුතු කාන්තාවන් ආදී කණ්ඩායම්වලට නායකත්ව පුහුණුව සහ නිපුණතා සංවර්ධන පුහුණුව හඳුන්වාදෙමින් කාන්තා අභිවෘද්ධිය වෙනුවෙන් ඉහළ සේවාවක් ඉටුකළේය. 'Top 50'විද්වත් සහ වෘත්තීය කාන්තා සම්මාන උළෙල 2020 ද IFC-DFAT Women in Work වැඩසටහන යටතේ ඇති තවත් එවැනි මූලිකත්ව වැඩසටහනක් වේ.

සම්මාන සඳහා නාම යෝජනා භාරගැනීම 2020 සැප්තැම්බර් මස 15වැනිදා දක්වා පැවැත්වෙන අතර www.womeninmanagementawards.orgවෙබ් අඩවියට ගොස් ඔබටත් යෝජනා ඉදිරිපත් කළ හැක.

# SLSI කොවිඩ් -19 ආරක්ෂිත කළමනාකරණ සහතිකය ලද
## පළමු සුපිරි වෙළෙඳසල් දාමය සහ සිල්ලර වෙළඳාමේ ප්‍රමුඛයා කීල්ස්

COVID-19 වසංගතය සියලුම ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන රටාවට එක සේ බලපාන හෙයින්, මෙම අභියෝගාත්මක කාල වකවානුවේදී ආරක්ෂාව සහ සනීපාරක්ෂාව සැමට ඉදිරියෙන් සිටී. මෙරට සිල්ලර වෙළෙඳපොළ ප්‍රමුඛයෙක් ලෙස කීල්ස්, තම ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, 2020 මාර්තු මස සිට ආරක්ෂිත ලෙස නිවෙස් වෙත භාණ්ඩ බෙදා හැරීම සඳහා තම කණ්ඩායම් සාමාජිකයන්ට මාර්ගෝපදේශ පවා ලබා දී තිබේ.

COVID-19 ආරක්ෂිත කළමනාකරණ පද්ධති සඳහා වන SLSI සහතික කිරීම යනු අපගේ කණ්ඩායම සහ වෙළෙඳසැල්/සැපයුම් දාමය විසින් පාරිභෝගිකයින්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම සඳහා ක්‍රියාත්මක කරන ලද සෞඛ්‍යාරක්ෂිත පිළිවෙත් පිළිගැනීමට පාත්‍ර කිරීමකි. අනාගතයේදී තවත් එවැනි අභියෝගයන්ට මුහුණ දීමට අවශ්‍ය හදිසි ක්‍රියාකාරී සැලැස්මක් ද ඊට ඇතුළය. දැනට, කීල්ස් වෙළඳසල් 10 කට SLS සහතිකය හිමිව ඇති අතර, ඉදිරියේදී එම සහතිකය අපගේ සියලුම සුපිරි වෙළඳසැල් වෙත ලබා ගැනීමේ අපේක්ෂාව ඇතිව SLS ආරක්ෂණ ප්‍රමිතීන්ට අනුකූලව අනෙකුත් සියලුම කීල්ස් වෙළෙඳසැල් පවත්වාගෙන යයි.

"මෙම අභියෝගාත්මක කාලවකවානුවේදී වගකිවයුතු සිල්ලර වෙළෙඳපොළ සාමාජිකයකු ලෙස අපගේ ගනුදෙනුකරුවන්ගේ මෙන්ම අපගේ කණ්ඩායම් සාමාජිකයින්ගේද ආරක්ෂාව සහතික කිරීම අතිශයින්ම වැදගත් බව ජෝන් කීල්ස් සමූහය සලකයි. අපගේ ගනුදෙනුකරුවන් උදෙසා ආරක්ෂිත සාප්පු සවාරි අත්දැකීමක් සහතික කිරීම සඳහා මෙන්ම අපගේ කණ්ඩායමේ සාමාජිකයින්ට සිය රාජකාරි කිරීමට ආරක්ෂිත ස්ථානයක් බවට කීල්ස් වෙළෙඳසල් ජාලය පත්කිරීම සඳහා හැකි සෑම පියවරක්ම ගත් බව අප පැවසීමට කැමැත්තෙමු. මෙම SLSI සහතිකය එවැනි ආරක්ෂිත පියවරයන් ස්ථාපිත කිරීම සඳහා වූ අපගේ ගමන තවදුරටත් සහතික කිරීමක් මෙන්ම සාප්පු සවාරි යාම සඳහා කීල්ස් වෙළෙඳසැල් තෝරා ගැනීමට ගනුදෙනුකරුවන් තුළ විශ්වාසය ගොඩනගන්නක් ද වේ" යනුවෙන් ජෝන් කීල්ස් සමූහ ව්‍යාපාරයේ සිල්ලර වෙළඳ අංශයේ සභාපති චරිත සුබසිංහ මහතා පැවසීය.







(වමේ සිට) ජෝන් කීල්ස් සමූහ ව්‍යාපාරය නියෝජනය කරමින් ලසිත ප්‍රනාන්දු, තුෂාර සිල්වා, චරිත සුබසිංහ, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ආචාර්ය සිද්ධිකා ජී. සේනාරත්න, අධ්‍යක්ෂ (පද්ධති සහතික කිරීම) සමන්ති නාරංගොඩ සහ කීල්ස්හි බුද්ධි ධර්මසේන.

ඡායාරූපයේ දැක්වෙන්නේ ජෝන් කීල්ස් සමූහ ව්‍යාපාරයේ සිල්ලර වෙළෙඳ අංශයේ සභාපති චරිත සුබසිංහ (වමේ සිට තුන්වැන්නා) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සිද්ධිකා ජී. සේනාරත්න මහත්මිය අතින් සහතිකය ලබාගන්නා අයුරු

# ලංකා සතොස වාර්තාගත වර්ධනයක

ශ්‍රී ලංකාවේ විශාලතම සිල්ලර වෙළඳ අලෙවිසල් ජාලය වන ලංකා සතොස 2020 ජූනි මස අවසානය වන විට ආදායම රුපියල් බිලියන 17.62 ක් ලෙස සලකුණු කර ඇති අතර, එය ලංකා සතොස ඉතිහාසයේ අත්පත් කරගත් වාර්තාගත ආදායමයකි.

2019 සිට 2020 දක්වා 23% විකුණුම් වර්ධනයක් පෙන්නුම් කර ඇත. මෙය ශ්‍රී ලංකාවේ රජයේ ආයතනයක් අතුරෙන් අත්පත් කරගත් සුවිශේෂී ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකිය.



සභාපති
නුෂාඩ් පෙරේරා

රාජ්‍ය අංශයේ ප්‍රගති දර්ශක සඳහා පූර්වාදර්ශයක් වෙමින් ලංකා සතොස ඉතිහාසයේ සුවිශේෂී මංසලකුණක් සටහන් කරන්නේ www.lankasathosa.lk යන වෙබ් අඩවිය තුළින් සිය පාරිභෝගිකයන්ට අන්තර්ජාලය ඔස්සේ ගනුදෙනු කිරීමට අවස්ථාව සැලැස්වීමෙනි. මේ තුළින් පාරිභෝගික භාණ්ඩ නිවසටම ගෙන්වා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

කැබිනට් වෙළෙඳ, ගරු අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙම ඔන්ලයින් වෙබ් අඩවිය නිරාවරණය කරන ලදී. ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා, ශ්‍රී ලංකාවේ අන්තර්ජාල සේවා සඳහා පාරිභෝගිකයන්ගේ ඉල්ලුම ඉහළ යන අවධියක ඒ සඳහා කරන ආයෝජනයෙන් ප්‍රතිපල ලබන අනාගත පරපුරක් අපේක්ෂා කරයි. මෙම වෙබ් අඩවිය ශ්‍රී ලංකා ටෙලිකොම් සහයෝගයෙන් ඉතා කෙටි කලක් තුළ නිර්මාණය කරන ලදී. ලංකා සතොස රට පුරා පිහිටි වෙළඳසල් 400ක ව්‍යාප්තිය ඔන්ලයින් ගනුදෙනුකරුවන්ට ලබාදෙන සේවය කඩිනම් කිරීමට අඩිතාලමක් වී ඇති බවත් පළමු අදියරේදී www.lankasathosa.lk වෙතට පිවිසෙන බස්නාහිර පළාතේ සහ මහනුවර නගරවල සිටින පාරිභෝගිකයන්ට බෙදාහැරීමේ සේවය නොමිලේ ලබා දෙන බවත් ලංකා සතොස සභාපති ආචාර්ය නුෂාඩ් පෙරේරා මහතා පැවසීය.




ශ්‍රී ලංකාවේ වේගයෙන් වර්ධනය වන ඔන්ලයින් සේවා වෙළඳපොළ තුළ තරගකාරිත්වය ජයගනිමින් පාරිභෝගිකයන්ට කාර්යක්ෂම සේවයක් සැපයීම අරමුණු කරගෙන ලංකා සතොස මෑතකදී ඔරුගොඩවත්තේදී නවතම අංගසම්පූර්ණ ගබඩා සංකීර්ණයක්ද විවෘත කරන ලදී.

අත්පත් කරගත් මේ සුවිශේෂී ප්‍රගතීන් සමග ඉදිරියේදී ලංකා සතොස ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසායකත්වයන් සඳහා නව ප්‍රමිතීන් හා වටිනාකම් රැසක් දායක කිරීමට බලාපොරොත්තු වන අතර, එමගින් පාරිභෝගිකයන්ට වඩාත් හිතකර වූ කාර්යක්ෂම සේවයක් ලබාදීමට අපේක්ෂා කරයි.

# වරාය අධිකාරිය සහ SLT, ගිවිසුමක

**ශ්‍රී ලංකා වරාය අධිකාරියේ (SLPA) සන්නිවේදන කටයුතු පවත්වාගෙන යාම වෙනුවෙන්, ජාතික තොරතුරු තාක්ෂණික හා ඩිජිටල් සේවා සැපයුම්කරු වන ශ්‍රී ලංකා ටෙලිකොම් (SLT) සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය අතර පසුගියදා අවබෝධතා ගිවිසුමක් අස්සන් කෙරුණි.**



ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙනුවෙන් එහි සභාපති ජෙනරාල් දයා රත්නායක, කළමනාකාර අධ්‍යක්ෂ W. S. වීරමන් යන මහත්වරුද ශ්‍රී ලංකා ටෙලිකොම් වෙනුවෙන් එහි ප්‍රධාන විධායක නිලධාරී කිත්ති පෙරේරා සහ ව්‍යවසායකත්ව හා තොග වෙළෙඳුම් පිළිබඳ ප්‍රධාන නිලධාරී ජානක අබේසිංහ යන මහත්වරු විසින් කොළඹ, ශ්‍රී ලංකා වරාය අධිකාරි කාර්යාල පරිශ්‍රයේදී මෙම අවබෝධතා ගිවිසුමට අස්සන් තැබූහ. මෙම ගිවිසුම යටතේ SLT සන්නිවේදන තාක්ෂණික දායකත්වයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන මෙහෙයුම් කටයුතු ආශ්‍රිතව සිදු කෙරෙන සන්නිවේදන කටයුතු විශ්වසනීය හා රහස්‍යභාවය සුරක්ෂිත වන ආකාරයෙන් සිදුකෙරේ.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙනුවෙන් අදහස් දැක්වූ එහි සභාපති ජෙනරාල් දයා රත්නායක මහතා, "ජාත්‍යන්තර සැපයුම් ජාලයේ ශ්‍රී ලාංකීය කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියාත්මක වන වරාය අධිකාරියේ මෙහෙයුම්, අති නවීන තාක්ෂණය භාවිත කරනු ලබන SLT විශ්වාසනීය සේවාව සමග තවදුරටත් ශක්තිමත් වේවි යැයි මා විශ්වාස කරනවා." යැයි පැවසීය.

ශ්‍රී ලංකා ටෙලිකොම් ප්‍රධාන විධායක නිලධාරි කිත්ති පෙරේරා මහතා එහිදී අදහස් දක්වමින් "ජාතික තොරතුරු තාක්ෂණික හා ඩිජිටල් සේවා සැපයුම්කරු ලෙස SLT අපට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ජාතික මෙහෙවරට දායකත්වයක් දක්වන්නට ලැබීම මහත් ආඩම්බරයක්. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ තොරතුරු තාක්ෂණික, සන්නිවේදන හා ඩිජිටල් තාක්ෂණික යටිතල පහසුකම් SLT අති නවීන තාක්ෂණයෙන් බලගැන්වීමෙන් "Smart Port" ජාත්‍යන්තර සංකල්පය ඔස්සේ කාර්යක්ෂම සේවාවක් ලබාදීමට හැකිවෙනවා. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයන්, ගනුදෙනුකාර භවතුන් හා මෙහෙයුම් සහකරුවන් සියලු දෙනාගේ සේවාවන් මේ සමග තවදුරටත් ශක්තිමත් වනවා." යැයි පැවසීය.

# කාගිල්ස් බැංකුවට
# නව කළමනාකාර අධ්‍යක්ෂකවරයෙක්

ප්‍රවීණ බැංකුකරුවකු වන සෙනරත් බණ්ඩාර මහතා කාගිල්ස් බැංකු නව කළමනාකාර අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත් කරන ලද අතර, 2020 සැප්තැම්බර් 08 දින සිට ඔහු විසින් සිය නව තනතුරෙහි කාර්යය භාරයන් ඇරැඹීමට නියමිතය. නියාමන නිෂ්කාශයන්ට යටත්ව, බණ්ඩාර මහතා විසින් 2020 ඔක්තෝම්බර් 01 වන දින සිට බැංකුවෙහි කළමනාකාර අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිලධාරී ලෙස රාජකාරී ආරම්භ කරනු ඇත.

2020 සැප්තැම්බර් 30 වැනි දා රාජේන්ද්‍ර ත්‍යාගරාජා මහතා විශ්‍රාම යාමෙන් හිස්වන පුරප්පාඩුව වෙනුවට සෙනරත් බණ්ඩාර මහතා පත් කර ඇත.

ඔහුගේ මෙම පත්වීමට පෙර, බණ්ඩාර මහතා ලංකා බැංකුවෙහි සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී ලෙස වසර 30ක කාලයක් පුරාවට සේවය කර ලංකා බැංකුවෙන් මෑතකදී විශ්‍රාම ගන්නා ලදී. එම කාල සීමාව තුළ ඔහු විසින් සාමාන්‍ය බැංකුකරණය, පාරිභෝගික



බැංකුකරණය, පාරිභෝගික ණය සේවා, සංවර්ධන බැංකුකරණය, ආයතනික ණය සේවාවන්, ආයෝජන හා භාණ්ඩාගාර කළමනාකරණය සහ ජාත්‍යන්තර බැකු මෙහෙයුම් පිළිබඳ අත්දැකීම් හිමි කරගෙන ඇත.

LankaClear පුද්ගලික සමාගම, ණය තොරතුරු කාර්යාංශය සහ ලංකා මූල්‍ය සේවා කාර්යාංශය යන ආයතන වලට අමතරව බණ්ඩාර මහතා ලංකා බැංකුවෙහි අනුබද්ධිත සහ ආශ්‍රිත මණ්ඩල කිහිපයක සිය සේවාව ඉටුකර ඇත.

ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි පාලක මණ්ඩල සාමාජිකයකු ලෙසත්, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයෙහි කවුන්සිල සාමාජිකයකු ලෙසත්, තායිලන්තයේ බැංකොක් නුවර සිට ක්‍රියාත්මක වන කලාපීය සංගමයක් වන ආසියානු පැසිෆික් ග්‍රාමීය කෘෂිකාර්මික ණය සංගමයෙහි (APRACA) සභාපති ලෙසත්, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමයේ උප සභාපති සහ ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ හිටපු සභාපති ලෙසත් වෘත්තීය සංවිධාන රැසකට ඒ මහතා සිය දායකත්වය ලබා දී ඇත.

එමෙන්ම, බණ්ඩාර මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සාමාජිකයකු ද වේ. බණ්ඩාර මහතාගේ පත්වීම පිළිබඳ අදහස් දැක්වූ, කාගිල්ස් බැංකු සභාපති රංජිත් පේජ් මහතා,

"සෙනරත් බණ්ඩාර මහතා කාගිල්ස් පවුල වෙත සාදරයෙන් පිළිගැනීමට ලැබීම සතුටට කරුණකි. ශ්‍රී ලංකාවේ වඩාත් පරිපූර්ණ බැංකුව බවට පත් වීමට අප සතු දැක්ම වෙත ගමන් කිරීමේදී බණ්ඩාර මහතා කාගිල්ස් බැංකුව වෙත ගෙන එන අත්දැකීම් සම්භාරය අපගේ පාර්ශ්වකරුවන්ට බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත. පසුගිය වසර තුනක කාලය තුළ බැංකුව වෙත දැක්වූ සුවිශේෂී දායකත්වය වෙනුවෙන් රාජේන්ද්‍ර ත්‍යාගරාජා මහතා හට මාගේ කෘතඥතාවය පළ කිරීමට මෙන්ම ඔහුගේ ඉදිරි කටයුතු සඳහා සුබ පැතීමටද මම මෙය අවස්ථාවක් කර ගැනීමට කැමැත්තෙමි."



# බිස්නස් නිවුස්

## AIA ඩිජිටල් තාක්ෂණයෙන් රක්ෂණ නියෝජිතයින් බඳවාගැනීම් හඳුන්වා දෙයි

AIA ඉන්ෂුවරන්ස්, ශ්‍රී ලංකාව තුළ ඩිජිටල් තාක්ෂණය ඔස්සේ සිදුකරන්නා වූ වැඩකටයුතු තවදුරටත් ශක්තිමත් කරමින්, රක්ෂණ නියෝජිතයින් බඳවා ගැනීමේ සම්මුඛ සාකච්ඡා කාර්යාලයෙන් පිටත දී online ක්‍රමයට සිදු කිරීම සඳහා Sixer Video platform එක හඳුන්වා දී ඇත.

AIA ඉන්ෂුවරන්ස් සමාගමට රක්ෂණ නියෝජිතයින් ලෙස බැඳීමට කැමති ඕනෑම අයෙකුට දැන් ඩිජිටල් තාක්ෂණය ඔස්සේ පවත්වනු ලබන වෘත්තීය අවස්ථා ඉදිරිපත් කිරීමට සහභාගී වීමෙන් අනතුරුව ඔවුන්ගේ ජීව දත්ත සහිත විස්තර ඇතුළත් වීඩියෝවක් online ක්‍රමයට සමාගම වෙත යොමු කිරීමට අවස්ථාව ඇත. මෙම ක්‍රමය ඔස්සේ නියෝජිතයින් බඳවා ගැනීම්, මුහුණට මුහුණ සිදු කරන්නා වූ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට වඩා පහසුවෙන් සහ ඉක්මණින් කළ හැකි වන අතර, මෙමගින් අපේක්ෂකයින් දුරබැහැර සිට සිය මුදල් සහ කාලය වැය කරමින් සම්මුඛ පරීක්ෂණ සඳහා කාර්යාලයන් වෙත පැමිණීම වළක්වාලීමටත් AIA කණ්ඩායමට හැකි වී ඇත.

AIA ඉන්ෂුවරන්ස් හි ප්‍රධාන තාක්ෂණ නිලධාරී උමේෂ් ද ෆොන්සේකා ඒ පිළිබඳ පැහැදිලි කරමින් කියා සිටියේ "COVID-19 න් පසු ලොව තුළ බොහෝ දෙනා මුහුණට මුහුණ හමු වී සිදුකරන රැස්වීම් සහ සම්මුඛ පරීක්ෂණ සඳහා වැඩි කැමැත්තක් දක්වන්නේ නෑ. අපට අවශ්‍ය වුයේ අපගේ නියෝජිතයින් බඳවා ගැනීමේ ක්‍රියාවලිය නොකඩවා කරගෙන යාමට ක්‍රමයක් සොයා ගැනීමටයි. එමගින් අපට ඉතාමත් ඉහළ තත්ත්වයේ වෘත්තීයමය අලෙවි බලකා සාමාජිකයින් පිරිසක් බඳවා ගැනීම තහවුරු කරගැනීමට අවශ්‍ය වුණා. මේ ක්‍රමය මගින් රක්ෂණ නියෝජිතයින් වීමට බලාපොරොත්තුවන පිරිස් හට ඔවුන්ගේ ප්‍රථම සම්මුඛ සාකච්ඡාව සඳහා නිකරුණේ කාලය සහ මුදල් වැය කරමින් විවිධ ප්‍රදේශ කරා ගමන් කිරීමට සිදු නොවන අතර, සිය නිවසේම රැඳෙමින් ඉතා පහසුවෙන් online ක්‍රමයට සිදුකරන අපගේ වෘත්තීය අවස්ථා ඉදිරිපත් කිරීමේ වැඩසටහන්වලට සහභාගි වීමට දැන් හැකියාව ලබා දී තිබෙනවා."



AIA ඉන්ෂුවරන්ස් හි ඒජන්සි බෙදාහැරීම් අධ්‍යක්ෂ චානක ලියනගේ කියා සිටියේ,

"අප සමාගමට මෙම වීඩියෝ ජීව දත්ත භාවිතයෙන් ඉතාමත් පහසුවෙන් සහ ඉක්මණින් එම රක්ෂණ නියෝජිතයින් බඳවා ගැනීමේ කටයුතු සිදු කිරීමට හැකියාව තිබෙන අතර, අපේක්ෂකයින්ගේ තොරතුරු පිළිබඳ ඉතා පැහැදිලි අදහසක් ලබාගැනීමටත් ඒවා උපකාරී වනවා. ඒ වගේම මුහුණට මුහුණ ලා එකින් එක සිදු කරන්නා වූ සම්මුඛ සාකච්ඡාවලට වඩා ඉතා සුළු කාලයක් ඇතුළත දී විශාල පිරිසකගේ ජීව දත්ත පිළිබඳ විස්තර සොයා බලා බඳවා ගැනීම් සිදුකිරීමටත් මෙමගින් අපට හැකිවී තිබෙනවා. අපගේ අලෙවි බලකාය, බලගැන්වීමට ඉතා උසස් තත්ත්වයේ වෘත්තිකයින් බඳවා ගැනීමට අප ගන්නා ප්‍රයත්නය මෙම ක්‍රමය ඔස්සේ වඩාත් කාර්යක්ෂම වී ඇති බව මගේ අදහසයි."

ඔබත් සොයන්නේ සීමා රහිත ආදායමක් ඉපැයීමට හැකියාව ඇති වෘත්තියක් නම්, එමෙන්ම ඔබට අවශ්‍ය ආකාරයට නම්‍යශීලී කාලවේලාවන්ට අනුව සිදු කළ හැකි රැකියාවක් නම්, ජාත්‍යන්තර තලයේ ඇගයීම් ලබාගත හැකි, දෙස් විදෙස් සංචාර ලබා දෙන නවතම තාක්ෂණය භාවිතයෙන් කළ හැකි රැකියාවක් නම් ලොව විශාලතම ජීවිත රක්ෂකයා වන AIA ඉන්ෂුවරන්ස් ඔබට වඩාත් ගැළපෙන රැකියා ස්ථානයයි.

ඔබත් අදම <https([[web'ssixervideo'com[record[candidate_details[aia-247> ඔස්සේ AIA ශ්‍රී ලංකා Sixer Video රක්ෂණ නියෝජිතයින් බඳවා ගැනීමේ පිටුවට පිවිස වැඩි විස්තර සොයා බලන්න.

MDRT
Great Place To Work. Best Workplaces Laureate SRI LANKA 2013 - 2018

## HNBA සහ HNBGI හි ඇඹිලිපිටිය ශාඛාව නවතම පරිශ්‍රයක



ඇඹිලිපිටියේ නැවත ස්ථානගත කරන ලද HNBA සහ HNBGI ශාඛාව විවෘත කිරීම.

HNB ඇෂුවරන්ස් PLC (HNBA) සහ එහි පූර්ණ අනුබද්ධිත සමාගමක් වන HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් (HNBGI) සිය ඇඹිලිපිටිය ශාඛාව නැවත ස්ථානගත කරන ලද බව නිවේදනය කළේය. මෙම ශාඛාව විවෘත කිරීමේ උත්සවය සඳහා ප්‍රධාන ආරාධිත ලෙස, HNBA සහ HNBGI හි ප්‍රධාන විධායක නිලධාරී ප්‍රසන්න ප්‍රනාන්දු මහතා සහභාගී වූ අතර, HNBA සහ HNBGI හි කළමනාකරණයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයින් මෙන්ම අනෙකුත් සම්භාවනීය අමුත්තන් ද ඊට සහභාගී වූහ.

මෙම අවස්ථාවට එක් වූ HNBA සහ HNBGI හි ප්‍රධාන විධායක නිලධාරී ප්‍රසන්න ප්‍රනාන්දු මහතා මෙසේ පැවසීය.

"ඇඹිලිපිටිය ප්‍රදේශයේ සේවාලාභීන් සමග වසර ගණනාවක සිට ගොඩනැගුණු ඉතාමත් සමීප සුහද සම්බන්ධතාවක් අප සමූහයට පවතී. අපි සෑම විටම ඔවුන්ගේ වටිනා වත්කම් මෙන්ම ආදරණීයයන්ගේ ජීවිත සඳහා පූර්ණ, විශිෂ්ට රැකවරණයක් සළසා දීමට කටයුතු කරමු. අද දවසේ සමරන මෙම නව ආරම්භය ඔවුන් හට උපරිම සේවාවක් සැලසීමට ඇති අපගේ අඛණ්ඩ කැපවීම සනිටුහන් කරයි. සමූහයක් ලෙස අපගේ සේවාලාභීන් හට නව සේවා හඳුන්වාදීමටත්, සේවා ගුණාත්මක බව වර්ධනය කිරීමටත් ඇප කැපව සිටියි. අපගේ ශාඛා තුළ ඇති යටිතල පහසුකම් නවීකරණය කිරීම මගින් සේවාලාභී තෘප්තිය ඉහළ නැංවීමට හැකි වන බව අපගේ විශ්වාසයයි. එබැවින් සේවා විශිෂ්ටත්වය තවදුරටත් ඉහළ නංවමින් ඇඹිලිපිටිය ප්‍රදේශයට ඉහළ වටිනාකමක් නිර්මාණය කිරීමේ අපගේ ඉලක්කය මෙම ශාඛාව නවීකරණය කිරීම මගින් ඉෂ්ට වනු බව නිසැකයි."

HNBA හි ප්‍රධාන මෙහෙයුම් නිලධාරී වන ලසිත විමලරත්න මහතා තම අදහස් ප්‍රකාශ කළේ මෙලෙස ය.

"සමූහයක් ලෙස අපගේ සේවාලාභීන් හට ප්‍රශස්ත හා ගුණාත්මක සේවාවක් සැලසීමට අපත් අපගේ කාර්ය මණ්ඩලයත් නිතර උත්සුක වේ. සැබවින්ම අපගේ කාර්ය මණ්ඩලයේ කැපවීම සමූහයක් ලෙස රක්ෂණ ක්ෂේත්‍රයේ විශිෂ්ටත්වය කරා යෑමේ ගමනට ඉමහත් සවියක් වී ඇති අතර, HNBA සහ HNBGI හට නව කඩ ඉම් කරා යෑමටද හැකියාව ගෙන දෙයි."

HNBGI හි ප්‍රධාන මෙහෙයුම් නිලධාරී වන සිතුමිණ ජයසුන්දර මහතා අදහස් ප්‍රකාශ කරමින් පැවසුවේ "ස්ථිර සහ සවිමත් ශාඛා මෙහෙයුම් පද්ධතියක් පැවතීම සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වර්ධනයට සෘජුවම බලපාන ප්‍රධාන සාධකයකි. තවද මෙම නව ශාඛාව, වෙළෙඳපොළ තුළ පවතින අභියෝගාත්මක කාලයන්හිදී පවා ව්‍යාපාරික අරමුණු කරා ගමන් කිරීමට ඇති අපගේ නොසෙල්වෙන ස්ථාවරය පිළිබඳ ප්‍රබල සාක්ෂියක් වේ".

HNB ඇෂුවරන්ස් PLC ශ්‍රී ලංකාව තුළ ශීඝ්‍රයෙන් වර්ධනය වන රක්ෂණ සමාගමක් වන අතර, එහි ශාඛාවන් 63ක් දැනට රට පුරා පවතී. HNBA, Fitch Ratings Lanka වෙතින් කෙරෙන "ජාතික රක්ෂණ සමාගම් හි මූල්‍ය සවිය ශ්‍රේණිගත කිරීම" අනුව, A (lka) යන ශ්‍රේණිය ලබාගත් ජීවිත රක්ෂණ සමාගමක් වේ. ශ්‍රී ලංකා රක්ෂණ නියාමකයා විසින් හඳුන්වා දුන් සමාගම් වෙන් කිරීමේ නීතිය අනුව 2015 ජනවාරි මස HNB General Insurance Limited සමාගම එහි මෙහෙයුම් ඇරඹුවේ ය.

HNBGI යනු සාමාන්‍ය රක්ෂණ සේවාවන් වන මෝටර් රථ, මෝටර් රථ නොවන සහ ටකාෆුල් රක්ෂණ විසඳුම් සළසා දෙන HNB Assurance PLC හී සම්පූර්ණ හිමිකාරිත්වය ඇති පරිපාලිතයක් වේ. HNBA, LMD විසින් නම් කරන ලද ශ්‍රී ලංකාවේ හොඳම සමාගම් 100 ඇතුළතත් ශ්‍රී ලංකාවේ හොඳම වෙළෙඳ නාම 100 ඇතුළතත් ඇගයුම් ලබා තිබෙන අතර, ජාත්‍යන්තර තලයේ වෙළෙඳ නාම විශිෂ්ටත්වය, ඩිජිටල් අලෙවිකරණය, මානව කළමනාකරණ විශිෂ්ටත්වය සඳහා සම්මාන ද එහි වාර්ෂික වාර්තාවන් සඳහා ශ්‍රී ලංකා වරළත් ගණකාධිකරණ ආයතනය විසින් සහ දකුණු ආසියානු ගණකාධිකාරීවරුන්ගේ සංගමය විසින් ලබා දෙන නොයෙකුත් සම්මානත් ජය ගත් සමාගමක් වේ.

# දිනමිණ රැකියා අවස්ථා

## Airport & Aviation Services (Sri Lanka) Limited

Make Happy Journeys'

**ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවේ සහ ශ්‍රී ලංකා පොලිසියේ වසර 10ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සාමාජිකයින් ගුවන් තොටුපොල ආරක්ෂක සේවාවට හා ගුවන් තොටුපොල ගිනි හා මුදවාගැනීම් සේවයට බඳවා ගැනීම......**

ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) සම්මතයන්ට අනුව ක්‍රියාත්මක වන ගුවන් තොටුපොල ආරක්ෂක සේවාව පිළිබඳ පුහුණු පාඨමාලාවක් හා ගුවන් තොටුපොල ගිනි හා මුදවා ගැනීම් පිළිබඳ පුහුණු පාඨමාලාවක් හදාරා එම ක්ෂේත්‍රයන් හි වෘත්තිකයෙකු ලෙස කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවේ සහ ශ්‍රී ලංකා පොලිසියේ වසර 10ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සාමාජිකයින් (පිරිමි) සඳහා අවස්ථාව උදාවී ඇත. එම පුහුණුව සාර්ථකව නිමකරන්නන් ආයතනයේ ස්ථිර සේවයට බඳවා ගනු ලැබේ.

මේ සඳහා වැඩි විස්තර හා අයදුම්පත http://www.airport.lk>Corporate> careers අපගේ වෙබ් අඩවියෙන් ලබාගන්න.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාල සහතික වල පිටපත් ද සමග පහත සඳහන් ලිපිනයට 2020 සැප්තැම්බර් මස 11 වන දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සලස්වන්න.

සභාපති
එයාර්පෝට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ්
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ
කටුනායක

---

## නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

## උපාය මාර්ගික නගර සංවර්ධන වැඩසටහන (SCDP)

SCDP

### (ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන වැඩසටහනකි)

# පුරප්පාඩු

### ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර (01)

උපාය මාර්ගික සංවර්ධන වැඩසටහන (SCDP) යනු, එම වැඩසටහන තුළ ආයෝජනය මගින්, සංවර්ධනය කරනු ලබන වත්කම් ඵලදායී ලෙස කළමනාකරණය කර ගැනීම සඳහා, ගාල්ල, මහනුවර සහ යාපනය යන නගරවලට හැකියාව ලැබෙන පරිදි එම නගරවල (ගාල්ල, මහනුවර හා යාපනය) හි, පාර්ශවකරුවන්ගේ අභිලාෂී ආයෝජකයින්ගේ, ආයතනික ධාරිතා සංවර්ධනය, පොදු නාගරික අවකාශයන් උත්ශ්‍රේණිගත කිරීම, උසස් කරළීම, රථවාහන ගමනා ගමන හා ප්‍රවාහන පහසුකම්, චලනාව, චලනය, සේවා හා නාගරික යටිතල පහසුකම් වැඩිදියුණු කරළීම සඳහා වන අරමුණින් යුක්තව, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ පිහිටුවනු ලැබූ, නාගරික සංවර්ධන මූල පිරිමකි. මෙම ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකුව වෙතින් ලබාගන්නා ණය පහසුකම් මගින් මූල්‍ය සහය ලබා ගනු ලැබේ.

ව්‍යාපෘති අධ්‍යක්ෂක තනතුර පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම්ලත් හා පළපුරුදු ශ්‍රී ලාංකීය පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**PS මට්ටම 1, 5 වන ගණය - කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2019 පරිදි (පහත 1 හෝ 2 හෝ 3)**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන, අදාළ ක්ෂේත්‍රයේ, ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම **හෝ**
    
    අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සරිලන සමාන සුදුසුකමක් ලෙස, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක් **හෝ**
    
    අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීයවේදී ආයතනයකින් ලබාගත්, ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීයවේදී සුදුසුකමක් **සහ**
    
    කළමනාකරණ මට්ටමේ, අඩුම තරමින් වසර 16 ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද ඉන් වසර 08 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ, ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම **හෝ**
    
    අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක් **හෝ**
    
    අදාළ ක්ෂේත්‍රයේ, පිළිගත් වෘත්තීයවේදී ආයතනයකින් ලබාගත් එහි ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීයවේදී සුදුසුකමක් **සහ**
    
    අදාළ ක්ෂේත්‍රයේ, පශ්චාත් උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීයවේදී ආයතනයකින් ලබාගත් එහි ආයතනික / වරලත් සාමාජිකත්වය හෝ එහි සමාන වෘත්තීයවේදී සුදුසුකමක් **සමග**
    
    අඩුම තරමින් වසර 14 ක (දහ හතරක) කළමනාකරණ මට්ටමේ පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද, ඉන් වසර 07 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

03. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම **හෝ**
    
    අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක් **සහ**
    
    අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් **සමග**
    
    අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීයවේදී ආයතනයකින් ලබාගත්, එහි ආයතනික / වරලත් සාමාජිකත්වය හෝ එහි සමාන වෘත්තීයවේදී සුදුසුකමක් **සමග**
    
    අඩුම තරමින් / වසර 12 ක කළමනාකරණ මට්ටමේ පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද ඉන් වසර 06 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

**වැටුප් පරිමාණය හා පොදු කොන්දේසි :**

වැටුප් 2019.03.15 දින දතම හා අංක 01/2019 දරන, කළමනාකරණ සේවා චක්‍රලේඛ හා වෙනත් අදාළ කළමනාකරණ සේවා චක්‍රලේඛ මත පදනම් වනු ඇත.

අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු අතර, වයස අවුරුදු 64 ට (හැට හතරට) වැඩි නොවිය යුතුය.

**සේවා කොන්දේසි හා නියමයන් :**

රජයේ සේවකයින්, 2019 මාර්තු මස 15 වන දින දතම හා අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2.3.3 වගන්තියට අනුකූලව බඳවාගනු ලබන අතර, රජයේ සේවයෙන් බැහැර අයවළුන් කොන්ත්‍රාත් පදනම මත, බඳවා ගනු ලැබේ. මෙම පෙත්වීම්, එක් වසරක කාලසීමාවකට, කොන්ත්‍රාත් පදනම මත වනු ඇත.

**තෝරාගැනීමේ ක්‍රමවේදය :**

සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව කෙටි ලැයිස්තුගත කරනු ලබන අයවළුන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

**අයදුම්පත් :**

අපේක්ෂකයින් විසින් තමන්ම A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙළ කරනු ලැබූ සිය අයදුම්පත් දුරකථන අංකය හා ඊමේල් ලිපිනයද ඇතුළුව, වෙනත් අදාළ තොරතුරු හා සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ සියලු තොරතුරු විස්තර සඳහන් කරමින්, 2020 **සැප්තැම්බර් මස 15 වන දිනට හෝ ඊට පෙර**, ලැබෙන සේ පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. "**අයදුම් කරනු ලබන තනතුර**" ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිළිව සටහන් කළ යුතුය. රාජ්‍ය / ආයතනික අංශයේ ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ ආයතන / සංවිධානවල ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතු වන අතර, ඍජු පිටපත්ද සමග පහත දැක්වෙන ලිපිනයට ඉදිරිපත් කළ යුතුය.

**ලේකම් :**
**නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය, 17 වන මහල, "සුහුරු පාය", බත්තරමුල්ල.**

---

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

# ඇබෑර්තු

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පහත දක්වා ඇති තනතුරු සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **පාර්ලිමේන්තු කථා පරිවර්තක**
2. **ගෘහපාලන සහායක**

මෙම අයදුම්පත් කැඳවීමට අදාළ දැන්වීම 2020 අගෝස්තු මස 28 වැනි දින ගැසට් පත්‍රයෙහි පළකර ඇති අතර, එම ගැසට් නිවේදනයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍ර ප්‍රකාරව සකස් කරගන්නා ලද අයදුම්පත් 2020 සැප්තැම්බර් මස 11 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "**පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය. මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේද ලබා ගත හැකිය.

**පාර්ලිමේන්තුවේ මහ ලේකම්,**

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,**

**2020 අගෝස්තු මස 30 වැනි දින.**

---

## රැකියා ඇබෑර්තු

ජලය ආශ්‍රිත ව්‍යාපාර සඳහා ප්‍රසිද්ධ ශ්‍රී ලංකා සමූහ ව්‍යාපාරයේ පහත සඳහන් පුරප්පාඩු සඳහා සේවකයින් අවශ්‍යව ඇත.


- **රියදුරන් (බර/සැහැල්ලු වාහන)**

ආහාර හා නවාතැන් පහසුකම් සහිතයි.

**ශ්‍රී ලංකා මෝටර් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම**
අංක 13/1, ශ්‍රී ධර්මාරාම පාර, රත්මලාන
දුරක: 011-2722486, 2728648,
077-3497081

---


BE BETTER INFORMED!



News you can trust now free on your mobile phone.

Dinamina Daily News Thinakaran

VISIT apps.lakehouse.lk

DOWNLOAD TODAY!

AVAILABLE AT

LAKE HOUSE


---

# ඇබෑර්තු ඇත

**විකුණුම් සහයක - පිරිමි**

**(සිම් ඇඳුම් ක්ෂේත්‍රයේ වසර දෙකක පළපුරුදු)**

ගම්පහ නගරය අවට්න් විශේෂයි.
(නවාතැන් පහසුව දිය හැක.)

වැටුප්
රු. 35 000/= සිට 40 000/= දක්වා

සියලු සහතිකපත් රැගෙන පැමිණෙන්න

**සුපර් ස්ටයිල්**
නො. 12, සිරිකුරුස පාර, ගම්පහ

---

## ජෙනරේටර් නඩත්තු කාර්මිකයින් අවශ්‍යයි

**ජෙනරේටර් නඩත්තු කාර්මික ශිල්පීන් කොළඹ සහ නුවර ප්‍රදේශ සඳහා අවශ්‍යයි.**

ජෙනරේටර් නඩත්තු අංශයේ අවුරුදු 2 ක අවම පළපුරුද්ද සහිත අයදුම් කරුවන් සම්පූර්ණ කරන ලද අයදුම්පත්, සැප්තැම්බර් 11 වන දිනට පෙර පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

**මානව සම්පත් කළමනාකරු,**
**හේලිස් ඇවෙන්චුරා (ප්‍රයිවට්) ලිමිටඩ්,**
**අංක 25, ෆොස්ටර් පටුමග,**
**කොළඹ 10.**

---




**ටොයොට්සු ලංකා පුද්ගලික සමාගම** ලංකාවෙහි ඇති මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ නවතම සේවාවන් සපයන ආයතනයයි. අපගේ මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ සේවාවේ අගයන්, පාරිභෝගික අත්දැකීම් හා අවශ්‍යතා, අලුත්වැඩියාවේ උසස් තත්වය, ආරක්ෂාව, පිරිවැය අඩුකිරීමේ හැකියාව සහ නවෝත්පාදනය මත පදනම් වේ. මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ නවතම පිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා අපගේ **වත්තල ප්‍රධාන ශාඛාවෙහි** පහත සඳහන් තනතුරු සඳහා පුරප්පාඩු ඇත.

## ඇබෑර්තු

### ආයතනික / පොදු කටයුතු

- අලෙවි විධායකයින්
- පාරිභෝගික සම්බන්ධතා විධායක
- තොරතුරු තාක්ෂණ නිලධාරී
- පිළිගැනීමේ නිලධාරිනී / ඉදිරිපස කාර්යාලය
- නඩත්තු කාර්මික ශිල්පීන්
- මුදල් අයකැමි

### පොදු අලුත්වැඩියා

- අලුත්වැඩියා උපදේශකවරු
- කාර්ය පාලකවරු
- තාක්ෂණික නිලධාරීන් (වීල් අලයින්මන්ට්)
- සේදුම් අධීක්ෂකවරු
- වැඩබිම් අධීක්ෂකවරු
- තාක්ෂණික නිලධාරීන්
- ගබඩා සහායකවරු
- ණය අයකර ගැනීමේ නිලධාරීන්

### බොඩි සහ පේන්ට්

- අලුත්වැඩියා අධීක්ෂකවරු
- පින්තාරුකරුවන්
- තීන්ත කවලම් කරන්නන්
- කාර්ය පාලකවරු
- ටින්කරින්
- කාර් ඩිටේලිං කාර්මිකයින්

### අමතර කොටස්

- දේශීය / විදේශීය අමතර කොටස් සැපයීමේ නිලධාරීන්
- ගබඩා නිලධාරීන් (අමතර කොටස්)
- රියැදුරන්

අපගේ ජයග්‍රාහී කණ්ඩායමෙහි සාමාජිකයෙකු වීමට ඔබ අදහස් කරන්නේ නම්, මෑතකදී ගත් ඡායාරූපයක්, ඥාති නොවන ඔබව දන්නා පුද්ගලයන් දෙදෙනෙකු සඳහන් කරන ලද ජීවදත්ත තොරතුරු සටහනක් ද සමග අයදුම් කරන තනතුර සඳහන් කරන ලද ඔබගේ අයදුම් පත දින 7ක් ඇතුලත **careers@toyotsu.lk** වෙත යොමු කරන්න.

වැඩි විස්තර සඳහා **www.toyotsu.lk** පිවිසෙන්න

*තෝරාගැනීම්, ඔබගේ විභව හැකියාවන් හා ව්‍යවහාරික නිපුණතා අනුව තක්සේරු මධ්‍යස්ථානයේ තක්සේරුව මත පදනම්ව සිදු කෙරේ.

---


1950 සිට දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොව ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන
(011) 2 242 9491

LAKE HOUSE

# සිළුමිණ රැකියා අවස්ථා

## රැකියා ඇබෑර්තු

රෙදිපිළි ආනයනය කරන ආයතනයකට දක්ෂපලපුළුල කස්ටමර් හැන්ඩ්ල් කල හැකි පලපුරුදු කාන්තාවන් අවශ්‍යයි. වැටුප රු.31,000ක් දක්ෂතාවය මත කොමිස් දීමනා ගෙවනු ලැබේ. විසිදාහතට අධිකව උපයාගත හැක. බෙඩ්ශීට් වැටී මැසීම සඳහා කාන්තාවන් අවශ්‍යයි. අවශ්‍ය නම් නැවතීමට කාමරයක් උපයාගැනීමට පහසුකම් ඇත.

**සැම්රිච්ටා බෙඩ්ශීට් කොම්පැනි**
ඇටවිරියවත්ත පාර, ඔවගම, ජා-ඇල. **070 140 78 72**

## පවුඩර් කෝටින් පින්තාරුකරුවන් වහාම අවශ්‍යයි

මත්තේගොඩ පිහිටි වානේ සහ දැව කර්මාන්ත ශාලාවක් සඳහා පවුඩර් කෝටින් පින්තාරුකරුවන් වහාම අවශ්‍යයි. ආකර්ෂණීය වැටුප් සහ දීමනා.

**විමසන්න : 0773 576 444**

TMS

## නව සම්භාණ්ඩ (පාවහන්) කර්මාන්ත ශාලාවකට

**පුහුණු/නුපුහුණු සේවකයින් වහාම බඳවා ගැනේ.**

නො.93/7B,මාකොල දකුණ,මාකොල
දු.අංක:077 6185166/0117 941144

## FLEXO මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් සහ සහයකයින් අවශ්‍යයි.

ටී අපනයනය සඳහා Tea Tag සහ Envelop මුද්‍රණය කරන කැලණිය පිහිටි අප ආයතනයට පළපුරුදු FLEXO මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් අවශ්‍යව ඇත.

- පළපුරුද්ද අනුව ඉහළ වැටුප් හා දීමනා සාකච්ඡා කරගත හැක.

සම්මුඛ පරීක්ෂණ සඳහා දිනයක් හා වේලාවක් වෙන් කරවා ගැනීමට පහත සඳහන් දුරකථන අංකය අමතන්න.

**විමසීම් - 071 958 6674**

ප්‍රිමියර් පැකේජින් ඉන්ටනැෂනල් (පුද්) සමාගම
151, බියගම පාර, කැලණිය.

H & D Ads

# සංචාරක අමාත්‍යාංශය
# ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය (SLCB)

## භාවිත කළ කාර් රථයක් විකිණීම සඳහා ලංසු ආරාධනය

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, උනන්දුවක් දක්වන ලංසුකරුවන් වෙතින්, පහත සඳහන් භාවිත කල කාර්රථය විකිණීම සඳහා මුද්‍රා, තැබූ යෝජනා කැඳවනු ලබයි.

| වාහන අංකය | වර්ගීකරණය | මාදිලිය | නිෂ්පාදිත වර්ෂය | ආපසු නොගෙවන ගාස්තු -රුපියල්- | ලංසු ඇපකර තැන්පතු -රුපියල්- |
|---|---|---|---|---|---|
| WP KJ-xxxx | නිසාන් | සනී EX සැලූන් කාර් රථය | 2010 | 500/- | 10,000/- |

01. අපේක්ෂිත ලංසුකරුවන්හට, අදාළ ලංසු ලේඛන, ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ ප්‍රසම්පාදන ඒකකයෙන් ලබාගත හැක. අදාළ වාහනය, සතියේ දිනවල (රජයේ වැඩකරන දිනවල), 2020 සැප්තැම්බර් 18 දින දක්වා පෙරවරු 9.00 හා පස්වරු 2.00 අතර කාලය තුළ, SLCB පරිශ්‍රයේදී පරීක්ෂා කොට බැලිය හැක.

02. ආපසු ගෙවනු නොලබන ගාස්තු ශ්‍රී ලංකා රුපියල් 500.00 ගෙවීමෙන් හා කොළඹ 03, ගාලු පාරේ, අංක 78, හෝටල් පාසල් ගොඩනැගිල්ලේ, 04 වන මහලේ ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන්, උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ලංසු අවසන් දිනය දක්වා පෙරවරු 9.00 හා පස්වරු 2.00 අතර කාලය තුළ, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගතහැක.

03. මුද්‍රා, තැබූ ලංසු, පිටපතක් සහිතව, ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ගෙනැවිත් භාරදීමෙන්, සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය, 04 වන මහල, හෝටල් පාසල් ගොඩනැගිල්ල, අංක 78, ගාලු පාර, කොළඹ 03 යන ලිපිනයට, 2020 සැප්තැම්බර් 21 වන දින පස්වරු 2.00 ට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ "**නිසාන් සනි EX සැලූන් කාර් රථය (WP KJ - xxxx) බැහැර කිරීම**" යනුවෙන් සටහන් කළ යුතුය. අදාළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම, ශ්‍රී ලංකා සම්මේලන කාර්යංශයේ ප්‍රසම්පදන අංශයේදී පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන්ගේ ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ.

04. ලංසු, අදාළ භාර ගැනීම අවසන් කරනු ලබන දින සිට දින 49 ක් දක්වා වලංගු විය යුතුය.

05. සියලුම ලංසු සමග, ආපසු ගෙවනු ලබන ඇපකරයක්, ශ්‍රී ලංකා රුපියල් දස දහසක (ශ්‍රීලංරු. 10,000.00) වටිනාකමට ඉදිරිපත් කළ යුතු අතර, එම මුදල, මූල්‍ය අංශය (SLCB) වෙත මුදලින්ම කළ යුතුවේ.

06. ප්‍රදානය ලද ලංසුකරු විසින්, ලංසුව පිළිගත් පසුව, ලංසු මුදලින් 25% ගෙවා වාහනය වෙන් කර ගත යුතු අතර, ඉතිරි 75% මුදල, ලංසුව පිළිගත් පසුව දින 07 ක් ඇතුළත ගෙවා නිමකළ යුතුය. එසේ, ලංසුකරු විසින් දින 07ක් ඇතුළත එම මුදල ගෙවීමට අපොහොසත් වුවහොත්, ගෙවා ඇති 25% මුදල හා ආපසු ගෙවනු ලබන තැන්පතු මුදල ආපසු නොගෙවන මුදලක් සේ සලකා ක්‍රියාකරනු ඇත.

07. මෙම කරුණ සම්බන්ධයෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ. ලැබී ඇති ලංසු කිසිදු හේතුවක් නොදක්වා පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය SLCB ආයතනය සතුවේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය,**
**ප්‍රසම්පාදන අංශය.**
**ඇමතුම් : 0114-865050 දිගුව 19**




මෙම සේවාව දැන් දිවයිනපුරා ක්‍රියාත්මකයි.

ලේක්හවුස් සමාජ සත්කාරයකි

# සිළුමිණ ටෙන්ඩර හා අනෙකුත් දැන්වීම්

# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

## අභිලාෂ ප්‍රකාශ කිරීම

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අයත් විශ්වවිද්‍යාල රෝහලෙහි ස්ථාපිත කර ඇති කාමර 50 කින් යුත් ආගන්තුක නිවාසය සහ ආපනශාලාව වෛද්‍ය සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා ඉදිකර ඇති අතර රෝහල් ප්‍රතිකාර ලබන දේශීය/විදේශීය රෝගීන්ගේ පවුල් සාමාජිකයන් සඳහා නේවාසික පහසුකම් ලබා දීම අරමුණු කර ගනිමින් මෙම විශ්වවිද්‍යාල රෝහල් ආගන්තුක නිවාසය ඉදිකර ඇති අතර මෙම පහසුකම මෙරට කිසිදු රෝහලක දක්නට නොලැබෙන සුවිශේෂී ලක්ෂණයක්ද වේ.

විශ්වවිද්‍යාල රෝහලේ පවතින මෙම පහසුකම එනම් ආගන්තුක නිවාසය සහ ආපනශාලාව කළමණාකරණය සහ පවත්වාගෙන යාම සඳහා කැමැත්ත ප්‍රකාශ කිරීම හෙවත් අභිලාෂ ප්‍රකාශ කිරීම සඳහා සුදුසුකම් ලත් ලංසුකරුවන් හට කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය වෙතින් ටෙන්ඩර්පත් කැඳවනු ලබයි.

හෝටල් කළමණාකරණය,ක්‍රියාත්මක කිරීම සහ සේවා සැපයීම පිළිබඳව අවම වශයෙන් අවුරුදු 03 ක පලපුරුද්දක් සමග වෘත්තීය කාර්ය මණ්ඩලයක් සහ ප්‍රමාණවත් මූල්‍ය ධාරිතාවක් සහිත ලංසුකරුවන් විසින් සවිස්තරාත්මක යෝජනාවක් ඉදිරිපත් කල යුතු වේ.

තරඟකාරී ලංසු තැබීම වෙනුවෙන් යෝජනාවක් ඉදිරිපත් කිරීම සඳහා උනන්දුවක් දක්වන පාර්ශවයන් හට මේ සම්බන්ධව පවතින නීති රෙගුලාසි සහ කොන්දේසි පිළිබඳව කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය මගින් හෝ කොආවි නිල වෙබ් අඩවියට පිවිසීම මගින් ලබා ගත හැක.

යෝජනා ඉදිරිපත් කිරීමේදී ඉදිරිපත් කරනු ලබන කවරයෙහි ඉහල වම් කෙලවරෙහි "හෝටල් කළමණාකරණ සේවා සැපයුම්කරුවකු තෝරාගැනීම (EOI)" යනුවෙන් සඳහන් කර 2020 සැප්තැම්බර් මස 14 වන දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනය වෙත ඉදිරිපත් කල යුතු වේ.

උපකුලපති
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය
කඳවල පාර
රත්මලාන
දුර : 0112635268
ඊ මේල් : kdudefence@kdu.ac.lk
වෙබ් :http://www.kdu.ac.lk/ocls/tender-notices

# ටෙන්ඩර් දැන්වීම

## ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

## කුලී පදනම මත මෝටර් කාර් ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම

**ටෙන්ඩර් අංක : AD/TR/Hiring of Vehicles/111/2020**
**දිනය : 15-09-2020 - පෙ.ව. 11.00**

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ අලෙවි අංශයේ නිෂ්පාදන තොරතුරු නියෝජිතයින්ගේ භාවිතය සඳහා මනා ධාවන තත්වයෙන් යුතු මෝටර් කාර් (800 CC – 1000 CC) කුලී පදනම මත ලබා ගැනීමට අවශ්‍යව ඇත.

අදාළ වාහනය ඔවුන් විසින්ම රාජකාරී සඳහා යොදගන්නා අතර, ගමන් ගන්නා මාසික දුර දළ වශයෙන් කිලෝමීටර 2600ක් පමණ වේ. මෙම වාහන පහත සඳහන් කොන්දේසිවලට යටත් විය යුතුය.

1. වාහනය නිශ්පාදිත වර්ෂයේ සිට වසර 05 කට වඩා පැරණි නොවිය යුතුය.
2. වාහනය පූර්ණ රක්ෂණ ආවරණයකර තිබිය යුතුය (සහතික කරන ලද වාහනයේ ආදයම් බලපත්‍රය, රක්ෂණ සහතිකය සහ වාහනයේ ලියාපදිංචි සහතිකයේ පිටපත් ටෙන්ඩර් පත්‍රය සමග අමුණා තිබිය යුතුය).
3. වාහන සැපයුම්කරු මාසික සේවා හා නඩත්තු කිරීම් කළ යුතු අතර, රු1000/=ට අඩු නඩත්තු වියදම් සංස්ථාව විසින් දරණු ඇත.
4. වාහනයේ අලුත්වැඩියා කටයුතු සඳහා දින 03 කට වැඩි කාලයක් ගතවේ නම් ඒ සඳහා වෙනත් වාහනයක් ලබා දිය යුතු වේ.
5. සංස්ථාව ඉන්ධන පිරිවැය දරණු ලැබේ.
6. ගිවිසුම් කාලය ඉක්මවීමට ප්‍රථම වාහනය ලබාගන්නේ නම් ඊට මාස තුනකට පෙර දැනුම්දිය යුතුය.
7. ටෙන්ඩර්කරු වාහනයේ හිමිකරු නොවන්නේනම් අදළ වාහනය පැවරු ලිපියක් සහ වාහන හිමිකරුගේ සහතික කරන ලද ජාතික හැඳුනුම්පතේ පිටපතක් ටෙන්ඩර් පත සමග අමුණා තිබිය යුතුය.
8. මිල ගණන් සමග SPC මුදල් අයකැමිගෙන් **රු.5,000.00 ක ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතු මුදල සඳහා ලබාගත් රිසිට්පතක් සෑම මිල ගණනක් සඳහාම වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කර තිබිය යුතුය.**
9. වාහනය කුලී පදනම මත ලබාදීමේදී සංස්ථාව සමග ගිවිසුමකට එළඹිය යුතුය.

**සියලුම ටෙන්ඩර්පත් පහත සඳහන් ආකෘතියට අනුව ඉදිරිපත් කළ යුතුය.**

| | | |
|---|---|---|
| 01 | ටෙන්ඩර්කරුගේ නම | |
| 02 | ටෙන්ඩර්කරුගේ ලිපිනය හා දුරකථන අංක | |
| 03 | වාහන වර්ගය | |
| 04 | වාහනයේ මාදිලිය හා නිෂ්පාදිත වර්ෂය (2015 වර්ෂයට පසු) | |
| 05 | ලියාපදිංචි අංකය | |
| 06 | ලියාපදිංචි අයිතිකරුගේ නම | |
| 07 | වාහනය හොඳ තත්වයෙන් වායුසමීකරණ ඇතුළුව ඇතිද යන වග (ඔව්/ නැත) | |
| 08 | ඔටෝ ගියර් පද්ධතිය (ඔව්/නැත) | |
| 09 | ලීටරයකට ධාවනය කළ හැකි කිලෝමීටර ගණන (කි. මී . 12 කට නොඅඩු ) | |
| 10 | මාසික කුලී මුදල (රු.) | |
| 11 | අතිරේක කි.මී. 01ක් සඳහා ගාස්තුව (රු.) | |

පිටපතක් සහිතව සීල් තබන ලද ටෙන්ඩර් පත ලියාපදිංචි තැපෑලෙන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටුවෙහි සභාපති වෙත **15.09.2020 වන දින පෙ.ව. 11.00ට හෝ ඊට ප්‍රථම** එවිය යුතුය. එසේ නැතහොත් ඉහත ලිපිනයෙහි බිම් මහලේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. ටෙන්ඩර් පත් බහා එවන කවරයේ උඩ වම් කෙලවරෙහි "AD/TR/Hiring of Vehicles/**111/2020, 15.09.2020 වන දින පෙ.ව. 11.00ට**" යන්න සඳහන් කළ යුතුය.

**15.09.2020 වන දින පෙ.ව.11.00 ට** ටෙන්ඩර් වැසීම කළ වහාම ඒවා විවෘත කරනු ඇත. ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකුට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ එහි සිටීමට ඉඩ දෙනු ලැබේ.

**සභාපති - දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය,**
**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව,**
**75, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,**
**කොළඹ 01.**

**දුරකථන : 011 2320356 - 9**

# කාර්යාල පරිශ්‍ර අවශ්‍යයි

## කුරුණෑගල, මාතලේ හා බත්තරමුල්ල

### අවටින් දිගු කාලීන බදු හෝ කුලී පදනම යටතේ

ප්‍රමුඛ පෙළේ පෞද්ගලික බැංකුවක් සඳහා දිගු කාලීන බදු හෝ කුලී පදනම යටතේ ඉහත ප්‍රදේශ වලින් කාර්යාල පරිශ්‍ර (බිම් මහළ) අවශ්‍ය කර තිබේ.

ගොඩනැගිලිවල පහත සඳහන් පහසුකම් හා අවශ්‍යතා තිබිය යුතුය:

**පිහිටීම** - ප්‍රධාන ව්‍යාපාරික ප්‍රදේශයේ / නගර මධ්‍යයේ
**බිම් ප්‍රමාණය** - අවම වශයෙන් වර්ග අඩි 2000 කි (බිම් මහළ)
**ප්‍රධාන මාර්ගයට මුහුණත** - අවම වශයෙන් අඩි 30යි
**වාහන නැවැත්වීම** - අවම වශයෙන් වාහන 3ක් නැවැත්වීමට හැකි විය යුතුය
**පහසුකම්** - තෙකලා විදුලිය හා ජලය

ඉහත සුදුසුකම් සපුරා ඇත්නම් මෙම දැන්වීම පළකර සති තුනක් ඇතුළත පහත විස්තර සහිතව සඳහන් ලිපිනයට දැනුම් දෙන්න.

- පිහිටීම / බිම් ප්‍රමාණය / අපේක්ෂිත කුලිය / ගොඩනැගිල්ලේ වර්ණ ඡායාරූප / සම්බන්ධ කරගතයුතු අයගේ දුරකථන අංක

ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "කාර්යාල පරිශ්‍ර කුලියට ගැනීම - (නගරය)" යනුවෙන් සඳහන් කරන්න.

ජ්‍යෙෂ්ඨ කළමනාකරු - පරිශ්‍ර හා පරිපාලන
තැපැල් පෙට්ටිය - 2098
කොළඹ

# බලපිටිය මූලික රෝහල සුබසාධක සංගමය

## ආපනශාලාව බදු දීම සඳහා ටෙන්ඩර් කැඳවීම

බලපිටිය මූලික රෝහලේ සුබසාධක සංගමය මගින් පවත්වාගෙන යනු ලබන රෝහල් ආපනශාලාව 2020/10/01 දින සිට 2021/09/30 දින දක්වා වසරක කාලයකට පවත්වාගෙන යාම සඳහා දකුණු පළාත තුළ පදිංචි පුද්ගලයන් ගෙන් මිල ගණන් කැඳවනු ලැබේ.

ලංසුපත් නිකුත් කිරීම 2020/08/31 දින සිට 2020/09/14 දින දක්වා සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.30 දක්වා.

ලංසුපත් භාරගැනීම 2020/08/31 දින සිට 2020/09/14 දින දක්වා සිදු කෙරෙන අතර, 2020/09/14 දින ප.ව. 2.00 ට ලංසුපත් භාරගැනීම අවසන් වේ.

ලංසුපත් විවෘත කිරීම 2020/09/14 දින ප.ව. 2.30 වේ.

ආපසු නොගෙවන රු. 3000/- ක මුදලක් සහ ලිපි ද්‍රව්‍ය ගාස්තු රු. 100/- ක් ගෙවා සුබසාධක සංගමයේ භාණ්ඩාගාරික එම්.කේ.එස්. චන්දන මහතා වෙතින් ලංසුපත් ලබාගත හැක.

ටෙන්ඩරයට අදාළ අතිකුත් ලේඛන සුබසාධක සංගම් කාර්යාලයේදී පරීක්ෂා කර බැලීමේ හැකියාව පවතී. මුද්‍රා තැබූ ලංසුපත් භාරගැනීමේ වේලාව අවසන් වීමට පෙර ලියාපදිංචි තැපැල මගින් සභාපති, සුබසාධක සංගමය, මූලික රෝහල, බලපිටිය නමට හෝ අතින් ගෙනවිත් වෛද්‍ය අධිකාරී නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ හැක. මුද්‍රා තැබූ ලංසුපත් බහාලන කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි **"ආපනශාලාව බදුදීම සඳහා ටෙන්ඩර් කැඳවීම 2020/2021"** ලෙස සඳහන් කළ යුතුය.

ලංසුපත් භාරදෙන අවස්ථාවේදී ඔබ විසින් ඉදිරිපත් කරන මාසික ලංසු වටිනාකමින් 1% ක වටිනාකමක් සඳහා ලංසු සුරක්ෂණයක් ලෙස සුබසාධක සංගමය වෙත මුදලින් තැන්පත් කළ යුතුය.

ආපනශාලාව බදුදීම සම්බන්ධයෙන් අවසන් තීරණය ටෙන්ඩර් මණ්ඩලය සතු වේ.

වැඩිදුර විස්තර සඳහා දුරකථන අංකය මගින් ඇමතිය හැකිය. 0912256330

**සභාපති,**
**සුබසාධක සංගමය,**
**මූලික රෝහල,**
**බලපිටිය.**

# විකිණීමට

භාවිතයෙන් ඉවත්කළ බැටරියෙන් ක්‍රියාකරන කොමට්සු වර්ගයේ Fork Lift යන්ත්‍රයක් (ක්‍රියා විරහිත), Fork Lift බැටරියක්, සින්ක් ඇලුමිනියම් තහඩු.

ඉල්ලුම්පත් ආපසු නොගෙවන රු. 500/- ක ආකෘති පත්‍ර මත 2020-09-11 දිනට හෝ පෙර ඉල්ලුම් කරන්න.

**විමසීම් : 077-3187757 / 076-1558895**

**ෆින්ලේස් කලම්බු ලිමිටඩ්**

**309/6, මීගමු පාර, වැලිසර.**

# කාර්යාල පරිශ්‍රයක් අවශ්‍යයි

- වාහන 15ක් නැවැත්වීමට හැකි, අවම වශයෙන් වර්ග අඩි 5000ක ප්‍රමාණයක්
- සම්පූර්ණයෙන් මිළදී ගැනීමට හෝ බද්දට
- කොළඹ 05, 06, නුගේගොඩ, කිරුළපන සහ ඒ නගර අවටින් විශේෂයි
- පොදු ප්‍රවාහනයෙන් පහසුවෙන් ප්‍රවේශ විය හැකි විය යුතුය

කරුණාකර hrdep1010@gmail.com විද්‍යුත් ලිපියට විස්තර ඉදිරිපත් කරන්න

**අමතන්න : 0773493417**

# මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විදේශ මත්පැන් රේන්ද විකිණීම - 2021

පූර්වෝක්ත තැබෑරුම් රේන්දය පහත විස්තර සඳහන් දිනයන්හිදී මොරටුව ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේදී ටෙන්ඩර් මගින් විකුණනු ලැබේ.

1. රටබීම තැබෑරුම විකිණීම 2020.09.18 දින පෙ.ව. 10.30 ට
2. ඉහත සඳහන් දිනදී විකිණීමට නොහැකි වන තැබෑරුම් රේන්දය 2020.11.13 දින පෙ.ව. 10.30 ට නැවත විකුණනු ලැබේ.
3. සම්පූර්ණ විස්තරය සඳහා 2020.08.14 දිනැති අංක 2189 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය බලන්න.

**බී. ඒ. ඩී. චින්තක**
**ප්‍රාදේශීය ලේකම්**
**මොරටුව.**

**ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය,**
**මොරටුව.**

# මහජන බැංකුව

## ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා ආරාධනයයි !

### "යෝජිත මහජන බැංකු ගල්කිරියාගම ශාඛාව ඉදිකිරීම"

**ටෙන්ඩර් අංක : 34/2020**

ප්‍රධාන කළමනාකරු (ඉංජිනේරු සේවා) මහජන බැංකුව, ප්‍රධාන කාර්යාලය, ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව, 06 වන මහල, 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02 විසින් පහත විස්තර කරන පරිදි **"යෝජිත මහජන බැංකු ගල්කිරියාගම ශාඛාව ඉදිකිරීම"** සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් කැඳවනු ලැබේ.

ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල රු. මිලියන 17.0 කි. (අගය එකතු කළ බදු රහිත)

යෝජිත ගොඩනැගිල්ල තනි තට්ටුවකින් (වර්ග අඩි 2340 ක බිම් ප්‍රමාණයක්) සමන්විත වන අතර, වැරගැන්වූම් කොන්ක්‍රීට් ව්‍යුහයක් සහිත නව ගොඩනැගිල්ල ගඩොල් බිත්ති නිම කිරීම්, ඇලුමිනියම් දොර / ජනෙල් හා සිවිලිම් වලින් හා අනෙකුත් නිමාවන් හා සේවාවන් සහිතව සිදු කෙරේ. යෝජිත ගොඩනැගිල්ල **"අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගල්කිරියාගම"** යන ස්ථානයේ ඉදිකිරීමට නියමිතයි.

01. ඉදිකිරීම් කාලසීමා වලින් දින 210 කි.

02. ටෙන්ඩර් කැඳවීම ජාතික තරගකාරී ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුව සිදු කෙරේ.

03. කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා සලකා බලනු ලැබීම පිණිස සුදුසුකම් ලබන ටෙන්ඩර්කරුවන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ කොන්ත්‍රාත් නාම ලේඛනයෙන් ඉවත් කර නොමැති විය යුතු අතර, එහි C5 ශ්‍රේණියේ හෝ ඊට වඩා වැඩි ශ්‍රේණියක ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා වලංගු ලියාපදිංචිය සතු විය යුතු වේ.

04. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමේ අවශ්‍යතා පහත පරිදි වේ.

a) පසුගිය වසර 5 තුළ ඉටු කරන ලද ඉදිකිරීම්වල සාමාන්‍ය වාර්ෂික වටිනාකම අවම වශයෙන් රුපියල් මිලියන 40 (රු. 40,000,000/-) ක් විය යුතුය.

b) පසුගිය වසර 5 ක කාලය ඇතුළත ප්‍රධාන කොන්ත්‍රාත්කරු වශයෙන් රුපියල් මිලියන 25 ක වටිනාකමින් යුත් මීට සමාන හා ගොඩනැගිල්ලක අලුත්වැඩියාවක් මාස 07 ක කාලයක් ඇතුළත සාර්ථකව නිම කිරීම හෝ මිලියන 25 ට වැඩි වටිනාකමින් යුත් ගොඩනැගිල්ලක අලුත්වැඩියාවක් ඊට සමානුපාතික වන කාලයක් තුළ නිම කර තිබීම.

c) මෙම කොන්ත්‍රාත්තුව යටතේ ලැබිය හැකි ද්‍රවශීල වත්කම්වල අවම මුදල සහ / හෝ අනුමතව ඇති ණය පහසුකම් අනිකුත් කොන්ත්‍රාත් බැඳීම් හා අත්තිකාරම් හැර ශුද්ධ ශේෂය රුපියල් මිලියන 5 ට නොඅඩු විය යුතුය.

05. උනන්දුවක් දක්වන කොන්ත්‍රාත්කරුවන්හට කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවතේ, මහජන බැංකු ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ 6 වන මහලේ මහජන බැංකුවේ ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව වෙතින් තවදුරටත් තොරතුරු (දුරකථන අංක 0112481513 / ෆැක්ස් අංකය 0112341591) ලබාගත හැකි අතර, 02.09.2020 සිට 22.09.2020 දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා රාජකාරී දිනවල ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කළ හැක.

06. උනන්දුවක් දක්වන ටෙන්ඩර්කරුවන් ඉහත ලිපිනය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් සහ රුපියල් පන්දහසක් (රු. 5,000/-) ආපසු නොගෙවන ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් 02.09.2020 සිට 22.09.2020 තෙක් පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා රාජකාරී දිනයන්හි දී සම්පූර්ණ ටෙන්ඩර් ලියවිලි කට්ටලයක් මිලදී ගත හැක.

07. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් අනුපිටපතකින් ද යුක්තව වම් උඩු කෙළවරේ **"යෝජිත මහජන බැංකු ගල්කිරියාගම බැංකු ශාඛාව ඉදිකිරීම"** යනුවෙන් සඳහන් කර වෙන් වෙන්ව කවරවල බහා මුද්‍රා තබා ඉහත ලිපිනයේ ප්‍රධාන කළමනාකාර (ඉංජිනේරු සේවා), ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට හෝ ලියාපදිංචි තැපැලෙන් 23.09.2020 දින ප.ව. 3.00 ට පෙර මහජන බැංකුව, ප්‍රධාන කාර්යාලය, 06 වන මහල, නො. 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02 යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාදවී ලැබෙන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ටෙන්ඩර් වැසූ විගස විවෘත කරනු ලබන අවස්ථාවට සහභාගි වීමට කැමති ටෙන්ඩර්කරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

08. ටෙන්ඩරය වැසූ දින සිට 23.12.2020 දින දක්වා ලංසුව වලංගු විය යුතුය.

09. සියලුම ටෙන්ඩර් රුපියල් එක් ලක්ෂ හැත්තෑ දහසක් (රු. 170,000/-) සඳහා වන ලංසු ඇපකරයක් සමග ඉදිරිපත් කළ යුතුය. ලංසු ඇපකරය මහජන බැංකුව හැර ඕනෑම වාණිජ බැංකුවකින් ලබාගත යුතු අතර, ටෙන්ඩර් වැසූ දින සිට 20.01.2021 දක්වා වලංගු විය යුතුය.

10. ටෙන්ඩර් පිළිබඳ පූර්ව රැස්වීමක් 11.09.2020 දින පෙ.ව. 10.00 ට ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව, මහජන බැංකුව, 06 වන මහල, 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02 හි දී පැවැත්වේ.

**ප්‍රධාන කළමනාකරු (ඉංජිනේරු සේවා)**
**මහජන බැංකුව,**
**ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව,**
**ප්‍රධාන කාර්යාලය, 06 වන මහල,**
**75, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,**
**කොළඹ 02.**

මහජන බැංකුව PEOPLE'S BANK
www.peoplesbank.lk

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## ආරක්ෂක සේවා සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම - A කලාපය

**කොන්ත්‍රාත් අංකය - USJP/EIS/SEC/Z-A 2020/2021**

01. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් විශ්වවිද්‍යාලයේ "ඒ" කලාපය සඳහා ආරක්ෂක සේවා සැපයීම සඳහා යෝග්‍ය හා සුදුසුකම් සහිත සේවා සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

02. ඉහත සේවාව දින 365 ක කාලයකට අදාළ වේ.

03. මෙම ටෙන්ඩර් ක්‍රියාවලිය ජාතික තරගකාරී මිල ගණන් කැඳවීමේ පටිපාටියට අනුව සිදු කරනු ලැබේ.

04. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙත ආරක්ෂක සේවා සැපයීම සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමට ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් බලපත්‍රය ලබා ඇති සේවක අවම වේතන පනතට අනුව වැටුප් ගෙවනු ලබන සැපයුම්කරුවන් සුදුසුකම් ලබන අතර, සෑම සේවා සැපයුම්කරුවකු විසින්ම රජය විසින් අනුමත 2016 අංක 03 දරන සේවකයන්ගේ ජාතික අවම වේතන පනත, 2016 අංක 4 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත, සේවක අර්ථ සාධක අරමුදල් පනත, සේවක භාරකාර අරමුදල් පනත, පාරිතෝෂික ගෙවීම් පනත, පඩිපාලක ආඥා පනත, සාප්පු හා කාර්යාල සේවක පනත, කම්කරු වන්දි ආඥා පනත ආදී පනත්වලට අනුකූලව වැටුප් හා දීමනා ගෙවිය යුතු වේ.

05. මේ පිළිබඳව උනන්දුවක් දක්වන යෝග්‍ය සේවා සැපයුම්කරුවන්ට දුරකථන අංක 011-2802856 ඔස්සේ සහකාර ලේඛකාධිකාරී / ආයතන (තොරතුරු හා සේවා) ඇමතීමෙන් වැඩිදුර තොරතුරු ලබාගත හැකි අතර, **2020 අගෝස්තු මස 31 වන දින සිට 2020 සැප්තැම්බර් මස 21 වන දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 2.30 දක්වා** සතියේ දිනවල පහත ලිපිනයේදී ටෙන්ඩර් පත්‍රිකා පරීක්ෂා කර බැලිය හැකිය.

06. මේ පිළිබඳව උනන්දුවක් දක්වන යෝග්‍ය සේවා සැපයුම්කරුවන්ට 2020 අගෝස්තු මස 31 වන දින සිට **2020 සැප්තැම්බර් මස 21** වන දින දක්වා කාලය තුළ දී පහත ලිපිනයට ලිඛිතව අයදුම් කිරීමෙන් හා **රුපියල් තුන්දහස් පන්සීයක** (රු. 3,500.00) ආපසු නොගෙවන මුදලක් ගෙවීමෙන් අදාළ ටෙන්ඩර් පත්‍රිකා ලබා ගත හැකිය. මෙම මුදල ගෙවිය යුත්තේ සතියේ රාජකාරී දිනවල **පෙ.ව. 9.00 සිට ප.ව. 2.30 දක්වා** විශ්වවිද්‍යාලයේ සරප් කවුන්ටරය වෙත මුදලින් පමණි.

07. පූර්ව ප්‍රසම්පාදන පැහැදිලි කිරීම් රැස්වීමක් **2020 සැප්තැම්බර් මස 10 වන දින පෙ.ව. 10.30 ට** ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ලේ පිහිටි මාණ්ඩලික රැස්වීම් ශාලාවේදී පැවැත්වේ. උනන්දුවක් දක්වන අයදුම්කරුවන් මේ සඳහා සහභාගි වීම අනිවාර්ය වන අතර, මෙයට අයදුම් කළ හැක්කේ මෙම රැස්වීමට සහභාගි වන අයදුම්කරුවන්ට පමණි.

08. **2020 සැප්තැම්බර් 22 වන දින පෙ. ව. 10.30 ට** ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ලේ පිහිටි මාණ්ඩලික රැස්වීම් ශාලාවේදී ටෙන්ඩර් පත්‍රිකා වසා තබනු ලැබේ.

09. ටෙන්ඩර් බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ, කොන්ත්‍රාත් අංකය, විස්තරය හා ටෙන්ඩරය විවෘත කරන දිනය සඳහන් කළ යුතුය. මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා **2020 සැප්තැම්බර් 22 වැනිද පෙ.ව. 10.30 ට** හෝ ඊට පෙර ලැබෙන පරිදි **නුගේගොඩ, ගංගොඩවිල පිහිටි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී ආයතන (තොරතුරු හා සේවා)** වෙත ලියාපදිංචි තැපැලෙන් ඉදිරිපත් කිරීම හෝ නැතහොත් ඉහත කී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කිරීම සිදු කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කර ඒවා විවෘත නොකරම ආපසු ලංසුකරුවන් වෙත යවනු ලැබේ. ප්‍රමාදයන් සම්බන්ධයෙන් තැපැල් කිරීම සනාථ කිරීමේ සාක්ෂි නොපිළිගනු ඇත. ලංසු භාර ගැනීම සඳහා නියමිත වේලාව අවසන් වූ වහාම ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ බලයලත් නියෝජිතයන්ට (එක් ලංසුකරුවෙකුට එක් නියෝජිතයකු බැගින්) ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වීමට හැකියාව ඇත.

10. මේ සම්බන්ධව ගනු ලබන තීරණ ප්‍රසම්පාදන අස්ථිතය සතුවේ.

11. ටෙන්ඩර් පත්‍රිකා භාර ගන්නා අවසන් දින සිට **2021 ජනවාරි මස 13** වන දින දක්වා මෙම ටෙන්ඩරය වලංගු වේ.

12. සෑම ටෙන්ඩර් පත්‍රිකාවක්ම ලංසු සුරක්ෂණයක් සහිතව ඉදිරිපත් කළ යුතුය.

**ඉහත සඳහන් කරන ලද කරුණු සඳහා අදාළ ලිපිනයන් පහත දැක්වේ.**

ටෙන්ඩර් පත්‍රිකා පරීක්ෂා කිරීම, අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම, සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රිකා භාරදීම.

**සහකාර ලේඛකාධිකාරී / ආයතන (තොරතුරු හා සේවා)**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,**
**ගංගොඩවිල, නුගේගොඩ.**

**ටෙන්ඩර් පත්‍රිකා විවෘත කිරීම**

**පරිපාලන ගොඩනැගිල්ලේ මාණ්ඩලික රැස්වීම් ශාලාව**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,**
**ගංගොඩවිල, නුගේගොඩ.**

**සභාපති / ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,**
**ගංගොඩවිල, නුගේගොඩ.**
**2020.08.26**

# මිල ගණන් කැඳවීමයි

**සමාගම විසින් පාවිච්චි කරන ලද පහත සඳහන් රථ වාහන අලෙවි කිරීම**

| අංකය | ලියාපදිංචි අංකය | වර්ගය | මාදිලිය | නිෂ්පාදිත වර්ෂය |
|---|---|---|---|---|
| 01 | WP LM - 4232 | ලොරි රථය | TATA 2518 | 2016 |
| 02 | WP NA - 1323 | වෑන් රථය | Mitsubishi L300 | 2005 |

- ටෙන්ඩර් පත්‍රිකා ආපසු නොගෙවනු ලබන රු.1,000/-ක තැන්පතුවක් සමාගමේ මූල්‍ය අංශය වෙත ගෙවා ලබා ගත හැක.
- ටෙන්ඩර් පත්‍රිකා ලබාගත් පසුව වාහන පරීක්ෂා කිරීම සතියේ දිනවල පෙරවරු 10.00 ත් පස්වරු 3.00 ත් අතර නො.50, අඟුලාන දුම්රියපොළ පාර, අඟුලාන, මොරටුව පිහිටි සමාගම් පරිශ්‍රයේ දී සිදුකළ හැක.
- එකී ටෙන්ඩර් පත්‍රිකා නිවැරදිව සම්පූර්ණ කර පහත ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට 2020 සැප්තැම්බර් 15 වන දින පස්වරු 01.00 ට පෙර බහාලිය යුතුය.
- ටෙන්ඩර් පත්‍රිකා 2020 සැප්තැම්බර් 15 වන දින පස්වරු 02.00 ට විවෘත කරන අතර, ඒ සඳහා අයදුම්කරුවන්හට සහභාගි විය හැක.

සැ.යු : ටෙන්ඩරයට ඉදිරිපත් කරන භාණ්ඩ හෝ ටෙන්ඩර් පටිපාටිය සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීම සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය සතුවේ.

**මග නැගුම ඉමල්ෂන් නිෂ්පාදන (පුද්) සමාගම**
**නො. 50, අඟුලාන දුම්රියපොළ පාර, අඟුලාන, මොරටුව.**
**විමසීම් : 011-7777460**

SANASA INTERNATIONAL Sefec

# ලංසු සඳහා ආරාධනයයි

## පටක රෝපිත කෙසෙල් පැළ සැපයීම

සණස අන්තර්ජාතික (පුද්) සමාගමෙහි EFECS ව්‍යාපෘතිය විසින් පහත සඳහන් අයිතම සැපයීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

| | අයිතමය | ප්‍රමාණය |
|---|---|---|
| 1 | කැවෙන්ඩිශ් කෙසෙල් පැළ | 9240 |
| 2 | කප්පල් (කෝලිකුට්ටු) කෙසෙල් පැළ | 13860 |
| 3 | පහත දිස්ත්‍රික්ක සඳහා පැළ ප්‍රවාහනය කළ යුතුයි. | |
| | යාපනය | |
| | කිලිනොච්චිය | |
| | මන්නාරම | |
| | මුලතිව් | |
| | වව්නියාව | |

වැඩිදුර විස්තර සහ පිරිවිතර අපගේ ලංසු ලේඛනයේ ඇතුළත්ව ඇති අතර, එය Info@sefec.lk වෙත ඊමේල් පණිවිඩයක් එවීම මගින් ලබාගත හැක.

**සම්පූර්ණ කරන ලද සියලු ලංසු පහත ලිපිනයට යොමු කරන්න,**
**සණස අන්තර්ජාතික (පුද්ගලික) සමාගම,**
**7/7, ප්‍රගතිපුර පාර, මාදිවෙල,**
**කෝට්ටේ. දු.ක. 0114363207**

නැතහොත් info@sefec.lk ඊමේල් කරන්න.

ලංසු භාර ගැනීමේ අවසාන දිනය 2020 සැප්තැම්බර් 07 සඳුද ප.ව. 4.00

## විකිණීමට



ඉතා හොඳ තත්වයේ Piaggio ත්‍රීරෝද රථ 18 විකිණීමට. ඉතා අඩු ධාවනය සහිත. වර්ෂය 2015

0712271088



පත්‍රය බාරේ පළවන දැන්වීම් සඳහා එවන පිළිතුරු සාමාන්‍ය තැපෑලෙන් එවිය යුතුයි

ලියාපදිංචි තැපෑලෙන් එවන ලියුම් බාරගනු නොලැබේ



## ආහාර සැපයීම සඳහා මිල ගණන් කැඳවීම

බියගම ආයෝජන කලාපයේ පිහිටි

**වර්ක්වෙයාර් ලංකා (පෞද්ගලික) සමාගම**

සඳහා දෛනිකව අවශ්‍ය ආහාර සැපයීම සඳහා සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලැබේ.

ඔබගේ මිල ගණන් **2020 සැප්තැම්බර් මස 15** වන දිනට හෝ පෙර අප වෙත ලැබීමට සලස්වන්න.

**වර්ක්වෙයාර් ලංකා (පෞද්ගලික) සමාගම,**
**අංක 78, ආයෝජන කලාපය, "ඒ" කොටස,**
**බියගම.**

වැඩි විස්තර සඳහා පහත අංකයන් අමතන්න

**සංබ : 0762127126 / 0115465000 - (151)**



## දැන්වීමයි

**අඹේවෙල පිහිටි නවසීලන්ත ගොවිපල 2020-09-01 වන දින සිට නැවතත් නරඹන්නන් සඳහා විවෘත කරන බව සතුටින් දැනුම් දෙනු ලැබේ.**

අප සතු ෆ්‍රීසියන් සහ අයෂයර් වර්ගයන්ට අයත් අනර්ඝ එළදෙනුන්ද, සානන්, ජමුනාපාරි සහ බෝයර් වර්ගයට අයත් එළුවන්ද,

කැලිෆෝනියන් ජයන්ට් වර්ගයේ හාවුන් සහ

හරිත වර්ණයෙන් යුක්ත මනරම් වටාපිටාව නැරඹීම සඳහා ඔබට සාදරයෙන් ඇරයුම් කර සිටිමු.

**(ලංකා මිල්ක් ෆුඩ්ස් (සී.ඩබ්ලිව්.ඊ) පී.එල්.සී)**


# ශ්‍රී ලංකා නාවික හමුදාව

## ප්‍රසම්පාදන දැන්වීම

### ශ්‍රී ලංකා නාවික හමුදාවට නිල ඇඳුම් රෙදි සැපයීම සඳහා නිෂ්පාදකයන්ගෙන්/ ආනයන කරුවන්ගෙන්/ සැපයුම්කරුවන්ගෙන්/ කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීම

01. ශ්‍රී ලංකා නාවික හමුදාවේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ඡේද අංක 02 යටතේ දක්වා ඇති නිල ඇඳුම් රෙදි සැපයිය හැකි යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත් කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

   අ. මිල ගණන් කැඳවීම ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ පටිපාටියට අනුව සිදුකරනු ලැබේ.

   ආ. මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ඡේද අංක 02 හි දැක්වෙන වගුවෙහි ඇතුළත් එක් එක් ලිපිගොනු සඳහා ඒ ඒ ලිපිගොනුව යටතේ දක්වා ඇති නොගෙවනු ලබන අයදුම්පත් ගාස්තුව මුදලින්, අධ්‍යක්ෂ (මුදල්) ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය, කොළඹ 01 වෙත ගෙවීමෙන් පසු ඉංග්‍රීසි භාෂාවෙන් සඳහන් ලංසු ලේඛනයන් **2020 සැප්තැම්බර් මස 01** වන දින සිට **2020 සැප්තැම්බර් මස 29** වන දින දක්වා සතියේ වැඩකරන දිනයන්හි **පෙ.ව 10.00 සිට ප.ව 02.00** දක්වා අධ්‍යක්ෂ නාවික (ආහාර හා නිල ඇඳුම්), නාවික හමුදා මූලස්ථානය, කොළඹ 01 වෙතින් ලබා ගත හැක.

   ඇ. ඉදිරිපත් කරන මිල ගණන් වල වලංගු කාලය අවම වශයෙන් ටෙන්ඩර්පත් විවෘත කරන දින සිට **දින 150** ක් විය යුතුය.

   ඈ. තෝරා ගන්නා කොන්ත්‍රාත්කරුවන් නාවික හමුදාව විසින් ඇණවුම් කරනු ලබන නිල ඇඳුම් රෙදි මාර්ගස්ථ ගබඩාව, ශ්‍රී ලං.නා.නෞ. "මහසෙන්" වැලිසර වෙත සැපයුම්කළ යුතුය.

2. 2020 වර්ෂය සඳහා අවශ්‍ය එක් එක් නිල ඇඳුම් රෙදි සහ අනෙකුත් විෂයයන් පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වන අතර අවශ්‍ය ප්‍රමාණයන් ලංසු ලේඛනයේ සඳහන් කර ඇත.

| ටෙන්ඩර් අනන්‍යතා අංකයන් | විෂයයන් පිළිබඳ විස්තරය | ලංසු ලේඛන නිකුත් කරන අවසාන දිනය | මිල ගණන් කැඳවීම අවසන් වන දිනය හා විවෘත කරන වේලාව | නැවත නොගෙවනු ලබන ලංසු ගාස්තුව (රු.) |
|---|---|---|---|---|
| සීපී/ඒ/29/2020 | ලා නිල් පැහැති රෙදි (Material Cloth Light Blue) | 2020.09. 29 | 2020.09.30 පෙ.ව 10.00 | රු. 8,000.00 |
| සීපී/ඒ/30/2020 | තද නිල් පැහැති රෙදි (Material Cloth Dark Blue) | 2020.09. 29 | 2020.09.30 පෙ.ව 10.00 | රු. 8,000.00 |
| සීපී/ඒ/31/2020 | සුදු පැහැති සින්තටික් රෙදි (Material Cloth White Synthetic) | 2020.09. 29 | 2020.09.30 පෙ.ව 10.00 | රු. 4,500.00 |
| සීපී/ඒ/32/2020 | ලා නිල් පැහැති ඇඳ ඇතිරිලි රෙදි (Material Cloth Bed Sheet Light Blue) | 2020.09. 29 | 2020.09.30 පෙ.ව 10.00 | රු. 18,000.00 |
| සීපී/ඒ/33/2020 | සුදු පැහැති නාන තුවා (ශ්‍රී ලංකා නාවික හමුදාව යන නාමය මුද්‍රිත) Bath Towel White (SLN Printed) | 2020.09. 29 | 2020.09.30 පෙ.ව 10.00 | රු. 4,500.00 |
| සීපී/ඒ/34/2020 | ලා නිල් පැහැති රෙදි (Material Cloth SKY Blue) | 2020.09. 29 | 2020.09.30 පෙ.ව 10.00 | රු. 1,500.00 |
| සීපී/ඒ/35/2020 | සුදු පැහැති ඩ්‍රිල් රෙදි (Material Cloth White Drill) | 2020.09. 29 | 2020.09.30 පෙ.ව 10.00 | රු. 3,000.00 |
| සීපී/ඒ/36/2020 | නිල් පැහැති ඩ්‍රිල් රෙදි (Material Cloth Blue Drill) | 2020.09. 29 | 2020.09.30 පෙ.ව 10.00 | රු. 13,000.00 |
| සීපී/ඒ/37/2020 | සැලෑ නිල ඇඳුම් රෙදි (Material Cloth Digital Camouflage) | 2020.09. 29 | 2020.09.30 පෙ.ව 10.00 | රු. 1,500.00 |
| සීපී/ඒ/38/2020 | කලු පැහැති ඩ්‍රිල් රෙදි (Material Cloth Black Drill) | 2020.09. 29 | 2020.09.30 පෙ.ව 10.00 | රු. 2,000.00 |
| සීපී/ඒ/39/2020 | සුදු පැහැති පොප්ලින් රෙදි (Material Cloth Trouser Inner Pocket Bag - Poplin White) | 2020.09. 29 | 2020.09.30 පෙ.ව 10.00 | රු. 4,500.00 |
| සීපී/ඕ/40/2020 | කලු මේස් (Socks Black) | 2020.09. 29 | 2020.09.30 පෙ.ව 10.00 | රු. 4,000.00 |
| සීපී/ඕ/41/2020 | සුදු පැහැති මේස් (White Socks) | 2020.09. 29 | 2020.09.30 පෙ.ව 10.00 | රු. 1,500.00 |
| සීපී/ඕ/42/2020 | තද නිල් පැහැති මේස් (Socks Blue Thick) | 2020.09. 29 | 2020.09.30 පෙ.ව 10.00 | රු. 3,500.00 |

3. ලංසුකරුවන් මිල ගණන් ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතු අතර, ලංසුකරු පුවත්පත් දැන්වීම පලකරන දිනය වන විට ව්‍යාපාර ලියාපදිංචිය සමග ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ආයතනයක්, නිෂ්පාදකයකු, සමාගමක් සහ සීමිත වගකීම් සහිත සමාගමක් හෝ අනෙකුත් වෙළෙඳ ආයතනයක් විය යුතුය.

   අ. නිල ඇඳුම් රෙදි සමාන හෝ ඊට ආසන්න ධාරිතා බලයක් සහිතව රජයේ/ පෞද්ගලික ආයතන වෙත සැපයීම පිළිබඳව වර්ෂ 02 ක සතුටුදායක කාර්ය සාධනයක් තිබීම.

   ආ. රුපියල් මිලියන පනහට (05) වැඩි පොදු කොන්ත්‍රාත් සඳහා අදාල වන 1987 අංක 03 දරණ රජයේ පොදු කොන්ත්‍රාත් පනත ප්‍රකාරව ලංසුකරුවන් ලියාපදිංචි වී සිටිය යුතුය.

   ඇ. ස්ථිර මූල්‍යමය හැකියාව.

   ඈ. බදු ගෙවීම පිළිබඳ සතුටුදායක විය යුතුය.

   ඉ. ප්‍රමාණවත් පරිදි පණිවිඩ හුවමාරු පහසුකම් තිබීම. (දුරකථන, ජංගම දුරකථන, ෆැක්ස් යන්ත්‍ර, විද්‍යුත් ලිපිනයන්)

   ඊ. ප්‍රමාණවත් පරිදි ගබඩා පහසුකම් තිබීම.

   උ. ප්‍රමාණවත් පරිදි කාර්ය මණ්ඩලයක් සිටීම සහ කාර්යාල පහසුකම් තිබීම.

   ඌ. ප්‍රමාණවත් පරිදි ප්‍රවාහන පහසුකම් තිබීම.

   එ. පසු ගිය වසර 03 ක කාලය තුළ අඛණ්ඩව ව්‍යාපාර කටයුතුවල නියැලී සිටීම.

   ඒ. පලපුරුදු තාක්ෂණික කාර්ය මණ්ඩලයකින් සමන්විත අලෙවියෙන් පසු සේවාව සැපයීමේ හැකියාව

   ඔ. සැපයුම්කරු අසාදු ලේඛන ගත නොවූ සැපයුම්කරුවෙකු විය යුතුයි.

4. ලංසුකරුවන් ලංසු ඉදිරිපත් කිරීමේදී වැට් බදු සඳහා ලියාපදිංචි අංකය සඳහන් කර තිබීම අනිවාර්ය වන අතර, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙතින් ලබා ගත් වැට් බදු නිශ්කාශණ සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. වැට් බදු සඳහා ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජෙනරාල් වෙතින් ලබාගත් වැට් බදු ලියාපදිංචියෙන් නිදහස් බවට සනාථ කරන සහතිකයක් ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය. තවද, ඉහත අවශ්‍යතාවයන් සපුරා නොමැති ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. ලංසුකරුවන් විසින් නිසිලෙස සම්පූර්ණ කරන ලද ලංසු ඉදිරිපත් කිරීමේදී ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"ශ්‍රී ලංකා නාවික හමුදාව 2020 වර්ෂය සඳහා නිල ඇඳුම් රෙදි සැපයීම සඳහා කොන්ත්‍රාත් මිල ගණන් ඉදිරිපත් කිරීම"** යන හිසිය, විෂයය කාණ්ඩය, සහ ටෙන්ඩර් පත් විවෘත කරන දිනය, වේලාව සඳහන් කර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ පහත ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් බහාලුම් පෙට්ටියේ තැන්පත් කිරීමට කටයුතු කළ යුතුය.

   **සභාපති,**
   **දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
   **ශ්‍රී ලංකා නාවික හමුදාව,**
   **නාවික හමුදා මූලස්ථානය,**
   **තැ.පෙ 593,**
   **කොළඹ 01.**

6. සියලුම ලංසුකරුවන් ලංසු ලේඛනයෙහි සඳහන් පරිදි ලංසු සුරක්ෂණ නාවික හමුදාධිපති නමට ඉදිරිපත් කළ යුතුය. එම ලංසු සුරක්ෂණ ඇපකරය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති පිළිගත් වාණිජ බැංකුවකින් ලබා ගන්නා ලද කොන්දේසි විරහිතව මුදල් බවට පරිවර්තනය කළ හැකි ලංසු සුරක්ෂණයක් විය යුතු අතර ඇපකරයෙහි මුල් පිටපත ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය. (අදාල බැංකුවේ ලිපි ශීර්ෂය සහිතව) ලංසු සුරක්ෂණ ඇපකරයෙහි වචනාකම මිලදී ගැනීම් මාර්ගෝපදේශ සංග්‍රහය 2006 ප්‍රකාරව ලංසු ලේඛනයෙහි සඳහන් කර ඇත. ලංසු සුරක්ෂණයේ වලංගු කාල සීමාව ලංසුව විවෘත කරන දින සිට **දින 180** ක් විය යුතුය.

7. සෑම ලංසුවක් සමගම ඉල්ලුම් කර ඇති පරිදි නියැදියක් ලබා දිය යුතු අතර, එම නියැදියක් රසායනාගාර පරීක්ෂාවට ලක් කිරීමට වැයවන වටිනාකම ලංසුවේ දක්වා ඇති පරිදි ලංසු තබන්නන් විසින් නාවික හමුදාධිපති නමින් නාවික හමුදා මූලස්ථානයේ අධ්‍යක්ෂ (මුදල්) වෙත තැන්පත්කර අදාල ලදුපත සමග ඉදිරිපත් කළ යුතුය. (චෙක්පත් හා මුදල් භාරගනු නොලැබේ) එසේ ඉදිරිපත් නොකරන ලද ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. ලංසු භාරගන්නා අවසාන දිනය හා වේලාව පසුවූ වහාම ලද ලංසුපත් විවෘත කරනු ලැබේ. ලංසුකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකු හට ලංසු විවෘත කරන අවස්ථාවට සහභාගී විය හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරන අතර, විවෘත කිරීමකින් තොරව ආපසු භාරදෙනු ලැබේ.

9. නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද ලංසු හා ලිඛිත සාක්ෂි අවශ්‍ය පරිදි ඉදිරිපත් නොකරන ලද ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඕනෑම ලංසුවක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

10. තෝරා ගනු ලබන ලංසුකරුවන් වෙත ගිවිසුම් අත්සන් කිරීම සඳහා ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දෙනු ලැබේ.

11. උනන්දුවක් දක්වනු ලබන සුදුසුකම්ලත් ලංසුකරුවන් හට වැඩිදුර තොරතුරු නාවික හමුදා මූලස්ථානයෙහි අධ්‍යක්ෂ නාවික (ආහාර හා නිල ඇඳුම්) කාර්යාලය වෙතින් ලබා ගත හැකි අතර, ලංසු ලේඛනයන් නොමිලේ ඡේද 13 හි සඳහන් කර ඇති ලිපිනයෙන් **2020 සැප්තැම්බර් මස 01** වන දින සිට **2020 සැප්තැම්බර් මස 29** වන දින දක්වා සතියේ දිනවල **පෙ.ව 09.00 සිට ප.ව 03.00** වේලාව තුල පරීක්ෂා කළ හැක.

12. මේ සම්බන්ධ පෙර - ලංසු රැස්වීමක් **2020 සැප්තැම්බර් මස 10** වන දින **පෙ.ව 10.00 ට** කොළඹ 01, තැ.පෙ 593, නාවික හමුදා මූලස්ථානයේ අද්මිරාල් සෝමතිලක දිසානායක ශ්‍රවනාගාරයේදී පැවැත්වීමට නියමිතය.

13. ඉහත සඳහන් කළ ලිපිනය

   අවධානය : අධ්‍යක්ෂ නාවික (ආහාර හා නිල ඇඳුම්)

   ලිපිනය : නාවික හමුදාධිපති
   නාවික හමුදා මූලස්ථානය
   තැ.පෙ. 593
   කොළඹ 01.

   දුරකථන

   | | |
   |---|---|
   | අධ්‍යක්ෂ නාවික (ආහාර හා නිල ඇඳුම්) | : 011-7192351 |
   | පොදු | : 011-7190000 - දිගුව 12351 |
   | ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (නිල ඇඳුම්) | : 011-7192356 |
   | ෆැක්ස් | : 011- 2424577 |
   | ඊමේල් | : nhqssoclothing.navy.lk |

14. මෙම පුවත්පත් දැන්වීම ශ්‍රී ලංකා නාවික හමුදා වෙබ් අඩවිය www.navy.lk මගින්ද නිරීක්ෂණය කළ හැක.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව**
**ශ්‍රී ලංකා නාවික හමුදාව**
**කොළඹ 01**

THE ORIGINAL DCSL ESTD 1913

## විකිණීමට

සමාගම් සතු හොඳ තත්ත්වයෙන් පවතින පහත දැක්වෙන වාහන විකිණීමට ඇත. (තනි පාර්ශ්විය)

| වාහන අංකය | මාදිලිය |
|---|---|
| 48-8570 | ඉසුසු - NPR 66 (සම්පූර්ණ බොඩිය සහිත ලොරි රථය) |
| 42-0743 | ටාටා 1210SE (සම්පූර්ණ බොඩිය සහිත ලොරි රථය) |
| KW-6103 | ටොයෝටා ප්‍රියස් කාර්-2013 |
| KW-6104 | ටොයෝටා ප්‍රියස් කාර්-2013 |

කොළඹ - 10, තෝර්ස් සහල් පාර, අංක 110 දරන ඩිස්ටිලරීස් සමාගමේ ශ්‍රී ලංකා පීඑල්සී ස්ථානයේදී සතියේ දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 5.00 දක්වා කාලය තුළ මෙම වාහන පරීක්ෂා කර බලා ලිඛිත මිල ගණන් ඉදිරිපත් කළ හැක.

විමසීම් - රොෂාන් පෙරේරා
ප්‍රවාහන කළමනාකරු
දුරකථන: 2687801, 2695295-7, 5507000

---

# මධ්‍යම පරිසර අධිකාරිය

## තාක්ෂණික උපදේශක ආයතන / රසායනාගාර ලියාපදිංචි කිරීම

මෙරට පාරිසරික ආරක්ෂණය හා කළමනාකරණය සඳහා පුරෝගාමී ආයතනය වන මධ්‍යම පරිසර අධිකාරිය විසින් දිවයින පුරා ව්‍යාප්තව සිටින තාක්ෂණික උපදේශක ආයතන හා රසායනාගාර 2021/2022 වසර සඳහා ලියාපදිංචි කිරීම හා වාර්ෂික යාවත්කාලීන කිරීම දැන් ආරම්භ කර ඇත.

පරිසර දූෂණය පාලනය කිරීමෙහිලා කර්මාන්තකරුවන් වෙත විධිමත් තාක්ෂණික උපදේශක සේවයක් හා රසායනාගාර සේවයක් ලබාදීමේ අරමුණ ඇතිව පහත ක්ෂේත්‍රයන්හි නිපුණතාවය ඇති විශේෂඥ සේවා සහ රසායානාගාර සේවා සපයන ආයතන වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

- **කර්මාන්ත ක්‍රියාකාරිත්වය නිසා ඇතිවන වායු, ජල, ශබ්ද දූෂණය, කම්පනය සහ දුර්ගන්ධය පාලනය සම්බන්ධයෙන් විශේෂඥ තාක්ෂණික උපදෙස් ලබාදීම.**
- **ජල තත්ත්ව, වායු තත්ත්ව, ශබ්දය, කම්පනය හා පාංශු විශ්ලේෂණය සහ මිනුම් කිරීම.**
- **කර්මාන්ත ස්ථානගත කිරීමේදී තාක්ෂණික සක්‍යතා අධ්‍යයනය කිරීම.**

ලියාපදිංචිය සඳහා අවශ්‍ය තොරතුරු සහ අයදුම්පත් පහත ලිපිනයෙන් ලබාගත හැක.

**අධ්‍යක්ෂ (පරිසර දූෂණ පාලන)**
**පරිසර දූෂණ පාලන අංශය**
**මධ්‍යම පරිසර අධිකාරිය**
**නො : 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**
**වෙබ් අඩවිය** www.cea.lk

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2020.09.30**

**අධ්‍යක්ෂ ජනරාල්**
**මධ්‍යම පරිසර අධිකාරිය.**

දුරකථන : 0112872278 / 0112873453
0112873453 / 0117877277.
ෆැක්ස් : 0112872605
ඊමේල් : buddika@cea.lk

---

# ලංසු දැන්වීම

## බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

## ආපනශාලා ලංසු කැඳවීම - 2020 / 2021

හෝමාගම මූලික රෝහලේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් 2020 වර්ෂයට හෝමාගම මූලික රෝහලේ වසරක කාල සීමාවක් සඳහා ආපනශාලා සේවය පවත්වාගෙන යාම වෙනුවෙන් එහිලා සුදුසුකම් ඇති ලංසුකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. මේ පිළිබඳව උනන්දුවක් දක්වන අයවළුන් ලංසු ලියවිලි වශයෙන් රු. 500.00 ක ආපසු නොගෙවන අයදුම්පත් ගාස්තුවක් හෝමාගම මූලික රෝහලේ ගණකාධිකාරී වෙත ගෙවා ලබා ගත් ලදුපත සමග තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීමෙන් 2020.08.31 දින සිට 2020.09.21 දක්වා සාමාන්‍ය රාජකාරී දිනවල පෙ.ව. 9.30 සිට ප.ව. 2.00 දක්වා කාර්යාලයෙන් ලංසු ලියවිලි ලබාගත හැකිය.

02. ලංසු අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"හෝමාගම මූලික රෝහලේ 2020 / 2021 වර්ෂ සඳහා ආපනශාලා සේවය"** යනුවෙන් සඳහන් කර 2020.09.21 දින පෙ.ව. 10.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ **"සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, මූලික රෝහල, හෝමාගම"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ, හෝමාගම මූලික රෝහලේ ගණකාධිකාරී කාමරයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීම හෝ සිදුකළ යුතුය.

03. ලංසු ලියවිලි පිටපත් 02කින් **"මුල් පිටපත"** හා **"අනු පිටපත"** යනුවෙන් සඳහන් කර වෙන වෙනම කවරවල බහා එම කවර දෙක තනි කවරයක බහා ඉදිරිපත් කළ යුතුය.

04. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම එම ස්ථානයේ දීම ලංසු විවෘත කරන අතර, ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් එක් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගි වීමට අවසර දෙනු ලැබේ.

05. ලංසු ලියවිලි ගෙවීමකින් තොරව හෝමාගම රෝහලේදී පරීක්ෂා කිරීමට පුළුවන.

06. රජයේ කොන්ත්‍රාත් කොන්දේසි කඩකර අසාධු ලේඛන ගත කොට ඇති පුද්ගලයින් වෙත ලංසුපත් නිකුත් කරනු නොලැබේ.

07. අදාළ ලංසු සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් හෝ පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

**සභාපති,**
**ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,**
**මූලික රෝහල, හෝමාගම.**
**දුරකථන : 011-2855200, 011-2098824, 0112-894780, 011-2098825**
**ෆැක්ස් : 011-2857844**

---

# ලංසු සඳහා ආරාධනයයි

## 2020.07.19 වෙනි දින පළ කරන ලද ලංසු සඳහා ආරාධනය

## දැන්වීමේ සංශෝධනයයි

## ආරක්ෂක අමාත්‍යාංශය

**අකුරේගොඩ ආරක්ෂක මූලස්ථාන ගොඩනැගිලි සංකීර්ණයේ පිහිටි 01 හා 02 ඒකක සඳහා යාන්ත්‍රික වායු සංසරණ හා වායුසමීකරණ පද්ධතිය නිර්මාණය කොට, සපයා, ස්ථාපිත කිරීම සඳහා ලංසුව**

**කොන්ත්‍රාත් අංකය : DHQC/MVAC/1&2/2020**

01. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන්, ආරක්ෂක අමාත්‍යාංශයේ, අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ (SCAPC) සභාපති විසින්, පහතින් විස්තර කොට ඇති පරිදි, බත්තරමුල්ල, පැලවත්ත, අකුරේගොඩ පාරේ, යෝජිත ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයේ 01 සහ 02 ඒකක සඳහා, යාන්ත්‍රික වායු සංසරණ හා වායුසමීකරණ පද්ධතිය නිර්මාණය කොට, සපයා, ස්ථාපිත කිරීම සඳහා සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා, තැබූ ලංසු දැන් කැඳවනු ලැබේ. එහි ඇස්තමේන්තුගත පිරිවැය ශ්‍රී ලංකා රුපියල් මිලියන 1400 (වැට් රහිත) වේ.

**අදාළ කාර්යයට, අකුරේගොඩ පිහිටි ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයේ 01 හා 02 ඒකක සඳහා යාන්ත්‍රික වායුසංසරණ හා වායු සමීකරණ පද්ධතියක් නිර්මාණය කොට, සපයා, ස්ථාපිත කිරීම අයත් වේ.**

02. අදාළ ඉදිකිරීම් කාලය දින 300 කි.

03. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

04. කොන්ත්‍රාත් ප්‍රදානයට සුදුසුකම් ලැබීමට, සාර්ථක ලංසුකරුවා අපලේඛන ගතවූ අයකු නොවිය යුතුය. ලංසුකරුවන් සතුව, යාන්ත්‍රික වායු සංසරණ හා වායුසමීකරණ (MVAC) කාර්ය උප විශේෂඥතාව යටතේ විදුලිමය හා යාන්ත්‍රික සේවා (EM) විශේෂඥතාවයේ, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) EM 1 ශ්‍රේණියේ ලියාපදිංචිය සතු විය යුතුය. තවද, අදාළ ලංසුකරු හෝ ඔහු විසින් යෝජිත උප කොන්ත්‍රාත්කරු හෝ ඔහුගේ බද්ධ ව්‍යාපාර හවුල්කරුහට, අතිරේක අඩු වෝල්ටීයතා සේවා වර්ගීකරණයේ, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ EM 1 ශ්‍රේණියේ ලියාපදිංචිය සතු විය යුතුය.

05. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා අවශ්‍ය අවම සුදුසුකම් පහතින් දක්වා ඇත.

| | සුදුසුකම් | අවම සුදුසුකම් අවශ්‍යතා |
|---|---|---|
| (i) | පසුගිය වසර 10 තුළදී ඕනෑම වසර පහ තුළ ඉටුකළ කාර්යයන්හි වාර්ෂික පිරිවැටුම් වටිනාකමේ සාමාන්‍යය (MVAC) | වසරකට ශ්‍රී ලංකා රුපියල් මිලියන 700 |
| (ii) | පසුගිය වසර 10 තුළදී 2010, 2011, 2012, 2013, 2014, 2015, 2016, 2017, 2018 හා 2019) සමාන ඒකක නිර්මාණය කොට, සපයා, ස්ථාපිත කිරීම් පිළිබඳ පළපුරුද්ද | පසුගිය වසර 10 තුළ, අවම වශයෙන් යාන්ත්‍රික වායු සංසරණ හා වායුසමීකරණ පද්ධති 5 ක් සාර්ථකව නිම කොට තිබීම. එවන් පද්ධති එකක අවම වටිනාකම ශ්‍රී ලංකා රුපියල් මිලියන 100 කට නොඅඩු විය යුතුය.<br>ලංසුකරු හෝ ඔහුගේ යෝජිත උපකොන්ත්‍රාත්කරු හෝ ඔහුගේ බද්ධ ව්‍යාපාර හවුල්කරු විසින් අවම වශයෙන් ගොඩනැගිලි ස්වයංක්‍රිය කරණ පද්ධති (BAS) පහක්, අවම වශයෙන් ශ්‍රී ලංකා රුපියල් මිලියන 10 ක වටිනාකමින් සාර්ථකව සම්පූර්ණ කොට තිබිය යුතු අතර, එම ව්‍යාපෘති අතර ව්‍යාපෘති දෙකක් සඳහා වටිනාකම ශ්‍රී ලංකා රුපියල් මිලියන 25 කට නොඅඩු විය යුතුය. |
| (iii) | තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් සහ / හෝ ණය පහසුකම් ප්‍රමාණය (වෙනත් කොන්ත්‍රාත්තුමය බැඳීම් සඳහා වෙන් කළ පසු) හා මෙම කොන්ත්‍රාත්තුව යටතේ කරනු ලබන යම් අත්තිකාරම් ගෙවීම් හැර | ශ්‍රී ලංකා රුපියල් මිලියන 350 ට නොඅඩු විය යුතුය. |
| (iv) | අදාළ සේවා කාලය තුළ, සපයනු ලබන පද්ධතිය සඳහා ලංසුකරු විසින්ම හෝ ඔහුගේ බලය පැවරූ නම්කළ නියෝජිතයකු විසින් නඩත්තු සේවා ලබා දීමේ හැකියාව තිබිය යුතුය. | මෙය අත්‍යවශ්‍ය වේ. |

06. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර, ශ්‍රී ලංකාවේ බත්තරමුල්ල, පැලවත්ත, අකුරේගොඩ පාරේ ආරක්ෂක මූලස්ථාන සංකීර්ණ ව්‍යාපෘතියෙහි, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි අධ්‍යක්ෂ වෙතින් ලබාගත හැකි අතර, ඉහත ලිපිනයේදී **2020.07.20 දින සිට 2020.09.16 දින** දක්වා, රාජකාරී දිනවල, **09.00 පැය හා 15.00 පැය** අතර කාලය තුළ, නොමිලයේ ලංසු ලේඛන පරීක්ෂා කොට බැලිය හැක.

07. ආපසු ගෙවනු නොලබන ගාස්තු ශ්‍රී ලංකා රුපියල් 100,000.00 (ශ්‍රී ලංකා රුපියල් එක් ලක්ෂයක්) ගෙවීමෙන් හා ශ්‍රී ලංකාවේ, කොළඹ 03, බාලදක්ෂ මාවතේ, අංක 15/5, ආරක්ෂක අමාත්‍යාංශයේ ගණකාධිකාරී (ප්‍රසම්පාදන) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, **2020.07.20 දින සිට 2020.09.16** දින දක්වා, රාජකාරී දිනවල **09.00 පැය හා 15.00 පැය** අතර කාලය තුළ, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද (1 A වෙළුම හැර) සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැක. ගෙවීම්, මුදලින්ම කළ යුතුවේ.

08. ලංසු, පහත සඳහන් ලිපිනයට ගෙනැවිත් භාරදීමෙන් හෝ පහත ලිපිනයේ තබා ඇති ලංසු පෙට්ටියේ බහාලීමෙන් **2020.09.17 දින 11.00 පැයට** පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ. අදාළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන්ගේ ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.

09. ලංසු, **2020.09.17 දින සිට 2021.03.10** දින දක්වා (අදාළ ලංසු අවසන් දින සිට දින 175 ක් දක්වා) වලංගු විය යුතුය.

10. සියලුම ලංසු සමග **ශ්‍රී ලංකා රුපියල් මිලියන විසි එකක් (ශ්‍රීලං රු. 21,000,000.00) වටිනාකමින් යුත්,** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බැංකුවකින් ලබාගත්, ඒක්ෂණ හා කොන්දේසි විරහිත බැඳුම්කරයක් වශයෙන් වූ **"ලංසු ඇපකරයක්"** තිබිය යුතු අතර, එම ලංසු ඇපකරය, **2020.09.17 දින සිට 2021.04.07 දින** දක්වා (ලංසු අවසන් දින සිට දින 203) වලංගු විය යුතුය. අදාළ ලංසු ඇපකරයේ ප්‍රතිලාභියා ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විය යුතුය.

11. ලංසුකරුවන් විසින් ආරක්ෂක මූලස්ථාන සංකීර්ණ ව්‍යාපෘතියෙන් අදාළ ලංසු ලේඛන මිලදී ගැනීමට පෙර, (අදාළ වෙතොත්) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ නිකුත් කරනු ලබන ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතුය.

12. ලංසුකරුවන් විසින්, ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වීමට අපේක්ෂිත අයගේ නම හා ජාතික හැඳුනුම්පත් අංකය / පාස්පෝට් අංකය අදාළ විවෘත කිරීමේ දිනයට අවම වශයෙන් රාජකාරී දින තුනකට (03) පෙර, ආරක්ෂක අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

**ඉහතින් යොමු කළ ලිපිනය වනුයේ :**

**සභාපති,**
**අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPC),**
**ආරක්ෂක අමාත්‍යාංශය,**
**අංක 15/5, බාලදක්ෂ මාවත,**
**කොළඹ 03, ශ්‍රී ලංකාව.**

**දුරකථනය** : 0094-011-2390719
**ෆැක්ස්** : 0094-011-2390720

---

දැන්වීම් කාර්යාල

ඔබගේ දැන්වීම් පළකරවා ගන්න පිවිසෙන්න



නුගේගොඩ
සව්සිරි වෙළඳ සංකීර්ණය
4 වන මහල, හයිලෙවල් පාර,
011 282 8114

සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
ඩී ආර් විජේවර්ධන මාවත, කොළඹ 10
1949

www.adz.lk
it's what you want






# සත්වෝද්‍යානය දෙහිවල සිට කහපොළට... 'පනින්න පෙර සිතා බලනු'

● හර්ෂා සුගතදාස

**දෙහිවල සත්වෝද්‍යානය, පිළියන්දල කහපොළ ප්‍රදේශයට රැගෙන යෑමේ පුවතක් පසුගියදා මාධ්‍ය ඔස්සේ පළ විය. පසුගිය 20 වැනිදා ජාතික සත්වෝද්‍යාන සහ උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තු නිලධාරීන් පිරිසක් සමඟ සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පැවැත්වූ සාකච්ඡාවකදී මෙම අදහස ඉදිරිපත්වී තිබේ.**

දෙහිවල සත්වෝද්‍යානයේ පවතින වත්මන් තත්ත්වය පිළිබඳව වාර්තාවක් ලබා දෙන ලෙස සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග විසින් අමාත්‍යාංශ ලේකම් එස්. හෙට්ටිආරච්චිට උපදෙස් දී ඇති අතර දෙහිවල පිහිටි සත්වෝද්‍යානය පිළියන්දල කහපොළට රැගෙන යෑමට හේතු ලෙස මෙහිදී පෙන්වා දී තිබෙන්නේ වඩාත් ඉඩකඩ ඇති භූමි ප්‍රදේශයක සත්වෝද්‍යානය ඉදි කිරීමෙන් සතුන්ට යහපතක් සිදු වන බවයි. සතුන් කූඩු කර නැරඹීමේ ක්‍රමවේදය වර්තමානයේ යල් පැන ගිය ක්‍රමවේදයක් බැවින් නවීන ලෝකයට ගැළපෙන පරිදි සකස් කිරීම අත්‍යවශ්‍ය බවත් එය සත්ව හිංසනයක් සිදු නොවන ආකාරයෙන් සිදු කළ යුතු බවත් අමාත්‍යවරයා පෙන්වා දී තිබේ.

## අමාත්‍යවරයා සමඟ සාකච්ඡාව හෙට

දෙහිවල සත්වෝද්‍යානය පිළියන්දල කහපොළට රැගෙන යෑමට, විරෝධය පාමින් එහි සේවක සේවිකාවන් 26 වැනි බදාදා දහවල් කෑම පැයෙන් පැය ½ කදී නිහඬ විරෝධයක් ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණි. එහෙත් එය අත්හිටුවනු ලැබුවේ සංචාරක අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් එස්. හෙට්ටිආරච්චි විසින් කහපොළට රැගෙන යෑම අමාත්‍යවරයා යෝජනාවක් වශයෙන් පැවසුවද එය තවමත් ස්ථිර අදහසක් වී නොමැති බව සේවක සේවිකාවන්ට දැනුම් දුන් නිසා ය. අගෝස්තු 31 වැනි දින (හෙට දින) දෙහිවල සත්වෝද්‍යානයේ වෘත්තීය සමිති නායකයන් මේ සම්බන්ධයෙන් සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග සමඟ සාකච්ඡාවක් පැවැත්වීමට නියමිතව තිබේ.

ජාතික සත්වෝද්‍යානය දෙහිවල ස්ථාපිත කර වසර 84 ක් ගත වී ඇත. මෙහි වපසරිය අක්කර 23 කි. මුලින් ම සත්ව කූඩු යටතේ සතුන් රඳවා තැබූවද අද වනවිට 'සත්ව අරණ' යන සංකල්පය ක්‍රියාත්මක වන්නේ සත්ව කූඩු සංකල්පය පැරණි සංකල්පයක් වන බැවිනි. 1982 ට පෙර මෙය වනජීවී අමාත්‍යාංශයට අයත් වුව ද එතැන් සිට ජාතික සත්වෝද්‍යාන පනත යටතේ දෙපාර්තමේන්තුව ස්ථාපිත කෙරිණි. වර්තමානයේ ජාතික සත්වෝද්‍යාන සහ උද්භිද උද්‍යාන අයත් වන්නේ සංචාරක අමාත්‍යාංශයටයි. මේ වනවිට ජාතික සත්වෝද්‍යානය දෙහිවලට පමණක් සීමා වී නැත. පින්නවල වාගොල්ල, හම්බන්තොට රිදීගම සෆාරි උද්‍යානය සහ හොරණ ගෝනපොළ ගොවිපොළ දක්වා මෙය පුළුල් වී තිබේ. ජාතික සත්වෝද්‍යානයක් පිහිටුවීමේ මූලික අරමුණ වන්නේ විනෝදාස්වාදයයි. එසේ වුව ද ඊට පරිබාහිර අරමුණු කීපයක් ද මෙමගින් අපේක්ෂිතය. අධ්‍යාපනික දැනුම ලබාදීම, පර්යේෂණ කටයුතු සහ සතුන් අභිජනනය කිරීම එවැනි අරමුණු කීපයකි. එහෙත් මේ වනවිට සංවෘත සංවෝද්‍යාන කෙරෙහි පක්ෂ මෙන් ම විපක්ෂ අදහස් ද මතු වී තිබේ. බොහෝ දෙනෙකුගෙන් එල්ලවන විරෝධතාව වනුයේ සතුන් කූඩු කර සිටීමෙන් සත්ව හිංසනයක් වන බව ය. වැඩි ඉඩකඩ සහිත භූමියක 'සත්ව අරණ' සංකල්පය යටතේ සත්වෝද්‍යාන ඉදි කිරීමට පියවර ගනු ලැබුවේ එබැවිනි. නව සංචාරක අමාත්‍යවරයා පිළියන්දල කහපොළට ජාතික සත්වෝද්‍යානය රැගෙන යෑමට අදහස් කළේ එම නිසා විය යුතු ය.

"ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ දෙහිවල සත්වෝද්‍යානය, රිදීගම සෆාරි උද්‍යානය සහ පින්නවල වාගොල්ල සත්වෝද්‍යානය තිබෙනවා. මෙම සත්වෝද්‍යානවල නවතා දමා තිබෙන ඉදිකිරීම් යළි ආරම්භ කරලා මේවා දියුණු කර ගන්නේ නැතිව අලුතින් ම ස්ථානයක් පටන් ගැනීම අපරාධයක් හැටියටයි අපි නම් දකින්නේ. අලුත් තැනක් හදනවා කියන්නේ කොයි තරම් ලොකු වියදමක් ද? රටේ සල්ලි නාස්ති වෙනවා.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහත්මයා රටේ මුදල්, ජාතික ධනය නාස්ති වීම වැළැක්වීමට පියවර ගනිද්දී මේ වගේ වෙලාවක අලුත් ඉදිකිරීමකට අත ගහන එක සුදුසු නැහැ. දෙහිවල සත්වෝද්‍යානයේ අඩුපාඩු තිබෙනවා. ඒ අඩුපාඩු පෙන්වා දෙන්න අපි සූදානම්. අපි කැමැතියි නව අමාත්‍යතුමා දෙහිවල සත්වෝද්‍යානයේ සංචාරයකට සහභාගි වෙනවා නම්" යනුවෙන් දෙහිවල සත්වෝද්‍යානය කහපොළට රැගෙන යෑමට එරෙහිව අදහස් පළ කළේ ශ්‍රී ලංකා ජාතික සත්වෝද්‍යානයේ පොදුජන සේවක සංගමයේ සභාපති ක්‍රිෂාන්ත ක්‍රිස්ටෝපර්ය.

දෙහිවල සත්වෝද්‍යානයේ භූමි ප්‍රමාණය අක්කර 23 කි. පිළියන්දල කහපොළ භූමි ප්‍රමාණය අක්කර 72 කි. අක්කර 23 ට වඩා 72 විශාල බව අපි දනිමු. මාගේ මතකයේ හැටියට පින්නවල වාගොල්ලේ සත්වෝද්‍යානයේ භූමි ප්‍රමාණය අක්කර 50 කි. එහෙත් හම්බන්තොට රිදීගම සෆාරි උද්‍යානයේ වපසරිය අක්කර 500 කි.

## නිහඬ විරෝධය තාවකාලිකව නවතා තිබෙනවා

අක්කර 72 ට වඩා 500 විශාල බව ද අප විසින් පිළිගත යුතු ය. සතුන්ට නිදහස භුක්ති විඳිමින් ජීවත් වීමට රිදීගම සෆාරි උද්‍යානය තිබියදී තවත් උද්‍යානයකට අත ගැසීමේ දැඩි අවශ්‍යතාවක් පැන නඟින්නේ නැති බව අපගේ අදහස ය. අනෙක, අධ්‍යාපනික හා පර්යේෂණ කටයුතු සඳහා පැමිණෙන අයට දුම්රියෙන් හෝ බස් රියෙන් පැමිණීමේ පහසුව තිබෙන්නේ දෙහිවල ජාතික සත්වෝද්‍යානයටය. මෙහිදී නරඹන්නන්ගේත් දැනුම රැස් කරන්නන්ගේත් ප්‍රවාහන පහසුකම් කෙරෙහිද අවධානය යොමු කිරීම වටී.

සාමාන්‍යයෙන් සංවෘත සත්වෝද්‍යාන මගින් සතුන්ගේ නිදහස සීමා වන බවට චෝදනා කළ ද ඉන් සැලසෙන වාසි කීපයක් කෙරෙහි සත්ව විද්‍යාඥයන් අවධානය යොමු කරන්නේ ඕනෑම දෙයක හොඳ - නරක, වාසි - අවාසි තිබෙන බව අපට සිහිපත් කරමිනි. වනාන්තරයේ ජීවත් වන සතුන් විලෝපිතයන්ට ගොදුරුවීමේ දැඩි අවදානමක් පැවතුන ද සත්වෝද්‍යාන තුළ ජීවත්වන සතුන්ට එවැනි අනතුරු නොමැති වීම හේතුවෙන් මෙම සත්වයන්ගේ ආයු කාලය වැඩිවීම එක් යහපත් කරුණකි. වනාන්තර තුළ සිටින ඇතැම් සතුන් වඳ වී යෑමේ තර්ජනයට ලක් වුව ද සත්වෝද්‍යාන තුළ සිටින සතුන් අභිජනන ක්‍රියාවලිය මගින් බෝකර ආරක්ෂා කර ගැනීමට හැකි වීම තවත් වාසිදායක කාරණයක් ලෙස දැක්විය හැකි ය.

ඇතැම් සතුන් සත්වෝද්‍යාන තුළ නොසිට වනාන්තර තුළ ජීවත්වූයේ නම් මරණයට පත්වී මුළුමනින් ම වඳවී යා හැකිය. එමෙන් ම විවිධ පර්යේෂණ හා අධ්‍යාපනික කටයුතු සඳහා පැමිණෙන අයට සත්ව චර්යාවන් නිරීක්ෂණය කර ගැනීමට සත්වෝද්‍යාන තුළ සිටින සතුන්ගෙන් මහත් පිටිවහලක් ලැබෙනු ඇත. වනයේ සිටින සතුන්ට සමීප වී නිරීක්ෂණය කළ නොහැකි වුවත් සත්වෝද්‍යාන තුළ දිවි ගෙවෙන සතුන්ගේ සමීපයට ගොස් නිරීක්ෂණය කළ හැකිවීම එම වාසියයි.

මේ අනුව සංවෘත සත්වෝද්‍යාන යන සංකල්පය මුළුමනින්ම බැහැර කළ යුතු නැත. එහෙත් වර්තමානයේ දී බොහෝ සත්වෝද්‍යාන පවත්වාගෙන යනු ලබන්නේ විනෝද සහ ක්‍රීඩා කටයුතු විෂය මූලික කර ගනිමිනි. එබැවින් බලධාරීන් ගේ ප්‍රමුඛ අරමුණ වී තිබෙන්නේ ප්‍රදර්ශන මගින් මුදල් ඉපයීම සහ ලාභය තර කර ගැනීමය.

ජෛව සංරක්ෂණය උදෙසා ඔවුන්ගේ න්‍යාය පත්‍රයේ හිමිවී තිබෙන්නේ අවැදගත් ස්ථානයකි. එම නිසාම 'සත්ව අරණ' සංකල්පය යටතේ වුව ද සතුන්ට නොගැළපෙන සීමිත ඉඩකඩ වෙන් කර තැබීම, සතුන් අධික ප්‍රමාණයක් ගාල් කිරීම සහ සත්ව භාරකරුවන්ට විධිමත් ආකාරයට නිසි අධ්‍යාපනයක් ලබා නොදීම හේතුවෙන් ඔවුන් සතුන් කෙරෙහි දක්වන නොසැලකිල්ල වැනි අඩුපාඩු රැසක් සත්වෝද්‍යාන තුළ දැකගත හැකි ය.

## දෙහිවල සතුන්වත්තේ ලංකාවේ දිවියො නැහැ

නව අමාත්‍යවරයා මෙවැනි අඩුපාඩු කෙරෙහි අවධානය යොමු කරන්නේ නම් එය ඉතා වැදගත් වනු ඇත. සත්වෝද්‍යානයක් යනු තවදුරටත් සතුන් කොටු කර තබා ගනිමින් විනෝදය සඳහා මුදල් උපයා ගන්නා මධ්‍යස්ථානයක් නොවන බව අවබෝධ කර ගත යුතු ය. එමෙන් ම සත්වෝද්‍යාන තුළ සැබෑ ලෙසම සත්ව සංරක්ෂණයක් සිදු විය යුතු බව ද සිහි තබා ගැනීම වටී. මෙය බලධාරීන්ට අවධාරණය කරදීම ප්‍රථමයෙන් ම සිදු කළ යුතු කාර්යයකි.

මීට අමතරව දෙහිවල සත්වෝද්‍යානයේ ලංකාවට ආවේණික දිවියන් නැත. මේ වනවිට දිවියන්ගේ කූඩු හිස්ව පවතී. ඔටුවෝ නැත. චීටා සතුන් ද නැත. සත්වෝද්‍යානය මාරු කිරීමට පෙර එහි අඩුපාඩු සම්පූර්ණ කර ගැනීම වඩා වැදගත් පියවරක් වශයෙන් සඳහන් කළ හැකි ය.

## විනෝදයට වඩා සත්ව සංරක්ෂණයට ප්‍රමුඛත්වය දිය යුතුයි

"ජාතික සත්වෝද්‍යාන සංචාරක අමාත්‍යාංශයෙන් ඉවත් කරලා වනජීවී අමාත්‍යාංශයට පවරනවා නම් හුඟක් හොඳයි. කෝච්චිය යන්න ඕනේ රේල් පාරෙ මිසක් බස් පාරේ නෙමෙයිනේ. කහපොළට ගෙන යෑම සම්බන්ධයෙන් අපේ අකමැත්ත ප්‍රකාශ කරලා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට ලිඛිතව දන්වා තිබෙනවා. විෂය භාර අමාත්‍යවරයාටත් යැව්වා. අගෝස්තු 21 දාතමින් අපි යැවූ ලියුමට අමාත්‍යාංශ ලේකම්ගේ දැනුම් දීම මත අතිරේක ලේකම්වරයාගේ අත්සනින් අපිට පිළිතුරක් ලැබුණා. එහි සඳහන් වුණේ දෙහිවලින් කහපොළට රැගෙන යෑම ගැන මෙතෙක් තීරණයක් ගෙන නොමැති බව. ඒ අය මෙතෙක් කියලා තිබුණු නිසා අපිත් අපේ නිහඬ විරෝධය තාවකාලිකව නැවැත්තුවා. ඇත්තටම අපි වර්ජනයකට නොගිහින් නිහඬ විරෝධයකට යන්න තීරණය කළේත් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා නිසා. එතුමා රට භාර ගත්ත ගමන් අපි වර්ජනය කරන්න හොඳ නැහැනේ. හෙට අමාත්‍යවරයා හම්බවෙන්න යනවානේ. සාකච්ඡාව සාර්ථක වෙයි කියලා අපි විශ්වාස කරනවා" යනුවෙන් ශ්‍රී ලංකා ජාතික සත්වෝද්‍යානයේ පොදුජන සේවක සංගමයේ සභාපති ක්‍රිෂාන්ත ක්‍රිස්ටෝපර් සඳහන් කළේය.

ලංකාවේ සත්වෝද්‍යාන වැඩි දියුණු කළ යුතුය. වෙනස්කම් සිදු කළ යුතු ය. එහෙත් කොරෝනා වසංගතය හේතුවෙන් අඩපණ වූ ආර්ථිකයක් ඇති අපේ රටේ මෙය ඊට සුදුසු කාලය දැයි විචාර බුද්ධියෙන් විමසා බැලීම වටී.

---

● **එස්. ලොකුකරවිට** - කරාපිටිය සමූහ

# ඡන්දය දාන්න කැලේ මැදින් කිලෝ මීටර 40ක් යන ගැමියෝ

**මෙරට එක්තරා ගම්මානයක ඡන්දදායකයන් පිරිසකට තමන්ගේ ඡන්දය ප්‍රකාශ කිරීමට ඡන්ද මධ්‍යස්ථානය වෙත යාමට කිලෝ මීටර 40කට ආසන්න දුරක් ගෙවා යාමට සිදුව ඇතැයි කිවහොත් ඔබ පුදුමයට පත්වනු ඇත. අතුරේගෙදර හා පැල්වාඩිය ලෙස හැඳින්වෙන මේ ගම්මාන දෙකේ ජනතාව අයත්වන ඉහළ මිල්ලව ග්‍රාම නිලධාරී වසමේ ඡන්ද මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ මිල්ලව කණිෂ්ඨ විද්‍යාලයේය. මිල්ලව කණිෂ්ඨ විද්‍යාලයත් මේ ගම්මානයත් වෙන්කරමින් දෙල්ලව රක්ෂිතය පිහිටා ඇත.**

අතුරේගෙදර හා පැල්වාඩිය නම් දෙකකින් හැඳින්වුව ද එය එකම ගම්මානයක් වන අතර ජීවත්වන්නේ පවුල් හැට ගණනකි. මේ ගැමියන්ට ඇති විශාලතම ගැටලුව වන්නේ ගාල්ල දිස්ත්‍රික්කයෙන් ගමට පිවිසුම් මාර්ගයක් නොමැති වීමයි. මේ නිසා ඔවුන්ට මාතර දිස්ත්‍රික්කයට අයත්ව ඇති වතුරාව ගම්මානය හරහා බෙලිඅත්තකුඹුරට පැමිණ එතැනින් පල්ලේබැද්ද හරහා දෙනියායටත්, දෙනියායේ සිට මොරවකටත් මොරවකින් මිල්ලවටත් යා යුතු වීමයි. මේ දුර කිලෝ මීටර 40කට ආසන්නය. ඒ අනුව තම වටිනා ඡන්දය ප්‍රකාශ කිරීමට කැලේ මැදින් කූඩැල්ලන්ගේ පීඩාව විඳිමින් යා යුතුය.

## අපි ඡන්ද දාන්න යන්නේ කූඩැල්ලන් කඩමින් ගස් ගල්වල හැපෙමින්

" අපි ඡන්දය දාන්න යන්න ඕනෑ මිල්ලව කණිෂ්ඨ විද්‍යාලයට. ඒකට පාරෙන් යනවනම් කිලෝ මීටර 50ක් විතර දුරක් යන්න වෙනවා. නැත්නම් කැලේ මැදින් කිලෝ මීටර 4ක් විතර යන්න වෙනවා. මේක බොහොම දුෂ්කර ගමක්. අපිට හැමදාම කියනවා ඡන්ද මධ්‍යස්ථානයක් ගමට දෙන්නම් කියලා. ඒකත් ඡන්ද පොරොන්දුවක් විතරයි. ඒත් අපි තාම ඡන්දය දාන්න යනවා." විදානපතිරණගේ මාටින් සිංඤෝ මහතා පවසයි.

" අපි හැමදේටම යන්නේ මාතර දිස්ත්‍රික්කයට. දරුවන් ඉගෙන ගන්නේත් මාතර. නමුත් අපි මාතර දිස්ත්‍රික්කය පැත්තේ හිටියත් අපි අයිති වෙන්නේ නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට. අපේ ගම ගාල්ලෙන් වෙන්වෙලා හුදකලා වෙලා තිබුණත් අපි අයිති ගාල්ලට. මේ නිසා අපි ලොකු අමාරුවක වැටිලා ඉන්නේ. රජයෙන් වැඩක් කරගන්න නෙළුවට යන්න ඕනෑ. නෙළුවට යන්න කිලෝ මීටර 60ක් විතර යන්න ඕන ඡන්දය දාන්න කිලෝ මීටර 50ක් විතර යන්න ඕනෑ. අනිත් සියලු වැඩකටයුතු කරගන්න යන්නේ මාතරට. නමුත් මාතර දිස්ත්‍රික්කයේ පොදු කටයුතු වලින් අපිට ඈත් වෙන්න වෙලා තියෙනවා. මේක ලොකු කරදරයක්. අපි මේ නිසා ගොඩක් දුක්විඳිනවා. විදුලිය එන්නේ මාතරින්. පාරවල් ලැබුණේ මාතරින්. නමුත් මේ කැලේ මැදින් දෙල්ලවට, නෙළුවට යන්න පුළුවන් පාරවල් තියෙනවා. ඒවා දැව සංස්ථාවෙන් කපපු ලොකු පාරවල්. අපේ ගමේ ඉදලා සැතපුමක් නැහැ ඒ පාරවල්වලට. අපි ඉල්ලන්නේ මේ පාරක් අපිට යා කරලා එළි පෙහෙළි කරලා දෙන්න කියලා. එතකොට අපිට කැලේ මැදින් ඉතා පහසුවෙන් නෙළුවට යන්න පුළුවන්. අද උදේ මම 6.30ට මගේ වියදමින් ඡන්දය දාන්න ගිහින් එන විට සවස 2.30 වුණා. " මනම්පේරි නන්දසිරි මහතා පවසයි.

" මිල්ලවට යනවා කියන්නේ සම්පූර්ණ දවසක් ම වැය වෙන වැඩක්. අපේ ගමේ කාන්තාවකට ළමයෙක් ලැබෙන්න ඉන්නවානම් ළඟින් තියෙන මාතර සායනයකටවත් යන්න විදියක් නැහැ. ඒකටත් යන්න ඕනෑ මිල්ලවට. ඡන්දය ළං වුණාම හැමෝම ඇවිත් අපිට ඡන්දය දාන්න යන්න තියෙන දුර ගැන කතා කරනවා. ඒත් අපි ග්‍රාම නිලධාරී සහතිකයක් ගන්න පවා කිලෝ මීටර 45ක් යන්න වෙනවා. ඒකට දවසක් ඉවරයි. ඊට පස්සේ ඒක අරගෙන නෙළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යන්න තව කිලෝ මීටර 60ක් යන්න ඕනෑ. ඒකට තව දවසක් ගතවෙනවා. මරණයක් වුණාම ග්‍රාම නිලධාරී මහත්තයා එනකම් ගෙදර මිනිය තියාගන්න වෙනවා. අපිට පාරක් ලැබෙනවානම් මේ ගැටලු අවසන් වෙනවා." සුබසිංහ ගමගේ මෙසේ පැවසුවාය.

"ප්‍රාදේශීය ලේකම්තුමාත් ඇවිත් අපේ ගම්මානයේ අපහසුතා ගැන සොයා බැලුවා. එන මැතිවරණයේ දි ගමට ඡන්ද පෙට්ටියක් දෙනවා කියලා පොරොන්දු වුණා. මහ මැතිවරණයට ඡන්දය දාන්න යන්න මැතිවරණ කාර්යාලයෙන් බස් එකක් එවලා තිබුණා. ඒකේ 50-60ක් විතර ගියා. කොටසක් කැලෙන් ගිහිල්ලා ඡන්දය දාලා ආවා. අපි ඉල්න එකම දේ පාර අපිට දෙන්න කියලා විතරයි." සුරංග හේමකුමාර පවසයි.



ඉහළ මිල්ලව ඡන්ද මධ්‍යස්ථානය



මනම්පේරි නන්දසිරි



විදානපතිරණගේ මාටින් සිංඤෝ



සුරංග හේමකුමාර

ඔවුන් බැංකු කටයුතුවල සිට සියලු දේ සඳහා මාතර දිස්ත්‍රික්කයට ගිය ද රජයේ සියලු කටයුතු සිදුකෙරෙන්නේ නෙළුවෙනි. පවුල් 60කට වැඩි ප්‍රමාණයක් මේ ගමේ ජීවත්වන අතර ලියාපදිංචි ඡන්ද දායකයන් සංඛ්‍යාව 173කි.

මේ ගම්මානය සොයා ගිය අපි මිල්ලව කණිෂ්ඨ විද්‍යාලයේ ඡන්ද මධ්‍යස්ථානයට ගොස් එතැනින් අතුරේගෙදර හා පැල්වාඩිය ගම්මානයට ගියෙමු. යතුරුපැදියක ගිය අපට අතුරේගෙදර ගම්මානයේ අවසාන නිවස දක්වාම වූ දුර මිල්ලව කණිෂ්ඨ විද්‍යාලයේ සිට කිලෝ මීටර 37කි. ඔවුන්ගේ ගමට ආසන්නතම පොදු බස්රථ පැමිණෙන ස්ථානය බෙලිඅත්තකුඹුර කඩපිලයි. එතැන සිට ගමේ අවසාන නිවසට දුර කිලෝ මීටර 5.1කි. බසයක් ගැනීමටනම් මේ ගමේ ජනතාව පයින් හෝ යතුරුපැදියකින් හෝ මේ දුර ගෙවා යා යුතුය.

ආසන්නම නගරය දෙනියායයි. දෙනියායට දුර කිලෝ මීටර 15කි. ගමේ සිට නෙළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඇති දුර කිලෝ මීටර 57කි.

ගමේ ජනතාව පවසන්නේ ඡන්දය ආසන්නවන විට දේශපාලනඥයන් පැමිණ පාර හදා දෙන්නම් යැයි පොරොන්දු වුව ද ඒවා කඩවුණු පොරොන්දු වන බවයි. මෙවැනි දුරක් ගෙවා ගොස් ඡන්දය භාවිතා කිරීම ඔවුන්ට ගැටලුවක් වුව ද ගමට මාර්ගයක් ලැබෙන ඇතැයි අපෙක්ෂාවෙන් ඔවුහු මෙවර ද ඡන්දය දැමූහ.

**" මේ කැලේ මැදින් දෙල්ලවට, නෙළුවට යන්න පුළුවන් පාරවල් තියෙනවා. ඒවා දැව සංස්ථාවෙන් කපපු ලොකු පාරවල්. අපේ ගමේ ඉදලා සැතපුමක් නැහැ ඒ පාරවල්වලට. "**

නෙළුව ප්‍රාදේශීය ලේකම් වන චතුරංග ගුණසේකර පවසන්නේ මෙවන් අදහසකි..

" මේ ගම්මානය පිහිටා තිබෙන්නේ ගාල්ල දිස්ත්‍රික්කයේ එක්තරා කෙලවරක. දැව සංස්ථාවෙන් කැපූ මාර්ග වනාන්තරය මැදින් ගම ආසන්නයට ම තිබෙනවා. මේ මාර්ගයක් ගමට යා කරලා අවම වශයෙන් ත්‍රී රෝද රථයකට හෝ යන්න අවස්ථාව ලබාදෙන්න කියා ගැමියන්ගේ ඉල්ලීමක් තිබෙනවා. දැනට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඒ යෝජනාවට විරුද්ධයි. අපි වනාන්තරත් ආරක්ෂා කරගත යුතුයි. ජනතා අවශ්‍යතා ඉටු කරමින් ඔවුන්ට පහසුකම් සපයන්නත් අවශ්‍යයි.

මෙවර මැතිවරණයේ දීත් ඔවුන්ට වෙනම ඡන්ද පෙට්ටියක් ලබා දීමට නොහැකි වුණා. ඒ නිසා ඔවුන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට යාම සඳහා බස් රථයක් ලබා දුන්නා. ඉදිරියේ දී මේ ගැටලු විසඳන්න බලාපොරොත්තු වෙනවා."

" මේ ගම්වාසීන්ට වෙනම ඡන්ද පොළක් ලබා දීමට ඇති හැකියාව ගැන සාකච්ඡාවක් කළා. ඒ සඳහා නීති ප්‍රතිශෝධනය කරන්න වෙනවා. ඒ නිසා මෙවර මහ මැතිවරණයේ දී ඒ දේ කරන්න අපහසු වුණා. අපි ඔවුන්ට ඡන්ද පොළ වෙත යාමට බස් රථයක් ලබාදුන්නා. ඉදිරි මැතිවරණයේ දී ඔවුන්ට වෙනම ඡන්ද පොළක් පිහිටුවීමට කටයුතු කරනවා." ඒ ගාල්ල දිස්ත්‍රික් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් කේ.යූ. චන්ද්‍රලාල්ය.



# ලග්ගල සාම්ප්‍රදායික බීජ හා ආහාර සංරක්ෂණ ක්‍රියාවලිය



ලග්ගල කුඹුරු





ලග්ගල කුරක්කන් වගාවක්

● නාඋල ඉන්දික අරුණ කුමාර

**මාතලේ - ලග්ගල වූ කලී ලංකාවේ සුවිශේෂී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකි. උතුරින් නාඋල හා ඇලහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයත් දකුණින් මහනුවර හා නැගෙනහිරින් විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද මායිම් වී තිබේ.**

බටහිරින් අඹන්ගඟ කෝරලයත් රත්තොටත් මායිම් කරගත් මේ සුවිශේෂී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වනාහි රාවණ ඉතිහාසය හා බැඳෙන්නේ කරුණු කාරණා ගණනාවක් නිසාය.

මෙහි ජීවත්වෙන්නන් ඉතා සරල ජීවන රටාවකට හුරුවී සිටීම මෙන්ම සාම්ප්‍රදායික හේන් ගොවිතැනින් ජීවිකාව ගෙන යෑම වැනි කාරණා අදටත් මේ ගම්මාන වල දැකගත හැකිය.

සංවර්ධනයේ අරුණලු වැටෙමින් පවතින ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රණමුරේ හා නාරංගමුව ආදි ගම්මාන වල බොහෝ පිරිසක් නූතනත්වය වැලඳ ගනිමින් සිටිති. එහෙත් තවමත් පැරණි ක්‍රමවේද ඔස්සේ සරල ජීවිකා ගෙවන්නන් රණමුරේ හා නාරංගමුව ගම් වල සොයා ගැනීම අපහසු නැත.

වසරේ කන්න දෙකක් කුඹුරු ගොවිතැනින් දිවි සරිකර ගන්නා මේ ගැමියන් අතර මැදි කන්නයක හේන් වගා සිදු කරති. වසර මුළුල්ලේ නොනැවති ගලා බසින දිය කදුරු මේ මිනිසුන්ට මහත් අස්වැසිල්ලකි. හේනේ කුරක්කන්, බඩඉරිඟු, මුං, තල, මිරිස්, වට්ටක්කා, වැටකොළු ආදී බොහෝ දෑ ඔවුහු වගා කරති.

පැරැන්නන් විසින් ආරක්ෂා කරගෙන ආ විවිධ ශාන්තිකර්ම මෙන්ම විවිධ ඇදහිලි ක්‍රම අදටත් ලග්ගල ගැමියා තුළින් දැකගත හැකිය. මේ ගැමියන්ගේ ආහාර මෙන්ම බීජ කල් තබා ගන්නා ක්‍රමවේද ගැන දැනුවත් කිරීම මෙහි අරමුණයි.

ඉපැරණි ශිෂ්ටාචාරයකට උරුමකම් කියන පැරණි ගැමියන් විසින් සරල මෙන්ම විද්‍යාත්මක ක්‍රමවේද ඔස්සේ බීජ කල්තබා ගැනීම් සිදුකර ඇති බවට ඉතිහාසයෙන් බොහෝ සාක්ෂි සපයාගත හැකිය.

අස්වනු නෙළා නිවසට රැගෙන ආපසු ඒවා එක්වර ආහාරයට නොගන්නා ගැමියා ඉන් කොටසක් දෙවියන් බුදුන් උදෙසා පුද කරනු ලබති. ලග්ගල එය හඳුන්වනු ලබන්නේ 'අඩුක්කු පිදීම' යනුවෙනි. ගමේ එක ස්ථානයකට එක්වන ගැමියන් සිය අස්වැන්නෙන් කොටසක් රැගෙන එනු ලබයි.

එකම තැනක හිඳ එක්ව පිළියෙල කර ගන්නා දේ දානය අඩුක්කු පිදීම ලෙස ලග්ගල ගැමියා හඳුන්වනු ලබයි.

**මස්, මාළු වර්ග සති ගණනක් නරක් නොවී තබා ගැනීම සඳහා ලග්ගල ගැමියා භාවිත කළ ක්‍රම කිහිපයක් තිබේ**

සනුහරේ නෑ යකුන් පිදීම, බණ්ඩාර දෙවියන් හෙවත් රාවණා දෙවියන් පිදීම මෙහිදී සිදු කරනු ලබයි. වදුරු වසංගත වලින් ගම්මාන ආරක්ෂා කර ගැනීම මෙන්ම වන සතුන්ගෙන් වන උවදුරු නැති කර ගැනීම අඩුක්කු පිදීමේ අරමුණ වෙයි.

වැසි සමය ළංවන්නට පෙර හේනෙන් ගෙනා ධාන්‍ය වියළා ආරක්ෂා කර ගැනීම මෙන්ම වැඩි කොටස් අලෙවි කර නිවෙස්වලට අවශ්‍ය බඩුමුට්ටු රැගෙන ඒම වැනි කටයුතු ගමියන් විසින් සිදු

අහාර කල්තබා ගැනීම සේම බීජ කල් තබා ගැනීම ලග්ගල ගැමියා විසින් නිවැරදි ලෙසටම ඉටු කරනු ලබයි.ඊට හේතුව වී ඇත්තේ ඊළඟ කන්නය සඳහා අවශ්‍ය බීජ තමන් විසින්ම සකසා ගැනීම සිදු කළ යුතු බැවිනි. දර ලිපට උඩින් සැකසූ දුම් මැස්ස තට්ටු තුනකින් අතීතයේ පැවති බව ලග්ගල ගැමියන් අපට කීවේය.

නිතර දැල්වෙන ලිපේ දුම්මැස්සේ පළමු තට්ටුවේ දඩමස් දමන අතර දෙවැනි තට්ටුවේ ඇත්තේ ගොඩගසා ඇති අතර අවස්ථා තට්ටුවේ ලබන කන්නට ගැනීමට වියළෙන ධාන්‍ය වර්ග පවතියි.

කාලයේ ඇවෑමෙන් එවැනි දුම් මැසි ලග්ගල ඇත්තේ බොහෝ කලාතුරකින් බව ද වත්මනේ ලග්ගල වැසියෝ අපත් සමඟ කියා සිටියේය. වසර ගණනාවක් ගතවෙත්ම පරිවර්තනීය යුගයක් පසුකරමින් සිටින ලග්ගල ගැමියාගේ පැරණි ක්‍රමවේද ක්‍රමිකව වියැකී ගියද තවමත් ඉන් කොටසක් හෝ පවත්වා ගැනීමට නූතන පරම්පරාව පියවර ගැනීම ද සතුටට කරුණකි.

හේනෙන් ගෙනා සිය අස්වැන්න මිදුලේ කිහිපවරක් වේළා නිවසේ වියළි ස්ථානයක ගැටගසා තැබෙන මේ ධාන්‍ය වර්ග වලින් ඔවුහු එළඹෙන කන්නයට බීජ සකසා ගනිති.

ඉතිරිය පවුලේ ආහාර අවශ්‍යතාවන්ට යොදා ගනිති. ලග්ගල පැරැන්නන් කියා සිටියේ පැරණි ක්‍රමවේද ඔස්සේ අද වන විට හේන් ගොවිතැන් කිරීම දුෂ්කර කාර්යයක් බවට පත්වී ඇති බවයි.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නව නීති රීති ඒ අතර ප්‍රධාන තැනක් ගන්නා බව ද ඔවුහු කියා සිටියහ.

කැළෑ එළි පෙහෙළි කිරීම දඩුවම් ලැබිය යුතු වරදක් බවට පත්වීමත් සමඟ තමන්ට හිමි භූමි වල පමණක් වගා කටයුතු සිදු කිරීමට ගොවීහු මේ වන විට පෙලඹී සිටිති. කෙසේ වෙතත් නකල්ස් අධි සංවේදි පරිසර පද්ධතියේ සිට ඈත් වන්නට පිහිටි භූමිවල එවැනි නීතියක් ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් ලග්ගල ගැමියා තුළ විරෝධයක් ද නොපවතියි.

ඊට හේතුව වී ඇත්තේ වර්තමානය වන විට ජනයාගේ අවශ්‍යතා වැඩිවීම මෙන්ම යැපුම් කෘෂිකර්මාන්තය වාණිජ මට්ටමට පැමිණ තිබීම ආදී කරුණු ගණනාවක් අද වන විට ලග්ගල ගැමියා වටහාගෙන ඇති බැවිනි.

වසර ගණනාවකට පෙර ලග්ගල ගම්මාන රැසක ජනයා එනසාල් වගාවන්ට නැඹුරු වී සිටි බවත් පසුකාලීනව එනසාල් වගා කළ භූමි රජයට පවරා ගැනීමත් සමඟ ලග්ගල ගැමියන් විවිධ වගා කටයුතු සිදු කළ බව අපට කීවේ දුම්බර මිතුරෝ පරිසර සංවිධානයයි. එහි සභාපති ආනන්ද කණහැරආරච්චිට අනුව සාම්ප්‍රදායික ගැමි ජීවන රටාවන්ට හුරුවූ ලග්ගල ගැමියා වනාහි ඓතිහාසික ජන මූලාශ්‍ර රැසක් සඟවාගත් පිරිසකි.

ඓතිහාසික රාවණ පුවතට මෙන්ම කුවේණියගේ නෑ පරපුරට නෑකම් කියන ලග්ගල ගැමියා පිළිබඳ පර්යේෂණ රැසක් සිදුකිරීමට නියමිත බව ද හෙතෙම කියා සිටියේය.

වසර පන්දහසකට වැඩි ඉතිහාසයක සිට පැවැත එන පිරිසක් යැයි හඳුන්වනු ලබන ලග්ගල ගැමියා මෙන්ම ඔවුනගේ ජීවන රටාවන් පිළිබඳ වෙනමම අධ්‍යයනයක් සිදු කළ යුතු බව ද ආනන්ද කනහැර ආරච්චි කියා සිටියේය.

වසරේ එක් සමයකට සීමාවන සියඔලා, දෙහි මෙන්ම අල වර්ග ද ලග්ගල ජනයා කල් තබාගත් ආහාර වර්ග අතරින් කිහිපයකි. සියඔලා ලුණු වල දමා අසුරා තබා ගැනීම, දෙහි සීතල සහිත ස්ථාන වල වළලා තැබීම, ලුණු දෙහි දැමීම, අල වර්ග පොළවේ වළලා තැබීම, දෙල්, කොස් වැනි ගෙඩි විශේෂ කපා පවනේ හෝ දුමේ වේලා තබා ගැනීම වැනි කාරණා අදටත් ලග්ගල ගැමියන් තුළින් දැකගත හැකිය.

ශීතකරණ හෝ වෙනත් නූතන කල් තබාගන්නා ක්‍රමවේද නැති සමයේ මස් හෝ මාළු වර්ග ද සති ගණනක් නරක් නොවී තබා ගැනීම සඳහා ලග්ගල ගැමියා භාවිත කළ ක්‍රම කිහිපයකි.

මාළු හා මස් වියළා තබාගැනීම, ලුණුවල දවටා කෙසෙල් හෝ කොළපත් (පුවක් කොළ) වල අසුරා තැබීම, තම්බා ලුණු දමා තබා ගැනීම වැනි ක්‍රම ඔවුන් භාවිත කර තිබේ.

අද වනවිට ද ලග්ගල බොහෝ ගැමියන් මේ ක්‍රමවේද එකක් දෙකක් හෝ කිහිපයක් අනුගමනය කරන අතර එවා තුළින් අදටත් පැරන්නන් විසින් ආරක්ෂා කරගෙන ආ ආහාර මෙන්ම බීජ කල්තබා ගත් ආකාරය ඔවුහු ඉදිරියටම රැගෙන යති.

---

# ආනයනය නතර වීමෙන් අතරමං වූ ටයිල් ව්‍යාපාරිකයෝ

● චන්දිමා එදිරිමාන්න

**සෘජු බදු ලෙස වර්ෂයකට රුපියල් බිලියන 15 ක පමණ ආර්ථික ප්‍රතිලාභයක් මෙරටට අත් කර දුන් ටයිල් සහ සනීපාරක්ෂක භාණ්ඩ ක්ෂේත්‍රය මේ වන විට බරපතළ අනතුරකට මුහුණ දී සිටියි. ඉතා අනර්ඝ තත්ත්වයෙන් හා ප්‍රමිතියෙන් යුතුව මෙතෙක් කාලයක් මෙරටට ආනයනය කරන ලද ටයිල් සහ සනීපාරක්ෂක භාණ්ඩ තවදුරටත් මෙරටට ආනයනය කිරීම තාවකාලිකව අත්හිටුවීම සඳහා රජය ගත් තීරණය හේතුවෙන් එම ක්ෂේත්‍රයේ නිරතව සිටි ව්‍යාපාරිකයින් තුන්සිය දෙනෙකු පමණ හා තවත් දෙදහසකට වැඩි නියෝජිත පිරිසක් මේ වනවිට මෙම අනතුරට මුහුණ දී සිටින අතර එම ක්ෂේත්‍රය ආශ්‍රිත සෘජු හා වක්‍ර රැකියාවන් හි නිරතව සිටි තවත් ලක්ෂයක පමණ පිරිසකගේ ජීවනෝපාය මාර්ග අහිමිවීමේ අවදානමක් ද ඒ සමඟම මතුව තිබේ.**

වසර 30 කට අධික කාලයක් ටයිල් සහ සනීපාරක්ෂක භාණ්ඩ මෙරටට ආනයනය කිරීමේ ව්‍යාපාරික කටයුත්තේ නිරතවී සිටි මෙම ආනයනකරුවන්ගෙන් වැඩි පිරිසක් මේ වන විට වාර්ෂිකව රුපියල් බිලියන 15ක් පමණ වන බදු ආදායමක් රටට හිමි කර දෙමින් මෙරට ආර්ථිකයේ ප්‍රගමනයට සුවිශාල දායකත්වයක් දක්වමින් සිටියි. තම ව්‍යාපාරික ක්ෂේත්‍රය මුහුණ දී සිටින මෙම අර්බුදකාරී තත්ත්වය පිළිබඳව ටයිල් හා සනීපාරක්ෂක නිෂ්පාදන ආනයනකරුවන්ගේ ගැටලු විසඳීමේ අරමුණින් පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආයතනය වන ටයිල් හා සනීපාරක්ෂක ආනයනකරුවන්ගේ සංගමය (TSIA)මේ වන විටත් සිය දැඩි අවධානය යොමු කර ඇති අතර ටයිල් සහ සනීපාරක්ෂක නිෂ්පාදන ආනයන තාවකාලිකව අත්හිටුවීම මගින් සිය පාරිභෝගිකයන්ට සිදු වන අපහසුතා පමණක් නොව එමගින් රටේ ආදායමට අහිතකර බලපෑමක් එල්ල විය හැකි ආකාරය පිළිබඳව ද එම සංගමයේ අවධානය මේ වන විටත් යොමුව ඇත.

ටයිල් සහ සනීපාරක්ෂක නිෂ්පාදන ආනයනය තාවකාලිකව අත්හිටුවීම මගින් ගබඩා සහ භාණ්ඩ ප්‍රවාහනය, නිශ්කාෂණය සහ යැවීම, බැංකු හා මූල්‍ය, ඉදිකිරීම් සහ දේපළ වෙළඳාම් වැනි සහායක කර්මාන්තවලට සුවිශාල බලපෑමක් එල්ල වනු ඇති බවට ටයිල් හා සනීපාරක්ෂක ආනයනකරුවන්ගේ සංගමය මේ වන විටත් රජයට හා ඒ හා සම්බන්ධ අනෙකුත් වගකිවයුතු පිරිස් වෙත පෙන්වා දී තිබේ. තාවකාලිකව ගත් තීරණයක් ලෙස ප්‍රකාශයට පත් වී තිබුණද මෙලෙස ටයිල් සහ සනීපාරක්ෂක නිෂ්පාදන ආනයනය තාවකාලිකව අත්හිටුවීම මගින් මෙම ක්ෂේත්‍රය හා එකමුතුව සිය ජීවනෝපාය මාර්ග පවත්වා ගෙන යන ගෘහ නිර්මාණ ශිල්පීන්, ඉංජිනේරුවන්, උපදේශකයින්, ප්‍රමාණ මිනින්දෝරුවන්, උප කොන්ත්‍රාත්කරුවන්, ටයිල් පෙදරේරුවන් වැනි විශාල පිරිසකට රැකියා අහිමි වීමේ අවදානම ඉහළ යා හැකි බවද සංගමයේ ඇස්තමේන්තුව වී ඇත.ටයිල් හා සනීපාරක්ෂක ආනයනකරුවන්ගේ සංගමයෙහි සාමාජිකයන් සතුව සාමාන්‍යයෙන් වර්ග අඩි මිලියන දෙකක පමණ ගබඩා ඉඩකඩ හා වර්ග අඩි 200,000 ක ප්‍රදර්ශනාගාර ඉඩකඩ පවතින අතර මෙම ආනයන අත්හිටුවීමේ ක්‍රියාමාර්ගය දිවයින පුරා ඇති ගබඩා සහ ප්‍රදර්ශනාගාර හිමිකරුවන් උපයන ආදායම කෙරෙහිද අහිතකර ලෙස බලපෑමට ඉඩ ඇති බවද ඔවුන් රජය වෙත දැනුම් දී තිබේ.

ටයිල් සහ සනීපාරක්ෂක නිෂ්පාදන ක්ෂේත්‍රය ආශ්‍රිත ආනයනයන් තාවකාලිකව අත්හිටුවීම සඳහා රජය විසින් ගත් තීරණයත් සමඟ මෙම ක්ෂේත්‍රය මේ වන විට මුහුණ දෙමින් සිටින අනතුරුදායී හා අර්බුදකාරී වාතාවරණය පිළිබදව අපි එම ක්ෂේත්‍රයේ ව්‍යාපාරිකයන් කිහිප දෙනෙකුගේම අදහස් විමසුවෙමු. මේ එහිදී ටයිල් සහ සනීපාරක්ෂක නිෂ්පාදන මෙරටට ආනයනය කිරීම තාවකාලිකව අත් හිටුවමින් රජය ගත් තීරණයේ බැරෑරුම් කම හා එමගින් උද්ගත විය හැකි අනතුර පිළිබදව එම ක්ෂේත්‍රයේ මේ වන විටද නිරත වී සිටින ව්‍යාපාරිකයින් කිහිප දෙනෙකුම සිය අදහස් සිළුමිණ සමඟ ප්‍රකාශ කළ ආකාරයයි.



## ඉල්ලුමට සරිලන දේශීය නිෂ්පාදන තවමත් මෙරට වෙළෙඳපොළ තුළ නැහැ...

කාමිල් හුසේන්,
සභාපති,ටයිල් හා සනීපාරක්ෂක
ආනයනකරුවන්ගේ සංගමය

ටයිල් හා සනීපාරක්ෂක නිෂ්පාදන ආනයනකරුවන් එම නිෂ්පාදන සඳහා පැනවෙන බදු ප්‍රමාණයෙන් 100% ක්ම ගෙවමින් ආර්ථිකයට දායක වුණත්, ශ්‍රී ලාංකීය වෙළෙඳ පොළෙන් 50 % ක ප්‍රමාණයක් පමණයි අපේ නිෂ්පාදනවලට ඉඩ තිබෙන්නෙ.

විදේශ රටවලට මෙරට මුදල් ගලා යෑම අවම කිරීමේ රජයේ අවශ්‍යතාව පිළිබඳව ව්‍යාපාරිකයින් ලෙස අප ඉතා හොඳින් තේරුම් අරන් තිබෙනවා. කෙසේ වුවත් මෙම ටයිල් හා සනීපාරක්ෂක නිෂ්පාදන ආශ්‍රිතව දැනට වෙළෙඳපොළ තුළ ඇති ඉල්ලුම සපුරාලීමට තරම් ප්‍රමාණවත් දේශීය නිෂ්පාදන තවමත් මෙරට වෙළෙඳපොළ තුළ නොමැති බව රජයේ හා බලධාරීන්ගේ අවධානමට යොමු වී නැහැ. ඒ නිසා මෙම ටයිල් හා සනීපාරක්ෂක නිෂ්පාදන ආනයනයන් තාවකාලිකව අත්හිටුවීමට ගෙන ඇති තීරණය නිෂ්පාදනවල මිල ඉහළ යාමට පමණක් බලපාන කාරණයක් නොවෙයි. එය ගෘහස්ත පාරිභෝගිකයන්ට මෙන්ම අමුද්‍රව්‍ය නැති වීම නිසා නියමිත කාලයට බාරගත් වැඩ අවසන් කිරීමට නොහැකි වීමෙන් සමස්ත ඉදිකිරීම් ක්ෂේත්‍රයටම අහිතකර ලෙස බලපාන කාරණයක් වී තිබෙනවා.ඇත්ත වශයෙන්ම කීවොත් ටයිල් හා සනීපාරක්ෂක නිෂ්පාදන ආනයනයන් තාවකාලිකව අත්හිටුවීමට ගෙන ඇති තීරණය මගින් රටට කිසිදු ප්‍රතිලාභයක් අත් නොවන බවත්, ඉන් සිදුවන හානිය සමස්ත රටටම බලපාන බවත් පැහැදිලිවම පෙන්නුම් කරනවා.

ශ්‍රී ලංකාව තුළ ටයිල් හා සනීපාරක්ෂක නිෂ්පාදන වෙනුවෙන් ආයෝජනය කිරීමට ප්‍රධාන පෙළේ ජාත්‍යන්තර සමාගම් ගෙන්වා ගැනීමට ටයිල් හා සනීපාරක්ෂක ආනයනකරුවන්ගේ සංගමයට (TSIA) ඉතා හොඳ හැකියාවක් තිබෙනවා. එහෙත් දුර්වල ආයෝජන ප්‍රතිලාභ ළඟා කර දෙමින්, රට තුළ පවතින ආයෝජන පරිසරය එවැනි කිසිදු සමාගමකට මෙරට මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට හිතකර තත්ත්වයක් උදා කරන්නේ නැති බව අපගේ හැඟීමයි.දේශීය නිෂ්පාදන සඳහා වන ඉහළ බලශක්ති පිරිවැය මෙන්ම, කුඩා ප්‍රමාණයේ වෙළෙඳ පොළ හේතුවෙන් එවැනි ආයෝජන ඵල රහිත වී තිබෙනවා.එබැවින් මෙවැනි නිෂ්පාදන දේශීයව නිෂ්පාදනය කිරීමට වඩා ආනයනය කිරීම සැලකිය යුතු අන්දමින් ලාභදායී වන අතර වඩාත් ගුණාත්මක හා මාදිලි රැසකින් සපයා දිය හැකි බව අපගේ අදහසයි.



## දේශීය කර්මාන්තයක් ලෙසින් අඩුම ප්‍රමුඛතාව ලබා දිය යුතු කර්මාන්තයක්...

අර්වින් බුලත්සිංහල,
කළමනාකරණ අධ්‍යක්ෂ,
Ceegreen Engineering Pvt Ltd.

ටයිල් හා සනීපාරක්ෂක උපකරණ නිෂ්පාදනය සඳහා සැලකිය යුතු ශක්තියක් අවශ්‍ය බව පැහැදිලි කාරණයක්. ඇත්ත වශයෙන්ම, පිරිවැය අවශ්‍යතාව අතින් දේශීය නිෂ්පාදන සඳහා වැයවන පිරිවැය ඒ මට්ටමේ හෝ ඊටත් වඩා ගුණාත්මකභාවයෙන් ඉහළ ආනයනය කළ නිෂ්පාදන සඳහා වැය වන පිරිවැය වගේ දෙගුණයක් පමණ වෙනවා. ඒ වගේම නිෂ්පාදන ක්‍රියාවලිය අතරතුර දූවිලි අංශු, ඊයම් හා ෆ්ලෝරීන් අඩංගු වායුමය අපද්‍රව්‍ය විමෝචනය වීම නිසා එය පරිසරයටත් හානිකරයි. එබැවින් මෙය ශ්‍රී ලංකාව වැනි පරිසර හිතකාමී රටකට නොගැළපෙන ඉහළම පරිසර දූෂණයක් සහිත කර්මාන්තයක් නිසා දේශීය කර්මාන්තයක් ලෙසින් අඩුම ප්‍රමුඛතාව ලබා දිය යුතු කර්මාන්තයක් හැටියට හඳුන්වා දිය හැකියි. අපගේ විදේශීය ගැණුම්කරුවන් සමඟ වසර ගණනාවක් පුරා අප ඉතා හොඳ සබඳතා පවත්වා ගෙන ගිය ව්‍යාපාරිකයින් පිරිසක්.පවතින තත්ත්වය යටතේ විදේශ මුදල් පීඩනය ලිහිල් කිරීම සඳහා දීර්ඝ ණය කාල සීමාවක් පිරි නමමින් රටට සහයෝගය දැක්වීමට එම විදෙස් සැපයුම්කරුවන් සමඟ මේ වන විටත් අපි සාකච්ඡා වට ගණනාවක් පවත්වා තිබෙනවා.ඒ වගේම ඊට ඔවුන්ගෙන් සුබදායී ප්‍රතිචාරද දැනටමත් අප වෙත හිමි වී තිබෙනවා. එම තත්ත්වයද සැලකිල්ලට ගෙන ටයිල් හා සනීපාරක්ෂක උපකරණ ආනයනය කිරීම සඳහා පනවා ඇති තාවකාලික අත්හිටුවීම ඉවත් කරන ලෙස අපි ඉතා නිහතමානීව රජයෙන් ඉල්ලා සිටනවා.එලෙස එම තාවකාලික අත්හිටුවීම ඉවත් කිරීමෙන් මෙම ක්ෂේත්‍රය හා අත්වැල් බැඳ ගෙන කටයුතු කළ රට පුරා සිටින දහස් ගණනකගේ ජීවනෝපායන් ආරක්ෂා වන බවද සඳහන් කිරීමට පුළුවන්.



## ආනයන අත් හිටුවීමත් සමඟ කිසිදා අත් නොවිඳි දැඩි පීඩනයකට මුහුණ දී සිටිනවා...

ශමේන්ද්‍ර ගුණසේකර
කළමනාකරණ අධ්‍යක්ෂ
Tile collection pvt Ltd

මේ වන විට ටයිල් සහ සනීපාරක්ෂක භාණ්ඩ ක්ෂේත්‍රය ආශ්‍රිතව ආනයනකරුවන් තුන්සියයකට අධික ප්‍රමාණයක් ඉන්නවා.ඒ හැම ව්‍යාපාරිකයෙකුම නිසි ලෙස සිය බදු මුදල් ගෙවනවා.එමෙන්ම විශාල පිරිසකට රැකියා ලබා දී තිබෙනවා.

කෙසේ වුවත් ටයිල් හා සනීපාරක්ෂක භාණ්ඩ විදේශ රටවලින් මෙරටට ආනයනය කිරීම නතර කර දැමීම සඳහා රජය ගත් තීරණයත් සමඟ මේ වන විට අපගේ ටයිල් ආනයන කරුවන් කිසිදා අත් නොවිඳි දැඩි පීඩනයකට මුහුණ දී සිටින ඉතාම අසීරු කාල වකවානුවක් ලෙස මේ කාල සීමාව හඳුන්වා දිය හැකියි. අප බොහෝ විට අපගේ ව්‍යාපාරික කටයුතු සඳහා බැංකු හා මූල්‍ය ආයතන වලින් ණය ලබා ගන්නවා. පවතින තත්ත්වය තුළ අපට එම ණය,පොලී හා වාරික නිසි ලෙස ගෙවීමට නොහැකි තත්ත්වයක්ද මේ වන විට නිර්මාණය වෙමින් තිබෙනවා.

පාරිභෝගික කැමැත්ත,රුචි අරුචිකම් හඳුනා ගනිමින් අපි නිතරම ඉතා අනර්ඝ එස්එල්එස් සහතිකය සහිත නිෂ්පාදන ඉතාම සාධාරණ මුදලකට අලෙවි කිරීමේ කටයුතු සිදු කළා.ඒත් රජයේ තීරණය ක්‍රියාත්මක වීමත් සමඟ දැන් අපේ ප්‍රදර්ශනාගාර වල භාණ්ඩ නැහැ.පිටරටින් ගෙන්වන්න හැකියාවකුත් නැහැ.මේ තත්ත්වය නිසා අපට අපගේ ප්‍රදර්ශනාගාර වල කුලිය පවා ගෙවීම අසීරු වුණු ඉතාම දුෂ්කර කාල වකවානුවක් වෙත මේ වන විට අප එළැඹ තිබෙනවා.



## ලක්ෂයක පමණ ශ්‍රමික පිරිසකගේ රැකියා සුරක්ෂිතභාවය සඳහා නොපමාව මැදිහත් වන්න...

ප්‍රවීන් ප්‍රනාන්දු
කළමනාකරණ අධ්‍යක්ෂ
පුවක් අරඹ සමූහ ව්‍යාපාරය

පැහැදිලිවම අපට දේශීය නිෂ්පාදකයින් සමඟ කිසිදු තරගයක් හෝ තරහවක් නැහැ.ආනයනකරුවන් හැටියට සෑම අවස්ථාවකම අප හොදම නිෂ්පාදන අපගේ ආදරණීය ගනුදෙනුකරුවන් වෙත ඉතාම සාධාරණ මුදලකට අලෙවි කළා.

කෙසේ වුවත් ටයිල් හා සනීපාරක්ෂක භාණ්ඩ ආනයනය අත් හිටුවීමට ගෙන ඇති තීරණයත් සමඟ තවදුරටත් මෙම ව්‍යාපාර පවත්වා ගෙන යනවාද යන තීරණය ගැනීමට අපට සිදු වී තිබෙනවා. ඒ නිසා අප ඉතාමත් කාරුණිකව හා ගෞරවයෙන් යුතුව අපගේ ව්‍යාපාර හා එම ව්‍යාපාර සමඟ එකතුව කටයුතු කරන ලක්ෂයක පමණ ශ්‍රමික පිරිසකගේ රැකියා සුරක්ෂිතභාවය සඳහා නොපමාව මැදිහත්ව මෙම ටයිල් හා සනීපාරක්ෂක භාණ්ඩ විදේශ රටවල සිට මෙරටට ආනයනය කිරීම අත් හිටුවමින් දැනට රජය ගෙන ඇති තීරණය නැවත ආපසු කැදවන මෙන් ඉල්ලා සිටිනවා.




සැප්තැම්බර් 05 සිට
සෑම සෙනසුරාදා හා ඉරිදාවකම සවස 6.00 ට
tv දෙරණ

සිළුමිණ
රැකී රක්ෂා

**ඇබෑර්තු**

මෝටර් ග්‍රේටර් ඔපරේටර්වරු වහා අවශ්‍යයි.

**0777-379846**



# තරුණී

කාලීන දැනුම | මැහුම් | ගෙතුම් | අත්කම් | අතිරේක

**දශක පහක් පුරා කාන්තා නැණ පහන් දැල්වූ කාන්තා පුවත්පත**



## මනාලියෝ

බොදු / කරාව කොළඹ පදිංචි ව්‍යාපාරික පසුබිමක් ඇති වයස අවු. 34 වන උසස් අධ්‍යාපන, BSc / MBA දැනට පෞද්ගලික සමාගමක කළමනාකාර ශ්‍රේණියේ රැකියාවක නියුතු උස 5'5" ක් පැහැපත් දියණියට උගත්, මතින් හා දුමින් තොර සම පවුල් පසුබිමක් සහිත පුතණුවකු සොයයි.

Email : tish985@hotmail.com









# කලම්බු ඩොක්යාඩ් පීඑල්සී

## දූවිලි සහ ශල්‍ය මුඛ ආවරණ මිලදී ගැනීම

අප ආයතනයෙහි සේවක මහතුන් හට දූවිලි මුඛ ආවරණ සහ ශල්‍ය මුඛ ආවරණ ලබා දීම සඳහා පිළිගත් සැපයුම්කරුවන්/ නිෂ්පාදකයින්ගෙන් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ. (ටෙන්ඩර් කාලය මාස 6 කි)

අයිතම පිළිබඳ විස්තර

| S/No | Item Description | Monthly Consumption (Approx.) |
|---|---|---|
| 1 | Cotton Dust Masks | 25,000 Nos. |
| 2 | Surgical Mask | 25,000 Nos. |

සැ.යු: ශ්‍රී ලංකාවේ වලංගු නීති රීතීන්ට අනුකූල තත්ත්ව හා ප්‍රමිති සහතික අනුව සපයනු ලබන දූවිලි සහ ශල්‍ය මුඛ ආවරණ සඳහා අනුමැතිය ලබා දීමේ අයිතිය සුරක්ෂිතයි.

* අදාල ටෙන්ඩර ගාස්තුව (ආපසු නොගෙවනු ලබන) රු.1,000.00 කි
* ටෙන්ඩර් පත්‍ර : අංක 223, ජයන්ත මල්ලිමාරච්චි මාවත, කොළඹ 14 හි පිහිටි ඩොක්යාඩ් ජෙනරල් ඉංජිනේරින් සර්විසස් පුද්ගලික සමාගමෙහි ගණකාධිකාරී වෙත 2020.09.02 දින සිට 2020.09.08 වන දින දක්වා අදාල ටෙන්ඩර් ගාස්තු ගෙවා ලබා ගත හැක. (සතියේ දිනවල පෙ.ව 9.00 සිට ප.ව 4.00 දක්වාද, සෙනසුරාදා දින පෙ.ව 9.00 සිට ප.ව 12.00 දක්වා පමණි)

මිල ගණන් බහා එවනු ලබන කවරයේ ඉහල වම් කෙලවර අපගේ ටෙන්ඩර් අංකය වන SMCD/T/17/2020 යන්න පැහැදිලිව සටහන් කර 2020.09.08 වන දින ප.ව. 4.00 ට හෝ ඊට පෙර ටෙන්ඩර්පත් භාරදීමට කරනු ලබන ඉහත ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු වේ.

පසුව ඉදිරිපත් කරනු ලබන සහ තැපැල් මගින් එවනු ලබන ටෙන්ඩර්පත් භාරගනු නොලැබේ.

වැඩි විස්තර සඳහා කරුණාකර විමසන්න :
**සාමාන්‍යාධිකාරී (සැපයුම් දාම කළමණාකරනය)**
**කලම්බු ඩොක්යාඩ් පීඑල්සී,**
**කොළඹ වරාය, කොළඹ 15.**
**දු.ක : 011 - 2429000**



## මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය

### උතුරු මැද පළාත

### අනුරාධපුර දිස්ත්‍රික්කයේ බස් නැවතුම්පළ භූමි තුළ පිහිටි වැසිකිළි පද්ධති හා නාන කාමර පද්ධති බදු දීම සඳහා මිල ගණන් කැඳවීම 2020/2021

උතුරු මැද පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරියට අයත්, පහත සඳහන් බස් නැවතුම්පළ ස්ථානයන්හි පිහිටි වැසිකිළි හා නාන කාමර පද්ධති 2020/2021 වසර සඳහා බදු දී පවත්වාගෙන යාම සඳහා උතුරු මැද පළාතේ පදිංචි පුරවැසියන්ගෙන් මිල ගණන් කැඳවනු ලැබේ.

| අනු අංකය | ස්ථානය | මිල ගණන් කැඳවන කාරණය | අවම ලංසුව (රුපියල්) |
|---|---|---|---|
| 01 | අනුරාධපුර දුර සේවා බස් නැවතුම්පළ | වැසිකිළි පද්ධතිය හා නාන කාමර පද්ධතිය බදු දීම. | 600,000.00 |
| 02 | අනුරාධපුර නව බස් නැවතුම්පළ | වැසිකිළි පද්ධතිය බදු දීම | 400,000.00 |
| 03 | අනුරාධපුර පැරණි බස් නැවතුම්පළ | වැසිකිළි පද්ධතිය බදු දීම | 700,000.00 |
| 04 | කැකිරාව බස් නැවතුම්පළ | වැසිකිළි පද්ධතිය බදු දීම | 800,000.00 |
| 05 | අරලගංවිල බස් නැවතුම්පළ | වැසිකිළි පද්ධතිය බදු දීම | 100,000.00 |

01. ටෙන්ඩර් අයදුම්පත් හා උපදෙස් පත්‍රිකා **2021-08-31 දින සිට 2020-09-15 දින ප.ව. 03.00 දක්වා** අනුරාධපුර විද්‍යාල මාවත, අනුරාධපුර යන ලිපිනයේ පිහිටි මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරියේ ප්‍රධාන කාර්යාලයට පැමිණ ලබා ගත හැකිය.
02. ටෙන්ඩර් අයදුම්පත්‍ර ලබා ගැනීම සඳහා ආපසු නොගෙවන රුපියල් 2000.00 ක ටෙන්ඩර් ගාස්තුවක් අය කෙරේ.
03. මිල ගණන් භාර ගැනීම 2021-09-16 දින ප.ව. 02.30 න් අවසන් වන අතර, එදින හෝ ඊට පෙර අනුරාධපුර, විද්‍යාල මාවතේ පිහිටි මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරියට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ යුතු වේ.
04. මිල ගණන් ඉදිරිපත් කිරීමට අදළ වැඩි දුර විස්තර 025-2227956 දුරකථන අංකයට කතාකොට ලබාගත හැකිය.

**සභාපති,**
**මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය, උතුරු මැද පළාත.**



## ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## ජාතික ප්‍රසම්පාදන ඇරයුමයි

### ACCELERATING HIGHER EDUCATION EXPANSION AND DEVELOPMENT (AHEAD) PROJECT

### Laboratory Equipment & Office Equipment - Faculty of Medicine

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයීය ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පහත සඳහන් කාණ්ඩ යටතේ අයිතමයන් සැපයීමට සුදුසුකම්ලත් පළපුරුදු ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ මිල ගණන් සඳහා ඇරයුම් කර සිටී.

| *Tender Name & Number* | *Items* |
|---|---|
| AHEAD/SUSL/FOM/2020/01 | Laboratory Equipment |
| AHEAD/SUSL/FOM/2020/02 | Office Equipment |

**සැලකිය යුතුයි :** භාණ්ඩ ලේඛනය හා පිරිවිතර සබරගමුව විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් ලබාගත හැක. (www.sab.ac.lk - Notices)

01. ජාතික තරගකාරී මිල ගණන් යටතේ මෙම මිලදී ගැනීම සිදුකෙරේ.
02. මේ සඳහා කැමැත්තක් දක්වන සුදුසුකම්ලත් ආයතන විසින් අවශ්‍ය තොරතුරු 2020.08.31 දින සිට 2020.09.21 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලයේ (OTS Office) AHEAD ව්‍යාපෘති නියෝජ්‍ය අධ්‍යක්ෂ / ප්‍රසම්පාදන වෙතින් ලබාගත හැකි අතර, විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලයේදී අදළ ලේඛන පරීක්ෂා කළ හැකිය.
03. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ සරප් වෙත රු. 3,500.00 ක ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවා එම ලදුපත සමග ලිඛිත අයදුම්පතක් (5 ඡේදයේ සඳහන් වන) ඉදිරිපත් කිරීමෙන් 2020.08.31 දින සිට 2020.09.21 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ඉංග්‍රීසි භාෂාවෙන් සකසන ලද සම්පූර්ණ ලේඛන කට්ටලයක් ලබාගත හැක.
04. සියලුම ලංසු සඳහා මුල් පිටපත හා අනු පිටපත ලෙස සලකුණු කළ කට්ටල දෙකක් වෙන වෙනම මුද්‍රා තබා ලිපි කවරවල බහා ඒවා නැවත තනි ලිපි කවරයකට බහා මුද්‍රා තබා ලංසුවේ නම, අංකය ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කර ඉදිරිපත් කළ යුතුය.
05. සම්පූර්ණ කරනලද ලංසු ලේඛන **සභාපති, ප්‍රසම්පාදන කමිටුව, මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලය (AHEAD ව්‍යාපෘතිය) ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, බෙලිහුල්ඔය,** 70140 යන ලිපිනයට **2020.09.22 දින ප.ව. 2.00 හෝ ඊට පෙර** ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් භාරදීම කළ හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු ඉදිරිපත් කිරීම අවසන් වූ වහාම (2020.09.22 දින) ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරිපිටදී විවෘත කරනු ලැබේ.
06. විශ්වවිද්‍යාලයේ ප්‍රසම්පාදන කමිටු තීරණය අවසාන තීරණය වන අතර, ඕනෑම ලංසුවක් කිසිදු දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය සතුවේ. මිල ගණන් කැඳවන ලද අයිතමයන්ගෙන් මිලදී ගන්නා ප්‍රමාණය අඩු / වැඩි කිරීම විශ්වවිද්‍යාලයේ අභිමතය පරිදි වේ.
07. මේ සම්බන්ධව වැඩිදුර තොරතුරු 045-2280005 ඇමතීමෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ / ප්‍රසම්පාදන මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලය (AHEAD ව්‍යාපෘතිය), ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය වෙතින් ලබාගත හැකිය.

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය,**
**බෙලිහුල්ඔය. 70140**





වර්ෂ 2020ක් වූ අගෝස්තු මස 30 වැනි ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.